වාර්ෂික වාර්තාව 2022



අනාගත පරපුර
සුරැකීමේ උරුමය
නිර්මාණය සඳහා...

මහජන බැංකුව | மக்கள் வங்கி

PEOPLE'S BANK

අනාගත පරපුර සුරැකීමේ උරුමය නිර්මාණය සඳහා...

මහජන බැංකුවේ වෘත්තාන්තය **අසමසම ශක්තියක්, ධාරිතාවක්, ඔරොත්තු දීමේ හැකියාවක්, සිය සේවය සපයන** ගනුදෙනුරුවන් සහ අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ආරක්ෂා කිරීමට, ඉදිරියට ගෙන යාම සඳහා ගැඹුරු සැලකිල්ලක් දැක්වීමේ උරුමයක් මත ගොඩනගා ඇත. මෙය බැංකුවේ ස්වභාවය සහ මුල් බැසගත් අනන්‍යතාවයයි. පසුගිය දශක හය පුරාවට යහපත් මෙන්ම අයහපත් කාලවලදී ජීවිතයේ සෑම අවස්ථාවක සහ විවිධ සමාජ, ආර්ථික සහ ජන විකාශ අංශවල ගනුදෙනුකාර පරම්පරාවකට සේවය කර ඇත. මෙම අවශ්‍ය අවස්ථාවේදී එහි සියලුම පාර්ශවකරුවන් සමඟ ස්ථීරව සිට, සමස්ථ ජාතියටම සෞභාග්‍යයේ නව යුගයක් උදා කිරීමට සහය වීමේ අපගේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත පරපුර සුරැකීමට අපි බලාපොරොත්තු වෙමු.

පටුන

3 අපගේ වීකාබද්ධ වාර්තාව පිළිබඳව 2022

7
මහජන බැංකුව පිළිබඳව

8 අපගේ බැංකුව
9 අපගේ සමූහය
10 අපගේ ගමන්මඟ
12 වසරේ වැදගත් සිදුවීම්

15
ඉහළ කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම

16 සභාපතිතුමාගේ පණිවිඩය
20 සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය
24 අධ්‍යක්ෂ මණ්ඩලය
28 ආයතනික කළමනාකාරිත්වය
36 විධායක කළමනාකාරිත්වය
38 ප්‍රධාන කළමනාකරුවන්

39
වටිනාකම් නිර්මාණය කිරීම

40 මෙහෙයුම් පරිසරය
47 පාර්ශ්වකාර සහභාගිත්වය
50 ප්‍රමාණාත්මතාව
55 අපගේ උපාය මාර්ගය
60 අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය සහ ප්‍රාග්ධන ශේෂ
62 තිරසාරභාවයට කැපවීම

67
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

68 මූල්‍ය ප්‍රධානීගේ සමාලෝචනය
72 ව්‍යාපාර මාර්ග සමාලෝචනය
72 පාරිභෝගික බැංකුකරණය
73 ව්‍යාවසාය බැංකුකරණය
75 ආයතනික බැංකුකරණය
77 භාණ්ඩාගාරය
78 විදේශීය ගනුදෙනුකාර සේවා
80 ජාත්‍යන්තර බැංකුකරණය
82 නිෂ්පාදිත ප්‍රාග්ධනය
87 බුද්ධිමය ප්‍රාග්ධනය
95 මානව ප්‍රාග්ධනය
108 සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
108 ගනුදෙනුකාර ප්‍රාග්ධනය
115 ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය
120 ආයෝජක ප්‍රාග්ධනය
124 ප්‍රජා ප්‍රාග්ධනය
129 ස්වභාවික ප්‍රාග්ධනය

137
පාලන වාර්තා

138 අවදානම් කළමනාකරණ වාර්තාව
168 ආයතනික යහපාලනය
194 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා
194 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව (BAC)
195 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව (BHRRC)
196 අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (BIRMC)
197 අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව (BECC)
198 අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව (BNC)
199 අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව (BIBC)
200 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව (BITC)
201 අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව (BSPRC)
202 මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
204 අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

205
මූල්‍ය ප්‍රකාශන

206 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
207 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව
209 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය
210 විස්තීරණ ආදායම සම්බන්ධ ප්‍රකාශය
211 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
212 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව
214 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය
216 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
217 මුදල් ප්‍රකාශවලට සටහන්

325
පරිපූරක වාර්තා

326 ආදායම් ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)
327 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)
328 දස වසරක සාරාංශය - බැංකුව
329 දස වසරක සාරාංශය - සමූහය
330 බාසල් III - ස්ථර III යටතේ වෙළෙඳපොල විනය හෙලිදරව් කිරීමේ අවශ්‍යතාව
346 තිරසාරත්ව වාර්තාව පිළිබඳ බාහිර සහතිකය
348 ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) අන්තර්ගත දර්ශකය
353 ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්
356 ශාඛා කළමනාකරුවන්
364 මූල්‍ය/බැංකුකරණ යෙදුම් (පාරිභාෂික ශබ්ද මාලාව)
368 ආයතනික තොරතුරු

අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳව 2022


2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 12ක කාලසීමාව ආවරණය කරමින් මහජන බැංකුව වෙනුවෙන් 8 වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ අපට සතුටුය. සය වැදෑරුම් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය තුළ බැංකුවේ කාර්යසාධනය පිළිබඳ එය සමාලෝචනයකි. එමෙන්ම, වසර තුළ අපි පෙරනොවූ විරූ විශාල ආර්ථික ව්‍යසනයකට සහ දේශපාලන අස්ථාවරත්වයකට මුහුණු දුන් බැවින්, අපගේ පාර්ශ්වකරුවන්ට – අපගේ සේවා දායකයින්, අපගේ කාර්ය මණ්ඩලය, රජය සහ අපගේ ප්‍රජාවන් වෙත සහයවීම සඳහා අප සිදුකර ඇති සුවිශේෂී උත්සාහයන් ද ඉන් විස්තර කරයි.

2021 දෙසැම්බර් 31 දින ප්‍රකාශිත අපගේ පසුගිය ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මත මෙම වාර්තාව සකස් කරන අතර මූල්‍ය සහ තිරසාර වාර්තාකරණය යන දෙඅංශය සඳහා අපගේ වාර්ෂික වාර්තාකරණ චක්‍රය සමඟ අනුකූල වේ.

විෂයපථය සහ සීමාව

මෙම වාර්තාව තුළින් මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ පීපල්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගමේ මෙහෙයුම් ආවරණය කරයි. මූල්‍ය ප්‍රාග්ධනය සහ ආයෝජක ප්‍රාග්ධනය යටතේ ඇතුළත් ප්‍රධාන මූල්‍ය අංගයන් බැංකුව ඇතුළුව සමූහය යන සන්දර්භය තුළ සාකච්ඡා කෙරෙන අතර, නිෂ්පාදිත ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය සහ සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය මගින් ආවරණය වන මූල්‍ය නොවන අංගයන් වෙනත් ආකාරයෙන් සඳහන් කර ඇත්නම් මිස බැංකුව යන සන්දර්භය තුළ සාකච්ඡා කෙරේ. 2022 ජනවාරි 1 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වාර්ෂික මූල්‍ය සහ තිරසාර වාර්තාකරණය සඳහා අපගේ පොදු චක්‍රයට මෙම වාර්තාව අනුරූප වේ.

සමාලෝචිත වර්ෂය තුළ, විෂයපථය හා අංශ සීමාවන් අනුව පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදවලින් සැලකිය යුතු වෙනස්වීම් නොමැති අතර, පසුගිය වසරෙහි නිකුත් කරන ලද වාර්ෂික වාර්තාව හා සැසඳීමේ ප්‍රතිප්‍රකාශ ද නොමැත.



සමාලෝචිත වර්ෂය තුළ, පසුගිය වසරට සාපේක්ෂව සමාගමේ ප්‍රමාණය හෝ ව්‍යුහය තුළ කිසිදු සැලකියයුතු වෙනස්වීමක් සිදු වී නොමැත.

වටිනාකම නිර්මාණය

අපගේ උපායමාර්ග හා නිවැරදිව පෙළගැසෙමින් සහ විවිධ ප්‍රාග්ධනයන් යටතේ අපේක්ෂිත කාර්යසාධන ප්‍රතිඵල අත් කරගනිමින් අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය තුළ අපි විශිෂ්ඨත්වයක් දක්වා ඇත. අපගේ වටිනාකම නිර්මාණ ප්‍රාග්ධන ශේෂ ආකෘතිය 60 සිට 61 දක්වා පිටුවල සහ උපායමාර්ගික වැඩසටහන් 55 සිට 59 දක්වා පිටුවල ඉදිරිපත් කෙරෙන අතර, ප්‍රග්ධන කාර්යසාධනය 68 සිට 136 දක්වා පිටුවල විස්තර කෙරේ.

ප්‍රමාණාත්මතාව

අපි ප්‍රමාණාත්මතා ඇගයීම් පවත්වා ඇති අතර, වැදගත් කරුණු සම්පාදනය කරමින් මාතෘකා ආමන්ත්‍රණය කිරීම සඳහා කළමනාකරණ ප්‍රතිචාර සකස් කර ඇති අතර, මෙම විසඳුම් 50 සිට 54 දක්වා කොටස තුළ දැක බලාගත හැකිය. හඳුනාගත් ප්‍රමාණාත්මක කරුණු වාර්තාවේ ඉතිරි කොටසේ අන්තර්ගතය මෙහෙයවා ඇත. මෙම වසර තුළ අපි සිදුකර ඇති ප්‍රධාන නවෝත්පාදන වන්නේ ප්‍රමාණාත්මතාවයට ඉදිරි දැක්මක් සහිත අංගයක් හඳුන්වාදීමයි. ප්‍රමාණාත්මක මාතෘකා වසර 5-10ක කාලසීමාවක් සඳහා පුරෝකථනය කොට ඇත. මෙම සංවර්ධනයට සමගාමීව, අනෙකුත් ප්‍රාග්ධනයන් සහ ව්‍යාපාර ඒකකවල කාර්යසාධනය විස්තර කිරීමේදී අනාගත කේන්ද්‍රීය ප්‍රවේශයක් රැගෙන ඇත.

ප්‍රාග්ධනය

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුවට අනුව නිශ්චිත පරිදි සය වැදෑරුම් ප්‍රාග්ධනය පහත දැක්වේ:

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
  - ගනුදෙනුකාර ප්‍රාග්ධනය
  - ප්‍රජා ප්‍රාග්ධනය
  - ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය
  - ආයෝජන ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය

ඒකාබද්ධ වාර්තාකරණය සම්බන්ධයෙන්, ප්‍රාග්ධනයන් අතර අන්තර් සම්බන්ධතා ද ඒවා විස්තර කිරීමේදී එළිදක්වා ඇත.

උපායමාර්ගය

අපගේ උපාය මාර්ගික කාර්යසාධනය 55 සිට 59 දක්වා පිටුවල සමාලෝචනය කර ඇත.

2025 ජූනි අවසාන වන නව **උපායමාර්ගික පරමාර්ථ** රාශියක් ඉදිරි වසර දෙක සඳහා සකස් කර ඇත:

- **මෙහෙයුම්** විශිෂ්ඨත්වය
- ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව **ගොඩ නැගීම**
- **අනාගත සූදානම**

පාදක වූ කරුණු

- **තනි කඩිසර** මානසිකත්වය
- **දත්ත ධාවන** මානසිකත්වය
- **වර්ධන** මානසිකත්වය

වේගයෙන් වෙනස්වන වාතාවරණය සහ බැංකු ක්ෂේත්‍රය බිඳ වැටීමට හේතුව පිළිබඳ දැනුවත්භාවය යන පසුබිම සමඟ මෙය සකස් කර ඇත.

වාර්තාකරණ රාමු

වෙනත් කරුණු අතර පහත දෑ අතුළත්ය.

රෙගුලාසි	ස්වේච්ඡා ප්‍රමිති
1961 අංක 29 දරන මහජන බැංකු පනත (සංශෝධිත)	2017 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත්කළ ආයතන පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත)	ගෝලීය වාර්තාකරණ ප්‍රවේශයේ ගෝලීය වාර්තාකරණ සම්මත
ශ්‍රී ලංකා මහ බැංකු උපදෙස්	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)
1953 අංක 24 දරන විනිමය පාලන පනත	ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය (IIRC) විසින් නිකුත් කළ ඒකාබද්ධ වාර්තාකරණ රාමුව
2006 අංක 6 දරන මුල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත	
2006 අංන 5 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනත	
බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත් නියෝගය	

මහජන බැංකුව ගෝලීය වාර්තාකරණ ප්‍රවේශයේ (GRI) ප්‍රමිති සම්බන්ධයෙන් 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා GRI අන්තර්ගත දර්ශක (348 සිට 352 දක්වා පිටු) තුළ දක්වා ඇති තොරතුරු වාර්තා කර ඇත.

අපගේ වාර්තාව වර්ගීකරණය

විනිවිදභාවය	වගවීම	පාලනය	තිරසාරභාවය
සම්පූර්ණ අනාවරණය පිණිස මෙම ඒකාබද්ධ වාර්තාව තුළ අපගේ පාර්ශවකරුවන්ට වැදගත්වන සියලුම තොරතුරු ඉදිරිපත් කිරීමට බැංකුව උත්සාහ ගෙන ඇත. ව්‍යවස්ථාපිත වාර්තාකරණයට අමතරව, අපගේ ඒකාබද්ධ වාර්තාවේ කොටසක් ලෙස ස්වේච්ඡා වාර්තාකරණ අංග කිහිපයක් අපි ඇතුළත් කර ඇත.	වගවීමේ ව්‍යවහාර සම්බන්ධයෙන් බැංකුව නෛතික අවශ්‍යතා, නීති සහ රෙගුලාසිවලට අනුකූල වී ඇත. මෙම වාර්තාව තුළ අඩංගු තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳ අභ්‍යන්තර සහ බාහිර පිළිගත් වෘත්තිකයින් විසින් තත්ත්ව සහතික පරීක්ෂා කිරීම් සිදුකර ඇත.	යහපාලනය ආරම්භයේ සිටම බැංකුවේ පරිපාලනය තුළ මුර පදයක්ව පැවති අතර, විශේෂයෙන් රාජ්‍ය බැංකුවක් ලෙස, සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීමට සියුම් පරීක්ෂාව තීරණාත්මකය.	බැංකුවට ආයතනික තිරසාර ප්‍රතිපත්තියක් ඇති අතර එය බැංකුවේ මෙහෙයුම්වල සියලුම අංග ආයතනය පිළිබඳ පරිසර හිතකාමී දර්ශනයට අනුකූල බව සහතික කිරීමට තීරණ ගන්නන් සඳහා මඟපෙන්වීමක් ලෙස සේවය කිරීමට සකස් කර ඇත.

අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳව 2022

පූර්වාරක්ෂක මූලධර්මය

අපගේ සමාජ හා පාරිසරික තිරසාරභාවය සම්බන්ධයෙන් පූර්වාරක්ෂාව පිළිබඳ මූලධර්මය අපි යොදා ගනිමු. අපගේ මෙහෙයුම්වලින් සමාජයට හා පරිසරයට සමස්ථ ධනාත්මක බලපෑමක් ඇති කරන බව අප අවබෝධ කර ගනිමින්, යම් සෘණාත්මක බලපෑමක් වුවද, එවැනි අවදානම් අවම කිරීම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අපි රැගෙන ඇත. 124 සිට 128 සහ 129 සිට 136 දක්වා පිටුවල ප්‍රජා ප්‍රාග්ධනය සහ ස්වාභාවික ප්‍රාග්ධනය යටතේ මේවා සවිස්තරව දක්වා ඇත.

තත්ත්ව සහතිකය

දත්තවල තුලනාත්මකභාවය සහ පැහැදිළිකම වර්ධනය කිරීම සඳහා අපි ප්‍රස්ථාර, වගු සහ තොරතුරු ප්‍රස්ථාර වැඩිපුර එකතු කර ඇති අතර දැනට පවත්නා අභ්‍යන්තර පාලනයන් විස්තර කිරීමට සහ තොරතුරුවල නිරවද්‍යතාව සහ අනුරූපතාව සහතික කිරීම සඳහා විනිවිදභාවය සහ සත්‍යාපනය කිරීම ශක්තිමත් කර ඇත. දෘශ්‍ය සංරචකවල භාවිතය වැඩිකිරීම තුලින් වාර්තාව පහසුවෙන් කියවීමේ හැකියාව සහ සංක්ෂිප්ත බව ඉහළ නංවා ඇත. බැංකුවේ සියලුම සෘජු සහ වක්‍ර වැදගත් බලපෑම් වාර්තාව විස්තරාත්මක බව සහතික කිරීමට ඇතුළත් කර ඇත. අදාළ සියලුම තොරතුරුවල සාධාරණ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අපි උත්සාහයක් දරා ඇති අතර, තොරතුරුවල වලංගුතාව සහ විශ්වාසනීයත්වය සහතික කිරීමට අභ්‍යන්තර සහ බාහිර සහතික කිරීම ලබාගෙන ඇත.

අංශය	අභ්‍යන්තර සහතික කිරීම	බාහිර සහතික කිරීම
මූල්‍ය වාර්තාකරණය	අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය	විගණකාධිපති දෙපාර්තමේන්තුව
තිරසාර දර්ශක	අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය, ව්‍යාපාර ප්‍රධානීන්	Messrs. Ernst & Young
ආයතනික පාලනය	අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය	විගණකාධිපති දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර පාලනය	අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය	විගණකාධිපති දෙපාර්තමේන්තුව

අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ පරිනාමය



2021 වාර්ෂික වාර්තාව සඳහා ප්‍රධාන සම්මාන සහ පිළිගැනීම්

ජාත්‍යන්තර ARC සම්මාන 2022

රන් සම්මාන – ලිඛිත අන්තර්ගතය: බැංකු

රන් සම්මාන – මූල්‍ය දත්ත: බැංකු: ජාතික

ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන 2022 හි CMA විශිෂ්ඨත්වය

මහජන බැංකුවේ 2021 වාර්ෂික වාර්තාව ඉහළම "විශිෂ්ඨතම ඒකාබද්ධ වාර්ෂික වාර්තා" දහයෙන් එකකි.

ගණකාධිකාරීන්ගේ දකුණු ආසියානු සංගමයේ (SAFA) සම්මාන

මහජන බැංකුව 2021 වාර්ෂික වාර්තාව –

රජය අංශයේ බැංකු වර්ගීකරණය තුළ හවුල් ලෝකඩ සම්මානය: අවකාශය සඳහා ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය අංශයේ බැංකුව බවට පත්වීම.

ඉදිරිය දැක්ම ප්‍රකාශය

වර්තමානයේ ලබාගතහැකි තොරතුරු සහ සිදුකරන උපකල්පන මත පදනම් වන ඉදිරි දැක්ම ප්‍රකාශ මෙම වාර්තාව තුළ අඩංගු වන අතර බැංකුවේ ව්‍යාපාර අනාගත කටයුතු, අපේක්ෂිත සංවර්ධන, ප්‍රවනතා සහ වෙළෙඳපොල තත්ත්වයන්, මෙහෙයුම්, සහ විනිමය අනුපාත පිළිබඳ පුරෝකථන ඇතුළත් විය හැක. එහි ස්වභාවය අනුවම, ඒවා සැලකියයුතු අවදානම් සහ අවිනිශ්චිතතාවන්ට සම්බන්ධවන අතර, සැබෑ ප්‍රතිඵලය පුරෝකථනවලින් වෙනස් විය හැකිය.

අපගේ වාර්ෂික වාර්තාවේ විඩියෝ ඡායාරූප

ඉතා වැදගත් තොරතුරු පිළිබඳ ඔබට හදිසි දළ විශ්ලේෂණයක් ලබාගැනීම සඳහා අපගේ වාර්ෂික වාර්තාවේ වීඩියෝ සාරාංශයක් අපි හඳුන්වා දෙමු.

ඔබට පහත සබැඳුම තුළින් වීඩියෝව කරා පිවිසිය හැකිය.
https://www.peoplesbank.lk/last-financial-result/

බැලීම සඳහා ස්කෑන් කරන්න

විමසුම් හා ප්‍රතිචාර

අනාගත වාර්තා වර්ධනය කිරීම සඳහා සහයවීමට අපි ඔබගේ ප්‍රතිචාර අගය කරමු. කරුණාකර ඔබගේ අදහස්, ප්‍රශ්න සහ යෝජනා පහත ලිපිනයට ඉදිරිපත් කරන්න.

අසාම් ඒ අහමට්
මූල්‍ය ප්‍රධානී
මූල්‍ය සහ කළමනාකරණ ගිණුම්කරණ
දෙපාර්තමේන්තුව
මහජන බැංකුව
නො: 75, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 2.

+94 11 248 1481 (දිගුව. 498)

azzam@peoplesbank.lk
info@peoplesbank.lk

www.peoplesbank.lk

7

මහජන බැංකුව පිළිබඳව

8 / අපගේ බැංකුව
9 / අපගේ සමූහය
10 / අපගේ ගමන්මඟ
12 / වසරේ වැදගත් සිදුවීම්

අපගේ බැංකුව

මහජන බැංකුව එහි ගනුදෙනුකාර පදනම සහ දිවයින පුරා භූගෝලීය පැවැත්ම අනුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය සේවා සපයන්නා වේ. බැංකුවට ක්ෂේත්‍රයේ විශාලතම ශාඛා ජාලය, සහ එහි ප්‍රතිඵලයක් ලෙස, රට තුළ මිලියන 14.7 කට වැඩි ගනුදෙනුකරුවන් අයත් වේ. රජයට, ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශවලට අමතරව ජීවිතයේ සියලුම තරාතිරම්වල ගනුදෙනුකරුවන්ට අපි සේවය කරමු. ශාඛා 745ක ජාලය පුරා විහිදී ගිය බැංකුවේ කාර්ය මණ්ඩල ශක්තිය 7,377ක් වන අතර, එහි මෙහෙයුම්වල සෑම අංගයකදීම වෘත්තීයභාවය, තිරසාරභාවය සහ අනුකූලතාවය පිළිබඳ ඉහළම මට්ටම් පවත්වා ගනිමින් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ නිෂ්පාදන ලබා දේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කළ පරිදි ශ්‍රී ලංකාවේ දේශීයව ක්‍රමානුකූල වැදගත් බැංකුවක් (D-SIB) වන මහජන බැංකුව 1961 අංක 29 දරන පනත යටතේ එය පිහිටුවීමේ සිට දශක හයකට වැඩි කාලයක් සඳහා රටේ ආර්ථික සංවර්ධනයට අත්‍යවශ්‍ය දායකත්වයක් සිදු කර ඇත. සමාලෝචිත වසරේ ආර්ථික ආරාවුල පුරාම අත්‍යවශ්‍ය අයිතම සඳහා මූල්‍යකරණය සමඟ ජාතියට සහය දක්වමින් ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස සිය කාර්යභාරය බැංකුව අඛණ්ඩව සිදු කර ඇත. මෑත කලය තුළ, ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් වර්තමානයේ ඩිජිටල් වශයෙන් කටයුතු කරන්නේ ය යන මතය අනුව අපි ඩිජිටල්කරණය කෙරෙහි විශාල වශයෙන් විතැන් වී ඇත. රට පුරා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන දායකත්වයක් බැංකුව විසින් සිදු කර ඇත.

අපගේ දැක්ම

පරිවර්තනීය වර්ධනය කරා ජාතිය පෙළඹවීම

BHAG

ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම සේවක තෘප්තිමත් මට්ටම් සමඟින් වැඩි ගනුදෙනුකරුවන් අපේක්ෂා කරන බැංකුව වීම.

අපගේ මෙහෙවර

- **අපි පහසුවෙන් දැරිය හැකි, ප්‍රවේශවිය හැකි මෙන්ම කාර්යක්ෂමව සපයා දෙනු ලබන විසඳුම් තුළින් ජනජීවිතයේ දියුණුවටත්, ව්‍යවසාය සංවර්ධනයටත් දායකත්වය සැපයෙන මූල්‍ය සේවා සපයාදීමේ ව්‍යාපාරයේ නියැළී සිටිමු.**
- **අපි අපගේ මානව සම්පත් සවිබලගන්වා සංවර්ධනය කරන අතර, එවිට ඔවුන් අපගේ ගනුදෙනුකරුවන් රැකබලාගෙන ආරක්ෂා කරනු ඇත.**
- **තරඟකාරී අන්දමින් ලාභ උපයන අතරම, ජාතික ආර්ථික සංවර්ධනයට අපි දායක වෙමු.**
- **අපගේ ව්‍යාපාර භාවිතය තුළ තිරසාර බව රැකගනිමින්, අප ක්‍රියාත්මක සමාජය වෙත ආපසු ලබාදීම කෙරෙහි අපි විශ්වාස කරමු.**

අපගේ වටිනාකම්

- **ජාතියේ අභිමානය වීම**
- **ගනුදෙනුකාර අවධානම සහ කඩිසරකම**
- **අවංකකම සහ වගවීම**
- **අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතිය සහ කණ්ඩායම් හැඟීම**
- **බලගැන්වීම සහ විවිධත්වය**



අපගේ සමූහය



සංස්ථාපිත වර්ෂය
1961

ප්‍රධාන නිෂ්පාදන සහ සේවා
පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය
ව්‍යවසාය බැංකුකරණය
ආයතනික බැංකුකරණය
ජාත්‍යන්තර බැංකුකරණය

ගනුදෙනුකාර අංශ
තනි පුද්ගලයන්
ක්ෂුද්‍ර ව්‍යවසාය
කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර
ආයතනික, රාජ්‍ය සහ රජයට අයත් ව්‍යවසාය

කාර්යසාධන සිදුවීම්
වත්කම් රු.බි. 2,972.
බදු පසු ලාභය රු.බි. 17.2

ශාඛා සංඛ්‍යාව
745

සේවක ශක්තිය
7,377

හිමිකාරත්වය	75%	99%
	PLC PEOPLE'S LEASING	PEOPLE'S TRAVELS
සංස්ථාපිත වර්ෂය	1995	1993
ගනුදෙනුකාර අංශ	තනි පුද්ගලයින් ක්ෂුද්‍ර ව්‍යවසාය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර	තනි පුද්ගලයින් ක්ෂුද්‍ර ව්‍යවසාය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර
ප්‍රධාන නිෂ්පාදන සහ සේවා	කල්බදු හා කුලී පිට ගැණුම් ක්ෂුද්‍ර මූල්‍ය තැන්පතු ණය	අභ්‍යන්තර සංචාර විදේශ සංචාර ගමනාන්ත කළමනාකරණය
කාර්යසාධන සිදුවීම්	වත්කම් රු.බි. 195 බදු පසු ලාභය රු.බි. 4.1	වත්කම් රු.බි. 92 බදු පසු ලාභය රු.බි. 10.4
ශාඛා සංඛ්‍යාව	111	2
සේවක ශක්තිය	3,062	15

අපගේ ගමන්මඟ

1961 සිට 1969

- **1961 ජූලි 1** දින ආරම්භ විය.
- කොළඹ ඩියුක් වීදියේ **පළමු ශාඛාව** විවෘත කිරීම.
- උකස් ණය සේවා **ආරම්භ කිරීම**.
- සමූපාකාර ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සහ නව කෘෂිකර්ම ණය යෝජනා ක්‍රමය කුඩා ගොවිපල අංශයේ **පුරෝගාමී ණය දෙන්නා** බවට පත්වීම.

1970 සිට 1979

- අවිධිමත් අංශයේ ආර්ථික කටයුතුවලට මුදල් ලබාදීම සඳහා **"අතමාරු" ණය යෝජනා ක්‍රමය** හඳුන්වා දීම.
- **100 වැනි ශාඛාව** මරඳගහමුල විවෘත කිරීම.
- **සේවකයින් 5,000ට ලඟාවීම.**
- **පළමු ධීවර බැංකුව** කොරළවැල්ල විවෘත කිරීම.

1980 සිට 1989

- විස්තීර්ණ බාලවයස්කාර ඉතුරුම් යෝජනා ක්‍රමය **දියත් කිරීම**.
- **300 වැනි ශාඛාව** ඉංගිරිය විවෘත කිරීම.
- මුළු **සේවක සංඛ්‍යාව 10,000ට** ලඟාවීම.
- ප්‍රධාන කාර්යාලය සහ තෝරාගත් නගර ශාඛාවල **පරිගණකගතකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම** සහ ගනුදෙනුකාර සේවා කාලය තිරසාර ලෙස අඩුකරමින් බිලැක් ලයිට් පද්ධතියන් හඳුන්වාදීම.

1990 සිට 1999

- ප්‍රධාන කාර්යාල ශාඛාවේදී **පළමු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM)** ස්ථාපිත කිරීම.
- **රජයේ කර්මාන්තශාලා 200** වැඩසටහනට බැංකුව සහයවීම.
- **ශාඛා 160ක්** පරිගණකගත කිරීම.
- **"වනිතා වාසනා", සහ "ඉසුරු උදාන"** ඉතුරුම් යෝජනා ක්‍රම, **"සුරතුරු"** ණය යෝජනා ක්‍රමය, **"විදේශිකා"** තැන්පතු යෝජනා ක්‍රමය දියත් කිරීම.

2000 සිට 2009

- **"ජන ජය",** ඉතුරුම් සමඟ ණය යෝජනා ක්‍රමය දියත් කිරීම.
- **මධ්‍යම ATM ස්විචය** හඳුන්වාදීම.
- මහජන ස්වයංක්‍රිය බැංකුකරණ පද්ධතිය **(PABS) සහිත ශාඛා සංඛ්‍යාව 218 දක්වා වැඩි කළ අතර**, ශාඛා 119ක් මධ්‍යම ATM ස්විචයට සම්බන්ධ කරන ලදී.
- **භාණ්ඩාගාර ස්වයංක්‍රිය** පැකේජය හඳුන්වාදීම.
- ෆිට්ච් රේටින්ග්ස් ලංකා වෙතින් මෙතෙක් **පළමු BBB+ මහජන ශ්‍රේණිගතකරණය** බැංකුව ලබාගැනීම.
- රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව අතර අත්සන් කළ ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජනය ලෙස රු.බි. 2ක පළමු ප්‍රාග්ධන කොටස, රු.බි. 1ක දෙවන ප්‍රාග්ධන කොටස සහ රු.බි. 1.5ක තෙවැනි ප්‍රාග්ධන කොටස බැංකුව වෙත ලබා ගැනීම.
- **පළමු වරට, SAFA (ගණකාධිකාරිවරුන්ගේ දකුණු ආසියානු සංගමය) 2008 වාර්ෂික වාර්තාව සඳහා සම්මානය ලැබීම.**



2010 සිට 2019

- බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව සඳහා 2012 ජාත්‍යන්තර ARC සම්මානවලදී ජාතික වර්ගීකරණය තුළ **විශිෂ්ට සම්මානයක් සහ රන් සම්මාන තුනක් දිනා ගැනීම**.
- දිවයින පුරා **කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 23ක් ස්ථාපිත කිරීම**
- **ජාතික පොදු ATM ස්විචය හා සම්බන්ධ වූ පළමු බැංකුව** බවට මහජන බැංකුව පත්වීම.
- බැංකුවේ වත්කම් පදනම ක්ෂේත්‍රය තුළ **දෙවැනි විශාලම බැංකුව ලෙස රු.ට්‍රි. එක පසු කිරීම**.
- බැංකුව යුරෝපීය ගෝල්ඩ බැංකුකරණය සහ මූල්‍ය සම්මාන – ශ්‍රී ලංකාව 2014 හි "2014 වසරේ බැංකුව" මෙන්ම වර්ල්ඩ් ෆිනැන්ස් බැංකුකරණ සම්මාන 2014 දී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකු සමූහය" සහ "ශ්‍රී ලංකාවේ වඩාත් තිරසාරමය බැංකුව" යන **තෙවැදෑරුම් පිළිගැනීමට පාත්‍රවීම**.
- බැංකුව සිය තිරසාරමය බැඳීම් පෙන්නුම් කරමින් **හරිත බැංකුකරණ සංකල්පය දියත් කිරීම.**
- ශ්‍රී ලංකාවේ **පළමු සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කළ ශාඛාව** කොළඹ විවෘත කිරීම සහ ජාතියේ රාජ්‍ය බැංකුවක් සඳහා පළමු තොරතුරු ආරක්ෂක කළමනාකරණය වෙනුවෙන් කීර්තිමත් ISO/IEC 27001:2013 තත්ත්ව සහතිකය ලබා ගැනීම.
- **පිපල්ස් වේව් ශ්‍රී ලංකාවේ වඩාත්ම භාගතකළ මූල්‍ය යෙදවුම** බවට පත්වීම.
- පර්ලිමේන්තුව විසින් සම්මත කළ මහජන බැංකු (සංශෝධිත) පනතින් පසු **ණයකර නිකුතුව මගින් රු.බි. 10.0ක් බැංකුව රැස් කිරීම**. SBUs 239ට ලඟා වූ අතර - වසර තුනක් තුළ එය සුවිශාල ජයග්‍රහනයකි.
- මේ දක්වා ශ්‍රී ලංකාවේ යම් වාණිජ බැංකුවක් විසින් ලබාගත් **විශාලතම සහ දීර්ඝතම ද්විපාර්ශ්වික ණය පහසුකම සඳහා බැංකුව අත්සන් කිරීම**.

2020

- කොවිඩ්-19 කාලය තුළ බැංකුව ජාතියට, ගනුදෙනුකරුවන්ට සහ පොදු මහජනතාවට අද්විතීය සහයක් ලබාදීම. මහජන බැංකුව රු.බි. 20ක් වටිනා ස්ථර II ණයකර තුළින් **මේ දක්වා ක්ෂේත්‍රය විසින් අත්කර ගත් ඉහළම මුදල රැස්කර ගැනීම.**
- සන්නාම වටිනාකම තුළ **ධනාත්මක නැගුමක් සහිත ඉහළම ආයතන 3 සහ රජයට අයත් එකම බැංකුව වීම.**

2021

- "ජාතියේ අභිමානය" තේමාව සහිතව **බැංකුව සිය 60 වැනි සංවත්සරය උත්සවාකාරයෙන් පැවැත්වීම.**
- **People's Wave මිලියනයකට වැඩි** සක්‍රිය පරිශීලකයින් සමඟ රටතුළ වඩාත්ම භාගතකළ ජංගම යෙදුම බවට පත්වීම සහ **People's Pay Wallet App යෙදුම දියත් කිරීම.**

2022

- අධිමිල වෙළෙඳපොල අංශයට සේවය සැලසීමට **නව සන්නාම දෙකක්** එනම් Excelsior සහ Elegance දියත් කිරීම.
- අපගේ ආයතනික සමාජ වගකීම්සහගත වැඩසටහන යටතේ **"මහජන මෙහෙවර"** හඳුන්වා දීම.
- **2022-2024 උපායමාර්ගික සැලසුම්** කිරීම සාර්ථකව දියත් කිරීම.
- බැංකුව ජාත්‍යන්තර මෙන්ම ශ්‍රී ලාංකීය ආයතන වෙතින් වසර තුළ **සම්මාන සහ පිළිගැනීම් ගණනාවක් ලබා ගැනීම.**
  - මහජන බැංකුව බැංකු සඟරාවක් මගින් ලෝකයේ ඉහළම බැංකු 1000 අතර නම් කරන ලද අතර, ආසියානු බැංකු සඟරාවක් විසින් ආසියාවේ ඉහළම බැංකු 500 අතරට මහජන බැංකුව ඇතුළත් කර ඇත.
  - රන් සම්මාන දෙකක් ඇතුළුව ජාත්‍යන්තර ARC සම්මානවලදී සම්මාන හතරක් ලබා ගැනීම.
  - බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන 2022 හි CMA විශිෂ්ඨත්වය තුළ විශිෂ්ඨතම ඒකාබද්ධ වාර්ෂික වාර්තා ඉහළම දහය අතර නම් කිරීම.
  - දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (SAFA) සම්මානවලදී රාජ්‍ය අංශයේ බැංකු වර්ගීකරණය තුළ හවුල් ලෝකඩ සම්මාන ජයග්‍රහකයෙක් වීම.
  - TAGS සම්මාන 2022 දී රාජ්‍ය අංශය සඳහා ලෝකඩ සම්මානය දිනා ගැනීම.
  - බැංකුව WFWP සම්මානයේදී කාන්තාවන් සඳහා ශ්‍රී ලංකාවේ වඩාත් කැපීපෙනෙන සේවා ස්ථානය ලෙස පිළි ගැනීම.




වසරේ වැදගත් සිදුවීම්


	බැංකුව			සමූහය		
	2022	2021	වෙනස %	2022	2021	වෙනස %
මෙහෙයුම් කාර්යසාධනය (රු.බි.)						
පොළී ආදායම	321.9	197.3	63.1	351.4	222.4	58.0
ශුද්ධ පොළී ආදායම	75.8	82.5	-8.1	91.0	96.9	-6.0
දළ ආදායම	357.2	207.2	72.4	391.2	236.8	65.2
මූල්‍ය සේවා මත බදු පෙර මෙහෙයුම් ලාභය	29.5	37.2	-20.7	36.7	45.7	-19.7
බදු පෙර ලාභය	21.3	30.4	-29.8	26.7	37.2	-28.3
ආදායම් බදු	4.1	6.7	-37.8	6.2	9.2	-32.7
බදුවලට පසු ලාභය	17.2	23.7	-27.5	20.5	28.1	-26.9
විශේෂ බදු සහ ගෙවූ ලාභාංශ	0.7	2.2	-69.9	0.9	2.3	-63.4
රඳවාගත් ලාභ	16.5	21.5	-23.2	19.7	25.7	-23.6
මූල්‍ය තත්ත්වය (රු.බි.)						
මුළු වත්කම්	2,972.0	2,647.6	12.3	3,133.1	2,832.6	10.6
දළ ණය සහ ලැබිය යුතු දේ	1,915.8	1,937.0	(1.1)	2,061.1	2,103.6	-2.0
මුළු තැන්පතු	2,371.5	2,071.5	14.5	2,450.1	2,168.7	13.0
කොටස් හිමියන්ගේ අරමුදල්	145.3	136.1	6.8	189.3	177.6	6.6
කාර්යසාධන අනුපාත (%)						
සාමාන්‍ය වත්කම් මත ඉපයීම් (බදුවලට පෙර)	0.8	1.2		0.9	1.4	
ස්කන්ධය මත ඉපයීම් (බදු පසු)	12.2	19.9		11.2	17.7	
පොළී ආන්තිකය	2.7	3.4		3.1	3.7	
ආදායමට පිරිවැය අනුපාතය	50.4	51.1		53.1	53.3	
තැන්පතුවලට ණය අනුපාතය	80.8	93.5		84.1	97.0	
වත්කම් ගුණාත්මකතා අනුපාත (%)						
හානි කළ ණය (අදියර 3) අනුපාතය	12.8	4.0		12.6	4.7	
අදියර 3 ණය අනුපාතයට හානිකරණය	29.9	50.2		30.5	46.9	
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය (%) (අවම අවශ්‍යතාව - (20%)						
දේශීය බැංකු ඒකකය	21.4	23.5				
අක් වෙරළ බැංකු ඒකකය	20.1	25.9				
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (%) (අවම අවශ්‍යතාව - 90%)						
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - රුපියල්	213.1	155.8				
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - සියලුම ව්‍යවහාර මුදල්	119.5	105.7				
නියාමන ප්‍රාග්ධන අනුපාත (%)						
පොදු ස්කන්ධ 1 ස්ථර I ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 8.0%)	11.4	12.0		12.8	13.0	
පළමු පෙළ ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව 2022 - 9.5%/2021 - 8.5%)	11.9	12.6		13.3	13.4	
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව 2022 - 13.5%/2021 - 12.5%)	16.3	17.8		17.2	17.9	
කොටස් හිමිකාර අනුපාතය (LKR)						
කොටසක ඉපැයුම	17,192	23,720	-27.5	19,572	26,351	-25.7
කොටසක ශුද්ධ වත්කම් අගය	145,294	136,077	6.8	189,332	177,638	6.6

වසරේ වැදගත් සිදුවීම්


මුළු වත්කම්




මුළු තැන්පතු




මුළු ස්කන්ධය




පොළී ආදායම




අරමුදල් නොවන ආදායම




බදු පෙර ලාභය



ආදායමට පිරිවැය අනුපාතය



මුළු ප්‍රාග්ධන අනුපාතය



වෙළෙඳපොල සහ ගනුදෙනුකරු



සම්ප්‍රදායික බැංකු ගනුදෙනුවලින් ඩිජිටල් මාර්ග තුළින් පවත්වන ලද ප්‍රමාණය **73%ට** වැඩිය.

අලුතින් ඇතුළත් වූ ගනුදෙනුකරුවන්
682,300

ප්‍රමුඛ ගනුදෙනුකාර අංශවලට සේවය සැලසීමට නව නිෂ්පාදන පැකේජ දෙකක් දියත් කිරීම

ගනුදෙනුකාර තෘප්තිය
90%ට වැඩිය

සේවකයින්



මුළු සේවක සංඛ්‍යාව
7,377

කාන්තා සේවිකාවන්
4,542

රඳවාගැනීමේ අනුපාතය
97.6%

මුළු පුහුණු පැයගණන
176,577

මුළු පුහුණු පිරිවැය
රු.මි. 92.8

ස්ථිර සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය **24**

ඩිජිටල් පුහුණුව පිළිබඳ පැය ගණන
40,970

ජාතික දායකත්වය

මුළු විශේෂ බදු සහ ගෙවූ ලාභාංශ
රු.බි. 661.

අපනයන, බලශක්ති සහ සෞඛ්‍ය වැනි අත්‍යවශ්‍ය අංශ සඳහා මූල්‍ය සහය ලබාදීම.



ව්‍යාපාර හවුල්කරුවන්

ලියාපදිංචි සැපයුම්කරුවන්
258

දේශීය සැපයුම්කරුවන් සඳහා නිර්මාණය කළ වටිනාකම **රු.බි. 14.8**



ප්‍රජාව

"මහජන මෙහෙවර" CSR සන්නාමය දියත් කිරීම

CSR වැඩසටහන්වල ආයෝජනය
රු.බි. 38.2



පරිසරය

ඩිජිටල් වශයෙන් විවෘත කළ ගිණුම්
මිලියන 2.7

සූර්ය බලයෙන් බලගැන්වෙන හරිත ශාඛා **20**



15

ඉහළ කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

16 / සභාපතිතුමාගේ පණිවිඩය
20 / සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය
24 / අධ්‍යක්ෂ මණ්ඩලය
28 / ආයතනික කළමනාකාරිත්වය
36 / විධායක කළමනාකාරිත්වය
38 / ප්‍රධාන කළමනාකරුවන්

සභාපතිතුමාගේ පණිවිඩය

අපි අපගේ ස්වෝත්සාහික වර්ධනය අපේක්ෂා කරන පදනම ලෙස ගනුදෙනුකාර අත්දැකීම් ප්‍රමුඛ කරණය කිරීමට කැපවී සිටිමු. මෙයට වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා ආමන්ත්‍රණය කරන බැංකුකරණ නිෂ්පාදන සහ සේවා නිර්මාණය කිරීම මෙන්ම ඒවා ඔවුන්ට සමීප මාර්ග තුළින් ලබාගැනීමට සැලැස්වීම ද ඇතුළත්ය.



සමාලෝචිත වසර, පසුගිය හැත්තෑ පස් වසරක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා වඩාත් ව්‍යාකූල වසර විය. අඩු වූ ප්‍රේෂණ, විදේශ විනිමය හිඟය, ඉහළ උද්ධමනය, සහ රුපියලේ ද්‍රවශීලතාව නොමැතිවීම සමඟ රට මහත් පීඩාකාරී තත්ත්වයකට පත් විය. ඊට අමතරව, විදේශීය ණය පැහැර හැරීම ද සිදු වූ අතර, එය ජාත්‍යන්තර ණයහිමියන් සමඟ ශ්‍රී ලංකාවේ ස්ථාවරය පහත වැටීමට හේතු විය. සැබැවින්ම මෙම සාර්ව-ආර්ථික හානිය ආර්ථිකයේ සෑම අංශයකම පැතිර පැවතුණි.

ස්වභාවිකව, මෙම විශාලත්වයේ ආකූලතාවයක බැංකුවට ඉන් ගැලවී සිටීමට නොහැක. වෙළෙඳපොල වාතාවරණය සැලකීමේදී, බැංකුවට ද්‍රවශීලතාව, ඉහළ පොළී අනුපාත, ඉහළ හාණිකරණය සඳහා වෙන් කිරීම, ලාභ ආන්තික සීමා කිරීම වැනි පැති ගණනාවක පීඩනය තුළින් ඉදිරියට යාමට සිදු විය. රටේ පහතවැටීම අපගේ විදේශීය හවුල්කරුවන් ණයදීම අත්හිටුවීමකට මඟ පාදන ලද අතර එය විශේෂයෙන් ඩොලර් ද්‍රවශීලතාවය තවදුරටත් සීමාවීමට හේතු විය.

නව උපායමාර්ගික දිශානතියක්

පෙර නොවූවිරූ තත්ත්වය තුළ, මධ්‍ය ධාරාවේ පාඨමාලා නිවැරදි කිරීමේ අවශ්‍යතාවකට අප මුහුණ දෙන ලදි. 2022-2024 කාලසීමාව සඳහා පවත්නා උපායමාර්ගික සැලැස්ම 2022-2025 පූනි දක්වා කාලසීමාව සඳහා පිළියෙල කළ නව සැලැස්මක් මගින් අවලංගු කරන ලදී. ශාඛාවල ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය ඇතුළුව සියලුම ප්‍රධාන පාර්ශවකරුවන්ගේ යෙදවුම් සමඟ මෙම සැලැස්ම සකස් කරන ලදී.

නව සැලැස්ම හඳුන්වාදීමට සමගාමීව, නව දැක්මක් සහ පුළුල් චින්තනයකට සහ දිගුකාලීන සාර්ථකත්වයක් නිර්මාණය කිරීමට ඉවහල් වන බලවේගයක් (BHAG) ප්‍රසිද්ධ කරන ලදී.

දැක්ම: පරිවර්තනීය වර්ධනය කරා ජාතිය දිරිමත් කිරීම (BHAG): බැංකු කර්මාන්තයේ ඉහළම සේවක තෘප්තිමත්භාවය සහ ගනුදෙනුකරුවන්ගේ වැඩිම ආකර්ශනය සහිත බැංකුව බවට පත්වීම.

සැලැස්ම සකස් කරන ලද සන්දර්භය තුළ, සැලැස්මේ ඊලඟ මට්ටම සඳහා ක්‍රියාවලි අරමුණු කළ දැක්මක් අපි ගෙනවිත් ඇත. මෙයට විශිෂ්ටත්වය මෙහෙයවීම, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩ නැගීම සහ අනාගතයට සූදානම් වීම යන උපායමාර්ගික අරමුණු තුන ඇතුළත්ය. අරමුණු සමඟ බැඳෙමින්, අපි තනි කඩිසර මානසිකත්වය (Lean-agile mindset), දත්ත පදනම් මානසිකත්වය (data driven mindset) සහ වර්ධන මානසිකත්වය (growth mindset) යන උපායමාර්ගික සක්‍රීයකාරක හඳුනාගෙන ඇත.

දෘඩ, අනම්‍ය සැලසුම් සුදුසු නොවන වර්තමානය වැනි වූ පරිසරයක, ඉහත කරුණු අවධාරණය කරන සැලැස්මක් වැඩි නම්‍යශීලභාවයක් ලබා දෙනු ඇත. ව්‍යාපාරික ඒකක සඳහා උපායමාර්ගික මුලපිරීම් 26ක්, සහය ඒකක සඳහා 6ක් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 600ක් පමණ සමඟ සැලැස්ම තවදුරටත් විස්තර කර ඇතත්, ක්‍රියාත්මක කිරීමේදී යම් නම්‍යතා අපි අපේක්ෂා කරමු.

බලවත් කැළඹීම තුළින් ඉදිරියට ගමන් කිරීම

සාර්ව ආර්ථික පරිසරයේ සියලුම පීඩනයන් හමුවේ, වසර තුළ බැංකුව ඉතා ප්‍රසංශනීය මූල්‍ය කාර්යසාධනයක් කරා ගමන් කර ඇත. වසර අවසානයේදී සමූහය රු.බි. 20.5ක බදු පෙර ලාභයක් සහ 17.2%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් වාර්තාකරන ලදී. මෙම ජයග්‍රහනයන් දෙකම මෙහෙයුම් සන්දර්භය තුළින් බැලීමේදී ප්‍රසංශනීය වේ. වික්සත් රාජධානියේ බැංකුකරුවන්ගේ සඟරාවක් වන The Banker Magazine (UK) මගින් මහජන බැංකුවට, ඒකාබද්ධ පළමු පෙළ ප්‍රාග්ධනය පිළිබඳ ශ්‍රේණිගතකරණය මත පදනම් වී ලෝකයේ ඉහළම බැංකු 1000න් එකක් ලෙස පිළිගැනීමක් අත්කර දී ඇත. අභියෝගාත්මක වාතාවරණයන් යටතේ ක්‍රියාත්මකවීමට මහජන බැංකුවේ ඇති ඔරොත්තුදීම සහ හැකියාව එහි විචක්ෂණ අවදානම් කළමනාකරණ ව්‍යවහාර, විභව අවදානම් සහ අභියෝග ආමන්ත්‍රණය කිරීමට ගන්නා සක්‍රීය ක්‍රියාමාර්ග සහ ශක්තිමත් ද්‍රවශීලතා ස්ථාවරයට ආරෝපිත කළ හැකිය.

සීමිත සම්පත් යන සන්දර්භය තුළ, ඒවායේ උපයෝජනය ප්‍රමුඛ කිරීමට අපට සිදු විය. විදේශ විනිමය සීමාවිම සමඟ, අත්‍යවශ්‍ය ආනයනවල අවශ්‍යතාව මත, අපනයන කර්මාන්ත වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා පවත්නා සම්පත් වෙන් කිරීමට අපට සිදු විය. මේ සියලුම දෑ සම්බන්ධයෙන් මෙන්ම ණය වර්ධනය පිළිබඳවද පරීක්ෂාකාරී මතයක් දැරීමට අපට සිදු විය.

වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම වැලැක්වීමේ පියවර ලෙස, වඩාත් ගැටළුසහගත ණය හඳුනාගෙන කළමනාකරණය සඳහා බරපතල ණය කළමනාකරණ ව්‍යවහාර ක්‍රියාත්මක කර ඇත. ද්‍රවශීලතාව අනුව. ද්‍රවශීලතා අවදානම සක්‍රීයව කළමනාකරණයු කරමින් සහ සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගනිමින් බැංකුව ශක්තිමත් ද්‍රවශීලතා ස්ථාවරත්වයක් පවත්වාගෙන ඇත. ඉහළ උද්ධමනය සහ පොළී අනුපාත හමුවේ, මහජන බැංකුව සිය අරමුදල් සම්මිශ්‍රණය ප්‍රශස්ථ කිරීමේ, එහි අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමේ සහ එහි පොළී අනුපාත අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමේ නියලී ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යසායකයින්ට සහ ග්‍රාමීය අංශයට සහයවීම

ග්‍රාමීය ජනතාවට සේවය කිරීමේ මූලික අරමුණින් මහජන බැංකුව ස්ථාපිත කරන ලද අතර, ජනතාවට සේවය කරමින් රජයේ පරමාර්ථවලට අනුව ආර්ථික සංවර්ධනයට සහයවන දැරියහැකි සහ පිවිසියහැකි බැංකුවක් ලෙස අඛණ්ඩව කටයුතු කරමින් අපගේ මූලික මූලධර්මවලට සැබැවින්ම අපි අනුකූලව සිටියෙමු. වර්තමාන පොළී අනුපාත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය ලබාගැනීම අභියෝගාත්මක කර තිබුනද, ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් විසින් අපට සහය වී ඇති බැවින් සහනශීලී අනුපාත යටතේ යම් අරමුදල් ප්‍රමාණයක් ලබාදීමට අපි සමත් වී ඇත. සැපයුම් දාම මූල්‍යකරණය සඳහා සහයවීමට සහ කුඩා ඉඩම්හිමියන්ට සහයවීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අපගේ අත්වැල සැපයීම පුළුල් කරන ලදී. ආර්ථික ස්ථාවරත්වය යලි යථා තත්ත්වයට පත්වූ පසු සහ අනුපාත අඩු වූ පසු, අපගේ නොසැලෙන සහයෝගය ඇතිව ඔවුන්ගේ සාමාන්‍ය මෙහෙයම් නැවත ආරම්භ කිරීමට ඔවුන්ට හැකි වනු ඇත.

අපි වර්ධනය සඳහා අඛණ්ඩව ඉදිරියට යන අතර, සිය ගනුදෙනුකරුවන්ට සහ ආර්ථිකයට සහයවන බැංකුවක් ලෙස අපගේ මූලික වටිනාකම්වලට එකඟව කටයුතු කරමු.

ඩිජිටල් නායකත්වය සහ ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව

ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව අපගේ උපායමාර්ගික පරමාර්ථවලින් එකක් වන අතර ඩිජිටල්කරණය එම විශිෂ්ටත්වය මෙහෙයවීමේදී තවත් එක ප්‍රධාන තෙරපුමකි.

මේ සම්බන්ධයෙන්, අපගේ ඩිජිටල් ප්‍රමුඛ සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශය අපට තරඟකාරිව සිටීමත් වසර ගණනාවක් පුරා සැලකියයුතු වර්ධනයක් අත්කරගෙන ඇති බවත් සහ අපි මෙම උපායමාර්ගය මත තවදුරටත් ගොඩ නැගෙන බවත් සටහන් කිරීමට ලැබීම මට සතුටකි. තවද, අපි ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ඩිජිටල් බැංකුව ලෙස පත්වීමට අපි උත්සාහ දරන බැවින්, අනාගතයේදී සම්පූර්ණ මාර්ගගත බැංකුකරණ අත්දැකීම පිරිනැමීමේ හැකියාව ගවේශනය කිරීමට අපි උත්සුක වෙමු. අපගේ ඩිජිටල්කරණ උපායමාර්ගයේ සාර්ථකත්වය ගනුදෙනුවලින් 70%ට වැඩියෙන් ඩිජිටල් ආකාරයෙන් සිදුකරන්නේය යන සාධකය මගින් පෙන්වා දී ඇත.

වසර තුළ ගනු ලැබූ තවත් පියවරක් වන්නේ නව වෙබ් අඩවිය දියත් කිරීම වන අතර එයට නුදුරු අනාගතයේදී Chatbot පහසුකමද අපි එකතු කරන්නෙමු. ඇමතුම් මධ්‍යස්ථානය වැඩිදියුණු කළ හැකියාවන් සහිතව සේවය ලබා දෙන අතර, පීපල්ස් පේ (People's Pay) යෙදවුමෙහි විශේෂාංග තවදුරටත් වර්ධනය කරන්නෙමු.

ලෝක ළමා දිනය සිහිපත් කිරීම සඳහා, මහජන බැංකුව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇතුලත් බාලවයස්කාර ගිණුම් ඉලක්ක කරමින් 2022 ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31 දක්වා බාලවයස්කාර ඉතුරුම් තැන්පතු වැඩසටහනක් දියත් කරන ලදී.

නව ක්ෂේත්‍රවලට පියවර තැබීම

තවත් නවෝත්පාදන පියවරක් වන්නේ දැනටමත් ක්‍රියාත්මක කර ඇති Excelsior සහ Elegance සේවා සමඟ ධනවත් ගනුදෙනුකාර වෙළෙඳපොල වෙත විශේෂයෙන් සේවාවන් සලසන සහ දැනට වර්ධනය කිරීමේ ක්‍රියාවලිය තුළ පවත්නා මාර්ග වේ. විදේශීය ප්‍රේෂණ සඳහා "වාසි කෝටියයි" ප්‍රවර්ධන වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක අතර එය දිරිගන්වනසුළු ප්‍රතිඵල අත්කරගෙන ඇත. මෙයට පෙර සාපේක්ෂව පැවති කුඩා වපසරිය තුළ අපගේ වෙළෙඳපොල කොටස සැලකියයුතු ලෙස වැඩි වී ඇත.

නව අපනයන අවස්ථා නිර්මාණය කරමින් දේශීය නිෂ්පාදකයින් සහ විදේශීය ගැණුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩ නැගීමට අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ හවුල් වූ අවස්ථාවේදී අපි අපගේ සම්ප්‍රදායික කාර්යභාරයෙන් ඉදිරියට ගමන් කල බව තහවුරු කළෙමු. අපනයන සංවර්ධන මණ්ඩලයට අපනයන ක්‍රියාපටිපාටි, රෙගුලාසි සහ නැවිගත කිරීම ඇතුළුව අපනයනවල බොහෝ අංග පිළිබඳ අපගේ ගනුදෙනුකරුවන්ට සහයවීමට මෙමගින් හැකි විය.

ප්‍රති සන්නාමකරණය සහ "පහසු අලෙවිය"

වර්තමාන ආර්ථික වාතාවරණය තුළ, ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙක් ආක්‍රමණශීලී "දැඩි අලෙවිකරණ" ප්‍රවේශයක් සඳහා වගකිව යුතු නැති යන සාධකය අපි හඳුනා ගත්තෙමු. මහජන බැංකු සන්නාමයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වූ "මහජන මෙහෙවර" සන්නාමය හඳුන්වා දුන් අතර එය අපගේ සන්නාමකරණයේ සුපැහැදිලි විතැන්වීමක් සිදුකළ අතර "මහජන මෙහෙවර" යටතේ අපගේ ආයතනික සමාජ සත්කාරක කටයුතු අපි කරන්නෙමු. මෙම නව සන්නාමය යටතේ සිදුකළ කටයුතුවලට දුෂ්කර ග්‍රාමීය පාසල්වලට විදුලිය සහ ජලය ලබාදීම ඇතුළත් විය. අපගේ 61වැනි සංවත්සරය සැමරීම සඳහා, ලේඩි රිජ්වේ ළමා රෝහල වෙත ඔවුන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලමින් රු.බි. 5ක් වටිනා ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කරන ලදී.

ඊට අමතරව. "Feed A Child" අරමුදල් රැස්කිරීමේ වැඩසටහන සඳහා රු.මී. 1 ක මූලික පරිත්‍යාගයක් සිදුකළ අතර, එය "මනුසත් දොරණ" සහ ශ්‍රී ලංකා ළමාරෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් සංවිධානය කරන ලදී.

බුද්ධ සාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මධ්‍යම සංස්කෘතික අරමුදල (CCF) සමඟ සහයෝගි හවුල්කාරත්වයක් අපි ඇති කරගෙන ඇත. මෙම හවුල්කාරත්වය තුළින්, ප්‍රවේශපත් මිලදී ගැනීම සඳහා බහුභාෂාමය, වෙබ් පාදක අවකාශයක් සහ ප්‍රවේශපත් සත්‍යාපනය කිරීමට CCF සඳහා ජංගම යෙදුමක් ඇතුළත් කරමින් CCF සඳහා උසස් ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත් විසඳුමක් (e-Ticketing Solution) අපි නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනින් අපගේ විදේශ විනිමය තැන්පතු පදනම ශක්තිමත් කිරීමට සහ බැංකුව සඳහා ලැබෙන ගාස්තුවලින් අමතර ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම අපි "පහසු අලෙවිය" උපායමාර්ගය සමාජ මාධ්‍ය තුළට ගෙවිත් ඇත. අපගේ YouTube නාලිකාව තුළින්, බැංකුකරණයට සෘජුවම අදාළ නොවන හෝ යම් ව්‍යාපාර පරමාර්ථවලට ගැලපෙන අර්තාර්ගතයන් අපි බෙදාහරින්නෙමු, ගනුදෙනුකාර පහසුව ඇති කිරීම සඳහා වර්ණ සහ පිරිසැලැස්ම භාවිතය සමඟ අපගේ ශාඛාවල භෞතික පෙනුම ද වැඩි කිරීමේ ක්‍රියාවලියකට භාජනය කර ඇත.

අනාගතය සඳහා මෘදු කුසලතා සංවර්ධනය

අපගේ BHAG අරමුණුවලින් එකක් වන්නේ ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම සේවක තෘප්ති මට්ටම් අත්කර ගැනීමයි. සේවක තෘප්තිමත්භාවය සේවක සමීක්ෂණයක් තුළින් අඛණ්ඩවම ශ්‍රේණිගත කරනු ලබන අතර අපගේ ශ්‍රේණිගත කිරීම් වැඩි කිරීමේ උත්සාහය තුළ අපි සිටිමු. 2022 දී සිදු වූ වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සහ නව උපායමාර්ගික සැලැස්මට සහ උපායමාර්ගික පරමාර්ථවලට සමගාමීව, මෘදු කුසලතා සඳහා වැඩිපුර අපගේ පුහුණු වැඩසටහන් අපි නැවත කේන්ද්‍රගත කරමින් සිටිමු. විධායක කළමනාකාරිත්වය සඳහා වැඩසටහනක් ආරම්භ කරන ලද අතර ඉන් මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ මට්ටම්වලදී කාර්ය මණ්ඩලයට අවශ්‍ය විශ්ලේෂණාත්මක සහ සංකල්පිත කුසලතා කෙරෙහි වැඩි අවධානය යොමු කරමු. ආවරණය කළ යුතු විෂයයන් අතර ගනුදෙනුකාර සේවා අනර්ඝත්වය, ගනුදෙනුකාර කේන්ද්‍රීය මානසිකත්වය සහ පුද්ගල සංවර්ධනය ඇතුලත්ය.

දක්ෂ, ඉහළ නිපුණත්වයකින් යුත් සේවකයන් බැංකුවෙන් ඉවත්වීම බරපතල ගැටළුවක්ව පවතින අතර ඒ සඳහා වෘත්තිය දියුණුව මෙන්ම වෘත්තීය සංවර්ධනය ඇති කිරීම සඳහා තරඟකාරී වැටුප්, අවස්ථාවන් වැනි දිරිදීමනා වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සහ සේවක සහභාගිත්වය සහ පක්ෂපාතිත්වය පෝෂණය කරන ධනාත්මක සේවා පරිසරයක් නිර්මාණය කිරීම මගින් අපි ප්‍රතිචාර දක්වා ඇත.

යෝජිත නව මානව සම්පත් පද්ධතිය තුළින් වර්තමානයේ බොහෝ සෙයින් අත්හුරු ක්‍රමයට සිදුකරන මානව සම්පත් ක්‍රියාවලි බොහෝමයක් ස්වයංක්‍රියකරණය කරනු ලැබේ. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම්-පරිමාණ සැකසීමේදී වෙනත් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේදී මෙය වඩා ඉහල නම්‍යශීලිභාවයක් අපට ලබා දෙනු ඇත.

පුද්ගලික අංශය සමඟ අපගේ වැටුප් තරඟකාරී නොවීම හේතු කොට ගෙන දක්ෂ කාර්ය මණ්ඩල හිඟයෙන් පීඩා විඳින තොරතුරු තාක්ෂණ වැනි ක්ෂේත්‍රවල මෙය ඉහළ වාසියක් වනු ඇති අතර ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා වන වේතනය කෙතරම් දුරට යාවත් කළ යුතු ද යන්න සම්බන්ධයෙන් අපි බාධාවන්ට මුහුණ දී සිටිමු.

ඉදිරි වසර සඳහා උපායමාර්ගය සහ අනාගත අභියෝගවලට මුහුණ දීම

අපගේ උපායමාර්ගික පරමාර්ථවල තෙවැන්න වන්නේ අනාගතයට සූදානම් වීමයි. මහජන බැංකුව විභව අවදානම් හඳුනාගැනීම සහ ඒවා අවම කිරීමට පියවර ගැනීම හා සම්බන්ධයෙන් ඔරොත්තුදීම වැඩි කිරීමට සක්‍රිය ප්‍රවේශයන් අරගනිමින් ඉතා වේගයෙන් වෙනස්වන පරිසරයක් තුළ එහි ලාභදායිතාව පවත්වා ගෙන ඇත. මෙයට නම්‍යශීලී උපායමාර්ගික ප්‍රවේශයක යොදා ගැනීම, තාක්ෂණයේ වාසිය භාවිතා කිරීම සහ කළඹ විවිධාංගීකරණය කිරීම ඇතුළත් වේ.

වෙළෙඳපොල සහ බැංකු අතර කම්පනවල බලපෑම අවම කිරීම සඳහා, අපි අයකිරීම් සැලසුම් සකස් කර ඇති අතර, එය කළඹ තුළ පීඩන පරීක්ෂාව, අහඹු සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ විභව ද්‍රවශීල සම්පත් හඳුනා ගැනීම හා සම්බන්ධ වේ. බැංකුව අනාගත අවදානම් සැලකියයුතු මට්ටම්වලට පත්වීමට පෙර ඒවා හඳුනා ගැනීමට පූර්ව අවදානම් නියාමන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇත.

මෙය වෙළෙඳපොල ප්‍රවණතා විශ්ලේෂනය කිරීම, ගනුදෙනුකාර හැසිරීම නිරීක්ෂණය සහ නියාමන සංවර්ධනයන් පසුවිපරම් කිරීම හා සම්බන්ධ වේ.

වර්තමාන ආර්ථික කොන්දේසි සැලකිල්ලට ගැනිමේදී, අපි ණයවල වර්ධනයේ වේගය අඩුකර ඇති අතර ප්‍රමාණයට වඩා ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙය ණයවල ප්‍රමිති දැඩි කිරීම, අවදානම් නිරාවරණය අඩු කිරීම, සහ ඉහළ ආන්තික සහිත ව්‍යාපාර මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම හා සම්බන්ධ වේ. තරුණ සහ සහශ්‍ර වසරවලින් පැමිණෙන අපගේ ගනුදෙනුකාර පදනමේ කොටස වැඩි කිරීමක් සමඟ, ඉදිරි වර්ෂවල වැඩිවන ලාභාංශ ගෙවීමට ඩිජිටල්කරණය කෙරෙහි අපගේ අවධානය අපට අපේක්ෂා කළ හැකිය.

මහජන බැංකුව අපනයනකරුවන්ට අඛණ්ඩවම සහයවන අතර දේශීය නිෂ්පාදකයින් සඳහා දිරිදීමනා පිරිනමමින් සහ වෙළෙඳ මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කරමින් අපනයන අරමුණු කළ ව්‍යාපාර වෙත මූල්‍ය ලබාදෙමින් නිෂ්පාදනය දිරිමත් කරයි. බැංකුව යටිතල පහසුකම් ව්‍යාපෘති, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා මුදල් ලබාදෙමින් සහ අපනයන කටයුතු ප්‍රවර්ධනය කිරීමට රජයේ ආයතන සමඟ හවුල් වෙමින් ව්‍යාපෘති අරමුදල් සඳහා දිගුකාලීන ණය පිරි නමන්නෙමු. ගෝලීය උණුසුම සහිත වර්තමාන තත්ත්වය සැලකීමේ දී පුනර්ජනනීය බලශක්තිය අනාගතයේදී ප්‍රමුඛ ක්ෂේත්‍රයක් වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

සයිබර් ආරක්ෂාව පිළිබඳ තර්ජනයට ප්‍රතිචාරාත්මකව, මහජන බැංකුව සයිබර් ප්‍රහාරවලට විරුද්ධව ආරක්ෂාවීම සඳහා ශක්තිමත් ආරක්ෂක ක්‍රියාමාර්ග සහ නීති ක්‍රියාත්මක කර ඇත. මෙයට නිරන්තර අනතුරට භාජනයවීම පරීක්ෂණය සහ විනිවිදියාමේ පරීක්ෂණය ද, පරිශීලක ගිණුම් සඳහා බහුසාධක සහතික කිරීම, සංවේදී දත්ත සම්මිතිකකරණය, සහ මතුවන තර්ජනවලට වඩා ඉදිරියෙන් සිටීමට ආරක්ෂක මෘදුකාංග සහ පද්ධති නිරන්තරව යාවත් කිරීම ද ඇතුළත් ය. මෙය තර්ජන සැමදා වැඩිවන සහ අපිට අඛණ්ඩව විමසිලිමත්ව සහ අවදියෙන් සිටීමට සිදුවන ක්ෂේත්‍රයක් බව අපි ඉතා හොඳින් දැනුවත්ය.

සාර්ව-ආර්ථික ස්ථාවරය ඇතුළුව විවිධ පෙරමුණු මත අපි සංවර්ධනයන් සමීපව නියාමනය කරමින් සිටින අතර අවශ්‍යනම් සෑම අවස්ථාවකදීම, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව විවිධ පාර්ශවකරුවන් සමඟ සහතික කිරීමට සහභාගි වී ඇත. ඉතා වැදගත් ස්වභාවයේ කරුණු සම්බන්ධයෙන් බැංකුව සහ නුසුදුසු ප්‍රතිවිපාකවලින් සමස්ත මූල්‍ය පද්ධතිය ආරක්ෂා කරන අකාරයෙන් කටයුතු කරනු ලබයි.

"වඩා විශේෂයෙන්, අපගේ වටිනා ගනුදෙනුකරුවන් සහ පාර්ශවකරුවන් වෙත – අපගේ සාර්ථකත්වය නොඅනුමානයෙන්ම ඔබය. අප කෙරෙහි ඔබගේ අඛණ්ඩ විශ්වාසය සහ ලැදියාව මෙයට පෙර නොදුටු ආකාරයකින් ඔබ වෙත සේවය කිරීමට අපව ශක්තිමත් කිරීම මෙන්ම ප්‍රමාණාත්මක සහ ගුණානාත්මක යන දෙඅංශයෙන්ම බැංකුකරණ සහ මූල්‍ය සේවා අවකාශය තුළ වෙනත් ආයතනවලින් වෙනස් වූ විශිෂ්ඨත්වයක් පෙන්නුම් කිරීමට සහය ලබා දී ඇත"

හානිකරණ වර්ගීකරණයේ තර්ජනයට ප්‍රතිචාර දැක්වීම වශයෙන් මහජන බැංකුව, වඩා දැඩි ණයදීමේ නිර්ණායක ක්‍රියාත්මක කිරීම, ණයකරුවන් පිළිබඳ නිසි සැලකිල්ල යොමු කිරීම සහ ඔවුන්ගේ ණය යෝග්‍යතාව වඩාත් සමීපව නියාමනය කිරීම වැනි අවදානම් කළමනාකරණය සහ ණය විශ්ලේෂණය සඳහා වූ දැඩි ප්‍රවේශයක් යොදා ගෙන ඇත. එමෙන්ම බැංකුව පාරිසරික සාමාජීය සහ පාලන අංශයෙන් තිරසාර සංවර්ධනයන් කෙරෙහි සමීපව නිරීක්ෂණය කරයි.

මගේ අවංක කෘතඥතාව පළ කිරීම

මෙවැනි අභියෝගාත්මක කාලවලදී සුවිශේෂී ප්‍රඥාවක් සහ දැක්මක් ඇති පිරිමින් සහ කාන්තාවන් කැඳවන අතර ඔවුන්ට දැඩි සහ නිවැරදි තීරණ ගැනීමට ධෛර්ය ඇත. මුදල් අමාත්‍යවරයා වශයෙන් සේවය කරන අතිගරු ජනාධිපතිතුමා. ගරු අගමැතිතුමා සහ මුදල් පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරුන් වෙත මෙවැනි අති විශේෂ දුෂ්කර වාතාවරණයන් තුළ ඔවුන්ගේ නායකත්වය වෙනුවෙන් මගේ අවංක අගය කිරීම සහ කෘතඥතාව මම පළකර සිටිමි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා, ජනාධිපති ලේකම්තුමා, භාණ්ඩාගාර ලේකම්තුමා, සහ ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන් වෙත අදාළ සෑම අවස්ථාවකදීම ඔවුන්ගේ සහය සහ මඟපෙන්වීම වෙනුවෙන් අපගේ හදපිරි කෘතඥතාව පළකර සිටිමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත, මෙම අභියෝගාත්මක කාලයන් තුළින් අපි ආයතනය ඉදිරියට ගෙන ගිය බැවින් ඔබගේ කැපවීම සහ නැණවත් උපදෙස් වෙනුවෙන් ඔබ වෙත අතිශය ස්තූතිය පුද කර සිටිමි, තවද, අපගේ විශ්‍රාම යන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි, රංජිත් කොඩිතුවක්කු මහතා වෙත ඔහුගේ ගතික නායකත්වය වෙනුවෙන් මෙන්ම වත්මන් ප්‍රධාන විධායක නිලධාරි සාමාන්‍යාධිකාරි (වැඩ බලන) ක්ලයිව් ෆොන්සේකා මහතා ප්‍රමුඛ කළමනාකාරිත්වය සහ සියලුම මට්ටමේ කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ උත්සාහයන් වෙනුවෙන් සුවිශාල ස්තූතියක් මම පුද කරමි.

වඩා විශේෂයෙන්, අපගේ වටිනා ගනුදෙනුකරුවන් සහ පාර්ශවකරුවන් වෙත – අපගේ සාර්ථකත්වය නොඅනුමානයෙන්ම ඔබය. අප කෙරෙහි ඔබගේ අඛණ්ඩ විශ්වාසය සහ ලැදියාව මෙයට පෙර නොදුටු ආකාරයකින් ඔබ වෙත සේවය කිරීමට අපව ශක්තිමත් කිරීම මෙන්ම ප්‍රමාණාත්මක සහ ගුණානාත්මක යන දෙඅංශයෙන්ම බැංකුකරණ සහ මූල්‍ය සේවා අවකාශය තුළ වෙනත් ආයතනවලින් වෙනස් වූ විශිෂ්ඨත්වයක් පෙන්නුම් කිරීමට සහය ලබා දී ඇත.



සුජීව රාජපක්ෂ
සභාපති

2023 මාර්තු 2

සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

සාර්ව ආර්ථික පරිසරය තුළ සිදුවන වර්ධනයන් අපගේ උපායමාර්ග නැවත සකස් කිරීමට සහ නව ආර්ථික යථාර්ථය පිළිබිඹු කරන ප්‍රගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අපට සහය වනු ඇත.



පසුගිය 61 වසර පුරා බලවත් බාධාවන් ජය ගැනීමේ පොහොසත් උරුමයක ආශීර්වාදය සමඟින්, මහජන බැංකුව ආයතනයක් ලෙස අබණ්ඩව පැවතීමට, මෙතෙක් විඳදරා ගැනීමට සිදු වූ අතිශය බැරෑරුම් අභියෝග කිහිපයක් සාර්ථකව ජය ගැනීමට සමත් වී ඇත. සමස්ත රට විසින් මුහුණ දුන් බරපතල ආර්ථික කැලඹීම එවැනි අභියෝගවල පදනම් සකස් කළ අතර, දළ දේශීය නිෂ්පාදිතය තුළ සෘණාත්මක වර්ධනයක් ඇති කිරීම, සංචාරක කර්මාන්තය බිඳවැටීම, අභ්‍යන්තර ප්‍රේෂණවල දැඩි පහත වැටීම සහ රටෙහි ස්වෛරී ශ්‍රේණිගතකිරීම පහත වැටීම හේතු විය. එය විදේශ විනිමය පහසුකම්වල සැලකියයුතු අඩු වීමකට හේතු වූ අතර එවැනි අහිතකර වාතාවරණයන් යටතේ ශ්‍රී ලංකාවේ බැංකුවලට ණයදීමට ජාත්‍යන්තර බැංකුවල වූ අකැමැත්ත එය තවදුරටත් දුර්වල තත්ත්වයට පත් කරන ලදී.

ජාතික අවශ්‍යතාවන් ප්‍රමුඛ කිරීම

බැංකුව විසින් මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ රටේ දරුණු ආර්ථික දුෂ්කරතා තුළ දැනටමත් හිඟ වූ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමයි. අත්‍යවශ්‍ය අයිතම පමණක් ආනයනය සඳහා ඇමෙරිකන් ඩොලර් පහසුකම් ලබාදීම මගින් සිය විදේශ විනිමය හිඟය මඟහරවා ගැනීමට ජාතියට සහයවීමේදී බැංකුව විසින් ඉටුකළ ප්‍රධාන කාර්යභාරය මගින් මෙය තවදුරටත් තීව්‍ර කරන ලදී. මහජන බැංකුව මෑත වසර තුළ පොහොර ආනයනයට අමතරව ආසන්න වශයෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන 2ක් වූ සමස්ථ ඉන්ධන ආනයනයෙන් 50%ක ආනයනයට මෙන්ම ගල්අඟුරු ආනයනයේ 100%ක් සහ එන්නත් ඇතුළුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සිදු කරන ඖෂධ ආනයන බොහොමයක් සඳහා මුදල් ලබාදීමට සහය විය.

අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා රාජ්‍ය ව්‍යවසායකයින් (SOEs) සඳහා අපගේ සහය රු.බි. 700ට වඩා වැඩි ය. එවැනි පහසුකම් පිරිනැමීම බැංකුවේ ද්‍රවශීලතාව කෙරෙහි අති විශාල පීඩනයක් ද ඇති කරන ලදී.

සැලකියයුතු අභියෝග

පසුගිය වසරේ අප්‍රේල් හි ආරම්භ වූ පොළී අනුපාතවල පෙර නොදුටුවිරූ වැඩිවීම බැංකුව විසින් මුහුණ පෑ තවත් එක් බාධාවක් විය. අන්තර් බැංකු වෙළෙඳපොල තුළ හිඟය 2022 අප්‍රේල් හිදී රු.බි. 800ක ඉහළ වාර්තාවට ලඟා විය. තැන්පතු ආකර්ෂණය කර රඳවා ගැනීම සඳහා 30-33% පොළී අනුපාත ගෙවීමට බැංකුවලට බලකරන ලදී. ඊට අමතරව, බොහෝ පුද්ගල ගනුදෙනුකරුවන් මෙන්ම බරපතල මූල්‍ය දුෂ්කරතාවන් සහිත ව්‍යාපාරික මෙන්ම සමාගම් ණය ආපසු ගෙවීම පිළිබඳ ඔවුන්ගේ වගකීම ඉටු කිරීමට අසමත් විය. මෙවැනි වර්ධනයන් රුපියලේ ද්‍රවශීලතාව කෙරෙහි දැඩි පීඩනයන් ගෙන දුන්හ.

ශ්‍රී ලංකා රුපියල ඉහළ උද්ධමන මට්ටම් සමඟ කෙටි කාලසීමාවක් තුළ ආසන්න වශයෙන් 80%කින් අවප්‍රමාණය විය. රජය විසින් ණය විලම්භන කාලසීමාව ප්‍රකාශකල විට, බොහෝ බැංකු තමන්ගේ ඇමෙරිකන් ඩොලර් වත්කම්වල සැලකියයුතු හානිකරණයන්ට මුහුණ දුන්හ. මහජන බැංකුව ප්‍රධාන පුද්ගලික බැංකු සහ වෙනත් රාජ්‍ය බැංකුවලට සාපේක්ෂව ජාත්‍යන්තර ස්වෛරීයත්ව බැඳුම්කරවලට අපගේ අවම නිරාවරණය සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට ශූන්‍ය නිරාවරණය හේතු කොට ගෙන මෙම තත්ත්වය සාර්ථකව මඟහරවා ගතහැකි විය.

මූල්‍ය කාර්යසාධනය

සමූහය රු.බි. 20.5ක මධ්‍යස්ථ බදු පසු ලාභයක් වාර්තා කර ඇති අතර එය රු.බි. 28.1ක්ව පැවති 2021 අගයට සාපේක්ෂව 26.9%ක අඩුවීමකි. මෙම හානිකරණ කාර්යසාධනයට මූලික වශයෙන්ම වඩාත් ලාභදායී අවස්ථාවන් හඹායාමට වඩා ජාතික ආර්ථිකයට සහයවීම කෙරෙහි අපගේ අවධානය හේතු විය.

අපගේ ප්‍රාග්ධන මට්ටම් 16.3%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් සහිත ශ්‍රී ලංකාවේ පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු අතර ඉහළම බැංකුව ලෙස රඳා පැවති අතර සමූහ මට්ටමේදී එය 17.2%ක් විය.

"රජය විසින් ණය විලම්භන කාලසීමාව ප්‍රකාශකල විට, බොහෝ බැංකු තමන්ගේ ඇමෙරිකන් ඩොලර් වත්කම්වල සැලකියයුතු හානිකරණයන්ට මුහුණ දුන්හ. මහජන බැංකුව ප්‍රධාන පුද්ගලික බැංකු සහ වෙනත් රාජ්‍ය බැංකුවලට සාපේක්ෂව ජාත්‍යන්තර ස්වෛරීයත්ව බැඳුම්කරවලට අපගේ අවම නිරාවරණය සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට ශූන්‍ය නිරාවරණය හේතු කොට ගෙන මෙම තත්ත්වය සාර්ථකව මඟහරවා ගතහැකි විය."

ඊට අමතරව, ජාත්‍යන්තර ස්වෛරීයත්ව බැඳුම්කර මත ඇමෙරිකන් ඩොලරයට ශත 35ක හානිකරණයක් අපි ලබාදී ඇති අතර එය රටතුළ දැනට ලබාගතහැකි ඉහලම වෙන්කිරීම්වලින් එකකි.

මෑත වසරවලදී රජයට යම් සැලකියයුතු ප්‍රමාණයක ලාභාංශ අපි ගෙවා නොමැති අතර අපගේ ඉතාම යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම් සඳහා මෙය ප්‍රධාන හේතුවක් විය. තවද, ඉහළ හිතකර අනුපාතයක් වන ආසන්න වශයෙන් 11%ක බරතබනලද සාමාන්‍ය අනුපාතයකට 2019 දී රු.බි. 10ක් වන සහ 2020 දී රු.බි. 20ක් වන, රු.බි. 35ක මුළු වටිනාකමකින් යුතු බාසල් III අවශ්‍යතාවන්ට අනුකූල ස්ථර දෙකේ ණයකර අපි නිකුත් කර ඇත.

වසර සඳහා අපගේ සමූහ කාර්යසාධනයේ ප්‍රධාන අංග පහත දැක්වේ:

- පිරිවැටුම/මුළු මෙහෙයුම් ආදායම් රු.බි. 130.0ට ලඟාවිය (2021: රු.බි. 110.7 කි. වර්ධනය: 17.4%)
- සමස්ථ ශුද්ධ තැන්පතු 13.0%කින් වර්ධනය වූ අතර රු.බි. 2,450.1ට ලඟාවිය. මෙමගින් රුපියල් තැන්පතු වර්ධනය 10.2%ක් විය.
- ශුද්ධ ණය 3.8%කින් පහත වැටීමට ලක්වූ අතර එය රු.බි. 1,915.8ක් විය. (2021 අවසානයට රු.බි. 1,990.7කි)
- බැංකුවේ පළමු පෙළ සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පිළිවෙලින් 13.3%ක් සහ 17.2%ක් විය.
- සියලුම ප්‍රධාන නියාමන අවශ්‍යතා වසර අවසානයේදී සාර්ථක සපුරාලන ලදී.

අවධානය යොමුකළ යුතු මූලික ක්ෂේත්‍ර

අපි ආමුඛ විදේශ විනිමය ප්‍රේෂණ ශක්තිමත් කිරීමේ අපගේ ඉලක්කය තුළ නොසැලී රැඳී සිටින අතර 6% සිට එම ප්‍රමාණයේ දෙගුණයට වඩා සාර්ථකව වැඩිකරගෙන ඇත. අපගේ මෙම උත්සාහයන්ට අපගේ නව වැඩසටහනට අමතරව හිතකර විනිමය අනුපාතද සහය විය. රු.මි. 30ට වැඩි වටිනාකමක් සහිත ප්‍රතිලාභ සමඟ ගනුදෙනුකරුවන් අභිප්‍රේරණය කරන "People's Remittance වාසි කෝටියයි" ප්‍රවර්තන වැඩසටහන් වර්ධනයට සහය විය.

ඩිජිටල් නාලිකා පිළිබඳ අපගේ අවධාරණයන් හේතුවෙන් සමස්ථ ගනුදෙනුවලින් 73%ට වඩා දායක වෙමින් ඩිජිටල් ගනුදෙනුවල සැලකියයුතු වැඩිවීමක් අත්කරගෙන ඇත. මෙම සංඛ්‍යාව 80% හෝ 90% දක්වා තවදුරටත් වැඩි කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. මහජන බැංකුවේ යෙදුම තුළින්, අපගේ ගනුදෙනුකරුවන්ට තත්පර ගණනක් තුළ විවිධ ගනුදෙනු ඉටුකළ හැකි අතර එය ඔවුන්ගේ ජීවිතවලට අමතර පහසුවකි. දැනට බොහෝ කාර්යයන් ස්වයංක්‍රීය කෙරෙන බැවින් අපගේ ඩිජිටල්කරණ ගමන නව සේවක බඳවා ගැනීම් අඩු කිරීමට අපව ශක්තිමත් කර ඇත.

ඉන්ධන අර්බුද හමුවේ වුවත්, අපගේ ශාඛා සහ විශේෂ බැංකුකරණ ඒකක (SBUs) බහුතරයක් මෙන්ම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ බිල්පත් ගෙවීමේ යන්ත්‍ර (KIOSKs) ක්‍රියාත්මකව පැවතුණි. ඊට අමතරව, කිසිදු බාධාවක් නොමැතිව අපි විශ්‍රාම වැටුප් සහ රජයේ සහනාධාර ගෙවීමට පහසුකම් සලසන ලදී.

වර්තමානයේ අවධානය යොමු වන්නේ රජයට අයත් ආයතන, පුද්ගලික ව්‍යවසාය සහ පුද්ගලයින් වෙත ලබාදුන් ණය අයකර ගැනීමටය.

දැනට පවත්නා ඉහළ පොළී අනුපාත හේතු කොට ගෙන ණය වර්ධනය කෙරෙහි අපගේ අවධානය අපි අඩුකර ඇත. උද්ධමනය සහ පොළී අනුපාතවල අපේක්ෂිත අඩු කිරීමත් සමඟ 2023හි දෙවැනි අර්ධය තුළ ණය වර්ධනය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

"ජාතික සංවර්ධනයට කැපවී සිටින රාජ්‍ය බැංකුවක් ලෙස, ආර්ථිකයට නැතිවම බැරි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) වෙත අපගේ සහය ලබා දීමට අපි නොසැලී සිටිමු."

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (MSMEs) අංශයට සහයවීම

ජාතික සංවර්ධනයට කැපවී සිටින රාජ්‍ය බැංකුවක් ලෙස, ආර්ථිකයට නැතිවම බැරි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) වෙත අපගේ සහය ලබා දීමට අපි නොසැලී සිටිමු. සහනශීලී යෝජනා ක්‍රම, පොළී සහන සහ ණය විලම්භන කාලසීමාවන්ට අමතරව ආකර්ෂණීය පොළී අනුපාත යටතේ ණය පිරිනමන යෝජනා ක්‍රමවලට අපි අරමුදල් ලබා දී ඇත. මූල්‍ය අන්තර්කරණය වැඩි කිරීමට, මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට, මුදල් ප්‍රවාහ කළමනාකරණය, ගිණුම්කරණයට සහයවීමට සහ ව්‍යවසායකයින් අතර ව්‍යාපාර පුළුල් කිරීමේදී ආධාර කිරීමට බැංකුව පියවර රැගෙන ඇත. බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයනවල නියැලී සිටින බැවින් අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගිත්වයෙන් ව්‍යවසායකයින් සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත. ඊට අමතරව, විදේශීය ගැනුම්කරුවන් සමඟ හවුල්කාරත්වයන් ගොඩ නැගීමට අපි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය වී ඇති අතර විදේශීය තානාපතිවරුන් සමඟ සමහර වැඩසටහන් ක්‍රියාවට නැංවීම ආරම්භ කර ඇත.

ආයතනික යහපාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

අපි ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ව්‍යවසාය සඳහා ආයතනික යහ පාලනය පිළිබඳ මනා පරිචයන් යොදා ගෙන ඇත. මෙය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ බැංකුකරණය පිළිබඳ බාසල් කමිටුවේ යෙදුම් සමඟ මුදල් අමාත්‍යංශයේ මුලපිරීමකි.

බැංකුකරණය පිළිබඳ බාසල් කමිටුවේ යෝජනා අපි ක්‍රියාත්මක කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මහජන බැංකුව තුළ විධායක බලතල නොදරන බව එහි දක්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවන්ට අනුකූලව අපි මණ්ඩල සහ කමිටු පත් කර ඇත.

අනුකූලතා කාර්යය, ව්‍යවස්ථාපිත රෙගුලාසි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ සහ උපදෙස්වලට අනුකූලව සහ මහජන බැංකුවේ ආචාර ධර්ම සංග්‍රහයට සහ මුදල් විශුද්ධිකරණ ප්‍රතිපත්ති පිළිපැදීම සහතික කිරීමට ස්ථාපිත කර ඇත. බාහිර විගණන සමාලෝචන සමඟින් ප්‍රාදේශීය අභ්‍යන්තර විගණන නිලධාරීන් අපි පත් කර ඇත. ණය අවදානම් කළමනාකරණය යටතේ සමහර ක්ෂේත්‍ර නියාමනය සඳහා ඩිජිටල්කරණය කළ උපකරණ පුවරුවක් (Digitised dashboard) ඔවුන් දැනට සංවර්ධනය කරමින් සිටී. අපි අබණ්ඩව ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි යාවත්කාලීන කරමින් සිටින අතර තනි ණයගැනුම්කාර සීමා, භූගෝලීය සීමා, ක්ෂේත්‍රයේ අංශ අතර සීමා තුළ ණය සන්කේන්ද්‍රණය ස්ථාපිත කර ඇති අතර අංශ සීමා සකස් කරමින් සිටිමු. ඊට අමතරව, සියලුම ප්‍රධාන දෙපාර්තමේන්තු සඳහා ප්‍රධාන අවදානම් දර්ශක අපි ස්ථාපිත කර ඇති අතර බොහෝ ක්ෂේත්‍ර ආවරණය කරමින් පුනරුත්ථාපන පුනර්ජීවන සිටුවීමේ ඒකකය, ණය පශ්චාත් පිරිනැමීම් සමාලෝචන ඒකක, ප්‍රාදේශීය අවදානම් නිලධාරීන්ගේ කාර්යයන් සහ පිඩන පරීක්ෂා අභ්‍යාසය ශක්තිමත් කරමින් සිටිමු. එමෙන්ම ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී විසින් මෙහෙයවනු ලබන අලුතින් පිහිටුවන ලද තොරතුරු ආරක්ෂන ඒකකය ද අපි ශක්තිමත් කරමින් සිටිමු.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය සහනයෙහි ධනාත්මක ප්‍රතිඵල

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ඇමෙරිකන් ඩොලර් බිලියන 2.9ක විස්තීර්ණ ණය පහසුකම (EFF) අනුමත කර ඇති අතර ලෝක බැංකුවේ ඇමෙරිකන් ඩොලර් බිලියන 1.5ක හදිසි පහසුකම සහ තෝරාගත් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය තුළින් අපේක්ෂිත ඇමෙරිකන් ඩොලර් බිලියන 3 සමඟ ආසියානු සංවර්ධන බැංකුවේ ඇමෙරිකන් ඩොලර් බිලියන 1 ලැබීමෙන් පසු, නුදුරු අනාගතයේදී අවම වශයෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන 8.4ක විදේශීය සංචිත වැඩි කිරීමට මහත් වූ අපේක්ෂා සහිත සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට රජය බලාපොරොත්තු වේ. ප්‍රතිව්‍යුහගතකරණ උත්සාහයට ආසියානු සංවර්ධන බැංකුව (ADB), ලෝක බැංකුව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද ආයතනය (USAID) සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) සහය ලබා දේ.

මෙරට තිරසාර මාවතක් මත තැබීමේ අරමුණ සහිතව රටේ ආර්ථික ප්‍රශ්නවල මූලික හේතු ආමන්ත්‍රණය කිරීම ඉලක්ක කළ ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති වැනි කොන්දේසි සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පහසුකම් ලැබේ. එය ආයෝජක විශ්වාසය වැඩි කිරීමට, ණය පිරිවැය අඩු කිරීමට උපකාර වන අතර වෙනත් බහුපාර්ශ්වික ආයතනවලින් මුදල් ලබාගැනීමේ අමතර මූලාශ්‍ර වැසීමට ද සහය වේ. ඊට අමතරව, පොළී අනුපාත සහ විනිමය අනුපාත වෙළෙඳපොල මත පදනම් වන අතර අපනයන සහ ප්‍රේෂණවල වැඩිවීම මෙන්ම අඩුකළ ආනයනවලට මඟ පාදනු ලබයි. බැංකුවලට විදේශීය ණය දෙන්නන් සමඟ සම්බන්ධතා වර්ධනය වන බැවින් විදේශීය විනිමය අරමුදල් අපේක්ෂා කළ හැකිය.


අනාගතය කෙරෙහි අවධානය

අපි නවීනතම මානව සම්පත් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටින අතර ඉන් බැංකුවේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් තවමත් අත්හුරු ක්‍රමයට සිදුකරන ක්‍රියාවලි අවම කරනු ඇත. එමෙන්ම අපි 2022-2024 සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කර ඇති අතර ඉන් විශිෂ්ටත්වය මෙහෙයවීම, ගනුදෙනුකාර කේන්ද්‍රියතාව ගොඩ නැගීම සහ අනාගතයට සූදානම්වීම කෙරෙහි අවධානය යොමු කරයි.

මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා, රුපියල් තැන්පතු ඉහළ නැංවීම, ආමුඛ ප්‍රේෂණ සහ අපනයන ආදායම වැඩි කිරීම, රජයේ ආයතන, ව්‍යාපාර සහ පුද්ගලයින්ට ලබාදී ඇති ණය අයකර ගැනීම, සමස්ථ ආර්ථිකය වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායට සහයවීම සහ ගනුදෙනුකාර සේවා කාර්යක්ෂමතාව වැඩි කිරීම වැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අපි අදහස් කරමු. මෙවැනි පියවර තිරසාර වර්ධනයට තුඩුදෙන ද්‍රවශීලතාව, ණය යෝග්‍යතාවය, ආදායම සහ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය වැඩි දියුණු කරනු ඇත. වැඩිකළ විදේශ විනිමය සංචිත, වර්ධිත ද්‍රවශීලතාව, මෙන්ම වඩා ඉහළ ආමුඛ ප්‍රේෂණ සහ සංචාරක ආදායම් ඇතුළුව සමස්ථ ආර්ථිකය තුළ අනාගත වර්ධනයන් සමඟ, ශ්‍රී ලංකාවට අනාගත වර්ධනය සහ සංවර්ධනය සඳහා මඟ පාදමින් ඉදිරි වසර ඉතා ධනාත්මක වසරක් වෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

කෘතඥතාවය පළකිරීම

අපගේ ඉහළම වත්කම වන්නේ අපගේ කාර්ය මණ්ඩලය වන අතර, ඔවුන් අපට බොහෝ බාධක සහ අවහිරතා ජයගැනීමට සහය වූ කැපවීම සමඟ කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් අති විශාල පක්ෂපාතිත්වය සහ බැඳියාවක් පෙන්වා ඇත. මාගේ ස්තූතිය ඔවුන් සියලුම දෙනා වෙත පිරිනමමි. එමෙන්ම අපගේ සභාපතිතුමන්, අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ නිලධාරීන් භාණ්ඩාගාර ලේකම්තුමා සහ මුදල් අමාත්‍යංශයේ නිලධාරීන්, ආයතනික සහ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයින්, අපගේ වෘත්තීය සමිති මෙන්ම වඩාත් සුවිශේෂී ලෙස සිය අනුග්‍රහය සහ පක්ෂපාතිත්වය සමඟ අඛණ්ඩව අපව දිරිමත් කළ අපගේ ගනුදෙනුකරුවන් වෙත මාගේ අවංක කෘතඥතාවය ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි. මේ සියල්ල සමඟින් මහජන බැංකුව ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම බැංකුව කිරීමේ අපගේ අරමුණ කරා අපට ගමන් කිරීමට කටයුතු කළ හැකිය.



ක්ලයිව් ෆොන්සේකා
සාමාන්‍යාධිකාරි/
ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)

2023 මාර්තු 2

අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට:

ශ්‍යාමා විජේකෝන් මිය (අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්), දුෂ්මන්ත තොටවත්ත මහතා, මංජුල වේල්ලාලගේ මහතා, සුජීව රාජපක්ෂ මහතා

මහජන බැංකුව පිළිබඳව
ඉහළ කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම
විධායකාධිකාරී නිර්මාණය කිරීම
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය
සාමාන්‍ය වාර්තා
මූල්‍ය ප්‍රකාශන
පරිපූරක වාර්තා



වමේ සිට දකුණට:

ඉසුරු බාලපටබැඳි මහතා, විශාඛා අමරසේකර මෙය, ඒ එම් පී එම් බී අතපත්තු මහතා

අධ්‍යක්ෂ මණ්ඩලය



සුජීව රාජපක්ෂ මහතා
සභාපති

සුජීව රාජපක්ෂ මහතා වරලත් ගණකාධිකාරී ආයතනයක් වන BDO Partners හි කළමනාකාර හවුල්කරුවෙකු වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCA) අධි සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (FCMA) අධි සාමාජිකයෙකු සහ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) සාමාජිකයෙක් ද වේ. රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය (MBA) පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇත. දශක හතරකට ආසන්න කාලයක් සිය වෘත්තීය ජීවිතය තුළ ඔහු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CA ශ්‍රී ලංකා) සභාපති, උපසභාපති සහ කවුන්සිල සාමාජික (තේරීපත්වූ), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ විගණන ප්‍රමිති කමිටුවේ හිටපු සභාපති, ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ගණකාධිකාරී සංසදයේ සභාපති, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික, 2011 ලෝක කුසලාන ක්‍රිකට් භාණ්ඩාගාරික, දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ තාක්ෂණික උපදේශක, ආසියා පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (CAPA) තාක්ෂණික උපදේශක යන ගෞරවනීය තනතුරු හෙබවීය. වර්තමානයේ ඔහු හේකාර්බි පීවිල්සී, ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පීවිල්සී, හේලීස් ඇග්රිකල්චර් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ ලංකා හෝල්ඩින්ග්ස් (පුද්ග) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස සේවය කරමින් සිටී. එමෙන්ම, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකි.

ඔහු පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී හී සභාපතිවරයා විය. ඔහු ජාතික සංවර්ධන බැංකුව පීවිල්සී, එන්ඩීබී කැපිටල් හොල්ඩින්ග්ස් – බංග්ලාදේශය, ද ෆිනෑන්ස් සමාගම පීවිල්සී (ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන යටතේ මහ බැංකුව විසින් පත්කළ) සහ යුනිඩිල් පැකේජින්ග් සහ සොලූසන්ස් ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇති අතර සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීවිල්සී හි නියෝජ්‍ය සභාපතිවරයා ද වේ.

ඔහුගේ විශේෂඥතාවයට සියලූ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සහ භාවිතයන්, මූල්‍ය විනය හා ආචාරධර්ම සම්බන්ධ රජයේ රෙගුලාසි, මානව සම්පත් කළමනාකරණය සහ පෞද්ගලික හා රාජ්‍ය යන අංශවල සමස්ත කළමනාකරණ භාවිතයන් සහ මූලධර්ම ඇතුළත් වේ.



ඉසුරු බාලපටබැඳි මහතා
අධ්‍යක්ෂ

ඉසුරු බාලපටබැඳි මහතා නීතිඥවරයකු වන අතර වර්තමානයේ සිවිල් හා වාණිජ නීතිය පිළිපැදීම සඳහා නීති කාර්යාලයක් පවත්වාගෙන යයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියා පිට්ස්බර්ග් විශ්ව විද්‍යාලයෙන් එල්එල්එම් උපාධියක් ද ලබා ඇත.

2008 සිට 2010 දක්වා නෙදර්ලන්තයේ හේග් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙස පත් කිරීමට පෙර නීතිපති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස බාලපටබැඳි මහතා සේවය කළ අතර එම කාලය තුළ ඔහු ශ්‍රී ලංකාවේ නියෝජිතයා ලෙස සංවිධානයේ රසායනික අවි තහනම් කිරීම සහ පුද්ගලික ජාත්‍යන්තර නීතිය පිළිබඳ හේග් සමුළුව (HCCH) සඳහා සේවය කළේය. හේග් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ චාන්සරි ප්‍රධානියා ලෙස ද ඔහු පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ආයෝජන නීති හා ආයෝජන මණ්ඩලයේ නීතිමය කටයුතු සඳහා ඔහු 2012 දී ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ නීති උපදේශක ලෙස පත් කරන ලදී.

බාලපටබැඳි මහතා මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, සෙලාන් බැංකුවේ සහ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලවල ද සේවය කර ඇත. ඔහු පිපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සී හි සභාපතිවරයා ලෙස දැනට කටයුතු කරමින් සිටින අතර සෙලිකෝ නැවුරල් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු 2007 දී කනිෂ්ඨ ජාතික නීති සම්මේලනයේ සභාපතිවරයා ලෙසත් 2020 ජාතික නීති සම්මේලනයේ කැඳවුම්කරු ලෙසත් පත් කරන ලදී. බාලපටබැඳි මහතා 2022/2023 වසර සඳහා සහ 2023/24 වසර සඳහා ද ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම් ලෙස තෝරා පත් කර ගන්නා ලදී.



මංජුල වෙල්ලාලගේ මහතා
අධ්‍යක්ෂ

මංජුල වෙල්ලාලගේ මහතා නීතිඥවරයෙකි. ඔහු දශක දෙකකට ආසන්න කාලයක් පෞද්ගලික නීතිඥ සංගමයේ ප්‍රායෝගිකව කටයුතු කරමින් සිටී. නීතිඥයෙකු වීමට පෙර, ඔහු අධිකරණ අමාත්‍යාංශයේ මූලිකත්වය ගත් ප්‍රජා පාදක නීති ආධාර ව්‍යාපෘතිය භාර සම්පත් හා පර්යේෂණ නිලධාරියා ලෙස සේවය කළේය. ඔහු අධිකරණ අමාත්‍යාංශයේ සම්පත්, පර්යේෂණ හා තොරතුරු මධ්‍යස්ථානයට (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු) සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සඳහා සම්පත් නිලධාරී වශයෙන් ඔහු සිය රාජකාරී ඉටු කළේය. අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් ජාතික මට්ටමින් තීරණාත්මක නීතිමය ගැටලූ විසඳීමට මැදිහත් වන අතරම, වෙල්ලාලගේ මහතා සිය කීර්තිමත් නීති වෘත්තිය තුළ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ පිළිබඳ සහ ප්‍රජාවගේ නීතිමය දැනුම වැඩිකිරීම පිළිබඳ ව්‍යාපෘති හා වැඩසටහන් රාශියක් සංවිධානය කර ඇත.



විශාඛා අමරසේකර මෙය
අධ්‍යක්ෂ

විශාඛා අමරසේකර මෙය මහා භාණ්ඩාගාරයේ වසර 20කට ආසන්න පළපුරුද්දක් සතු වන අතර දැනට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (CUD) ලෙස බාහිර සම්පත් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටී. ඇය එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යා සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සහ එක්සත් ජනපදයේ වෙඩර්බිට් විශ්ව විද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිකර ගෙන ඇත. ඇය එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ (CIMA) ගණකාධිකාරිණියක් වන අතර වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිණියකි. ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා බැංකුව ඇතුළුව ප්‍රධාන රජයට අයත් ව්‍යවසාය කිහිපයක මහ භාණ්ඩාගාරය නියෝජනය කර ඇත.



දුෂ්මන්ත තොටවත්ත මහතා
අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 ජූලි 8 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී. තොටවත්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ උපාධිය)ක් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCA) අධි සාමාජිකයෙකි. ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස බොහෝ රාජ්‍ය ආයතන සහ පුද්ගලික ආයතනවල වසර 40කට වැඩි පළපුරුද්ද සහිත වාර්තාවක් ඇති මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ග කළමනාකරණය සහ මහජන සම්බන්ධතා යන ක්ෂේත්‍රවල විස්තීර්ණ පළපුරුද්ද ඇති දක්ෂ නියමුවෙකි.



ඒ එම් පි එම් බී අතපත්තු මහතා
අධ්‍යක්ෂ

ඒ එම් පි එම් බී අතපත්තු මහතා දැනට වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කරන අතර බැංකුකරණය, මූල්‍ය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ වසර 28කට වැඩි සේවා පළපුරුද්ද ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය (රාජ්‍ය පරිපාලනය) දෙවන පන්තිය ඉහළ විද්‍යාවේදී උපාධියක් ලබාගෙන ඇති අතර ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ඔහු සතු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය සහ ජපානයේ සංවර්ධන ආර්ථික විද්‍යා ආයතනයෙන් සංවර්ධන ආර්ථිකය සම්බන්ධයෙන් පශ්චාත් උපාධි දෙකක් සම්පූර්ණ කර ඇත. 2004 දී ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා "ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා පරිමේයකරණය" ඔහුගේ පර්යේෂණ මාතෘකාව වූ අතර ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනයේ ආවසරික සහතිකය ඔහු සතු ය.

වර්තමාන තනතුර භාර ගැනීමට පෙර, ඔහු ශ්‍රී ලංකා ජනාධිපතිගේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙක් ලෙස සේවය කර ඇති අතර ආර්ථිකයේ ප්‍රතිසාධනය සහ වර්ධනය ස්ථායීකරණ අංශය තුළ ආර්ථික ප්‍රතිසංස්කරණ රාජකාරී ඔහු වෙත පවරන ලදී. අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කිරීම) ලෙස, අධ්‍යාපන අමාත්‍යංශයේ ප්‍රාග්ධන අයවැය ඔහු පිළියෙල කළ අතර අමාත්‍යංශයේ සංවර්ධන ව්‍යාපෘති නියාමනය කරන ලදී.

තවද, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස, ප්‍රදාන අරමුදල් ව්‍යාපෘති, රජයේ වෙළෙඳ සහ ගාස්තු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සහ ජාතික අයවැය නියාමනය සඳහා කාර්යභාර ප්‍රධානියා විය. එමෙන්ම, ඔහු විසින් රජයේ ජාතික අයවැය යෝජනාවක් ලෙස "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා සහන ණය හා සංවර්ධන වැඩසටහන" ආරම්භ කරන ලදී.

අතපත්තු මහතා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද කටයුතු කර ඇති අතර ධාන්‍ය ගොවියන් සහ ගොවියන් සඳහා පොහොර මුදල් සහන යෝජනා ක්‍රමය සඳහා ගුදම් ලැබීම් මූල්‍යකරණ ක්‍රමය ආරම්භ කර ඇත. තවද, ඔහු ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් ලබාදුන් "කුඩා හා මධ්‍ය ව්‍යවසාය ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය" (SMERDP), ලෝක බැංකුව විසින් අරමුදල් ලබාදුන් "කුඩා හා මධ්‍ය ව්‍යවසාය සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය" (SMEDeF) සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් ලබාදුන් "කුඩා හා මධ්‍ය ව්‍යවසාය ණය මාර්ගය" (SMELoC) නමින් හඳුන්වන ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරව, ජර්මන් ජාත්‍යන්තර සහයෝගිතාව (GIZ) විසින් අරමුදල් ලබාදුන් කුඩා හා මධ්‍ය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන මෙන්ම ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් ලබාදුන් "වහල මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාවට නංවා ඇත.

අතපත්තු මහතා ආයෝජන මණ්ඩලය, මහජන බැංකුව, ශ්‍රී ලංකා ගුවන් සමාගම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, සතොස, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුළ භාණ්ඩාගාර නියෝජිත ලෙස සිය රාජකාරී ඉටුකර ඇත.



ශ්‍යාමා විජේකෝන් මිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

ශ්‍යාමා විජේකෝන් මිය 2016 දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහකාර ලේකම්වරියක් ලෙස බැඳුණු අතර පසුව 2022 දී අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුරට උසස් විය. ඇය නීතිඥවරියකි. එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති (LLM) උපාධිය ඇය සතුය. ඇය වාණිජ නීතිය සහ ව්‍යවහාර සංවර්ධනය – ICPL – CCC සඳහා ආයතනයෙන් නැවිගත කිරීමේ නීතිය හා පුහුණුකරණය පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ඉහත සියලු කරුණු හැරුණු විට, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද (PGEDMB) ඇය සතුවන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුර තුළ ඇයගේ වෘත්තිය කරගෙනයාමට ඇයට සුවිශාල සහයක් ලබා දෙනු ඇත.

ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ යාවජීව සාමාජිකාවකි.

ආයතනික කළමනාකාරීත්වය



ඉදිරි පෙළ වමේ සිට දකුණට:
ප්‍රීති කටුලන්ද මිය, රෝෂිනි විජේරත්න මිය, අසාම් ඒ අහමට් මහතා, රොහාන් පතිරගේ මහතා,

පසු පෙළ වමේ සිට දකුණට:
ගංගා සේනානායක මිය, නිල්මිනී ප්‍රේමලාල් මිය, ඒ එස් එම් ඩබ්ලිව් කුමාරසිරි මහතා, කේ ඒ නිහාල් මහතා



ඉදිරි පෙළ වමේ සිට දකුණට:

ක්ලයිව් ෆොන්සේකා මහතා, රේණුකා ජයසිංහ මිය, පී එස් ජේ කුරුකුලසූරිය මිය, නිපුනිකා විජයරත්න මිය, ෂමිලා ලොකු කලුගේ මිය

පසු පෙළ වමේ සිට දකුණට:

ධම්මික දසා මහතා, ඊ ඒ එම් දිසානායක මහතා, වික්‍රම නාරායන මහතා, ටී එම් ඩබ්ලිව් චන්ද්‍ර කුමාර මහතා



ක්ලයිව් ෆොන්සේකා මහතා

ප්‍රධාන විධායක නිලධාරී/
සාමාන්‍යාධිකාරී (වැඩබලන)

ක්ෂේත්‍රයේ ප්‍රවීනයෙක් වන ,ෆොන්සේකා මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයකු වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිධරයකු වේ. ACI Dealing Certificate විභාගයේදී ඔහුට විශිෂ්ට සාමාර්ථයක් පිරිනමා ඇති අතර භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධයෙන් වසර 29 කට අධික අත්දැකීම් ඔහු සතු වේ. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියාවේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA) සහතිකලත් සාමාජිකයෙකි.

ඔහු 2018 සිට 2020 දක්වා කාලසීමාව තුළ, ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සංගමයේ සභාපති ලෙස කටයුතු කළ අතර ඊට අමතරව ජාතික ගෙවීම් කවුන්සිලයේ, මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවේ සහ නව විකල්ප මිණුම් දණ්ඩණ පොලී අනුපාත අධ්‍යයනය කිරීම හා සැලසුම් කිරීම සඳහා වූ කාර්යසාධක බලකාය ඇතුළුව කමිටු ගණනාවක සාමාජිකත්වය දරයි. ඊට අමතරව, ඔහු දේශීය මූල්‍ය වෙළෙඳපොල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳපොල ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි. එමෙන්ම ඔහු වර්තමානයේ පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී, පීපල්ස් ලීසින් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, ලංකන් චිලියාන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ලංකා පේ (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ජාතික ගෙවීම් සභාව, ශ්‍රී ලංකා බැංකු සංගම් (ඇප) සමාගම, මූල්‍ය ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා (ඇප) සමාගම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ මූල්‍ය සේවා කාර්යංශ සමාගම තුළ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කරයි. ඔහුගේ වත්මන් පත්කිරීම්වලට පෙර, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ IABF/DABF විභාගවල ප්‍රධාන පරීක්ෂක ලෙස කටයුතු කර ඇත.

2002 දී, ෆොන්සේකා මහතා මහජන බැංකුවේ ඔහුගේ නිලකාලය ආරම්භ කළ අතර 2011 නොවැම්බර් සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ.

මෙම කාර්යභාරය තුළ, දේශීය සහ විදේශීය වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා කළමනාකරණය කිරීමට අමතරව විදේශ විනිමය මෙහෙයුම්, ප්‍රාථමික වෙළෙඳ ඒකකයේ කටයුතු, ආයෝජන බැංකුකරණ ඒකකය, සහ ඇමෙරිකන් ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල් මුදල් වෙළෙඳපොල මෙහෙයුම් පාලනය කර ඇත. මහජන බැංකුවට එක්වීමට පෙර ඔහු ඇමරිකානු එක්ස්ප්‍රස් බැංකුව සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවල ජ්‍යෙෂ්ඨ තනතුරු දරා ඇත.

ෆොන්සේකා මහතා 2023 ජනවාරි 2 දින සිට මහජන බැංකුවේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස පත් කර ඇත.



රොහාන් පතිරගේ මහතා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
එතෙර ගනුදෙනුකාර සේවා

බැංකු ක්ෂේත්‍රය තුළ මානව සම්පත්, නීති හා පරිපාලනය තුළ වසර 28කට වැඩි පළපුරුද්ද සහිත, රොහාන් පතිරගේ මහතා ඉහළින් සුදුසකම් සහිත ප්‍රවීන වෘත්තිකයෙකි. ඔහු නවසීලන්තයේ මැසි විශ්වවිද්‍යාලයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් ශාස්ත්‍රපති උපාධිය මෙන්ම බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙක් ද වේ. ඊට අමතරව, ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් ලබා ඇති නීතිඥවරයෙකි. ඔහු මහජන බැංකුවේ ආයතනික කළමනාකරණ කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් ලෙස සේවය කර ඇති අතර, බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කමිටුවල සාමාජිකයෙක් ද වේ.

පතිරගේ මහතා මහජන බැංකුවේ දැනට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – එතෙර ගනුදෙනුකාර සේවා තනතුර දරයි. එමෙන්ම ඔහු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී අධ්‍යක්ෂ, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්හි සභාපති, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ, පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂ, බංග්ලාදේශයේ ලංකා චිලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ, පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ විකල්ප අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කරයි.

මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා නීති) ලෙස ඔහුගේ පෙර තනතුර තුළ පතිරගේ මහතා බැංකුවේ 10,000කට අධික ශ්‍රම බලකායක් සාර්ථකව කළමණාකරණය කළ අතර, බැංකුවේ මානව සම්පත් අවශ්‍යතාවයන්ට අනුකූලව ජ්‍යෙෂ්ඨ විධායක බඳවා ගැනීම් අධීක්ෂණය කළේය. ඊට අමතරව, ඔහු බැංකුවේ සාමාජිකයින් 70කගේ නීති කණ්ඩායම මෙහෙයවන ලද අතර මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස ද කටයුතු කරන ලදී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි විවිධ අනුකමිටුවලට අදාළ කරුණුවලදී ඔහුගේ පරිපාලන සහය ඉතා අගනේය.



රේණුකා ජයසිංහ මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු

රේණුකා ජයසිංහ මිය 1987 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකුවේ ඇයගේ වෘත්තිය ආරම්භ කළ අතර බැංකු ක්ෂේත්‍රයේ වසර 36 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඇය සිය වෘත්තීය ජීවිතය තුළ ශාඛා කළමනාකරු, කලාපීය ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතන හා සංවර්ධන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු, ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතිකකරණය) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සහාය සේවා) වැනි තනතුරු දරමින් ශ්‍රේණි තුළින් වේගවත් උසස්වීමක් පෙන්වා ඇත. වර්තමානයේ ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු) ලෙස කටයුතු කරයි.

ජයසිංහ මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී පළමු පන්තියේ විශේෂ උපාධියක් ලබා ඇති අතර වෘත්තීය බැංකු සුදුසුකම් (AIB - ශ්‍රී ලංකා) ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ යාවජීව සාමාජිකාවකි. තවද, 2021 ජනවාරි 1 දින සිට ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ මානව සහ සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති උපදේශන කමිටුවේ සාමාජිකාවක් ලෙස ඇය පත්කර ඇත.



අසාමි ඒ අහමට් මහතා
මූල්‍ය ප්‍රධානී

අහමට් මහතා 2017 ජනවාරි 3 වැනි දින මහජන බැංකුවේ සේවයට එක්වූ අතර දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් ආයතනවල සේවය කරමින් උපායමාර්ගික මූල්‍ය කළමනාකරණය, විකල්ප ආයෝජන හා අවදානම් කළමණාකරණය යන ක්ෂේත්‍රයන්හි දශක දෙකකට ආසන්නව පළපුරුද්දක් ඇත. ඔහු මහා පරිමාණ බහු ජාතික වෘත්තීය සේවා ආයතන කිහිපයක් සහ විවිධ අංශ සහ වෙළෙඳපොල අවකාශයන් හරහා මූලික ප්‍රාග්ධන සේවා සම්පාදකයින් සමඟ කටයුතු කර ඇත.

අහමට් මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජික, වරලත් සහතික ලත් ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජික සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙහි අධි සාමාජිකයෙක් ද වීම ඇතුළුව ඉහළ වෘත්තීය සාමාජිකත්ව කිහිපයක් දරමින් සිටී. එමෙන්ම ඔහු සහතික ලත් සේවයේ නියුතු ගණකාධිකාරිවරයෙක් (ඕස්ට්‍රේලියාව), වරලත් සුරැකුම් හා ආයෝජන ආයතනයේ (එක්සත් රාජධානිය) සහ වරලත් ණය කළමනාකරණ ආයතනයේ (එක්සත් රාජධානිය) සහතික ලත් සාමාජිකයෙක් මෙන්ම අවදානම් කළමනාකරණ ආයතනයේ (එක්සත් රාජධානිය) තාක්ෂණික විශේෂඥයෙක්ද වේ.

අහමට් මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී, පිපල්ස් ඉන්ෂුරන්ස් පීවිල්සී, සහ ලංකා අලියාන්ස් ෆිනෑන්ස් සමාගම (බංගලාදේශය) අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි.



පී එස් ජේ කුරුකුලසූරිය මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - උපායමාර්ගික සැලසුම් කිරීම, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ

ජයන්ති කුරුකුලසූරිය මිය 1994 දී කළමනාකාර අභ්‍යාසලාභියෙකු වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්වූ අතර බැංකු ක්ෂේත්‍රය තුළ වසර 28 කට අධික සේවා අත්දැකීම් සපුරාලයි. ඇගේ අත්දැකීම් ප්‍රධාන වශයෙන් ශාඛා බැංකුකරණය, ණය, කාර්ය මණ්ඩල පුහුණුව, මානව සම්පත් සංවර්ධනය, ණය පරිපාලනය, ශාඛා කළමනාකරණය සහ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය යන අංශවලට අයත් වේ. බැංකුව සමඟ සම්බන්ධ වීමට පෙරාතුව ඇය, මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන සමාගමෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරිනියක වශයෙන් පළපුරුද්ද ලබාගෙන ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සහිත (ගෞරව) විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර පරිපාලන උපාධිධාරිනියක සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධිධාරිනියකි.

ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජික (FIB), AAT ශ්‍රී ලංකා සාමාජික, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික සාමාජිකයෙක් වන අතර මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාවක්ද (Dip HRM) ලබා ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවයේදී (1997) රන් පදක්කම් 3ක් දිනා ගනිමින් උපරිම කුසලතා ලබා ගැනීම, අඛණ්ඩව වසර දෙකක් තුළ විභාගය සම්පූර්ණ කිරීම සහ අතරමැදි හා අවසාන විභාගවලින් ඉහළම ලකුණු ලබා ගැනීම තුළින් බැංකුවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමට ඇයට හැකි විය. එය තවමත් නොපරදවන ලද වාර්තාවකි.



රෝෂිණි විජේරත්න මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණය

රෝෂිනි විජේරත්න මිය දැනට බැංකුවේ අවදානම් කළමනාකරණය සහ ණය පාලන කටයුතු භාරව කටයුතු කරයි. ඇය බැංකුවේ වසර 32ක් කාලයක් පුරා සේවය කර ඇත. බැංකුවේ භාණ්ඩාගාරය ආශ්‍රිතව ඇයගේ පළපුරුද්ද වසර 26 කට වැඩි වන අතර එම කාලය තුළ 2003 සිට ඇය ප්‍රාථමික වෙළඳ ඒකකය සහ ඉන් පසුව භාණ්ඩාගාරය නියෝජනය කර ඇත. 2017 සිට ඇය බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලි ශක්තිමත් කිරීමේදී මෙම ක්ෂේත්‍රය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින් සක්‍රියව මැදිහත් වී ඇත.

ඇය තෝරාගත් වෘත්තිය තුළ ඉහළ සුදුසුකම් සමඟ, විජේරත්න මියගේ අධ්‍යාපනික සුදුසුකම්වලට කොළඹ විශ්වවිද්‍යාලයේ දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධිය, එම විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (මූල්‍ය පිළිබඳ) පශ්චාත් උපාධිය, සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) වෙතින් ලබාගත් භාණ්ඩාගාර හා අවදානම් කළමනාකරණ ඩිප්ලෝමාව ඇතුළත්ය. එමෙන්ම ඇය ACI Dealing සහතිකය - ACI, මූල්‍ය වෙළෙඳපොල සංගමය සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි.

විජේරත්න මිය ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරියක සහ ලේකම්වරියක් සහ දැනට ශ්‍රී ලංකා ෆොරෙක්ස් සංගමයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවක්ද වෙමින් විවිධ වෘත්තීය සංවිධානවල නායකත්ව තනතුරු දරා ඇත. ඇය බැංකු අංශයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමයේ හිටපු සම සාමාජිකාවක්ද වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලන මණ්ඩල සාමාජිකාවක් ලෙස ද සේවය කරයි.



නිපුනිකා විජයරත්න මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
බැංකු සහය සේවා

1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් බැංකුවේ සේවයට එක්වූ නිපුණිකා විජයරත්න මිය බැංකුකරණ ක්ෂේත්‍රය තුළ 32 වසරකට අධික අත්දැකීම් සපුරාලන අතර බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – බැංකු සහය සේවා ලෙස කටයුතු කරයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය අධ්‍යයන සම්බන්ධ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ඇය සතුය. වෙළෙඳ සේවාවන් සහ අනුරූප බැංකුකරණය සම්බන්ධ හසළ අත්දැකීම් සහිත ඇය බැංකුවේ සේවයට එක්වීමට පෙර පෞද්ගලික අංශයේ සේවයේ නියුතු විය. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ විධායක කමිටු සාමාජිකාවක් ද වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලන මණ්ඩලයේ විකල්ප සාමාජිකාවක් ද වේ.



ප්‍රීති කටුලන්ද මිය
ප්‍රධාන නීති නිලධාරිනී

ප්‍රීති කටුලන්ද මිය නීතීඥවරියක් ලෙස නීති වෘත්තියේ සක්‍රීය සේවයේ වසර 29 ක පළපුරුද්දක් සහිත ජ්‍යේෂ්ඨ නීති වෘත්තිකයෙකි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (HRM) ලබා ඇත. ඊට අමතරව, ඇය පිරිස් කළමනාකරණ ආයතනයෙන් (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ද සාර්ථකව නිම කර ඇත.

ප්‍රීති කටුලන්ද මිය මහජන බැංකුවේ නීති අභ්‍යාසලාභිනියක ලෙසින් ඇයගේ නීති වෘත්තිය ආරම්භ කර ඇති අතර මෙම තනතුරේ වසර 17ක සේවය සමඟ තනි පුද්ගල වෘත්තිකයෙකු මෙන්ම ආයතනික අංශයේ සාමාජිකාවක් ලෙස දශක දෙකකට ආසන්න සේවා පළපුරුද්ද ඇය ලබාගෙන ඇත. මෙම කාලසීමාව තුළ, ඇය විවිධ නීති අංශවල සේවය කර ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන මූල්‍ය අංශය – ව්‍යාපාර ආයතනවල ජ්‍යේෂ්ඨ තනතුරුවල සේවය කර ඇත.

2021 දෙසැම්බර් 1 දින, කටුලන්ද මිය අතිරේක ප්‍රධාන නීති නිලධාරිනී තනතුර භාරගත් අතර ඉන්පසුව ඇය 2022 දෙසැම්බර් 23 දින ප්‍රධාන නීති නිලධාරිනී ලෙස උසස් කරන ලදී.



ධම්මික දසා මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ වසර 26ක පළපුරුද්ද සමඟ, ධම්මික දසා මහතා මහජන බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස සේවය කරයි. ඔහුට උපායමාර්ගික කළමනාකරණය, වැඩසටහන් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, යටිතල පහසුකම් තාක්ෂණ කළමනාකරණය, මෘදුකාංග සංවර්ධනය, සහ ක්‍රියාත්මක කිරීමේ නිරාවරණය ඇතුළුව විවිධ පරාසයන් හී බහුල අත්දැකීම් ඇත. වසර ගණනාවක් පුරා, ශ්‍රී ලංකාවේ, ඕස්ට්‍රේලියාවේ සහ නවසිලන්තයේ මූල්‍ය, රක්ෂණය, බැංකුකරණය, නිෂ්පාදනය, මනා සැපයුම්, සහ සංචාරක වැනි විෂයයන් ගණනාවක ඔහුගේ කුසලතා ඔප්නංවාගෙන ඇත. ඊට අමතරව,තොරතුරු ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම් පිළිබඳ හසල අවබෝධයක් ඔහු සතුය.

දසා මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ගණිතය හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත. බැංකුවේ ඔහුගේ වර්තමාන තනතුර භාර ගැනීමට පෙර, එයිටිකන් ස්පෙන්ස් සමූහය, කේපිඑම්පි ශ්‍රී ලංකා සහ ෆිසෙරි වැනි කීර්තිමත් ආයතනවල විවිධ ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇත.



කේ ඒ නිහාල් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
මානව සම්පත්

කේ ඒ නිහාල් මහතා 1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකුවට බැඳුණු අතර දැනට බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් ලෙස කටයුතු කරයි. ඔහුට ශාඛා මෙහෙයුම්, තොරතුරු තාක්ෂණය, භාණ්ඩාගාරය සහ මානව සම්පත් යන අංශ ආවරණය කරමින් බැංකු ක්ෂේත්‍රයේ වසර 28 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පිරිනමන දෙවන පංතියේ (විශේෂ) කළමනාකරණ උපාධිධාරියෙකි. ඊට අමතරව, ඔහුට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ වෘත්තීය බැංකුකරණ සුදුසුකම් ඩිප්ලෝමාවක් ඇති අතර ශ්‍රී ලංකා පුද්ගල කළමණාකරණ වරලත් ආයතනයෙන් (CIPM) වෘත්තීය මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම නිහාල් මහතා භාණ්ඩාගාර සහ විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සහතිකය ද ලබාගෙන ඇත.



ඊ ඒ එම් දිසානායක මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

මහින්ද දිසානායක මහතාහට ශාඛා බැංකුකරණය සහ අභ්‍යන්තර විගණනය තුළ වසර 300 වැඩි පළපුරුද්දක් සතුවන අතර දැනට ඔහු මහජන බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCA) අධි සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක් ද වේ.

ඊට අමතරව ඔහුට කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය (පොදු) පිළිබඳ විද්‍යාවේදී උපාධියද සතුය. තවද, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ තාක්ෂණික සහයෝගය ඇතිව පිරිනමන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ තොරතුරු පද්ධති, ආරක්ෂාව පාලනය සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත.



ඒ එස් එම් ඩබ්ලිව් කුමාරසිරි මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ජාත්‍යන්තර බැංකුකරණය

ඒ එස් එම් ඩබ්ලිව් කුමාරසිරි මහතාට බැංකුකරණය පිළිබඳ වසර 36කට වැඩි පළපුරුද්ද සහ මහජන බැංකුවේ ජාත්‍යන්තර බැංකුකරණ අංශයේ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ සේවාවන් හී වසර 20කට වැඩි සේවාවක් අයත් වන අතර වර්තමානයේ එහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ගෞරව සාමාර්ථයක් සහිත රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය මෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී (මූල්‍ය) උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක් ද වේ.

ඔහු බැංකුකරුවන්ගේ වෙළෙඳ මූල්‍ය සංවිධානයේ හිටපු සභාපති, ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ බැංකු කමිටුවේ සාමාජික, ලංකා SWIFT පරිශීලක සමූහයේ විධායක කමිටු සාමාජික, ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජික ඇතුළුව වෙළෙඳ මූල්‍ය මෙහෙයුම්වල ඔහුගේ දිගුකාලීන විශේෂිත බැංකුකරණ ප්‍රවීනත්වයට අදාළ වෘත්තීය සංවිධානවල කීර්තිමත් තනතුරු කිහිපයක් දරනු ලබයි. ඔහු පිපල්ස් ට්‍රැවල්ස් හී අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කරයි.



වික්‍රම නාරායන මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ව්‍යවසාය බැංකුකරණය

1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුවට බැඳුණු වික්‍රම නාරායන මහතා ශාඛා බැංකුකරණය, ආයතනික සහ විදේශීය බැංකුකරණය මෙන්ම උපායමාර්ගික සැලසුම් කිරීම වැනි විවිධ බැංකු අංශවල වසර 28කට වැඩි පළපුරුද්ද ලබාගෙන ඇත. කුඩා ව්‍යාපාර සඳහා ණයදීම, ව්‍යාපෘති මූල්‍ය, ව්‍යවසාය සංවර්ධනය, ව්‍යාපාර පුබුදුව සහ පුනරුත්ථාපනය කෙරෙහි විශේෂ අවධානයක් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කෙරෙහි ණය දීම තුළ ඔහුගේ ප්‍රවීනත්වය වසර 12ක කාලසීමාවක් පුරා දිවයයි. වර්තමානයේ, ඔහු මහජන බැංකුවේ ව්‍යවසාය බැංකුකරණය මෙහෙයවන අතර එහිදී ඔහු වාණිජ ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන මූල්‍ය, ක්ෂුද්‍ර මූල්‍ය, වාණිජ බැංකුකරණය සහ ව්‍යාපාර පුබුදුව තුළ ඔහුගේ පළපුරුද්ද යොදා ගනී.

නාරායන මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිකර ගෙන ඇති අතර, පසුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇත. ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් ද වේ.

බැංකුවේ ඔහුගේ ධුරකාලයට පෙර, නාරායන මහතා පුද්ගලික අංශයේ විවිධ නිෂ්පාදන සමාගම්වල සේවය කර ඇත. ඔහු දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකුකරණ අධ්‍යයන සඳහා මධ්‍යස්ථානයේ දේශන පවත්වනු ලබයි.



නිල්මිනි ප්‍රේමලාල් මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ගෙවීම්, ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව ආරක්ෂණය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ගෙවීම්, ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව ආරක්ෂණය ලෙස කටයුතු කරන නිල්මිනී ප්‍රේමලාල් මිය කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස 2002 දී මහජන බැංකුව හා එක් විය. ඇය වසර 18ක් පුරා මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ සහ වසර දෙකක කාලසීමාවක් උපායමාර්ගික සැලසුම්කරණය, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරමින් බැංකුව තුළ වසර 20ක පළපුරුද්දක් ලබා ඇත.

නියෝජ්‍ය මූල්‍ය ප්‍රධානි ලෙස සේවය කරමින්, ප්‍රේමලාල් මිය විශේෂ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර ඒවා බැංකුවේ සමස්ථ කාර්යසාධනයට සැලකියයුතු දායකත්වයක් ලබා දී ඇත. සහකාර සාමාන්‍යාධිකාරී ලෙස, ඇය උපායමාර්ගික සැපසුම්කරණය, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුව යන ක්ෂේත්‍ර ආවරණය කරමින් බැංකුවේ උපායමාර්ගය නිර්මාණය සහ සංවර්ධනය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

ප්‍රේමලාල් මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තිය ඉහල සමාර්ථයක් සමඟ ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධියක් සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ද ලබාගෙන ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCA) අධි සාමාජිකාවක් මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (FCMA) අධි සාමාජිකාවක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) සහය සාමාජිකාවක් ද වේ. ඇය ආරාධිත දේශන සහ IBSL ශ්‍රී ලංකා හී විභාග ඇගයීම තුළින් බැංකු ප්‍රජාවට ඇයගේ දැනුම දායද කර ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් කළමණාකරන ගණකාධිකාරී ආයතනයේ (CIMA UK) අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇත.

ප්‍රේමලාල් මිය දැනට පිපල්ස් මයික්‍රෝ ලිමිටඩ් හී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස ද සේවය කරයි. ඇය මෙයට පෙර පිපල්ස් මර්චන්ට් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇති අතර එයට සමගාමීම පිපල්ස් මර්චන්ට් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති තනතුර දරා ඇත.



ටී එම් ඩබ්ලිව් චන්ද්‍ර කුමාර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ශාඛා කළමනාකරණය

චන්ද්‍ර කුමාර මහතා 1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුවේ සිය වෘත්තිය ආරම්භ කළ අතර බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 29කට වැඩි පළපුරුද්ද අත්කරගෙන ඇත. වර්තමානයේ ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ලෙස සේවය කරයි. ඔහුගේ වෘත්තීය කාලය තුළ, දේශීය මෙන්ම විදේශීය වශයෙන් විවිධ නිරාවරණ වැඩසටහන්වල සහභාගි වී ඇති අතර විවිධ කළමනාකරණ මට්ටම්වල හා තනතුරුවල ව්‍යාපාර බැංකුකරණ කළමනාකරණ ව්‍යවහාර පිළිබඳ හසල දැනුමක් ලබාගෙන ඇත.

2018 සිට 2020 අවසානය දක්වා, චන්ද්‍ර කුමාර මහතා සැපයුම්, ප්‍රවාහනය, ආරක්ෂාව, ඉංජිනේරුකරණ නඩත්තුව, ගොඩනැගිලි ඉංජිනේරුකරණය, සහ ප්‍රකාශයට පත් කිරීම යන දෙපාර්තමේන්තු හය පාලනය කරමින් සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු සහය සේවා) තනතුර දැරීය. මෙම කාලසීමාව තුළ, ප්‍රවාහනය සහ ආරක්ෂක ක්‍රියාපටිපාටිවලට අමතරව ප්‍රසම්පාදනය, ඉදිකිරීම් සහ නඩත්තුව, ගබඩා සහ තොග පාලනය පිළිබඳ අගනා පළපුරුද්ද ලබාගෙන ඇත. 2020 සිට 2023 දක්වා ඔහු සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ පරිපාලනය සහ ව්‍යාපාර සහය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ දෙපාර්තමේන්තුව) ලෙස කටයුතු කළ අතර එහිදී ඔහු ශාඛා ජාලය සහ CEFT මෙහෙයුම් සඳහා එස් පහ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සැලකියයුතු දැනුමක් ලබාගෙන ඇත.

චන්ද්‍ර කුමාර මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තිය ඉහළ අංශයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාවක් (ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය/WTO (UNCTAD), ජිනීවා, ස්විට්සර්ලන්තය) ලබාගෙන ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (LICA) ආවසරික, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ (MAAT) සාමාජික සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක් ද වේ. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා සැපයීම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (MISMM) ආයතනික සාමාජිකයෙක් ද වේ.

චන්ද්‍ර කුමාර මහතා සේවා ලබාදීමේ ශාඛාවල ප්‍රධානියා වූ අතර එයට 2022 දෙසැම්බර් සිට ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර (ATMs), මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs), මුදල් චක්‍රීකරණ යන්ත්‍ර (CRMs), සහ බිල්පත් ගෙවීමේ යන්ත්‍ර (KIOSKs) වලින් සමන්විත ශාඛා ජාලයේ නියාමන ඒකක 743ක් ඇතුළත්ය.



ගංගා සේනානායක මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරීම්

කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස 1990 දී මහජන බැංකුවේ සිය වෘත්තිය ආරම්භ කළ, ගංගා සේනානායක මිය බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 32කට වැඩි පළපුරුද්ද අත්කරගෙන ඇත. මෙම කාලසීමාව තුළ, ඇය ශාඛා කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු, සහ සහකාර සාමාන්‍යාධිකාරී වැනි ශාඛා බැංකුකරණ සේවා තුළ ප්‍රධාන තනතුරු කිහිපයක් දරා ඇත. වර්තමානයේ ඇය අයකිරීම් දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරයි.

සේනානායක මිය පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තිය ඉහළ අංශයෙන් කෘෂිකර්ම විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබාගෙන ඇත. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකාවක් ද වේ. ඇය ණය අයකර ගැනීම සහ ණය පරිපාලනය පිළිබඳ විස්තීර්ණ දැනුම සහ පළපුරුද්ද ලබාගෙන ඇති අතර බැංකු මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් සංවිධානය කළ දැනුම වැඩි කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායිකාවක් ලෙස පත්කර ඇත.

බැංකුව හා එක්වීමට පෙර, සේනානායක මිය පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පර්වාස පදනමක් මත සහකාර කථිකාචාර්යවරියක් ලෙස කටයුතු කර ඇත. නව්‍යකරණ චින්තකයෙක් ලෙස, 2021/22 හි ජාල පරිමේයකරණ ව්‍යාපෘතිය ඇතුළුව බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ අත්කර ගැනීම අරමුණු කළ සාර්ථක වැඩසටහන් කිහිපයකට ඇය සැලකියයුතු දායකත්වයන් සිදු කර ඇත.



ෂමිලා ලොකු කලුගේ මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩබලන) – භාණ්ඩාගාරය, ආයෝජන බැංකුකරණය, සහ මූල්‍ය ආයතන

ෂමිලා ලොකු කලුගේ මිය 2002 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකුව සමඟ සිය වෘත්තිය ආරම්භ කළ අතර, බැංකුවේ භාණ්ඩාගාර ඒකකය තුළ වසර 20කට වැඩි පළපුරුද්ද ලබාගෙන ඇත. ඇය බැංකුවේ භාණ්ඩාගාරය, ආයෝජන කළමනාකරණය සහ මූල්‍ය ආයතන කාර්යයන් හී වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස වත්මන් තනතුර වෙත වේගයෙන් පැමිණ ඇත.

2011 සිට 2022 දක්වා, ලොකු කලුගේ මිය ප්‍රාථමික වෙළෙඳ ඒකකය ඇතුළුව භාණ්ඩාගාර කාර්යයන්හි ක්ෂේත්‍ර කිහිපයක්ම නියෝජනය කර ඇති අතර 2017 සිට, ඇය භාණ්ඩාගාරය සහ ප්‍රාථමික වෙළෙඳ ඒකකයේ සමස්ත කාර්යයන් පාලනය කරමින් සිටී.

ඇය කැලණිය විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තිය ඉහළ සමාර්ථයක් සමඟ ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය මෙන්ම එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් ගෞරවය සහිත ව්‍යාපාර පරිපාලනවේදී (මූල්‍ය) උපාධිය ලබාගෙන ඇත. ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් භාණ්ඩාගාරය, ආයෝජනය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත. ඇය ACI Dealing සහතිකය විශිෂ්ඨ ලෙස අත්කර ගෙන ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකාවක් ද වේ.

ලොකු කලුගේ මිය 2017 දී ප්‍රාථමික වෙළෙඳ සංගමයේ අධ්‍යක්ෂවරියක් ලෙස පත්කරන ලද අතර වර්තමානයේ එහි ලේකම් ලෙස කටයුතු කරයි. එමෙන්ම ඇය ශ්‍රී ලංකා ෆොරොක්ස් සංගමයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකාවක් ලෙස සේවය කරයි.

විධායක කළමනාකාරිත්වය



ඉදිරි පෙළ වමේ සිට දකුණට:

වීල් යූ වීල් අල්විස් මහතා, මංගල කාරියවසම් මහතා, අනුර දිසානායක මහතා, නාලක විජයවර්ධන මහතා, අරුණි ලියනගුණවර්ධන මිය, ප්‍රසාද් ආරියවංශ මහතා, ශ්‍රියා ගලප්පත්ති මිය, සමන්ති සේනානායක මිය

පසු පෙළ වමේ සිට දකුණට:

ගයාත්‍රි ජයසේන මිය, ඉන්ද්‍රික කොඩිතුවක්කු මහතා, ශාන්ත ගඟබඩගේ මහතා, දීපිකා ප්‍රේමදාස මිය, යසස් රාජපක්ෂ මහතා, අරුණ පෙරේරා මහතා, නලින් පතිරණගේ මහතා



ඉදිරි පෙළ වමේ සිට දකුණට:

ඒ යූ ඒ අන්සාර් මහතා, ලක්මාල් ජයරත්න මහතා, තුෂාරි හේවාවසම් මිය, ධම්මිකා දසනායක මිය, ජයන්ත ඩයස් මහතා, සමන් සමරකෝන් මහතා, ආර් රවිකරන් මහතා

පසු පෙළ වමේ සිට දකුණට:

විරාජනී මුණසිංහ මිය, මංජුල දිසානායක මහතා, නලින් පෙරේරා මහතා, නිලන්ති රූබසිංහ මිය, ටී ජී එස් පී කුමාරසිරි මහතා, චමින්ද ඉහළ කෝරාල මහතා, ඉන්දුමිනි රත්නායක මිය, සධානා පෙරේරා මිය

ප්‍රධාන කළමනාකරුවන්

1. **කේ කේ එන් ප්‍රියන්ත මහතා**
ප්‍රධාන කළමනාකරු –
විමර්ෂණ හා විමසුම් දෙපාර්තමේන්තුව

2. **එම් වී පී පීරිස් මිය**
ප්‍රාදේශිය කළමනාකරු –
නුවරඑලිය ප්‍රා.ප්‍ර.කා.

3. **ඩී එම් කපිල මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – මහනුවර ප්‍රා.ප්‍ර.කා.

4. **එන් කේ විමලසිරි මහාතා**
ප්‍රාදේශිය කළමනාකරු – ගාල්ල ප්‍රා.ප්‍ර.කා.

5. **ඩී එස් පී එල් රත්නායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – මාතර ප්‍රා.ප්‍ර.කා.

6. **වී ජී කනගසබෙයි මිය**
ප්‍රාදේශිය කළමනාකරු –
ත්‍රීකුණාමලය ප්‍රා.ප්‍ර.කා.

7. **පී ඒ පී ආර් එස් පෙරේරා මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
කුරුණෑගල ප්‍රා.ප්‍ර.කාග

8. **ඊ පී ඒ සිසිර කුමාර මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
මඩකලපුව ප්‍රා.ප්‍ර.කා.

9. **එස් එල් එම් ඒ එස් සමරතුංග මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
කොළඹ උතුර ප්‍රා.ප්‍ර.කා.

10. **එච් ජී එන් ආරෝහන**
ප්‍රාදේශිය කළමනාකරු –
හම්බන්තොට ප්‍රා.ප්‍ර.කා.

11. **කේ ඒ ඒ එස් පීරිස් මිය**
ප්‍රාදේශිය කළමනාකරු – පුත්තලම ප්‍රා.ප්‍ර.කා.

12. **ආර් එම් එන් පී ගුණතිලක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
මොනරාගල ප්‍රා.ප්‍ර.කා.

13. **ඒ ධනවලවිතාන මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
අනුරාධපුරය ප්‍රා.ප්‍ර.කා.

14. **බී එස් රණතුංග මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
කොළඹ පිටත ප්‍රා.ප්‍ර.කා.

15. **ඩබ්ලිව් ඩී පී ඩී බුද්ධිකා මිය**
ප්‍රාදේශිය කළමනාකරු – කලුතර ප්‍රා.ප්‍ර.කා.

16. **එච් එම් යූ එච් හේරත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – රත්නපුර ප්‍රා.ප්‍ර.කා.

17. **පී ආර් එස් කෝඳාගොඩ මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – ගම්පහ ප්‍රා.ප්‍ර.කා.

18. **පී පී එන් පී ලියනගේ මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
පොලොන්නරුව ප්‍රා.ප්‍ර.කා.

19. **ඒ එම් වී ඩී එල් අධිකාරි මිය**
ප්‍රාදේශිය කළමනාකරු – කෑගල්ල ප්‍රා.ප්‍ර.කා.

20. **එම් එස් කනකහේවගේ මහතා**
ප්‍රාදේශිය කළමනාකරු –
කොළඹ දකුණ ප්‍රා.ප්‍ර.කා.

21. **කේ කොඩිස්වරම් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – යාපනය ප්‍රා.ප්‍ර.කා.

22. **එම් එම් ඒ අමරසිරි මිය**
ප්‍රාදේශිය කළමනාකරු – අම්පාර ප්‍රා.ප්‍ර.කා.

23. **ජී ඩී එන් එල් පොත්තෙවෙල මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – බදුල්ල ප්‍රා.ප්‍ර.කා.

24. **ඒ ජයාසිත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – වන්නි ප්‍රා.ප්‍ර.කා.

25. **ඩී එම් ඩී දිසානායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු – මාතලේ ප්‍රා.ප්‍ර.කා.

26. **ජී ඒ ඒ රණසිංහ මිය**
ප්‍රධාන කළමනාකරු –
මානව සම්පත් දෙපාර්තමේන්තුව

27. **ජී එච් යූ එස් ගුණරත්න මහතා**
ප්‍රධාන කළමනාකරු –
සේවක පුහුණු ආයතනය

28. **එම් ටී එස් එන් සමරසේකර මිය**
ප්‍රධාන කළමනාකරු –
සැපයීම් හා ගබඩා දෙපාර්තමේන්තුව

29. **එල් එන් ඒ එන් කේ නිශ්ශංක මිය**
ප්‍රධාන කළමනාකරු – වාණිජ මූල්‍ය

30. **එම් එච් එම් රිසාන් මහතා**
ප්‍රධාන කළමනාකරු –
අභ්‍යන්තර විගණන දෙපරේතමේන්තුව

31. **ඩබ්ලිව් ඒ එල් වීරසූරිය මහතා**
ප්‍රධාන කළමනාකරු –
අවදානම් කළමනාකරණය හා ණය පාලනය

32. **එච් ඩී ගුණරත්න මහතා**
ප්‍රධාන කළමනාකරු –
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

33. **ඩබ්ලිව් ඩී පියශීලි මිය**
ප්‍රධාන කළමනාකරු –
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

34. **කේ සුභසිංහ මිය**
ප්‍රධාන කළමනාකරු –
ආයතන හා ආයතනික බැංකු අංශය

35. **එන් ශ්‍රීස්කාන්ත මහතා**
ප්‍රධාන කළමනාකරු –
මධ්‍යගත පසු කාර්යාලය

36. **ආර් එල් පේ පීරිස් මහතා**
ප්‍රධාන කළමනාකරු –
ණය සමාලෝචන දෙපාර්තමේන්තුව

37. **වී පී අබේරත්න මිය**
ප්‍රධාන කළමනාකරු –
ආයතන හා ආයතනික බැංකු අංශය

38. **එස් එම් ඒ ආර් සේනානායක මහතා**
ප්‍රධාන කළමනාකරු –
ආයතන හා ආයතනික බැංකු අංශය

39. **ඒ එම් එම් එස් එම් රුවයිස් මහතා**
ප්‍රධාන කළමනාකරු –
අභ්‍යන්තර විගණන දෙපරේතමේන්තුව

40. **එම් එස් සී පී ටී මාරසිංහ මහතා**
ප්‍රධාන කළමනාකරු –
පීපල්ස් කාඩ් මධ්‍යස්ථානය

41. **එම් වී ඩී පෙරේරා මිය**
ප්‍රධාන කළමනාකරු –
සාමාන්‍යාධිකාරී දෙපාර්තමේන්තුව

42. **එල් පී එන් ගුණවර්ධන මිය**
ප්‍රධාන කළමනාකරු – සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය දෙපාර්තමේන්තුව

43. **ආර් අරුණාසලම් මිය**
ප්‍රධාන කළමනාකරු –
විදේශීය ගනුදෙනුකාර සේවා

44. **ඒ ඩී ආර් මෙන්ඩිස් මිය**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
ආයතන හා ආයතනික බැංකු අංශය

45. **ඩී එස් ලෝරන්ස් මිය**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
කොළඹ උතුර ප්‍රා.ප්‍ර.කා.

46. **ජේ ජයවර්ධන මහතා**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී – මාතර ප්‍රා.ප්‍ර.කා.

47. **වයි කේ අතාවුද මිය**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
නීති දෙපාර්තමේන්තුව

48. **පී ආර් කේ එන් ප්‍රනාන්දු මහතා**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
නීති දෙපාර්තමේන්තුව

49. **එස් එම් ඩී කුමාරි මිය**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
අනුරාධපුරය ප්‍රා.ප්‍ර.කා.

50. **වී කේ සුභසිංහ මිය**
ජ්‍යේෂ්ඨ නීති නිලධාරී –
නීති දෙපාර්තමේන්තුව

51. **එච් සී කේ ගුණවර්ධන මහතා**
ප්‍රධාන කළමනාකරු – ඉංජිනේරු සේවා

52. **සී වී එබෙනිසර් මිය**
ප්‍රධාන වෙළෙඳ – භාණ්ඩාගාර ඒකකය

53. **ඩී ඊ එච් වීරසූරිය මිය**
ප්‍රධාන වෙළෙඳ – භාණ්ඩාගාර ඒකකය

54. **ඩබ්ලිව් ඩබ්ලිව්ටී ආර් ප්‍රනාන්දු මිය**
ප්‍රධාන වෙළෙඳ – භාණ්ඩාගාර ඒකකය

55. **කේ එම් සී බී සේනාරත්න මහතා**
ප්‍රධාන ආරක්ෂක අධිකාරී –
ආරක්ෂක දෙපරේතමේන්තුව

56. **ඒ එම් ටී එන් ද සිල්වා මහතා**
ප්‍රධාන කළමනාකරු – තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මෙහෙයුම්

39

වටිනාකම් නිර්මාණය කිරීම

40 / මෙහෙයුම් පරිසරය
47 / පාර්ශ්වකාර සහභාගිත්වය
50 / ප්‍රමාණාත්මතාව
55 / අපගේ උපායමාර්ගය
60 / අපගේ වටිනාකම නිර්මාණය කිරීමේ ආකෘතිය සහ ප්‍රාග්ධන ශේෂ
62 / තිරසාරභාවයට බැඳීම


මෙහෙයුම් පරිසරය

ගෝලීය ආර්ථිකය

ගෝලීය වර්ධනය 2021 6.2% සිට අඩුවෙමින් 2022 දී ඇස්තමේන්තුගත 3.4%ට ලඟා විය. කෙසේවෙතත්, මෙම අඩුවීම වසංගතයෙන් ප්‍රතිසාධනය වෙමින් පැවති වසරක් වූ 2021 සන්දර්භය තුළ දැකීමට සිදු විය. 2022 දී වර්ධනය රුසියා-යුක්‍රේන යුද්ධය හේතුවෙන් පෙර පුරෝකථනවලට වඩා තරමක් අඩුවූ අතර ආහාර සහ බලශක්ති අර්බුදය, ගෝලීය උද්ධමනය සහ චීනයේ කොවිඩ්-19 පුනරුත්ථාපනයට හේතු විය.

ප්‍රධාන ආර්ථිකයන් ඉහළ උද්ධමනයෙන් පීඩාවට පත් වෙමින් දැඩි මූල්‍ය ප්‍රතිපත්තියට සහ දැඩි ණයගැතියාවට හේතු වූ අතර මේ සියල්ල වර්ධනය ප්‍රමාද කිරීමට දායක විය. එක්සත් ජනපදය, යුරෝ ප්‍රදේශය සහ චීනය යන ලෝකයේ ප්‍රධාන වර්ධන ආර්ථික මන්දගාමීත්වයට මුහුණ දුන්හ. මතුවන වෙළෙඳපොල සහ සංවර්ධනය වන ආර්ථිකයන් (EMDES) වෙත පැතිරුණු බලපෑම් තියුණු විය. දැඩි ප්‍රතිපත්තිවල බලපෑම උද්ධමනය පාලනය කිරීම වුවත් බලපෑම 2024 වනතුරු පවතිනු ඇත.

වර්ගීකරණය අනුව වර්ධනය 2018-2022




උසස් ආර්ථිකවල වර්ධන වේගය අඩුවී ඇති අතර – සැබැවින්ම එය මෑත දශකවල ඉහළම මන්දගාමීත්වයකි. විශේෂයෙන් 2022 දෙවන අර්ධය තුළ ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ හැකියාව ඉහළ උද්ධමනය සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය මගින් අඩු කරන ලදි. නිවාස අංශය තුළ කටයුතු ද දුර්වල විය. රුසියාවේ යුක්‍රේන ආක්‍රමණය යුරෝ ප්‍රදේශයට ගෑස් සැපයුම් අවහිර කර දමන ලද අතර බලශක්ති මිල ගණන් සහ උද්ධමනය වැඩි කර ඇත. කර්මාන්තවලට බලශක්ති සැපයීමේ මාර්ග පීඩාවට පත් වූ අතර නිෂ්පාදනය අවහිර කරන අවිනිශ්චිතතාවයට මඟ පාදන ලදී.

මූල්‍ය නම්‍යතාව සැලකියයුතු ලෙස හැකිලීමට ලක් වූ අතර බොහෝ රටවල් ණය ගෙවාදැමීම දුෂ්කරතාවට ඇද දමමින් ගෝලීය මූල්‍ය කොන්දේසි සමඟ ණය තිරසාරභාවය පිළිබඳ ගැටළුවලට මුහුණපාන ලදි. කෙසේවෙතත් බොහෝ රජයන් මූල්‍ය ශක්තිමත් කිරීම අඩුවෙමින් ගෘහස්ථ සහ ආයතන මත මිල වැඩිවීමේ බලපෑම අවම කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.

යුරෝපයේ වර්ධනය මත රුසියා-යුක්‍රේන යුද්ධයේ බලපෑම අපේක්ෂිත ප්‍රමාණයට වඩා තරමක් වෙනස් වී ඇත. ආර්ථිකයන් වෙත රජයේ සහය මෙයට අර්ධ වශයෙන් දායක වේ. කෙසේවෙතත්, හතරවැනි කාර්තුවේ සංඥාවලින් නිෂ්පාදන සහ සේවා අංශ සංකෝචනය වෙන බව සහ ගනුදෙනුකාර සහ ව්‍යාපාර විශ්වාසය දුර්වලවී ඇති බවට යෝජනා කරයි.


එක්සත් ජනපද ආර්ථිකය 2022 දී 2.7%කින් වර්ධනය වූ අතර පසුගිය මාස හය තුළ වර්ධනය මගින් තක්සේරුවට අනුබල දී ඇත. මෙමගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදකයින්ට යම් කාලයක් සඳහා පොලී අනුපාත ඉහළ නැංවීමට ඉඩ ඇත. ආහාර මිල ගණන් ඉහළ යාම සහ දැඩි ශ්‍රම වෙළෙඳපොල මෑත කාලයේදී නොදුටු මට්ටම්වලට උද්ධමනය ගෙන ගොස් ඇත. පාරිභෝගික වියදම් කිරීම හතරවැනි කාර්තුවේ ශක්තිමත්ව පැවති අතර නිවාස සහ නිෂ්පාදනය පහත වැටී ඇත. නව බඳවා ගැනීම් සඳහා ඇති ඉල්ලුම පවතින කම්කරුවන්ගේ සැපයුම ඉක්මවා යන අතර විරැකියාව අඩකින් එහි අවම මට්ටම් කරා පහත වැටී ඇත. කම්කරුවන් රැකියා මාරු කිරීමේ වැඩි ප්‍රවණතාවක් පවතින අතර කලින් විශ්‍රාම යාමේ ප්‍රවණතාවක් ද ඇත.

එක්සත් ජනපදයේ වර්ධන අනුපාත 2019-2023



ගමනාගමනය සීමා කිරීමට හේතු වූ වසංගතය අඛණ්ඩව පැතිරීම, චීනයේ වර්ධනය පසුගාමී වී ඇති අතර එය 3.0% ක වර්ධනයක් පමණක් ලබා ඇත. මෙම සියලු සාධකවල අවසන් ප්‍රතිඵලය වූයේ පරිභෝජනය, ආහාර සහ බලශක්ති නිෂ්පාදනය සහ නේවාසික ආයෝජන කෙරෙහි බාධා ඇතිවීමයි. රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ගැටළු අර්ධ වශයෙන් සමනය කර ඇත. කෙසේවෙතත්, චීන ආර්ථිකය 2023 දී 5.2%කින් වර්ධනය වීමට සහ ගෝලීය වර්ධනයෙන් තුනෙන් එකක් සඳහා දායකවීමට අපේක්ෂා කරයි.

චීන වර්ධන අනුපාත 2019-2023



ගෝලීය වර්ධනය 2023 දී 2.9% දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන නමුත් 2024 දී 3.1% දක්වා යථා තත්ත්වයට පත් වේ. ප්‍රධාන වශයෙන් මහ බැංකු විසින් පනවන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්ති සහ රුසියානු-යුක්‍රේන යුද්ධය හේතුවෙන් මෙම අඩුවීම අපේක්ෂා කෙරේ. මන්දගාමිත්වය ප්‍රධාන වශයෙන් දියුණු ආර්ථිකයන් වෙත බලපානු ලබයි. උද්ධමනය අඩුවීම සහ යුක්‍රේන යුද්ධයේ බලපෑමෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් චීනයේ වර්ධනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

EMDE රටවල් සඳහා වන අනාවැකි මිශ්‍ර වේ. 2023 ජනවාරි WEO වාර්තාවේ 2023 සහ 2024 දී වර්ධනය වන වර්ධන අනුපාතවල අනාගත කටයුතු ඉදිරිපත් කරයි. කෙසේවෙතත්, ලෝක බැංකුවේ 2023 ජනවාරි Global Economic Prospects වාර්තාව ඉතා අඩු ශුභවාදී චිත්‍රයක් ඉදිරිපත් කරයි. මෙම මූලාශ්‍රයට අනුව, චීනය හැර අනෙකුත් EMDE රටවල් සඳහා ඉදිරි දැක්ම ඔවුන්ගේ සම්පූර්ණ ණය වසර 50ක් සඳහා වූ ඉහළම අගය බවට පත්වීම සමඟ බොහෝ දුරට දුර්වල වේ. රුසියානු-යුක්‍රේන යුද්ධය ද පිරිවැය වැඩි කර ඇත. එපමණක් නොව, මෙම රටවල සෞඛ්‍යය. අධ්‍යාපනය, සහ පෝෂණය කොවිඩ්-19 වසංගතයෙන් ඇති වූ පසුබෑම් වලින් තවමත් නොසැලී සිටිති. මෙය මූල්‍ය නම්‍යශීලීභාවය සඳහා කුඩා ඉඩක් ඉතිරි කරයි. 2020-2024 කාලය සඳහා චීනය හැර අනෙකුත් EMDE රටවල ඒක පුද්ගල ආදායම් වර්ධනය සඳහා ප්‍රක්ෂේපනය සංවර්ධිත රටවලට ආසන්න වශයෙන් සමාන වේ. මේ දෙක අතර පරතරය අඩු වේ යැයි අපේක්ෂා කළ නොහැකි බව මින් පෙන්නුම් කරයි.

එය ගෝලීය වශයෙන් මූල්‍ය වෙලෙඳපොලවල් සඳහා ද කැළඹිලි සහිත වසරක් විය. ගෝලීය කොටස් සහ බැඳුම්කර ඇමෙරිකන් ඩොලර් ට්‍රිලියන 30 කට වඩා අහිමි විය. උද්ධමනයෙන් පසු 2022 දී උද්ධමනය, පොලී අනුපාත ඉහළ යාම සහ යුක්‍රේනයේ යුද්ධය ප්‍රධාන හේතු විය. නිව්යෝර්ක් වල, වසරේ අවසාන වෙළෙඳ දිනයේ අධික විකුණුම් 2022 තුළ S & P 500 සහ Nasdaq පිළිවෙලින් 19% සහ 33%ට පහත වැටීම සමඟ වෙලෙඳපොල දර්ශක වේගයෙන් පහත වැටීමකට මඟ පාදන ලදි. සියලුම විනිමය හරහා විකුණන ලද කොටස්වල වෙළෙඳපල වටිනාකම ඇමෙරිකන් ඩොලර් ට්‍රිලියන 25 ක වටිනාකමකින් සෝදාපාලුවක් ඇති විය. බැඳුම්කර වෙලෙඳපොලවල් ද දැඩි විකුණුම්වලට මුහුණ දී ඇත.


ශ්‍රී ලංකා ආර්ථිකය

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකාව දේශපාලන කැලඹීම්, විදේශ විනිමය හිඟය, විදේශ විනිමය සංචිත අඩුවීම, සර්පිල උද්ධමනය සහ ඉහළ පොලී අනුපාත වැනි අර්බුද රාශියකට ගොදුරු විය. මේ සියලු සාධක නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා 2022 නරකම වසර බවට පත් කිරීමට හේතු විය.


2020 වසරේ ණය ශ්‍රේණිගත පහළ දැමීමත් සමඟ ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ශ්‍රී ලංකාවේ ප්‍රවේශය ඒ වන විටත් සීමා වී තිබුණි. රට විදේශ ණය සහ මූල්‍ය ආනයන සඳහා තමන්ගේම සංචිත සහ බැංකු අංශයේ ණය භාවිතා කරමින් අඛණ්ඩව සේවය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස නිල සංචිත 2019 දී පැවති ඇමෙරිකන් ඩොලර් බිලියන7.6 2022 ජූනි මාසයේදී ඇමෙරිකන් ඩොලර් මිලියන 400 දක්වා පහත වැටුණි. බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ද ඇමෙරිකන් ඩොලර් බිලියන -5.9 දක්වා පහත වැටුණි. ජුනි මාසයේදී, විදේශ විනිමය හිඟය නිසා ඉන්ධන, ගෑස්, ඖෂධ, කාර්මික අමුද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල දැඩි හිඟයක් ඇති විය.

විදේශීය සේවකයින්ගේ ප්‍රේෂණ ද වේගයෙන් පහළ වැටුණි. මෙම ප්‍රේෂණ පසුගිය දශක දෙක තුළ සාමාන්‍යයෙන් වෙළෙඳ හිඟයෙන් 80%ක් සඳහා දායක වී ඇත. කොවිඩ්-19 වසංගතයේ සිට පහත වැටුණ ප්‍රේෂණ 2021 ඔක්තෝම්බර් මාසයේදී මහ බැංකුව කෘත්‍රිමව ඩොලරයකට රුපියල 200 ලෙස නියම කිරීමෙන් පසු තවදුරටත් පහත වැටීමකට ලක් විය. මේ නිසා විදේශ රටවල සිටින බොහෝ ශ්‍රී ලාංකිකයින් නිල නොවන මාර්ග හරහා මුදල් ප්‍රේෂණය කිරීමට යොමු වූ අතර, එමඟින් ඔවුන්ට ඉහළ අනුපාත ලබා ගත හැකිය. 2022 ජනවාරි සිට මැයි දක්වා, ලද ප්‍රේෂණවල වටිනාකම ඇමෙරිකන් ඩොලර් බිලියන 1.3ක් වූ අතර එය 2021 හි මෙම කාලසීමාව සඳහා වූ අගයෙන් භාගයකටත් අඩුය. තත්ත්වය දරාගත නොහැකි වීමත් සමඟ, 2022 මැයි මාසයේදී ඩොලරයට රුපියල් 360 දක්වා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය විය.

ඇමෙරිකානු ඩොරලයේ විනිමය අනුපාත



ප්‍රේෂණ



වසර තුළ උද්ධමනය පෙර නොවූ විරූ මට්ටම් කරා ළඟා විය; 2022 අගෝස්තු මාසයේදී වාර්ෂික උද්ධමනය 64.3%ක් වාර්තා කළේය. ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම, දේශීය හා ගෝලීය සැපයුම් අංශයේ බිඳවැටීම් සහ මෑත අතීතයේ ලිහිල් මුදල් ප්‍රතිපත්තිවල ප්‍රමාද වූ බලපෑම ඇතුළු බොහෝ සාධක මෙම සර්පිලාකාර උද්ධමනයට හේතු වී ඇත. එපමනක් නොව, 2019 දී බදු අනුපාත දැඩිව අඩු කිරීමේ බලපෑම ද සමස්ත ඉල්ලුම වැඩිවීමට පමණක් නොව වර්ධනය වන අයවැය හිඟය සඳහා මූල්‍යකරණය අවශ්‍යතාව ඇති කිරීමට හේතුවක් විය. 2021 දී රසායනික පොහොර තහනම් කිරීමේ බලපෑම ආහාර හිඟයකට හේතු වූ අතර එය මිල ගණන් ද ඉහළ යාමට මෙන්ම විදේශ විනිමයේ දැඩි හිඟයකට ද හේතු විය.

අතිශයින් ඉහළ උද්ධමනය සහ පොලී අනුපාත නිසා ජනගහනයේ අඩු ධනවත් කොටස්වලට ඉමහත් දුෂ්කරතා ඇති කර ඇත; බොහෝ ව්‍යාපාර ද දැඩි අර්බුදයක පවතී.


උද්ධමන පීඩනය වැඩිවීමත් සමඟ මහ බැංකුව සමලෝචිත වර්ෂය පුරාම දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් පවත්වාගෙන ගියේය. ප්‍රධාන පොළී අනුපාත, SDFR සහ SLFR 2022 ඔක්තෝබර් අවසානය වන විට පිළිවෙලින් 14.50% සහ 15.50% දක්වා 10 pps කින් වැඩි කරන ලදී. 2022 ඔක්තෝබර්-දෙසැම්බර් කාලපරිච්ඡේදය තුළ උද්ධමන අනුපාතවල යම් මධ්‍යස්ථභාවයක් පැවති අතර, එය පාරිභෝගික මිල දර්ශකවලින් පිළිබිඹු වන අතර, එය අවම වශයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගවලට අර්ධ වශයෙන් ආරෝපණය කළ හැකිය. මූල්‍ය ප්‍රතිපත්තිය 2023 දී ලිහිල් කිරීමට අපේක්ෂා කරන අතර එය වසර මැද සිට පොළී අනුපාත අඩු කිරීමකට හේතු වනු ඇත.

2022 අප්‍රේල් මස ශ්‍රී ලංකාව ණය ගෙවීම පැහැර හරින ලදී. මෙය ශ්‍රී ලංකා ෆිච් රේටින් (දැනටමත් CCC දක්වා පහළට ශ්‍රේණිගත කර ඇති) තවදුරටත් සීමිත පැහැරහැරීම (RD) දක්වා පහළට ශ්‍රේණිගත කිරීමකට හේතු විය. අර්බුදකාරී තත්වයේ යම් ලිහිල් කිරීමක් සිදු නොවන්නේ නම්, විදේශ ණය ගැනීම් සඳහා ඇති සියලු මාර්ග මෙමගින් වැසී ගියේය.

2022 පළමු අර්ධය තුළ ආර්ථිකය වාර්ෂිකව 4.8% කින් හැකිලී (2021 පළමු අර්ධයේ 9.3%ක වර්ධනයට සාපේක්ෂව) ගිය අතර වර්ෂය තුළ 8% – 9.2% කින් හැකිලී යනු ඇති බවට ගණන් බලා ඇත. ජනගහනයෙන් 25% ක් පමණ දරිද්‍රතා මායිමට පහළින් සිටින අතර මෙම තත්ත්වය දිගු වීමක් අපේක්ෂා කළ හැකිය.


විදේශ විනිමය අර්බුදයට දේශීය හා ගෝලීය යන දෙඅංශයේ ආරාවුල බලපෑවේය. 2022 හි පළමු අර්ධයෙහි වෙළෙඳ භාණ්ඩ ආනයනය මත වියදම 2021 හි අනුරූප කාර්තුව සඳහා වූ වියදම ඉක්මවා ඇත. මෙය අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවලට ආනයන සීමා කිරීමේ හදිසි අවශ්‍යතාවයක් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආනයන අගය පහත වැටීමක් සිදු වූ අතර අපනයන ස්ථාවරව පැවතුණි. 2022 දී ශ්‍රී ලංකාවේ මුළු අපනයන ඇමෙරිකන් ඩොලර් බිලියන 13 ඉක්ම වූ අතර 2021 දී පැවති ඉහළම අගයට වඩා ආසන්න වශයෙන් 5%ට වඩා වැඩිය. අනෙක් අතට, ආනයන ඇමෙරිකන් ඩොලර් බිලියන 18.3 දක්වා වාර්ෂිකව 11.4කින් අඩුවිය.

අපනයන හා ආනයන



වර්ධනය වන ආර්ථික දුෂ්කරතා පෙර නොවූ විරූ පරිමාණයක් මත ජනප්‍රිය විරෝධය ප්‍රකාශකිරීමක් ආකාරයෙන් දේශපාලන ආරාවුලකට ඉඩ සලසන ලදී. ජනාධිපතිගේ නිල නිවස ඇතුළුව රජයේ ගොඩනැගිලිවලට විරෝධතාකරුවන් බලාත්කාරයෙන් ඇතුළු වූ අතර මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ වත්මන් ජනාධිපතිවරයාගේ ඉල්ලා අස්වීමයි. ඉන් පසුව ඇති වූ දේශපාලන අවිනිශ්චිත කාලපරිච්ඡේදය දුෂ්කර අර්බුදය ආමන්ත්‍රණය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්තියක ස්වරූපය සකස් කරන ලදී.

උද්ධමන අනුපාත



වත්මන් තත්ත්වය සමනය කිරීම සඳහා ඇති එකම ප්‍රායෝගික ක්‍රමය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් විස්තීරණ අරමුදල් පහසුකමක් (EFF) ලබා ගැනීම බවට පුළුල් එකඟතාවක් පවතී. මේ සඳහා සාකච්ඡාවන් දැනට සිදුවෙමින් පවති. 2022 අගෝස්තු මස IMF දූත පිරිස සේවක මට්ටමේ එකඟතාවයකට ලඟාවිය. මෙම ගිවිසුමට බැඳි නොමැති අතර IMF මණ්ඩලය විසින් අනුමත කිරීමට යටත් වේ.

ගිවිසුමේ පුළුල් වැදගත් සිදුවීම්වලින් කිහිපයක් පහත දැක්වේ;

- විස්තීරණ අරමුදල් පහසුකම ඇ.ඩො.බි 2.9 ක් වනු ඇත.
- මෙහි පරමාර්ථ වන්නේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය ස්ථායිතාව යලි ගොඩ නැගීම මෙන්ම මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කරමින් අනතුරට ලක්වීමෙන් ආරක්ෂා වීමයි.
- ශ්‍රී ලංකාවේ ණයහිමියන්ගේ ණය සහනය සහ බහුපාර්ශවික හවුල්කරුවන්ගෙන් අමතර මූල්‍යකරණය ණය තිරසාරභාවය සහතික කිරීමට සහ මූල්‍ය පරතර යා කිරීමට අවශ්‍ය වනු ඇත.

අරමුදල විසින් අධිකාරී වැඩසටහනක් සඳහා ද එකඟ වී ඇති අතර එහි ප්‍රධාන අංග කිහිපයක් පහත දැක්වේ;

- ආදායම් වැඩි කරන බදු ප්‍රතිසංස්කරණ මඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම.
- රාජ්‍ය ව්‍යවසායන්ගෙන් මූල්‍ය පාඩු අවම කිරීම සඳහා ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය ප්‍රතිසාධන මිලකරණය හඳුන්වා දීම.
- දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ බලපෑම අවම කිරීම සඳහා වඩා යහපත් ඉලක්ක සහිතව සමාජ වියදම් ඉහළ නැංවීම.
- වැඩසටහන යටතේ ප්‍රතිපත්ති පැකේජය මඟින් අනුග්‍රහය දක්වන වෙළෙඳපල තීරණයකළ සහ නම්‍යශීලී විනිමය අනුපාතයක් හරහා විදේශ විනිමය සංචිත නැවත ගොඩ නැගීම
- යහපත් සහ ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම.

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය

ආර්ථික හා මූල්‍ය වාතාවරණයන් හී පවතින පසුබට තත්ත්වයන් සමඟ මූල්‍ය අංශය ද දැඩි පීඩනයකට ලක්ව ඇත. අඩු විදේශ විනිමය ද්‍රවශීලතාවය සහ ඉහළ පොලී අනුපාත බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඒවායේ බලපෑම ඇති කරයි. ආර්ථිකයේ බලපෑම් ආර්ථිකයේ සෑම අංශයකටම පාහේ කාන්දු වන බැවින් බැංකු ඉහළ බොල් ණයවලට සහ අක්‍රීය ණයවලට මුහුණ දී ඇත. රටේ ශ්‍රේණිගත කිරීම පහත හෙළීම නිසා බැංකුවලට විදේශ මුදල් හා ප්‍රතිපාර්ශව ගනුදෙනු සඳහා ප්‍රවේශය දැඩි ලෙස සීමා විය.

වත්මන් වටපිටාව තුළ, ආර්ථික නිමැවුම් සංකෝචනය වීම, පවතින ඉහළ පොලී අනුපාත සහ බදු සංශෝධන වැනි ප්‍රධාන ප්‍රබල ප්‍රවාහයන්ට බැංකු මුහුණ දෙමින් සිටී, නැතහොත් මුහුණ දීම අපේක්ෂා කළ හැකිය. රාජ්‍ය ව්‍යවසාය විශේෂයෙන් රජය බැංකුවලට ප්‍රධාන නිරාවරණය තවත් එක ප්‍රධාන ගැටළුවකි. වාණිජ බැංකුවලින් රජය වෙත ණය පහළ වැටීම හමුවේ, රජයට අයත් ව්‍යවසාය වෙත බැංකු විසින් මූල්‍යකරණය 2022 ජූනි මස වාර්ෂිකව 52.9කින් වැඩි විය. එසේ වුවද, පෞද්ගලික බැංකුවලින් රජයට සහ රාජ්‍ය ව්‍යවසායයට ලබා දෙන ණය ඔවුන්ගේ මුළු වත්කම්වලින් 33%ක් දායක වන අතර; මෙම ණයවල පාඩු හඳුනාගත යුතුව ඇත. 2022 ජූනි මාසයේදී පුද්ගලික ණය වාර්ෂිකව 17.1%ක වර්ධනයක් පෙන්නුම් කරමින් ඉහළ යාමේ සලකුණු පෙන්නුම් කර ඇත. ධනාත්මක සටහනක් සඳහා, දැඩි පීඩනයට ලක් වුවද, පිළිගත හැකි ප්‍රාග්ධන මට්ටම් සහ හානිකරණ අනුපාත පවත්වා ගැනීමට බැංකු පද්ධතිය සමත් වූ බව කිව යුතුය.

බැංකුවලින් ණය ගැණුම්කරුවන්ට සහන ලබාදී තිබියදීත් එය සමනය කර නොමැති වත්මන් සාර්ව ආර්ථික පසුබිම හේතුවෙන් හානි වූ ණයවල වැඩිවන ප්‍රවණතාවක් පවතී. 2022 සැප්තැම්බර් මාසයේදී, ඉහළ පෙළේ බැංකු විසින් වසරකට පෙර මට්ටමට වඩා 70%කට වඩා බොල් ණය වෙන්කිරීම් වාර්තා කර ඇත. මෙය විශාල වශයෙන් ඩොලරයෙන් නම්කළ ජාත්‍යන්තරය විසින් ස්වෛරීත්ව බැඳුම්කර (ISBs) සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs) මඟින් මෙහෙයවනු ලැබ ඇත. ISB සඳහා හානිකරණ 25-30% පමණ වන අතර SLDB සඳහා එය 20% පමණ වේ. බැංකුවල වත්කම්වල ගුණාත්මකභාවය අඩුවීම මුළු ණය අනුපාතයට අදියර 3 ණය මඟින් පෙන්නුම් කරන බව මහ බැංකුව සඳහන් කර ඇත. 2022 අගෝස්තු මස අවසානයට, අදියර 3 ණය රුපියල් බිලියන 475.1ක (56.9%) වැඩිවීමක් වාර්තා කළ අතර රුපියල් ට්‍රිලියන 1.3ට ලඟා වී ඇත. තවද, මුළු ණයවලට අදියර 3 ණය 2021 අවදානයට පැවති 7.1% සිට 2022 අගෝස්තු අවසානයට 10.6% දක්වා වැඩි වී ඇත. සමාගම් සහ පුද්ගලයින් වෙත ණය විලම්භන ලබාදීම ද හානිකරණ වැඩිවීමට හේතු විය. ඉහළ යන පොළී අනුපාත සහ ආනයනවල සීමා කිරීම් ඵලදායී ආකාරයෙන් අත්තිකාරම්වල යම් වර්ධනයක් ලබාගෙන ඇත.

ඉන්ධන අර්බුදය සහ විදුලිය බිඳවැටීම් කාර්මික නිමැවුම්වලට සහ බැංකුවේ ගනුදෙනුකරුවන්ගේ වාණිජමය මෙහෙයුම්වලට බලපා ඇත. ඉදිකිරීම්, පුනර්ජනනීය බලශක්තිය සහ පොහොර වැනි ඇතැම් ප්‍රධාන කර්මාන්ත සඳහා ගෙවීමේ ප්‍රමාද ඔවුන්ගේ මුදල් ප්‍රවාහයට බලපා ඇති අතර ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව අඩාල කර ඇත. සාර්ව ආර්ථික තත්ත්වයන් පාරිභෝගික අංශයට ද බලපා ඇත; උද්ධමනය සමඟ සහ පාරිභෝගික මිල ඉහළ යාම නිසා ගනුදෙනුකරුවන්ට ණය ආපසු ගෙවීමට කඩා ඉඩක් ඉතිරි කරමින් තම ආදායම ආහාර සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වෙත යොමු කිරීමට සිදුව ඇත. ණය හානිකරණ සඳහා වැඩියෙන් වෙන් කිරීම ලාභදායිත්වය අඩු කිරීමට හේතු විය. මෙය ආයෝජක විශ්වාසය බිඳ වැටීමට හේතු වූ අතර එය දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ප්‍රාග්ධනය රැස් කිරීමට බාධා ඇති කරයි. ලාභය පහත වැටීම ද වඩා අඩු රඳවාගත් ලාභවලට හේතු වූ අතර එය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත කෙරෙහි බලපෑම් කරමින් නව ණය ලබාදීමේ බැංකුවේ හැකියාව සංකෝධනය කරන ලදී. පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ අඩුවීම ද ඔවුන්ගේ මූල්‍ය වත්කම් ඉතුරුම් හෝ කාලීන තැන්පතුවල ආයෝජනය කිරීම වෙනුවට ඒවා ද්‍රවශීල ආකාරයෙන් තබා ගැනීමට ඔවුන් උනන්දු කරන ලදී.

උද්ධමනය විසින් ඇතිකළ වඩා ඉහළ මෙහෙයුම් පිරිවැය, රුපියලේ අවප්‍රමාණය සහ හානිකරණවල වැඩිවීම මඟින් බැංකු අවහිර කර ඇත. මෙය ස්වභාවිකවම පටු ලාභ ආන්තිකවලට හේතු වී ඇත. වෘත්තිකයින් සහ වෙනත් පුහුණු කාර්ය මණ්ඩලය අතර විශේෂයෙන් සහශ්‍ර වාර්ෂික පරම්පරාව අතර සංක්‍රමන සිදුවීම් පැවතුණි. මෙම ප්‍රවනතාව වර්ධනය වුවහොත්, ඉදිරි වසරවල මානව සම්පත් පිළිබඳ බරපතල ගැටළුවලට මුහුණ දීමට සිදුවිය හැකිය.


බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන දර්ශක

	2018	2019	2020	2021	2022	වාර්ෂික වෙනස 2022 (%)
වත්කම් හා වගකීම් (රු.බි)						
වත්කම්	11,794	12,523	14,666	16,924	19,400	14.6
ශුද්ධ ණය සහ අත්තිකාරම්	7,580	7,961	8,970	10,180	11,300	11.0
තැන්පතු	8,492	9,162	11,141	12,671	15,300	20.7
ණය ගැනීම්	1,763	1,679	1,692	2,181	1,900	-12.9
බදු පෙර ලාභය	195	172	190	259	192.2	-25.8
බදු පසු ලාභය	126	111	136	198	151.7	-23.4
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව (%)						
ප්‍රධාන ප්‍රාග්ධනය (පළමු පෙළ ප්‍රාග්ධණය) ප්‍රමාණාත්මතාව	13.1	13.0	13.0	13.2	12.3	
මුළු ප්‍රාග්ධනය ප්‍රමාණාත්මකා අනුපාතය	16.2	16.5	16.5	16.5	18.3	
වත්කම්වල ගුණාත්මකභාවය (%)						
දළ ක්‍රිය අත්තිකාරම් අනුපාතය	3.4	4.7	4.9	4.5	N/A	
ශුද්ධ ක්‍රිය අත්තිකාරම් අනුපාතය	2.0	2.8	2.4	1.7	N/A	
මුළු ණය සඳහා අදියර 3 ණය	-	-	-	7.6	11.3	
ලාභදායීතාව (%)						
බදු පෙර වත්කම් මත ඉපයීම් (ROA)	1.8	1.4	1.4	1.6	1.0	
බදු පසු වත්කම් මත ඉපයීම්	1.1	0.9	1.0	1.2	0.8	
ස්කන්ධය මත ඉපයීම් (ROE)	13.2	10.3	11.4	14.5	10.5	
පොළී ආන්තිකය	3.6	3.6	3.1	3.4	4.0	
ද්‍රවශීලතා දර්ශක						
තැන්පතුවලට ණය අනුපාතය	90.6	88.7	82.6	82.7	73.9	
ද්‍රවශීල වත්කම් අනුපාතය	27.6	31.0	37.3	33.8	29.9	

වෙළෙඳපොල පොළී අනුපාත

	දෙසැම්බර් 2018	දෙසැම්බර් 2019	දෙසැම්බර් 2020	සැප්තැම්බර් 2021	දෙසැම්බර් 2021	සැප්තැම්බර් 2022	දෙසැම්බර් 2022
SDFR	8.0	7.0	4.5	5.0	5.0	14.5	14.5
SLFR	9.0	8.0	5.5	6.0	6.0	15.5	15.5
AWDR	8.8	8.2	5.8	4.8	4.9	11.6	14.1
AWFDR	10.9	10.1	7.1	5.6	5.9	15.4	18.5
AWLR	14.4	13.6	10.3	9.4	9.9	16.9	18.7

බැංකු ක්ෂේත්‍රයේ වත්කම් සහ ශුද්ධ ණය හා අත්තිකාරම්



බැංකු ක්ෂේත්‍රය සමඟ සාපේක්ෂව මහජන බැංකුවේ කාර්යසාධනය

	2022			2021		
	බැංකු ක්ෂේත්‍රය	මහජන බැංකුව	මහජන බැංකුවේ කොටස (%)	බැංකු ක්ෂේත්‍රය	මහජන බැංකුව	මහජන බැංකුවේ කොටස (%)
වත්කම් (රුපියල් බිලියන)	19,400	2,972	15.3	16,924	2,648	15.6
තැන්පතු (රුපියල් බිලියන)	15,300	2,372	15.5	12,671	2,072	16.3
බදු පෙර ලාභය (රුපියල් බිලියන)	192.2	21.3	11.1	285.7	30.4	10.6
බදු පසු ලාභය (රුපියල් බිලියන)	151.7	17.2	11.3	198.4	23.7	12.0
පළමු පෙල ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	12.3	11.9	-	13.2	12.6	-
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	15.3	16.3	-	16.5	17.8	-
බදු පෙර වත්කම් මත ඉපයීම (%)	1.0	0.8	-	1.6	1.2	-
පොළී ආන්තිකය (%)	4.0	2.7	-	3.4	3.4	-

අනාගත දැක්ම

සමස්ථ ආර්ථිකය දෙස බැලීමේදී, යෝජිත IMF-EFF වැඩසටහන, මෙතෙක් පැවති සාකච්ඡා වල ප්‍රගතිය සහ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සලකා බැලීමේදී ශුභවාදී වීමට යම් යම් හේතු තිබේ. 2023 අග භාගයේදී ආර්ථිකයේ පෙරළියක් අපේක්ෂා කිරීමට සාධාරණ හේතු තිබේ. කෙසේ වෙතත් මෙය දේශපාලන පෙරමුණක් ඇතුළු බොහෝ පැති මත රඳා පවතී. පැහැදිලි දිශානතියක් තිබේ නම් රට මධ්‍යකාලීනව තිරසාර ප්‍රගතියක් අත්කර ගැනීමට ඉඩ ඇත. කෙසේ වෙතත් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව පිළිබඳ බරපතල ගැටළු පවතී. මේ පිළිබඳ නිශ්චිත ලකුණු තවමත් නොමැත, නමුත් බැංකු ක්ෂේත්‍රයේ මහඟු දායකත්වය මේ සඳහා අතිශයින්ම වැදගත් වේ.

බැංකු ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, බැංකු මුහුණ දෙන ප්‍රධාන අභියෝග වන්නේ විදේශ විනිමය ද්‍රවශීලතාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ වත්කම්වල ගුණාත්මකභාවය පවත්වා ගැනීමයි. දේශීය හා විදේශීය ව්‍යවහාර මුදල්වල ද්‍රවශීලතාවය අතිශයින්ම ප්‍රවේශමෙන් නියාමනය කළ යුතුය. එකඟවී ඇති බහු පාර්ශ්වික නියෝජිතායතන සහ ණයවර ලිපි සඳහා වූ බැඳීම් පැහැර හරිනු නොලබන බව සහතික කිරීමට අංශය එහි උපරිමයෙන් කළ යුතුය. ඕනෑම විදේශ මුදල් බැඳීමක් ඉන්ධන සහ ඖෂධ, සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ආනයන සඳහා අඛණ්ඩව ප්‍රමුඛත්වය දිය යුතුය. විවිධ ගනුදෙනුකාර අංශවලට සහ ඔවුන්ගේ තත්ත්වයට සංවේදීව කළඹේ ගුණාත්මකභාවය කළමනාකරණය කළ යුතුව ඇත. විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සහකම්පනයෙන් කටයුතු කිරීමට සිදුවනු ඇත. එසේ නොමැති නම් මෙම අංශයේ බොහෝ ව්‍යවසායන් නොනැසී පැවතිය නොහැකිය. බැංකු විසින් අක්‍රිය ණය අනුපාතය සහ ඒවායේ ප්‍රාග්ධනය මත ඇතිවන විවිධ බලපෑම් පිළිබඳව බහු – ක්‍රියාදාම විශ්ලේෂණ සිදු කළ යුතුය. එමගින් අක්‍රිය ණය මට්ටම්වලට තුඩු දෙන අවදානම් ඉවසීමේ මට්ටම ඔවුන්ට නිශ්චය තරගත හැකිය.

පාර්ශ්වකාර සහභාගිත්වය

මහජන බැංකුව තුළ, අපගේ උපාය මාර්ගික සැලැසුම් තීරණ සඳහා, තිරසාර සහ තුළනාත්මක තිරණ ගනු ලබන බව සහතික කිරීමේදි පාර්ශ්වකාර සහභාගිත්වය ප්‍රධාන වේ. අපගේ පාර්ශවකරුවන් වන්නේ අපගේ ව්‍යාපාර මෙහෙයුම්වලින් සැලකිය යුතු ලෙස බලපාන හෝ සැලකිය යුතු ලෙස බලපෑ හැකි පුද්ගලයින්, කණ්ඩායම් හා ආයතනයි. මෙම ආයතන සහ අප අතර අඛණ්ඩ සංවාදය පවත්වා ගැනීම පිණිස, වසර පුරා අපත් සමඟ මැදිහත්වීමට අවස්ථාවන් ගණනාවක් අපගේ පාර්ශවකරුවන් වෙත අපි පිරිනමමු. මෙවැනි හුවමාරුවීම් අපගේ උපායමාර්ගයේ දිශාව කෙරෙහි බලපාන අතර පාර්ශ්වකාර අවශ්‍යතා සහ අපේක්ෂාවන් සමඟ පෙළ ගැසෙමින් අපි කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව ඔවුන් සඳහා තරඟකාරී තිරසාර වටිනාකම සංවර්ධනය කරමු.

පාර්ශ්වකාර සහභාගිත්ව ක්‍රියාවලිය


අපගේ පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම

බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සහභාගිත්වයේ මට්ටම, අපගේ මෙහෙයුම් කෙරෙහි බලපෑම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලය මත පදනම් වී හඳුනා ගනී. ඔවුන්ගේ නිරන්තර යෙදුම් වගකිම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ කාර්යභාරය වඩා හොඳින් ඉටු කිරීමට අපට සහය වේ.

	ආයෝජක	ගනුදෙනුකරුවන්	සේවකයින්/වෘත්තීය සමිති	නියාමනයින්/නීති	සැපයුම්කරුවන්	ප්‍රජාව/පරිසරය
ඔවුන් කවුරුන්ද	රජය සහ වෙනත් කොටස්හිමියන්	• රාජ්‍ය අංශයේ සේවාදායකයින් • ආයතනික සහ සංස්ථාපිත බැංකු සේවාදායකයින් • පාරිභෝගික හා සුළු හා මධ්‍ය පරිමාණ සේවාදායකයින් • තැරැව්කරුවන් හා අතරමැදියන්	පූර්ණ කාලීන සහ අර්ධ කාලීන පරිසර පද්ධති	• රජය සහ නියාමකයින් • වෙනත් රාජ්‍ය නොවන ආයතන	• සැපයුම්කරුවන් • ව්‍යාපාර හවුල්කරුවන්	දේශීය ප්‍රජාවන් සහ පරිසර පද්ධති
ඔවුන් අපට වැදගත් වන්නේ ඇයි	අපගේ ව්‍යාපාරයේ තිරසාර වර්ධනය සහ කාර්යසාධනය සඳහා ප්‍රාග්ධනයට අඛණ්ඩ ප්‍රවේශය තිබීම.	ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලන නිෂ්පාදන අඛණ්ඩව නවෝත්පාදනය සහ සංවර්ධනය. ඒ තුළින් තරඟයෙන් අපව වෙන්කිරීම සහ ගනුදෙනුකාර අත්දැකීම සහ ගනුදෙනුකාර තෘප්තිය අනුව සීමාව සැකසීම.	වර්ධනයවීමට, සාර්ථකවීමට සහ ඔවුන්ගේ සම්පූර්ණ හැකියාව අත්කර ගැනීමට අවස්ථා නිර්මාණය කරමින් බැංකුවක් ලෙස එකම දැක්ම හුවමාරු කරන පක්ෂපාතී කැපවූ සහ අභිප්‍රේරිත සේවක කණ්ඩායමක් ලබාගැනීම.	බැංකුවට වැඩිපුර අරමුදල් ආකර්ෂණය, නව සේවාදානයනිට මූල්‍යකරණය සහ අනාගත අවිනිශ්චිතතාවල විභව බලපෑම් අවම කිරීම සඳහා බැංකුවේ සදාචාර මෙහෙයුම් සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය සහතික කිරීම.	තිරසාර සැපයුම් දාමයක් පෝෂණය කර ශක්තිමත් කිරීම හා ඒ තුළින් වගකීම්සහගත සහ තිරසාර මූලාශ සඳහා ක්ෂේත්‍රයේ සීමා සකස් කරමින් හුවමාරු වටිනාකම අපි අඛණ්ඩව නිර්මාණය කරමු.	තිරසාර සංවර්ධන අරමුණු (SDGs) අත්කර ගැනීමේ අපේක්ෂාවෙන් දායකවීම සහ වර්තමානයේ ඇතිවන සමාජ හා පාරිසරික ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී අපගේ කාර්යය ඉටු කිරීම.

අපගේ පාර්ශ්වකරුවන් ප්‍රමුඛ කිරීම

බැංකුවේ මෙහෙයුම් මත පාර්ශවකරුවන්ගේ බලපෑම් මට්ටමට අනුව ඔවුන් ශ්‍රේණිගත කෙරේ.
ඔවුන් සමඟ දැනට පවත්නා අපගේ මැදිහත්වීම තුළ අප විසින් සිදුකිරීමට අවශ්‍ය ගැලපීම් මින් තීරණය කරනු ඇත.



අපගේ පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය

පහත වගුවෙන් පාර්ශවකරුවන් සමඟ අපි කටයුතු කරන ආකාරය විස්තර කෙරේ.

	ආයෝජකයින්	ගනුදෙනුකරුවන්	සේවකයින්/වෘත්තීය සමිති
ප්‍රධාන ගැටළු/අපේක්ෂාවන්	• ස්ථීර ආර්ථික කාර්යසාධනය • පාරිසරික, සමාජීය සහ පාලන (ESG) නිර්ණායකය • තිරසාර වර්ධනය • විනිවිදභාවය • ව්‍යාපාර අඛණ්ඩතාව • සන්නාම කීර්තිනාමය සහ ප්‍රතිරූපය • ආයතනික ඔරොත්තු දීම. • පිරිවැය ප්‍රශස්ථකරණය • වත්කම්වල ගුණාත්මකභාවය	• පර්යේෂණය හා නව්‍යකරණය • සේවයේ ගුණාත්මකතාව • සබඳතා කළමනාකරණය • අනුකූලතාව • සේවා වැය දැරිය හැකි බව • පහසුව හා ප්‍රවිෂ්ට විය හැකි බව • බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය • කඩිනමින් පැමිණිලි විසඳීම • සෞඛ්‍ය සහ ආරක්ෂාව • ස්ථාවර ශ්‍රේණිගතකරණය • රහස්‍යතාව සහ සයිබර් ආරක්ෂාව • ගනුදෙනුකාර සන්නිවේදනය	• සෞඛ්‍ය සහ ආරක්ෂාව • දෙමුහුන් සේවා පරිසරයේ නම්‍යතාව • විනිවිද, සාධාරණ හා ආකර්ශනීය පාරිශ්‍රමිකය • සේවක සංවර්ධනය • සේවක සහභාගිත්වය • දක්ෂතා ප්‍රවාහ මාර්ගය හා රඳවා තබා ගැනීම • වෘත්තීය ඉඩප්‍රස්ථා • විධිත්වය හා සර්වග්‍රහණය • ව්‍යාපාර අඛණ්ඩතාව • පිළිගැනීම සහ අත්කර ගැනීම • දිරිදීමනා සහ ප්‍රතිලාභ

සහභාගිත්ව මාර්ග හා වාරගණන	වාරගණන	සහභාගිත්ව රටාව	වාරගණන	සහභාගිත්ව රටාව	වාරගණන	සහභාගිත්ව රටාව
	වාර්ෂික	වාර්ෂික වාර්තාව	ඉදිරියට යන	ගනුදෙනුකාර සංතෘප්ත සම්ක්ෂණය	වාර්ෂික	කාර්යසාධන ඇගයීම
	කාර්තුමය	මූල්‍ය ප්‍රකාශන	ඉදිරියට යන	ගනුදෙනුකාර ජාලකරණය	ඉදිරියට යන	සාමූහික කේවල්කරණය
	අඛණ්ඩ	ආයතනික වෙබ් අඩවිය	ඉදිරියට යන	ආයතනික වෙබ් අඩවිය	ඉදිරියට යන	බහු – මට්ටම් කාර්ය මණ්ඩල රැස්වීම්
	ඉදිරියට යන	දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදනය	ඉදිරියට යන	සබඳතා කළමනාකරණය	ඉදිරියට යන	සේවක ආගමනය හි ප්‍රශස්ථකරණය
			ඉදිරියට යන	මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්	ඉදිරියට යන	පුහුණු වැඩසටහන්
			ඉදිරියට යන	ගනුදෙනුකාර හඳිසි අංකය	ඉදිරියට යන	සමූහ අන්තර්ජාලය/ඊමේල්
			ඉදිරියට යන	සමාජ මාධ්‍ය	ඉදිරියට යන	Pulse සඟරාව
අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය	ශක්තිමත් සහ දිගුකාලීන තිරසාර වටිනාකම ලබාදීමට අපගේ ආයෝජකයින් සමඟ අපි සහයෝගයෙන් සිටින අතර අපගේ සාර්ථකත්වය සහ ප්‍රතිඵල පිළිබඳව ඔවුන් කඩිනමින් සහ විවෘතව දැනුවත් කර තබා ගනිමු.		අපි වඩාත් යාවත්කළ ඉක්මන් සහ පහසු ඩිජිටල් බැංකුකරණ මෙවලම සහ යෙදුම් ලබාදෙන්නෙමු. අපගේ ගනුදෙනුකරුවන්ගේ භාවිත අත්දැකීම වැඩි කිරීමට ඒවා නව්‍යකරණය හා මුසුව නිර්මාණය කරමු.		සම්මාන සහ පිළිගැනීම, අභිවෘර්ධිය, සාධාරණ වැටුප් ගෙවීම, සහ පුහුණු අවස්ථා තුළින් පුද්ගල සහ වෘත්තීය සංවර්ධනයට සහයවන ආරක්ෂිත සහ අභිප්‍රේරක සේවා පරිසරයක් අපි පිරිනමමු.	

අපගේ පාර්ශ්වකරුවන් වෙත ලබාදුන් වටිනාකම

ආයෝජකයන්	ගනුදෙනුකරුවන්	සේවකයින්/වෘත්තීය සමිති	නියාමකයින්/නීති සම්පාදකයින්
ස්කන්ධය මත ඉපයීම 12.2% කොටස් ඉපයීම් රු. 17,192 විශේෂ බදු සහ ලාභාංශ රු.මි. 661.	මුළු ගනුදෙනුකරුවන්ගේ ගණන: මිලියන 14.70 වැඩිය. බඳවාගත් නව ගනුදෙනුකරුවන් 682,300 පිපල්ස් වේව් යෙදුම භාගත කිරීම් 35,000ක මාසික සාමාන්‍යක් අත්කරගෙන ඇති අතර බිලියන 411ක ගනුදෙනු සිදුකර ඇත. මාසයකට Facebook නරඹන සාමාන්‍ය 107,000.	සේවක සහභාගිත්ව ලකුණු 69.6% සේවක ප්‍රතිලාභ මත වියදම රු.බි 26.6 විමසන ලද මැසිවිලිවල ප්‍රතිශතය 50% රඳවාගැනීම 97.6% උසස්වීම් 33	ශ්‍රී ලංකා රජයට බදු ලෙස ගෙවූ දායකත්වය රු.බි. 13.9

පාර්ශ්වකාර සහභාගිත්වය

නියාමකයින්/නීති සම්පාදකයින්	සැපයුම්කරුවන්	ප්‍රජාව/පරිසරය
• පාලනය සහ විනිවිදභාවය • අවදානම් කළමනාකරණය • කර්මාන්ත උපකාරක ප්‍රතිපත්ති • ක්ෂුද්‍ර මූල්‍යනය හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය • පර්යේෂණය හා නව්‍යකරණය • තිරසාරභාවය පිළිබඳ කාර්යසාධනය • නියාමන අනුකූලතාව	• ශක්තිමත්, සදාචාර සබඳතා පවත්වා ගැනීම • හැකියාව හා විශේෂඥතාව ගොඩනැඟීම • වගකීම්සහගත ප්‍රසම්පාදනය • වගකීම්සහගත මූලාශ්‍රකරණය • මෙහෙයුම් වර්ධනය • ඩිජිටල් විසඳුම් ඇතුළුව තාක්ෂණික දියුණුවීම් • සේවාන්ගේ තත්ත්වය • නව ව්‍යාපාර අවස්ථා • සාධාරණ ක්‍රියාවලි සහ සාධාරණ මිල	• අනාගත දක්ෂතා ප්‍රවාහ මාර්ගය • සමාජීය හා පාරිසරික බලපෑම • විචක්ෂණ ජලය සහ බලශක්ති • පරිභෝජනය • අපද්‍රව්‍ය කළමනාකරණය • වගකීම්සහගත මූල්‍යකරණය • හරිත මූල්‍යකරණය • ප්‍රජා සංවර්ධනයට කැපවීම • මූල්‍ය කළමනාකරණය හා ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ • කාලගුණ වෙනස • මූල්‍ය සාක්ෂරතාව

වාරගණන	සහභාගිත්ව රටාව	වාරගණන	සහභාගිත්ව රටාව	වාරගණන	සහභාගිත්ව රටාව
සතිපතා	නියාමනීය වාර්තාකරණය	ඉදිරියට යන	සැපයුම්කාර සමීක්ෂණ	ඉදිරියට යන	මාධ්‍ය නිවේදනල මාධ්‍ය සාකච්ඡා
ඉදිරියට යන	ස්ථානගත ආවේක්ෂණය	ඉදිරියට යන	සැපයුම්කාර සබඳතා	ඉදිරියට යන	ආයතනික වෙබ් අඩවිය
ඉදිරියට යන	කර්මාන්ත සංසද හා රැස්වීම්	ඉදිරියට යන	ස්ථානගත රැස්වීම් හා චාරිකා	ඉදිරියට යන	ප්‍රසිද්ධ අවස්ථා
ඉදිරියට යන	මාධ්‍ය නිවේදන	ඉදිරියට යන	සමාජ මාධ්‍ය	ඉදිරියට යන	සමාජ මාධ්‍ය

ඉදිරියට යන සාකච්ඡා, නියාමන අවශ්‍යතා සපුරාලීම සහ අදාළ තොරතුරු කාලීනව ඉදිරිපත් කිරීම සහ රජයේ බලධාරීන් සමඟ මනා වැඩදායක සම්බන්ධතා අපි පවත්වා ගනිමු.	විශ්වාසකළහැකි සහ තිරසාර සැපයුම් දාම ආරක්ෂා කිරීම පිණිස අපි විශ්වාසදායක සබඳතා ගොඩ නගමු.	අපි සමාජ ආර්ථික සංවර්ධනය, තිරසාරභාවය සහ ප්‍රජාවන් තුළ පාරිසරික ආරක්ෂාවට සහය වෙමු.

සැපයුම්කරුවන්	ප්‍රජාව/පරිසරය
සැපයුම්කරුවන්ට ගෙවීම රු.බි. 15.9 දේශීය ප්‍රජාවන්ගෙන් සැපයුම්කරුවන් ගණන - 258	ආයතනික සමාජීය වහකිම්සහගත ව්‍යාපාතිවල ආයෝජනය රු.මි. 38.2

ප්‍රමාණාත්මතාව

ප්‍රමාණාත්මතා මාතෘකා යනු අපගේ විවිධ පාර්ශ්වකරුවන් බැංකුව සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියා වලදී සැලකිලිමත් වන ගැටළු වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඒවායින් බැංකුවේ මූල්‍ය කාර්යසාධනය, තත්ත්වය, සමාජය තුළ ක්‍රියාත්මක වීමට අපට ඇති හැකියාව සහ එම පාර්ශවකරුවන් සඳහා දිගු, මධ්‍යම සහ කෙටි-කාලීන වටිනාකම නිර්මාණය කිරීමේ අපගේ හැකියාව කෙරෙහි බලපෑමක් ඇත. අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් වසර පුරා අඛණ්ඩව අප සමඟ කටයුතු කරන අතර, ඔවුන්ට වඩාත් වැදගත් වන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීමට අපි ඔවුන් ලබා දෙන ප්‍රතිපෝෂණ සහ යෝජනා භාවිතා කරමු.

අපගේ සමාලෝචනයේ අන්තර්ගතය තීරණය කිරීම සඳහා අපි වාර්ෂිකව ප්‍රමාණාත්මතා ඇගයීමක් පවත්වමු. ප්‍රමාණාත්මතාවයේ මට්ටම හෝ මාතෘකාවක වැදගත්කම බැංකුවට හෝ අපගේ පාර්ශවකරුට එහි වැදගත්කම සහ අදාළත්වය මගින් තක්සේරු කෙරේ. මාතෘකාවක් ඇතිවිමේ හැකියාව සහ එහි බලපෑමේ විශාලත්වය මගින් වැදගත්කම ඇගයීමට ලක් කෙරේ. මෙම වාර්තාවේ අපි ප්‍රමාණාත්මතාවයේ මට්ටම පිළිබඳ දිගුකාලීන පුරෝකථනයක් ද ඇතුළත් කර ඇත.

හුවමාරු වටිනාකම නිර්මාණය කිරීම

අපගේ ප්‍රමාණාත්මතා විශ්ලේෂණයේ සොයාගැනීම් මත පදනම්ව, අපි අපගේ උපාය මාර්ග සකස් කරමු. අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ වගකීම්වලට අනුකූලව සියලුම වැදගත් ගැටළු සුදුසු ව්‍යාපාර ඒකක ප්‍රධානීන් විසින් හසුරුවනු ලැබේ. එක් එක් මාතෘකාවට අදාළ අවදානම් මට්ටම සහ අවස්ථා අනුව සම්පත් වෙන් කරනු ලැබේ.

ප්‍රමාණාත්මතා මාතෘකා, අපගේ උපායමාර්ගික අරමුණු සමඟ එක්ව ප්‍රධාන ප්‍රතිඵල දර්ශක (KRIs) සකස් කිරීමේදී අපට සහය වේ. උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ කැපවීම් එක්ව ප්‍රධාන ප්‍රතිඵල දර්ශක අනුව අපගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කරන ආකාරය මගින් පෙන්නුම් කෙරේ.

ප්‍රමාණාත්මතා ඇගයීම

බැංකුවට සහ එහි පාර්ශවකරුවන්ට බලපාන වැදගත් ප්‍රමාණාත්මතා මාතෘකා හඳුනා ගැනීමට අපට උපකාර වන පැහැදිලි වැදගත් තක්සේරු ක්‍රියාවලියක් අපි අනුගමනය කරන්නෙමු. මෙය අපට අවශ්‍ය ප්‍රතිචාර සැකසීමට සහ කෙටි, මධ්‍ය සහ දිගු කාලීනව ඉදිරියේ ඇති අවදානම් හඳුනා ගැනීමට සහ අවස්ථාවන් හඹායාම සඳහා උපාය මාර්ග සැලසුම් කිරීමට උපකාරී වේ.

ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය

පහත කරුණුවලින් අප බැංකුවේ අපගේ ප්‍රමාණාත්මතා මාතෘකා ප්‍රමුඛ කිරීමට අපට මඟ පෙන්වනු ලබයි.



ප්‍රමාණාත්මතාවය සහ අදාළ ප්‍රමුඛතා නිරන්තරයෙන් වෙනස් වන්නේය යන සාධක පිළිබඳ අපි දැනුවත්ය. එමනිසා අපි මධ්‍ය කාලයේ සිට දිගුකාලයට ප්‍රමාණාත්මතා විස්තරවල සංවර්ධනයන් අරමුණු කිරීමට ඉදිරිය දකින ව්‍යායාමයක් අපි සිදුකර ඇත.

වසර තුළ සංවර්ධනයන්

වසරේ ආර්ථික සහ දේශපාලන ව්‍යාකූලතාව බැංකුවට සහ එහි පාර්ශවකරුවන් යන දෙපාර්ශවයටම බොහෝ බරපතල ගැටළු ඇති කර ඇත. මේවාට මුදල් අවප්‍රමාණයවීම, විදේශ විනිමය හිඟය, ඉහළ උද්ධමනය සහ ඉහළ පොළී අනුපාත, සහ ගනුදෙනුකරුවන් මත අර්බුදයේ බලපෑම ඇතුළත්ය. මෙම ගැටළු රාශීය සාර්ව ආර්ථික සාධක යටතේ වර්ගීකරණය කර ඇත. මෙම වාතාවරණයන් තුළ, බැංකුවට විදේශ විනිමය වැනි හිඟ සම්පත් භාවිතය ප්‍රශස්ථ කිරීමට සිදුවිය.

මෙම වාර්තාව තුළ ඇතුළත් කිරීම සඳහා තෝරාගත් ප්‍රමාණාත්මතා මාතෘකා පහත වගුවේ දැක්වේ.

අංකය	ප්‍රමාණාත්මක මාතෘකා	GRI ප්‍රමිති අංකය	ප්‍රමාණාතාව සඳහා හේතුව	කළමනාකරණ ප්‍රවේශය GRI 3-3	ප්‍රාග්ධන අංශවලට යොමුව
1.	මූල්‍ය කාර්යසාධනය	GRI 201: ආර්ථික කාර්යසාධනය GRI 207: බදු	ධනාත්මක මූල්‍ය ප්‍රතිඵලයක් බැංකුවේ ස්ථාවරත්වය, ඔරොත්තු දීමේ හැකියාව සහ වර්ධනය ශක්තිමත් කරන අතර සන්නාම හිමිකම වැඩිදියුණු කරයි.	වෙළෙඳපොල අවස්ථා සහ ඵලදායී පිරිවැය කළමනාකරණයේ වාසිය ලබාගනිමින් ආදායම වැඩි කිරීම. අවදානම් උපායමාර්ගිකවකළමනාකරණය කිරීම, ප්‍රාග්ධන තත්ත්වය සවිබල ගන්වමින් ශ්‍රේෂ්ඨ පතුය ශක්තිමත් කිරීම.	මූල්‍ය ප්‍රධානිගේ සමාලෝචනය (68 සිට 71 දක්වා පිටු) ව්‍යාපාර මාර්ග සමාලෝචනය (72 සිට 81 දක්වා පිටු) අවදානම් කළමනාකරණ වාර්තාව (138 සිට 167 දක්වා පිටු)
2.	ඩිජිටල් නායකත්වය	GRI 417: අලෙවිකරණය සහ ලේබල්කරණය	මූල්‍ය වෙළෙඳපොල තුළ සන්නාම හිමිකම සහ බැංකුවේ ස්ථානය වැඩි කරන සුවිශේෂ ගනුදෙනුකාර සේවාවන් ලබා දෙමින් තරඟකාරී වාසිය ලබා ගැනීම.	අපගේ ආර්ථිකයට සහ පාර්ශවකරුවන්ට වටිනාකම ලබා දෙමින් වඩාත් ඩිජිටල්කරණය වූ බැංකුව ලෙස අපගේ ස්ථානය පවත්වා ගැනීමට ඩිජිටල්කරණය තුළ අඛණ්ඩ ආයෝජනය.	නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු) ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු)
3.	ගනුදෙනුකාර අත්දැකීම	GRI 417: අලෙවිකරණය සහ ලේබල්කරණය GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාව	වෙළෙඳපොල කොටස අත්කර ගැනීමට සහ බැංකුවේ තිරසාරභාවය වැඩි කරගැනීමට ගනුදෙනුකාර අත්දැකීම අත්‍යවශ්‍යය.	ගනුදෙනුකරුවන්ට ප්‍රධාන වටිනාකම් කොටසක් පිරිනැමීම. ඩිජිටල්කරණය සහ නව භෞතික පෙනුම මෙයට ඇතුළත් වන අතර ශාඛා පිළිබඳ දැනීම බැංකුවේ ප්‍රතිරූපය වැඩි කිරීමට විශාල වශයෙන් දායක වී ඇත.	නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු) ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු)
4.	මෙහෙයුම් කාර්යක්ෂමතාව	GRI 402: කම්කරු/කළමනාකරණ සම්බන්ධතා	සියලුම පාර්ශවකරුවන් සඳහා පිරිවැය අඩුකිරීම සහ ප්‍රතිලාභ වැඩි කිරීම අත්‍යවශ්‍යය.	ලාභදායිතාව වැඩි කිරීමට ප්‍රධාන වශයෙන් ස්වයංක්‍රියකරණය තුළින් බැංකුවේ සියලුම මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම.	නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු) ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු) ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය (115 සිට 119 පිටු) මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු) ස්වභාවික ප්‍රාග්ධනය (129 සිට 136 දක්වා පිටු)
5.	සේවක ඵලදායිතාව	GRI 401: සේවා නියුක්තිය	බැංකුවේ මෙහෙයුම් සහ උපායමාර්ගික අරමුණු ඉහළ නැංවීමේදී ඉහළ සේවක ඵලදායිතාව අත්‍යවශ්‍යය.	ඩිජිටල්කරණය තුළ ආයෝජනය සේවක ඵලදායිතාව ඉහළ නැංවීමේදි ප්‍රධාන වේ.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු)
6.	දක්ෂතා කළමනාකරණය	GRI 402: කම්කරු/කළමනාකරණ සම්බන්ධතා GRI 404: පුහුණු සහ අධ්‍යාපනය GRI 405: විවිධත්වය හා සමාන අවස්ථාව GRI 406: කොන් නොකිරීම	අවශ්‍ය දක්ෂතා සහ හැකියාවන් හඳුනාගෙන රඳවා ගැනීම සහ අනාගතය සඳහා සැලසුම්	සේවක චිත්තධෛර්ය ගොඩ නැගීම සහ සේවක රඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීම. අනුප්‍රාප්තික සැලැස්ම අත්‍යවශ්‍ය සංරචකයකි.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු)

ප්‍රමාණාත්මතාව

අංකය	ප්‍රමාණාත්මක මාතෘකා	GRI ප්‍රමිති අංකය	ප්‍රමාණාතාව සඳහා හේතුව	කළමනාකරණ ප්‍රවේශය GRI 3-3	ප්‍රාග්ධන අංශවලට යොමුව
7.	පුහුණුව සහ සංවර්ධනය	GRI 404: පුහුණු සහ අධ්‍යාපනය	බැංකුවේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ කැපී පෙනෙන පාර්ශ්වකාර අත්දැකීමක් ලබාදීමට ඉහළ කාර්යසාධන සේවක කණ්ඩායමක් සංවර්ධනය කිරීම.	පුහුණු හා සංවර්ධනය සහ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ හැකියාවන් සංවර්ධනය කිරීමට අවශ්‍ය යටිතලපහසුකම්වල ආයෝජනය සහ අපගේ සේවකයින්ට ඔවුන්ගේ උපරිම හැකියාවට ලඟාවීමට සහයවීම	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු)
8.	සෞඛ්‍යය සහ ආරක්ෂාව	GRI 403: වෘත්තීමය සෞඛ්‍යය සහ ආරක්ෂාව GRI 416: ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව	ආරක්ෂිත, අභිප්‍රේරිත සහ යහපත් සේවා ස්ථානයක් සහතික කිරීම.	සේවයේදී සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිති සහතික කිරීම සහ දැනට පවත්නා සෞඛ්‍ය ගැටළු සහ අනාගත වසංගතවලට ගැලපෙන සක්‍රිය පද්ධති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු) නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු)
9.	අනුකූලතාව	GRI 417: අලෙවිකරණය සහ ලේබල්කරණය GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාව GRI 205: දූෂණ විරෝධය GRI 206: තරඟ විරෝධී හැසිරීම	බැංකුවේ කීර්තිනාමය ඉහළ නැංවීම සහ සන්නාම හිමිකම ශක්තිමත් කිරීම.	ශක්තිමත් පාලනය සහ පාලන රාමුවක් පවත්වා ගනිමින් අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීම.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු)
10.	අඛණ්ඩතාවය, විනිවිදභාවය සහ වගවීම	GRI 205: දූෂණ විරෝධය GRI 206: තරඟ විරෝධී හැසිරීම	සදාචාර සමාජයක් සහ පොදු ජනතාව අතර බැංකු පද්ධතිය පිළිබඳ විශ්වාසය කරා දායකවීම.	සේවකයින් ඉහළම ප්‍රමිති පවත්වා ගන්නා බව සහතික කිරීමට බැංකුව තුළ දැඩි නීති පිළිපදින සංස්කෘතියක් සහ අනුකූලතාවක් සංවර්ධනය කිරීම.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු) අවදානම සහ පාලනය (138 සිට 204 දක්වා පිටු) මූල්‍ය ප්‍රධානිගේ සමාලෝචනය (68 සිට 71 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු)
11.	සේවකයින් දක්ෂතා නැවත ඇති කිරීමේ අවශ්‍යතාව	GRI 404: පුහුණු සහ අධ්‍යාපනය	නවීනතම තාක්ෂණය සමඟ කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයේ දක්ෂතා නැවත ප්‍රගුණ නොකිරීමේ හේතුව මත Gen Z ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට බැංකු අසමත්වීම.	නවීනතම තාක්ෂණය සමඟ කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයේ දක්ෂතා නැවත විධිමත්ව ප්‍රගුණකිරීම සහ ගනුදෙනුකරුවන්ට සහයවීම.	මානව ප්‍රාග්ධනය (95 සිට 107 දක්වා පිටු)
12.	වගකීම්සහගත ණයදීම		පවත්නා ආර්ථික වාතාවරණය මත බොහෝ ගනුදෙනුකරුවන් බරපතල අයුරින් පීඩාවට පත්ව ඇති බැවින් ඉහළ අගයක පවතින අක්‍රීය ණය අවදානම අවම කිරීම.	මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර අඩුවෙන් පීඩාවට පත් අංශ මත සංකේන්ද්‍රණය වෙමින් ණයදීමේදී පරීක්ෂාකාරීවීමට අපට සිදුවිය.	ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු)
13.	ගනුදෙනුකාර ප්‍රවේශය		ගනුදෙනුකාර ප්‍රවේශය පුළුල් කරමින් මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම.	මේවන විට බැංකු කටයුතුවලට සම්බන්ධ වී නොමැති ජනගහන අංශ වෙත ලඟාවීම සහ හේතු හඳුනාගෙන ඔවුන් ග්‍රහනය කර ගැනීමට සුදුසු පියවර ගැනීම.	ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු) නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු) ප්‍රජා ප්‍රාග්ධනය (124 සිට 128 දක්වා පිටු)

ප්‍රමාණාත්මතාව

අංකය	ප්‍රමාණාත්මක මාතෘකා	GRI ප්‍රමිති අංකය	ප්‍රමාණාතාව සඳහා හේතුව	කළමනාකරණ ප්‍රවේශය GRI 3-3	ප්‍රාග්ධන අංශවලට යොමුව
14.	සන්නාම හිමිකම		වෙළෙඳපොල කොටස වැඩිකිරීම සහ සන්නාම කීර්තිනාමය ශක්තිමත් කරමින් සවිබල ගැන්විය හැකි තරඟකාරී වාසියක් අත්කර ගැනීම.	ඩිජිටල්කරණය තුළ නායකත්වය තුළින් සන්නාම හිමිකම වැඩි කිරීම. පාලනය, නවෝත්පානය, ගනුදෙනුකාර සේවා, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය සහ වෙළෙඳපොල කොටස ශක්තිමත් කිරීම	බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු)
15.	සැපයුම්කාර වටිනාකම නිර්මාණය	GRI 204: ප්‍රසම්පාදන ව්‍යවහාර GRI 308: සැපයුම්කරුගේ පරිසරය ඇගයීම GRI 414: සැපයුම්කරුගේ සමාජය ඇගයීම	සැපයුම් දාමය බිඳවැටීම හේතුවෙන් ව්‍යාපාර බිඳවැටීමේ අවදානම අවම කිරීම.	දිගුකාලීන අනෝන්‍ය ප්‍රතිලාභී ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ හුවමාරු වටිනාකම නිර්මාණය	ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය (115 සිට 119 දක්වා පිටු)
16.	අවදානම සහ පාලනය		බැංකුවේ අවංකභාවය, විශ්වාසය, සහ ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම.	යහපත් පාලන ව්‍යවහාර අනුගමනය කරමින් අවදානම කළමනාකරණය සඳහා සක්‍රීය ප්‍රවේශයක් යොදා ගැනීම.	අවදානම් කළමනාකරණ වාර්තාව (138 සිට 167 දක්වා පිටු) ආයතනික යහපාලන වාර්තාව (137 සිට 204 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු) මූල්‍ය ප්‍රධානිගේ සමාලෝචනය (68 සිට 71 දක්වා පිටු)
17.	සසිබර් ආරක්ෂක තර්ජන	GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාව	බැංකුව වෙනත් ආයතන මෙන් පොදුවේ සයිබර් ප්‍රහාර අවදානමට පත්විය හැකි අතර එය ආරක්ෂාව, රහස්‍යතාව සහ දත්තවල අඛණ්ඩතාව සඳහා තර්ජන ඇති කරන අතර එය විසඳීම අවශ්‍යය.	වැඩිවන තර්ජන පාලනය සඳහා තොරතුරු ආරක්ෂණ පද්ධති සහ හැකියාවන් වර්ධනය කිරීම	අවදානම් කළමනාකරණ වාර්තාව (138 සිට 167 දක්වා පිටු) බුද්ධිමය ප්‍රාග්ධනය (87 සිට 94 දක්වා පිටු) නිෂ්පාදිත ප්‍රාග්ධනය (82 සිට 86 දක්වා පිටු)
18.	සමාජ-ආර්ථික බලපෑම්	GRI 202: වෙළෙඳපොල පැවැත්ම GRI 203: වක්‍ර ආර්ථික බලපෑම් GRI 413: දේශීය ප්‍රජාව	ජාතික ප්‍රමුඛ ගැටළු සමඟ පෙළ ගැසීම	දේශීය ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනයන්ට සහය වෙමින් සමාජීය විෂමතා අවම කිරීම	ප්‍රජා ප්‍රාග්ධනය (124 සිට 128 දක්වා පිටු)
19.	පාරිසරික බලපෑම	GRI302: බලශක්තිය GRI 303: ජලය සහ අපවාහය GRI305: විමෝචන	තිරසාර ව්‍යාපාර ව්‍යවහාර තුළින් තිරසාර හරිත පරිසරයක් කරා දායකවීම.	මූල්‍ය සහ ආයෝජන තීරණ ගැනීමේදී පාරිසරික සාධක සලකා බලමින් හරිත යටිතල පහසුකම් සහ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවල ආයෝජනය මගින් කාබන් පාසටහන අවම කිරීම.	ස්වභාවික ප්‍රාග්ධනය (129 සිට 136 දක්වා පිටු)
20.	සාර්ව ආර්ථික සාධක		වසර තුළ පෙරනොවූ විරූ දේශපාලනය සහ ආර්ථික ආරාවුල බැංකුවට සහ එහි පාර්ශවකරුවන් පිඩාවට පත්කරමින් බරපතල ගැටළු ගණනාවක් වෙත යොමු කර ඇත, මෙම බලපෑම බැංකුව විසින් අවම කළ යුතුව ඇත.	අවස්ථාවට ගැලපීම සඳහා නම්‍යශීලී උපායමාර්ග සහ මෙහෙයුම් සැලසුම් යොදාගැනීම. අර්බුදය විසින් සම්පත් සීමාවන් ඇති කළ අවස්ථාවලදී, ප්‍රමුඛ අංශ වෙත ප්‍රශස්ථ ප්‍රතිලාභ ලබාදීම සඳහා ලබාගතහැකි සම්පත් භාවිතා කිරීමට සිදුවිය.	සියලුම ප්‍රාග්ධනය නමුත් විශේෂයෙන් මූල්‍ය ප්‍රධානිගේ සමාලෝචනය (68 සිට 71 දක්වා පිටු) ගනුදෙනුකාර ප්‍රාග්ධනය (108 සිට 114 දක්වා පිටු) ආයෝජක ප්‍රාග්ධනය (120 සිට 123 දක්වා පිටු)

ප්‍රමාණාත්මතා විශ්ලේෂණ කෙටි, මධ්‍යම සිට දිගුකාලය දක්වා රාමු දෙකක යටතේ සිදු කර ඇත. අදාල කාල රාමු යටතේ, එක් එක් වැදගත් මාතෘකා පාර්ශවකරුවන්ට සහ බැංකුවට එහි වැදගත්කම අනුව ඉහළ, මධ්‍යම සහ පහළ ලෙස ශ්‍රේණිගත කරනු ලබයි.


වැදගත්කම:

ඉහළ: ක්‍රියාකිරීමට ප්‍රමුඛතාවක් ලෙස සලකන

මධ්‍යස්ථ: විය හැකි බලපෑම් පාලනය කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් කාර්යයන්


පහළ: දැනටමත් ක්‍රියාත්මක ප්‍රමාණවත් ක්‍රියාමාර්ග හෝ අපගේ පාලනයෙන් තොර බලපෑම

කෙටිකාලය: එක වසරක කාලසීමාව



දිගුකාලීන අනුකෘතියට 5-10 වසරක කාලසීමාව

දිගුකාලීන අනුකෘතිය අවදානම පැතිකඩ පිළිබඳව ඇගයීමේ ප්‍රක්ෂේපනයක් මත පදනම් වී සංවර්ධනය කර ඇත.



පුරෝකථනය කළ සංවර්ධනයන් කිහිපයක්

- වර්තමාන සාර්ව-ආර්ථික ගැටළු කොපමණ කලක් අනාගතයේ පවතීද යන්න දැනගත නොහැකි අතර, අවම වශයෙන් වීවායින් සමහරක් දිගු කාලීනව වැදගත් වීමට ප්‍රබල හැකියාවක් ඇත.
- ගෝලීය අත්දැකීම් පෙන්වා දී ඇති පරිදි ESG ගැටළු අනාගතයේ දී පාර්ශවකරුවන්ට වඩාත් වැදගත් වනු ඇත; බැංකුව මූල්‍ය කාර්යසාධනයට ප්‍රමුඛත්වය දෙන අතර, පාර්ශවකරුවන් (කොටස් හිමියන් ඇතුළුව හා ඉන් ඔබ්බට) බැංකුවේ පරම කාර්යසාධනයේ පිරිවැය යටතේ වුවද ESG බලපෑම අගය කළ හැකිය.
- මෘදුකාංග සහ නවෝත්පාදන වැනි අස්පෘශ්‍ය වත්කම් අනාගතයේදී ස්පෘශ්‍ය වත්කම්වලට වඩා වැදගත් විය හැක. මෙය ඩිජිටල් නායකත්වයට සහ සන්නාම හිමිකමට බලපානු ඇතැයි අපේක්ෂා කළ හැක.
- වත්මන් ආර්ථික සන්දර්භය තුළ තියුණු වෙමින් පවතින විගමන/බුද්ධිමතුන් රටහැරයාම සහ වැඩිවන ඉල්ලුමට මුහුණ දීමට අවශ්‍ය මානව සම්පත් කුසලතා සලකා බැලීමේදී අනාගතයේ දී බැංකුවට කුසලතා කළමනාකරණය වඩාත් වැදගත් වනු ඇත.
- විශේෂයෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ සන්දර්භය තුළ පාරිසරිකවාදය සහ සමාජ ගැටළු පිළිබඳ වැඩිවන මහජන සැලකිල්ල හේතුවෙන් මේ අංශ දෙක සඳහා ඇති වැදගත්කම තුළ සමාජ – ආර්ථික බලපෑම් වැඩි වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.
- සේවක ඵලදායිතාව බැංකුවට තවමත් ඉතා වැදගත් වන අතරම, පාර්ශවකරුවන්ට අඩු වැදගත්කමක් විය හැකිය.
- විශේෂයෙන්ම දූෂණ ගැටළු සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විභිවිදභාවය සහ වගවීම පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ඇතැයි අපේක්ෂා කළ හැක.
- අනාගතයේ දී කල්පවත්නා සබඳතා ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය අනුව, සැපයුම්කරුවන්ගේ වටිනාකම නිර්මාණය කිරීමට, වැඩි වැදගත්කමක් ලබා දෙනු ඇත. පුළුල් සැපයුම් දාම පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ හැකි අතර බැංකුවට සියලු හැකියාවන් අභ්‍යන්තරව වර්ධනය කිරීමට වඩා ඩිජිටල් නවෝත්පාදනය මගින්, සැපයුම්කරුවන් මත රඳා පැවතිය හැකිය.

අපගේ උපාය මාර්ගය

2022 අනපේක්ෂිත කැලඹිලි සහිත වසරක් වූ අතර පළමු කාර්තුවේදී විදේශීය හා දේශීය ව්‍යවහාර මුදල්වල අඩු ද්‍රවශීලතාවය, උද්ධමනය සහ පොලී අනුපාතවල තියුණු වැඩිවීම් දේශපාලන ආරවුල් සහ ආර්ථික දුෂ්කරතා දක්වා අභියෝග මාලාවක් ගෙනවිත් ඇත.

2022-2024 සඳහා වූ උපායමාර්ගික සැලැස්ම බාහිර උපදේශන සමාගමක උපදෙස් ඇතිව මහජන බැංකුව විසින් සකස් කරන ලදී. සියලුම ආයතනික සහ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයින් සහ සියලුම කලාප ආවරණය වන පරිදි තෝරාගත් ශාඛා කළමනාකරුවන් ඇතුළු අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින් සැලැස්ම සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියට සහභාගී වූහ.

උපායමාර්ගය පහත විස්තර කර ඇති මූලික වෙළෙඳපල ප්‍රවණතා ආමන්ත්‍රණය කරයි.

01 **අපි නිරන්තරයෙන් සේවා මට්ටම් වැඩිදියුණු කළ යුතුයි.**

ගනුදෙනුකරුවන්ට වැඩි දැනුමක් සහ විකල්ප තිබේ; ඔවුන්ට බැංකුවකින් හෝ ව්‍යාපාරයකින් වැඩිපුර ඉල්ලා සිටිය හැකි අතර පහසුව බෙහෙවින් අගය කළ හැකිය.

02 **අප ගනුදෙනුකාර කේන්ද්‍රීය විය යුතුය.**

විශිෂ්ට ගනුදෙනුකාර සේවාව ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව මෙන් සමාන නොවේ. ක්ෂේත්‍රය තුළ, නිෂ්පාදන-කේන්ද්‍රීයතාව සිට නවීන දත්ත විශ්ලේෂණ මගින් සක්‍රීය කළ ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව දක්වා විතැන්වීමක් ඇත.

03 **අප අනාගතයට සූදානම් විය යුතුය.**

තාක්ෂණයේ පරිණාමය යනු පාදක වූ සාධකයක් සහ ඉහත ප්‍රවණතා දෙකෙහිම ප්‍රධාන සක්‍රීය කරන්නාය. තාක්ෂණය යනු එකම විශාලතම බාධාකරු වන අතර එය මූල්‍ය සේවා සංකල්පගත කර ලබා දිය හැකි ආකාරය කෙරෙහි බලපාන අතර නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී – අප කඩිසරව හා ඉක්මනින් එයට අනුගත විය යුතුය.

උපායමාර්ගික පරිනාමය

එක දැක්මක් සහ BHAG

දැක්ම පරිවර්තනීය වරර්ධනය කරා ජාතීය පෙළඹවීම.

BHAG: ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම සේවක තෘප්තිමත් මට්ටම් සමඟින් වැඩි ගනුදෙනුකරුවන් අපේක්ෂා කරන බැංකුව වීම.

අපගේ BHAG පහත පරිදි අගය කෙරේ:

- අපගේ ගනුදෙනුකරුවන්ගෙන් 35%ක් සඳහා ප්‍රමුඛ බැංකුව වීම.
- දේශීය ප්‍රධාන තරඟකරුවන් අතර ඉහළම ජාල ප්‍රවර්ධන ලකුණු (NPS) ලබා ගැනීම.
- අපනයන සහ අභ්‍යන්තර ප්‍රේෂණ සඳහා රටතුළ ඉහළම බැංකුව වීම.
- ශ්‍රී ලංකාවේ ඉහළම සේවා ස්ථානය: සුවිශාල ව්‍යවසාය වර්ගීකරණය) ලෙස රන් සම්මානය දිනාගැනීම.

මූලික උපායමාර්ගික පරමාර්ථ 3කි

- විශිෂ්ඨත්වය මෙහෙයවීම
- ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩ නැගීම්.
- අනාගතයට සූදානම්වීම.

මානසිකත්වය ශක්තිමත් කිරීම් 3කි

- Lean-Agile
- දත්ත පදනම්
- වර්ධනය

මොඩියුල 8කි

- ආයතන
- භාණ්ඩාගාරය සහ ජාත්‍යන්තර බැංකුකරණය
- ව්‍යවසාය
- පාරිභෝගික
- තොරතුරු තාක්ෂණය
- මානව සම්පත්
- මූල්‍ය
- බැංකුව පුළුල්ව

20+ වැඩසටහන්

මොඩියුලය මෙන්ම උපායමාර්ගික පරමාර්ථ අනුව සකස් කර ඇත.

50+ කටයුතු

150+ සේවක කණ්ඩායම්

උපායමාර්ගික කුළුණු යටතේ ප්‍රවේශයන්

විශිෂ්ඨත්වය මෙහෙයවීම

1. මෙහෙයුම් අනර්ඝත්වය

- ව්‍යාපාර සංවර්ධන වර්ධනය
- මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම්
- මෙහෙයුම්වල ඩිජිටල් පරිවර්තනය
- TAT හි වැඩිදියුණු කිරීම්
- ශාඛා අවධානය නැවත සකස් කිරීම
- ගනුදෙනුකාර තෘප්තිය වැඩි කිරීම
- ශාඛාවල කාලය භාවිතා කිරීම
- ගනුදෙනුකාර wallet කොටස සහ රඳවාගැනීම වැඩි කිරීම
- එක් එක් අංශයේ/නිෂ්පාදන සහ සේවා මාර්ගයේ බදු පෙර ලාභය

2. කළඹේ ගුණාත්මකභාවය

- වත්කම් තත්ත්ව වැඩිදියුණු කිරීම
- අක්‍රීය ණය අඩු කිරීම

3. කාර්යසාධනය පදනම් සංස්කෘතිය

- සේවක සහභාගිත්වය
- සේවකයෙකු සඳහා ආදායම/පිරිවැය
- සේවක කුසලතා ඉහළ නැංවීම
- අර්ථවත් රඳවා තබා ගැනීම සහ බැංකුව වෙත දායකත්වය
- බාහිර විදිරිව අභ්‍යන්තර බඳවා ගැනීම

ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩ නැගීම

1. ගනුදෙනුකාර සේවය වර්ධනය කිරීම්

- C1/C2 ගනුදෙනුකරුවන්ගේ වර්ධනය සහ C3 - C5 පාරිභෝගිකයින් රඳවා තබා ගැනීම (පාරිභෝගික)
- ඉහළ විභවතා අහිමි ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම/නැවත සම්බන්ධ කර ගැනීම (ආයතනික/කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්)
- පාරිභෝගික වර්ධනය අනුව ශුද්ධ පොළී ආන්තිය
- ගනුදෙනුකාර ගැටළු විසඳුම් TAT වැඩිදියුණු කිරීම්
- වෙළෙඳ/බෙදාහරින්නාගේ මූල්‍ය ආදායම/නායකත්වය
- අපනයන ආදායමේ වර්ධනය

2. වඩා යහපත් ඉලක්කකරණය සහ වටිනාකම් කොටස

- ඉහළ ප්‍රමුඛතා අංශයේ වර්ධනය
- භාණ්ඩාගාර පරිමාව වර්ධනය
- විදේශ පදනම් ගනුදෙනුකාර වර්ධනය
- ගනුදෙනුකරුවන්ගේ සාමාන්‍ය මුදල් පසුම්බිය
- පිරිනමනු ලබන ගලපනලද කොටස් ගණන
- ගනුදෙනුකාර තෘප්තිය වැඩි දියුණු කිරීම
- අපනයන ගනුදෙනුකාර වර්ධනය
- සාම්ප්‍රදායික නොවන අපනයන ගනුදෙනුකාර වර්ධනය
- ණය කාඩ් වර්ධනය - NII, පරිමාව සහ සාමාන්‍ය සීමාව

අනාගතයට සූදානම් වීම

1. බිඳවැටීම්වලට ඉදිරියෙන් සිටීම

- උපාය මාර්ගික හවුල්කරුවන් සංඛ්‍යාව
- විදේශ ගිණුම් වර්ධනය
- විදේශ ශාඛාව පුළුල් කිරීම
- ප්‍රේෂණ අගය/පරිමාවේ වර්ධනය
- විදේශීය ආයෝජකයන්ගේ ජාලය
- බැංකුව හරහා මාර්ගත විදේශීය සෘජු ආයෝජන
- පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම - කර්මාන්ත සහ සියලු ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන හඳුනාගෙන සිතියම්ගත කිරීම


2. වර්ධන මනස අරමුණු කළ කණ්ඩායම ගොඩ නැගීම

- අනුප්‍රාත්තික සැලසුම් උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම
- මානව සම්පත් විසින් කළමනාකරණය කරන ආයතනය අතර මුලපිරීම්
- අන්තර් දෙපාර්තමේන්තු මුලපිරීම් ගණන
- ඉගෙනුම් ඇකඩමියෙන් "උපාධිය ලබන" සේවක සංඛ්‍යාව
- පරිවර්තන/ගතික පුහුණු මොඩියුල

උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන ව්‍යාපාර ඒකක සඳහා උපායමාර්ගික මුලපිරීම් 26 කින් සහ සහය ඒකක සඳහා මුලපිරීම් හයකින් සමන්විත වන අතර, ප්‍රමාණයකළ හැකි සහ මැනිය හැකි අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ මූලික කාර්යසාධන දර්ශක (KPIs) 59 කින් සමන්විත වේ. උපායමාර්ගික මුලපිරීම් උපායමාර්ගික සැලැස්මේ සම්පූර්ණ කාලසීමාව සඳහා ක්‍රියාත්මක වන අතර, එක් එක් මුලපිරීම යටතේ කාල රාමු සහිත පියවර ඇත. වසර පුරා පවත්වනු ලබන නිත්‍ය සමාලෝචන මගින් මෙම ප්‍රතිඵල නියාමනය කෙරේ.

උපාය මාර්ගයේ මෙහෙයුම්කරණය

සුනුරු මූලික කාර්යසාධන දර්ශක පරාසයක් තුළින් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ක්‍රමවේදයක් ඇති කර ඇත.



සමාලෝචන යාන්ත්‍රණය

සැලැස්මට අනුව උපායමාර්ගික මූලපිරිම් ක්‍රියාත්මක කරන බව සහතික කිරීම සඳහා බැංකුව තුළ දැඩි සමාලෝචන ක්‍රියාවලියක් ඇත. අපි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් මාසික සමාලෝචන රැස්වීමක් පවත්වන අතර, සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC) විසින් කාර්තුමය සමාලෝචන රැස්වීමක් පවත්වමු. මෙම රැස්වීම්වලදී මූලික කාර්යසාධන දර්ශක අනුව කාර්යසාධනය ප්‍රවේශමෙන් ඇගයීමට ලක් කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලැබේ.

අනාගතයේදී බැංකුවේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා කෙටි සහ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) සංවර්ධනය

1. අපනයන අංශයේ විශේෂිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන
2. සාම්ප්‍රදායික නොවන අපනයන අංශ සඳහා ඉලක්කගත විකුණුම් සහ නිෂ්පාදන
3. ව්‍යවසාය බැංකුකරණය සඳහා හවුල්කාර උපාය මාර්ගය
4. ක්‍රමානුරූප නොවන SME වලින් ක්‍රමානුරූප දක්වා වෙනස් කිරීම.
5. ණය පහසුකම් සඳහා පහසුකම් සැලසීමට පමණක් නොව ව්‍යාපාරයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ගනුදෙනුකරුවන්ගෙන් විශාල කොටසක් සමඟ කටයුතු කිරීම.
6. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ අවශ්‍යතා පදනම් මත ණය පහසුකම් පහසුවෙන් ලබාදිය හැකි බවට සහතික වීම.
7. රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ණය දීමේදී ප්‍රමුඛතා අංශ හඳුනා ගැනීම. අවධානය යොමු කළ ප්‍රමුඛ අංශ:
   - කෘෂිකර්මය (ගොවිතැන, පශු සම්පත්, ධීවර, කෘෂි නිෂ්පාදන වීකතු කරන්නන් සහ අතරමැදියන්, කුඩා සහල් මෝල්කරුවන්)
   - සෘජු හා වක්‍ර අපනයන සහ ආනයන ආදේශන කෙරෙහි අවධානය යොමු කරන ලද නිෂ්පාදන කර්මාන්ත
   - ආහාර පාන
   - නවෝත්පාදන සහ තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාරය
   - අත්‍යාවශ්‍ය සේවා (සෞඛ්‍ය, අධ්‍යාපනය, සැපයුම්, ටෙලිකොම්)
   - ඉදිකිරීම්
8. I. ඉහත කරුණුවලට අනුකූලව නව ණය නිෂ්පාදන හඳුන්වාදීම.
   II. නව MSMEs සහනදායී අනුපාත සහ නියමයන්වලට ඉඩදීම.
   III. ප්‍රාග්ධනය ආපසු ගෙවීමේදී අඩු පොලී අනුපාත, සහන කාල සීමාවන්, කුඩා ප්‍රමාණයන් සඳහා පහසු සුරැකුම් ආවරණ සමඟ ලිහිල් සුරැකුම්
   IV. ණය ලබාදීම කඩිනම් කිරීම සඳහා ණය අනුමැතිය සඳහා වැඩි බලගැන්වීම
   V. ඉල්ලීම් ඇගයීම් කරන ණය ඒකක ශක්තිමත් කිරීම.
   VI. මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන සහනදායී ණය යෝජනා ක්‍රමවලට සහභාගී වීම.
   VII. ව්‍යාපාර උපදේශනය
   VIII. මූල්‍ය සාක්ෂරතාව නොමැතිකම ආමන්ත්‍රණය කිරීම සහ අංශ දෙකෙහිම ව්‍යාපාර සැලසුම් සඳහා සහාය වීම සඳහා කාන්තා සහ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවස්ථා සැකසීම.
   IX. බැංකුව විසින් සංවර්ධනය කරන ලද පුහුණු පද්ධතියක් හරහා තරුණ උපාධිධාරීන් තුළ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම.
   X. කාර්මික සංවර්ධන මණ්ඩලය, CISIR, SLTDA, SLIM යනාදී ආයතනවලට සහාය වීමට ව්‍යවසායකයින් යොමු කිරීම.
   XI. සැපයුම් දාම සහ ව්‍යාපාර වැඩිදියුණු කිරීම් සඳහා විශාල සමාගම් සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

XII. MF/DF කළඹ වර්ධනය කිරීම සඳහා කලාප 24 ආවරණය කිරීමට සංවර්ධන නිලධාරීන්/ක්ෂේත්‍ර නිලධාරීන් 24 දෙනෙකු පත් කිරීම.

XIII. ගොවීන්ට පහසුකම් සැපයීම සඳහා කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP) සමඟ සම්බන්ධවීම.

XIV. දුර්වල ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම සඳහා ණය පුනර්ජීවන ඒකකයක් පිහිටුවීම.

9. බැංකුව සඳහා තිරසාර මූල්‍යකරණයක් ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

10. ඉන්ටර්නැෂනල් ෆිනෑන්ස් කෝපරේෂන් (IFC) සහයෝගීතාවයෙන් MSME ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය ඇතුළත් කිරීම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන සැසි පැවැත්වීම.

11. දැනට සිටින MSME ගනුදෙනුකරුවන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ වෙළෙඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම.

12. නව වැඩිදියුණු කිරීම් සමඟ "කප්රුක අයෝජන ණය" ප්‍රදානය කිරීම සඳහා පොල් වගා මණ්ඩලය සමඟ සම්බන්ධ වීම.

13. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ණය මාර්ගයක් හරහා කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධනය සඳහා විශේෂ පොලී සහන අනුපාත ණය යෝජනා ක්‍රමයක් දියත් කිරීම.

14. කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ණය මාර්ග යක් හරහා විශේෂ පොලී සහනදායී ණය යෝජනා ක්‍රමයක් සහ ආපසු නොගෙවිය යුතු ප්‍රදානයක් (10%-25%) ක්‍රියාත්මක කිරීම.

15. කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා නව "කාන්තා ව්‍යවසායක සංවර්ධන ප්‍රතිපත්තියක්" හඳුන්වා දීම.

16. මූල්‍ය සේවා සපයන්නා ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් හඳුන්වා දුන් "හෙළවිරු" ඩිජිටල් වේදිකාවට සහභාගී වීම.

17. "එක් ගමක් එක් නිෂ්පාදනයක්" යන නව සංකල්පය කලාප 24 තුළම හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.

2. තැන්පතු

1. තැන්පතු පොලී අනුපාතිකය (වෙළඳපොල ප්‍රමුඛයා ලෙස තත්ත්වය පවත්වා ගනිමින්) අවශ්‍ය වූ විට සහ අවශ්‍ය අවස්ථාවේදී අඩු කිරීමේදී තරඟකාරී වෙළෙඳපල වාසිය ලබා ගැනීම සඳහා තරඟකාරී මට්ටමකින් පොලී ආන්තිකය පවත්වා ගෙන යාම සහ බැංකුව විසින් පිරිනමනු ලබන ඉහළ පොලී අනුපාත අලෙවි කර ඉතුරුම් නිෂ්පාදනවලට ප්‍රතිලාභ ලබා දීම. ගනුදෙනුකාර සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, අමතර ප්‍රතිලාභ ලබා දීම යනාදිය මගින් ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම

2. පවතින නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේදී/නව නිෂ්පාදන හඳුන්වාදීමේදී ඉතුරුම් නිෂ්පාදනවල ගනුදෙනුකරුවන් අරමුණුකළ විශේෂාංග/ගුණාංග පිරිනැමීම් සහ ගුණාත්මක අංශ සඳහා ප්‍රමුඛත්වය ලබා දී ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඉතුරුම් නිෂ්පාදන සමඟ අනුබද්ධ විශේෂාංග සමූහයක් හරහා කාර්යක්ෂම, ගුණාත්මක සේවාවක් සැපයීම.

3. බාලවයස්කාර (අඩු පිරිවැය) තැන්පතු පදනම ඉහළ නැංවීම සහ මූලික තැන්පතුව ලබා දීමෙන් බැංකුව විසින් කරන ලද ආයෝජනයේ ප්‍රතිලාභය උපරිම කිරීම සඳහා එකතැන පවතින ශේෂයන් ඇති බාලවයස්කාර ගිණුම් පසු විපරම් කිරීමේ යාන්ත්‍රණ.

4. ජංගම ගිණුම් හිමියන්ට විවිධ ප්‍රතිලාභ හඳුන්වා දීම තුළින් ඉහළම ආදායම් උත්පාදන මූලාශ්‍රයක් ලෙස බැංකුවේ ඉල්ලුම් තැන්පතු පදනම (ජංගම ගිණුම් තැන්පතු) වැඩි කිරීම.

5. බැංකුවේ තැන්පතු පදනම් වැඩි කිරීම සඳහා:

   අ. විකල්ප නාලිකා අත්හදා බැලීම

   ආ. ශාඛා ජාලය තුළ දෛනික එකතු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ දෛනික එකතු කිරීම නිතිපතා නියාමනය කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

   ඇ. බැංකුවේ ඉල්ලුම් තැන්පතු වැඩි කිරීමට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

   ඈ. තැන්පතු නිෂ්පාදන නැවත දියත් කිරීම.

3. උකස් ණය

1. උකස් වෙළඳපල කොටස වර්ධනය කර ගැනීමේ හැකියාව ඇති ස්ථානවල වැඩ කරන කාලය දීර්ඝ කිරීම.

2. අදාළ භූගෝලීය ප්‍රදේශය තුළ උකස් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අබණ්ඩ අලෙවිකරණ උපාය මාර්ග

3. උකස් කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධනය වැඩසටහන් පැවැත්වීම.

4. ගනුදෙනුකරුවාගේ පෞද්ගලිකත්වය සහතික කිරීම සඳහා උකස් කුටිය නැවත සකස් කිරීම.

5. සමහර ඉතුරුම් නිෂ්පාදන සඳහා ලබා දෙන උකස් වට්ටම් අනුපාතය භාවිතා කිරීමට පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

4. ණය කාඩ් ව්‍යාපාරය

1. වර්තමානයේ බොහෝ ගනුදෙනු සිදු කරනු ලබන්නේ මාර්ගගත ක්‍රම හරහා බැවින් ප්‍රදාන පද්ධතියක් වන ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදනය (NFC) හඳුන්වාදීම තුළින් ණය කාඩ් පදනම, ණය කාඩ් ලාභදායීතාවය සහ ණය කාඩ් වලින් ජනනය වන ගාස්තු ආදායම (පොලී ආදායමට අමතරව) වැඩි කිරීම; ණය කාඩ්පත් ප්‍රචාරණය සඳහා සමාජ මාධ්‍ය භාවිතා කිරීම, සෙවුම් යන්ත්‍ර වෙත පණිවිඩ යැවීම සහ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි තවත් POS යන්ත්‍ර යෙදවීම.

2. ණය කාඩ් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රමවත් කිරීම.

3. කාර්ය මණ්ඩල පුහුණුව තුළින් සේවාවේ ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

4. මහජන බැංකු කාඩ්පත් හිමියන්ගේ සමස්ත පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කිරීම.

5. ණය කාඩ්පත් පිළිබඳ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ (ශාඛා ජාලයේ) දැනුම වැඩිදියුණු කිරීම.

6. රැකියා වෙළෙඳපොළට පිවිසීමට පෙර උසස් අධ්‍යාපන ආයතන තුළින් අනාගත ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම.

7. ජංගම POS සහ මෘදු POS යන්ත්‍ර හඳුන්වා දීම.

8. ණය කාඩ් හරහා ගාස්තු මත පදනම් වූ ආදායම වැඩි කිරීම.

9. භාවිතයට නොගත් පාරිභෝගික පදනම සම්බන්ධකර ගැනීම, BI මෙවලමක් හරහා ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම.

5. අක්‍රීය ණය අඩු කිරීම

1. නෛතික ක්‍රියාමාර්ග (නඩු පැවරීම) තුළින් අයකිරීම වේගවත් කිරීම.
2. අයකිරීම සහ නෛතික ක්‍රියාපටිපාටි පිළිබඳව සියලුම ණය නිලධාරීන් පුහුණු කිරීම.
3. අපගේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ ව්‍යාපාරය නව ව්‍යාපාරික අවස්ථා සමඟින් ශක්තිමත් කිරීම පිණිස බැංකුවේ කුඩා පරිමාණ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අනපේක්ෂිත/අහිතකර තත්ත්වයන් මඟහරවා ගැනීමටත්, ඔවුන්ගේ අනවශ්‍ය වියදම් අවම කර ගැනීමට, පිරිවැටුම, විභව වෙළෙඳපොළ ආදිය වැඩි කිරීමට මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය උපදෙස් ලබා දෙමින් සහයවීම.
4. අව්‍යාජ පැහැර හරින්නන්ට සහය දැක්වීමට සහ ඔවුන් සමඟ හවුල් වීමට “VIEWPOINT” මධ්‍යස්ථාන.
5. සේවකයින් දිරිමත් කිරීම, මාසික අයකිරීමේ ජයග්‍රහකයින්
6. අක්‍රීය ණය ගනුදෙනුකරුවන් සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.
7. අයකිරීමේ උත්සාහයන් සහ ප්‍රතිඵල දැඩි ලෙස නියාමනය කිරීම සඳහා අක්‍රීය ණය සමාලෝචන කමිටුව.
8. අයකිරීම් ක්‍රියාවලිය තුළ බාධාවන් ඉවත් කිරීම මගින් ක්‍රියාවලි සුමට කිරීම සඳහා Lean සංකල්පය හඳුන්වා දීම.
9. ණය අයකර ගැනීමේ මෙඩියුලය තුළින් අයකිරීම වේගවත් කිරීම.
10. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අබණ්ඩ පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
11. සෑම අංශයකම සහ කොටසකම ඉහළම ගනුදෙනුකරුවන් 25 දෙනා පිළිබඳ විශේෂ නියාමනය
12. නිශ්චිත ඉලක්ක සහ මූලික කාර්යසාධන දර්ශක ලබා දීමෙන් සියලුම CRO (ගනුදෙනුකාර සම්බන්ධතා නිලධාරීන්) ගේ මූල්‍ය දායකත්වය නියාමනය කිරීම.
13. අයකිරීමේ කඳවුරු පැවැත්වීම.

6. වියදම් කළමනාකරණය

1. වියදම් මත පිරිවැය අඩු කිරීමේ පියවර
2. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ පිරිවැය නායකත්වය සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දීම.
3. සම්පත් ප්‍රශස්තකරණය සහ බැංකුව විසින් දරනු ලබන වියදම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම.
4. තවදුරටත් බැංකු අතර පිරිවැය ඉතිරි කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.

7. නව මාර්ග

1. තරුණ වෘත්තිකයින්ගේ වාසිදායක අනාගත ගනුදෙනුකාර අංශයක් ලෙස විශ්ව විද්‍යාල සිසුන් අතර විශේෂ ණය සහ කාඩ් යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීම
2. ඩිජිටල් මාර්ග ප්‍රශ්ධනීයකරණය

8. නව නිෂ්පාදන සංවර්ධනය

1. ගලපනලද සහ වෙළෙඳපොල පදනම් නවෝත්පාදන තැන්පතු නිෂ්පාදන
2. වෙළෙඳපොල පදනම් වත්කම් නිෂ්පාදන

අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය සහ ප්‍රාග්ධන ශ්‍රේෂ

2021 දෙසැම්බර් 31 දිනට යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය

ශුද්ධ පොළී ආන්තිය රු.බි. 82.5 | ROE 19.9% | ගෙවා ඇති බදු රු.බි. 16.3
ගාස්තු ආදායම රු.බි. 8.3 | ROA 1.2% | ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 17.8%

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, නිමකිරීමේ ප්‍රතිශතය 3.0%
දරන ලද පිරිවැය රු.මි. 1,447.6.
ශාඛා ප්‍රතිසංස්කරණ පිරිවැය රු.මි. 189.6

බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම හිමිකම් දර්ශකය 3.8
ෆිච් ලංකා ණය ශ්‍රේණිගතකරණය AA-(lka)
ගනුදෙනුකාර තෘප්තිය 91%

මානව ප්‍රාග්ධනය

මුළු සේවකයින් 7,568
සේවක රැඳවාගැනීම 98.2%
ඩිජිටල් පුහුණු පැය 18,813
කාන්තා සේවිකාවන් 4,637
උසස්වීම් ගණන 99

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

ගනුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන 14.5ට ආසන්නය
ඩිජිටල් ලෙස කළ ගනුදෙනු 70%ට වැඩිය
ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන ගණන 2,326
නව ගනුදෙනුකරුවන් ඇතුළත්කර ගැනීම 510,000ට ආසන්නය

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

සැපයුම්කරුවන් ගණන 258
මිලදි ගැනීමේ මුළු වටිනාකම රු.බි. 12.3
අනුරූප බැංකු ගණන 42
වෙස්ට්‍රෝ නියෝජිකයින් ගණන 78

ආයෝජක ප්‍රාග්ධනය

කොටස් ප්‍රාග්ධනය රු.බි. 136.1
ස්කන්ධය මත ප්‍රතිලාභ 19.9%
කොටසක ඉපයීම් රු. 23,720

ප්‍රජා ප්‍රාග්ධනය

ප්‍රජා ව්‍යාපෘති ගණන 12
ප්‍රජා ව්‍යාපෘති මත වියදම් රු.මි. 12.7

ස්වභාවික ප්‍රාග්ධනය

සූර්ය බලය භාවිතා කරණ ශාඛා ගණන 20
ඩිජිටල් ලෙස විවෘත කළ ගිණුම් ගණන මිලියන 1.7

කටයුතු

ව්‍යාපාර ඒකක

- විදේශීය බැංකුකරණය
- පාරිභෝගික බැංකුකරණය
- ආයතනික බැංකුකරණය
- ජාත්‍යන්තර බැංකුකරණය
- ව්‍යවසාය බැංකුකරණය
- භාණ්ඩාගාරය

මූල්‍ය මැදිහත්වීම

විවිධ පාර්ශවකරුවන් අතර මැදිහත්කරුවෙක් ලෙස කටයුතු කිරීම

2022 දෙසැම්බර් 31 දිනට නිමවුම්

සහය සේවා

මානව සම්පත්

තොරතුරු තාක්ෂණය

ප්‍රසම්පාදනය

පරිපාලනය

අලෙවිය සහ සන්නිවේදනය

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

උපායමාර්ගික සැලසුම් කිරීම

කල්පිරීම් පරිනාමය

දිගුකාලීන වත්කම්වලට මුදල් ලබාදීමට කෙටිකාලීන අරමුදල් භාවිතය

ප්‍රාග්ධන කළමනාකරණය

මූල්‍ය කළමනාකරණය

මූල්‍ය ප්‍රාග්ධනය

ශුද්ධ පොළී ආන්තිය රු.බි. 75.8
ROE 12.2%
ගෙවා ඇති බදු රු.බි. 13.9
ගාස්තු ආදායම රු.බි. 16.4
ROA 0.8%
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 16.3%

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල:
නිමකිරීමේ ප්‍රතිශතය 21.3%
දරන ලද පිරිවැය රු.මි. 2,204.2
ශාඛා ප්‍රතිසංස්කරණ පිරිවැය රු.මි. 211.3

බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම හිමිකම් දර්ශකය 4.0
ෆිච් ලංකා ණය ශ්‍රේණිගතකරණය A(lka)
ගනුදෙනුකාර තෘප්තිය 90%ට ඉහළ

මානව ප්‍රාග්ධනය

මුළු සේවකයින් 7.377
සේවක රැඳවාගැනීම 97.6%
ඩිජිටල් පුහුණු පැය 40.970
කාන්තා සේවිකාවන් 4.530
උසස්වීම් ගණන 33

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

ගනුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන 14.7ට වැඩි
ඩිජිටල් ලෙස කළ ගනුදෙනු 73%ට වැඩිය
නව ගනුදෙනුකරුවන් ඇතුළත්කර ගැනීම 682,300
ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන ගණන 2,301

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

සැපයුම්කරුවන් ගණන 258
මිලදී ගැනීමේ මුළු වටිනාකම රු.බි. 15.9
අනුරූප බැංකු ගණන 43
වෙස්ට්‍රෝ නියෝජිතයින් ගණන 82

ආයෝජක ප්‍රාග්ධනය

කොටස් ප්‍රාග්ධනය රු.බි. 145.3
ස්කන්ධය මත ප්‍රතිලාභ 12.2%
කොටසක ඉපයීම රු. 17,192

ප්‍රජා ප්‍රාග්ධනය

ප්‍රජා ව්‍යාපෘති ගණන 44
ප්‍රජා ව්‍යාපෘති මත වියදම රු.මි. 38.2.

ස්වභාවික ප්‍රාග්ධනය

සූර්ය බලය භාවිතා කරණ ශාඛා ගණන 20
ඩිජිටල් ලෙස විවෘත කළ ගිණුම් ගණන මිලියන 2.7

තිරසාරභාවයට කැපවීම

මහජන බැංකුව තිරසාර ව්‍යාපාර ව්‍යවහාරවලට සහ එය ක්‍රියාත්මක ප්‍රජාවන් වෙත "ආපසු දීමට" කැපවී සිටී. බැංකුව ආයතනික තිරසාරභාවය තුළ එක් එක් වසරේ සැලකියයුතු මුදල් ආයෝජනය කරන අතර, කාර්යක්ෂම ආකාරයකින් මෙම ආයෝජන භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකුවේ ආයතනික තිරසාර රාමුව (CSF) ස්ථාපිත රාමුවට අනුව ආයතනික තිරසාර ව්‍යාපෘති සකස් කිරීමේදී තිරණ ගන්නන්ට මඟපෙන්වනු ලබයි.

මහජන බැංකුවේ සේවකයින් ප්‍රතිපත්ති මුල්පිරිමි ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වගකියන වැදගත් පාර්ශවකරුවන් අතර සිටිති. අධ්‍යක්ෂ මණ්ඩලය CSF සංවර්ධනය කිරීම සඳහා වගකිවයුතු අතර ආයතනික සහ විධායක කළමනාකාරිත්වය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කිරීම සහ අරමුදල් වෙන් කිරීම භාරව කටයුතු කරයි.

ප්‍රතිපත්ති පරමාර්ථ ඉටුකරමින්, පාර්ශවකරුවන්ට වැදගත් වන ක්ෂේත්‍රවල ඔවුන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීමට බැංකුව අරමුණු කරයි.

උපායමාර්ගික අරමුණු

විශිෂ්ඨත්වය මෙහෙයවීම

ප්‍රමාණාත්මතා කරුණු

මූල්‍ය කාර්යසාධනය
මෙහෙයුම් කාර්යක්ෂමතාව
සේවක ඵලදායිතා
අවදානම සහ පාලනය
අනුකූලතාව
දක්ෂතා කළමනාකරණය
අවංකකම, විනිවිදභාවය සහ වගවීම
ව්‍යාපාරයේ පාරිසරික බලපෑම
සැපයුම්කරු වටිනාකම නිර්මාණය
පුහුණු සහ සංවර්ධනය කිරීම

ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩ නැඟීම

ප්‍රමාණාත්මතා කරුණු

ගනුදෙනුකාර අත්දැකීම්
වගකීම් සහිත ණය දීම
සමාජ ආර්ථික බලපෑම්
සන්නාම හිමිකම
ගනුදෙනුකාර ප්‍රවේශය
සෞඛ්‍යය හා ආරක්ෂාව

අනාගතයට සූදානම්වීම

ප්‍රමාණාත්මතා කරුණු

ඩිජිටල් නායකත්වය
සයිබර් ආරක්ෂක තර්ජන
සාර්ව ආර්ථික සාධක

මහජන බැංකුවේ ආයතනික තිරසාර ප්‍රතිපත්තිය

1 සමාජීය තිරසාරභාවය
2 පාරිසරික තිරසාරභාවය
3 ආර්ථික තිරසාරභාවය

1 සමාජීය තිරසාරභාවය

බැංකුව මෙම ප්‍රධාන ක්ෂේත්‍ර තුන මත සංකේන්ද්‍රණය වී ඇත:

තිරසාරතා කාර්යය	ප්‍රමාණාත්මතාව	සහශ්‍ර සංවර්ධන අරමුණුවලට අදාළත්වය
ළමා සංවර්ධනය: දරුවන්ගේ සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ අධ්‍යාපනය සහ සංවර්ධනය සඳහා බැංකුව තම කාර්යභාරය ඉටු කරන බව සහතික කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රටේ දුප්පත්කම තුරන් කිරීම සහ සාමාන්‍ය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.	• සමාජ ආර්ථික බලපෑම	4 QUALITY EDUCATION 1 NO POVERTY
උරුමය, සංස්කෘතිය සහ ආගමික සංවර්ධනය: රට සහ එහි ජනතාව විශාල හා පොහොසත් සංස්කෘතික උරුමයකින් ආශීර්වාද ලබා ඇති අතර, බැංකුව ක්‍රියාත්මක වන ප්‍රජාවන් තුළ කලාව, සංස්කෘතිය සහ ආගම් සඳහා සහයෝගය ලබා දෙමින් එහි සමාජ වටිනාකම ප්‍රවර්ධනය කර ඇත.	• සමාජ ආර්ථික බලපෑම	
විවිධත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය: බැංකුව විනිවිද සහ සාධාරණ ආකාරයකින් කාර්ය මණ්ඩලය බඳවා ගන්නා අතර, රටේ සෑම ප්‍රදේශයකින්ම සියලුම සමාජ ආර්ථික කණ්ඩායම්වල පුද්ගලයින් සේවයේ යොදවා ගනිමින් සියලුම දෙනා ඇතුළත් කර ගනි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් 39.6% කාන්තා කාර්ය මණ්ඩල සාමාජිකයින් නියෝජනය කිරීම තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ආඩම්බරයෙන් පිළිබිඹු වන ප්‍රධාන ක්ෂේත්‍රවලින් එකකි,	• මෙහෙයුම් කාර්යක්ෂමතාව • සේවක ඵලදායිතාව • දක්ෂතා කළමනාකරණය	5 GENDER EQUALITY

2 පාරිසරික තිරසාරභාවය

බැංකුව නවතම ව්‍යාපාර ව්‍යවහාර එහි මෙහෙයුම්වලට යොදා ගැනීමට සහ අපගේ සේවකයින්, සේවා දායකයින් සහ සැපයුම්කරුවන් අතර පාරිසරික දැනුවත්කම සහ වගකීම පෝෂණය කිරීමට බැඳී සිටී.

2016 දී ආරම්භ කළ අපගේ පාරිසරික වැඩසටහන වන පීපල්ස් ග්‍රීන් පල්ස් වැඩසටහන බැංකු ක්ෂේත්‍ර තුළ පහත කරුණුවලදී මඟ පෙන්වනු ලබයි.:

- බැංකු මෙහෙයුම්වලින් ඇතිවන පාරිසරික බලපෑම තක්සේරු කර අවම කිරීම.
- අභ්‍යන්තර සහ බාහිර ප්‍රජාව අතර අධ්‍යාපනය සහ දැනුම ඇති කිරීම.
- රටේ පාරිසරික හිතකාමී බැංකුකරණ වැඩසටහන්වල නායකත්වය ගැනීම.



පීපල්ස් ග්‍රීන් පල්ස්: ගොඩනැගිලි, සොබාදහම සහ ඔබ

- ගොඩනැගිලි
- ක්‍රියාවලි
- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- සමාජය

තිරසාරභාවයට කැපවීම

තිරසාරතා කාර්යය අදාළත්වය	ප්‍රමාණාත්මතාව	සහශ්‍ර සංවර්ධන අරමුණුවලට අදාළත්වය
ගොඩනැගිලි හරිත ගොඩනැගිලි වැඩසටහන සියලුම නව ගොඩනැගිලි සහ දැනට පවත්නා ගොඩනැගිලි නැවත සකස් කිරීම ආවරණය කරමින් සාර්ථකව ඉදිරියට ගමන් කරයි. ඩිජිටල්කළ බැංකු වැඩසටහන යටතේ නම්කළ තෝරාගත් ශාඛා කාබන් ශූන්‍ය ගොඩනැගිලි ලෙස සහතික කරනු ලැබේ. සහතික ලත් සූර්ය බලශක්ති උත්පාදන ක්‍රම LEED/GREENSL/CIOB Green Mark මාර්ගෝපදේශවලට අනුව ගොඩනැගිලි අන්තර්ගත කරනු ලැබේ. සියලුම කොන්ත්‍රාත්කරුවන් නව ප්‍රධාන ශාඛා සඳහා LEED/GREENSL/CIOB Green Mark සහතික කිරීම අනුගමනය කිරීම අවශ්‍ය වන අතර ඔවුන්ගේ අමුද්‍රව්‍ය එම අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.	• පාරිසරික බලපෑම	11 SUSTAINABLE CITIES AND COMMUNITIES 7 AFFORDABLE AND CLEAN ENERGY 13 CLIMATE ACTION
ක්‍රියාවලි මහජන බැංකුව එහි බොහෝ මෙහෙයුම්වල කඩදාසි රහිත බැංකුකරණය හඳුන්වාදීමක් සමඟ වඩාත් හරිත බැංකුව ලෙස කීර්තිනාමය ලබා ගනිමින් ක්‍රියාවලි ඩිජිටල්කරණය සහ දිවයින පුරා ඩිජිටල් සේවා ක්‍රියාත්මක කිරීමේදී පෙරමුණ ගෙන ඇත: • මුදල් හා චෙක්පත් තැන්පත් යන්ත්‍ර (CDM) • උපයෝගිතා බිල්පත් ගෙවීම සඳහා KIOSK • රටතුළ වඩාත් පුළුල් ATM ජාලය • කඩදාසි රහිත ගිණුම් විවෘත කිරීම සහ ගිණුම් සඳහා ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන • කඩදාසි රහිත පරිසරය තුළ ණය ක්‍රියාවලීන් • අන්තර්ජාල, ජංගම සහ වෙබ් පදනම් බැංකුකරණ ක්‍රම • හරපත් සහ ණය කාඩ් • 24/7 මහජන ඇමතුම් මධ්‍යස්ථානය	• මෙහෙයුම් කාර්යක්ෂමතාව • සේවක ඵලදායිතාව • පාරිසරික බලපෑම • ගනුදෙනුකාර අත්දැකීම • ගනුදෙනුකාර ප්‍රවේශය • ඩිජිටල් නායකත්වය	9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE 11 SUSTAINABLE CITIES AND COMMUNITIES
ගනුදෙනුකරුවන් ගනුදෙනුකරුවන්ට විවිධ මාර්ගවලින් ලබාගතහැකි පරිදි හරිත බැංකුකරණ සංකල්පය හඳුන්වා දී ඇත. විශේෂයෙන් මෙම ක්ෂේත්‍ර ගනුදෙනුකරුවන් අතර ප්‍රචලිත බව ඔප්පු වී ඇත.: • කඩදාසි රහිත මෙහෙයුමක් වන එක්ස්ප්‍රස් බැංකුකරණය තුළින් ගිණුම් විවෘත කිරීම. • ගිණුම්හිමියන්ට ඉල්ලා සිටිය හැකි ඉ-ප්‍රකාශන • කෙටි පණිවිඩ සහ අන්තර් ජාල බැංකුකරණය • හරපත් – මුදල් රහිත සමාජයක් කරා ගමන් කිරීම. • නව ගනුදෙනුකරුවන් සඳහා එක්ස්ප්‍රස් බැංකුකරණය ක්‍රියාවට නැංවීම. • CDM – මුදල් තැන්පතු, ATM – මුදල් ආපසු ගැනීම සහ Kiosk – බිල්පත් ගෙවීම. • වඩා අඩු පොළී අනුපාත සමඟ හරිත ණය ක්‍රමය	• මෙහෙයුම් කාර්යක්ෂමතාව • සේවක ඵලදායිතාව • පාරිසරික බලපෑම • ගනුදෙනුකාර අත්දැකීම • සමාජ ආර්ථික බලපෑම • ගනුදෙනුකාර ප්‍රවේශය • සෞඛ්‍යය හා ආරක්ෂාව • වගකීම්සහගත ණයදීම	12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
සේවකයින් මෙම වැඩසටහන්වල සම්පූර්ණ බලපෑම ඇති කිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් තිරසාර දර්ශනයේ සම්පූර්ණ පිළිපදින්නන් වීම වැදගත් වේ. මේ සඳහා සූර්ය බලශක්ති පද්ධති මිලදී ගැනීම සඳහා සහනදායී ණය ලබා ගැනීමටත්, පරිසර හිතකාමී ගොඩනැඟිලි ක්‍රම භාවිත කිරීමටත්, විදුලි හෝ දෙමුහුන් වාහන මිලදී ගැනීමටත් සේවකයන් උනන්දු කරනු ලැබේ. අභ්‍යන්තර සහ ගනුදෙනුකාර සන්නිවේදනය සඳහා විද්‍යුත් ලියකියවිලි සහ සන්නිවේදන ක්‍රම වෙත මාරු වීමට ද ඔවුන් දිරිමත් කරනු ලැබේ.	• සේවක ඵලදායිතාව • අනුකූලතාව • පාරිසරික බලපෑම	12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION 13 CLIMATE ACTION 15 LIFE ON LAND
සමාජය රටේ වඩාත් හරිත බැංකුව බවට පත්වීමේ බැංකුවේ ප්‍රයත්නයේ දී, අපි පොදු සමාජයට පහත ලක්ෂණ ඉදිරිපත් කරමු: • අපගේ මෙහෙයුම් වලින් අවම කාබන් විමෝචනය • අපි කාබන් කළමනාකරණය ක්‍රියාවේ යොදවා ඇති අතර කාබන් වෙළඳ වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇත. • පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රගුණ කිරීම මගින් සමස්තයක් ලෙස සමාජයම දැනුවත් කිරීමේ උත්ප්‍රේරකයක් ලෙස අපි කටයුතු කරන්නෙමු. • කාබන් ණය නිෂ්පාදනය උපරිම කිරීම සඳහා රුක් රෝපණ ව්‍යාපෘති ආරම්භ කිරීම	• අනුකූලතාව • පාරිසරික බලපෑම	9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE 11 SUSTAINABLE CITIES AND COMMUNITIES 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION 15 LIFE ON LAND

3 ආර්ථික තිරසාරභාවය

ආර්ථික තිරසාරත්වයේ අරමුණු, රටේ ජනගහනයෙන් අඩුවෙන් සේවය ලද විශාල පිරිසකට එකල පැවති මූල්‍ය සේවාවන්හි කොටස්කරුවන් වීමට අවස්ථාව ලබා දීම සඳහා පිහිටුවන ලද මහජන බැංකුවේ මූලයන් වෙත අපව රැගෙන යයි. එය විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ පාරිභෝගිකයන් – ගොවීන්, ධීවරයින් සහ ග්‍රාමීය ව්‍යවසායකයින් වෙනත් අය අතරින් ඉලක්ක කර ගෙන ඇත. එතැන් සිට දශක හයක කාලය තුළ, බැංකුව මූල්‍ය සේවා විශිෂ්ටත්වයේ ජාතික බලාගාරයක් බවට පරිවර්තනය වී ඇත. අපගේ අරමුණ ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා වෙළෙඳපොළ ප්‍රමුඛයා ලෙස පිළිගැනීමට පත්වීමයි.

මෙය මහසේ තබාගෙන බැංකුව ආර්ථික තිරසාරත්වය සඳහා මුල පිරීම් මාලාවක් සකස් කර ඇත.

තිරසාරතා කාර්යය	ප්‍රමාණාත්මතාව	සහශ්‍ර සංවර්ධන අරමුණුවලට අදාළත්වය
තිරසර වාර්තාකරණ රාමුවක් ස්ථාපිත කර ඇත (මධ්‍යම තිරසාර කමිටුවකින්, ප්‍රාදේශීය තිරසාර නිලධාරීන්, ශාඛාව/දෙපාර්තමේන්තු තිරසාර නිලධාරීන්ගෙන් සමන්විත). රාමුවට ප්‍රධාන තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලියක් ඇතුළත් වේ.	• අවදානම සහ පාලනය • අනුකූලතාව • අවංකකම, විනිවිදභාවය සහ වගවීම	
නව ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය ආධාර දැරිය හැකි මිලකට ලබාදීම.	• වගකීම්සහගත ණය දීම • සමාජ ආර්ථික බලපෑම • ගනුදෙනුකාර ප්‍රවේශය	
රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නඟා සිටුවීමෙන් ආර්ථික සංවර්ධනය වේගවත් කරන අතර ඔවුන්ගේ කළමනාකරණ සහ අලෙවිකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම.	• වගකීම්සහගත ණය දීම • සමාජ ආර්ථික බලපෑම • ගනුදෙනුකාර ප්‍රවේශය	
සුදුසු ක්ෂුද්‍ර මූල්‍යකරණ ව්‍යාපෘති තුළින් නව රැකියා සහ ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම.	• වගකීම්සහගත ණය දීම • සමාජ ආර්ථික බලපෑම • ගනුදෙනුකාර ප්‍රවේශය	
විභව ව්‍යවසායකයින්ගේ අපනයන හැකියාවන් වැඩි දියුණු කිරීම.	• වගකීම්සහගත ණය දීම • සමාජ ආර්ථික බලපෑම • ගනුදෙනුකාර ප්‍රවේශය	
සූර්ය බලශක්ති ව්‍යාපෘති වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමෙන් පරිසර හිතකාමී මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම.	• පාරිසරික බලපෑම • වගකීම්සහගත ණය දීම • සමාජ ආර්ථික බලපෑම	7 AFFORDABLE AND CLEAN ENERGY 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
රට පුරා ඩිජිටල් මධ්‍යස්ථාන, ස්වයං බැංකුකරණ ඒකක සහ බැංකු ශාඛා පිහිටුවීම මගින් ව්‍යාපාරික ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාවය සහ මූල්‍ය ඇතුළත් කිරීම වැඩිදියුණු කිරීම.	• සේවක ඵලදායිතාව • ගනුදෙනුකාර අත්දැකීම • සමාජ ආර්ථික බලපෑම • සන්නාම හිමිකම • ගනුදෙනුකාර ප්‍රවේශය • ඩිජිටල් නායකත්වය	9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE 10 REDUCED INEQUALITIES
මහජන බැංකුව විසින් පිරිනමනු ලබන පහසුකම්වලින් සියලුම අංශ ප්‍රතිලාභ ලබන බව සහතික කිරීම සඳහා බැංකුවේ වත්කම් සහ වගකීම් රාමුවට අනුව ආර්ථිකයේ සියලුම අංශ (කෘෂිකාර්මික, ධීවර, පශු සම්පත්, අපනයන කෘෂිකර්ම, වෙළඳාම ආදිය) සඳහා මූල්‍යමය වශයෙන් පහසුකම් සපයනු ලැබේ.	• මූල්‍ය කාර්යසාධනය • ගනුදෙනුකාර අත්දැකීම • ගනුදෙනුකාර ප්‍රවේශය • සමාජ ආර්ථික බලපෑම • සන්නාම හිමිකම් • ඩිජිටල් නායකත්වය	5 GENDER EQUALITY 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE 10 REDUCED INEQUALITIES

අනාගත දැක්ම

2022 ආර්ථික කැළඹිලි සහිත වසරෙන් අප ගොඩ එන බැවින් බැංකුවේ අනාගත කටයුතු මත බලාපොරොත්තු වන, ආයතනික තිරසාර සමුද්දේශ රාමුවේ ප්‍රධාන අංග තුනක් යටතේ එන සියලුම අනුග්‍රාහක ඉල්ලීම් සඳහා පැහැදිලි මාර්ගෝපදේශ මාලාවක් අපි අනුගමනය කරන්නෙමු. පහත නිර්ණායක සම්බන්ධයෙන් ඒවා සලකා බලනු ඇත.

- ආයතනික තිරසාර ව්‍යාපෘතියේ හෝ අනුග්‍රාහකත්වයේ අවසාන අරමුණ/ප්‍රතිඵලය සමාජ තිරසාරත්වය, ආර්ථික තිරසාරත්වය හෝ පාරිසරික තිරසාරත්ව රාමුව/රාමු යටතේ පැමිණිය යුතුය.
- ආයතනික තිරසාර ව්‍යාපෘති සඳහා අනුග්‍රාහකත්වය ඉල්ලා සිටින පාර්ශ්වකරුවන්ට මහජන බැංකුව සමඟ ගිණුමක්/මූල්‍ය සබඳතාවක් තිබිය යුතුය.
- විශේෂිත ගිණුම/මූල්‍ය සම්බන්ධතාව බැංකුවට මෙන්ම පාර්ශවකරුටද ලාභදායී ව්‍යාපාරයක් විය යුතුය.
- යම් ආයතනික තිරසාර ව්‍යාපෘතියක් සඳහා අනුග්‍රාහකත්වය සලකා බැලීමට පෙර සම්මත පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සිදු කළ යුතුය.
- යම්කිසි විශේෂ ව්‍යාපෘතියක් හැර, අනුග්‍රාහක මුදල අදාළ ව්‍යාපාරයේ වාර්ෂික ලාභයෙන් 10% නොඉක්මවිය යුතු අතර සාධාරණ ප්‍රතිලාභ බැංකුවට සහ සමාජයට ලැබිය යුතුය.
- විශේෂ ආයතනික තිරසාර ව්‍යාපෘති විධායක මෙහෙයුම් කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ අධිකාරී මට්ටම්වල නිසි නිර්දේශ සහිතව අනුමත කළ යුතුය.
- බැංකුව සමඟ මූල්‍ය සබඳතාවක් නොමැති ගිණුම් හිමියන් නොවන පුද්ගලයින් ආයතනික තිරසාර ව්‍යාපෘති අනුග්‍රාහකත්ව ප්‍රතිලාභ ලෙස බැංකුවට ප්‍රමාණවත් ප්‍රතිලාභ (වාණිජ හෝ වාණිජ නොවන) පිරිනැමිය යුතුය.
- සියලුම ආයතනික තිරසාර ව්‍යාපෘති අනුග්‍රහයන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක: PED 57 යටතේ දක්වා ඇති “රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ” වලට අනුකූල විය යුතුය.

67
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

68 / මූල්‍ය ප්‍රධානීගේ සමාලෝචනය
72 / ව්‍යාපාර මාර්ග සමාලෝචනය
72 / පාරිභෝගික බැංකුකරණය
73 / ව්‍යවසාය බැංකුකරණය
75 / ආයතනික බැංකුකරණය
77 / භාණ්ඩාගාරය
78 / විදේශීය ගනුදෙනුකාර සේවා
80 / ජාත්‍යන්තර බැංකුකරණය
82 / නිෂ්පාදිත ප්‍රාග්ධනය
87 / බුද්ධිමය ප්‍රාග්ධනය
95 / මානව ප්‍රාග්ධනය
108 / සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
108 / ගනුදෙනුකාර ප්‍රාග්ධනය
115 / ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය
120 / ආයෝජක ප්‍රාග්ධනය
124 / ප්‍රජා ප්‍රාග්ධනය
129 / ස්වභාවික ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රධානීගේ සමාලෝචනය

බැංකුවේ දෘෂ්ටිකෝණයෙන්, එහි වාණිජ අරමුණුවලට අමතරව සමාජීය බලපෑමක් සහ ජාතික කාර්යභාරයක් සහිත රාජ්‍ය ආයතනයක් ලෙස – එහි කාර්යසාධනය රටේ ආර්ථික සෞභාග්‍යය සමඟ වෙන්කල නොහැකි අයුරින් බැඳී ඇත. එහි දශක හයකට වැඩි මෙහෙයුම් ඉතිහාසය තුළ, බොහෝ අභියෝග සහ ආර්ථික චක්‍ර සමඟ කටයුතු කර ඇති අතර 2022 වසර මෙයට පෙර කිසිදිනක නොවූ තරම් විය. සමාලෝචිත වසර තුළ, ද්‍රවශීලතා පෙරමුණකින් විදේශ විනිමය විශේෂයෙන් ඉපයීම් පෙරමුණකින් සහ පොදු මෙහෙයුම් පෙරමුණකින් අභියෝගවලට මුහුණදීමට බැංකුවට සිදු විය.

සාර්ව සමාලෝචනය

2022 ශ්‍රී ලංකාව සඳහා මෙයට පෙර නොදුටු සාර්ව ආර්ථික බාධා සහිත වසරක් විය. එය වසර ගණනාවක් පුරා පැවති ගැටළු ගැඹුරු ආර්ථික පීඩාවකට පත් වූ බාහිර කම්පන සහ පීඩනවල කූටප්‍රාප්තිය දුටු වසර විය. රටේ ප්‍රයෝජනයට ගත හැකි විදේශ සංචිත සර්වකාලීනව පහත වැටුණු වසරකි. රටේ ශ්‍රේණිගත කිරීම පෙර නොවූ විරූ මට්ටමකට පහත වැටීම සහ පසුව ඇති වූ විදේශ මුදල් ද්‍රවශීලතා හේතුවෙන් අනෙක් කරුණු අතර, වසරේ දෙවන කාර්තුවේ වැඩි කාලයක් තුළ ආර්ථික කටයුතු නතර කිරීම සිදුවිය. මෙය සමස්තයක් ලෙස රුපියල 80.0%කින් අවප්‍රමාණය වීමත්, උද්ධමනය වාර්තාගත 70.0% මට්ටම් දක්වා වර්ධනය වීමත්, සහ එය සීමා කිරීමේ පියවරක් ලෙස, පොලී අනුපාත 30.0%ක ඉතිහාසගත ඉහළ සංඛ්‍යාවක් දක්වා ඉහළ යාමත් සිදු විය. ඕනෑම ආර්ථිකයක කොදු නාරටිය ලෙස බැංකු ක්ෂේත්‍රය එවැනි අභියෝග සහ ප්‍රතිවිපාක අතින් ඉදිරියෙන්ම සිටින බව අමුතුවෙන් කිව යුතු නැත.

40 සිට 46 දක්වා පිටුවල මෙහෙයුම් පරිසරය මඟින් වඩා පුළුල් පොදුවේ ක්ෂේත්‍රය තුළ සහ බැංකුව ක්‍රියාත්මක ගෝලීය, දේශීය සහ අංශවල මෙහෙයුම් සන්දර්භය සම්පූර්ණයෙන් විස්තර කරයි.

මහජන බැංකුවේ අභියෝග සහ ප්‍රවේශය

බැංකුවේ දෘෂ්ටිකෝණයෙන්, එහි වාණිජ අරමුණුවලට අමතරව සමාජීය බලපෑමක් සහ ජාතික කාර්යභාරයක් සහිත රාජ්‍ය ආයතනයක් ලෙස – එහි කාර්යසාධනය රටේ ආර්ථික සෞභාග්‍යය සමඟ වෙන්කල නොහැකි අයුරින් බැඳී ඇත. එහි දශක හයකට වැඩි මෙහෙයුම් ඉතිහාසය තුළ, බොහෝ අභියෝග සහ ආර්ථික චක්‍ර සමඟ කටයුතු කර ඇති අතර 2022 වසර මෙයට පෙර කිසිදිනක නොවූ තරම් විය. සමාලෝචිත වසර තුළ, ද්‍රවශීලතා පෙරමුණකින් විදේශ විනිමය විශේෂයෙන් ඉපයීම් පෙරමුණකින් සහ පොදු මෙහෙයුම් පෙරමුණකින් අභියෝගවලට මුහුණදීමට බැංකුවට සිදු විය.

ද්‍රවශීලතා පෙරමුණින්, රටේ ණය වර්ගීකරණ අනුපාතය පහළ ශ්‍රේණිගතකරණය තුළින් විදේශීය ණයදෙන්නන් කිහිපදෙනෙක් විසින් මාර්ග සහ සීමා ඉවත්කර ගැනීම දක්නට විය. 2020ට පෙර, – බැංකුව දේශීයව සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු අතර විදේශීය ප්‍රතිපාර්ශ්ව වලින් විශාලතම ණය ලබාගන්නා විමෙන් ප්‍රතිලාභ ලබන ලදී. කෙසේවෙතත්, කොවිඩ්-19 ආරම්භයට පෙර B මට්ටමේ පැවති ශ්‍රේණිගතකරණය 2020 නොවැම්බර් වන විට CCC ණය වර්ගීකරණ ශ්‍රේණිගතකරණයට අනුව, මාසයක පමණ කාලයක් තුළ – බැංකුවට තිබුණු ඇ.ඩො.බී. 1.0ට වැඩි බාහිර විදේශ විනිමය ප්‍රවේශය අහිමිවීම දක්නට විය. දරුණු අවශ්‍යතා කාලයක් තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය මඟින් ජාතියට අඛණ්ඩව සහයවීමේ අවශ්‍යතාව හා මෙය සම්බන්ධ වී ඇත. – ප්‍රධාන වශයෙන් මේවාට බොරතෙල්, ගල් අඟුරු සහ ඖෂධ ඇතුළත් වූ අතර අනෙකුත් රාජ්‍ය ආයතන හා සමානව මුහුණ දුන් සාමාන්‍ය අවබෝධය ආශ්‍රිත පසුබෑම – බැංකුව එහි විදේශ විනිමය මෙහෙයුම් තුළ සැලකිය යුතු අභියෝග සමඟ ගනුදෙනු කිරීම දක්නට විය. මෙම අභියෝග තවදුරටත් පවතින අතරම, බැංකුව කොටි කාලය පුරා ඒවා ක්‍රමානුකූලව විසඳීම කරා සැලකියයුතු දියුණුව ලබාගෙන ඇති අතර, එයට සාර්ව ආර්ථික වාතාවරණයන් වැඩිදුරට වර්ධනය දරාගත හැකි බව පෙන්නුම් කරන්නේනම් තවදුරටත් අධාර කරනු ඇත. රුපියල් පෙරමුණක සිට බැලීමේදී, ඉහළ පොළී අනුපාත ඇතුළුව සාර්ව ආර්ථික පසුබෑම හේතුවෙන් 2022 පළමු මාස හතරක කාලසීමාව තුළ පූර්ව පසුබෑමක් පැවති අතර, තැන්පතු වැඩි කර ගනිමින් ණය වර්ධනය මැඩ පැවැත්වීමට ගනු ලැබූ පූර්ණ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, එවැනි දුෂ්කර සහ සීමිත වාතාවරණයන් සාර්ථකව ජය ගැනීමට බැංකුව සමත් වී ඇත.

ඉපයීම් පෙරමුණක සිට බැලීමේදී, පැවති අති විශේෂ ඉහළ පොළී අනුපාත මඟින් බැංකුවේ ශුද්ධ පොලී ආන්තික දැඩි පීඩනය යටතේ පැවති බව දැකිය හැකි විය. බැංකු තැන්පතුවලින් තුනෙන් දෙකකට සමීපව – ක්ෂේත්‍රයට සමානම – පොළී සංවේදී කාලීන තැන්පතු වන අතර ඒවායේ කල්පිරීම්වලින් 90.0%ට වඩා මාස 12ක කාලසීමාවක් තුළ හෝ ඊට අඩු වන අතර එහි ණය කළඹට අදාළව වේගවත් අගයකින් ප්‍රතිමිලකරණය කර ඇත. එමෙන්ම එහි සමාන සමාජීය බලපෑම තුළ, පාරිභෝගික සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය යන දෙඅංශයේම වඩාත් උවදුරට ලක්වන ගනුදෙනුකරුවන්ගේ ණය විස්තර ප්‍රතිමිලකරණය ප්‍රමාද කර ඇත. ඊට අමතරව. පිරිහීමට ලක් වූ සාර්ව පරිසරයන්, ස්වභාවිකවම පිරිහීමට ලක් වූ වත්කම්වල ගුණාත්මකභාවය සහ ඉහළ හානිකරණ අයකිරීම් නියම කළ අතර, උද්ධමනීය පීඩනයන් පිරිවැය වැඩි කිරීමට අවිකල්පයෙන් හේතු විය. – මේ සියල්ල අමතර ඉපයීම් පීඩනයන් ඇති කරයි. කෙසේවෙතත්, අපි සිදුකර ඇති සෑම දෙයක්ම සලකා බැලීමේදී, සහ පදනම් මූලධර්මවලට අනුකූලව, අපගේ උපාය මාර්ග සැකසීමේදී අපි ලාභයෙන් ඔබ්බට බැලූ අතර ඕනෑම ඉහළ හෝ පහළ මට්ටමේ මිනුමකට සාපේක්ෂව දිගු කාලීන තිරසාරභාවය සහ පාරිභෝගික කේන්ද්‍රීයතාව සඳහා ඔරොත්තු දීමේ හැකියාව, දූරදර්ශී ආයෝජන වැඩි දියුණු කළ වසරක් ලෙස 2022 වසර දෙස බැලුවෙමු. බැංකුවේ ප්‍රයෝජනය සඳහා, මෙම දුෂ්කර කාලවලදී මිල කළ නොහැකි වත්කම් වූ එහි කැපවූ කාර්ය මණ්ඩලය සහ තීක්ෂණ නායකත්වය සහ තාක්ෂණය සහ ඩිජිටල්කරණය කෙරෙහි එහි අවධානය යොමු කිරීම නිසා මෙම එක් එක් බාධක සමඟ කටයුතු කිරීමට එය සමත් විය.

මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඉදිරි දර්ශනයකින් බැලීමේදී, එවැනි අතිශය දුෂ්කරතා මධ්‍යයේ වුවද, දැනට පවතින බාසල් III නීති යටතේ ක්ෂේත්‍රයේ ආයතන හා සැසඳීමේදී යහපත් මට්ටමේ නුඹුන්වත්භාවයක් සාර්ථකව පවත්වා ගැනීමට බැංකුවට හැකි විය. මෙය 2017 ජූලි 1 වන දින බාසල් III ආරම්භයේ සිට බැංකුව සිය නියාමන ප්‍රාග්ධනය වැඩි කර ගැනීමට ගත් නොයෙකුත් ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වන අතර වෙනත් කරුණු අතර එයට එහි ඉපයීම් රඳවාගැනීම් වර්ධනය සහ මහජන බැංකු පනතේ සංශෝධනය සහ ඉන් පසුව ඇති වූ ණයකර නිකුත් කිරීම් ඇතුළත් ය.

ප්‍රධාන සිදුවීම්

- ඒකාබද්ධ දළ ආදායම රුපියල් බිලියන 391.2 දක්වා ළඟා වූ අතර 65.2% (2021: රුපියල් බිලියන 236.8) වර්ධනයක් නියෝජනය කරයි. මෙය මූලික වශයෙන් ඉහළ පොලී අනුපාත පරිසරය සහ එකෝචිත ගාස්තු ආදායම සහ විදේශ විනිමය හුවමාරු ලාභ ඇතුළත් අරමුදල් නොලබන ආදායම් මූලාශ්‍රවල වැඩි වීම මඟින් මෙහෙයවනු ලැබීය.

- ඒකාබද්ධ ශුද්ධ පොළී ආදායම රුපියල් බිලියන 91.0 දක්වා (2021: රුපියල් බිලියන 96.9) 6.0%කින් අඩු විය. ශුද්ධ පොළී ආන්තිකය 2021 දී පැවති 3.7% සිට 3.1% දක්වා පහත වැටුණි. බැංකුව ස්වාධීන පදනමක් මත, ශුද්ධ පොළී ආන්තිකය 2021 දී පැවති 3.4% සිට 2.7% දක්වා පහත වැටුණි.
- ඒකාබද්ධ මෙහෙයුම් වියදම් මුළු රුපියල් බිලියන 59.0ක් වූ අතර එය (2021: රුපියල් බිලියන 50.5)ට සාපේක්ෂව 16.8%ක වැඩිවීමකි. බැංකුවේ විශ්‍රාම වැටුප් භාර අරමුදල ආශ්‍රිත වියදම් හැර මුළු පිරිවැය වැඩිවීම 13.2%කි.
- බැංකුවේ හානිකරණ අයකිරීම් වාර්ෂිකව 130.4%කින් ඉහළ ගොස් ඇති අතර ඉන් ප්‍රධාන ගනුදෙනුකාර නිරාවරණයන් කිහිපයක් අදියරගත කිරීම ඇතුළුව ණය ගුණාත්මකභාවයේ පීඩනය පිළිබිඹු කරයි. මෙම සන්දර්භය තුළ, බැංකුවේ ප්‍රතිලාභය සඳහා, බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයට යටත්ව බැංකුවේ නිරාවරණ ස්වෛරී ආයෝජන ඩොලර් මිලියන 51.4ක් පමණක් වූ බවත් එය සැලකියයුතු ලෙස අඩු අගයක් වූ බවත් පෙන්වා දිය යුතුය.
- පිළිවෙලින් 2021 දී පැවති 1.4% සහ 17.7%ට සාපේක්ෂව 2022 දී ඒකාබද්ධ වත්කම් මත ඉපයීම (බදු පෙර) 0.9% සහ ස්කන්ධය මත ඉපයීම් 11.2% ලෙස වාර්තා විය.

ආදායම් ප්‍රකාශය

මුළු මෙහෙයුම් ආදායම සහ ශුද්ධ පොළී ආදායම

මෙහෙයුම් පරිසරයේ සංරෝධක සැලකිල්ලට ගැනීමේදී, බැංකුවේ මෙහෙයුම් ආදායමේ, ශුද්ධ පොළී ආදායම මත අවහිරතා පැවතුණි. ජාතික වැදගත්කමක් ඇති අංශවලට සේවය කිරීමට ණයදීම සඳහා ප්‍රමුඛත්වය දීමට බැංකුවට සිදුවිය; මෙයින් ඔබ්බට, සලකා බලන සමස්ත සාර්ව වාතාවරණයන් ණය දීමේදී ප්‍රවේශමිසහගත වීම අවශ්‍ය විය.

ඉහළ යන පොළී ආදායම සහ පොළී නොවන ආදායම යන දෙකින්ම, බැංකුවේ ඒකාබද්ධ දළ ආදායම රුපියල් බිලියන 391.2 දක්වා ළඟා වෙමින් 65.2%කින් ඉහළ ගියේය. පොළී ආදායම, ගාස්තු සහ කොමිස් ආදායම සහ වෙනත් මෙහෙයුම් ආදායම තවදුරටත් ප්‍රධාන ආදායම් මූලාශ්‍ර විය. වර්ෂය සඳහා ඒකාබද්ධ මුළු මෙහෙයුම් ආදායම රුපියල් බිලියන 130.0ක් වූ අතර එය 2021 දී පැවති රුපියල් බිලියන 110.7 සිට 17.4%ක වැඩි වීමකි. බැංකුවේ මෙහෙයුම් ආදායම සමාලෝචිත වර්ෂයේ මුළු ඒකාබද්ධ මෙහෙයුම් ආදායමෙන් 84.8%ක් විය.

අතීතයේදී ගත් දූරදර්ශී තීරණ හේතුවෙන්, 2022 අප්‍රේල් මාසයේ සිදු වූ පොළී අනුපාතවල හදිසි ඉහළ යාම යම් සැලකියයුතු වෙළෙඳපොළ අලාභවලට හේතු නොවූ තරමට අපගේ ආයෝජන කළඹේ පැහැකඩ පැවතුණි.


තවද, එහි දූරදර්ශී බව පිළිබිඹු කරමින් සහ පළමු අවස්ථාවේ දී නිවැරදිව වර්ගීකරණය කර තිබීම නිසා, බැංකුවට සිය ණය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීමට කිසිදු නියාමන හෝ අධීක්ෂණ අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තාවූ පරිදි බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය යථාර්ථවාදී රූපයක් නිරූපණය කරයි.

	2022 රු.බි.	2021 රු.බි.	2020 රු.බි.	2019 රු.බි.	2018 රු.බි.
මුළු මෙහෙයුම් ආදායම	130.0	110.7	90.8	96.5	89.8
- ශුද්ධ පොළී ආදායම	91.0	96.9	74.4	78.6	71.2
- පොළී නොවන ආදායම	39.0	13.8	16.4	17.9	18.7
ශුද්ධ පොළී ආන්තිකය - (%)					
- ඒකාබද්ධ	3.1	3.7	3.3	3.8	4.0
- බැංකුව	2.7	3.4	3.0	3.2	3.5

පොළී ආදායම රු.බි. 351.4 දක්වා 58.0%කින් වැඩි විය. වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්වලින් පොළී ආදායම ඉන් 73.7%ක් සඳහා දායක වූ අතර ඉතිරි 26.3% ණය උපකරණ මත ආයෝජනවලින් (මූලිකව රජයේ සුරැකුම්පත්) උපයාගෙන ඇත. පොළී වියදම් රු.බි. 260.4 දක්වා වඩා ඉහළ අගයක් වන 107.5%කින් වර්ධනය වූ අතර මින් පොළී අනුපාත 30% හෝ ඊට වැඩිවන විට කාලීන තැන්පතු රඳවා ගැනීමට දැරීමට සිදු වූ තැන්පතු මත පොලියෙහි විශාල වැඩිවීමක් පිළිබිඹු කරයි. මුළු පොළී වියදම්වලින්, තැන්පතු ආශ්‍රිත වියදම් 80.6%ට ආසන්න වූ අතර, මෙයින් 80%ට වඩා කාලීන තැන්පතු නිසා විය. 19.4%ක ඉතිරිය වෙනත් අරමුදල් මූලාශ්‍ර මත ගෙවන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොළී ආදායම 2021 දී පැවති රුපියල් බිලියන 96.9 සිට 2022 දී රුපියල් බිලියන 91.0 දක්වා පහත ගිය අතර මෙය 6.0%ක පහත වැටීමකි. සමූහයේ ශුද්ධ පොළී ආන්තිකය වාර්ෂිකව 3.7% සිට 3.1% දක්වා අඩු විය. මෙම අවස්ථාව සඳහා විවිධ සාධක දායක වූ අතර ඒවාට පොළී දරන වගකීම් (විශේෂයෙන් තැන්පතු) පොළී උපයන වත්කම්වලට වඩා වේගයෙන් සහ සාපේක්ෂ ඉහළ මිලකට ප්‍රතිමිලකරණයවීම සහ පැවති වෙළෙඳපොල ද්‍රවශීලතාවයේ පහළ මට්ටම තුළ දැඩි තරඟකාරිත්වය හමුවේ තැන්පතු ආකර්ෂනය කර ගැනීමට/රඳවා ගැනීමට ඉහළ පොළී අනුපාත පිරිනැමීම ඇතුළත් විය. තවද, තැන්පතු අඩු පිරිවැය පංගම සහ ඉතුරුම් ගිණුම්වල සිට කාලීන තැන්පතු වෙත මාරුවීමක් බැංකුවට දැකගත හැකි වූ අතර, එය ඉහළ පොළී අනුපාත පාලන කාලවලදී ක්ෂේත්‍රය තුළ දක්නට ලද සංසිද්ධියකි. 2021 වසර තුළදී පංගම ගිණුම් ඉතුරුම් ගිණුම් අනුපාතය 39.3% සිට 30.2% දක්වා පහත වැටීමකට හේතු විය.

ශුද්ධ පොළී ආන්තිකය



පොළී නොවන ආදායම

පවතින පොළී අනුපාතවල අස්ථාවර වාතාවරණය තුළ, බැංකුවේ පොළී නොවන ආදායම් මූලාශ්‍ර වැඩිදියුණු කිරීම බැංකුවේ සංවර්ධනය කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍රයකි. පොළී නොවන ආදායම ගාස්තු සහ කොමිස් ආදායම, වෙළෙඳ ආදායම සහ වෙනත් මෙහෙයුම් ආදායම් මූලාශ්‍රවලින් සමන්විත වේ. සමූහයේ පොළී නොවන ආදායම 2021 දී පැවති රු.බි. 13.8 සිට 2022 දී රු.බි. 39.0 දක්වා වැඩි වූ අතර, එය 181.8%ක වැඩිවීමකි. කෙසේ වෙතත් මෙය මූලික වශයෙන් විදේශ විනිමය ප්‍රත්‍යාගණනය කිරීම සහ ගාස්තු සහ කොමිස් ආදායම තුළ එකෝවිත වැඩිවීම මගින් මෙහෙයවනු ලැබීය. මේවා හැර, සාමාන්‍යකරණය වූ පදනමක් මත, මුළු ආදායමට අරමුදල් නොලබන ආදායම 23.8%කට ආසන්න වනු ඇති අතර, එය මේ දක්වා එහි වෙනත් ආදායම් මූලාශ්‍ර වැඩිදියුණු කිරීම පිළිබිඹු කරයි. මෙවැනි ප්‍රයත්නයන් ඉදිරි වසර වලදීද අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ණය සහ අත්තිකාරම්වලට අදාළ ගාස්තු, වෙළෙඳාමට අදාළ ගනුදෙනු සහ ක්‍රෙඩිට් කාඩ් සහ ඩිජිටල් ගනුදෙනු මත උපයාගත් ගාස්තු ඇතුළත් ඒකාබද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 2021 දී පැවති රුපියල් බිලියන 9.6 සිට 2022දී රුපියල් බිලියන 17.2 දක්වා වැඩිවිය. 2022දී රක්ෂණ ව්‍යාපාරයෙන් ශුද්ධ ඉපැයූ වාර්කවලින් ප්‍රධාන වශයෙන් සමන්විත වෙනත් මෙහෙයුම් ආදායම 2021දී පැවති රුපියල් බිලියන 6.0 සිට 2022දී රුපියල් බිලියන 5.6 දක්වා අඩු විය.

හානිකරණ අයකිරීම්

අභියෝගාත්මක සාර්ව-ආර්ථික තත්ත්වයන් හේතුවෙන් අපේක්ෂා කළ යුතු වූ, හානිකරණ අයකිරීම් පෙර වසරට වඩා දෙගුණයකටත් වඩා වැඩි විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සිට විශාල සමාගම් සහ රජය දක්වා සමස්ත ව්‍යාපාරික අංශය දැඩි පීඩනයට ලක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවතින වෙළෙඳපොල තත්ත්වයන් හේතුවෙන් ප්‍රධාන ගනුදෙනුකරුවන් මුහුණ දුන් අවදානම් මට්ටම පිළිබඳව බැංකුව විසින් වසර තුළදී විචක්ෂණ තක්සේරුවක් සිදු කරන ලදී. මේ මත පදනම්ව, වාතාවරණයන් යටතේ අවශ්‍ය පරිදි අවදානම් වර්ගීකරණයේ ඉහළ අදියරකට ගනුදෙනුකරුවන් මාරු කිරීම පිළිබඳව තීරණ ගන්නා ලදී.

සමූහය සඳහා, හානිකරණ අයකිරීම් 2021 පැවති රුපියල් බිලියන 14.5 සිට 2022 දී රුපියල් බිලියන 34.4 දක්වා ඉහළ ගියේය. (137.2%ක වැඩිවීමක්). බැංකුව පමණක් ගත් විට, අනුරූප අගයන් රුපියල් බිලියන 14.5 ක් සහ රුපියල් බිලියන 33.3කි. (130.4%ක වැඩිවීමක්).

සමාලෝචිත වර්ෂයේදී, 1 අදියරේදී නිරාවරණ සඳහා වූ හානිකරණ වෙන් කිරීම 17.9% කින් අඩු වූ අතර 2 සහ 3 අදියර සඳහා පිළිවෙලින් 79.5% සහ 27.1% කින් වැඩි විය. සමුච්චිත අදියර 3 වෙන් කිරීම පසුගිය වසරේ රුපියල් බිලියන 92.2 සිට 2022 අවසානයේදී රුපියල් බිලියන 117.1 දක්වා ළඟා විය. 2022 අවසානයේ දී ඒකාබද්ධ පදනමක් මත, හානිකරණය වූ ණය (අදියර 3) අනුපාතය පෙර වසරේ 4.7% සිට 12.6% දක්වා වැඩි විය. ස්වාධීන පදනමක් මත, බැංකුවේ සංඛ්‍යා පිළිවෙලින් 12.8% සහ 4.0% විය. වත්මන් සන්දර්භය තුළ, බැංකුව රජයට සහ රජයට අයත් ආයතනවලට නිරාවරණය වීම අඩු කිරීම සහ අවදානම් ඉහළ කර්මාන්ත සහ ආයතන, සිය මුදල් ප්‍රවාහ මත පීඩනයට මුහුණපාන MSME සහ පුද්ගලයින් සඳහා ලබා දී ඇති ණය ආපසු අයකර ගැනීම සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙයි.

මෙහෙයුම් පිරිවැය

මුළු මෙහෙයුම් පිරිවැය 2021 දී පැවති රුපියල් බිලියන 50.5 සිට 2022 දී රුපියල් බිලියන 59.0 දක්වා 16.8%කින් වැඩි විය. මෙහෙයුම් පිරිවැයේ විශාලතම සංරචකය වන කාර්ය මණ්ඩල වියදම් මුළු මෙහෙයුම් පිරිවැයෙන් ආසන්න වශයෙන් 54.6% සඳහා දායක වී ඇත. 2021 වසර හා සසඳන විට 2022 වසරේ බැංකු මට්ටමින් කාර්ය මණ්ඩල පිරිවැය 16.8%ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වැඩිවීම මගින් මූලික වශයෙන් උද්ධමන පීඩනයන් සැලකිල්ලට ගනිමින් කාර්ය මණ්ඩලයට ලබා දිය යුතු වේතනයේ වැඩිවීම් පිළිබිඹු විය.

අනෙකුත් මෙහෙයුම් පිරිවැය 2021 දී පැවති රුපියල් බිලියන 22.8 සිට සමාලෝචිත වර්ෂය තුළ රුපියල් බිලියන 26.8 දක්වා 17.6%කින් වැඩි විය. සර්පිලාකාර උද්ධමනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ පිරිවැය පීඩනය හමුවේ, සමූහයේ පිරිවැයේ ආදායම් අනුපාතය – (මූල්‍ය සේවා මත ඒකතුතළ අගය මත බදු ඇතුළුව) පුළුල් ලෙස 53.0% මට්ටමට ආසන්නව පවත්වා ගෙන යන ලදී; බැංකු මට්ටමින් 2021 දී පැවති 51.5% සිට 2022 දී 50.4% දක්වා මධ්‍යස්ථ වර්ධනයක් දක්නට ලැබිණි. 2020දී 54.3%ට සාපේක්ෂව, විශේෂයෙන්ම ස්වයංක්‍රියකරණය සහ ඩිජිටල්කරණය හරහා එහි පිරිවැය කාර්යක්ෂමතාවය අබණ්ඩව වැඩිදියුණු කිරීමට බැංකුව දරන උත්සාහය මෙයින් පෙන්නුම් කෙරේ. මේ සම්බන්ධයෙන් තවමත් ක්‍රියාත්මක ප්‍රයත්නයන් සමඟ, එහි ඩිජිටල්කරණ ප්‍රයත්නයන්ගෙන් වැඩි ප්‍රමාණයක් උපකාර කරන ඵලදායිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම කෙරෙහි බැංකුව සිය අවධානය තීව්‍ර කරන බැවින්, කෙටිකාලීන සිට මධ්‍ය කාලීනව තවදුරටත් වැඩිදියුණු කිරීම් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.

ලාභදායිතාව

සමූහයේ බදු පෙර ලාභය 2021 දී පැවති රුපියල් බිලියන 37.2 සිට 2022 දී රුපියල් බිලියන 26.7 දක්වා 28.3%කින් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් ඉහත විස්තර කර ඇති පරිදි ශුද්ධ පොලී ආදායමේ හැකිලීම, හානිකරණ අයකිරීම් මෙහෙයුම් පිරිවැය වැඩිවීම හේතු විය හැක.

රාජ්‍ය භාණ්ඩාගාරයට දායකවීම

2022 වර්ෂය සඳහා රජය වෙත සමූහය ලබා දුන් දායකත්වය රුපියල් බිලියන 17.8ක් වූ අතර එය රුපියල් බිලියන 20.4ක් වූ 2021 සඳහා දායකත්වයට වඩා 13.1%ක අඩුවීමකි. මෙයට පෙර අදාළ 24% සිට 2022 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක 30% අදායම් බදු අනුපාතය වැඩිවීම හමුවේ අඩු ලාභදායිත්වය හේතුවෙන් ආදායම් බදු ප්‍රකාශය වෙත අයකිරීම අඩුවීම, ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අයකිරීම් සඳහා වෙන් කිරීම මත විලම්බිත බදු වත්කම්වල වැඩිවීම සහ 30%ක නව ආදායම් බදු අනුපාතයට විලම්බිත බද්දූ නැවත ගණනය කිරීම සිදුවිය.

මූල්‍ය ප්‍රධානීගේ විෂය පථය යටතේ ඉහළ දක්ෂතා සහිත විශේෂඥ කණ්ඩායමක් බැංකුවේ බදු කටයුතු කළමනාකරණය කරයි. මීට අමතරව, ආදායම් බදු වගකීම් ගණනය කිරීම, බදු වාර්තා ගොනු කිරීම සහ අදාළ පරිපාලන කාර්යයන් මෙහෙයවීම සඳහා බාහිර උපදේශකවරුවන්ගේ සේවය භාවිතා කර ඇත. අභ්‍යන්තර විගණනය, අනුකූලතා ඒකකය සහ බාහිර විගණකවරුන් විසින් දැඩි ලෙස නිරීක්ෂණය කිරීම අනුකූලතාව සහතික කරයි. බැංකුව බදු කාරණාවලදී ද සමාජ වගකීම් පිළිබඳ එහි මූලධර්ම අනුගමනය කරයි. බදු ඒකකයේ ප්‍රධානී නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අබණ්ඩව සම්බන්ධ වේ. වර්ෂය තුළ බදු නීති සහ අදාළ රෙගුලාසිවලට අනුකූල නොවීම් නොමැත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

තැන්පතු

තැන්පතු පදනම 2021 අවසානයේ දී රුපියල් බිලියන 2,168.7 සිට 2022 අවසානයේ දී රුපියල් බිලියන 2,450.1 දක්වා 13.0%කින් වර්ධනය වූ අවස්ථාවේදී තැම්පතු ඉහළ නැංවීමට බැංකුවේ උත්සාහය පැහැදිලිවම ප්‍රතිඵල ගෙන ආවේය. උද්ධමන පීඩනය හේතුවෙන් සිල්ලර පාරිභෝගික ගනුදෙනුකරුවන්ගේ බැහැරකළ හැකි ආදායමට දැඩි බලපෑමක් එල්ල වූ සහ කුඩා හා මධ්‍ය පරිමාණ අංශය සහ ආයතන දැඩි මුදල් ප්‍රවාහ බාධක අත්විඳිමින් සිටින පරිසරයක මෙම වැඩිවීම ඉතා ප්‍රශංසනීය ය. නිසැකව ම, පිරිනැමෙන ආකර්ෂණීය පොලී අනුපාත තැන්පතු වර්ධනයට දායක විය. තාක්ෂණය කෙරෙහි අපගේ අවධානය සහ ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ටත්වය සඳහා වූ උනන්දුව ද මෙම ප්‍රතිඵල සඳහා දායක විය. බැංකුවේ තැන්පතුවල සහ පුළුල් ශාඛා ජාලයේ ශක්තිය, එහි පුළුල් ගනුදෙනුකාර පදනම සහ එය වසර ගණනාවක් තිස්සේ ගොඩනගා ඇති ජනගහනයෙන් විශාල කොටසකගේ විශ්වාසය පිළිබිඹු කරමින් මුළු තැන්පතු අරමුදල් පදනමෙන් 79.8%ක් සඳහා දායක විය.

වසර තුළ ඉතා වැදගත් ජයග්‍රහණයක් වූයේ අපගේ අභ්‍යන්තර ප්‍රේෂණවල වෙළෙඳපොල කොටසෙහි ඉහළ යාමයි. විශේෂයෙන්ම "වාසි කෝටියායි" වැඩසටහනේ විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීමේ වෑයමේ සාර්ථකත්වය මින් පෙන්නුම් කරයි. අපගේ ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස දෙගුණ කිරීමට අපට හැකි වීම යන සාධකය මගින් මෙම ව්‍යාපාරයේ ප්‍රතිඵලය පැහැදිලි වේ. මෙය පංගම ගිණුම් ඉතුරුම් ගිණුම් අනුපාතයේ අඩුවීම නැවැත්වීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමද විශේෂත්වයකි.

	2022 රු.බි.	2021 රු.බි.	2020 රු.බි.	2019 රු.බි.	2018 රු.බි.
පංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් (CASA)	739	853	757	571	543
කාලීන තැන්පතු	1,707	1,310	1,172	1,012	943
වෙනත්	4	6	6	6	10
මුළු ගණන	2,450	2,169	1,935	1,589	1,495
පංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් (%) (CASA)	30.2	39.3	39.1	35.9	36.3
ව්‍යවහාර මුදල්					
දේශීය (%)	87.8	90.1	89.8	91.8	93.4
විදේශීය (%)	12.2	9.9	10.2	8.2	6.6
මුළු ගණන (%)	100.0	100.0	100.0	100.0	100.0

ණය සහ අත්තිකාරම්

සමාලෝචිත වර්ෂය තුළ ණය දීම සඳහා බොහෝ බාධාවන් තිබුණි. ද්‍රවශීලතා සීමාවන් සහ වෙනත් වඩා ලාභදායී අවස්ථා තිබුණත් ජාතික වැදගත්කමක් ඇති අංශවලට ණය ලබාදීමට ප්‍රමුඛත්වය දීමේ අවශ්‍යතාව මේවාට ඇතුළත් විය. තවද, ඉහළ පොලී අනුපාතවලට ණය දීමේදී සහ බොහෝ අංශවල හානිකරණ ඇතිවීමේ ඉහළ අවදානමක් ඇති විට ප්‍රවේශම් විය යුතු විය. දළ ණය සහ අත්තිකාරම් කළඹ 2022 දී රුපියල් බිලියන 2,103.6 සිට රුපියල් බිලියන 2,061.1 දක්වා 2.0%කින් සංකෝචනය විය.

	2022 රු.බි.	2021 රු.බි.	2020 රු.බි.	2019 රු.බි.	2018 රු.බි.
මුළු අත්තිකාරම් (දළ)	2,061	2,104	1,876	1,544	1,490
වර්ගය අනුව					
අයිරා	111	392	258	145	126
වෙළෙඳ මූල්‍ය	423	299	251	234	281
උකස් ණය	185	195	175	163	150
කාලීන ණය	1,166	1,092	1,073	880	808
ලැබියයුතු බදු වාරික	64	79	82	88	95
වෙනත්	113	47	38	34	30
මුළු ගණන	2,061	2,104	1,876	1,544	1,490

ණය සහ අත්තිකාරම් වර්ගය අනුව අයිරාවල තියුණු පහත වැටීමක් සහ වෙළෙඳ මූල්‍යවල සැලකිය යුතු වැඩිවීමක් අනාවරණය කරයි. දෙවැන්න අපනයන සඳහා ආධාර කිරීමට දෙන ලද ප්‍රමුඛතාවය පිළිබිඹු කරයි.

නුඹුන්වත්භාවය

අපගේ ප්‍රාග්ධන අනුපාත ශ්‍රී ලංකාවේ ක්‍රමාණුකූලව වැදගත් බැංකු අතරින් ඉහළම අගයක පැවතුණි. 2022 අවසානය වන විට, ඒකාබද්ධ ස්ථර 1 අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පිළිවෙලින් 13.3% සහ 17.2% (2021: 13.4% සහ 17.9%) අතර බැංකුව ස්වාධීන පදනම, එය පිළිවෙලින් 11.9% සහ 16.3% (2021: 12.6% සහ 17.8%)ක් විය. කිසිදු සැකයකින් තොරව, මේවා දැනට පවතින බාසල් III නීති සලකා බලනු ලැබූ බව අමුතුවෙන් කිව යුතු නැත. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත සුරක්ෂිත කර ගැනීමට අපව ශක්තිමත් කළ සාධකයක් වන්නේ 2017 ජූලි 1 දින සිට බාසල් III ආරම්භයේ සිට ගන්නා ලද අපගේ ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගය වන අතර, එයට වෙනත් කරුණු අතර අපගේ ඉපයීම් රඳවා ගැනීම්වල වර්ධනය සහ මහජන බැංකු පනතේ සංශෝධනය ඇතුළත් වන අතර මෙම සංශෝධනය මගින් බාසල් III අනුකූල ස්ථර 1 සහ ස්ථර 2 ණය උපකරණ නිකුත් කිරීම සඳහා අවසර දී ඇත. 2019 සැප්තැම්බර් 30 දින එම පනතේ සංශෝධනයේ සිට - බැංකුව රුපියල් බිලියන 35ක වටිනාකමට බාසල් III අනුකූල ස්ථර 1 සහ ස්ථාර 2 ණයකර සාර්ථකව නිකුත් කර ඇත. මෙවැනි සාර්ථකත්වයන් සඳහා වසර ගණනාවක් පුරා මෙම පෙරමුණ මත මහා භාණ්ඩාගාරය සහ මුදල් අමාත්‍යාංශය විසින් දෙන ලද සහය සහ සහයෝගයට ණය ගැති බව කිව යුතුය.

ද්‍රවශීලතාව


වසර තුළ හේතු කිහිපයක් නිසා ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම ප්‍රමුඛ වැදගත් කරුණක් බවට පත්විය. සාර්ව ආර්ථික වාතාවරණය විසින් ඇතිකළ අව්‍යාජ දුෂ්කරතා හේතු කොට ගෙන, සියලුම බැංකුකරණ ඒකකවල සේවා දායකයින්, ආයතන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් ඔවුන්ගේ ණය බැඳීම් ඉටු කිරීමේදී ඉහළ දුෂ්කරතාවන්ට මුහුණපාන ලදී. ඊට අමතරව, අන්තර් බැංකු වෙළෙඳපොල තුළ හිඟයක්ද පැවතුණි.

2022 අවසානයේදී, බැංකුවේ දේශීය බැංකුකරණ ඒකකය සහ විදේශීය බැංකුකරණ ඒකක තුළ එහි ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය 2021 අවසානයේදී පැවති 23.5%ට සහ 25.9%ට සාපේක්ෂව පිළිවෙලින් 21.4% සහ 20.1%ක් විය. මේ සම්බන්ධයෙන් අපගේ කාර්යසාධනය 20.0%ක නියාමන අවමය සමඟ හිතකර ආකාරයෙන් තුලනය වේ. අපගේ සියලුම ව්‍යවහාර මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2021 අවසානයේදී පැවති 105.7%ට සාපේක්ෂව 119.5%ක් වූ අතර එහි නියාමන අවමය 90.0%ක්ව පැවතුණි.

අනාගත දැක්ම

ප්‍රතිසාධන ක්‍රියාවලිය දීර්ඝ සහ දුෂ්කර එකක් වනු ඇති බවත් එය ඉදිරියට යන බොහෝ කොටස්වලට බාධා ඇති කරනු ඇති බව පැවසීම අනවශ්‍යය. ඉන් පවසන්නේ, ප්‍රතිසාධනය වීම සඳහා නිවැරදි මාවතක ගමන් කරන බව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ වෙනත් ද්විපාර්ශ්වික ආයතනවල මගපෙන්වීම් යටතේ මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ සිදු විය හැකි වෙනස්කම් සහ සිදුවී ඇති වෙනස්කම් - රටේ අනාගතය යහපත සඳහා හැඩගස්වනු ඇති බවට අපි සුබවාදීව සිටිමු.

අපි පරීක්ෂාකාරී සර්වශුභවාදය අපේක්ෂා කරමු.



අසාමී ඒ අහමට්
මූල්‍ය ප්‍රධානී
2023 මාර්තු 2

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

පාරිභෝගික බැංකුකරණය

ප්‍රධාන සිදුවීම්

රු.බි. 172 ක් වූ
උකස් ණය කළඹ

රු.බි. 450 ක
පාරිභෝගික ණය කළඹ

Elegance සහ **Excelsior** සංවෘත බැංකුකරණ සේවා පැකේජ

පැය 24ක් තුළ
පුද්ගල ණය පිරිසැකසුම්

මහජන බැංකුවේ පාරිභෝගික ණය අංශය පුද්ගලයින්, වෘත්තිකයින් සඳහා ඉතුරුම් සහ තැන්පතු යෝජනාක්‍රම, ණය යෝජනාක්‍රම මෙන්ම උකස් සේවා ඇතුළුව ජීවිතයේ සියලුම අවධිවල සිටින පුද්ගලයින් වෙත නිෂ්පාදන හා සේවා රාශියක් සපයයි. කොවිඩ්-19 වසංගතය, දේශීය සහ විදේශීය මුදල්වල ද්‍රවශීලතාව, උද්ධනමය, වැඩිවන මිලගණන් සහ පොලී අනුපාත බලපාන ලද අභියෝගාත්මක ආර්ථික වාතාවරණය හමුවේ, පාරිභෝගික බැංකුකරණ ඒකකය පාරිභෝගික තැන්පතු වැඩි කිරීමට මහත් අපේක්ෂාවෙන් දිවයින පුරා වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පාරිභෝගික තැන්පතු වර්ධනය ඉදිරියට ගෙන යාමට පෙරමුණ ගෙන ඇත.

ජාලය පුරා කණ්ඩායම් වැඩ පෝෂණය කිරීමට සහ ධනාත්මක තරඟකාරී සංස්කෘතියක් ඇති කිරීමට, මෙම අංශය විසින් කණ්ඩායම් අතර ප්‍රබෝධමත් පාඨ සහ අභිප්‍රේරණ පණිවිඩ හුවමාරුව, නිල චක්‍රලේඛ දෘශ්‍යමය වශයෙන් සිත් ඇදගන්නා සහ සහභාගිත්ව කාර්ය කාඩ්පත් බවට පරිවර්තනය කිරීම, ශාඛා කාර්යාල කාර්යසාධනය සමීපව අධීක්ෂණය කිරීම සහ නිල WhatsApp සමූහය තුළ වර්ණවත් සහ සිත් ඇදගන්නා දැන්වීම් තුළින් ප්‍රතිඵල නිවේදනය කිරීම ඇතුළත් වන නව්‍යකරණ උපායමාර්ගයක් ක්‍රියාත්මක කර ඇත. දෛනික ශ්‍රේණිගතකරණ වගු එක් එක් නිෂ්පාදන වර්ගය සඳහා එක් එක් ශ්‍රේණිවල ඉහළම ශාඛා 10 පෙන්වීම සඳහා සකස් කරන අතර මේ තුළින් කණ්ඩායම් වැඩ පෝෂණය කරන සහ දෛනික හා සතිපතා පදනමක් මත සිය පසුගිය කාර්යසාධනයන් ඉක්මවා යාමට ශාඛා කණ්ඩායම් අභිප්‍රේරණය කරන තරඟකාරී සංස්කෘතියන් නිර්මාණය කරයි. වසර තුළ මුහුණ දුන් අභියෝග හමුවේ, බැංකුව ධනාත්මක ප්‍රතිඵල ඇති කරමින් කණ්ඩායම් ගොඩ නැගීමට අද්විතීය අභිප්‍රේරණ තරඟ උපායමාර්ගයක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. බැංකුව ඉතුරුම් හා ජංගම ගිණුම් වර්ගීකරණය තුළ මෙන්ම බැංකු අංශය තුල මුළු තැන්පතු තුළ එහි වෙළෙඳපොල කොටසේ වර්ධනයක් සිදු කර ඇත. මෙවැනි යෝජනා ක්‍රමවල සාර්ථකත්වය බැංකුවේ අභිප්‍රේරණ මූලපිරීම්වලට ආරෝපනය කළ හැක. වසර පුරා, පාරිභෝගික බැංකුකරණ ඒකකය එක් එක් ප්‍රවර්ධන වැඩසටහන් සහ නිෂ්පාදන වර්ගීකරණය තුළ සුවිශේෂී කාර්යසාධනය පිළිගැනීමට සම්මාන උළෙල පවත්වනු ලබයි. මෙම උත්සවවලට විශිෂ්ටතම ශාඛාව සහ ඊට අදාළ වෙනත් වර්ගීකරණද ඇතුළත්ය.

මෙම අන්‍යෝන්‍ය වශයෙන් සිදුකරන අභිප්‍රේරණ කටයුතු සුවිශේෂී ප්‍රතිඵල ලබාගෙන ඇති අතර, අභියෝගාත්මක ආර්ථික වාරාවරණයන් තුළ වර්ධනය ඉදිරියට ගෙන යාමේදී ධනාත්මක සහ තරඟකාරී සංස්කෘතියක වැදගත්කම ඉස්මතු කර දක්වයි. පාරිභෝගික බැංකුකරණ ඒකකය එහි ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත සඳහා සේවය කිරීමට කැප වී සිටින අතර බැංකුවේ අරමුණ පරිදි කරන සේවය මෙම කාලසීමාව මුළුල්ලේ දැකගත හැකි විය. එමෙන්ම මෙම ක්ෂේත්‍රය නැවත ප්‍රාණවත් කිරීම සඳහා එහි උත්සාහයන් ප්‍රසංශනීය වේ.

නව විශේෂිත ගනුදෙනුකාර අංශ දෙකක් බැංකුව විසින් හඳුනා ගෙන ඇති අතර, මෙම සැම අංශයක් සඳහා සේවය සැලසීමට නව නිෂ්පාදන දියත් කර ඇත.

- **Elegance** – ශාඛා කළමනාකරුවන් විසින් සේවය කරනු ලබන ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පුද්ගලයින් සහ ඉහල වැටුප් උපයන්නන්
- **Excelsior** – දැනට පවත්නා ශාඛා කාර්ය මණ්ඩලයෙන් පත්කරනු ලබන Excelsior තානාපතිවරුන් විසින් සේවය සපයනු ලබන ඉහළ මධ්‍යම මට්ටමේ වැටුප් උපයන වෘත්තිකයින්.

මෙම කාණ්ඩ දෙකම, ඕනෑම ශාඛාවකදී සුවිශේෂ සේවය, විශේෂ අංග සහිත ගලපන ලද ණය සහ ණයපත්, සංචාරක රක්ෂණය, සහ ගුවන් තොටුපල ව්‍යාපාර අංශ කරා ප්‍රවේශය වැනි ප්‍රතිලාභ රාශියකට හිමිකම් ලබයි.

අනාගත දැක්ම

පෙර වසරේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් පැවැත්වීම, ප්‍රතිඵල ඇගයීම, උගත් පාඩම් පැහැදිලි කිරීම, නව මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාල සමඟ රැස්වීම් මාලාවක් පවත්වනු ලැබේ. 2023 සඳහා දැනටමත් සැලසුම් කර ඇති සිදුවීම් දින දර්ශනය සමඟ සාර්ථක කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණ කටයුතු නොනවත්වා කරගෙන යනු ඇත.

වර්තමාන ගනුදෙනුකාර අවශ්‍යතා මත පදනම්ව නව නිෂ්පාදන සංවර්ධනය කරනු ලබන අතර ගනුදෙනුකරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම සඳහා පවතින නිෂ්පාදන වෙනස් කරනු ලැබේ. ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීම සඳහා ප්‍රධාන අවධානයක් යොමු කරන අතර ගනුදෙනුකාර පිරිනැමීම වැඩිදියුණු කිරීම සඳහා සේවා මට්ටම් වැඩි කරනු ඇත. නව විශේෂිත අංශ මෙම මූලපිරීමේ කොටසකි.

ව්‍යවසාය බැංකුකරණය

වැදගත් සිදුවීම්



අඩු පිරිවැය මූල්‍යකරණයේ වටිනාකම **ඇ.ඩො.මි. 90 කි.**



පොලී ආදායම වර්ධනය **165% කි.**



4,000ට වඩා වැඩි නව ගනුදෙනුකරුවන්



බාහිර පාර්ශවයන් සමඟ **අවබෝධතා ගිවිසුම් තුනක්** අත්සන් කර ඇත.

ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ අවශ්‍යතා සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට සේවය කිරීමට කැප වී සිටියි. මෙම දෙපාර්තමේන්තුව අංශ හතරකින් සමන්විත වේ. එනම් වාණිජ ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ණය, ක්ෂුද්‍ර මූල්‍ය හා සංවර්ධන බැංකුකරණය සහ අළුතින් ස්ථාපිත ව්‍යාපාර පුනරුත්ථාපන සහ ව්‍යාපෘති ඒකකය වේ.

වසර තුළ, දෙපාර්තමේන්තුව පවත්නා ආර්ථික තත්ත්වයන් විසින් බරපතල ලෙස පීඩාවට පත් වූ සහ වසරේ දෙවන අර්ධයේදී සැලකිය යුතු ලෙස වර්ධනය වූ ව්‍යාපාරවලට සහයවිමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. කෙසේවෙතත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය විදුලි සහ ඉන්ධන හිඟය, මිල ඉහළයාම්, සහ ඉහළ යන පොලී අනුපාත හේතුවෙන් 2022 දී තවදුරටත් අභියෝගවලට මුහුණපාන ලදී. ඊට අමතරව, විදේශ විනිමය සීමා කිරීම් සමහර කර්මාන්ත ක්‍රියාත්මක විම දුෂ්කර කළ අතර මහ බැංකුව සමහර අංශවලට සහයවීම සඳහා විලම්භන කාලසීමා නිකුත් කරන ලදී.

අපගේ දෙපාර්තමේන්තුවේ පළමු ප්‍රමුඛතාව වූයේ ආසන්න ආර්ථික පීඩනයන් කළමනාකරණ කිරීමේදී, ඔවුන්ගේ ව්‍යාපාර යථා තත්ත්වයට පත්කර ගැනීමේ දී සහ අනාගත වර්ධනය සකස් කිරීමේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය ලබාදීමයි. අපගේ දෙවන ප්‍රමුඛතාව වූයේ අපනයන කර්මාන්තවල වර්ධනයට අපගේ දායකත්වය ඉහළ නැංවීමයි.

මෙම පරමාර්ථ අත්කර ගැනීම සඳහා, පීඩාවට පත් උපායමාර්ගිකව සැලකියයුතු අංශවලට කාරක ප්‍රාග්ධනය ඇතුළත් කිරීමෙන් යලි ගොඩ නැගීමට සහ ආරක්ෂා වීමට විවිධ වැඩසටහන් අපි ක්‍රියාත්මක කළෙමු. අපගේ ව්‍යාපාර පුනරුත්ථාපන සහ ව්‍යාපෘති ඒකකය පීඩාවට පත් ව්‍යවසායන් වෙත ඔවුන්ගේ මූල්‍ය පහසුකම් ප්‍රතිව්‍යුහගතකරණයට සහ ඔවුන්ගේ ව්‍යාපාර උපායමාර්ග යලි සකස් කර ගැනීම සඳහා උපදෙස් සහ මූල්‍ය සහය ලබා දී ඇත. අපගේ අවධානය වූයේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීම, ඔවුන්ගේ ව්‍යාපාර පුනරුත්ථාපනය සහ ඔවුන්ගේ ණය පැහැර හැරීමෙන් ඔවුන් වැලැක්වීම කෙරෙහි විය.

බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විලම්භන කාලසීමාද ඉක්මවා යමින්, සේවාදායකයින්ට සිය සහන පැකේජ් ලබාදෙන ලදී. අපගේ වාණිජ, කුඩා හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ගනුදෙනුකරුවන් විසින් සිදුකළ ණය කොන්දේසි වෙනස්කිරීම් සහ නැවත ගෙවීමේ සැලසුම් සඳහාවන ඉල්ලීම්වලින් බහුතරයකට ඒවා ලබාදීමට අපට හැකි වූ අතර සමහරුන්ට විශේෂයෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අමතර අරමුදල් ලබාදෙන ලදී.

චීනයේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් සෘජුවම ලබාගත් ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 90ක් වටිනා අඩු පිරිවැය මූල්‍යකරණය මෙවැනි පීඩාවට පත් ව්‍යාපාර යලි ගොඩ නැගීමට 5% සිට 5.5% අතර ඉතා අඩු පොළී අනුපාතයකට බෙදා දෙන ලදී. මෙම අරමුදල් නිරන්තරව පොළි අනුපාත අධික කාලයක් තුළදී ඔවුන්ගේ මුදල් ප්‍රවාහ වර්ධනය කිරීමට ලබා දුන් අතර ඒවා ස්ථර ලෙස කාරක ප්‍රාග්ධනය යෙදීමට භාවිතා කරන ලදී. නිත්‍ය ගනුදෙනුකරුවන්ට අමතරව, දැරියහැකි මූල්‍යකරණයට ප්‍රවේශය නොතිබූ බොහෝ ව්‍යාපාර බැංකුවේ නව ගනුදෙනුකරුවන් බවට පත් වූ බැවින් මෙම ව්‍යායාමය තුළින් එහි ගනුදෙනුකාර පදනම වැඩි කර ගැනීමට බැංකුවට හැකි විය. මූල්‍ය සහයට අමතරව, බැංකුවේ ප්‍රාදේශීය ණය ඒකක ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කරමින් ව්‍යාපාර උපායමාර්ග, ඔවුන්ගේ වත්කම් ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ උපදෙස් ලබාදුන් අතර ඔවුන්ගේ යලි ගොඩනැගීම මෙහෙයවන ලදී. මෙහිදී, ඔවුන්ගේ මුදල් ප්‍රවාහ සහ නැවත ගොඩනැගීමේ හැකියාව මත රුඳෙමින් යම් අරමුදල් ප්‍රමාණයක් ලබාදෙන ලදී. අපගේ දිවයිනපුරා ශාඛා කළමනාකරුවන්ගේ ජාලය සහ එම කලාපවල විවිධ කර්මාන්තවල ප්‍රවීනයින් ගනුදෙනුකරුවන්ගේ කාර්යසාධනය සමීපව නියාමනය කරමින් අවශ්‍ය අවස්ථාවලදී මඟපෙන්වීම් ලබා දෙන ලදී.

වසර තුළ කෘෂිකාර්මික අංශය යම් අභියෝගවලට මුහුණ දුන් බව බැංකුව පිළිගන්නා අතර මෙම අංශයට සහයවීම සඳහා මහ බැංකුව සමඟ සම්බන්ධ වී වැඩසටහන් දෙකක් ආරම්භ කරන ලදී. ඒවානම්:

- දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය (මහ බැංකුව විසින් අරමුදල් සපයන ලද): සැපයුම් දාම මූල්‍යකරණය පහසු කිරීම සඳහා නියමු ව්‍යාපෘතියකි. බැංකුව ආසන්න වශයෙන් රුපියල් මිලියන 150ක් සමඟ ගනුදෙනුකරුවන් 120කට වැඩි පිරිසකට සහයවිය.
- කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව ණය යෝජනා ක්‍රමය: මෙම වැඩසටහන යටතේ, බැංකුව රුපියල් මිලියන 500ක් සමඟ ගනුදෙනුකරුවන් 1000කට වැඩි පිරිසකට පහසුකම් සලසා ඇත.

පීපල්ස් ස්පාක් වැඩසටහන මෑත කාලීන උපාධිධාරීන්ට ඔවුන්ගේ උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු ව්‍යවසායත්ව ව්‍යාපාර ආරම්භ කිරීමට ඔවුන්ට අවශ්‍ය දක්ෂතා සහ සම්පත් ඔවුන් වෙත ලබාදීමට නිර්මාණය කළ නවෝත්පාදන මුලපිරීමකි. විශාල අයදුම්කරුවන් ප්‍රමාණයකින්, අපි අපේක්ෂකයන් 45ක් තෝරාගත් අතර ඔවුන්ට කොළඹ විශ්ව විද්‍යාලයේදි පළපුරුදු උපදේශක මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලැබූ පුහුණුවක් ලබා දෙන ලදී. පුහුණුව අවසන් කිරීමෙන් පසු, ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට ඔවුන් වෙත ණය ලබාදෙන අතර අපගේ ප්‍රාදේශීය ණය ඒකක විසින් දැනට ඒවාට සහයවෙමින් අධීක්ෂණය කරනු ලැබේ. විශ්ව විද්‍යාල උපාධිධාරීන් අතර රජයේ රැකියා සඳහා සීමිත අවස්ථා පිරිනමන මෙවැනි වාතාවරණයක් තුළ මෙම වැඩසටහන විශේෂයෙන් වැදගත් වේ. පවත්නා ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සමස්ත ණයදීම සීමා කරනු ලැබුවත්, සමහර උපායමාර්ගිකව වැදගත් වර්ගීකරණයන් වෙත අරමුදල් ලබාදෙන ලදී.

විදේශ විනිමය හිඟ බැවින්, සහ බලශක්ති, ඉන්ධන සහ පොහොර සැපයීම් සඳහා රාජ්‍ය ව්‍යවසායවල (ලංවිම, සී/ස ලංකා කෝල් (පුද්) සමාගම, ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව, සහ සීමාසහිත ලංකා පොහොර සමාගම) අවශ්‍යතා ප්‍රමුඛ කිරීමට බැංකුවට සිදුවිය. ඉතිරිව ඇති අරමුදල් අවස්ථානුකූල පදනමක් මත අපගේ ගනුදෙනුකරුවන් අතර බෙදා දෙන ලදී. මෙම වෙන්කිරීම සඳහා අපනයන, ඖෂධ, සහ ආහාරපාන යන අංශවලට ප්‍රමුඛතාව ලබා දුන්හ. මෙම අවස්ථාවේ වර්ධනයට වඩා ස්ථාවරත්වය කෙරෙහි අවධානය යොමු කළ අතර වසර තුළ මුහුණ දෙන ලද අභියෝග හමුවේ, අපි මාර්ගෝපදේශ වලට ගරුකරමින් රැඳී සිටි අතර දෙපාර්තමේන්තුවේ ඉලක්ක සාර්ථකව අත්කර ගන්නා ලදී.

කාර්යසාධන වැදගත් සිදුවීම්

	ලබාදුන් ණය 2022	
	ණය සංඛ්‍යාව	ප්‍රමාණය රු.මි.
ප්‍රතිමූල්‍ය සහිත ණය යෝජනා ක්‍රම – කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය	936	6,066
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය – මහජන බැංකු අරමුදල් යටතේ	568	1,132
ප්‍රතිමූල්‍ය සහිත ණය යෝජනා ක්‍රම – D & MF	494	617
D & MF ණය – මහජන බැංකු අරමුදල් යටතේ	5,152	1,696
ප්‍රතිමූල්‍ය සහිත ණය යෝජනා ක්‍රම – CC	247	1,775
වාණිජ ණය – මහජන බැංකු අරමුදල් යටතේ	1,828	16,995
මුළු ගණන	9,225	28,280

නව ගනුදෙනුකරුවන් 4000ට වඩා වසර තුළ අත්කරගත් අතර එය අයවැයගත ප්‍රමාණයට වඩා 211%ක් ඉහළය. 2022 දී බාහිර පාර්ශව සමඟ අවබෝධතා ගිවිසුම් තුනක් අත්සන් කරන ලදී. පොළී අදායම ක්ෂේත්‍ර අතර වැඩි වූ පොළී අනුපාත හේතුවෙන් 165%කින් වැඩි විය. අයවැයගත අත්තිකරම්වලින් 90%ක් පමණ ලබාදුන් අතර අක්‍රීය ණය වටිනාකම අයවැයට පහළ අගයක් ගත් අතර ඉන් ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුවේ දැඩි නියාමනය සහ පාලනය පිළිබිඹු වේ.

අනාගත දැක්ම

ව්‍යවසාය බැංකුකරණය සඳහා අනාගත දැක්ම ගෝලීය ආර්ථික වාතාවරණය තුළ මහත් අපේක්ෂාවෙන් බාරගන්නා වර්ධනයක් ලෙස පෙනී යයි. පුද්ගල සහ නිවාස ණය අඩු වී ඇති අතර, කුඩා ව්‍යාපාර වසර අවසානයේදී යථා තත්ත්වයට පත් වීමේ සංඥා පෙන්වා ඇත.

විදේශ විනිමය ඉපයීම් වැඩි කිරීම සඳහා, විදේශීය ගැනුම්කරුවන් සමඟ දේශීය විකුණුම්කරුවන්ගේ සම්බන්ධතා ඇති කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ හවුල්කාරත්වයෙන් රටපුරා අපනයන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට සහ ලාභදායී සහ කාර්යක්ෂම වෙළඳාම ශක්තිමත් කිරීමට අපි අරමුණු කරමු.

බැංකුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය නව විදේශීය වෙළෙඳපොලට පිවිසීමේදී කුඩා නිෂ්පාදකයින්ට සහය ලබා දේ. තේ, පොල්, ගම්මිරිස් සහ වෙනත් කුළුබඩු වැනි අගය එකතුකළ අපනයන සහිත අපනයන අංශය තුළ නව ගනුදෙනුකරුවන්ට සහයවීමේදී අපි ප්‍රමුඛතාව දක්වමු. අපි ගනුදෙනුකරුවන් සමඟ නිරන්තරව සම්බන්ධ වන අතර ව්‍යාපාර සැලසුම් කිරීම, මාර්ගගත සහ ඩිජිටල් අලෙවිකරණය, සහ ඔවුන්ගේ දැනුම සහ හැකියා වර්ධනය කිරීමේ වෙනත් කුසලතා පිළිබඳ අධ්‍යාපනයද ලබා දෙන්නෙමු.

හරිතාගාර, බහු උමං පද්ධති, ඉසිනය සහ බිංදු ජල සම්පාදන පද්ධති භාවිතා කරමින් පාලිත පාරිසරික කෘෂිකර්මය වැනි උසස් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට බැංකුව සැලසුම් කරයි. මෙය ඉඩම්, ජලය සහ පොහොර භාවිතය ප්‍රශස්ථ කරන අතර, ඉහළ අපනයන හැකියාවන් සහිත නම් කරන ලද පළතුරු සහ එලවළු අස්වැන්න වැඩි කරනු ඇත.

අනාගතය දෙස බැලිමේදී, බැංකුව හරිත සහ නීල මුල්‍යකරණය (Green and Blue Financing) ගවේෂනය කිරීමට අපේක්ෂා කරයි. අරමුදල් මාර්ගයක් සඳහා බහු පාර්ශවික සහ ප්‍රාදේශීය බැංකු සමඟ අපි දැනට සාකච්ඡා පවත්වමින් සිටින අතර, මේ තුළින් හරිත ව්‍යාපෘති ඇගයීමට සහ ඒවාට ණයදීමට දේශීය කණ්ඩායම් පුහුණු කරනු ඇත. එමෙන්ම අපි හරිත මූල්‍ය ණය යෝජනා ක්‍රම සංවර්ධනය කර ඇති අතර, හරිත බැඳුම්කර නිකුත් කරන්නෙමු. නුදුරු අනාගතයේදී අපගේ පාරිසරික සහ සමාජීය පාලන (ESG) මාර්ගෝපදේශ සඳහා තවදුරටත් අපි නීල මූල්‍යකරණය පුළුල් කරන්නෙමු.

බැංකුව ශ්‍රී ලංකාව පුරා සියලුම විවිධ සේවා සමූපාකාර සමිති (MPCS) සහ ග්‍රාමීය බැංකු සමඟ එහි හවුල්කාරත්වය අඟය කරන අතර අනෝන්‍ය ප්‍රතිලාභය සඳහා මෙම සම්බන්ධතාව නැවුම් කිරීමට උත්සාහ ගනිමින් සිටී. ක්ෂුද්‍ර ව්‍යවසාය නගා සිටුවීම සඳහා "එක ගමක් එක නිෂ්පාදනයක්" ක්ෂුද්‍ර මූල්‍ය ආදර්ශය පාඨය අපි නැවත දියත් කරන්නෙමු. අපගේ ශාඛා කලමනාකරුවන් මෙවැනි ව්‍යවසාය සඳහා ඔවුන්ගේ මූල්‍ය විනය වර්ධනය කරමින් මුදල් ලබාදීමට අඩු පොලී ණය යෝජනා ක්‍රම සැපයීමට ශක්තිමත් කර ඇත.

අපගේ ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේ ඉදිරි වසර තුළ 25%ක ණය වර්ධනයක් අත් කර ගැනීමයි. පාරිභෝගික ගනුදෙනුකරුවන් අඩුවෙන් වියදම් කරන බැවින්, ඉදිරි මාසවල වර්ධනය ඇති කිරීමට අප ව්‍යාපාර අංශය දෙස බලන්නෙමු. අපි සංවර්ධනය කර ඇති උපායමාර්ග සහ සැලසුම් සමඟ, මෙම ඉලක්කය සපුරාලීමට අරමුණ කරන අතර දෙපාර්තමේන්තුවේ අරමුණ සඳහා අපගේ බැඳීම පවත්වා ගන්නෙමු.

ආයතනික බැංකුකරණය

▶ ප්‍රධාන සිදුවීම්



අපනයන හා ආනයන ආදේශකවලට **ප්‍රමුඛතාව ලබාදීම.**



මෙහෙයුම් ආදායම **141%කින්** වර්ධනය විය.



රාජ්‍ය ව්‍යවසාය වෙත සහය වීම වෙනුවෙන් කැපවීම.



BOI සහ EDB සමඟ **හවුල්කාරත්වය**

ආයතනික බැංකුකරණ ඒකකය ජාතියට අත්‍යවශ්‍ය සේවාවන් ලබාදෙන සහ පුද්ගලයින් දහස් ගණනකට රැකියා සපයන රාජ්‍ය ව්‍යවසාය, කොන්ත්‍රාත්කරුවන්, නිෂ්පාදකයින්, අපනයනකරුවන් සහ ආනයනකරුවන් ඇතුළත් සේවාදායකයින්ගේ තනිපුද්ගල අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කළ නිෂ්පාදන හා සේවා රාශියක් පිරිනමමින් ව්‍යාපාර අංශයට සේවය සැලසීම විශේෂත්වයකි. එබැවින්, ආයතනික බැංකුකරණ ඒකකය ජාතික ආර්ථිකයේ වර්ධනය සහ සංවර්ධනය තහවුරු කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

රටපුරා පශ්චාත් වසංගත ප්‍රතිසාධන ප්‍රයත්නයන්ගේ අභියෝගවලින් පසු ආයතනික ගනුදෙනුකරුවන් දේශපාලන අස්ථාවරත්වය, ආර්ථික අවිනිශ්චිතතා, ඉහළ උද්ධමනය, ගෝලීය ඉල්ලුමේ බිඳවැටීම, සහ ලෝක ව්‍යාප්ත මූල්‍ය අර්බුදය වැනි අතිරේක පසුබෑම් කිහිපයකට මුහුණ දී ඇත. මෙම සියලුම සාධක ආර්ථිකයේ සියලුම අංශවලට පීඩාකිරීමට මෙන්ම ව්‍යාපාර අඛණ්ඩතාව බරපතල ලෙස බිඳ දැමීමට ඒකාබද්ධ වී ඇත. මෙම පසුබෑම සංචාරක ක්ෂේත්‍රයේ සැලකියයුතු පහතවැටීමක් ඇතුළුව ආධාරක කර්මාන්ත කෙරෙහි වක්‍රාකාර බලපෑමක් ඇති කර ඇත. තවද, විදේශයන්හි ශ්‍රී ලාංකිකයින් ප්‍රේෂණ සඳහා වඩා ඉහළ පරිවර්තන අනුපාත පිරිනමන අවිධිමත් පුද්ගලයින් සඳහා පැහැදිලි කැමැත්තක් පෙන්නුම් කිරීමත් සමඟ, විදේශ විනිමය අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව සහ සමස්තයක් වශයෙන් රටම දරුණු විදේශ විනිමය ද්‍රවශීලතා හිඟ තත්ත්වයකට මුහුණ දී ඇත.

රටේ සමස්ථ ආර්ථික ඉලක්ක හා පෙළ ගැසීමට අපගේ මූලික උපායමාර්ග සහ කාර්යසාධනය සංවර්ධනය කර ඇත. මෙම උපායමාර්ගවලට පහත දෑ සම්බන්ධ වේ:

- හිඟ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමට අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම.
- අපනයන සහ ආනයන ආදේශක අංශය ප්‍රමුඛත්වය දීම.
- විදේශ විනිමය සහ ඉහළ පරිමාවේ රුපියල් තැන්පතු දිරිමත් කිරීම.
- ආමුඛ ප්‍රේෂණ පරමා වැඩි කිරීම.
- පුද්ගලික අංශයේ ප්‍රමුඛතා තත්ත්වය සහ රාජ්‍ය ව්‍යවසාය අංශයට ඇති ඉහළ නිරාවරණය පියවීමේ ශක්‍යතාවය මත පදනම්ව තෝරාගත් කාණ්ඩවල වර්ධනය ප්‍රවර්ධනය කිරීම.

රාජ්‍ය බැංකුවක් ලෙස, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, සී/ස ලංකා කෝල් (පුද්) සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ලංකා පොහොර සමාගම වැනි ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) සහයවීම සඳහා පෙර පවත්නා බැඳීම්වලට ප්‍රමුඛතාවය දී ගරු කිරීමට අපට සිදු වී ඇත. ඊට අමතරව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ වෙනත් මහා පරිමාණ මූලපිරීම් වැනි ආයතන සඳහා යටිතල පහසුකම් ව්‍යාපෘති හා සම්බන්ධ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ට ශේෂ පත්‍රයෙන් පරිහාහිර පහසුකම් (Off-balance sheet facilities) අපි ලබා දී ඇත. කෙසේවෙතත්, මෙම අඛණ්ඩ සහය අපගේ විදේශ සංචිත කෙරෙහි සැලකියයුතු පීඩනයක් ඇති කළ අතර, රටේ අත්‍යවශ්‍ය අවශ්‍යතා මත පදනම් වී සම්පත් පැවරීමට උපායමාර්ගික තීරණ අපි ගෙන ඇත. වෙනස්වන වාතාවරණය සහ මතුවන අභියෝග හේතුවෙන්, අපගේ ආනයන මෙහෙයුම් උපායමාර්ග නැවත සලකා බැලීමේ අවශ්‍යතාව සහ තීරණාත්මක ගැටළු ජය ගැනීමට නව ප්‍රවේශ යොදා ගැනීමේ අවශ්‍යතාව අපි හඳුනා ගනිමු.

භාණ්ඩ වර්ගීකරණ කිහිපයක් මත රජයේ ආනයන සීමා කිරීම් පැනවීම, ණය වර්ධනය මත සංරෝධක බලපෑමක් සිදු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ආනයන ගනුදෙනුකරුවන්ගේ සිට අපනයනකරුවන් සහ ආනයන ආදේශක නිෂ්පාදකයින් දක්වා අපගේ අවධානය නැවත සකස් කිරීමට අපට සිදු විය. රාජ්‍ය ව්‍යවසාය වෙත සහයවීමට අමතරව, කෘෂිකාර්මික, නිෂ්පාදන අංශය, තොරතුරු තාක්ෂණ, සහ අත්‍යවශ්‍ය උපකරණ සහ ඖෂධ ආනයනය ඇති කරමින් සෞඛ්‍ය වැනි අත්‍යවශ්‍ය අංශවල ගනුදෙනුකරුවන්ට අපි සහයෝගය ලබාදෙන ලදී.

අපගේ කළඹ රාජ්‍ය ව්‍යවසාය අංශය වෙත බොහෝ සෙයින් බර තබා ඇති අතර, එය අපගේ නිරාවරණයෙන් ආසන්න වශයෙන් 70% ක් පමණ වන අතර සංචාරක හා පුද්ගලික අංශ වෙත 25%-30% ක් පමණ වෙන්කර ඇත. මෙම වසර තුළ, අපි තොරතුරු තාක්ෂණ වැනි ප්‍රමුඛ ක්ෂේත්‍රයන් තුළ අරමුදල් වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් සමඟ අපනයන අරමුණු කළ පුද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් සොයා යමින් මෙම අසමානතාව අඩු කිරීමට අපි උත්සාහ දරමු.

මෙම කේන්ද්‍රීය විතැන්වීම හමුවේ, ආයතනික බැංකුකරණ අංශය විදේශ විනිමය ද්‍රවශීලතාව මත ගෝලීය වසංගතයේ බලපෑම මෙන්ම පාස්කු ඉරිදා ප්‍රහාර සහ අඛණ්ඩ දේශපාලන ආරාවුල ඇතුළුව වසර තුළ අභියෝග ගණනාවකට මුහුණ දෙන ලදී. තවද, අපගේ බැංකුව රටේ වෙනත් වාණිජ බැංකුවලට සාපේක්ෂව ගනුදෙනුකරුවන්ගේ පරිමාව සහ ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව අනුව ඉහළම විලම්භන කාලසීමා පහසුකම් ගණනාවක් ලබා දී ඇත.

පොළී අනුපාතවල වැඩිවීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘණාත්මක බලපෑමක් එකතු කර ඇති අතර, එය බදු පෙර ලාභයේ 97%ක පහළ වැටීමකට හේතු විය. දෙපාර්තමේන්තුව පසුගිය වසරට සාපේක්ෂව 141%ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රු.බි. 31.9ක මෙහෙයුම් ආදායමක් වාර්තා කරනු ලැබුවද, අක්‍රිය ණය සහ අත්තිකාරම් 1%කින් ඉහළ ගොස් ආයතනික බැංකුකරණ අංශය විසින් ලබාදුන් මුළු ණය සහ අත්තිකාරම් වලින් 6%ට ළඟාවී ඇත.

අපගේ සම්ප්‍රදායික කාර්යභාරය ඉක්මවා කටයුතු කරමින්, අනාගත විදේශීය ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධතා ස්ථාපිත කිරීමේදී දේශීය නිෂ්පාදකයින්ට පහසුකම් ඇති කිරීමට සහ අපනයන සඳහා අවස්ථා නිර්මාණය කිරීමට ආයෝජන මණ්ඩලය (BOI) සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ අපි හවුල් වූයෙමු. මෙවැනි උත්සාහයන්ගේ ප්‍රතිඵල දිගුකාලීනව දැකිය හැකි වුවත්, අපි මෙවැනි අවස්ථාවන් පසු විපරම් කරන්නෙමු. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් අපගේ ගනුදෙනුකරුවන් වෙත ක්‍රියාපටිපාටි, රෙගුලාසි, නැවිගත කිරීමේ වැඩපිළිවෙල, සහ අවශ්‍ය අවස්ථාවල සම්බන්ධීකරණය වැනි අත්‍යවශ්‍ය තොරතුරු ලබා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවට වෙනත් බැංකු සමඟ මෙයට පෙර කටයුතු කළ නව අපනයන ගනුදෙනුකරුවන් කිහිප දෙනෙක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත.

හුවමාරු අනුපාතවල වැඩිවීම සහ ආනයන සීමා කිරීම් ආනයනය කළ භාණ්ඩ සහ අමු ද්‍රව්‍යවල මිල ඉහළ යාමට හේතු වූ අතර, එය ව්‍යාපාර අඛණ්ඩතාව සහ ලාභය කෙරෙහි සෘණාත්මකව බලපාන ලදී. ගනුදෙනුකරුවන් අක්‍රීය ණයකරුවන් ගණයට මාරු වීම වැලැක්වීම පිණිස, අපි ඔවුන්ගේ ව්‍යාපාර පරීක්ෂාකාරීව නියාමනය කළ අතර, හැකි අවස්ථාවලදී වෘත්තීය උපදෙස් පිරි නමා ඇත. මහ බැංකුව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සහයවීමට විලම්භන කාලසීමා මෙන්ම අනුග්‍රහක කාල සහ පහසුකම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම, අපගේම ඇගයීම මත පදනම් වී අවදානම තුළ සිටින ගනුදෙනුකරුවන්ට තවදුරටත් ප්‍රතිලාභ සහ දීර්ඝ කිරීම් ද ලබා දී ඇත. අපගේ මූලික අවධානය වූයේ වත්මන් දුෂ්කරතා හමුවේ වුවද දිගුකාලීනව වර්ධනය වියහැකි හිතකර ව්‍යාපාර සහිත ගනුදෙනුකරුවන් රඳවා ගැනීමයි.

අපි ප්‍රේෂණ, ණයවර ලිපි විවෘත කිරීම, සහ වැටුප් ගෙවීම් කළමනාකරණය වැනි නිරන්තර බැංකුකරණ කාර්යයන් කරගෙන යාමට හැකියාව ඇති කරන ඩිජිටල් අවකාශ භාවිතා කරමින් නව ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම මගින් අපගේ සේවා පිරිනැමීම් පුළුල් කර ඇත. තවද, අපගේ තොරතුරු තාක්ෂණ අංශය තුළින් මුදල් කළමනාකරණය සහ වට්නාකම් දාම කළමනාකරණය අපි පිරිනමන අතර එය අතිරේක ආදායම් උත්පාදනය කරයි. අභියෝග හමුවේ, ආයතනික බැංකු කළඹ පොළි සහ ගාස්තු ආදායම් වැඩි කර ගනිමින් පවත්වා ගෙන ඇත.

කාර්යසාධන වැදගත් සිදුවීම්

	2022	2021	2020
ශුද්ධ ආදායම (රු.මි.)	32,618	13,223	13,565
ශුද්ධ බදු පෙර ලාභය (රු.මි.)	4,189	5,399	6,142

ව්‍යවහාර මුදල් අනුව ආයතනික බැංකුකරණ අත්තිකාරම් සහ තැන්පතු

	2022		2021		2020	
	රු.	විදේශ විනිමය	රු.	විදේශ විනිමය	රු.	විදේශ විනිමය
අත්තිකාරම් (රු.මි.)	392,670	477,777	322,352	367,818	330,433	365,738
තැන්පතු (රු.මි.)	43,888	68,676	69,968	84,894	72,437	85,814

අනාගත දැක්ම

ඉදිරි වසර අභියෝගාත්මක වන නමුත් අරමුණු වන්නේ ගනුදෙනුකරුවන්ගේ කළඹ අඛණ්ඩව පවත්වාගෙන වර්ධනය කිරීම වන අතරම අපගේ අවධානය නව අවස්ථා කෙරෙහි විතැන් කිරීමයි. මූලිකවම, අපි අපනයන අරමුණු කළ නිෂ්පාදන සහ සේවා කෙරෙහි යොමු වන අතර ආයෝජන මණ්ඩලය (BOI) සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) යේ ප්‍රවීනතාව හුවමාරු කර ගනිමින් සහය සහ උපදේශන සේවය ලබා දේ. ඒ සමඟම, අපි අපනයන ගනුදෙනුකරුවන්ට වර්ධනය වීම සඳහා අවස්ථා නිර්මාණය කරමින් අපනයන ප්‍රේෂණ රට තුළට කාර්යක්ෂමව ප්‍රේෂණය කිරීම සහතික කිරීමට පසු විපරම් කරන අතර ඒ තුළින් අපගේ ආර්ථිකය සම්පූර්ණ ප්‍රතිලාභ ප්‍රතිඵල වශයෙන් ලබා ගනු ඇත.

බැංකුව හරහා පැමිණෙන සහ ඒ තුළින් මාරු කරන විදේශීය සෘජු ආයෝජන නියාමනය කරමින් වරාය නගර කොමිෂන් සභාව සමඟ අපි හවුල්කාරිත්වයට එළඹුනෙමු. සැලසුම් කරමින් ආරම්භ කරන ලද නමුත් පසුගිය වසරේ ආර්ථික බිඳවැටීම් හේතුවෙන් ප්‍රගතියක් නොමැති තාක්ෂණික උද්‍යාන (IT Parks) නැවත ආරම්භ කර අවසන් කරනු ලබන අතර, එය විදේශ විනිමය ඉපයීමට වැඩි අවස්ථා සලසනු ඇත.

සමස්ථයක් ලෙස, ඉන්දීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඥාව සහ 2023 වසරේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුදල් මත පදනම් වූ සුභවාදී බවක් පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පහසුකම්න් පසු, එය අනුගමනය කරමින්, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි වෙනත් ආයතනද වැඩිදුරටත් මූල්‍ය සහයෝගය සැපයීම සඳහා ණය මාර්ග විවෘත කරනු ඇතැයි අප අපේක්ෂා කරන අතර, එය රටෙහි ආර්ථිකය වර්ධන අවධියකට ඔසවා තබනු ඇත.

භාණ්ඩාගාරය

ප්‍රධාන සිදුවීම්



බැංකුවේ ස්කන්ධ කළඹ **30%ට වැඩි ප්‍රතිලාභ** අත්කරගෙන ඇත.

භාණ්ඩාගාර ඒකකය වත්කම් හා වගකීම් තුළනය කිරීම, ප්‍රමාණවත් ද්‍රවශීලතාව සහතික කිරීම, විදේශ විනිමය ගනුදෙනු කළමනාකරණය කිරීම, සහ බැංකුවේ සමස්ත ලාභදායීතාව පාලනය ඇතුළුව ප්‍රධාන කාර්යයන් කිහිපයක් ඉටු කරයි. මෙම විශේෂිත ඒකකය අරමුදල් ගලාඒම් සහ පරිපාලනය මෙන්ම ද්‍රවශීලතාව සහ බැංකුවේ ආයෝජන හා බැඳුණු අවදානම් කළමනාකරණයද කරයි. තවද, 2012 දී ස්ථාපිත ආයෝජන බැංකුකරණ ඒකකය (IBU) එහි ආයෝජන බැංකුකරණ කටයුතු තුළින් භාණ්ඩාගාරයේ මෙහෙයුම්වලට අමතර සහය ලබා දේ. ආයෝජන බැංකුකරණ ඒකකය (IBU) බැංකුවේ ලැයිස්තුගත කොටස් සහ ආයතනික ණය කළඹ කළමනාකරණය සඳහා සහ සේවාදායකයින්ට සිය ප්‍රාථමික නිකුතු (IPOs), ණයකර නිකුත් කිරීම සහ වෙනත් මූල්‍ය සහ ව්‍යාපාරයට අදාළ කරුණුවලදී උපදේශන සේවා ලබාදෙමින් ගාස්තු ආදායම උත්පාදනය කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

බැංකුව සමාලෝචිත වසර තුළ අභියෝග ගණනාවකට මුහුණ පෑ අතර ඒවාට 2020 කොවිඩ්-19 වසංගතයේ කල්පවතින බලපෑම සහ 2021 දී ඇති වූ විදුලි කප්පාදුව සහ විදේශ විනිමය හිඟයද ඇතුළත්ය. ජාත්‍යන්තර ණය ආයතන විසින් ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම පහත දැමීම මහජන බැංකුව ඇතුළුව රටේ සමස්ථ මූල්‍ය ක්ෂේත්‍රයට බලපාන ලද සැලකියයුතු ගැටළුවක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ විධිමත් ණය දෙන ආයතනවලට ශ්‍රී ලංකාවේ බැංකු වෙත අරමුදල් ලබාදීමට නොහැකි වූ අතර විදේශ විනිමය ගලාඒම් සහ ලබාගත හැකි වෙන්කිරීම පිළිබඳ තීරණාත්මකව නැවත ඇගයීමට බලකරන ලදී. වසර ආරම්භයේදී, නිල සහ නිල නොවන හුවමාරු අනුපාත අතර විශාල වෙනස ශ්‍රී ලංකාවේ විදේශ ශ්‍රමිකයන් සිය ඉපයීම් මාරු කිරීමට අවිධිමත් මාර්ග භාවිතා කිරීමට හේතු විය. මෙම ප්‍රවණතාවය රුපියල පාවීමට හැරීම සහ නිල සහ නිල නොවන හුවමාරු අනුපාත අතර වෙනස පටුවීම සමඟ ආපසු හැරවුණි. කෙසේවෙතත්, සමහර විදේශීය ශ්‍රමිකයන් ඔවුන්ගේ ආදායම් විස්තර බලධාරීන්ට දැනුවත්වීම වැලැක්වීමේ හැකියාව තුළ අවිධිමත් මාර්ග භාවිතය අඛණ්ඩව සිදුකරන ලදී. ඉන්ධන හිඟය සහ රට පිළිබඳ සෘණාත්මක පුවත් ආවරණය ද වසර ආරම්භයේදී සංචාරකයින්ගේ පැමිණීම පහළ දැමීමට හේතු වූ අතර එම සංඛ්‍යාව වසර තුළ ක්‍රමයෙන් අඩුවිය. තවද, අන්තර් බැංකු වෙළෙඳපොල කටයුතු අඩු වීම ද්‍රවශීලතාවයට අමතර අභියෝග එකතු කරන ලදී.

ආර්ථිකය පහතවැටීම සහ විදේශ විනිමය අර්බුදයේ අභියෝග ජයගැනීම සඳහා, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව අවදානම් අවම කිරීමට සහ මෙම තත්ත්වය ස්ථාවර කිරීමට මූලික ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අහිතකර බලපෑම් අවම කිරීම සහ සිදුවිය හැකි බොහෝ අලාභ පිරිමැසීම ඇතුළත්ය. ඉහළම වැදගත්කම ඇමරිකන් ඩොලර් ද්‍රවශීලතාව පවත්වා ගැනීම වූ අතර, ඒ සඳහා ප්‍රමුඛතා පදනමක් මත විදේශ විනිමය වෙන් කළ යුතුය. සමහර පෙර සැලසුම්කළ ණය දීමේ මෙහෙයුම් අඩුකළ යුතු වූ අතර, ප්‍රවාහනය සහ බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉන්ධන ආනයන කිරීම වෙනුවෙන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ගල්අඟුරු සමාගම වැනි අත්‍යවශ්‍ය සේවා සපයන ආයතන වෙත අරමුදල් නැවත යොමු කරන ලදී. මීට අමතරව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ පොහොර සමාගම් සඳහා භාණ්ඩ ආනයනය වෙනුවෙන් ද අරමුදල් වෙන් කරන ලදී.

භාණ්ඩාගාර ඒකකය අභියෝගාත්මක වාතාවරණයන් හමුවේ බැංකුවේ සමස්ථ ලාභයට අගය කළ හැකි දායකත්වයක් සිදු කර ඇති අතර, එයට විදේශ විනිමය ඉපයීම්, ප්‍රාග්ධන ඉපයීම්, පොලී ආදායම, ගාස්තු ආදායම, සහ වෙනත් ආයෝජන බැංකුකරණ නිෂ්පාදන වලින් ලද ආදායමද ඇතුළත්ය. මෙම ඒකකය බැංකුවේ බැඳීම් ඉටු කිරීමේදී ප්‍රමාණවත් ද්‍රවශීලතාව පවත්වා ගනිමින් සාර්ථක වී ඇත. ගෝලීය බැංකුකරණ හා මූල්‍ය සමාලෝචනයකින් 2022 දී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ආයෝජන බැංකුව සඳහා ඉහළින් කීර්තිමත් සම්මානය ලබා ගැනීම හේතුවෙන් ආයෝජන බැංකුකරණ ඒකකයට මෙම වසර ඉහළ සාර්ථකත්වයකින් යුත් වසරක් විය. බැංකුවේ ස්කන්ධ කළඹ සුවිශේෂී ආකාරයෙන් කටයුතු කර ඇති අතර, සමස්ත වෙළෙඳපොල 27%ක සෘණාත්මක ප්‍රතිලාභ පෙන්නුම් කලද 30%ට වැඩි ප්‍රතිලාභයක් අත්කරගෙන ඇත. පරීක්ෂාකාරී ප්‍රවේශයක් හේතුවෙන් සේවාදායකයින් ප්‍රාථමික නිකුතු (IPOs) වැනි සැලසුම්කළ කටයුතු කිහිපයක් කල් දැමුවද, ආයෝජන බැංකුකරණ ඒකකය (IBU) ප්‍රධාන වශයෙන් භාරකාර සහ භාරකාර සේවා සැපයීම් තුළින් නව ආදායම් ප්‍රවාහයන් විවිධාංගීකරණය කරමින් ඇති වන ආදායම් අලාභ පිරිමැසීමට සමත් විය.

භාණ්ඩාගාර අලෙවි කණ්ඩායම දැනට ක්‍රියාත්මක වන සැලකිය යුතු මූලපිරිම් නියෝජනය කරන අතර එයට භාණ්ඩාගාර නිලධාරීන් සහ ගනුදෙනුකාර සම්බන්ධතා නිලධාරීන් අතර සහයෝගය සම්බන්ධ වේ. මෙම ගනුදෙනුකාර කේන්ද්‍රීය මූලපිරිම් මගින් භාණ්ඩාගාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි. භාණ්ඩාගාර නිෂ්පාදන සහ ගනුදෙනුකාර සම්බන්ධතා ඇතුළුව අංශ දෙක තුළ නව කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවාගෙන පුහුණු කිරීම සඳහා බැංකුව පියවර ගෙන ඇත.

අනාගත දැක්ම

ඉදිරි වසර දෙස බැලීමේදී, භාණ්ඩාගාර ඒකකය අභියෝගාත්මක වාතාවරණ අපේක්ෂා කරන නමුත් එවැනි බාධක ජය ගැනීමට එයට ඇති හැකියාව පිළිබඳව විශ්වාසයෙන් සිටී. ඇමෙරිකන් ඩොලර්වලින් නම්කළ සුරැකුම්පත්වලට අපගේ සීමිත නිරාවරණවලින් අදහස් වන්නේ බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයට බිය විය යුතු නැති බවයි. අපගේ ආදායම් අවස්ථා පුළුල් කිරීම සඳහා ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරුවන් සමඟ සහයෝගයෙන් භාණ්ඩාගාර අලෙවි කණ්ඩායම තුළින් අමතර ව්‍යාපාර අත්කර ගැනීම සිදු කිරීමට අපි සැලසුම් කරමු. තවද, මෙම ඒකකය බැංකුවේ හුවමාරු කළඹ වැඩි කිරීමට බුද්ධිමත් කොටස් තෝරාගැනීම් අඛණ්ඩව සිදු කිරීමට සහ ඉහළ ශුද්ධ වටිනාකම් සහිත පුද්ගලයින් සඳහා කළඹ කළමනාකරණයට පිවිසීමට අරමුණු කරයි. අපි අපගේ භාරකාර සහ භාරකාර සේවා පුළුල් කරනු ලබන අතර, මෙමඟින් සේවා ස්ථීර ආදායම් ප්‍රවාහයක් පිරිනමනු ඇත. අතිරේක ආදායම් මාර්ග ඇතිකරන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම මෙන්ම ඒකාබද්ධ කිරීම් වැනි ක්ෂේත්‍රවල උපදේශන සේවා සඳහා අපේක්ෂිත අවස්ථාද පවතී.

භාණ්ඩාගාර ඒකකය අඛණ්ඩ පදනමක් මත අරමුදල් මූලාශ්‍ර සහ විදේශීය ප්‍රතිපාර්ශ්ව ගණනක් සමඟ ශක්තිමත් සම්බන්ධතා පවත්වා ගනී. මෙවැනි සම්බන්ධතා හිතකර අනුපාත ලබාගැනීම සඳහා අතීතයේදී තීරණාත්මක වී ඇති අතර, මෙම ආයතනවලට වර්තමානයේ ශ්‍රී ලංකික බැංකුවලට ණය ලබාදීමට නොහැකි වුවද, තත්ත්වය පිළිගතහැකි මට්ටමට සාමාන්‍යකරණය වීම තුළ අනාගතයේදී මෙවැනි සම්බන්ධතා වටිනා බව ඔප්පු කරනු ඇත.

එතෙර ගනුදෙනු සේවාව

ප්‍රධාන සිදුවීම්



ආමුඛ සේවක ප්‍රේෂණ **වෙළෙඳපොල කොටස 50%කින්** වැඩි විය.



ආමුඛ සේවක ප්‍රේෂණ **ඇ.ඩො.මි. 32.38කින්** වැඩි විය.



"People's Remittance වාසි කෝටියයි" සුපිරි ත්‍යාගය **රු.මි. 10.**



මැලේසියාව, ස්පාඤ්ඤය, ජෝර්දානය, ඩෙන්මාර්කය සහ රුසියාව දක්වා **වෙළෙඳපොල පුළුල්වීම.**

එතෙර ගනුදෙනු ඒකකය (OCS) බැංකුව වෙත ආමුඛ ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය සියලුම මාර්ග සහ යටිතල පහසුකම් සඳහා පහසුකම් සපයන සහ ක්‍රියාත්මක කරන බැංකුවේ ප්‍රධාන මධ්‍යස්ථානය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විශේෂ රුපියල් ගිණුම් පිළිබඳ අවශ්‍ය දැනුම සහ මගපෙන්වීමද සපයයි. එතෙර ගනුදෙනු සේවාව ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත පදිංචිව සිටින ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විදේශ විනිමය කළමනාකරණය කිරීමට, ඉපැයීම් ආපසු ගෙන්වා ගැනීමට සහ විදේශ ව්‍යවහාර මුදලින් නම් කරන ලද ගනුදෙනු කිරීමට උපකාර කිරීම සඳහා කැපවී සිටී. එතෙර ගනුදෙනු ඒකකය (OCS) හට විදේශ විනිමය ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැන්වීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට ඉඩ සලසමින් බැංකුවේ ගෝලීය හවුල්කරුවන්ගේ ජාලය මෙම සේවාවන් සඳහා සහාය වේ.

සමාලෝචිත වර්ෂය තුළ, විදේශ විනිමය සංචිතවල අඩුවීම සමස්ත බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇති අතර, අදාළ අර්බුද කිහිපයක් වැඩි කර ඇත. ණය දෙන ආයතන විසින් පහළට ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික පුරවැසියන් සහ විදේශිකයන් අතර විශ්වාසය අඩු විය. වසංගතය හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි විදේශගත ශ්‍රමිකයින්ට විදේශයන්හි පෙර තනතුරු ලබාගැනීම ප්‍රමාද වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රේෂණවල සමස්ත පහළ වැටීමක් සිදු විය. මීට අමතරව, වසරේ මුල් භාගය තුළ පැවති දේශපාලන අවිනිශ්චිත කාලපරිච්ඡේදය මෙම තත්ත්වය වඩාත් නරක අතට පත්කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විධිමත් මාර්ගවලට සාපේක්ෂව වඩා හිතකර හුවමාරු අනුපාත ලබා ගැනීමට හැකි වූ බැවින් ඔවුන්ගේ විදේශීය විනිමය ඉපයීම් ප්‍රේෂණය කිරීමට අවිධිමත් මාර්ග වෙත මාරු විය. වසර අවසානයේදී නිල සහ නිල නොවන අනුපාතවල වෙනස අඩු වැදගත්කමක් බවට පත් වූ බැවින් විධිමත් මාර්ගවලට වැඩි විශ්වාසයක් ඇතිවිය. 2022 වසරේ වැඩි කාලසීමාවක් තුළ මෙම අභියෝග පැවතියද, වසංගතය ලිහිල් වීමෙන් පසු මතු වූ විදේශ රැකියා අවස්ථා සහ විදේශ රැකියා සොයන ශ්‍රී ලාංකිකයන් වැඩිවීමත් සමඟින් පසු මාසවල ප්‍රකෘතිමත් වීමේ ප්‍රවණතා දක්නට ලැබුණි.

ඉහත සඳහන් කළ සෘණාත්මක දැක්ම සහ රාජ්‍ය බැංකුවක් ලෙස අපගේ තත්ත්වය පිළිගනිමින්, එතෙර ගනුදෙනු ඒකකය විසින් විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීම සහ රටේ ආර්ථික පුනර්ජීවනය සහ සංවර්ධනය සඳහා විදේශ විනිමය සම්පත් යොමු කිරීමේ වගකීම භාර ගන්නා ලදී.

මෙම ගැටළු විසඳීම සඳහා, එතෙර ගනුදෙනු ඒකකය විසින් 2022 දී අපගේ මෙහෙයුම්වල ව්‍යාප්තිය, ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරී සහ නව්‍ය උපාය මාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී.

- විදේශයන්හි සේවය කරන විදේශගත ශ්‍රී ලාංකිකයින් අතර අපගේ එතෙර ගනුදෙනු සේවා සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
- ඔවුන්ගේ ඉපැයීම් බැංකුව හරහා ප්‍රේෂණය කිරීමට සහ අවිධිමත් මාර්ග භාවිතා කිරීමෙන් වැළක්වීමට මෙම කොටස දිරිමත් කිරීම සඳහා ආකර්ෂණීය දිරිගැන්වීම් ලබා දීම. එයට ඉතා ආකර්ෂනීය ත්‍යාග හා දීමනා ද ඇතුළත් විය.
- වඩාත් විධිමත් සහ කාර්යක්ෂම සේවාවක් මෙන්ම වැඩි ගනුදෙනුකාර පහසුවක් සඳහා ඩිජිටල් අවකාශ සහ මෙවලම් භාවිතා කිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගීත්වයෙන් ව්‍යාපාරික අංශයට විශේෂයෙන්ම අපනයනකරුවන්ට එහි පහසුකම් පුළුල් කිරීම.

"People's Remittance වාසි කෝටියයි" අපගේ ප්‍රධාන ප්‍රවර්ධන ව්‍යාපාරයේ මෙහෙයුම් පෙරමුණගත් අතර, අපගේ පැතිකඩ සැලකිය යුතු ලෙස ඉහළ නංවා විශිෂ්ට ප්‍රතිඵල ලබා දුන්නේය. මහජන බැංකුව හරහා හෝ සෘජුව මුදල් කවුන්ටර් හරහා තම මහජන බැංකු ගිණුම්වලට හෝ වෙනත් බැංකු ගිණුම්වලට විදේශ මුදල් ප්‍රේෂණය කළ ගනුදෙනුකරුවන් මුදල් සහ රන් පවුම් ඇතුළු ත්‍යාග සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. ජයග්‍රහණය පිළිබඳ සම්භාවිතාව ප්‍රේෂණය කළ මුදලට සමානුපාතිකව වැඩි වූ අතර, එය වැඩිපුර මුදල් ප්‍රේෂණය කිරීමට මහත් දිරිගැන්වීමක් විය. වැඩසටහනේ උච්චතම අවස්ථාව වූයේ වසර අවසානයේදී රුපියල් මිලියන 10ක සුපිරි ත්‍යාගය වේ. වැඩිකළ දැනුවත් කිරීමේ වැඩසටහන් ආමුඛ සේවක ප්‍රේෂණ සඳහා අපගේ කොටස දෙගුණයකටත් වඩා වැඩි කිරීමට දායක විය.

ඩිජිටල් තාක්ෂණය සහ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු මාර්ගවල අපගේ භාවිතය අපගේ මෙහෙයුම් විධිමත් කිරීමේ තීරණාත්මක අංගයක් සහ ප්‍රධාන වෙනසක් ඇති කළේය. මෙය ගනුදෙනුකරුවන්ට ඔවුන්ට පහසු වේලාවට සහ ස්ථානයේදී බැංකුව සමඟ අන්තර් ක්‍රියා කිරීමට උපකාරී විය. මෙය බැංකුවේ මෙන්ම ගෝලීය හවුල්කරුවන්ගේ අතිනවීන තාක්ෂණික අවකාශ මගින් පහසුකම් සපයන අතර තත්පර කිහිපයකින් ශ්‍රී ලංකාවට අරමුදල් ප්‍රේෂණ ලැබීම ද සක්‍රීය කළේය.

බැංකුවේ වෙළෙඳපොල පුළුල් කිරීමේ සැලසුම් කාලසටහනට අනුව කරගෙන යන අතර, අපි මැලේසියාව, ස්පාඤ්ඤය, ජෝර්දානය, ඩෙන්මාර්කය සහ රුසියාව අපගේ කළඹට එකතු කර ඇත. ලෝකයේ විවිධ ප්‍රදේශවල වෙසෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා බොහෝ රටවල නියෝජිතයන් අප සතුව ඇත. තවද, රුසියා සඳහා මේ වසරේ විදේශගත වූ ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව ඉහළ යාමත් සමඟ විදේශ අනුරූප බැංකුවල අපගේ ජාලය අපි පුළුල් කර ඇත.

තරඟකරුවන් මහජන බැංකුවේ මූලිකත්වය අනුගමනය කර දිරිගැන්වීම්/ප්‍රවර්ධන යෝජනා ක්‍රම හඳුන්වා දී ඇති බැවින්, අපගේ තරඟකාරී වාසිය රඳවා තබා ගැනීම සඳහා අපගේ පිරිනැමීම් වැඩිදියුණු කළ යුතුය. දැනටමත් නිර්මාණය කර ඇති දැනුවත්භාවය සහ උද්යෝගය මත පදනම්ව, ඉදිරි වසර තුළ ආමුඛ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස වැඩි කිරීමටත්, අපගේ ගෝලීය ගමන් මග තවදුරටත් වැඩිදියුණු කිරීමටත් අපි ඉලක්ක කරමු.

කාර්යසාධන වැදගත් සිදුවීම්

- ආමුඛ සේවක ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස 2022 දී 50% කින් වැඩි කරන ලදී.
- ආමුඛ සේවක ප්‍රේෂණවල අගය 2021 ට වඩා 2022 දී ඩොලර් මිලියන 32.38කින් වැඩි විය.
- 2022 දී ලැබුණු ආමුඛ සේවක ප්‍රේෂණ සංඛ්‍යාව ගනුදෙනු 300,000කට වඩා වැඩි කර ඇත.
- 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ විදේශ විනිමය තැන්පතු ඩොලර් මිලියන 737.7කි.

අනුරූප බැංකු ගණන

	2022	2021	2020	2019
වොස්ට්‍රෝ නියෝජිතයන්	82	78	71	71
නොස්ට්‍රෝ බැංකු සේවා	43	42	42	42

අනාගත දැක්ම

විදේශයන්හි ණයපත් හෝ හරපත් ඇති ගනුදෙනුකරුවන්ට භෞතිකව බැංකු/විනිමය හුවමාරු මධ්‍යස්ථානයක් වෙත නොගොස් විදේශ විනිමය ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමේ යෝජනා ක්‍රමය බැංකුව පුළුල් කරනු ඇත. මෙය ශ්‍රී ලාංකීය විදේශිකයන්ට, විශේෂයෙන්ම වැඩ මුරයක් හෝ වැඩවාර සටහන් පදනම මත සේවය කරන අයට ඉමහත් උපකාරයක් වනු ඇත. මහජන බැංකුවට හෝ වෙනත් බැංකු ගිණුම්වලට පහසුවෙන් මුදල් ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා අපි වෙනත් ඩිජිටල් මෙවලම් කිහිපයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටිමු.

ඉදිරි වර්ෂයේදී නව ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම දැකිය හැකි අතර, රුපියල් මිලියන 25ක් හෝ ඊට වැඩි මුදලක් දක්වා නිවාස ණය සහ පෙර ගමන් විගමනිත ණය යෝජනා ක්‍රම සහනදායී අනුපාතවලට ප්‍රදානය කිරීමට අපි සැලසුම් කරමු. මෙම ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවය විදේශයන්හි ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමට ශ්‍රමිකයින් දිරිමත් කරනු ඇති අතර එය විදේශ මුදල් ප්‍රේෂණ සඳහා අඛණ්ඩ මූලාශ්‍රයක් වනු ඇත. දියත් කරන ලද විදේශ මුදල් නිෂ්පාදනවලින් එහි සාර්ථකත්වය පෙරමුන ගනිමින්, ඉදිරි වසර තුළ සිය නිෂ්පාදන පරාසය විවිධාංගීකරණය කිරීම සඳහා තවත් එකතු කිරීම් සිදු කිරීමට අංශය උත්සාහ ගනිමින් සිටී.

ජාත්‍යන්තර බැංකුකරණය

ප්‍රධාන වැදගත් සිදුවීම්

ආනයන ආශ්‍රිත වෙළෙඳ ගනුදෙනු **ඇ.ඩො.මි. 1.0ට වැඩිය.**

රටවල් 110ක විදේශීය අනුරූපකයින් **1,000ට වැඩිය.**

ISO 9001:2015 ප්‍රති සහතිකකරණය

9001-2015

තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) **අපගේ ප්‍රවීනත්වය.**

ජාත්‍යන්තර බැංකුකරණ අංශය (IBD) පුළුල් පරාසයක නිෂ්පාදන සහ සේවාවන් භාවිතා කරමින් සිය ආයතනික ගනුදෙනුකරුවන්ගේ සහ ශාඛාවල ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු සඳහා පහසුකම් සලසයි. ජාත්‍යන්තර වෙළඳාමට සහය වන සේවාවන් අතරට ණයවර ලිපි විවෘත කිරීම (LC), අපනයනය ආශ්‍රිත ලේඛණ හැසිරවීම, සහ නැවිගත කිරීමට පෙර සහ පසු මූල්‍ය පහසුකම් මෙන්ම ඇපකර නිකුත් කිරීම ඇතුළත් වේ. රටවල් 110ක් පුරා විසිරී සිටින 1,000කට අධික විදේශීය අනුරූපකයින් විසින් අනුග්‍රහය දක්වන අක්වෙරළ බැංකු ඒකකය ඇතුළු මධ්‍යගත මෙහෙයුම් ඒකක තුළින් මෙම සේවාවන් සපයනු ලබයි. අක්වෙරළ ගනුදෙනු සඳහා අක්වෙරළ බැංකු ඒකකය මඟින් පහසුකම් සලසන අතර විදේශ මුදල් ණය, තැන්පතු සහ ගිණුම් පරාසයක් මෙම ඒකකය පිරිනමයි.

සමාලෝචිත වර්ෂය තුළ, දේශීය හා විදේශීය ව්‍යවහාර මුදල්වල දැඩි ද්‍රවශීලතා අර්බුදයකින් පසුව ඇති වූ පශ්චාත් වසංගත ප්‍රතිසාධනය සහ ඉන්ධන අර්බුද ඇතුළු සාධක ගණනාවක් අපගේ මෙහෙයුම්වලට බාධාවක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ සීමිත විදේශ විනිමය සම්පත් ඉන්ධන, ගල් අඟුරු, ඖෂධ සහ පොහොර යනාදී අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් වෙත නැවත යොමු කරන ලදී.

ආනයන කාණ්ඩ කිහිපයක් මත වසර තුළ පැවති සීමා කිරීම් හේතුවෙන් අපනයනය ඉලක්ක කරගත් ව්‍යාපාර වෙත අපගේ අවධානය යොමු කිරීමට සිදු වී ඇති අතර, අපනයන ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අප කටයුතු කර ඇත. අපගේ ශාඛා වඩාත් අපනයනය ඉලක්ක කරගත් ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට වැඩසටහනක් පවත්වන ලද අතර, විදේශ විනිමය ඉපයීම් මෙරටට ගෙන්වීම වැඩි කර ඇත. ප්‍රධාන මුලපිරීමක් ලෙස, ප්‍රධාන කලාප/ප්‍රදේශ දැනටමත් හඳුනාගෙන ඇති අතර, එම කලාප/ප්‍රදේශවල ඉලක්කගත අපනයනකරුවන්ට අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා දෙනු ඇත.

පශ්චාත්-කොවිඩ් තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධා අවම කිරීම සඳහා කඩිනමින් ප්‍රතිචාර දක්වමින්, ජාත්‍යන්තර බැංකුකරණ අංශය ඩිජිටල්කරණයේ බලය සහ විභවතාව ශක්තිමත් කිරීමට අමතරව නව මෙහෙයුම් ක්‍රම යොදා ගන්නා ලදී. අපගේ ආයතනික අන්තර්ජාල බැංකුකරණ මොඩියුලය හරහා පාරිභෝගික ඇතුල්වීම් සක්‍රීය කර ඇති අතර, එමඟින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය විධිමත් කර වේගවත් කරන ලදී. ඊමේල් සහ විද්‍යුත් ලියකියවිලි හරහා වැඩි ගනුදෙනුකාර සම්බන්ධතා සහ ලිපි හුවමාරු කිරීම් සිදු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් පිරිවැය අඩු වී සේවාව කාර්යක්ෂමව ලබා දීමට හැකි විය. ගනුදෙනුකරුවන්ට ණයවර ලිපි, තත් කාලීන දළ පියවීම් පද්ධතිය, ණය සහ ඇපකර ඇතුළු සේවා පරාසයක් සඳහා මාර්ගගත ක්‍රමය යොදා ගැනීමට හැකි විය. මෙම ක්‍රියාවලිය තවදුරටත් වේගවත් කරමින්, අපි අපගේ පූර්ව ඩිජිටල්කරණ යුගයේ උරුමයක් වූ සංකීර්ණ ලේඛනගත ක්‍රමය සරල කළ අතර මුදල් විශුද්ධිකරණ නිවාරණය මාර්ගගතව සිදු කළෙමු. අපගේ අපනයන ගනුදෙනුකරුවන් ප්‍රේෂණ හරහා ගනුදෙනු කිරීම සඳහා කැමැත්ත වැඩිවන බැවින්, වැඩිවන කාර්යබහුලතාව මඟහරිවා ගැනීමට, අපි අපගේ ප්‍රේෂණ ඒකකයේ මෙහෙයුම් පුළුල් කළෙමු. ජාත්‍යන්තර බැංකුකරණ අංශය සාමාන්‍ය ව්‍යාපාරික වේලාවෙන් ඔබ්බට ප්‍රවේශ විය හැකි පරිදි පවත්වාගෙන ගිය අතර, ලේඛනවල පිටපත් මත අපනයනකරුවන්ට සහ ආනයනකරුවන්ට ලබා දීම සඳහා භාණ්ඩ බෙදා හැරීමට පහසුකම් සලසමින් දවස පුරා විවෘතව තබා ඇත.

කාර්යසාධන වැදගත් සිදුවීම්

	2022 රු.මි.	2021 රු.මි.
ණයවර ලිපි	188,432	328,452
ආනයන බිල්	344,833	393,344
නැවිගත කිරීමේ ඇප	34,251	45,175
බැංකු ඇප	207,249	20,521
අපනයන බිල්	10,849	21,552
කෙටිකාලීන අත්තිකාරම් - අපනයන	9,360	8,674
කෙටිකාලීන අත්තිකාරම් - ආනයන	181,637	87,065
තොග ණය	46,917	45,519

2022 වර්ෂය තුළ, ජාත්‍යන්තර බැංකුකරණ අංශය විසින් රුපියල් බිලියන 1,483 ක වටිනාකමකින් යුත් වෙළෙඳ පහසුකම් (වෙළඳ නිෂ්පාදන) 20,796 කට පහසුකම් සපයා ඇත. රුපියලේ තියුණු අවප්‍රමාණය වීම සහ විදේශ මුදල්වල උග්‍ර හිඟයත් සමඟ භාණ්ඩ ආනයනය මත පනවා ඇති සීමා කිරීම් සහ අත්හිටුවීම් හේතුවෙන් 2021 ට සාපේක්ෂව, ආනයන ආශ්‍රිත නිෂ්පාදන පහත වැටීමක් පෙන්නුම් කර ඇත. අක්වෙරළ බැංකුකරණ ඒකකය 2021 දී පැවති ඩොලර් මිලියන 1,387 ට සාපේක්ෂව 2022 දී ඩොලර් මිලියන 596ක් වටිනා ගනුදෙනුවලට පමණක් පහසුකම් සපයා ඇත.

ආනයන හා ප්‍රේෂණවල පහත වැටීම සහ ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියලේ අගය තියුණු ලෙස අවප්‍රමාණය වීම මගින් පෙන්නුම් කරන වසර තුළ අභියෝගාත්මක පරිසරය හමුවේ, ජාත්‍යන්තර බැංකුකරණ අංශය සීමාවන් තිබියදීත් පොලී සහ ගාස්තු ආදායම යන දෙකෙහිම සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කර ඇත. ඉන්ධන සහ ගල් අඟුරු ආනයනය සඳහා පහසුකම් සැලසීමට අපට හැකි වූ අතර, එහි වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 900 ඉක්මවයි. එමෙන්ම ඉන්දියානු රේඛීය ණය පහසුකම යටතේ, ඇමරිකානු ඩොලර් මිලියන 13ක වටිනාකමකින් යුත් 200කට අධික ආනයන ගනුදෙනු සඳහා පහසුකම් සලසා ඇත. ඇපකර නිකුත් කිරීම, විදේශ විනිමය ණය සඳහා ඉල්ලුම වැඩි වී ඇති නමුත් ආනයන මූල්‍යකරණයේ අඩුවීමක් වාර්තා වී ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත කාලය තුළ ඇමරිකානු ඩොලර් බිලියන 1.0ට වැඩි ආනයන ආශ්‍රිත වෙළෙඳ ගණුදෙණු සිදු කර ඇත.

මෙහෙයුම් වියදම් අඩු කිරීම සඳහා, ජාත්‍යන්තර බැංකුකරණ අංශය ඩිජිටල් අවකාශ යොදා ගනු ලැබූ අතර, සැලකිය යුතු පිරිවැයක් ඉතිරි කරන සම්පත් භාවිතය සීමා කිරීමට තිරසාර භාවිතයන් පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කළේය.

අවශ්‍ය දැනුම් මට්ටම් සහ තත්ත්ව ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පවතී. පවතින තත්ත්වයන් හේතුවෙන් 2022 දී විශේෂයෙන් පිටස්තර ශාඛාවල කාර්ය මණ්ඩල සඳහා බොහෝ පුහුණුවීම් මාර්ගගතව පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ සඵලතාව වැඩිදියුණු කිරීම සඳහා අපගේ මානව සම්පත් දෙපාර්තමේන්තුව හරහා E-Learning මොඩියුල මාලාවක් හඳුන්වා දීමට අපි අදහස් කරමු. මීට අමතරව, තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්ය මණ්ඩල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් අපගේ ප්‍රවීනතාව සමඟ පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කළෙමු.

සේවා ක්‍රියාවලි සහ බෙදාහැරීම තුළ තත්ත්ව කළමනාකරණ පද්ධතිය හඳුනා ගනිමින්, අප විසින් පිරිනමනු ලබන ආනයන හා අපනයන සේවාවන්හි ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කරන අතරම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අඛණ්ඩව 3 වැනි වරටත් නැවත වරක් ප්‍රති-සහතිකකරණය (ISO 9001:2015) ලබා ගැනීමට අපට හැකි විය. මෙය මුල් වරට 2013 දී ලබාගෙන ඇත. මෙම ප්‍රති-සහතිකකරණය වෙළෙඳ සේවා විසින් දශකයකට ආසන්නව ලබාදෙන ලද සේවාවන්හි සේවා තත්ත්වය පිළිබඳ තවදුරටත් සාක්ෂි දැරීමකි.

අනාගත දැක්ම

අනාගතය කෙරෙහි අවධානය යොමු කරමින්, ජාත්‍යන්තර බැංකුකරණ අංශය අපනයන ගනුදෙනුකරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සහ තිරසාර අලෙවිකරණ උත්සාහයන් ක්‍රියාත්මක කරමින් තම වෙළෙඳපොල කොටස පුළුල් කිරීමට සැලසුම් කරයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, වියදම් අඩු කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට ඩිජිටල් අවකාශ සහ මෙවලම් මත දැඩි ලෙස රඳා පවතිනු ඇත. අති නවීන පද්ධති අප සතුවන අතර ඒවා අපගේ 2023 ඉලක්ක සහ ඉන් ඔබ්බට සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී ලෙස භාවිතා කිරීමට අදහස් කරයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය යන්නෙන් බැංකුවට අයත් ස්පෘශ්‍ය වත්කම් කළඹ අදහස් කරන අතර මෙයට අයත් දෑ අතර අපගේ සේවාදායකයින්ට සේවය සැලසීම සඳහා පහසුකම් ඇති කරන එහි භෞතික යටිතල පහසුකම් ඇතුළත් වේ. තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල්කරණයේ දියුණුව හමුවේ, භෞතික ස්ථානවල වැදගත්කම විශේෂයෙන් ජනගහනයෙන් බහුතරයක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන රටකට අදාළව මූලික වේ. මේ සම්බන්ධයෙන් පුළුල් ශාඛාජාලය, සේවා මධ්‍යස්ථාන, ස්වයං බැංකුකරණ ඒකක (SBU), ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs), සහ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධවීමට භාවිතා කරන වෙනත් පහසුකම් අපගේ පදනම වන අතර සමාජීය බැලපෑම් හැකියාවන් තවදුරටත් වර්ධනය කර ඇති ඩිජිටල් පහසුකම් ද මෙයට සම්බන්ධ වේ.

අපගේ ප්‍රවේශය

බැංකුකරණ සේවා සඳහා අපගේ ප්‍රවේශය ලඟාවිය හැකි බව සහ දැරිය හැකි බව මත නිරන්තරයෙන් කේන්ද්‍රගත වන අතර එයට අපගේ පුළුල්ව පැතිරුණු භූගෝලීය පැවැත්ම ප්‍රධාන වාසි අතර පවතී. එය අපගේ සේවාදායකයින් සමඟ හුවමාරු කරගන්නා සමීප සම්බන්ධතාවයට දායක වෙන සැලකියයුතු සාධකයක් වී ඇත. ස්වයංක්‍රිය බැංකු ඒකක ඉහළම සංඛ්‍යාවක් සම්බන්ධ වී ඇති රටේ විශාලතම ජාලය වන අපගේ පුළුල් ශාඛා ජාලය අපගේ ව්‍යාපාරයේ සහ නව ගනුදෙනුකරුවන් අත් කරගැනීමේ වර්ධනය තුළ ප්‍රමුඛ වී ඇත. ඊට අමතරව, සේවා ප්‍රමිති ඉහළ නැංවීමේ සහ නවෝත්පාදන ඩිජිටල් වත්කම් හඳුන්වාදීමේ අපගේ අඛණ්ඩ උත්සාහයන් රට පුරා නවීන බැංකුකරණ සේවා පිරි නැමීමේදී අපගේ නායකත්ව කාර්යභාරය පවත්වා ගැනීමට අපට ශක්තියක්ව ඇත.

ප්‍රධාන සිදුවීම්

745 ක් වූ දිවයිනේ විශාලතම ශාඛා හා සේවා මධ්‍යස්ථාන ජාලය
විශාලතම ජාලය

289ක් වූ විශාලතම ස්වයං බැංකුකරණ ඒකක ජාලය

ජනගහනයෙන් **65%ක්** ආවරණය වන ගනුදෙනුකාර කළඹ

හරිත ගොඩනැගිලි – සංකල්පය තුලින් පුනර්ජනනීය බලශක්තිය කරා අඛණ්ඩ පරිනාමය



වැදගත් තේමා

- ඩිජිටල් නායකත්වය
- ගනුදෙනුකාර පිවිසීම.

අභියෝග

- සාර්ව ආර්ථික මන්දගාමිත්වය
- ඉහළ උද්ධමනය සහ දියුණු නොවන ආදායම් මට්ටම්
- දේශපාලන ආරාවුල සහ අවිනිශ්චිතතාව
- ප්‍රවාහන/සැපයුම් ගැටළු
- විදේශ විනිමය හිඟය

අවස්ථා

- කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පිරිවැය අඩු කිරීමට ඩිජිටල් විසඳුම් වේගවත් කිරීම.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

දැරියහැකි සහ පිරිසිදු බලශක්තිය

ගොඩනැගිලි හරිත ශාඛා සහ පොසිල ඉන්ධන භාවිතය අඩු කිරීමට සූර්ය බලශක්තියට පවත්නා ශාඛා පරිවර්තනය කිරීම.

විෂමතා අඩු කිරීම

දිවයින පුරා අපගේ ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන තුළින්, සෑම තරාතිරමකම මිනිසුන්ට අපගේ නිෂ්පාදන සහ සේවා සඳහා පිවිසුම ලබාදීම.

යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

පාරිශ්‍රමික මනාව ගෙවන සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත තෘප්තිමත් සේවා ස්ථානයක් සහතික කිරීම.

වගකීමසහගත පරිභෝජනය සහ නිෂ්පාදනය

ඩිජිටල්කරණය තුළින්, බැංකුකරණ සේවා සහ ප්‍රසම්පාදනයේදී හැකි තරම් දුරට කඩදාසි භාවිතය ඉවත් කිරීම.

කර්මාන්ත, නවෝත්පාතනය සහ යටිතලපහසුකම

තාක්ෂණික යාවත් කිරීම්, ඩිජිටල්කරණය සහ ක්‍රියාවලි වර්ධනයන් තුළින් සම්පත් භාවිතය සහ තිරසාරභාවය තුළ කාර්යක්ෂමතාව වැඩි කිරීම.

දේශගුණ ක්‍රියා

සම්පත් භාවිතය අවම කිරීම සහ පරිසර දූෂණය අඩුකිරීම මගින් මිහිකතේ අනාගතය සුරක්ෂිත කිරීම.

නිර්මාණය කළ වටිනාකම

ස්වයංක්‍රීය බැංකු ඒකක සහ සංවයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

රුපියල් බිලියන 1,703.4ක් වූ
බිලියන 101ට වැඩි ගනුදෙනු


ඩිජිටල් යෙදුම්

රුපියල් බිලියන 392.6ක් වූ
බිලියන 75.3ට වැඩි ගනුදෙනු

ගිණුම් සහ ණය – ඩිජිටල් යෙදවුම් තුලින්

මිලියන 1ට ආසන්න නව ගිණුම්
රුපියල් බිලියන 52.2 ඉක්ම වූ ණය

ප්‍රාග්ධන සම්බන්ධතා




අපගේ ගනුදෙනුකරුවන් වෙත ලඟාවීම

ශාඛා **745**	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **822**	මුදල් තැන්පතු යන්ත්‍ර **319**
ස්වයංක්‍රීය බැංකුකරණ ඒකක **289**	ගනුදෙනුකරුවන් මිලියන **14.7**	ඩිජිටල් යෙදුම් පරිශීලකයින් මිලියන **1.57**
126 KIOSKs	මුදල් තැන්පතු හා ආපසු ගැනීම් යන්ත්‍ර **100**	පාසල් මුදල් තැන්පතු යන්ත්‍ර **50**

ග්‍රාමීය සහ වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට සේවය කිරීම කෙරෙහි බැංකුවේ අවධානය හේතුවෙන්, කාලය සමඟ අපි පුළුල් ශාඛා සහ පහසුකම් ජාලයක් ස්ථාපිත කර ඇත.


ශාඛා සහ SBUS සංඛ්‍යාව



ශාඛා ජාලයේ/ගනුදෙනුකාර පිවිසුම් මධ්‍යස්ථානවල භූගෝලීය ව්‍යාප්තිය

බැංකුව සමස්ථ ශ්‍රී ලංකාව තුළ එහි මෙහෙයුම් පවත්වයි. පහත සිතියමේ දක්වා ඇති පරිදි බැංකුවේ ජාලය ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය කරයි.

බැංකුව සියලුම ආර්ථික ක්ෂේත්‍ර එනම් කෘෂිකර්මය, කර්මාන්ත සහ සේවාවන්ට සේවය සලසන අතර අපගේ සේවාදායකයින් අතර පාරිභෝගික, ආයතනික සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගනුදෙනුකරුවන් ඇතුළත්ය.



බස්නාහිර පළාත	
	218
	107
	252
	123
	50
	51
	21

වයඹ පළාත	
	75
	23
	76
	27
	13
	8
	3

උතුරු මැද පළාත	
	54
	21
	59
	23
	6
	5
	3

නැගෙනහිර පළාත	
	61
	19
	61
	20
	7
	4
	3

උතුරු පළාත	
	49
	14
	50
	14
	6
	2
	2

දකුණ පළාත	
	87
	31
	99
	32
	14
	8
	4

සබරගමුව පළාත	
	56
	18
	60
	21
	8
	6
	4

ඌව පළාත	
	49
	18
	58
	18
	6
	4
	2

මධ්‍යම පළාත	
	96
	38
	107
	41
	16
	12
	8

ශාඛා | ස්වයං බැංකු ඒකක | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | මුදල් තැන්පතු යන්ත්‍ර

KIOSKs යන්ත්‍ර | CRMs | SCDMs

යටිතල පහසුකම් සංවර්ධනය

මහල් 23ක් සහ බිම් මහල් 3කින් සමන්විත බැංකුවේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම මුහුණපාන ලද බාධා හමුවේ වුවත් සාර්ථක ප්‍රගතියක් සිදු කර ඇත. කෙසේවෙතත්, පිරිවැය ඉහළ යාම සහ ආනයන සීමාකිරීම් හේතුවෙන් නව ශාඛා ගොඩනැගිලිවල ඉදිකිරීම් සහ පවත්නා ශාඛාවල ප්‍රතිසංස්කරණය ආර්ථික තත්ත්වයන් වර්ධනය වන තුරු අත්හිටුවා ඇත. 2022 අවසානයේදී, ප්‍රධාන කාර්යාලයේ ඉදිරිකිරීම් කටයුතු 21.3%ක් රුපියල් මිලියන 2,204.3ක පිරිවැයකට නිම කර ඇති අතර එයට උපදේශන කටයුතු, කුළුණු ඉදිකිරීම සහ ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ඇතුළත් විය. ශාඛා පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 211.29ක පිරිවැයක් දරන ලදී. ඊට අමතරව, 2022 දී දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීමට සහ යාවත්කාලීන කිරීමට රුපියල් මිලියන 1,142.3ක වියදම් දරන ලදී. මෙයට සින්නක්කර ඉඩම, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, යන්ත්‍ර, උපකරණ සහ පරිගණක ඇතුළත් වන අතර, මෙම සියල්ලම බැංකුව සඳහා අමතර වටිනාකමක් ඇති කරන නිෂ්පාදන වත්කම් වෙති. තිරසාරභාවය වෙත බැංකුවේ බැඳීමට අනුව, සියලුම අලුත්වැඩියාවන්, ප්‍රතිස්ථාපනයන්, සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඇතුළුව නව ඉදිකිරීම් ව්‍යාපෘති පාරිසරික හිතකාමී තිරසාරතා මූලධර්ම පදනම්ව කරගෙන යනු ලැබේ. සූර්ය කෝෂ ස්ථාපිත කරමින් සහ අලුත්වැඩියාවන්හී කොටසක් ලෙස ප්‍රතිදීප්ත බල්බ වෙනුවට LED බල්බ සවිකරමින් සියලුම ගොඩනැගිලි "හරිතකරණය" කිරීමේ ක්‍රියාවලිය බැංකුව තුළ සිදු වේ. සූර්ය බලශක්තිය සියලුම නව ගොඩනැගිලි සඳහා භාවිතා කිරීමට යෝජිතය. දැනට, ශාඛා 20ක් සූර්ය බලශක්තියෙන් බලගන්වා ඇති අතර, 2023 අවසානයේදී මෙම සංඛ්‍යාව 80 දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය.

ඩිජිටල් පරිනාමය

බැංකුවේ ඩිජිටල් පරිනාමය සැලැස්ම අනුව ක්‍රියාත්මක වෙමින් පවතින අතර වසර ආරම්භයේදී සැපයුම් දුෂ්කරතා, ආනයන සීමා කිරීම්, සහ පිරිවැය ඉහළයාම හමුවේත් එහි ගම්‍යතාව රඳවා ගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලව KYC (ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න) සහ KYC වීඩියෝ භාවිතා කරමින් නව ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ගනුදෙනුකරුවන්ට භෞතිකව ශාඛාවට පැමිණීමේ අවශ්‍යතාවක් නොමැතිව මාර්ගගතව ගිණුම් විවෘත කිරීමේ හැකියාව විශේෂයෙන් සීමිත ප්‍රවාහන කටයුතු සිදුවූ කාලසීමාව තුළ වාසිදායක වී ඇත. මෙම මූලපිරීම ශාඛාවල පෝලිම් සහ තදබදය අඩු කිරීමට උපකාරී වන අතර සිරිත් පරිදි ගනුදෙනු වෙනුවට මූල්‍ය උපදේශන සේවාවන්ට වැඩිපුර කාලය යෙදවීමට සේවකයින්ට ඉඩ ලැබේ. වසර තුළ නව ගනුදෙනුකරුවන් 525,501ක ඩිජිටල් යෙදවුම් සඳහා ඇතුලත්ව ඇති අතර, ලබන වසරේදී අමතර මාර්ගගත සේවාද හඳුන්වාදීමට අපි අපේක්ෂා කරමු.

අපගේ ඩිජිටල් බැංකුකරණ සේවා මෙතෙක් භාවිතා නෙකළ අංශ වෙත ලඟාවෙමින් අපගේ වෙළෙඳපොල විනිවිදයාම වැඩි කිරීමට අපට අඛණ්ඩව උපකාර කර ඇත. බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකමෙහි ශක්තිමත් බව සහ ප්‍රමාණාත්මක බව දෛනික පදනමකින් ගනුදෙනු 200,000ට වැඩි ප්‍රමාණයක් සිදුකිරීමට අපට ඇති හැකියාව මගින් සනාථ වේ. සංචාරක සීමා පැවති කාලසීමාව තුළ, අපගේ ජංගම බැංකුකරණය සහ palmtop බැංකුකරණ කණ්ඩායම් දුරස්ථ ස්ථානවලට ලඟාවී ග්‍රාමීය සහ උපනාගරික ප්‍රදේශවල පදිංචි ගනුදෙනුකරුවන් වෙත බැංකු සේවා ලබාදීමට සමත් විය.

	2022 රු. '000	2021 රු. '000
සින්නක්කර ඉඩම	64,000	-
සින්නක්කර ගොඩනැගිල්ල	18,818	183,257
කල්බදු ඉඩම මත ගොඩනැගිලි	175,087	1,328
ගෘහභාණ්ඩ	70,027	43,582
යන්ත්‍ර, උපකරණ සහ ස්වයං බැංකුකරණ ඒකක	355,512	237,557
පරිගණක	458,832	660,929
දේපල, පිරියත හා උපකරණවලට එකතු කිරීම්	1,142,275	1,126,653

ගනුදෙනුකාර ප්‍රවේශතාව

වසර තුළ අත්කර ගත් වැදගත් සන්ධිස්ථානයක් වූයේ අපගේ දැනට පවතින ඇමතුම් මධ්‍යස්ථානයට අනුපූරක වන සම්බන්ධතා මධ්‍යස්ථානයක් පිහිටුවීමයි. ඇමතුම් මධ්‍යස්ථානයක් ලෙස මුලින් සංකල්පනය කරන ලද සම්බන්ධතා මධ්‍යස්ථානය, නුදුරු අනාගතයේ දී අපගේ වෙබ් අඩවිය සහ යෙදවුම සමඟ සම්බන්ධ කරනු ඇත. මෙම අති නවීන පහසුකම මඟින් ගනුදෙනුකරුවන්ට පහසුවෙන් මූල්‍ය තොරතුරු වෙත ප්‍රවේශ විය හැකි අතර බාධාවකින් තොර අත්දැකීමක් ලබා දේ. ගනුදෙනුකරුවන් පළමුව AI චැන්ජිමක් මඟින් මෙහෙයවන තොරතුරු chatbot එකකට සම්බන්ධ කරනු ලබන අතර, නිරන්තර විමසුම්වන ප්‍රශ්න සඳහා පිළිතුරු සහිත පුළුල් දත්ත පද්ධතියකින් සමන්විත කරනු ඇත. chatbot හට විමසුම ආමන්ත්‍රණය කිරීමට නොහැකි වූ විට, ඇමතුම බාධාවකින් තොරව සම්බන්ධතා මධ්‍යස්ථානය වෙත හරවා යවනු ලබන අතර එහිදී අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විමසුම් සඳහා කඩිනම් සහ ඵලදායී විසඳුමක් ලැබෙන බව සහතික කරන මානව ක්‍රියාකරුවෙකුගේ විශේෂඥ සහාය ලබා දෙනු ඇත.

අනාගත දැක්ම

රට තුළ ඩිජිටල් බැංකුකරණ සේවාවල අපගේ මූලිකත්වය රඳවා ගැනීමට අපි ස්ථිරව කැපවී සිටිමු. අපි අපගේ යටිතල පහසුකම් සංවර්ධනය මත සිටින බැවින්, මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස ඩිජිටල්කරණයට ප්‍රමුඛත්වය දීමේ අවශ්‍යතාවය අපි හඳුනාගෙන ඇත.

අප නවෝත්පාදනයේ ඉදිරියෙන්ම රැඳී සිටින බව සහ අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත් නවීන සහ පහසු බැංකු විසඳුම් අඛණ්ඩව ලබා දෙන බව සහතික කිරීමට එවැනි ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. මෙම පරමාර්ථය සමඟ පෙළගැසී, ඩිජිටල් බැංකු ක්ෂේත්‍රය තුළ අපගේ ස්ථානය ශක්තිමත් කිරීම සඳහා ඉදිරි වසරවලදී නවෝත්පාදන මාලාවක් හඳුන්වා දීමට අපි සූදානම්ව සිටිමු.

බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය බැංකුවේ අස්පෘශ්‍ය දේපලවලින් සමන්විත වන අතර එයට සියලුම ගබඩාකළ දැනුම, කාර්ය මණ්ඩලය විසින් අත්කරගත් ප්‍රවීනත්වය, උපාය දැනුම, බුද්ධිමය දේපල, සන්නාමකරණය සහ ප්‍රතිරූපය ආශ්‍රිත දේපල, ක්‍රියාවලි, සේවක පුහුණු කටයුතු, සහ ගනුදෙනුකාර විශ්වාසය සහ පක්ෂපාතිත්වය ඇතුළත් වේ. එමෙන්ම එයට සංස්කෘතිය, සදාචාරය, නවෝත්පාදන හැකියාවන් ද ඇතුළත් වේ. දැනුම, ප්‍රවීනත්වය සහ නවෝත්පාදනය තරඟකාරී වාසි මූලශ්‍රයක් වන අතර, එය ක්ෂේත්‍රයේ රැඳී සිටීමට අවස්ථාව ලබා දෙනු ඇත.

අපගේ ප්‍රවේශය

වසර ආරම්භයේදී බැංකුවේ ප්‍රවර්ධන කටයුතු මත ආර්ථික පීඩනය, දේශපාලන ආරාවුල සහ සීමාකිරීම් හේතුවෙන්, ජනතාවතේ හදවත් සහ මනස වෙත ලඟාවීමට වඩා අවධානිත මාර්ගයක් ගැනීමට අපි තීරණය කළෙමු. අපගේ උපායමාර්ගය වූයේ මහජන බැංකුව ජනතාවගේ මනසෙහි ඉහලම ස්ථානයක රඳවා තබා ගැනීම සඳහා ප්‍රජාවට විශාල වශයෙන් උපකාර අවශ්‍ය ප්‍රදේශවල ක්‍රියාකාරකම් මාලාවක් මෙහෙයවීමයි. ඒ සඳහා ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්වල නව ඔසවා තැබීමක් ලෙස "මහජන මෙහෙවර" දීප ව්‍යාප්තව දියත් කරන ලදී. පොදු සේවා කටයුතු මඟින් සන්නාමය සජීවීව තබාගත හැකි නමුත් නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට විශිෂ්ඨ සේවයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍යය. මේ සම්බන්ධයෙන් අපගේ කාර්යසාධනය මැනීම පිණිස, අගනා ගනුදෙනුකාර අදහස් ලබා ගැනීමට සහ අපගේ කාර්යසාධන මට්ටම් වැඩි කිරීමට වසර තුළ විස්තීර්ණ පර්යේෂණ පැවැත්වූවෙමු.

ප්‍රධාන සිදුවීම්

- 2022දී ජයග්‍රහණය කළ සම්මාන සහ පිළිගැනීම් **26**
- **90%ට වැඩි** ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය
- **4.0ක** සන්නාම හිමිකම් දර්ශකය (සන්නාම මූල්‍ය)
- **A(lka)** ෆිච් ශ්‍රේණිගතකරණය
- **විදේශීය ආමුඛ සේවක ප්‍රේෂණවල** වෙළෙඳපොල කොටස දෙගුණ වීම
- ඩිජිටල් අවකාශ හරහා කාලය **99.0%**



වැදගත් තේමා

- ගනුදෙනුකාර අත්දැකීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව
- ඩිජිටල් නායකත්වය
- සමාජ ආර්ථික බලපෑම
- පාරිසරික බලපෑම
- සන්නාම හිමිකම

අභියෝග

- ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ගනුදෙනුකාර මනස සම්ප්‍රදායික විකුණුම් අවකාශයන්ට යොමුගත නොවීම.
- විදේශීය විනිමය අනුපාත වෙනස් වීම හා නිල නොලත් මාර්ගවලින් ලබා දුන් දිරි දීමනා හේතුවෙන් බැංකු හරහා සිදුකල විදේශ ප්‍රේෂණ පහළ වැටීම.
- ආර්ථික තත්ත්වය ව්‍යාපාර අවස්ථාවන්ට බාධා කර තිබීම.

අවස්ථා

- ප්‍රජා සේවා ව්‍යාපෘති තුළින් ගනුදෙනුකරුවන්ගේ සහ ජනතාවගේ විශ්වාසය සහ ලැදියාව දිනා ගැනීම.
- නව ගනුදෙනුකාර අංශ වෙත ළඟා වීමට සේවා අනර්ඝත්වය වැඩි කිරීම.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

ක්ෂේත්‍රය, නව්‍යකරණය සහ යටිතල පහසුකම්

කෙෂේත්‍රය ඩිජිටල්කරණය තුළ ආයෝජනය සහ දිගුකාලිනව පද්ධති සහ ක්‍රියාපටිපාටි වර්ධනය හා නවෝත්පාදන සහ යටිතල පහසුකම් මත ධනාත්මක බලපෑමක් ඇති කිරීම.

වගකීම්සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය

පද්ධති සහ ක්‍රියාපටිපාටි යාවත් කිරීම මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ බලය, ජලය සහ වෙනත් සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය කරයි.

සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

ශක්තිමත් පාලනය, අනුකූලතා රාමුව සහ සදාචාර හැසිරීම තුළින් ශක්තිමත් ආයතනයක් ගොඩ නැගීම.

නිර්මාණය කළ වටිනාකම

ගනුදෙනුකරුවන්ගේ
තෘප්තිය 90%ට වැඩිය.

වාසිදායක ගනුදෙනුකාර කොටසට ලබාදීමට නව සන්නාම දෙකක් නිර්මාණය කිරීම:

- Elegance –
  ඉහළ වටිනාකම් සහිත පුද්ගල ගනුදෙනුකරුවන් සඳහා
- Excelsior –
  ඉහළ වටිනකමේ වෘත්තිමය වැටුප් උපයන්නන් සඳහා

ප්‍රාග්ධන සම්බන්ධතා

බාහිරව ගනුදෙනුකරුවන් සමඟ සහ අභ්‍යන්තර පරිපාලනය සඳහා කඩදාසි රහිත ක්‍රියාවලි සඳහා විතැන්වීම.

ස්වභාවික ප්‍රාග්ධනය

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ඵලදායී සන්නිවේදනය තුළින් ගනුදෙනුකාර පක්ෂපාතිත්වය සහ සහභාගිත්වය වර්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය

නව සන්නාමකරණ උපායමාර්ග තුළින් වාසිදායක වෙළෙඳපොල අංශ ඇගයීම සහ ඩිජිටල්කරණය තුළින් කාර්යක්ෂමතාව වැඩි කිරීම.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ඩිජිටල්කරණයේ අඛණ්ඩ වර්ධනය

මානව ප්‍රාග්ධනය

වසර ආරම්භයේදී සීමාකිරීම් මගින් පීඩාවටපත් පුහුණු කටයුතු නැවත ආරම්භ කිරීම සහ වැඩි කිරීම සහ සම්ප්‍රදායික කාර්යස්ථ පුහුණුවට අතිරේකව ඉ-ඉගෙනුම් වැඩසටහන් කරා විතැන්වීම.

සන්නාම කටයුතු

මහජන බැංකුව බොහෝ දුරට එකට ගැලපෙන ප්‍රවේශයක් හරහා වසර 61 ට වැඩි කාලයක් පුරා ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවා රාශියක් පිරිනමමින් සිටින අතර එහිදී විශේෂ ගනුදෙනුකාර අංශ නොසලකා නිෂ්පාදන පිරිනැමීම් සමරූපී වී ඇත. කෙසේවෙතත්, ඉතිරි ක්ෂේත්‍රය තුළ සංවර්ධනයන් සමඟ, අපට මෙම ප්‍රවේශය නැවත සලකා බැලීමට සිදු වී ඇත. Elegance මධ්‍යස්ථාන හඳුන්වා දුන් අතර, එහිදි වඩා විශේෂිත සේවාවක් තුළින් ඉහළ වටිනාකමේ ගනුදෙනුකරුවන් වෙත එම නිෂ්පාදන පිරිනැමීම් අපි සිදු කර ඇත. මෙම උපායමාර්ගය තුළින් වෙළෙඳපොල ඉහළ අන්තයක දී සහ ලාභදායී ගනුදෙනුකාර අංශය අතර ගනුදෙනුකාර පක්ෂපාතිත්වය නිර්මාණය කිරීමට අපි උත්සාහ ගනිමු. වෙනස්වන සන්දර්භය තුළ, හඳුනාගත් වෙළෙඳපොල අංශයේ විශේෂ අවශ්‍යතා ඉටු කිරීමට, දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට මෙන්ම මතුවට නව ගනුදෙනුරුවන් ආකර්ෂණය කර ගැනීමට මනාව නිශ්චිත නිෂ්පාදන පිරිනැමීම් නිර්මාණය කිරීම වැදගත් විය.

අපගේ අඛණ්ඩ වෙළෙඳපොල පර්යේෂණවල කොටසක් ලෙස, අභිරහස් ගනුදෙනුකාර සේවා සමීක්ෂන දෙකක් පැවැත් වූ අතර මින් එකක් අවබෝධය සහ ආකල්ප සමීක්ෂණයක් වන අතර අනෙක ශුද්ධ ප්‍රවර්ධන ලකුණු සමීක්ෂණයකි. මෙම ප්‍රතිඵල අදාළ ශාඛා සහ ප්‍රාදේශීය කළමනාකරුවන්ට ඔවුන්ගේ මිලදී ගැනීම් සහතික කිරීමට සහ ඉහළ කාර්යසාධන මට්ටම් අත්කර ගැනීමට මූලික කාර්යසාධන දර්ශන සමඟ සම්බන්ධ කර ඇත.

අපි ඉහළ අන්ත ගනුදෙනුකරුවන් සඳහා නිෂ්පාදන පිරිනැමීම් දෙකක් හඳුන්වා දුන් අතර වෙළෙඳපොල කොටස අත්කර ගැනීම පිණිස ජන මාධ්‍ය සහ ඩිජිටල් සන්නිවේදන තුළින් අපි ඔවුන් මෙන්ම අපගේ සම්ප්‍රදායික ගනුදෙනුකරුවන් ඉලක්ක කිරීමට අදහස් කරමු. මෙම ප්‍රවේශය තුළින් බැංකුවට පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබී ඇත.

- ප්‍රවර්ථන ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධතාවල ශක්තිය රඳවා ගැනීම හා වැඩිදියුණු කිරීම.
- ඉහළ වටිනා තැන්පතු සම්බන්ධතා ගනුදෙනුකාර පදනම වර්ධනය කිරීම.
- බැංකුවේ වෙනත් නිෂ්පාදන සාර්ථකව හරස් විකුණුම් කර ගැනීම.

මෙම වසර අපගේ පුළුල් ශාඛා ජාලය තුළ අපගේ සන්නාමකරණය ශක්තිමත් කිරීමට තව පියවරක් ගෙන ඇත. ශාඛා ජාලයේ සෑම ශාඛාවකට ම දෘෂ්‍යමාන සන්නම් උපාංග සහ භෞතික ගති ලක්ෂණ නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී. ඒ තුළින් ගනුදෙනුකරුවන් අපේක්ෂා කරන දෑ දැනුවත් කරන අතර රට තුළ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ඔවුන් යාමේදී හුරු පුරුදු සහ පහසුවක් දැනෙනු ඇත.

සන්නාම යාවත් කිරීමේ කොටසක් ලෙස සාමාන්‍ය තොරතුරු වලට අමතරය ඩිජිටල් බැංකුකරණයට පිවිසීම පිළිබඳ තොරතුරු සහ උපදෙස් සමඟ අපගේ පුළුල් පරාසයක් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට භාෂා තුනෙන් නව වෙබ් අඩවියක් අපි දියත් කර ඇත. අපගේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුමක් හඳුන්වා දී ඇති අතර එය දැනට ස්ව කැමැත්ත මත වන නමුත් කාලයත් සමඟ එයට අනුගත වනු ඇති බව අපට විශ්වාසය.

සන්නාම කාර්යසාධනය

අපගේ සන්නාම කාර්යසාධනය 2022 දී මූලික කාර්යසාධන දර්ශක ගණනාවකින් අඛණ්ඩව වර්ධනය වී ඇත:

සන්නාම කාර්යසාධනය	2022	2021
සන්නාම හිමිකම	4.0	3.8
සන්නාම දැනුවත් භාවය (%)	36	36
ගනුදෙනුකාර තෘප්තිය (%)	91	90

2021 දී, බැංකුව 80.9 සන්නාම ශක්තියක්, රු.බි. 44.75ක සන්නාම වටිනාකමක් සහිත AAA ශ්‍රේණිගත කිරීමේ විය.

ආයතන සංස්කෘතිය

"ජාතියේ අභිමානය" ලෙස, අපගේ දැක්ම, මෙහෙවර සහ මූලික සාධර්ම වලින් පාදක වූ වටිනාකම පදනම් සංස්කෘතියක් තුළ අපි මුල් බැස ඇත. දැනුම, දිරිගැන්වීම, නව අදහස් පෝෂණය කරන, නව්‍යකරණයට සහයවන සංස්කෘතියක් අපි පෝෂණය කරමු. අපගේ සංස්කෘතිය සියලු තරාතිරකම ගනුදෙනුකරුවන්ට සේවය කිරීම, ඔවුන්ගේ විවිධ අවශ්‍යතා ලබාදීම සඳහා පහසුකම් සපයයි. සියලුම අභ්‍යන්තර පාර්ශවකරුවන් අතර විවෘත සන්නිවේදනය සහ විනිවිදභාවය අපි ප්‍රවර්ධනය කරන අතර රැකියාවේ වගකීම් මත වගකීම් කෙරෙහි වඩා ඉහළ අවධාරණයන් තබමු. දශක හයක දැනුම, ප්‍රවීනත්වය සහ දේශීය බැංකුකරණ ගනුදෙනුකරුවන් මත පදනම් වෙමින්, මනස සහ අවශ්‍යතා පිළිබඳ අසමසම අවබෝධය තුළින්, මහජන බැංකුව සේවකයින්ට ඉගෙනීමට නිදහස ලබාදෙන අතරම සේවකයාගේ හැඟීම ආරක්ෂිත සහ විශ්වාසී අවස්ථාවේ පමණක් නවෝත්පාදන සිදුවන බවට අවබෝධය සමඟ වර්ධනය වීමට කටයුතු කරන සහ අසමත්වීමට බියනැති සංස්කෘතියක් අපි පෝෂණය කර ඇත. කණ්ඩායමේ කැපිපෙනෙන කාර්යසාධනයන් පෙන්නුම් කරන සේවකයින්ට ඇගයීම් සහ විධිමත්ව අගය කර ප්‍රදාන ලබාදෙන අතර, බැංකුව අතර බෙදාහරින ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ මාසික ප්‍රධාන ලිපි සටහනේ එම කාර්යසාධනය සටහන් කිරීමෙන් නව සන්ධිස්ථාන සනිටුහන් කරයි.

ආයතනික දැනුම

අපගේ සේවකයින්ගේ සාමුහික දැනුම සහ පළපුරුද්ද අපගේ මෙහෙයුම්වල වඩාත් සැලකියයුතු සම්පතකි. අපගේ දශක හයක මෙහෙයුම් කාලය තුළ, ආධුනිකයින්ගේ සිට දිගු සේවාවක් සහිත කාර්ය මණ්ඩලයකින් සමන්විත ශ්‍රම්බලකායක් සමඟ ප්‍රවීනත්වය සහ පළපුරුද්ද පිළිබඳ සමකළ නොහැකි සංචිතයක් නිර්මාණය කර ඇත. දැනුම් හුවමාරු සැසි, විස්තීර්ණ පුහුණු සහ මානව ප්‍රාග්ධන කළ විශේෂිත ප්‍රවීනත්වය ඇතුළුව මෙම අසමසම විශේෂඥතාව සහ අත්දැකීම් සමූහය ලේඛනගතකර හුවමාරු කිරීමට අපි උත්සාහ ගනිමු. මෙම ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය තුළ නිහඬ දැනුම පැහැදිලි දැනුමකට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍යය.

සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද අනුව අපගේ සේවකයින්ගේ විවිධත්වය වැදගත් තරඟකාරී වාසියක් ලෙස සලකනු ලබයි. 97.6%ක් වන අපගේ ඉහළ සේවක රඳවා ගැනීමේ අනුපාතය තුළින් උත්තේජනය කරන සොයා ගැනීමට අපහසු සහ රඳවා ගැනීමට අපහසු දක්ෂතා ඇතුලත් ගෞරවනීය සහ පෙළඹූ වූ සේවා ස්ථානයන් පෝෂණය කිරීම තුළ අපගේ සාර්ථකත්වය පෙන්නුම් කරයි. එමෙන්ම එය අපගේ ආයතනික දැනුම් පදනම් නැවත ශක්තිමත් කරයි. ජ්‍යේෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු, නිෂ්පාදන කලමනාකරු – කාඩ් ව්‍යාපාර සහ ප්‍රධාන තොරතුරු නිලධාරී ඇතුළත් විධායක මට්ටමේ සහ ආයතනික කළමනාකාරිත්වයේ ප්‍රධාන බඳවා ගැනීම් ගණනාවක් අපගේ සාමුහික ආයතනික දැනුමට එකතු කරමින් සමාලෝචිත වසර තුළ සාර්ථකව නිම කරන ලදි.

සුදුසුකම්	සේවකයින් ගණන
MSc/MBA/ පශ්චාත් උපාධි	622
ශාස්ත්‍රවේදී/ විද්‍යාවේදී (BA/BSc)	1,645
CIMA/CFA/CMA/ CA Sri Lanka/බැංකුකරණ	1,800
නීති පිළිබඳ සුදුසුකම්	89
IT පිළිබඳ සුදුසුකම්	306
ඩිප්ලෝමා සහ වෙනත්	4,240
මුළු ගණන	8,702

විවිධ සුදුසුකම් සහිත අය ඇතුළත් කර ඇති බවට සැකයක් නොමැත.

ව්‍යාපාර අචාරධර්ම

ව්‍යාපාර අචාරධර්ම, අවංකකම, විනිවිදභාවය, සහ වගවීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපි කැපවී සිටිමු. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සෑම දිනකම බැංකුවේ සෑම අංශයකම මෙවැනි අංග ක්‍රියාවේ යොදවන පරිසරයක් ස්ථාපිත කිරීමේදි පෙරමුණ ගනී. අපගේ සේවකයින් ඔවුන්ගේ වගකීම්වල හිමිකාරත්වය භාර ගනිමින් සහ සියලුම අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දක්වමින් සිය වෘත්තීය කටයුතු ඉටු කිරීමේ වගකීම දරනු ලබයි. අපගේ දැඩි විගණන සහ අනුකූලතා ක්‍රියාවලි අප ලබාගෙන ඇති ශ්‍රේණිගතකිරීම් තුළින් පිළිබිඹු කෙරේ. කරුණාකර අපගේ විස්තරාත්මක පාලන රාමුව සඳහා 170 පිටුව බලන්න. සමාලෝචිත වසර තුළ, මහ බැංකුවේ මූල්‍ය තොරතුරු ඒකකය (FIU) 2007 සහ 2016 වසරවල ගනුදෙනුකරුවන් දෙදෙනෙක් හඳුනා ගැනීමේදී මෙහෙයුම් දෝෂ හේතුවෙන් බැංකුව මත රුපියල් මිලියන 2ක දඩමුදලක් පනවන ලදි. මෙයට පසු, බැංකුව මෙහෙයුම් පාලනය තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. ඉහත FIU දඩමුදල හැර අනෙකුත් සියලුම නීති හා රෙගුලාසිවලට බැංකුව එකඟ වී ඇත.

නව්‍යකරණය

අපගේ තරඟකරුවන්ගෙන් මහජන බැංකුව වෙනස්වන හේතුව වන්නේ අපගේ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමට සහ සම්ප්‍රදායිකව උරුම බැංකුකරණ ක්‍රම කඩාබිඳ දැමීමට මෙන්ම වේගයෙන් වෙනස්වන ගනුදෙනුකාර සහ ව්‍යාපාර අපේක්ෂාවන් සපුරාලීමට අප අඛණ්ඩව නව්‍යකරණයේ වාසිය ලබාගැනීමයි අපි නව්‍යකරණය පිළිබඳ ඉහළ වටිනාකමක් තබන අතර, ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුම වෙත නවීන හා උසස් බැංකුකරණ විසඳුම් තුළින් මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය ලබාදීමේ අපගේ විධි නියෝග ලබා දීම තුළ නිර්දය ලෙස හඹා යන්නෙමු, මෙය ශ්‍රී ලංකාවේ මෙතෙක් පළමු නව්‍යකරණ මධ්‍යස්ථානය සඳහා පුරෝගාමී විමට අපව මෙහෙය වූ අතර, ඒ තුළින් අපගේ නව්‍යකරණ ගමන්මඟ සහ ඩිජිටල් මූලපිරිම් ශක්තිමත් කරනු ඇත. අපි අඛණ්ඩව අවකාශ සංවර්ධනය කරන අතර සමහර ගෝලීය විශිෂ්ඨ බැංකු සමඟ සමානව මහජන බැංකුව ස්ථානගත කිරීමට අතිනවීන බැංකුකරණ විසඳුම් දියත් කරමින් ජාත්‍යන්තරව දැනුවත් බැංකුකරණ පුරවැසියන් පෝෂණය කරමු.

ඩිජිටල්කරණය

මහජන බැංකුව 2015 දී අභිලාෂකාමී ඩිජිටල්කරණ මූලපිරීම ආරම්භ කළ අතර බැංකුවේ නිෂ්පාදන සහ සේවා ගෝලීය ක්ෂේත්‍රයේ මංසලකුණු දක්වා උසස් කිරීමට සහ ඉදිරි බැංකුකරණ ගනුදෙනුකාර පරම්පරාවේ අපේක්ෂාවන් සපුරාලීමට ඩිජිටල් හැකියාවන් තුළ ආයෝජනය කිරීමට යොදා ගෙන ඇත. මෙම පූර්ව වසංගත දුර දැකීම තුළ අපගේ උත්සාහයන් පිළිගැනීම සහ දේශීය සහ විදේශීය වශයෙන් ප්‍රසංසා කිරීම සමඟ ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් බැංකුකරණයේ පුරෝගාමියා වීමේ සන්නාම කීර්තිනාමය මහජන බැංකුව වෙත වර්තමානයේ පිරිනමා ඇත. අපගේ ඩිජිටල්කරණ ගමන්මඟ පිරිවැය ඉතුරුම් අත්කර ගැනීමට, ක්‍රියාවලි වර්ධනයට, පුනරාවර්තන කාර්යයන් ස්වයංක්‍රිය කිරීමට, සහ භෞතිකව ශාඛා පුළුල් කිරීමට කිසිදු ආයෝජනයක් සිදු නොකර ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීමට අපව ශක්තිමත් කර ඇත. මෙය එක් සේවකයෙකුගේ ආදායම තුළ පිළිබිඹු කර ඇති අතර, එය 2021 දී පැවති රුපියල් මිලියන 27.4 සිට 2022 දී රුපියල් මිලියන 48.4 දක්වා වැඩි වී ඇත. සම්ප්‍රදායික බැංකුකරණ ගනුදෙනුවලින් 73% කට වඩා වර්තමානයේ අපගේ ඩිජිටල් මාර්ගවලින් සිදු කරනු ලබන අතර අපගේ ජංගම යෙදුම් සහ අන්තර්ජාල බැංකුකරණය තුළින් සිදු කරන ගනුදෙනුවල වටිනාකම 2021 දී රුපියල් බිලියන 601.3 සිට 2022 දී රුපියල් බිලියන 804.43 දක්වා වැඩි වී ඇත.

පරිගණක මාදුකාංග සහ දෘඩාංගවල අපගේ ආයෝජනය සමාලෝචිත වසරේදී රුපියල් බිලියන 2.7 ඉක්මවා ඇති අතර එයට හේතුව අපගේ ගනුදෙනුකරුවන් සඳහා බාධා රහිත සර්වමාර්ග අත්දැකීමක් නිර්මාණය කිරීමට නව කාර්යයන් සහ යෙදුම් ක්‍රියාත්මක කර ක්‍රියාවට නැංවීමයි. සියලුම කාර්යයන්, අභ්‍යන්තර ක්‍රියාවලි සහ ගනුදෙනුකාර අතුරු මුහුණත ඩිජිටල්කරණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

වසර තුළ සාක්ෂාත් කරගත් ප්‍රධාන සංවර්ධිස්ථාන තුනක් ඇත:

- සත්‍යාපනය සඳහා ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) සහ v-KYC (විඩියෝ KYC) භාවිතා කරමින් මහ බැංකුවේ මාර්ගෝපදේශ පිළිපැදීම තුළ ගනුදෙනුකරුවන් ඩිජිටල් ආකාරයෙන් ඇතුළත් කර ගැනීම හඳුන්වා දෙන ලදි. ජාතික හැඳුණුම්පත් (NIC) හිමි මෙරට හෝ විදේශයන්හි ඕනෑම ගනුදෙනුකරුවෙක් සඳහා මාර්ගගතව ගිණුම් විවෘත කිරීමට මෙයින් අවස්ථාව උදා වනු ඇත. ගනුදෙනුකරු අවශ්‍ය පුද්ගලික විස්තර, ජායාරූපය, සහ ජාතික හැඳුණුම්පතේ සහ අවශ්‍ය ලියවිලිවල පිටපත් උඩුගත කිරීම සිදුකළ යුතු අතර සත්‍යාපන සම්මූඛ පරීක්ෂණයක් සඳහා බැංකුවේ නියෝජිතයෙක් සමඟ විඩියෝ ඇමතුමක් සඳහා කාලයක් ඉල්ලා සිටිය යුතුය. ඔහුගේ හෝ ඇයගේ ගිණුම විවෘත කිරීමේ අයදුම්පතේ ගනුදෙනුකරුගේ වාර්තාගත තොරතුරු පරීක්ෂා කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ බැංකුවට ඉන් අතුරු මුහුණතක් ඇත. ඉන්පසු වීඩියෝ ඇමතුම් සත්‍යාපනය සම්පූර්ණ කරන අතර ගිණුම් විවෘත කරනු ලබයි.
- ණය තොරතුරු කාර්යාංශයෙන් (CRIB) i-වාර්තාවක් භාගත කිරීමේ පහසුකම් පීපල්ස් පේ යෙදුම හරහා සලස්වා ඇත.
- බැංකුවට වඩාත් පුද්ගලගත ඉහළ තත්ත්වයේ සේවාවක් ලබාදීමේ හැකියාව ඇති කිරීමට සහ ඒතුළින් වෙළෙඳපොල කොටස ලබා ගැනීමට එක් එක් පුද්ගලික ගනුදෙනුකරුවාගේ අවශ්‍යතා සහ ඕනැවිපාකම් ලබාදීම සඳහා විස්තීර්ණ ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදි.

අනාගතයේද අපගේ යෙදුම් තුළින් පෙවමිති තොරතුරු භාවිතය ඒකාබද්ධ කිරීමට අප අපේක්ෂා කරන අතර තත්කාල දළ නිරවුල් කිරීම (RTGS) ක්‍රියාත්මක කිරීම හඳුන්වා දෙමු.

අපගේ ශාඛාවල භෞතික ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය ද කඩදාසි ලියවිලි භාවිතා නොකර සිදුකරන අතර, සියලුම තොරතුරු ලබාගත හැකිනම් එම ක්‍රියාවලිය මිනිත්තු 6-8ක් අතර සම්පූර්ණ කළ හැකිය. මෙම ක්‍රියාවලිය බැංකු නිලධාරියා විසින් පෙට්ටි කිහිපයක් සලකුණු කිරීමෙන් පමණක් පාරිභෝගිකයාට අදාළ ඕනෑම

අංගයක් හෝ සේවාවක් එකවර විකිණීමට හැකි වන පරිදි නිර්මාණය කර ඇත. පසුගිය වසර තුළ, අපගේ නව ගනුදෙනුකරුවන්ගෙන් 90%ක් Gen Z වූ අතර සියලු ගනුදෙනුවලින් 70%ක් ඩිජිටල් වශයෙන් සිදුකර ඇත.

ජාත්‍යන්තර ව්‍යාපාර සඟරාව විසින් **2022 දී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ඩිජිටල් බැංකුව ලෙස සම්මානයට පාත්‍ර විය.**

ශ්‍රී ලංකාවේ **පළමු සම්පූර්ණ ඩිජිටල්කරණය කළ ශාඛාව**

ශ්‍රී ලංකාවේ **පළමු බැංකු තොරතුරු තාක්ෂණ නවෝත්පාදන මධ්‍යස්ථානය**

තොරතුරු ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සඳහා ඉහළම ජාත්‍යන්තර පිළිගැනීම ලද **ශ්‍රී ලංකාවේ පළමු රජයේ බැංකුව** – ISO/IEC 27001: 2013 සහතිකකරණය

පීපල්ස් වේව්

- ශ්‍රී ලංකාවේ **වැඩියෙන්ම භාගත කළ** පාරිභෝගික ජංගම යෙදුම්වලින් එකකි.
- 2017 දියත් කිරීමේ සිට **මිලියන 2.1ට වැඩි** භාගත කිරීම්.
- ගනුදෙනුකරුවන්ට දුරස්ථව විවිධ බැංකුකරණ පහසුකම් **50කට වැඩි ප්‍රමාණයක්** කරගෙන යාමට ඉඩ ලබා දේ.
- මූල්‍ය අන්තර්කරණය ඉදිරියට සිදුකර ගෙනයාමට සැලකියයුතු දායකත්වයක් ලබාදී ඇත.
- මාසික සාමාන්‍යය – **ආසන්න වශයෙන් 50,000ක** භාගත කිරීම් සහ **රුපියල් බිලියන 28.7ක්** වටිනා **මිලියන 1.4ට වැඩි** ගනුදෙනු ප්‍රමාණයක්.

පීපල්ස් වින්

- ආයතනික සේවාදායකයින් සඳහා **විශේෂයෙන් සැලසුම්කළ** ජංගම බැංකුකරණ යෙදුම.
- ගනුදෙනුවලට අමතරව **ගනුදෙනුවලට අවසරදීම** සිදුවේ.
- උපයෝගිතා සපයන්නන්ට **ආයතන ගෙවීම්** පහසුකම් ලබාදේ.
- 2018 දියත් කිරීමේ සිට භාගත කිරීම් 76,000

පීපල්ස් වෙබ් – පාරිභෝගික

- පීපල්ස් වේව් හි ලබාගතහැකි සියලුම ලක්ෂණවලට අමතරව පාරිභෝගික බැංකුකරණ විශේෂාංග ගණනාවක් ලබාදේ.
- වසර අවසානයට ලියාපදිංචි ගනුදෙනුකරුවන් **මිලියන 1.4ට වැඩිය.**
- මාසිකව රුපියල් බිලියන 5.6ක වටිනාකමට ගනුදෙනු **88,000ට ආසන්නව.**

පීපල්ස් වෙබ් – ආයතනික

- පීපල්ස් වින් හි ලබාගත හැකි ඒවාට අමතරව ආයතනික බැංකුකරණ විශේෂාංග ගණනාවක් පිරිනමයි
- සක්‍රිය පරිශීලකයින් **16,358ක්** සමඟ ගනුදෙනුකරුවන් **9,716**
- ආසන්න වශයෙන් **රුපියල් බිලියන 31** ක වටිනාකමට මාසිකව සිදුකළ ගනුදෙනු සාමාන්‍යය **21,000**
- Lankapay SLIPS, සහ RTGS තුළින් බැංකු අතර අරමුදල් මාරු කිරීමට ඉඩ ලබාදීම.
- කඩදාසි රහිත වෙළෙඳ මූල්‍ය ගනුදෙනු සහ උපයෝගිතාවන්ට ගෙවීම් පහසුකම් සලසයි.

පීපල්ස් විස්

- අග්නිදිග ආසියාව, අප්‍රිකාව සහ මැද පෙරදිග **මේ දක්වා පළමු** තත්‍ය-කාල ඩිජිටල් ගනුදෙනුකරුවන් ඇතුළත් කරගැනීමේ බැංකුකරණ යෙදුම
- විවිධ සේවා සහ අංග සහිත ගිණුම් විවෘත කිරීමට පහසුකම් සලසන **කඩදාසි රහිත** ක්‍රියාවලිය
- බැංකුකරණ සේවා සඳහා දුරස්ථ ප්‍රවේශය සහිතව කොවිඩ්-19 වසංගත කාලය තුළ අත්කරගත් **කාලය – සහ – පිරිවැය ඉතුරුම්**
- හරිත බැංකුකරණ දැක්මට දායක වීමට කඩදාසි භාවිතය සැලකිය යුතු ලෙස පහත දැමීම.
- 2017 ජූලි දියත් කිරීමේ සිට ඇතුළත් කරගත් ගනුදෙනුකරුවන් ගණන **මිලියන 2.7**

පීපල්ස් විස් ක්‍රෙඩිට් – පාරිභෝගික ණය උත්පාදන පද්ධතිය (RLOS)

- අතින් සිදුකළ ක්‍රමය වෙනුවට **උසස්** පාරිභෝගික ණය පිරිසැකසුම් ක්‍රමය
- අයදුම් පත්‍රයේ සිට පශ්චාත් බෙදාහැරීම දක්වා **අවසන්වන** ක්‍රියාවලිය
- මූලික ඉල්ලීමෙන් **පැය ගණනක් ඇතුළත** පිරිසැකසුම් කළ පුද්ගලික ණය
- 2022 අවසානයේදී **ශාඛා 300ක** ක්‍රියාත්මක කිරීම.

පීපල්ස් විස් ක්‍රෙඩිට් – ආයතනික ණය උත්පාදන ක්‍රමය (CLOS)

- **අවසානය දක්වා** ඩිජිටල්කරණය කළ ව්‍යාපාර ණය උත්පාදන ක්‍රමය
- ව්‍යාපාර **රාශියක්** සඳහා **විවිධ** නිෂ්පාදන වර්ග සමඟ තනි ණය පහසුකම් සහ ණය පැකේජ හැසිරවීම.
- 2022 අවසානයේදී **ශාඛා 82ක** ක්‍රියාත්මක කිරීම.

පීපල්ස් පේ – වොලට් යෙදුම

- උසස් ත්‍රිභාෂා පරිශීලක හිතකාමී අතුරුමුහුණත සමඟ 2021 ඔක්තෝබර් මස V2.0 දියත් කිරීම.
- ජෙවමිති සහ ස්වයං ලියාපදිංචි කිරීම ඇතුළත්ය.
- තත්‍ය කාලීනව මාර්ගගතව ගෙවීයයුතු මුදල ගනුදෙනුකරුවන්ට ලබාදීමට උපයෝගිතා සේවා සපයන්නන් සමඟ හවුල්වීම.

පීපල්ස් පේ – වෙළෙඳ මොඩියුලය

- තත්‍ය කාලයට පරිවර්තනය වීම සඳහා කුඩා ව්‍යාපාර දිරි ගැන්වීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වේගවත්, ආරක්ෂිත සහ අඩු ගාස්තු ඩිජිටල් ගෙවීම් ලබාදීම.
- 2022 අවසානය වන විට, ලියාපදිංචි වෙළෙඳුන් 52,000ට වැඩිය.

පීපල්ස් පේ – දුරස්ථ ඇතුළත් කිරීමේ මොඩියුලය

- පීපල්ස් පේ යෙදුම විසින් හඳුන්වාදුන් මුහුණට – මුහුණ සම්මුඛ නොවන ඩිජිටල් ගනුදෙනුකාර හඳුනා ගැනීම සහ සත්‍යාපන ක්‍රියාවලිය.
- ලොව ඕනෑම තැනක සිට ගනුදෙනුකරුවන්ට ඩිජිටල් ආකාරයෙන් ඇතුළත්විය හැකිය.

සම්මාන

ලෝකයේ ඉහළම බැංකු 1000 – ද බෑන්කර් සඟරාව

- මහජන බැංකුව කීර්තිමත් ලෝකයේ ඉහළම බැංකු 1000 අතර ශ්‍රේණිගතකර ඇත.

ජාත්‍යන්තර ARC සම්මාන 2022

- ලිඛිත අන්තර්ගතය සඳහා රන් සම්මානය – බැංකු – ජාතික
- මූල්‍ය දත්ත සඳහා රන් සම්මානය – බැංකු – ජාතික
- පිටකවර ඡායාරූපය සැලැස්ම සඳහා ලෝකඩ සම්මානය: – බැංකු – ජාතික



ලංකා පේ ටෙක්නෝවේෂන් සම්මාන

- LankaQR හරහා පාරිභෝගික ගෙවීම් සඳහා "විශිෂ්ඨතම ජංගම යෙදුම" සඳහා රන් සම්මානය (බැංකු සහ බැංකු නොවන)
- මූල්‍ය ආයතනය – පීපල්ස් පේ මොබයිල් බැංකුකරණ යෙදුම

ගෝලීය බැංකුකරණය සහ මූල්‍ය සමාලෝචනය

- විශිෂ්ඨතම ආයෝජන බැංකුව 2022 – ශ්‍රී ලංකාව

- විශේෂ වාර්ෂික වාර්තාව: ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සහ ආයතනික සමාජ වගකීම් සම්ප්‍රදායික නොවන ආකෘතිය – ගෞරවයට පාත්‍රවීම.

දකුණු ආසියානු ගණකාධිකාරීන්ගේ සංගමයේ (SAFA) සම්මාන

- මහජන බැංකුවේ 2021 වාර්ෂික වාර්තාව – රාජ්‍ය අංශයේ බැංකු වර්ගීකරණයේ හවුල් ලෝකඩ සම්මානය

ඒකාබද්ධ වාර්තාකරණය තුළ CMA විශිෂ්ඨත්ව සම්මාන 2022

- මහජන බැංකු 2021 වාර්ෂික වාර්තාව විශිෂ්ඨතම ඒකාබද්ධ වාර්ෂික වාර්තා දහයෙන් එකකි.

TAGS සම්මාන 2022 – CA ශ්‍රී ලංකා

- රාජ්‍ය බැංකු වර්ගීකරණයේ ලෝකඩ සම්මානය: කුඩා වේදිකාවක් බවට පත්වූ ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය අංශයේ බැංකුව වීම.

Satynmag CIMA කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මාන (WFWP සම්මාන) 2022

- කාන්තාවන් සඳහා ශ්‍රී ලංකාවේ වඩාත්ම යෝග්‍ය සේවා ස්ථානවලින් එකකි.

ආසියානු ඩිජිටල් මූල්‍ය සංසදය සහ සම්මාන

- විශිෂ්ඨතම ජංගම ඉලෙක්ට්‍රොනික ගෙවීම් මුලපිරීම – පීපල්ස් වේව් ජංගම බැංකු යෙදුම



විශිෂ්ඨතම කළමනාකරණ ව්‍යවහාරය

- ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය

ජාත්‍යන්තර ව්‍යාපාර සඟරාව

- ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ඩිජිටල් බැංකුව 2022

Bizz Hybrid සම්මාන 2022

- ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මානය

ගෝලීය වකපාර සමාලෝචන සඟරා සම්මාන 2022

- ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රතිචාරාත්මක බැංකුව 2022
- ශ්‍රී ලංකාවේ වඩාත්ම පාරිභෝගික ඩිජිටල් බැංකුව 2022
- ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංවර්ධන බැංකුව 2022

ගෙවීම් හවුල්කාර කාර්යසාධන සම්මාන 2022 – ඩරාස්

- විශිෂ්ඨතම පරිවර්තන බැංකුව
- විශිෂ්ඨතම හරපත් වර්ධනය

බැංකුවක් ලෙස අපගේ පරිණාමය සහ අපගේ නිෂ්පාදන, සේවා, පද්ධති සහ පරිචයන් අපගේ ගනුදෙනුකරුවන්ට විශිෂ්ටත්වය වනම් වඩා කාර්යක්ෂම අගනා ප්‍රතිඵල ලබාදෙන බැංකුකරණ අත්දැකීම බෙදාහැරීම සඳහා අපගේ අඛණ්ඩ ආයෝජන හඳුනා ගන්නා සම්මාන, ඇගයීම් සහ පිළිගැනීම් සමඟ අපගේ කාර්යසාධනය සඳහා පිළිගැනීමට ලැබීම පිළිබඳව අපි ආඩම්බර වෙමු. මහජන බැංකුව සහ එහි කණ්ඩායම සමාලෝචිත වර්ෂය තුළ දේශීය හා ජාත්‍යන්තර සම්මාන රැසක් දිනා ගත් අතර, එහිදී බැංකුව තුළ අපගේ උපාය මාර්ගික ඩිජිටල්කරණ ව්‍යාපාරය වෙනුවෙන් ඉහළ පිළිගැනීමක් ලැබිණි.



දිවයින පුරා **ඩිජිටල් ගනුදෙනුකරුවන් මිලියන 2.7** දක්වා වැඩි විය.



බැංකුවේ සම්ප්‍රදායික බැංකුකරණ ගනුදෙනුවලින් 73%ට වඩා ඩිජිටල් මාර්ගවලින් සිදුකර ඇත.



පීපල්ස් වේ වී යෙදුමේ මාසික සාමාන්‍ය භාගතකිරීම **50,000කට ආසන්නය.**

පීපල්ස් වේ වී යෙදුම මත මාසිකව සිදුකළ මූල්‍ය ගනුදෙනු **මිලියන 1.4 කට වැඩිය.**



2022 දෙසැම්බර් අවසන් වන විට **ඩිජිටල් තැන්පතු රුපියල් බිලියන 551.9 ඉක්මවා ඇත.**

ඩිජිටල් තැන්පතු මාසික සාමාන්‍යය **රුපියල් බිලියන 45.9**



පීපල්ස් විස් සිල්ලර ණය උත්පාදන පද්ධතිය ශාඛා 300ක දියත් කරන ලදී.



මහජන බැංකුවේ QR ගෙවීම් පහසුකම සමඟින් **52,000කට අධික වෙළෙඳුන්** ලියාපදිංචි වී ඇත.

අනාගත දැක්ම

අනාගත විභවය පවතින සහශ්‍ර වර්ෂ සහ Z, පරම්පරාව යන තරුණ ගනුදෙනුකාර අංශය බැංකුව ක්‍රියාකාරීව හඹා යනු ඇත. ඔවුන් ඩිජිටල් විප්ලවය සමඟ වැඩී ඇති අතර, සයිබර් අවකාශය සැරිසැරීම පහසු වන අතර මහජන බැංකුවේ අනාගතය සඳහා ස්වභාවික සුදුසුකමක් වනු ඇත.

අතිවිශාල ශාඛා ජාලය සහ සංසන්දනාත්මකව අඩු ගාස්තු අපගේ ශක්තිය චෛතිහාසික වූ අතර එමඟින් ප්‍රවේශවීමේ හැකියාව සහ දැරිය හැකි බව යන සාධක අපි හඳුනා ගනිමු. නමුත් වර්තමාන තත්ත්වයන් තුළ සහ අනාගතයේදී එය අපව වෙන් කරන අපගේ සේවා විශිෂ්ටත්වය සහ තාක්ෂණික විශිෂ්ටත්වය වනු ඇත.

මානව ප්‍රාග්ධනය

අපගේ මානව ප්‍රාග්ධනය සාම්ප්‍රදායිකව සාමාන්‍ය මිනිසාගේ හදවතට සමීප වූ බැංකුව ලෙස එහි කාර්යභාරය තුළ ආයතනයේ පෞරුෂය මූර්තිමත් කරයි. මෙම පෞරුෂය කාලයට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන ජනවිකාස අනුකූලව වෙනස් වුවද, අපගේ ජනතාව නියත වශයෙන්ම අපගේ විශාලතම වත්කම වේ. මහජන බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු අතර ශ්‍රේණිගත වන අතර දිවයිනේ සෑම කොටසකින්ම පැමිණෙන පසුබිම්වලින් 7,377 ක ශ්‍රම බලකායක් ඇත. ප්‍රධාන රාජ්‍ය බැංකුවක් ලෙස, එය දිවයිනේ සෑම කොටසක්ම ආවරණය කරමින් විවිධ පසුබිම්වල සිට එහි ගනුදෙනුකරුවන්ගේ ජීවිත සහ ජීවනෝපාය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

2022 කොවිඩ්-19 වසංගතයෙන් පසුව එළඹෙන අභියෝගාත්මක වසරක් වූ අතර, බැංකුවට සාර්ව ආර්ථික පීඩනයන්ට, දේශපාලන කැලඹීම්වලට සහ ඉහළ උද්ධමනයකට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, අපගේ ගනුදෙනුකරුවන්ට සහ රජයට අවශ්‍ය වේලාවේදී, බාධාවකින් තොරව සම්පූර්ණ අත්‍යවශ්‍ය සේවාවන් රාශියක් සැපයීම සඳහා දක්ෂතාව, පුහුණුව සහ කණ්ඩායම් වැඩ අපගේ ප්‍රධාන ශක්තීන් අතර වන බව ඔප්පු කරමින් අපගේ කාර්ය මණ්ඩලය එක්ව කටයුතු කර ඇත.

අපගේ ප්‍රවේශය

මෑත අතීතය තුළ අපගේ කාර්ය මණ්ඩලය අපගේ සාර්ථකත්වයේ ප්‍රමුඛයා වූ අතර, මෙම වසරේදීද අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලුම සහයෝගය ඔවුන් වෙත ලබා දෙමින් එම විශ්වාසය හා කැපවීමේ හැඟීම මත ගොඩනඟා ගැනීමට අපි වග බලා ගත්තෙමු. කොවිඩ්-19 කාලසීමාව තුළ, බැංකුව සේවකයන්ට රැකියාවට යාමට ප්‍රධාන මාර්ග ඔස්සේ ප්‍රවාහන පහසුකම් සපයා ඇත. තමන්ගේම වාහන ඇති කාර්ය මණ්ඩලයට ප්‍රවාහන දීමනාවක් ලබා ගැනීමට පහසුකම් සලසා දී ඇති අතර නිවසේ සිට කාර්යක්ෂමව වැඩ කළ හැකි කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රම සම්පාදනය කළේය.

වෙළෙඳපොල තත්ත්වයන් මාර්ගගත බැංකුකරණ ගනුදෙනු වෙත මාරු වීම වේගවත් කළේය. අපගේ තරුණ බඳවා ගැනීම් ඉක්මනින් ඩිජිටල් සේවාස්ථානයට අනුවර්තනය වූ අතර, අපගේ සමහර වැඩිහිටි කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මාර්ගගත මාධ්‍යය වටහා ගැනීමට සහ ඔවුන්ගේ තරුණ කණ්ඩායමේ සාමාජිකයින්. සමඟ නායකත්ව කාර්යභාරයක් ඉටු කිරීමට දැනුමෙන් ඔවුන් සවිබල ගැන්වීමට අපි පුහුණු සැසි පැවැත්වුවෙමු.

මානව සම්පත් ක්‍රියාකාරී ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය නව මෘදුකාංගය මිලදී ගැනීමත් සමඟ පසුගිය වසරේ ආරම්භ වූ අතර, මෙම වසරේ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරෙන අතර එය 2023 දී අඛණ්ඩව සිදුවනු ඇත. 2024 වන විට සමස්ත මානව සම්පත් පද්ධතිය ඕනෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට එය සමඟ අන්තර් ක්‍රියා කිරීමට මාර්ගගතව ලබාගත හැක.

ඉහත කරුණු වලට අමතරව, සමස්තයක් ලෙස සංවිධානය තුළ මානසික වෙනසක් ඇති කිරීම සඳහා බැංකුව අතර මුලපිරීමක් අප සතුව ඇත. අපගේ කාර්ය මණ්ඩලයේ සංස්කෘතිය වෙනස් කිරීම සහ බැංකුව අනාගතයට සූදානම් 21 වැනි සියවසේ ආයතනයක් බවට පරිවර්තනය කිරීම මෙහි අරමුණයි. මෙම ව්‍යාපෘතිය මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර බැංකුවේ සියලුම අංශ තුළ ක්‍රියාත්මක කෙරේ.



ප්‍රධාන සිදුවීම්

මුළු සේවකයින්: **7377**	පිරිමි: **2835**	කාන්තාවන්: **4542**	රඳවා ගැනීමේ අනුපාතය: **97.6%**
සේවකයෙකුට ලාභය **රු.මි.: 2.3**	නව කාර්යසාධන කළමනාකරණ පද්ධතිය පිළිබඳ නියමු අදියර සැලසුම්කර, ස්ථාපිත කර සහ ආරම්භ කර ඇත.	සේවක සහභාගිත්වය 69%ට වැඩිය.	ශ්‍රී ලංකාවේ වඩාත් කාන්තා හිතකාමී ආයතනයකි. (WFWP සම්මාන)

වැදගත් තේමා

- සේවක ඵලදායිතාව
- කුසලතා කළමනාකරණය
- පුහුණුව සහ සංවර්ධනය
- දූෂණ විරෝධය
- සේවකයින්ගේ දක්ෂතා නැවත ඇති කිරීම.

අභියෝග

- 2022 පළමු කාර්තුවේ ආර්ථික අර්බුදයේ විදේශ විනිමය සීමා කිරීම් සහ වසරේ ඉතිරි කාලය තුළ ඉන්ධන හිඟයට හේතු විය.
- ප්‍රවාහන ගැටළු කාර්ය මණ්ඩල පැමිණීමට, බැංකුවට විශේෂ ප්‍රවාහන වැඩපිළිවෙලක අවශ්‍යතාවට බලපාන ලදී.
- කාර්ය මණ්ඩලයෙන් බහුතරයකට යටිතල පහසුකම් නොපවතින බැවින් නිවසේ සිට වැඩ කිරීමේ සීමාවන් සහ බැංකුවේ බොහෝ කාර්යයන් සඳහා ප්‍රායෝගික නොවේ.
- විදේශ විනිමය අර්බුදය සහ සංචාරක සීමා හේතුවෙන් පුහුණු වැඩසටහන් වල ප්‍රමාදයන් සහ බාධා කිරීම්.
- පැරණි Gen X කළමනාකරුවන්ට නව Gen Z අලුතින් බඳවා ගත්අයට නායකත්වය දීමට හැකි වන පරිදි ඩිජිටල් කළ වැඩ ප්‍රවාහ පද්ධති පිළිබඳ පුහුණුව අවශ්‍ය වේ.
- පුහුණු කාර්ය මණ්ඩල සංක්‍රමණය වැඩි වීම.

අවස්ථා

- හැකි සෑම විටම මාර්ගගත පුහුණු මොඩියුල වෙත මාරුවීම.
- කාලසටහනට අනුව වැඩ ප්‍රගතිය සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තු තුළ කණ්ඩායම් වැඩ ගොඩනැගීම.
- සීමාවාසික මට්ටමේ නව යෙදවීම්.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

දරිද්‍රතාව නොමැත

රැකියා අවස්ථා ඇති කිරීම තුළින් දරිද්‍රතාව තුරන් කිරීම.

ගුණාත්මක අධ්‍යාපනය

අති නවීන පහසුකම්වල සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ඉගෙනුම් ඇකඩමිය සඳහා සැලසුම්

සීමා කරන ලද අසමානතා

තරඟ විභාග සහ සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව සියලුම සමාජ – ආර්ථික වර්ගීකරණ සහ ස්ත්‍රීන් සහ පුරුෂයන් බඳවා ගැනීම.

යහපත් සෞඛ්‍ය සහ ශුභසාධනය

සියලුම සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පශ්චාත් වසංගත ක්‍රියාමාර්ග

යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

විශිෂ්ට කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහිත බැංකුකරණ වර්ගීකරණය තුළ විශාලතම සේවා යෝජකයා

නිර්මාණය කළ වටිනාකම

රුපියල් බිලියන 26.6ක්
සේවක ප්‍රතිලාභ ලෙස වෙන් කර ඇත.

කාර්ය මණ්ඩලයේ **සාමාජිකයින් 33ක්**
මෙම වසර තුළ උසස් කරන ලදී.

ප්‍රාග්ධන සම්බන්ධතා


දිවයින පුරා රුක් රෝපණ ව්‍යාපාර සඳහා බීජ පැල බෙදා හැරීම සහ කඩදාසි භාවිතය අවම කිරීම වැනි තිරසාර භාවිතයන් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් සහභාගී වේ.

හරිත ශාඛාවල සේවය කරන සේවකයින් නිත්‍ය වැඩ දින චර්යාවක් ලෙස තිරසාර සම්පත් භාවිතය සහ බලශක්ති ඉතිරිකිරීමේ කටයුතුවල නිරත වනු ඇත.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ සේවකයින් ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය, සැපයුම් දාම කළමනාකරණයට නිරාවරණය වීමෙන් නිපුණතා, සහ CSR ව්‍යාපෘති කරා නිරාවරණය මඟින් තමන්ගේ දක්ෂතා සංවර්ධනය කරගන්නා අතර ඒය ඉහළ රැකියා තෘප්තිය සහ සේවක රඳවා තබා ගැනීම සඳහා මඟ පාදයි.



මූල්‍ය ප්‍රාග්ධනය

බැංකුවේ ආදායම් වර්ධනය සඳහා සේවකයින්ගේ දායකත්වය

බලශක්ති සහ අනෙකුත් සම්පත් පරිභෝජනය අඩු කිරීම සඳහා කාර්ය මණ්ඩලය විසින් පිරිවැය ඉතිරි කිරීමේ මුලපිරීම්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

නව මානව සම්පත් කාර්යය ප්‍රතිව්‍යුහගත කිරීමේ පද්ධතිය නිෂ්පාදිත ප්‍රාග්ධනය වැඩි කිරීමට සැලකිය යුතු ලෙස දායක වනු ඇත.

බුද්ධිමය ප්‍රාග්ධනය

දැනට ක්‍රියාත්මකව පවතින යාවත්කාලීන පුහුණු මොඩියුල බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය වැඩි කරනු ඇත.

අපගේ කණ්ඩායම්

සේවකයින් 7,377ක් සමඟ අපි වසර අවසන් කළ අතර, 97.6%ක් වන අපගේ රැඳවා ගැනීමේ අනුපාතය මගින් දුෂ්කර කාලය තුලදී පක්ෂපාති සහ ඇල්ම සහිත කණ්ඩායමක් අපට සිටින බව ඔප්පු කරයි. අපගේ ශ්‍රමබලකාය දිවයින පුරා සියලු ජාතීන්ගෙන් සහ ආගමික නිකායන්ගෙන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

අපි නව ඉලක්ක සකස් කර ඇති අතර වසරේ පළමු අර්බුදය තුළ අපි මුහුණපාන ලද අභියෝග හමුවේ ඒවා සාක්ෂාත් කරගෙන ඇත.

මෙය සාක්ෂාත් කරගැනීම සඳහා, කාර්ය මණ්ඩලයේ සමහර අයට කාර්යාලයට වාර්තා නොකළ අයද ඇතුළුව සිය සහයකයින් වෙනුවෙන් වැඩ තොග භාර ගැනීමට සිදු විය. එම කාලසීමාව තුළ, වැඩ කාලීන සහ කාර්යක්ෂම ආකාරයෙන් සම්පූර්ණ කල බව සහතික කිරීමට අපි ඉහළ සාමූහික උත්සාහයන් සහ කණ්ඩායම් හැඟීමක් පෙන්වා ඇත. එමෙන්ම, ගනුදෙනුකරුවන්ට හැකිතරම් ලබාගතහැකි ඩිජිටල් මාර්ග භාවිතා කිරීමට ඔවුන් දිරිගන්වමින් අපගේ සියලුම ශාඛා ක්‍රියාත්මකව පවත්වා ගැනීමට අප සමත් විය.

විශ්ව විද්‍යාලවලට තෝරාගත් සහ බාහිර ආරක්ෂක කාර්ය මණ්ඩලය බැංකුවේ ස්ථිර සේවකයින් නොවූ සේවකයින් විය. බැංකුව උපාධියේ අවසන් වසරේ සිටින විශ්ව විද්‍යාල සිසුන්ට සීමාවාසික ලබා දේ. මෙම අංශ වසර පුරා බොහෝ උපකාරිව සහ මැදිහත්ව කටයුතු කළ අය වෙති.

අපගේ සියලුම සේවකයින් පූර්ණ කාලීන පදනම මත වේ.

අපගේ මානව සම්පත් සංඛ්‍යා ලේඛන

පිරිමි සේවකයින්		කාන්තා සේවකයින්		මුළු සේවකයින්		සේවකයෙකුට ලාභය රු '000		සේවකයෙකුට ආදායම රු. '000	
2018	2019	2018	2019	2018	2019	2018	2019	2018	2019
3,184	3,058	4,909	4,778	8,093	7,836	2,112	1,650	22,400	25,489
2020	2021	2020	2021	2020	2021	2020	2021	2020	2021
2,979	2,931	4,713	4,637	7,692	7,568	1,843	3,134	24,829	27,385
2022		2022		2022		2022		2022	
2,835		4542		7,377		2,330		48,425	

ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු සේවකයින්



පිරිමි
38.4%



කාන්තා
61.6%

රැකියා ගිවිසුම සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු ශ්‍රම බලකාය

	2022			2021		
	පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා	එකතුව
ස්ථිර සේවකයන්	2,814	4,530	7,344	2,896	4,625	7,521
කොන්ත්‍රාත් සේවකයින්	21	12	33	35	12	47

රැකියා වර්ගය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු ස්ථිර ශ්‍රමබලකාය


	2022					2021				
	පිරිමි ගණන	කාන්තා ගණන	එකතුව	පිරිමි %	කාන්තා %	පිරිමි ගණන	කාන්තා ගණන	එකතුව	පිරිමි %	කාන්තා %
ආයතනික කළමනාකරණය	9	7	16	0.12	0.09	10	7	17	0.13	0.09
විධායක කළමනාකරණය	20	12	32	0.27	0.16	21	14	35	0.28	0.18
නිලධාරීන් (3-III-ශ්‍රේණිය 1)	1,340	2,444	3,783	18.16	33.13	1,387	2,510	3,897	18.33	33.17
මාණ්ඩලික සහකාර ශ්‍රේණිය	606	1,541	2,147	8.21	20.89	605	1,499	2,104	7.99	19.81
වෙනත් වර්ගීකරණ	853	536	1,389	11.56	7.27	894	603	1,497	11.81	7.97
කළමනාකරණ අභ්‍යාසලාභීන්	-	-	-	-	-	-	-	-	-	-
ගනුදෙනුකාර සේවා සහයකයින්	-	-	-	-	-	-	-	-	-	-
වෙනත් කොන්ත්‍රාත් සේවකයින්	7	2	9	0.09	0.03	14	4	18	0.18	0.05
එකතුව	2,835	4,542	7,377	38.43	61.57	2,931	4,637	7,568	38.73	61.27

මුළු ශ්‍රමබලකාය - දෙපාර්තමේන්තු අනුව



	පිරිමි	කාන්තා
ශාඛා	62.4%	77.1%
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල	17.1%	8.7%
භාණ්ඩාගාරය සහ ප්‍රාථමික ගනුදෙනු අංශය	0.4%	0.5%
ආයතනික හා අක්වෙරළ බැංකු ඒකකය	1.4%	2.6%
එතෙර ගනුදෙනුකාර සේවා	1.0%	1.0%
කාඩ් මධ්‍යස්ථානය	1.0%	0.8%
ප්‍රධාන කාර්යාලය	16.6%	9.3%

වයස හා ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු සේවකයින්



සියලුම ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය ජ්‍යේෂ්ඨ ප්‍රජාවගෙන් බඳවා ගන්නා ලදි.

භූගෝලීය ව්‍යාප්තිය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු ශ්‍රමබලකාය

පළාත	පිරිමි	කාන්තා	මුළු ගණන	මුළු ගණන %
බස්නාහිර	1,036	1,879	2,915	40
දකුණ	264	498	762	10
මධ්‍යම	285	468	753	10
වයඹ	218	384	602	8
ඌව	187	236	423	6
උතුරු	168	195	363	5
සබරගමුව	191	321	512	7
නැගෙනහිර	275	276	551	7
උතුරු මැද	211	285	496	7
එකතුව	2,835	4,542	7,377	100

රැකියා වර්ගය අනුව මුළු ස්ථිර සේවකයින්

ස්ත්‍රීපුරුෂභාවය සහ වයස් බාණ්ඩය

වසර	ආයතනික කළමනාකාරිත්වය		විධායක කළමනාකාරිත්වය		නිලධාරීන් (3-III-ශ්‍රේණිය 1)		මාණ්ඩලික සහකාර ශ්‍රේණි		කළමනාකරණ අභ්‍යාසලාභීන්		ගනුදෙනුකාර සේවා සහයකයින්		වෙනත් වර්ග		වෙනත් කොන්ත්‍රාත් සේවකයින්	
	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා
18-25																
26-45	1				832	1,833	547	1,531					492	394		
46-55	3	2	16	11	407	479	50	9					284	99	6	2
56ට වැඩි	5	5	4	1	101	132	9	1					77	43	1	
එකතුව	9	7	20	12	1,340	2,444	606	1,541	-	-	-	-	853	536	7	2

2022 සඳහා රැකියා වර්ගය සහ සේවා වසර අනුව මුළු සේවකයින්

වර්ගය	<2	3-10	11-20	21-30	31-35	>36	මුළු ගණන
ආයතනික කළමනාකරණය	-	-	1	6	4	2	13
විධායක කළමනාකරණය	-	-	11	8	7	1	27
නිලධාරීන් (3-III-ශ්‍රේණිය 1)	11	341	1,979	1,071	376	6	3,784
මාණ්ඩලික සහකාර ශ්‍රේණිය	-	1,109	958	66	14		2,147
වෙනත් වර්ගීකරණ	-	1,037	21	287	42	2	1,389
ආයතනික කළමනාකාරිත්වය - කොන්ත්‍රාත්	2	1	-	-	-	-	3
විධායක කළමනාකාරිත්වය - කොන්ත්‍රාත්	5	-	-	-	-	-	5
කළමනාකරණ අභ්‍යාසලාභීන්	-	-	-	-	-	-	-
ගනුදෙනුකාර සේවා සහයකයින්	-	-	-	-	-	-	-
වෙනත් කොන්ත්‍රාත් සේවකයින්	2	7	-	-	-	-	9
එකතුව	20	2,495	2,970	1,438	443	11	7,377

අපගේ ක්‍රියාවලි

මානව සම්පත් පරිපාලන කටයුතු ස්වයංක්‍රියකරණය ආරම්භ කර ඇති නමුත් වැඩවලින් 80%ක් තවමත් අත්හුරු ක්‍රමයට සිදු කරන අතර අපගේ අරමුණ වන්නේ නුදුරු අනාගතයේදී ක්‍රියාවලි මුළුමනින්ම ඩිජිටල්කරණය කිරීමයි. මාර්ගගත පුහුණුව 2021 දී ආරම්භ කළ අතර, ඉ-ඉගෙනුම් වැඩසටහන් හඳුන්වාදීමත් සමඟ එය තවදුරටත් සංවර්ධනය කරනු ලැබේ. කෙසේවෙතත්, මාර්ගගත පුහුණුව තාක්ෂණික දැනුම සඳහා ඵලදායී වන බවත් මෘදු කුසලතා සඳහා අඩු ඵලදායී බවත් අපි සොයා ගෙන ඇත. තත්ත්වය වර්ධනය වීමත් සමඟ, අනාගතයේදී මුහුණට මුහුණ වැනි පුහුණු පැවැත්වීමට අපි බලාපොරොත්තු වෙමු. නව බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා විශේෂයෙන් අපේක්ෂකයා අසනීප, විදේශයක සිටින හෝ වෙනත් ආකාරයෙන් එම දිනයේ දී කාර්යාලයට පැමිණීමට නොහැකි අවස්ථාවල මාර්ගගත ක්‍රමයට පැවැත්වීම සාමාන්‍ය කාරණය වී ඇත.

අතිකාල ගණනය කිරීම්, නිවාඩු කළමනාකරණය සහ වෙනත් පරිපාලන කාර්යයන් ඇතුළුව වැටුප් ගෙවීම කොටස් වශයෙන් ස්වයංක්‍රියකරණය කර ඇත. අනාගතයේදී, එවැනි කාර්යයන් ප්‍රධාන පද්ධතියට සෘජුවම සම්බන්ධ කරනු ලබන අතර කිසිදු මානව මැදිහත්වීමක් නොමැතිව එය ක්‍රියාත්මක කිරීමේ හැකියාව අප සතුය.

බඳවා ගැනීම

ගනුදෙනුකාර සේවා සහයකයින් සහ කළමනාකරණ අභ්‍යාසලාභීන් ඇතුළත් වීමේ මට්ටමේ බඳවා ගැනීම් වසරකට වැඩි කාලයක් ප්‍රමාද වී ඇත. එයට හේතුව, විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන තරඟකාරී විභාගවලින් මෙවැනි තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකිරීම සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඔවුන්ගේ කාලසටහන් ආල් දැමීමට සිදුවීමයි.


කෙසේවෙතත් වසර තුළ, කළමනාකරණ අභ්‍යාසලාභීන් සඳහා විභාගය මැයි මස සහ ගනුදෙනුකාර සේවා සහයකයින් සඳහා විභාගය ඔක්තෝබර් පැවැත්වීමට අපට හැකි වූ අතර, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතී. මෙම තනතුරුවල තවමත් හිඟයක් පවතින නමුත් අලුතින් බඳවාගත් අය ශ්‍රමබලකායට ඇතුලත් වූ පසු මෙම තත්ත්වය ලිහිල් වනු ඇත.

එමෙන්ම අපි දේශීය හා විදේශීය සමාගම්වලින් පුහුණු සේවක පිරිස් සඳහා ඉහළ වැටුප් පිරිනැමීම හේතුවෙන් තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩල අඩුවීමක් පෙන්වනු ලබයි. සාමූහික එකඟතාවන්ට අනුව අපගේ ගෙවීම් පරිමා ස්ථිර කරන බැවින් පුද්ගලික අංශයේදී ඔවුන් වෙත ගෙවන මුදලට සමානව වැටුප් වැඩි කිරීමට අපට නොහැකිය. කෙසේවෙතත්, නව මානව සම්පත් පද්ධතිය සමඟ, දක්ෂ කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට හැකි පරිදි කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිශෝධිත ගෙවීම් පරිමාණ ක්‍රමයක් යොදා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු. අභ්‍යන්තරව, අවශ්‍ය පරිදි සියලුම අංශවල පහසු වැඩප්‍රවාහ සහතික කිරීමට පළපුරුදු කාර්ය මණ්ඩලය සහිත කණ්ඩායම්වල කටයුතු කළ හැකි බඳවාගත් අය සමඟ අපි වැඩ කිරීමට අදහස් කරමු.

වයස් කාණ්ඩය සහ ස්ත්‍රිපුරුෂභාවය අනුව නව බඳවා ගැනීම්

සියලුම බඳවා ගැනීම් ප්‍රධාන කාර්යාලය සඳහා ය.

වයස් කාණ්ඩය සහ ස්ත්‍රිපුරුෂභාවය අනුව බඳවා ගැනීම්



පුහුණු හා සංවර්ධනය

2022 දී, මෘදු කුසලතා සහ තාක්ෂණික ප්‍රවීනත්වය පිළිබඳ සේවක පුහුණු පවත්වන ලදී. 2023 දී, මෘදු කුසලතා සඳහා අවධානය වැඩිපුර යොමු කිරීමට බලාපොරොත්තු වේ. විධායක සංවර්ධන වැඩසටහනක් ද විධායක කළමනාකරණයේ විශ්ලේෂණාත්මක සහ සංකල්පිත කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් බාහිර උපදේශකයෙක් සමඟ ආරම්භ කරන ලදී. රටතුළ පැවති ආර්ථික තත්ත්වයන් හේතුවෙන්, පුද්ගල පුහුණුව තරමක් අඩු වූ අතර මාස කිහිපයක් සඳහා පුහුණු වැඩසටහන් මාර්ගගතව පවත්වන ලදී. කෙසේවෙතත්, සේවක පුහුණු පාසල 2022 වසර තුළ ස්ථිර සේවකයෙකුට පුහුණු පැය 24ක සාමාන්‍යයක් ලබාදීමට සමත් වී ඇත.

සේවක පුහුණුවේ ප්‍රධාන අවධානය විශිෂ්ඨත්වය මෙහෙයවීම, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩ නැගීම සහ අනාගතයට සූදානම් වීම යන උපායමාර්ගික කුළුණු මත සිතියම්ගත කළ 2022-2024 වර්ෂ සඳහා නව උපායමාර්ග මුලපිරීම් සමඟ බැඳුණු බැංකුවේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම කෙරෙහි විය. ඒ අනුව, පුහුණු පරමාර්ථ බැංකුවේ උපායමාර්ගික මුලපිරීම්, සේවකයින්ගේ කාර්යසාධන ඇගයීමේ නිර්ණායක සහ රටේ සාර්ව වාතාවරණය සහ හඳුනාගත් සේවක පුහුණු අවශ්‍යතා සමඟ පෙළ ගස්වනු ලදී.

අනාගත පුහුණු වැඩසටහන් සහ කටයුතු නව ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කරන අතර, සෘජු සහ සංකල්පිත කුසලතා යන දෙඅංශය ආවරණය කරමින් පහත ක්ෂේත්‍ර කෙරෙහි කේන්ද්‍ර ගත කරනු ලබයි:

- ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය සඳහා ආකල්ප වර්ධනය සහ අභිප්‍රේරණය
- ගනුදෙනුකාර කේන්ද්‍රීය මානසිකත්වය, පැමිණිලි කළමනාකරණය සහ සාකච්ඡා කුසලතා වර්ධනය
- පෞරුෂ වර්ධනය, පුද්ගල සංවර්ධනය, සමාජීය සහ ආයතනික ආචාර ධර්ම
- ආපදා කළමනාකරණය සහ උපදේශන කුසලතා
- උපාය මාර්ගික සැලසුම්කරණය
- තාක්ෂණික කුසලතා සංවර්ධන වැඩසටහන් (ප්‍රධාන වශයෙන් ඩිජිටල්, ණය, උකස්, භාණ්ඩාගාර සහ විදේශ මුදල් නිෂ්පාදන ඇතුළත් නිෂ්පාදන පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සහ නිලධාරී ශ්‍රේණියේ සේවකයින් සඳහා විගණනය, අනුකූලතාව, අවදානම් කළමනාකරණය සහ වැඩි ලාභයක් නොලැබෙන කළමනාකරණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම)
- අලුතින් බඳවාගත් කළමනාකරණ අභ්‍යාසලාභීන් සඳහා පුහුණු වැඩසටහන්
- විධායක සංවර්ධන වැඩසටහන (මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය/උසස් නිලධාරීන් සඳහා විශේෂ පුහුණු මාලාවක්)

කෙසේවෙතත්, අනාගතයේදී අපි ඉ-ඉගෙනුම් ක්‍රම හඳුන්වා දෙනු ලබන අතර එහිදී පුහුණුවේ ප්‍රතිඵල පාර්ශ්විකය, උසස්වීම් සහ වෙනත් ප්‍රතිලාභ සමඟ සම්බන්ධ කරන අතර එය නිසැකවම පුහුණුවේ සඵලත්වය වැඩි කරනු ඇත.

ස්ථිර සේවක පුහුණු සංඛ්‍යා ලේඛන

පුහුණුවේ වර්ගය	වැඩසටහන් ගණන	සහභාගිවූවන්ගේ ගණන	පුහුණු පැයගණන
අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	386	27,303	172,573
බාහිර පුහුණු වැඩසටහන්	59	298	3,948
විදේශීය පුහුණු වැඩසටහන්	2	3	56
එකතුව	447	27,604	176,577

සේවක පුහුණු සංඛ්‍යා ලේඛන

	2022
පුහුණු පිරිවැය (රු.මි.)	92.8
පුහුණු පැය ගණන	176,577
ස්ථිර සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන	24
මාර්ගගත පුහුණ සැසි ගණන	94
ඩිජිටල් පුහුණු පැය ගණන	40,970

සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ පුහුණු සැසි

	2022
BCP/DRP/වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව	252
පීඩන කළමනාකරණය	5
පීඩන කළමනාකරණය සහ උපදේශනය	71
අධ්‍යක්ෂවරු සඳහා පීඩන කළමනාකරණය, උපදේශනය, පුහුණු කිරීම සහ කුසලතා උපදේශනය	60

සේවක වර්ගය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව පුහුණු පැය

සේවක වර්ගය	සාමාන්‍ය පුහුණු පැය ගණන	
	පිරිමි	කාන්තා
ආයතනික කළමනාකරණය	11	11
විධායක කළමනාකරණය	11	20
නිලධාරීන් (3-III-ශ්‍රේණිය 1)	35	32
මාණ්ඩලික සහකාර ශ්‍රේණිය	24	17
කළමනාකරණ අභ්‍යාසලාභීන්	-	-

පවත්වන ලද පුහුණු වැඩසටහන්

වැඩසටහන සහ ලබාදුන් ක්‍රමය	මූලික අරමුණ
ගනුදෙනුකාර සේවා විශිෂ්ඨත්වය සඳහා ආකල්ප සංවර්ධනය සහ අභිප්‍රේරණය (ස්ථානීය – STC/ප්‍රාදේශීය)	ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීමට සහභාගිවූවන්ගේ මනස සකස් කිරීම සහ සුවිශේෂී ගනුදෙනුකාර සේවාවක් ලබාදීමට සහභාගිවූවන් අභිප්‍රේරණය කිරීම.
විදේශ ප්‍රේෂණ සහ තැන්පතු වේගවත් කිරීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන (මාර්ගගත)	විදේශීය ප්‍රේෂණ වේගවත් කිරීම සහ එය ක්‍රමවත් කිරීම.
එතෙර ගනුදෙනු, අපනයන අවදානම් හඳුනා ගැනීම, සහ අවදානම් කළමනාකරණය (ස්ථානීය – STC)	මායිම් අතර ගනුදෙනු හා අදාළ අවදානම් පිළිබඳ වෙළෙඳාමට අදාළ ගනුදෙනු/ලියවිලි පිළිබඳ දැනුවත් කිරීම.
පෞරුෂ සංවර්ධනය, සමාජ සහ ව්‍යාපාර ආචාර ධර්ම (ස්ථානීය – STC)	පෞරුෂ වර්ධනය සහ සේවකයින් තුළින් ආයතනික සන්නාම ප්‍රතිරූපය වැඩි කිරීම.
Excelsior තානාපතිවරු සඳහා ගනුදෙනුකාර සේවය, පුද්ගල සංවර්ධනය, ආචාර ධර්ම සහ විකුණුම් කුසලතා සංවර්ධනය, නේවාසික පුහුණු වැඩසටහන – පාසිකුඩා පුහුණු මධ්‍යස්ථානය	කණ්ඩායම් වැඩ කුසලතා, විකුණුම් කුසලතා සන්නිවේදන කුසලතා, පුද්ගල සංවර්ධනය සංවර්ධනය කිරීම සහ ශාඛා ජාලය තුළ Excelsior තානාපතිවරු අභිප්‍රේරණය
නායකත්ව, කණ්ඩායම් ගොඩනැගීම, අභිප්‍රේරණය සහ කළමනාකරණ කුසලතා සංවර්ධනය (ස්ථානීය – STC)	මාණ්ඩලික ශ්‍රේණියේ කාර්ය මණ්ඩලයේ යහපත් නායකත්ව හැකියාවන් සහ කණ්ඩායම් ගොඩනැගීමේ කුසලතා සංවර්ධනය
ණය අයකිරීමේ ක්‍රියාපටිපාටිය සහ ණය අයකිරීමේ ප්‍රායෝගික අංග (ස්ථානීය – STC/ප්‍රාදේශීය)	සක්‍රිය ණය මෙන්ම අක්‍රීය ණය අයකරගැනීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සහ අයකිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුම වැඩි කිරීම.
පාරිභෝගික අන්තර්ජාල බැංකුකරණය, (RIB), පාරිභෝගික ජංගම බැංකුකරණය, (RMB) හා පීපල්ස් පේ/ආයතනික අන්තර්ජාල බැංකුකරණය (CIB) ආයතන ජංගම බැංකුකරණය (CMB)/CLOS/RLOS – (ස්ථානීය –STC/ප්‍රාදේශීය)	ඩිජිටල් නිෂ්පාදන පිළිබඳ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර මූලික අවබෝධය ඇති කිරීම.
ගනුදෙනුකාර කේන්ද්‍රීය මනස, අනුකූලතා බැංකුකරණය සහ සාකච්ඡා කුසලතා සංවර්ධනය (ස්ථානීය – STC)	ගනුදෙනුකාර කේන්ද්‍රීය මානසික සන්නිවේදන කුසලතා සංවර්ධනය සහ ගනුදෙනුකාර පැමිණිලි ඵලදායීව මෙහෙයවීම.
ආතති කළමනාකරණය සහ උපදේශන කුසලතා සංවර්ධනය (ස්ථානීය –STC)	පීඩනය තමන්ගේ වැඩවලට සහ පුද්ගල කාර්යසාධනයට බලපාන ආකාරය සහ පීඩනය අඩු කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග සහ සහයකයින්ට ඔවුනගේ පීඩන ජය ගැනීමට සහයවන ආකාරය පිළිබඳව සහභාගිවූවන් දැනුවත් කිරීම.
ඉලෙක්ට්‍රොනික් අරමුදල් මාරු කිරීමේදී වංචා අවම කිරීමේදී මතුවන ප්‍රවනතා (මාර්ගගත)	සයිබර් වංචා හා බැඳුණු අවදානම් පිළිබඳ දැනුවත් කිරීම සහ එවැනි අවදානම් අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව ඉගෙනීම.

කාර්යසාධන ඇගයීම

වර්තමාන ඇගයීම් ක්‍රම බොහෝ සෙයින් ප්‍රමාණාත්මක ඇගයීම්වලට නොව ගුණාත්මක ඇගයීම්වලට සහය වේ, ප්‍රමාණාත්මක ඇගයීම් ශාඛා කළමනාකරුවන් සහ ඊට ඉහළ නිලධාරීන් සඳහා පමණක් දැනට සිදුකරනු ලැබේ. අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා ඇගයීම් ප්‍රදාන සඳහා පෙළගස්වා නොමැත. මෙය නව මානව සම්පත් ප්‍රතිව්‍යුහගතකරණ පද්ධතිය සමඟ ආමන්ත්‍රණය කරමින් පවතින අතර එහිදී සැම සේවකයෙක්ම ප්‍රමාණාත්මතව මෙන්ම ගුණාත්මකව අගයනු ලබන අතර ඔවුන්ගේ කාර්යසාධනය අනාගත උසස්වීම්, පාර්ශ්වීකය සහ පුහුණු සඳහා සැලකිල්ලට ගනු ලැබේ. මෙය එවැනි යෝජනා ක්‍රමයක් බැංකු ඉතිහාසය තුළ ක්‍රියාත්මක කර ඇති පළමු අවස්ථාව වනු ඇත.

වසර තුළ, කොන්ත්‍රාත් සේවකයින් හැර අපගේ සියලුම සුදුසුකම් ලබන ස්ථිර සේවකයින් කාර්යසාධන සමාලෝචනය තුල නියැලුනු අතර එය 2022 දී මුළු සේවකයින්ගෙන් 99.8%ක් වූ අතර ඉතිරි දෙනා ඔවුන්ගේ ගිවිසුමේ අලුත් කිරීමේ වසරේදී අගයනු ලැබේ.

උසස්වීම් සහ මාරු කිරීම්

බැංකුවේ විධිමත් උසස්වීම් සහ ස්ථානමාරු ප්‍රතිපත්තිය සියලුම උසස්වීම් සහ ස්ථාන මාරුවීම් පාලනය කරන අතර ඉන් ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහතික කරයි. උසස්වීම් යෝජනා ක්‍රමය සෑම ශ්‍රේණියක් සඳහාම ස්ථාපිත කර ඇති අතර, සේවකයින්ට ඔවුන්ගේ කුසලතා පුළුල් කර ගැනීමට සහ ඔවුන්ගේ පළපුරුද්ද වැඩි කර ගැනීමට උසස්වීම් සහ ස්ථානමාරු ලබා ගැනීමට දිරි ගන්වනු ලබයි. සියලුම උසස්වීම් ජ්‍යෙෂ්ඨ කළමනාකරු (11 ශ්‍රේණිය) මට්ටම දක්වා විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් තුළින් සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක, ආයතනික කළමනාකාරිත්වය සහ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු සඳහා උසස්වීම් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් තීරණය කරයි. ඉහළම ශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් සඳහා උසස්වීමේ අවස්ථා සාමාන්‍යයෙන් පුරප්පාඩු සිදුවන අවස්ථාවේදි ඇති වේ. කාර්ය මණ්ඩලයේ ස්ථානමාරු ඔවුන්ගේ වර්තමාන කලාපය තුළ හෝ ඉන් පිටත කලාප සඳහා සිදුවිය හැකිය. ස්ථානමාරු තීරණයක් සම්බන්ධ අතෘප්තියට පත්වන යම් සේවකයෙක්ට ස්ථානමාරු ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත කර ඇති අභියාචනා කමිටුවට අභියාචනා කළ හැකිය.

විශ්‍රාම යාමේ වයස 62 සිට 60 දක්වා අඩු කිරීම හේතුවෙන්, නව ප්‍රධාන කලමනාකරුවන්, සහකාර සාමාන්‍යාධිකාරීන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ වෙනත් පත් කිරීම් සඳහා එසේ ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා අපි සම්මුඛ පරීක්ෂණ සංවිධානය කර කටයුතු සූදානම් කළෙමු. බැංකුව සඳහා නව සේවක සංඛ්‍යා සැලැස්මක් 2015 සිට පළමු වරට අනුමත කරන ලද අතර, අපි ඒ අනුව කටයුතු කරමින් සිටිමු.

විවිධත්වය හා සමාන අවස්ථාව

කාන්තා සේවිකාවන් 61,57%ක් සහිත දිවයින පුරා විසිරුණු ශාඛා සහිත ආයතනයක් ලෙස, මෙය අඛණ්ඩව සැලකිල්ලට ගන්නා ක්ෂේත්‍රයකි. විශේෂයෙන් බැංකුව එහි කාන්තා සේවිකාවන්ගේ වැඩ-ජීවිත තුළනය සැලකිමේදී මෙම ක්ෂේත්‍රය තුළ ගැටළු ගණනාවකට මුහුණ පාන බව සොයා ගෙන ඇත. විසංගතය පුරාම, ගර්භණී සේවිකාවන් සහ කිරිදෙන මව්වරුන්ට නිවසේ සිට වැඩ කිරීමට අවසර දෙන ලදී. මෙම ආතති තුරන් කිරීම සඳහා, අපි උපක්‍රමයක් සොයා ගන්නා ලද අතර එහිදී සේවකයින්ගෙන් භාගයක් පමණක් සේවා පරිශ්‍රයේදී වැඩ කිරීම අවශ්‍ය වේ.

පිරිමින්ට කාන්තාවන්ගේ මූලික වැටුප සහ පාරිශ්‍රමිකයට අනුපාතය

රැකියා වර්ගය සහ මෙහෙයුම්වල වැදගත් ස්ථාන අනුව සේවය කරන පිරිමි සේවකයන්ට සාපේක්ෂව කාන්තා සේවිකාවන්ගේ මූලික වැටුප් හා පාරිශ්‍රමික අනුපාතිකය 1:1 ක් වශයෙන් පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ. අපි සම්පූර්ණයෙන්ම බේදයකින් තොරව සමානාත්මතාවය සැලකීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර කාන්තා සේවිකාවන්ටද පිරිමි සේවකයන්ට මෙන් සමානවම සලකනු ලැබේ. කෙසේවෙතත්, මෙම පාරිශ්‍රමික අනුපාතය සේවකයින්ගේ විවිධ සේවා කාලසීමා සහ ඔවුන්ගේ වැටුප් ශ්‍රේණි අනුව වෙනස් විය.

ප්‍රසූත නිවාඩු

2022 වසරේදී සේවිකාවන් 346 දෙනෙකු ප්‍රසූත නිවාඩු රැගෙන තිබුණි. පසුගිය වසර පහක කාලය මුළුල්ලේ ප්‍රසූත නිවාඩු රැගෙන ගිය සේවිකාවන් නිවාඩුවෙන් පසු ආපසු පැමිණීමේ හා සේවක රඳවා ගැනීමේ ප්‍රතිශතය 100% ක් ලෙස පවත්වා ගෙන ඇත.

	2022	2021	2020	2019	2018
ප්‍රසූත නිවාඩු සඳහා හිමිකම් කියන ලද සේවිකාවන් ගණන	4,542	4,637	4,713	4,778	4,893
ප්‍රසූත නිවාඩු ගනු ලැබූ සේවිකාවන් ගණන	346	419	483	510	517
	346	419	483	510	517
ප්‍රසූත නිවාඩුවෙන් පසු ආපසු සේවයට පැමිණි සේවිකාවන් ගණන	100	100	100	100	100
නැවත සේවයට වාර්තා කිරීම (%)					

සමානාත්මතාවයෙන් සැලකීමේ ප්‍රතිපත්තිය

ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය හෝ සමාජ තත්ත්වය පදනම් කරගනිමින් වාචික හෝ ශාරීරික හිංසනයෙන් හෝ වෙනස් කොට සැලකීමෙන් සේවකයින් ආරක්ෂා කරන පරිසරයක් පෝෂණය කිරීමට අපි නිරතුරුව කැප වෙමු. ඉහත ප්‍රතිපත්තිය සාධාරණව සේවකයින් බඳවා ගැනීම, ප්‍රදාන සහ පිළිගැනීමට ලක් කිරීම සහතික කරයි. සියලුම සේවකයින්ට උසස්වීම් අවස්ථාවලදී සාධාරණ සහ සමාන සැලකීම සහතික කෙරේ. ක්ෂේත්‍රය තුළ ඉහළම කාන්තා සේවිකාවන් සංඛ්‍යාව අප සතු වන අතර එයින් අපගේ සමානාත්මතාවයෙන් සැලකීමේ ප්‍රතිපත්තිය පෙන්නුම් කරයි.

වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව

පසුගිය වසර කිහිපය අපගේ සේවකයින් සඳහා පීඩනය ඇති කරන තත්ත්වයන් සමඟින් පිරී පැවතුණි. හැකි තරම් දුරට අපගේ සේවකයින් ආරක්ෂිතව සහ පීඩන රහිතව තබා ගැනීම අපගේ ප්‍රමුඛ වගකීම බව අපි සලකමු. මෙය සහතික නොකර, අපට ඉලක්ක ලබාදීමට හෝ සපුරාලීමට බලාපොරොත්තු තබාගත නොහැක. එමනිසා, සෞඛ්‍යය සහ ආරක්ෂාව යහපත් ලෙස පවත්වා ගැනීමට අදාළ සේවා මාර්ගෝපදේශ අපි නිකුත් කර ක්‍රියාත්මක කිරීම අනිවාර්ය විය. සියලුම ශාඛා සහ මෙහෙයුම් ගිලන්රථ සේවා සඳහා විෂබීජනාශක සහ මුහුණු ආවරණ ලබාදීම වැනි අවශ්‍ය භෞතික වැඩපිළිවෙල අඛණ්ඩව සකස් කළෙමු.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සහය සේවා) අධික්ෂණය යටතේ පවතින "ගිනි සහ ආපදා කළමනාකරණය" නමින් හඳුන්වන වෙනම දෙපාර්තමේන්තුවක් යටතේ ශුභසාධනය සහතික කිරීම පිණිස 2022 දී වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අපි ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ශාඛා ජාලය සහ ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු ආවරණය කරන නියෝජිතයින් සම්බන්ධීකරණ ස්ථාන ලෙස පත්කරන ලදී. මෙම නියෝජිතයින් සහ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු සැසි පවත්වා ඇත. කාර්යභාර නිලධාරි උවදුරු හඳුනා ගැනීම, අවදානම් තක්සේරු කිරීම සහ සිදුවීම් විමර්ෂණය සඳහා වගකීමට බැඳී සිටී. ආපදා අවස්ථාවන්වලදී ඉක්මන් ක්‍රියාමාර්ග සහතික කිරීමට ප්‍රථමාධාර පෙරහුරුව ද පවත්වන ලදී. කාර්යාල පරිසරයේ උවදුරු සමඟ කටයුතු කරන ආකාරය පිළිබඳ විශේෂ පුහුණු සමාලෝචිත වසර තුළ පවත්වනු ලැබ ඇත.

බැංකුව වෘත්තීමය සහ සෞඛ්‍ය සේවා පහත පරිදි ලබා දේ.

- කොළඹ ගිනිනිවන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිත්වයෙන් වාර්ෂික ගිනි පෙරහුරුව
- කාර්ය මණ්ඩලය සඳහා ගිලන්රථ සේවාව
- ප්‍රධාන කාර්යාලයේ නවලෝක වෛද්‍ය මධ්‍යස්ථානය
- කොවිඩ්-19 පූර්වෝපායන් සහ එන්නත් කිරීම වේගවත් කිරීම.
- කාර්ය මණ්ඩල යහපත සඳහා Zumba සැසි
- නොමිලේ ව්‍යායාම් මධ්‍යස්ථානය සහ ක්‍රීඩා පහසුකම්

2022 දී සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා දරන ලද වියදම

සෞඛ්‍යය සහ ආරක්ෂක වියදම	රු.මි.
වෛද්‍ය වියදම්	2,370.8
ගිනි සහ ආරක්ෂාව	97.2
කොවිඩ්-19 ආරක්ෂක නියමයන්	0.5
එකතුව	2,468.5


සේවය ඉටු කිරීමේ දී ශාරීරික ආපදා නවයක් වාර්තා වූ අතර 2022 දී වාර්තා වූ සේවයට අදාළ බරපතල අසනීප සිදුවීම් කිසිවක් නොමැත.

සේවක තෘප්තිය

සේවක සහභාගිත්වය යන්නෙන් සිය සේවා ස්ථානය සමඟ ඔවුන්ට ඇති බලවත් උනන්දුව සහ සම්බන්ධය නියෝජනය කරයි. එය අභිප්‍රේරිත පුද්ගලයින් සිය සේවා ස්ථානය සඳහා අතිරේක උත්සාහයක් යොදවන ආකාරය මැනීමක් මෙන්ම මෙහි රැඳිසිටීමට ඔවුන් කැපවෙන ආකාරය පිළිබඳ සංඥාවකි. ඉහළ මට්ටමේ සේවක සහභාගිත්වය කාර්යසාධනය, රඳවා ගැනීම සහ නවෝත්පාදනය ඉහළ නංවයි.


SPPMR දෙපාර්තමේන්තුව 2022 වසරේදී බැංකුව තුළ සේවක සහභාගිත්වය පිළිබඳ සම්ක්ෂණයක් පවත්වා ඇත. ශාඛා කාර්ය මණ්ඩලයෙන් තොරතුරු එකතු කිරීමට ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල (RHOs) වෙත ප්‍රශ්නාවලියක් සකස් කොට බෙදාහැර ඇති අතර සම්පූර්ණ කළ ප්‍රශ්නාවලි 307ක් ශාඛා ජාලයෙන් එකතු කරන ලදී. ආද්‍රශවල බහුතරය කාන්තාවන්ය. බොහෝ ප්‍රතිචාර වයස අවුරුදු 31-40 අතර වූ අතර කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් බහුතරය නියෝජ්‍ය කළමනාකාර ශ්‍රේණියේ අය විය. සේවක සහභාගිත්වය පිළිබඳ අභ්‍යන්තර ගනුදෙනුකාර තෘප්තියේ ප්‍රතිශතය 69.6ක් විය.

සහභාගි වූ මුළු ගණන



පිරිමි - 41% කාන්තා - 59%

වයස් කාණ්ඩය මත පදනම්ව සහභාගි වූ මුළු ගණන



20-30 අවුරුදු - 3% 31-40 අවුරුදු - 66%
41-50 අවුරුදු - 16% 51-60 අවුරුදු - 15%

අනුප්‍රාප්තික සැලැස්මට

ආයතනය තුළ නව නායකත්ව පරපුරක් සංවර්ධනය කිරීමට අපි අඛණ්ඩව උත්සාහ පෙල ස්ථාපනය කිරීමට ගනිමු. කළමනාකරුවන්ගේ දෙවැනි කණ්ඩායමක් කළමනාකරණ සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීමට නියමිතය. ශාඛා කළමනාකරුවන් 50ක් මෙම පාඨමාලාවට ඇතුළත් කර ගනු ලැබේ. හවුල්කාර ආයතනයක සහය ඇතිව, විධායක සංවර්ධන වැඩසටහන් උපලෙඛන ගත කර ඇති අතර ඉන් සහකාර සාමාන්‍යාධිකාරීන් සහ ප්‍රධාන කළමනාකරුවන් ඉලක්ක කෙරේ. මෙම වැඩසටහන මඟින් අනාගත වෘත්තීය වර්ධනය සඳහා අවශ්‍ය කළමනාකරණ සහ සංකල්පිත කුසලතාවන්ගෙන් ඔවුන් ශක්තිමත් කරනු ඇත.

පාරිශ්‍රමික හා ප්‍රතිලාභ

බැංකුකරණ ක්ෂේත්‍රය තුළ ඇතුළත්වන මට්ටම සඳහා ව්‍යවස්ථාපිත අවම වැටුපක් නොමැත. බැංකුව ඇතුළත්වීමේ මට්ටමේ අවම වැටුප් අනුපාතයට වඩා ඉහළින් ගෙවයි. වැටුප් ප්‍රතිශෝධන ත්‍රෛවාර්ෂිකව සිදු කරනු ලබන අතර, එහිදී බැංකුවේ කාර්යසාධනය, ක්ෂේත්‍රයේ ප්‍රමිති සහ වෙළෙඳපොල තත්ත්වයන් මත පදනම් වී අවශ්‍ය වැටුප් වර්ධක සිදු කරන ලදී.


ස්ත්‍රිපුරුෂ පදනම මත නොවෙනස්ව සැලකීමේ ප්‍රතිපත්තිය හැර, අපි අපක්ෂපාති පාරිශ්‍රමික ව්‍යුහයක් ද පිළිපදින අතර ඉන් අපගේ සේවකයින්ට සාධාරණ, තරඟකාරී, ආකර්ෂණීය පැකේජ පිරිනමයි. මෙයට අපගේ සේවකයින් තෘප්තිමත්ව සහ අභිප්‍රේරිතව තබාගන්නා කාර්යසාධන පදනම් ප්‍රදාන සහ වෙනත් මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ. අපගේ සේවකයින් අදාල නීති සහ රෙගුලාසිවලට අනුකූලව පාරිතෝෂිකයට, සහ සේවක අර්ථසාධක අරමුදලේල (EPF), සේවක භාර අරමුදලේ (ETF) ගෙවීම්වලට හිමිකම ලබයි, බැංකුව 2022 මූල්‍ය වසර සඳහා රුපියල් මිලියන 1,600.89ක් සේවක අර්ථසාධක අරමුදලට සහ රුපියල් මිලියන 400.22ක් සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. සිය රැකියා වර්ගය මත පදනම් වී, සියලුම ස්ථීර සේවකයින් ප්‍රතිලාභ රාශියකට හිමිකම් ලබයි. කෙසේවෙතත්, කොන්ත්‍රාත් සහ අභ්‍යාසලාභී සේවකයින් සමහර ප්‍රතිලාභවලින් ඉවත් කෙරේ. ස්ථීර සේවකයින්ට දෙන ප්‍රතිලාභවලට වාර්ෂික දිර දීමනා, ගමන් වියදම් දීමනා, සමහර ශ්‍රේණිවලට නිවාඩු නිකේතන, සේවක ණය, වෛද්‍ය ප්‍රතිලාභ, මරණ පාරිතෝෂිකය, පුද්ගල අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම, ආබාධිත සහ රෝගී ආවරණය, ප්‍රසූත නිවාඩු, සහ විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළත්ය. සියලුම කාන්තා සේවිකාවන්ට ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව ප්‍රසූත නිවාඩු ලබා දේ.

සේවක යහපැවැත්ම සහ සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

සේවයේදී සේවකයින්ගේ පීඩනය අවම කරන්නේනම් ඔවුන් නිරෝගීව සහ ඵලදායීව රැඳී පවතී. සේවකයින්ගේ නොදන්වා සේවයට වාර්තා නොකිරීම සහ අනාගත ආදායම් හිමිවීම අවම කිරීමේදි ප්‍රධාන වේ. අපි හිතකර වැඩ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. ඒ අනුව සේවකයින්ට හිතකර ජීවන රටාවකට මඟපාදාගත හැකි අතර සිය තෘප්තියට වැඩකළ හැකිය. මෙම අන්තයෙන් අප


විසින් ගෙන ඇති පියවර අතර, යෝග පන්ති සහ අංග සම්පූර්ණ ව්‍යායාම් ශාලාව පවතී. ප්‍රධාන කාර්යාලයේ අති නවීන පුස්තකාලය අපගේ සේවකයින්ට ඔවුන්ගේ දැනුම පුළුල් කර ගැනීමට අවස්ථාව ලබා දේ. එමෙන්ම අපි MBA සහ වෘත්තීය සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කිරීම මත විභාග ගාස්තු ප්‍රතිපූරණය කරමින් වඩා ඉහළ සුදුසුකම් ලබා ගැනීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරමු. බැංකුවේ ක්‍රීඩා සමාජය, කලා කවය සහ වෙනත් එවැනි සමාජ විසින් සංවිධානය කරනු ලබන සේවක සහභාගිත්ව කටයුතුවල සහභාගිවීමට සේවකයින් සඳහා අවස්ථා පිරිනමමු.

ස්ත්‍රිපුරුෂභාවය අනුව සේවක පිරිවැටුම



පිරිමි - 47% කාන්තා - 53%

වයස් කාණ්ඩය සහ ස්ත්‍රිපුරුෂභාවය අනුව සේවක පිරිවැටුම



වයස් කාණ්ඩය සහ ස්ත්‍රිපුරුෂභාවය සහ රැකියා වර්ගය අනුව සේවක පිරිවැටුම

රැකියා වර්ගය	අවුරුදු 18-25		අවුරුදු 26-35		අවුරුදු 36-45		අවුරුදු 46-55		අවුරුදු 56 සහ ඉහළ	
	පි	ගැ	පි	ගැ	පි	ගැ	පි	ගැ	පි	ගැ
ආයතනික කළමනාකරණය									5	2
විධායක කළමනාකරණය									1	5
නිලධාරීන් (3-III-ශ්‍රේණිය 1)			3	12	7	21	3	4	30	28
මාණ්ඩලික සහකාර			3	9		3	2		3	
වෙනත් වර්ග					1		4	1	20	9
කළමනාකරණ අභ්‍යාසලාභීන්										
ගනුදෙනුකාර සේවා සහයකයින්										
වෙනත් කොන්ත්‍රාත් සේවකයින්										
එකතුව			6	21	8	24	9	5	59	44

ප්‍රදේශය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක පිරිවැටුම

	පිරිමි	කාන්තා	එකතුව	පිරිමි (%)	කාන්තා (%)
අම්පාර	1		1	0.01	-
අනුරාධපුර	4	2	6	0.02	0.01
බදුල්ල	1	2	3	0.01	0.01
මඩකලපුව	-	1	1	-	0.01
කොළඹ	6	18	24	0.03	0.10
ගාල්ල	5	6	11	0.03	0.03
ගම්පහ	4	7	11	0.02	0.04
හම්බන්තොට	2	1	3	0.01	0.01
යාපනය	1	4	5	0.01	0.02
කලුතර	5	3	8	0.03	0.02
මහනුවර	5	6	11	0.03	0.03
කෑගල්ල	2	2	4	0.01	0.01
කුරුණෑගල	1	3	4	0.01	0.02
මාතලේ	1	4	5	0.01	0.02
මාතර	2	3	5	0.01	0.02
මොනරාගල	3	1	4	0.02	0.01
නුවරඑළිය	1	1	2	0.01	0.01
පොලොන්නරුව	1		1	0.01	-
පුත්තලම	2	1	3	0.01	0.01
රත්නපුර	3	1	4	0.02	0.01
වන්නිය	1	-	1	0.01	-
ත්‍රිකුණාමලය	-	-	0	-	-
ප්‍රධාන කාර්යාලය	31	28	59	0.18	0.16
එකතුව	82	94	176	0.47	0.53

සේවක සන්නිවේදනය, අචාරධර්ම සහ ඒකාග්‍රතාව

සේවක සන්නිවේදනය

දෙයාකාර සන්නිවේදනය ප්‍රවර්ධනය කරන මාර්ග කිහිපයක් අප සතු ය. මෙම මාර්ග තුළින් බැංකුව කාර්ය මණ්ඩලය අදාළ කරුණුවලදී ඔවුන් සමඟ සහභාගි වන අතර කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ ප්‍රතිචාර ලබාදීමට සහ වැඩදායක සාකච්ඡාවක නියැලීමට හැකියාව ඇත. මෙම මාර්ග බැංකුව තුළ මැදිහත්වීම් ඵලදායි බව සහතික කිරීමට විධිමත් සහ අවිධිමත් සන්නිවේදන මාර්ග පිරිනමයි. මෙයට අමතරව, කණ්ඩායම් ලිපිසටහන් සහ සේවක සංසද බැංකුවේ ව්‍යාපාර කාර්යසාධනය සහ වෙනත් ගැටළු පිළිබඳ සිය අදහස් සහ උපදෙස් දායක කිරීමට කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දේ.

මෙහෙයුම් වෙනස්වීම් සඳහා වූ අවම දැනුම්දීමේ කාලය

කිසියම් මෙහෙයුම් වෙනස්වීම් සහ ඒවායේ කාර්යයන් මත වියහැකි බලපෑම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්දීම සේවකයින් වෙත අපි ලබාදෙමු. මෙය එවැනි වෙනස්වීම් හේතුවෙන් සේවකයන්ගේ චිත්ත ධෛර්යය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට සහය වේ. මෙහෙයුම් වෙනස්කම් සඳහා වූ අවම දැනුම්දීමේ කාලසීමාවන් පහත පරිදි වේ:

මෙහෙයුම් වෙන	දැනුම්දීමේ කාල සීමාව
ස්ථාන මාරු කිරීම්	සති 2
ඉල්ලා අස්වීම්	මාස 1
විශ්‍රාම ලැබීම්	මාස 3
සේවය අවසන් කිරීම්	මාස 1-3

මැසිවිලි නිරාකරණය

"සේවක ගැටළුවලට සහන සලසන යාන්ත්‍රණය" චක්‍රලේඛ යටතේ සේවකයින්ගේ මැසිවිලි නිරාකරණය කිරීමට බැංකුව විසින් යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත. මේ තුළින් සේවකයින්ට පළමුව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත තම පැමිණිළි හා මැසිවිලි ඉදිරිපත් කළ හැකිය. පසුව ඒවා ආයතනික කළමනාකරිත්වයේ සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් සමාලෝචනය කරනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සමාලෝචනයේ ප්‍රතිඵල මත පදනම් වී ගැටළුවට සහන සලසයි. 2022 වසර තුළ, ඉදිරිපත් කළ මුළු සිදුවීම් 14ක් සඳහා නිවැරදි කිරීමේ පියවර 7ක් ගෙන ඇත.

සාමූහික කේවල් කිරීම

මාස 21-34ක කාලසීමාවක් සඳහා 2021 නොවැම්බර් මස වෘත්තිය සමිති සමඟ අත්සන් කළ විධිමත් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම ක්‍රියාත්මකව පවතී. බැංකුව සහ එහි සේවකයින් අතර සම්බන්ධතා සඳහා අනාගත පෙර නිමිති දක්වන ප්‍රධාන ජයග්‍රහනයකි.

සේවක වෘත්තීය සමිති	සේවකයින් ගණන
ලංකා බැංකු සේවක සංගමය	5752
නිලධාරීන්ගේ සංගමය	252
ශ්‍රී ලංකා නිදහස් බැංකු සේවක සංගමය	37
ජාතික සේවක සංගමය	140
සමස්ථ ලංකා බැංකු සේවක සංගමය	24
ප්‍රගති බැංකු සේවක සංගමය	993
එකතුව	7198

දූෂණ විරෝධය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් රාශියක් තුළින් දැනුවත් කර ඇති ශක්තිමත් දූෂණ විරෝධී සංස්කෘතියක් බැංකුවට ඇත. සියලුම සේවකයින් දූෂණ හා වංචාසහගත හැසිරීම වැලැක්වීම සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බැංකුවේ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කර ඇත. අල්ලස් සහ දූෂණය සම්බන්ධයෙන් ශූන්‍ය ඉවසුම් ප්‍රතිපත්තියක් අප සතු වන අතර යම් වරදක් සොයා ගනු ලැබුවහොත් දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට බැඳී සිටී. මේ පිළිබඳව මේ වසර තුළ පුහුණු පැය 700ක් සේවකයින් වෙත ලබාදෙන ලදී.

දූෂණ විරෝධය	ගණන	(%)
ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සන්නිවේදනය කර ඇති පාලන මණ්ඩල සාමාජිකයින්ගේ මුළු ගණන සහ ප්‍රතිශතය	All	100
ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සන්නිවේදනය කර ඇති සේවකයින්ගේ මුළු ගණන සහ ප්‍රතිශතය	All	100
දූෂණ විරෝධය පිළිබඳ පුහුණුව ලබාගෙන ඇති සේවකයින්ගේ මුළු ගණන සහ ප්‍රතිශතය	2,875	39%
වසර සඳහා දූෂණය පිළිබඳ තහවුරු කළ නව සිදුවීම්වල මුළු ගණන සහ ස්වභාවය	72	1%
දූෂණය සඳහා වැඩ තහනම්කළ හෝ විනය කටයුතු කරන ලද තහවුරු කළ සිදුවීම්වල මුළු ගණන	68	0.9%

බැංකුව වෙනුවෙන් ව්‍යාපාර කටයුතුවල නියැලීමේදී ඉහළ මට්ටම්වල අවංකකම සහ හැසිරීම පවත්වා ගැනීමට ඔවුන්ට සහාය වනු පිණිස පහත සඳහන් ප්‍රතිපත්ති පිහිටුවා ඇත.

- **ආයතනික පාලන සංග්‍රහය**

  බැංකුවට අවශ්‍ය වටිනාකම් සහ හැසිරීම ඇතුළත් කරමින්, ආයතන පාලන සංග්‍රහය සියලුම සේවකයින් සඳහා ස්වරය සකස් කරයි. එහි සදාචාර හැසිරීම සහ අවංකකම මගින් සේවකයින්ගේ ස්වරය සකස් කිරීම පමණක් නොව විශ්වාසදායී, විනිවිද සහ වගවීමේ පරිසරයක් ගොඩ නැගීමට සහය වනු ඇති අතර එය බැංකුවේ දිගුකාලීන ආයෝජනය, මූල්‍ය ස්ථාවරත්වය සහ ව්‍යාපාර අවංකකම මෙහෙයවනු ඇත.

- **සේවකයින් සඳහා චර්යා සංග්‍රහය**

  මෙය බැංකුවේ මෙහෙවර, වටිනාකම් සහ මූලධර්ම වෘත්තීය චර්යාව පිළිබඳ ප්‍රමිති සමඟ සම්බන්ධ කරන අතර සියලුම සේවකයින් බැංකුව සමඟ ඔවුන්ගේ රැකියාව ආරම්භයේදී මෙම ලේඛනයට අත්සන් කළ යුතුවේ.

- **විනය සංග්‍රහය**

  මෙම ලේඛනය ස්වභාවයෙන්ම විධිමත් වන අතර, ඉන් විෂමාචාරය පිළිබඳ බැංකුවේ නිර්වචනය ගෙනහැර දක්වන අතර එවැනි අවස්ථාවක අදාළ කර ගන්නා විධිමත් විනය ක්‍රියාපටිපාටිය විදහා දක්වයි. එහි අදහස වන්නේ විෂමාචාර ගැටළු සමඟ දක්ෂ ලෙස කටයුතු කරන දියුණුවන සේවා ස්ථානයක් සැකසීමයි. එමඟින් එහි අවංකකම රඳවා ගනී.

- **තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය**

  තොරතුරු දැනුම් දීමේ ප්‍රතිපත්තිය දූෂණය සම්බන්ධ බැංකුවේ ඉවසුම් නොදෙන ප්‍රතිපත්තිය පිළිබිඹු කරන විෂමාචාරය සහ දූෂණයට එරෙහි වැඩිදුර ක්‍රියාමාර්ගයකි. සේවකයා ආරක්ෂා කිරීමට නිර්ණාමිකබව සහතික කරමින් එවැනි පැමිණිලි බැංකුව විසින් පත්කළ අධ්‍යක්ෂවරයෙක් විසින් සමාලෝචනය කරයි. පහත සඳහන් ගැටළු සිය ආසන්න අධීක්ෂකට හෝ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කළ හැකිය.

  i. විනය සංග්‍රහය කඩකිරීම
  ii. නෛතික/නියාමන බැඳීම්වලට අනුකූල වීමට අසමත්වීම
  iii. යුක්ති අවගමනය
  iv. මූල්‍ය අක්‍රමිකතා

අනාගත දැක්ම

2024 වන විට අපගේ උපායමාර්ගික මූලපිරීම් පහ සාක්ෂාත් කර ගැනීම සඳහා අපි ඉතා වෙහෙස මහන්සි වී වැඩ කරමින් සිටිමු. එක් වැදගත් සන්ධිස්ථානයක් වන්නේ අපි මේ වසරේ ආරම්භ කළ නව මානව සම්පත් කළමනාකරණ පද්ධතියයේ සංවර්ධනයයි. 2024 වන විට අපි පළමු ඇගයීම් කිරීමට සහ ඒ අනුව ප්‍රදාන යෝජනා ක්‍රම සකස් කිරීමට බලාපොරොත්තු වෙමු.

කාර්ය මණ්ඩලයට මානව සම්පත් පද්ධතිය විවෘත කිරීමටත්, ඒ තුළින් පද්ධතිය සමඟ විනිවිදභාවයෙන් මැදිහත් වීමට සහ ඔවුන්ගේ රැකියාව ඉතිහාසය පිළිබඳව ඔවුන්ට අවශ්‍ය ඕනෑම තොරතුරක් ලබා ගැනීමට හැකියාව ලබාදීමටත් අපි සැලසුම් කරමු. තවද, විවාහක තත්ත්වය හෝ සම්බන්ධතා තොරතුරු වෙනස් කිරීම වැනි ඔවුන්ගේ පුද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීමට අවශ්‍ය නම්, ඔවුන්ට මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට අවශ්‍ය නොවේ. ඔවුන්ට අවශ්‍ය ලේඛන ආරක්ෂිත පිවිසුම් පද්ධතිය හරහා මාර්ගගතව ඉදිරිපත් කිරීමට අවශ්‍ය වනු ඇත. මෙම නව ක්‍රමය හඳුන්වාදීම මඟින් සේවකයින් බැංකුව සමඟ මැදිහත්වන ආකාරය විප්ලවීය වෙනසක් සිදු කරනු ඇත.

අපි මුහුණු හඳුනාගැනීමේ පහසුකම ලබාදෙන අතර සේවකයාගේ පැමිණීම, නිවාඩු, වැටුප්, අතිකාල සහ වෙනත් මානව සම්පත් සම්බන්ධ කාර්යයන් ස්වයංක්‍රීයව හසුරුවනු ලැබේ. ඩිජිටල් දැනුමක් ඇති Z පරපුරේ සේවකයින් සමඟ වැඩ කරන විට මෙය විශේෂයෙන් වැදගත් වේ. මෙහි අපගේ කාර්යය වන්නේ නව සහ පැරණි කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර කිසියම් ගැටුමක් වැලැක්වීම සඳහා අපගේ පැරණි කණ්ඩායම් සාමාජිකයින් වේගවත් කිරීම සහතික කිරීමයි. ඩිජිටල් අවකාශය තුළ විශ්වාසයෙන් හා කාර්යක්ෂමව ක්‍රියා කිරීමට ඔවුන්ට උපකාර කිරීම සඳහා අපි ආචාර විධි වැනි මෘදු කුසලතා කෙරෙහි අවධානය යොමු කරන්නෙමු.

අපගේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ කළමනාකරුගේ සිට ඉහළට ඇති සියලුම ශ්‍රේණි සඳහා නායකත්ව සංවර්ධන පුහුණුවක් ලබා දීම වන අතර ඉන් මනා ඩිජිටල් කුසලතා ඇති නව පරපුරේ බඳවා ගන්නන් පිළිගෙන ඔවුන් සමඟ වැඩ කිරීමට ඔවුන් හොඳින් සූදානම් බව සහතික කරයි. අනාගත පිරිස් සැලසුම් කිරීම සඳහා අපගේ දක්ෂතා සිතියම්ගත කිරීමට ද මෙය අපට උපකාරී වනු ඇත. තරුණ ගතිකත්වයේ සහ පරිණත අත්දැකීම්වල ඉදිරිය දකින මනසක් සහිත මෙම නව සංකලනය අපි සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන මහජන බැංකුවේ නව ප්‍රතිරූපයයි.

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

ගනුදෙනුකාර ප්‍රාග්ධනය අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලය තුලින් ශක්තිමත් වී ඇත. කෙසේ වෙතත්, වෙනස්වන ආර්ථික තත්ත්වයන් සහ විවිධ ජනවිකාස පැතිකඩ සහ අපේක්ෂාවන් සහිත නව ගණුදෙනුකාර කොටස් බිහිවීමත් සමඟ නව ක්‍රමෝපායන් අනුගමනය කළ යුතු විය.

අපගේ ප්‍රවේශය

රටේ මුළු ජනගහනයෙන් තුනෙන් දෙකකට සමීප පාරිභෝගික පදනමක් අප සතුව ඇති අතර අපගේ සදාචාරය වී ඇත්තේ ලාභදායීත්වයට වඩා ප්‍රවේශ්‍යතාව ප්‍රවර්ධනය කිරීමයි. වසර තුළ අපට උද්ධමනය සහ විදේශ විනිමය අවිඥදය වැනි ප්‍රධාන අභියෝගවලට මුහුණ දීමට සිදු විය. මහජන බැංකුවට පක්ෂපාතීව සිටින එහි සාම්ප්‍රදායික පාරිභෝගික පදනමට තවමත් සේවය කරයි, නමුත් විවිධ ආදායම් මට්ටම්, අවශ්‍යතා, රුචි අරුචිකම් සහ අභිලාෂයන් සහිත නව ගනුදෙනුකරුවන් පිරිසකට ආකර්ෂණීයි ලෙස මාර්ගය විවෘත කිරීමේ අවශ්‍යතාවයට අපි මුහුණ දුන්නෙමු. වර්තමානයේ අපගේ පාරිභෝගික පදනමෙන් විශාල කොටසක් වන නව සහස්‍ර ගනුදෙනුකරුවන් ඩිජිටල්කරණයට ඉතා ඉහළ ප්‍රතිචාර දක්වන බව ද අපි දැන සිටියෙමු; ඒ අනුව අපගේ නිෂ්පාදන සහ සන්නිවේදන ක්‍රම සකස් කිරීමට අපට සිදු වී ඇත.

ප්‍රධාන සිදුවීම්

මිලියන 14.7ට වැඩි ගනුදෙනුකරුවන්

ගනුදෙනුකරුවන්ගේ විසඳන ලද පැමිණිලි **96%කි**

2022 වසර තුලදී පමණක් අත්පත් කර ගත් ගනුදෙනුකරුවන් ගණන **682,300**

ඉහළ පෙලේ ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට නව නිෂ්පාදන දෙකක්: **Elegance** සහ **Excelsior**

වැදගත් තේමා

- මූල්‍ය කාර්යසාධනය
- ගනුදෙනුකාර අත්දැකීම්
- මෙහෙයුම් කාර්යක්ෂමතාව
- දක්ෂතා කළමනාකරණය
- සමාජ-ආර්ථික බලපෑම්
- සන්නාම හිමිකම
- ගනුදෙනුකාර ප්‍රවේශය
- සෞඛ්‍යය සහ ආරක්ෂාව



අභියෝග

- දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය
- සාම්ප්‍රදායික අලෙවිකරණ සන්නිවේදනයන් සඳහා ප්‍රතිචාරාත්මක නොවීම.
- ණය ප්‍රදානයට බලපෑම් කරන ඉහළ පොලී අනුපාත
- අලෙවිකරණ වියදම් සම්බන්ධයෙන් නියාමකයින්ගෙන් බාධා

අවස්ථා

- ඩිජිටල්කරණයෙන් ප්‍රතිලාභ අත්කර ගැනීම.
- විදේශීය ප්‍රේෂණ තවදුරටත් වැඩි කිරීම.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවලට දායකත්වය

දරිද්‍රතාව තුරන්කිරීම

සියලුම පුරවැසියන්ගේ මූල්‍ය අන්තර්ගතභාවය මඟින් ඔවුන් සවිබලගන්වා මූල්‍ය සේවා සඳහා ඔවුන්ට ප්‍රවේශය ලබා දේ.

විෂමතාව අවමකිරීම

අපගේ පුළුල් ගනුදෙනුකාර පදනම පුළුල්ව පැතිරුණු සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

නිර්මාණය කළ වටිනාකම


රුපියල් බිලියන 17.2ක
බැංකු ලාභදායිතාව

110.3%කින්
අයවැය ඉක්මවා ඇත.

ප්‍රාග්ධන සම්බන්ධතා

ඩිජිටල්කරණය සහ හරිත ගොඩනැගිලිවල ප්‍රතිඵලයක් ලෙස කඩදාසි භාවිතය අඩු වීම ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීමට දායක වේ.

ස්වභාවික ප්‍රාග්ධනය



බුද්ධිමය ප්‍රාග්ධනය

තාක්ෂණික කුසලතා නව්‍ය යෙදුම් දියත් කිරීමට උපකාරී වන අතර එය ගනුදෙනුකාර අවශ්‍යතා සම්පූර්ණ කරයි.

මූල්‍ය ප්‍රාග්ධනය

ප්‍රේෂණ, ඩිජිටල්කරණය තුළ වැඩි වූ වෙළෙඳපොල කොටස සහ නව ගනුදෙනුකාර අංශවලට විවෘතවීම මූල්‍ය ප්‍රාග්ධනය වැඩි කිරීමට හේතු වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය තුළ ආයෝජනය සහශ්‍ර පරපුරේ අපේක්ෂාවන්ට අනුව නව ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දේ.


මානව ප්‍රාග්ධනය

ගනුදෙනුකාර තෘප්තිය සමඟ පාර්ශ්විකය ගැලපීම අනෝන්‍ය ප්‍රතිලාභ ලබා දේ.

ගනුදෙනුකාර පැතිකඩ


දිවයින පුරා පුළුල් ශාඛා ජාලයක් සහ වේගයෙන් පුළුල්වන ඩිජිටල් පරිසර පද්ධතියක් සමඟ, අපගේ ගනුදෙනුකාර පදනම සමාලෝචිත වසර තුළ මිලියන 14.7 ට ඉක්මවා ඇත. අපගේ ගනුදෙනුකරුවන්ගෙන් 79.5%ක් බස්නාහිර පළාතෙන් පිටත ජීවත්වන්නේය යන කාරණය මගින් අපට විවිධත්වයේ පදනමක් ඇත යන සාධකයට උදාහරණ සපයයි. විශේෂයෙන් අපගේ ගනුදෙනුකරුවන්ගෙන් 51.1%ක් කාන්තාවන් වන අතර එය අපගේ ස්ත්‍රිපුරුෂභාවයේ උදාසීන ප්‍රවේශයට ප්‍රශංසාවකි. ජන විකාශනය පරිණාමය වන අතර අපගේ පාරිභෝගිකයින්ගෙන් ආසන්න වශයෙන් 24.8% ක් සහස්‍ර පරම්පරාවට අයත් වේ. අපගේ නිෂ්පාදන සහ උපායමාර්ග සකස් කිරීමේදී අප සැලකිල්ලට ගන්නා ප්‍රධාන සාධකය මෙයයි.

ගනුදෙනුකාර වයස් පැතිකඩ




- අවුරුදු 10ට පහළ – 14%
- අවුරුදු 10-15 – 16%
- අවුරුදු 16-25 – 21%
- අවුරුදු 26-45 – 25%
- අවුරුදු 46-60 – 13%
- අවුරුදු 60ට වැඩි – 11%

ගනුදෙනුකාර ස්ත්‍රිපුරුෂ පැතිකඩ




- පිරිමි – 49%
- කාන්තා – 51%

ගනුදෙනුකාර භූගෝලීය පැතිකඩ



- බස්නාහිර – 26%
- නැගෙනහිර – 8%
- දකුණ – 11%
- උතුර – 6%
- වයඹ – 12%
- සබරගමුව – 9%
- උතුරු මැද – 8%
- ඌව – 7%
- මධ්‍යම – 13%

ගනුදෙනුකාර ක්ෂේත්‍ර පැතිකඩ



- කෘෂිකර්මය, වන හා ධීවර – 7%
- නිෂ්පාදනය – 2%
- සංචාරක – 4%
- ප්‍රවාහනය හා ගබඩා – 4%
- ඉදිකිරීම – 31%
- යටිතල පහසුකම් සංවර්ධනය – 27%
- තොග හා සිල්ලර වෙළෙඳාම – 8%
- තාරතුරු තාක්ෂණය හා සන්නිවේදන සේවය – 0%
- මූල්‍ය සේවා – 1%
- වෘත්තීය, විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු – 2%
- අධ්‍යාපනය – 0%
- සෞඛ්‍යාරක්ෂාව, සමාජ සේවා, සහ සහය සේවා – 1%
- වෙනත් – 13%

අපගේ නිෂ්පාදන සහ සේවා පිරිනැමීම්

පුද්ගල බැංකුකරණය

තැන්පතු නිෂ්පාදන

i. පංගම ගිණුම්

ii. ඉතුරුම්
- ඉසුරු උදාන
- සිසු උදාන
- Yes
- වනිතා වාසනා
- ජන ජය
- අස්වැන්න
- පරිනත
- People's Relax
- සාමාන්‍ය ඉතුරුම්
- චිතෝර වාසනා

iii. ස්ථීර තැන්පතු

iv. කාලීන තැන්පතු

v. විදේශ මුදල් තැන්පතු

අත්තිකාරම්

i. පුද්ගලික ණය

ii. කාලීන ණය

iii. නිවාස ණය
- උකස් ණය

වෙනත්

i. ණයපත්/හරපත්

ii. ත්‍යාග වවුචර්

iii. පංගම බැංකුකරණය/ SMS බැංකුකරණය

iv. අන්තර්ජාල බැංකුකරණය

v. ජීවිත සත්‍යාපන සහතික

ව්‍යවසායක බැංකුකරණය

i. පංගම ගිණුම්

ii. ඉතුරුම් ගිණුම්

iii. ස්ථීර තැන්පතු

iv. අයිරා

v. කාලීන ණය

vi. SME ණය

vii. සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය ණය

viii. වෙළෙඳ මූල්‍ය

තොග බැංකුකරණය

i. පංගම ගිණුම්

ii. ඉතුරුම් ගිණුම්

iii. ස්ථීර තැන්පතු

iv. අයිරා

v. කාලීන ණය

vi. වෙළෙඳ මූල්‍ය
- ආනයන/අපනයන මූල්‍ය කරණය නාවික හා බැංකු ඇපකර ජාත්‍යන්තර වෙළෙඳ ගෙවීම් සඳහා පහසුකම් (ණයවර ලිපි භාරගැනීම)

භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය	i. මුදල් වෙළෙඳපොල කටයුතු ii. රජයේ සුරැකුම්පත්වල වෙළෙඳාම iii. රජයේ සුරැකුම්පත් මත ප්‍රති විකුණුම් ගනුදෙනු iv. විදෙස් විනිමය ගනුදෙනු v. ව්‍යුත්පන්න ගනුදෙනු (ඉදිරි විනිමය හිවිසුම් FX Swap) vi. ආයෝජන බැංකුකරණය ව්‍යාහගත උපදේශන සේවා, භාරකාර සේවා
ජාත්‍යන්තර මෙහෙයුම්	i. වෙළෙඳ සේවා ii. අක්වෙරළ ගනුදෙනුකාර සේවා iii. විදෙස් විනිමය ප්‍රේෂණ iv. විදෙස් විනිමය තැන්පතු v. ජාත්‍යන්තර ගෙවීම් සහ නිරවුල් කිරීම් සේවා

මහජන බැංකුව විසින් පිරිනමන නිෂ්පාදන හා සේවා බැලීම සඳහා ස්කෑන් කරන්න

දශක ගණනාවක අපගේ අත්දැකීම්, ගණුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ තාක්ෂණයේ සහ ඩිජිටල්කරණයේ බාධා රහිත සම්මිශ්‍රණයේ සහයෝගී බලපෑම අපගේ නිෂ්පාදන සහ සේවා පිරිනැමීම අබණ්ඩව වැඩි දියුණු කරයි. අපගේ සේවා කළඹ තරඟකාරී නිෂ්පාදන සහ රටේ මුදල් ප්‍රතිපත්තියට අනුකූලව මිල කර ඇති අතර මූල්‍ය අන්තර්ගතභාවය පෝෂණය කරයි. අපි තරඟකාරී විරෝධී, විශ්වාස-විරෝධී සහ ඒකාධිකාරී භාවිතයන්හි නිරත නොවෙමු. වාර්තාකරණ වර්ෂය තුළ දඩ හා දඩ මුදල් ගෙවා නොමැත.

2022 දී, වේගයෙන් වෙනස් වන අවශ්‍යතා, අපේක්ෂාවන් සහ ගනුදෙනුකරුවන්ගේ රුචි අරුචිකම් සපුරාලීම සඳහා අපි නවෝත්පාදන සහ නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලිය දිගටම කරගෙන ගියෙමු; මෙම ක්‍රියාවලියේදී අපට ගනුදෙනුකාර අංශවල සහ ජනවිකාශවල විවිධ අවශ්‍යතා නිශ්චය කර ඒවාට විසඳුම් සෙවීමට සිදුවිය.

අපගේ මූලපිරීම්

වසර තුළ ප්‍රධාන ප්‍රවර්ධන වැඩසටහනක් වූයේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කරන, වාසි කෝටියයි වැටසටහනයි. විදේශ විනිමය අර්බුදය සහ අපගේ විදේශීය සේවකයන් අතර මුදල් ප්‍රේෂණය සඳහා නිල මාර්ගවලට වඩා අවිධිමත් මාර්ග භාවිතා කිරීමට ඇති ප්‍රවණතාවය සැලකිල්ලට ගැනීමේදී එය ඉහළ ජාතික වැදගත්කමකින් යුක්ත විය. අපගේ විදේශ ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස දෙගුණ කර ගැනීම තුළින් මෙම මූලපිරීමේ සාර්ථකත්වය පෙන්නුම් කළේය.

මෙතෙක් අපගේ ප්‍රතිපත්තිය වූයේ සියළුම ගනුදෙනුකරුවන් සමාන කණ්ඩායමක් ලෙස සැලකීමයි. නව්‍ය පියවරක් වූයේ වසර තුළ ධනවත් සහ වෘත්තීය ගනුදෙනුකරුවන් සඳහා නව වැඩසටහන් දියත් කිරීමයි.

තෙවැනි පුරෝගාමී මූලපිරීම වූයේ ආයතනික සමාජීය වගකීම් (CSR) සංරචකයක් එකතු කරමින් අපගේ සන්නාමය වර්ධනය කිරීමයි. මහජන මෙහෙවර නමින් හඳුන්වන මෙම සන්නාම මූලපිරීම විවිධ මට්ටමේ දී (ප්‍රධාන කාර්යාලය, ශාඛාව හෝ ශුභසාධන සමාජය) පොදු ධජයක් යටතේ ආරම්භ කළ විවිධ CSR මූලපිරීම රැගෙන එයි. මෙම වැඩසටහන යටතේ, ඉතා දුෂ්කර සහ නොදියුණු පාසල් ඇතුළුව සමාජයේ අතිශයින් වරප්‍රසාද නොලත් අංශවලට උපකාර කරමින් සිටිමු. එමෙන්ම අපි අපගේ සහයෝගය සෞඛ්‍යය අංශය වෙතද පුළුල් කරමින් සිටිමු.

ගනුදෙනුකරු හඳුනා ගැනීම

අපගේ ගනුදෙනුකාර ප්‍රවේශ්‍යතාව අපගේ පුළුල් ජාලය සහ දැරියහැකිවීම යනසාධක දෙක මත පදනම් වී තිබුණි. නමුත් වර්තමාන ප්‍රවනතාවය තුළ අනාගත අවධානය සේවා විශිෂ්ඨත්වය සහ ඉහළ තාක්ෂණය වී ඇත. අපි අපගේ ගනුදෙනුකරුවන් අධ්‍යයනය කර හඳුනා ගැනීමට උත්සාහයන් ගණනාවක් දරමින් සිටිමු. සේවා විශිෂ්ඨත්වය මැනීම අවශ්‍ය විය යුතුය. වසර තුළ අපි ගනුදෙනුකරු අරමුණු කළ සමීක්ෂණ තුනක් එනම්, “Mystery Customer” සමීක්ෂණය, අවබෝධ සහ ආකල්ප සමීක්ෂණය සහ ශුද්ධ ප්‍රවර්තක ලකුණු සමීක්ෂණය පැවැත්වූවෙමු. මැතකදී ආරම්භ කළ අවසාන සමීක්ෂණයේ ප්‍රතිඵල වසරකින් පමණ ලබාගත හැකි වනු ඇත. සමීක්ෂණ තුනම මූලිකවම එක් එක් වෙනස් හැඩතල සහිත වුවද අපගේ ගනුදෙනුකරුවන්ට අප කොතරම් හොඳින් සේවය කරන්නේද යන්න පිළිබඳ හැඟවුමකි.

ගනුදෙනුකරුට සේවය කිරීම

අපගේ ගනුදෙනුකාර සේවයේ අංග තුනකි.

1. පුද්ගල අවධාරණ මූලපිරීම්

අපි ශාඛා මට්ටමේදී සේවා තත්ත්ව වර්ධන වැඩසටහන් කිහිපයක් සිදු කර ඇත. මෙවැනි වැඩසටහන් මත පදනම් වී, ශාඛා සහ උකස් මධ්‍යස්ථාන වෙත සේවා තත්ත්ව ශ්‍රේණිගතකිරීම් ලබා දී ඇත. මෙය නායකත්ව කාර්යභාරයන් හි, ශාඛා කළමනාකරුවන් සහ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත මූලික කාර්යසාධන දර්ශක ආකාරයෙන් කාර්යසාධන ශ්‍රේණිගත කිරීම්වලට හේතු වී ඇත. එමෙන්ම මෙය පුද්ගලයින් සුදුසු නායකත්ව කාර්යභාරයන් හි ස්ථානගත කිරීමේදී සහය වේ. කාර්ය මණ්ඩලය ඔවුන්ගේ දැනුම සහ ඔවුන්ගේ පළපුරුද්ද මත ශ්‍රේණිගත කෙරේ. යම් පුද්ගලයෙක් කළමනාකරුගේ කාර්යභාරය සඳහා සුදුසු නොවේනම්, ඔහු මෙහෙයුම් කලමනාකරුවෙක් ලෙස හෝ විගණනයක් තුළ ඵලදායී විය හැකිය. ශාඛා වෙත ඔවුන්ගේ සේවා මට්ටම වර්ධනය කිරීම සඳහා සේවා අත්පොතක් ලබා දී ඇත. වෙළෙඳපොල අංග සැලකිල්ලට ගනිමින්, ශාඛා කළමනාකරුවන් සහ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත ගනුදෙනුකරුවන්ට විශේෂ තැන්පතු පොලී අනුපාත ලබාදීමට යම් අභිමත මට්ටමක් සඳහා ඉඩ දී ඇත. මේ මගින් වඩා ඉහළ ගනුදෙනුකාර තෘප්තිය සහ අපගේ නායකයින්ට රැකියා තෘප්තිය ලබා දේ.

2. ක්‍රියාවලි අවධාරණ මූලපිරීම්

අභ්‍යන්තර සම්පත් සහ බාහිර සම්පත්වල සංයෝගයක් ඇගයීම මගින් ක්‍රියාවලි අවධාරණය සිදු කරනු ලබයි. දෙකෙහිම ඉහළ මට්ටම් සංයෝජනයෙන් ඇඟවෙන්නේ ශාඛාව හෝ කලාපය පුළුල් කිරීම සඳහා අතිශයින්ම සුදුසු ස්ථානයක් බවයි. බාහිර සාධක ඉහළ නමුත් අභ්‍යන්තර සාධක පහළනම්, කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මින් සඳහන් කරයි. අනෙක් අතට, බාහිර සම්පත් අඩු සහ අභ්‍යන්තර සම්පත් ඉහළ නම්, නුසුදුසු ස්ථානයක් බව සහ ව්‍යාපාර ඒකකය නැවත ස්ථානගත කිරීම හෝ විකේන්ද්‍රීකරණ කිරීමේ අවශ්‍යතාව යෝජනා කරයි. දර්ශක දෙක සඳහාම අඩු ශ්‍රේණිගත කිරීමක්නම්, කාර්ය මණ්ඩලය සහ ස්ථානය යන දෙකම ප්‍රමාණවත් නොවන බව සඳහන් කරන අතර ඉන් නැවත ස්ථානගත කිරීම හෝ විකේන්ද්‍රීකරණ කිරීමේ අවශ්‍යතාව නැවත පෙන්වා දේ.

3. භෞතික සාධක මුලපිරීම්

භෞතික සාධක මුලපිරීම් ක්‍රියාත්මක ව්‍යාපාර ඒකකයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට එස් 5 යොදා ගැනීමට මෙය අදාළ වේ.

නව ගනුදෙනුකාර අංශ විවෘත කිරීම

ගනුදෙනුකරුවන්ගේ නව පන්තියකට ආයාචනා කරන අතරම අපගේ නිෂ්පාදන සහ සේවා පුළුල් කිරීමට අපි ප්‍රධාන නවෝත්පාදන පියවරක් ගෙන ඇත. ඉතා උසස් ගනුදෙනුකාර අංශ ඉලක්ක කරමින් නව පැකේජ පිරිනැමීම් දෙකක් එනම් Elegance සහ Excelsior දියත් කරන ලදී. මේවා පැකේජ වන අතර සරලව නව නිෂ්පාදන නොවේ.

Elegance තුළින් ධනවත් ගනුදෙනුකරුවන් ඉලක්ක කරන අතර Excelsior තුළින් ඉහළ ආදායම් ලබන ජංගම වෘත්තිකයන් ඉලක්ක කරයි. මෙම පැකේජ තුළින් ලැබෙන පහසුව, පිළිගැනීම. සහ වෘත්තීමයභාවය සඳහා ඔවුන්ගේ ඉලක්ක ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලයි. ගනුදෙනුකරුවන්ගේ ජීවන රටා අවශ්‍යතා තෘප්තිමක් කරන අංග ඒවාට එකතු කර ඇත.

Elegance ගනුදෙනුනරුවන්ට බැංකු සේවා සඳහා අනුග්‍රහ පූර්වක ගාස්තු, දේශීය සහ විදේශීය මුදල් තැන්පතු සඳහා අනුග්‍රහ පූර්වක අනුපාත, පුද්ගල ණය සඳහා සහනදායී පොලී අනුපාත, පුද්ගලගත හරපත් සහ සංචාරක රක්ෂණය, නොමිලේ ප්‍රධාන පිවිසුම් සාමාජිකත්වය, සහ භාරකාර සේවා ඇතුළු ප්‍රතිලාභ ගණනාවක් සහිත වරප්‍රසාද සහිත වීසා ඉන්ෆිනිටි හරපත වැනි වරප්‍රසාද ගණනාවක් ලැබේ. එමෙන්ම ඔවුන්ට කොළඹ 7 සහ රත්නපුර Elegance ගනුදෙනුකාර මධ්‍යස්ථාන දෙකක් භාවිතා කිරීමේ අවස්ථාව ඇති අතර එහිදී ඔවුන්ට විශේෂිත ගනුදෙනුකාර සම්බන්ධතා නිලධාරියෙක් විසින් සේවය සලසනු ඇත. Elegance ශාඛා පරිශ්‍රවල නවීන පෙනුමක් ඇති අතර සංග්‍රහ. නොමිලේ වයිෆයි සහ වෙනත් පහසුකම් සපයනු ඇත. Elegance ගනුදෙනුනරුවන්ට ඕනෑම මහජන බැංකු ශාඛාවක ශාඛා කළමනාකරුවෙක් විසින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන විකල්පය ද ඇත. එමෙන්ම ඔවුන්ට පුද්ගලාරෝපිත Elegance චෙක්පත් පොතක් ද ලබා දේ. සංචාරක සැලසුම්, රාත්‍රී භෝජන සංග්‍රහයන්, ක්‍රීඩා, විනෝදාස්වාද ප්‍රවේශපත්‍ර, සහ තවත් දෑ සඳහා 24/7 පුද්ගලාරෝපිත සහය ලබා දෙන අතර, ඒවා වසරකට දින 365ම දේශීය හෝ විදේශයන්හි සිට ලබා ගත හැකිය.

Excelsior ගනුදෙනුකරුවන්ට සැම මහජන බැංකු ශාඛාවකදීම විශේෂිත Excelsior තනාපතිවරයෙන් විසින් සේවය සලසන අතර ඔහු ගනුදෙනුකරුගේ අවශ්‍යතා පහසුවෙන් සහ කාර්යක්ෂමව ලබා දෙනු ඇත. ඔවුන් Excelsior විසා ණය පතකට සහ වැඩිකළ ගනුදෙනු සීමා, සහ වාර්ෂික ගාස්තු මත සහන සහිත හර පතකට හිකම් ලබයි. එමෙන්ම ඔවුන් විදේශ විනිමය ගනුදෙනු, වෙනත් බැංකුකරණ ගනුදෙනු මත අනුග්‍රහ පූර්වක අනුපාත සහ මෝටර් රථ සහ දේපල රක්ෂණය සඳහා පිපල්ස් රක්ෂණයෙන් අනුග්‍රහ පූර්වක අනුපාත, විශේෂ සන්නාමයේ චෙක්පත් පොතක් සඳහා හිමිකම් ලබයි. හරපත් හිමිකරුවන්ට සංචාරක රක්ෂණය සහ නොමිලේ ප්‍රධාන පිවිසුම් සාමාජිකත්වය සඳහා ද හිමිකම් ලැබේ.

ගනුදෙනුකාර සන්නිවේදනය

වසර තුළ පැවති අයහපත් ආර්ථික සහ දේශපාලනික තත්ත්වයන් ගනුදෙනුකරුවන් සම්ප්‍රදායික අලෙවිකරණ මාර්ග හෝ පණිවිඩවලට ප්‍රතිචාර දැක්වීම අඩු කිරීමට හේතු විය. මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා නව උපාය මාර්ග යක් සකස් කළ යුතු විය. ගනුදෙනුකරුවන් පිළිබඳව දිගටම සැලකිලිමත් වන අතර, අපගේ නිෂ්පාදන සහ සේවා සම්බන්ධයෙන් සාධාරණ, නිවැරදි, පහසුවෙන් තේරුම්ගත හැකි සහ කාලෝචිත තොරතුරු සඳහා ඔවුන්ගේ අයිතිය ගැන අපි දැනුවත්ව සිටිමු. බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කර ඇත. ඩිජිටල් මාර්ග හරහා ගනුදෙනුකරුවන් සමඟ ද්වි-මාර්ග සන්නිවේදනය ප්‍රදාන තෙරපුම විය. අපි බැංකුව සඳහා Facebook පිටුවක් සහ YouTube නාලිකාවක් ද පවත්වාගෙන යන්නෙමු. Facebook පිටුවට 347,000කට ආසන්න රසික පිරිසක් සිටින අතර, බැංකුවේ වෙබ් අඩවියට මසකට පැමිණීම් 107,000ක් පමණ ඇත. මෙම මාර්ග ගනුදෙනුකරුවන්ට ප්‍රශ්න ඇසීමට, පැමිණිලි ඉදිරිපත් කිරීමට, සහ හදිසි ප්‍රතිචාර ලබා ගැනීමට අවස්ථාව සලසයි. අපි ගනුදෙනුකාර යෙදවුම්වලට 24X7X365 පදනමක් මත ප්‍රතිචාර දක්වන අතර එය ශ්‍රී ලාංකික බැංකුවක් සඳහා අද්විතීය ජයග්‍රහනයකි. තවද, අපි අපගේ අන්තර්ජාල අන්තර්ගතය තුළද අපව වෙන්කර හඳුනා ගනිමු. අපගේ Facebook පිටුවේ වීඩියෝ ඇතුළු විවිධ අන්තර්ගතයන් ඇත, ඒවායින් බොහොමයක් බැංකුකරණයට සම්බන්ධ නැත. "දැඩි විකුණුම්" ප්‍රවේශයක් ගැනීමට වඩා මෙවැනි ආකාරයේ සන්නිවේදනය වත්මන් ආර්ථික වටපිටාව තුළ වඩාත් ඵලදායී ලෙස සලකනු ලැබේ.

අපගේ ඩිජිටල් මාර්ග හැර, අපගේ විශේෂිත 24x7 ඇමතුම් මධ්‍යස්ථානය හරහා අපි අපගේ ගනුදෙනුකරුවන් සමඟ සහභාගි වෙමු. මෙම ඇමතුම් මධ්‍යස්ථානය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් ගනුදෙනුකරුවන්ට සේවය සලසයි. ගනුදෙනුකරුවන්ට බැංකුකරණ නිෂ්පාදන සහ සේවා පිළිබඳව වෙනත් කරුණු අතර සෞඛ්‍යය හා ආරක්ෂාව වැනි තමන්ගේ ප්‍රශ්න ඇසිය හැකි අතර ඉක්මණින් සහ විස්තරාත්මකව පිළිතුරු ලබාගත හැක.

භෞතික පෙනුම සහ සේවා හැඟීම වැඩි කිරීමේ ප්‍රධාන පියවරක් වූයේ ශාඛා නැවත සකස් කිරීමට පියවර ගැනීමයි. වර්ණ භාවිතය සහ විනයාස සැලැස්ම සියලුම ශාඛාවන්ට ප්‍රමිතිගත කර ඇති අතර ඒ තුළින් ගනුදෙනුකරුවන්ට ගනුදෙනු කිරීමට අවශ්‍ය අදාළ කවුළු පෙන්නුම් කරයි. ඩිජිටල් පැතිකඩ සලකා බැලීමේදී, අපගේ සමස්ථ වෙබ් අඩවිය දෝශ සහගත බව අවම කිරීමට සහ අනෙකුත් ඉහල පැතිකඩ වෙබ් අඩවි වලට සමාන වන පරිදි එය අති නවීන ලෙස සකස් කිරීම සඳහා ප්‍රතිනිර්මාණය කර ඇත. ඉහත වෙනස්කම් දෙකම බැංකුවට "තරුණ පෙනුමක්" ලබා දෙන අතර එය සහස්‍ර ගණුදෙණුකරුවන් අතර අනුනාදය ඇති කරයි. අපගේ යෙදුම් සහ ඩිජිටල්කළ යෙදුම්වල ඉහළ සාර්ථකත්වයක් ඇත. එක් උදාහරණයක් සඳහන් කරන්නේනම්, අපගේ පීපල්ස් වේව් යෙදුම මාසික භාගත කිරීම්වල සාමාන්‍ය 35,000ක් වන අතර ගනුදෙනු බිලියන 411කි.

ගනුදෙනුකාර පැමිණිලි

බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ සියලුම ගනුදෙනුකාර දුක්ගැනවිලි සඳහා කඩිනම් අවධානය යොමු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී කඩිනම් සහන සැලසීමයි. ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන මැසිවිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටියක් අප විසින් ක්‍රියාත්මක කර ඇත. අපගේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කිසියම් අතෘප්තියක් ඇති වූ අවස්ථාවක, ගනුදෙනුකරුවෙකුට ගැටළුව මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කිරීමේ විකල්පය ඇත. අපගේ 24 පැය ගනුදෙනුකාර සේවා හදිසි දුරකථන අංකය සහ විශේෂිත ගනුදෙනුකාර සේවා හැසිරිවිමේ ඒකකය හරහා පැමිණිලි ලබා ගන්නා අතර ඒ සම්බන්ධව කඩිනමින් කටයුතු කරයි. ශාඛා කළමනාකාර මාසික රැස්වීමේදී පැමිණිලි පිළිබඳව සේවකයින් දැනුවත් කරන අතර, නැවත සිදුවීම වැලැක්වීමට නිවැරදි කිරීමේ කටයුතු තීරණය කෙරේ. ATM සේවා බිඳවැටීම්වලට අදාළ පැමිණිලි ATM පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. මෙහිදී අවම ප්‍රමාදයක් සහිතව අවස්ථාව නිවරුදි කිරීමට ක්‍රියාපටිපාටි බොහොමයක් ක්‍රියාවට නංවා ඇත.

ලැබී ඇති ගනුදෙනුකාර පැමිණිලි පිළිබඳ විස්තර පහත දැක්වේ:

විස්තරය	සංඛ්‍යාව
ගනුදෙනුකරුවන් වෙතින් ලද පැමිණිලි සංඛ්‍යාව	1,931
විසඳන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව	1,854
විසඳීමට ඇති පැමිණිලි	67
විමර්ශන අවසන් නොමැති	15
නීතිමය කටයුතු සිදුකෙරෙමින් පවතින	29
සිදුකෙරෙමින් පවතින	5

ගනුදෙනුකාර සෞඛ්‍යය සහ ආරක්ෂාව

සියලුම ශාඛා සහ සම්බන්ධිත ස්ථාන ගනුදෙනුකරුගේ සෞඛ්‍යය සහ ආරක්ෂක ගැටළු සඳහා අපගේ යුතුකම මනසේ තබාගෙන සැලසුම් කර ඇත. අපගේ ශාඛා වල හදිසි ගිනි අවස්ථාවල පිටවීම්, ගිනි නිවන උපකරණ, සහ ගිනි සංඥා වැනි හදිසි අවස්ථා සඳහා පූර්වෝපායන් ක්‍රියාවට නංවා ඇත. එමෙන්ම ඔවුන් ආයුධ සන්නද්ධ සහ රහිත ආරක්ෂක කාර්ය මණ්ඩලය විසින් යම් කායික තර්ජනවලින් ආරක්ෂා කෙරේ. කොවිඩ්-19 වසංගතය අවසන් වෙමින් පැවතියද, අපි සෞඛ්‍යයට අදාළ අවදානම් සම්බන්ධයෙන් අඛණ්ඩව පරීක්ෂාකාරීව සිටිමු. රජයේ මාර්ගෝපදේශවලට අනුව ගනුදෙනුකාර පිවිසුම් ස්ථානවලට හඳුන්වා දී ඇති සියලුම සෞඛ්‍ය සහ ආරක්ෂක නීති අපි ක්‍රියාත්මක කර ඇත.

ගනුදෙනුකාර රහස්‍යතාව

දත්තවල ආරක්ෂාව සහ රහස්‍යතාව බොහෝ තර්ජනවලට ලක්ව ඇති වර්තමාන පරිසරය තුළ, අපගේ ගනුදෙනුකරුවන්ගේ හිමිකම් සහ බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අපි අඛණ්ඩව අවදියෙන් සිටින්නෙමු. තර්ජන දිනෙන් දින වැඩිවන බව මතකයේ තබා ගනිමින්, අපි අපගේ තොරතුරු තාක්ෂණ (IT) සහ සයිබර් ආරක්ෂක රාමු වඩ වඩාත් ශක්තිමත් කිරීමට උත්සාහ දරමු. අප විසින් ක්‍රියාත්මක කර ඇති පාලනයන්ට නිරන්තර තොරතුරු තාක්ෂණ උවදුරු තක්සේරු කිරීම, ජාල යාවත් කිරීම්, තෙවැනි පාර්ශවයක් සිදුකරන IT විගණන, සහ IT ආරක්ෂාව පිළිබඳව කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව ඇතුළත් වේ. සමාලෝචිත වසරේදී ගනුදෙනුකාර රහස්‍යතාව කඩකිරීම හෝ ආරක්ෂක පූර්වෝපායන්ට අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් නොමැති බව වාර්තා කිරීමට ලැබීම අපට සතුටකි.

නිෂ්පාදන සහ සේවා ලේබල්කරණය සහ අලෙවිකරණ සන්නිවේදන

දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට සහ අපගේ නිෂ්පාදන සහ සේවා පිළිබඳ පැහැදිලි, නිවැරදි, කාලීන සහ අදාළ තොරතුරු බෙදා හැරීම සඳහා සාධාරණ සහ නිවැරදි තොරතුරු ලබා ගැනීමට ගනුදෙනුකරුවන්ට ඇති අයිතියට අපි ගරු කරමු. බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇත. අපි අපගේ නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ සියලුම අදාළ නියමයන් සහ කොන්දේසි සරල, පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් ලබා දෙන්නෙමු.

මහජන බැංකුවේ වෙබ් අඩවිය තැන්පතු සහ අත්තිකාරම් පොළී අනුපාත, විනිමය අනුපාත සහ වෙනත් අදාළ ගාස්තුවලට අදාළ තොරතුරු සපයයි.

මෙම තොරතුරු දිනපතා සංශෝධනය කෙරේ. නිෂ්පාදන සහ සේවා අත් පත්‍රිකා අදාළ තොරතුරු, නියමයන් සහ කොන්දේසි සහිතව භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) මුද්‍රණය කරනු ලැබේ. මේවා අපගේ සියලුම ශාඛා මධ්‍යස්ථාන වලින් ලබා ගත හැක. ඊට අමතරව, අපගේ විශේෂිත පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වීමෙන් ගනුදෙනුකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.

අපගේ අලෙවිකරණ සන්නිවේදනය භාෂා තුනෙන්ම සිදු කෙරේ. බැංකුවේ සන්නාමකරණ මාර්ගෝපදේශවලට අනුව සදාචාරාත්මක සහ වගකීම් සහගත වෙළඳ ප්‍රචාරණ මූලධර්ම මත පදනම්ව සියලුම අලෙවිකරණ සන්නිවේදනයන් සිදු කෙරෙන බව අපි සහතික කරමු. ප්‍රකාශනය සිදුකිරීමට පෙර, මහජනතාව නොමඟ යැවීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහා සියලුම අලෙවිකරණ සන්නිවේදනයන් දැඩි සියුම් පරීක්ෂාවකට සහ බහු මට්ටමේ අනුමත කිරීමේ ක්‍රියාවලියකට යටත් වේ.

2022 දී, රූපවාහිණිය, ගුවන් විදුලිය, පුවත්පත්, සහ සමාජ මාධ්‍ය හරහා අපගේ නව නිෂ්පාදන සහ සේවාවන්හී ප්‍රතිලාභ සහ වාසි සම්බන්ධයෙන් තවදුරටත් ජනතාව අඛණ්ඩව දැනුමත් කළෙමු. ගනුදෙනුකරුවන් සමඟ පැහැදිලි සහ දැනුවත් සන්නිවේදනය සහතික කිරීම පිණිස නව නිෂ්පාදන සහ සේවා පිළිබඳව සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් අඛණ්ඩව සහ මුළුමනින්ම දැනුවත් කෙරේ.

සමාලෝචිත වසර තුළ, නිෂ්පාදන සහ සේවා ලේබල්කරණය, අලෙවිකරණ සන්නිවේදන හෝ යම් ස්වේච්ඡා සංග්‍රහ සහ වෙනත් මාර්ගෝපදේශවලට අදාළව අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් නොමැත.


මූල්‍ය අන්තර්කරණය

මහජන බැංකුව, එහි ආචාර විධි සහ එහි ශාඛා ජාලය අනුව, මූල්‍ය අන්තර්කරණයේ පෙරමුනේ සිට ඇත. මෙයට පෙර බැංකු කටයුතු නොකළ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල අපි ශාඛා ස්ථාපිත කර ඇත, එවැනි ශාඛා මූල්‍ය වශයෙන් ලාභදායක නොමැති අවස්ථාවන්හි පවා අප අඛණ්ඩ සේවාවන් ලබාදෙන අවස්ථා ඇත.


කෙසේවෙතත් මෑතකදී, නව මට්ටමක් දක්වා මූල්‍ය අන්තර්කරණය රැගෙන ඇත. අපගේ ස්වයං බැංකුකරණ ඒකක විශාල වශයෙන් වෙනස් ස්ථාන, සමාජීය පන්ති, සහ අධ්‍යාපන මට්ටම්වල ජනතාව විසින් අනග්‍රහය දක්වයි. සාක්ෂරතාව අඩු මට්ටමක් සහිත ජනතාව තාක්ෂණයට යොමු නොවන බව අපේක්ෂා කළ හැකිය. කෙසේවෙතත්, මහජන බැංකුව කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය හේතුවෙන් ඔවුන් මෙයට ඇදගැනීමට අපට හැකිවිය. බැංකුවේ මූල්‍ය සාක්ෂරතාව නිසා තාක්ෂණය භාවිතා කිරීමේ හැකියාව ඇතුළත් කිරීමට හැකි වී ඇත.

අපි වර්තමාන වෙළෙඳපොල අනුපාතවලට පහළ පොළී අනුපාතවලට ණය ලබාදෙමින් මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කරමු. අපි අඩු පොලියට මුදල් ලබාගන්නා අවස්ථාවල දී මෙය සිදුකළ හැකිය. "නිදහසේ උපත" ඉස්මතු කොට දැක්වීමට තරම් වටිනා බැංකුවේ තවත් එක් වැඩසටහනකි. රටේ උපදින සෑම ළමයෙක්ම ආරම්භක තැන්පතුවරු. 2,000ක් සහිත ඉතුරුම් ගිණුමක් ලබා ගැනීමට හිමිකම ලබයි. මෙය වෙනස් කොට නොසැලකීමේ පරම පදනම මත සෑම ළමයෙකුටම මෙය පිරිනමනු ලැබේ.

ගනුදෙනුවල වටිනාකම



ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය



අපගේ කාර්යසාධනය

අපගේ ශාඛා ජාලයට ලාභදායිතාව අනුව අතිශයින් සතුටුදායක වසරක් විය. අපි රුපියල් බිලියන 17.2ක ලාභයක් අත්කර ගත් අතර එය 2022 වසරේ අයවැය සඳහා ඉලක්කය පසුකර ඇත. කෙසේවෙතත්, මෙය වැඩි වූ පොළී අනුපාත සහ සංක්‍රාමික මිල ගැලපුම් තුළින් විනිශ්චය කළ යුතුව ඇත. මෙය හැරෙන්නට, අපගේ ශාඛා ජාලය වර්ධනය හා ශාඛාවල සහ වෙනත් ව්‍යාපාර ඒකකවල ලාභාදායිතාව වර්ධනය කිරීම මගින් ඉතුරුම් වැඩි වී ඇත.

තහනම්කළ හෝ ආරාවුලට තුඩුදුන් නිෂ්පාදන අලෙවිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥාප්තියට සහ අපගේම සදාචාර සංග්‍රහවලට අනුකූලතාවය තුළ, වෙළෙඳපොළෙහි තහනම් කර ඇති හෝ පාර්ශ්වකරුවන් හෝ මහජනතාව අතර ආරාවුලට හේතු වී ඇති නිෂ්පාදන අලෙවි කිරීමෙහි හෝ ලබා දීමෙහි අපි නිරත නොවෙමු. අපගේ ණය ප්‍රතිපත්තිය අනුව නීතිවිරෝධී ව්‍යාපෘතියක් සඳහා මූල්‍ය පහසුකම් සැලසීමෙන්ද අපි වැළකී සිටින්නෙමු. වසර තුළ තහනම් කරන ලද හෝ ආරාවුලට තුඩුදුන් නිෂ්පාදන අලෙවිය හේතුවෙන් අනුකූල නොවූ අවස්ථා වාර්තා වී නොමැත.

අනාගත දැක්ම

අනාගතය දෙස බැලීමේ, අපගේ විදේශීය ප්‍රේෂණ කොටස වර්ධනීය වැඩිවීමක් අපිට දැකිය හැකිය. සහශ්‍ර ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා කෙරෙහි අපගේ වැඩිවන අවධානය තුළින් ලාභාංශ ගෙවනු ඇත. මෙම වසරේ ඇතිවන ප්‍රවනතාව සමඟ, තනිපුද්ගල නිෂ්පාදනවල වඩා සන්නාමය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි සන්නිවේදනය තුළ හෝ ඒ මත අප වැඩි අවධානය තිබිය යුතුය. මහජන බැංකුව ඉතා කලබලකාරී පරිසරයක් සහිත වසරක ඉතා ශක්තිමත් ලෙස ඉදිරියට ගමන් කල අතර, නිශ්චයභාවයකින් තවදුරටත් ඉදිරියට ගමන් කිරීමට විශ්වාසයෙන් අපේක්ෂා කරයි.

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාර හවුල්කරුවන් යනු අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට පිටතින් ප්‍රසම්පාදනය කරන සම්පත්, නිෂ්පාදන සහ සේවා සැපයුම්කරුවන්ය. මෙම හවුල්කරුවන් සමඟ වන සම්බන්ධතා අපගේ වටිනාකම නිර්මාණ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි.

අපගේ ප්‍රවේශය

බැංකුව සක්‍රීය සහ සහයෝගී උත්සාහයන් තුළින් එහි ව්‍යාපාරික හවුල්කරුවන් 383ක් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභී සහ අන්‍යෝන්‍ය හවුල්කාරිත්වයක් පවත්වා ගැනීමේ වටිනාකම දැඩිව පිළිගන්නා අතර ඉන් පසුගිය වසර පුරා රුපියල් බිලියන 15.9ක වටිනාකමක් උත්පාදනය කර ඇත. මෙම හවුල්කාරත්වය අපගේ හිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමේදී අපක්ෂපාති සහ සාධාරණ ඩෙන්ඩර් ක්‍රියාවලි සහතික කරමින් සහ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව දැරා ගනිමින් විවෘත, වගකීම්සහගත, සහ සදාචාරාත්මක ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් තුළ එහි සිද්ධාන්තය සොයා ගනී. බැංකුව ක්ෂේත්‍රයේ සියලුම රෙගුලාසිවලට දැඩි අනුකූලතාව පවත්වා ගන්නා අතර විනිවිදභාවයෙන් සහ අවංකභාවයෙන් යුතුව ක්‍රියාත්මක වන අතර සදාචාරාත්මක ව්‍යාපාරික පිළිවෙත්වලට අනුකූල වන අතරම, මූල්‍ය වගකීම කඩිනමින් සපුරාලයි.

ප්‍රධාන සිදුවීම්

- සැපයුම්කරුවන් **258**
- **සාමාජික** ආයතන 12
- **93%ට වැඩි** **දේශීය සැපයුම්කරුවන්** සඳහා නිර්මාණය කළ **වටිනාකම**
- **අනුරූප බැංකු 43ක් සහ වොස්ට්‍රෝ නියෝජිතයින් 82ක්** සමඟ සම්බන්ධතා



වැදගත් තේමා

- මෙහෙයුම් කාර්යක්ෂමතාව
- සැපයුම්කාර වටිනාකම නිර්මාණය

අභියෝග

- ආනයන මත සීමාකිරීම් සහ සීමිත විදේශ විනිමය ලබා ගැනීම සමහර ආනයනය කළ සැපයීම්වල ප්‍රසම්පාදනය තුළ ප්‍රමාදය ඇති කරයි.
- සමහර ව්‍යාපෘති මූල්‍ය සංරෝධක හේතුවෙන් නතර කිරීමට හෝ කල්දැමීමට සිදුවිය.
- විදේශීය හවුල්කාර ණය මාර්ග ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගතකරණය පහළ හෙලීම හේතුවෙන් අඩුවිය.

අවස්ථා

- මූල්‍ය සංරෝධක හේතුවෙන් නතර කළ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමේ හැකියාව

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

5 GENDER EQUALITY

ස්ත්‍රිපුරුෂ සමානතාව

කාන්තාවන්ට එක් එක් නායකත්ව කාර්යභාරයන් හි සහ තීරණ ගැනීමේදී සක්‍රීය කොටසක් ඉටු කිරීමට සමාන අවස්ථා ලබාදීම.

8 DECENT WORK AND ECONOMIC GROWTH

යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

තෘප්තිමත් සහ මනා වැටුප් සහිත රැකියා නිර්මාණය.

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

තිරසාර නගර සහ ප්‍රජාවන්

පහසුවෙන් ක්‍රියාකරන සැපයුම් දාම තුළින්, අපි ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවන්ට වටිනාකම ලබා දෙමු.

13 CLIMATE ACTION

දේශගුණ ක්‍රියා

වගකීම්සහගත ප්‍රසම්පාදනය සහ සැපයුම්කරුවන් අතර පරිසර හිතකාමී ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම.

17 PARTNERSHIPS FOR THE GOALS

අරමුණු සඳහා හවුල්කාරත්ව

ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ජාලගතකරණය වීම මඟින් පාර්ශවකරුවන්ට වටිනාකම ලබා දේ.

නිර්මාණය කළ වටිනාකම



රු.බි. 14.8ක් **93.1%**

දේශීය සැපයුම්කරුවන්ට ගෙවා ඇත.



රු.බි. 1.1ක් **6.9%**

විදේශීය සැපයුම්කරුවන්ට ගෙවා ඇත.

ප්‍රාග්ධන සබඳතා

තිරසාර ව්‍යවහාර වැළඳගැනීමට සහ බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සැපයුම්කරුවන් දිරිගැන්වීම මඟින් ඔවුන්ගෙන් වන පාරිසරික බලපෑම අවම කරයි.


සියලුම සැපයුම්කරුවන් මත දැඩි නිවාරණ ක්‍රියාපටිපාටි පැනවීම මඟින් පරිසරය සහ සමාජ තිරසාරභාවය ප්‍රවර්ධනය කරයි.

බැංකුව විසින් ප්‍රසම්පාදනය කරන භාණ්ඩ හා සේවා පාරිසරික සහ සමාජීය වශයෙන් වගකීම්සහගතව නිෂ්පාදනය කර බෙදාහරින බව සහ බැහැර කරන බව මෙන්ම ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය කරන ආකාරයෙන් සිදු කරන බව සහතික කිරීම.

කොවිඩ්-19 වසංගතය තුළ හඳුන්වා දුන් ටෙන්ඩර් ක්‍රියාවලිය ඩිජිටල්කරණ කාර්යක්ෂමතාව වැඩි කරයි.

සදාචාර ව්‍යාපාර ව්‍යවහාර දරාගැනීම ව්‍යාපාර හවුල්කරුවන් සමඟ සම්බන්ධතා ශක්තිමත් කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය:



කාර්යක්ෂම සැපයුම් දාම කළමනාකරණය ඵලදායිතාව ඉහළ නංවන අතර පිරිවැය ඉතුරුම් ඇති කරයි.

ඩිජිටල්කරණය තුළ ආයෝජනය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලි වර්ධනය ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය වැඩි කරයි.

සැපයුම් දාම කළමනාකරණ පුහුණුව මඟින් ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය වැඩි කිරීමට සහය වේ.

ලියාපදිංචි සැපයුම්කරුවන් ගණන		අනුරූප බැංකු ගණන		වොස්ට්‍රෝ නියෝජිතයින් ගණන		සැපයුම්කරුවන්ට ගෙවීම් (රු.බි.).	
2018	2019	2018	2019	2018	2019	2018	2019
383	242	43	42	73	71	12.8	12.2
2020	2021	2020	2021	2020	2021	2020	2021
242	258	42	42	71	78	11.1	12.3
2022		2022		2022		2022	
258		43		82		15.9	

ව්‍යාපාර වර්ධන හවුල්කරුවන්	අනුරූප බැංකු
	වොස්ට්‍රෝ නියෝජිතයන්
	වෙළෙඳ හවුල්කරුවන්
	රාජ්‍ය ආයතන
සැපයුම්කරුවන්	උපයෝගිතා සේවා සපයන්නන්
	අමුද්‍රව්‍ය සපයන්නන්
	ස්ථාවර වත්කම් සපයන්නන්
	ප්‍රවාහන සැපයුම්කරුවන්
නඩත්තු හවුල්කරුවන්	මෘදුකාංග සැපයුම්කරුවන්
	අපද්‍රව්‍ය කළමනාකරණය
	සන්නිවේදනය
	ණය විකතු කිරීමේ ආයතන
	මානව සම්පත් සැපයුම්කරුවන්
වෙනත්	කොන්ත්‍රාත්කරුවන්
	පරිශ්‍ර සැපයුම්කරුවන්

සැපයුම් දාම කළමනාකරණය


සැපයුම් දාම කළමනාකරණය අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ඇතුළත් අන්‍යෝන්‍ය ප්‍රතිලාභී ක්‍රියාවලියක් ලෙස බැංකුව සලකනු ලබයි. එක් අතකට, අඩුම සාධ්‍ය පිරිවැයට අනර්ඝ තත්ත්වයෙන් නිෂ්පාදන ප්‍රසම්පාදනය කරමින් සැපයුම්කරුවන් සමඟ අපගේ සම්බන්ධතා තුළ මුදල් සඳහා ඉහළම වටිනාකම ලබා ගැනීමට අපි අරමුණු කරමු. අනෙක් අතට, අපගේ සැපයුම්කරුවන් සමඟ සුහද සම්බන්ධතා දියුණු කර ගැනීමට අපි උත්සාහ දරන අතර එය විශේෂයෙන් හදිසි සැපයුම් අවශ්‍යතාවලදී කාලීනව බෙදාහැරීම් ප්‍රවර්ධනය කරයි. සැපයුම් දාම කළමනාකරණය සඳහා වූ අපගේ ප්‍රවේශය තුළින් කාර්යක්ෂම සහ පිරිවැය ඵලදායී ප්‍රසම්පානය මෙන්ම කල්පවත්නා සැපයුම්කාර සම්බන්ධතා ඇති කරයි.

ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

- ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය රජයේ ප්‍රසම්පාදන අත්පොත මඟින් මෙහෙයවන අතර ධනාත්මක සැපයුම්කාර සම්බන්ධතා පෝෂණය කරමින් බැංකුවේ බැඳියාවන් ආරක්ෂා කිරීමට සකස් කෙරේ.
- ප්‍රසම්පාදනයේ සුමට ක්‍රියාකාරිත්වය බාධා රහිත මෙහෙයුම් සහතික කරමින් බැංකුවට අවශ්‍ය භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම සහතික කිරීමට අත්‍යවශ්‍යය.
- ප්‍රසම්පාදන ප්‍රතිපත්ති වෙනස්වන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් සංශෝධනය කෙරේ.
- තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) ඉතා පරීක්ෂාකාරීව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර සියලුම තාක්ෂණික පිරිවිතර ඇගයීමට ලක් කරයි.
- තාක්ෂණික ඇගයීම් කමිටු සියලුම කටයුතු සඳහා මෙහෙයුම් සහ ප්‍රාග්ධන අයවැය (CAPEX සහ OPEX) සංවර්ධනය කරන අතර, එය පාලන දැනුම සහ ආයතනික ව්‍යුහයට අනුකූලව සේවකයින් අතර කාර්යයන් බෙදාහරිමින් ප්‍රසම්පාදනය සහ මෙහෙයුම් සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීමට භාවිතා කෙරේ.

සැපයුම්කාර සම්බන්ධතා කළමනාකරණය


- බැංකුවේදී, සැපයුම්කාර සම්බන්ධතා යනු සාමූහික උත්සාහයක් වන අතර, එහිදී පාර්ශ්වයන් දෙක විසින්ම නිෂ්පාදන සහ සේවා වගකීම් හුවමාරු කරගනිමින් ගුණාත්මකභාවය සහ අනුකූලතා ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කරයි.
- දැඩි නිවාරක ක්‍රියාවලියක් අනුගමනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් සම්බන්ධවන විධිමත් ක්‍රියාවලියක් තුළින් නව සැපයුම්කරුවන් තෝරා ගනු ලැබේ.
- DI කාඩ් සහ තොරතුරු තාක්ෂණ උපකරණ වැනි ඉහළ මට්ටමේ සහ තීරණාත්මක අයිතම සඳහා ගෝලීය ටෙන්ඩරයක් තුළින් ප්‍රසම්පාදනය කරන අතර තෝරාගත් ගෝලීය සැපයුම්කරුවන් සමඟ බැංකුව හවුල්කාරිත්වයන් පවත්වා ගනී.
- සැපයුම්කරුවන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) රෙගුලාසිවලට අනුකූල වන බවට සහ ළමා හෝ බලාත්කාර ශ්‍රමය භාවිතය තහනම් කරන බව සහතික කරමින් පාරිසරික සහ සමාජීය නිර්ණායකවලට ඔවුන්ගේ අනුකූලතාව තක්සේරු කරන නිවාරණ ක්‍රියාපටිපාටියට අපගේ නව සැපයුම්කරුවන් අපි යටත් කරමු.
- කොවිඩ්-19 වසංගතයෙන් පසු පහත දැක්වෙන පරිදි මාර්ගගත ක්‍රියාවලියක් තුළින් ටෙන්ඩර් කැඳවීම සිදු කරයි.
  - විශේෂිත විද්‍යුත් තැපෑලක් තුළින් ටෙන්ඩර් කැඳවීම කරන අතර Zoom හරහා විවෘත කෙරේ. මෙහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහතික කෙරේ. මුදල් අමාත්‍යාංශය මඟින් අනිවාර්ය කළ පරිදි, සැපයුම්කරුවන් රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය තුළින් ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. මෙම පද්ධතිය සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරයි.
  - වසර තුළ, බැංකුව විවිධ සංරෝධකවලට මුහුණ දුන් අතර ඒවාට කොවිඩ්-19 වසංගතය, දේශපාලන ආරවුල්, ආර්ථික අර්බුදය, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණයවීම, සහ පසුව ඇති වූ මිල වැඩිවීම් ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සමහර ඉදිකිරීම් ව්‍යාපෘති මුදල් සංරෝධක හේතුවෙන් නතර කර දමන ලදී. කෙසේවෙතත්, එවැනි අභියෝගාත්මක වාතාවරණයක් යටතේ වුවත් බැංකුව කොන්ත්‍රාත්කරුවන්ට හානිපූරක ගෙවීම් සිදුකරන ලදී. බැංකුව ශක්තිමත් ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා පවත්වාගෙන යාමට බැඳී සිටින අතර, ඔවුන්ගේ අඛණ්ඩ සම්බන්ධතා පවත්වා ගැනීමට එවැනි සංරෝධක බාධාවක් විමට ඉඩ නොදිය යුතුය.



ව්‍යාපාර හවුල්කාර සබඳතා

බැංකුකරණ හවුල්කරුවන් සමඟ අනෝන්‍ය ප්‍රතිලාභී සම්බන්ධතා අපට ඇති අතර, ඉන් කිහිපයක් දශක කිහිපයක් දිවයන කාලසීමාවක් තුළ ගොඩනගා ඇත. මෙම හවුල්කරුවන්ට අනුරූප බැංකු 43ක් සහ වොස්ට්‍රෝ නියෝජිතයින් 82ක් ඇතුළත්ය.

සම්බන්ධතාවයේ කාලසීමාව



බැංකුව අතීතයේ ණය මාර්ග සපයා ඇති විදේශ ණයදෙන ආයතන කිහිපයක් සමඟ සාර්ථක සම්බන්ධතා ස්ථාපිත කර ඇත. මෙවැනි සම්බන්ධතා රටෙහි ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහත වැටීම හේතුවන් වර්තමානයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාදීම නතර වී ඇත. එසේවුවත්, තත්ත්වය වර්ධනය වූ පසු මෙම සම්බන්ධතා නැවත ස්ථාපිත කිරීමට බැංකුව අරමුණු කරයි.

ක්ෂේත්‍රයේ සංවිධාන සමඟ සාමාජිකත්වය

බැංකුව, බැංකු ක්ෂේත්‍රය ආශ්‍රිත සංවිධාන සමඟ සම්බන්ධතා ගණනාවක් ගොඩනගා පෝෂණය කර ඇත. මෙවැනි සම්බන්ධතා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ක්ෂේත්‍රයේ මනා පරිචයන් එක මට්ටමක තබා ගැනීමට ප්‍රයෝජනවත් වී ඇත. එවැනි සම්බන්ධතා ක්ෂේත්‍රයේ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අමතරව, බැංකුවට ජාලගත වීමට ඇති අවස්ථා ශක්තිමත් කරගැනීමට උපකාරී වේ. බැංකුව පහත සඳහන් ආයතනවල සාමාජිකත්වය දරයි:

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ලංකා වාණිජ මණ්ඩලය
- සීමාසහිත ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (සහතිකත්ව) සමාගම
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයින්ගේ සංගමය
- ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය
- ආසියා ශාන්තිකර ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය
- ශ්‍රී ලංකාවේ බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- සීමාසහිත ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (සහතිකත්ව) සමාගම
- බැංකුකරුවන්ගේ නිශ්කාෂණ සංගමය
- ශ්‍රී ලංකා සේව්‍ය සම්මේලනය
- ප්‍රාථමික වෙළඳ සංගමය
- ශ්‍රී ලංකා FOREX සංගමය

සැපයුම්කාර පාරිසරික තක්සේරුව

පාරිසරික නියමයන් සහ රෙගුලාසි සහ ජාතික පාරිසරික පනත මෙන්ම බැංකුවේ පාරිසරික ප්‍රතිපත්තිය වැනි නීතිවලට අනුකූල වන සැපයුම්කරුවන්, බලයලත් වෙළෙන්දන්, නිෂ්පාදකයින්, සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ පමණක් කටයුතු කරයි. මෙම ප්‍රතිපත්තිය නිවාරණ ක්‍රියාවලිය තුළ සැපයුම්කරුවන් සපුරාලිය යුතු සදාචාර සහ ආචාර ධර්ම ප්‍රමිති නියම කරයි. බැංකුවේ ටෙන්ඩර් ක්‍රියාවලියට පාරිසරික බලපෑම වැලැක්වීමේ කොන්දේසි ඇතුළත්ය.

ළමා ශ්‍රමය

රාජ්‍ය බැංකුවක් ලෙස, තරුණ පරම්පරාවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂිත අවධානයක් සමඟ අපගේ සමාජීය බැඳීම් ඉටු කිරීමට අපි කැප වෙමු. බැංකුව ළමා හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරන අතර, මේ සම්බන්ධයෙන් අනුකූලතාව සහතික කිරීමට සියලුම කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන්, වෙළෙන්දන්, සහ නිෂ්පාදකයින් ඉතා පරීක්ෂා සහිතව නිවාරණය කරයි. එවැනි සියලුම පාර්ශව ළමා ශ්‍රමය පිළිබඳ ශ්‍රී ලංකා නීති හා රෙගුලාසිවලට අනුකූල බව අපි සහතික කරමු. බැංකුවේ ටෙන්ඩර් ක්‍රියාවලියට ළමා ශ්‍රමය භාවිතා කිරීම වැලැක්වීමේ කොන්දේසි ඇතුළත්ය.

සදාචාර ව්‍යවහාර

ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා සඳහා අපගේ ප්‍රවේශය සියලුම අවශ්‍යතාවන්ට අනුකූලතාව සහිතව රජයේ රෙගුලාසි, සහ අපගේම ප්‍රසම්පාදන අත්පොත අපි අනුගමනය කරමු. සියලුම ප්‍රසම්පාදන කටයුතුවලදී අපි විනිවිදභාවයට ප්‍රමුඛතාවය දෙන අතර, අපගේ ක්‍රියාවලියට පාරිසරික සහ සමාජීය ගැටළු සැලකිල්ලට ගනු ලබන දැඩි සැපයුම්කාර ඇගයීම් ක්‍රමවේදයක් ඇතුළත්ය. අපි අපගේ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයින් ඉහළම සදාචාර ප්‍රමිතිවල තබන අතර ඔවුන්ට අදාළ සියලුම තොරතුරුවල දැඩි රහස්‍යතාව පවත්වා ගනිමු. ඊට අමතරව නිර්මාණාත්මක ප්‍රතිපෝෂණ ලබාදෙමින්, උසස් තත්ත්වයේ ප්‍රමිති පවත්වා ගනිමින් සහ කාලීන ගෙවීම් සහතික කරමින් වටිනාකම එකතු කිරීමට අපි අරමුණු කරමු.

අනාගත දැක්ම

වසරේ ආකූලතාවන් හමුවේ, අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමේදී අපි සාර්ථක වී ඇත. 2023 දී අපේක්ෂිත වර්ධිත දැක්මක් සමඟ, මෙයට පෙර බලපාන ලද සමහර කටයුතු නැවත ආරම්භ කිරීමට අපි අරමුණු කරමු. අපගේ සැපයුම් දාමය වැඩි කිරීමට සහ අපගේ සම්බන්ධතා ශක්තිමත් කිරීමට ස්ථාපිත හවුල්කාරත්වයන් මත ප්‍රාග්ධනීකරණය කිරීමට අපි අපේක්ෂා කරමු. අතීතයේදී මෙන් අනාගත සම්බන්ධතා වම දැඩි නිවාරණ ක්‍රියාවලියට භාජනය කරනු ඇති බව පැවසිම අනවශ්‍යය. ඵලදායි සහ අනෝන්‍ය ප්‍රතිලාභී සම්බන්ධතා අපි අපේක්ෂා කරන අතර එය බැංකුවේ වටිනාකම එහි ව්‍යාපාර හවුල්කරුවන්ගෙන් ශක්තිමත් කරනු ඇත.

ආයෝජක ප්‍රාග්ධනය

වසර 60කට වැඩි ඉතිහාසයක් ඇති ආයතනයක් වන බැංකුව, අපගේ ප්‍රධාන කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයට දිගු කලක් තිස්සේ ප්‍රධාන දායකයෙකු වී ඇත.

අපගේ ප්‍රවේශය

මහජන බැංකුව සිය සමස්ත මෙහෙයුම් කටයුතුවලදී අඛණ්ඩව ඉහළ මට්ටමේ අවංකකම සහ විනිවිදභාවයක් පවත්වා ගෙන ඇත. කාලීන ආකාරයෙන් බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ එහි සියලුම පාර්ශවකරුවන්ට නිවැරදි චිත්‍රයක් සන්නිවේදනය කිරීමෙන් අපි බැංකුව කෙරෙහි ආයෝජක විශ්වාසය රඳවා තබාගෙන වැඩි දියුණු කර ඇත්තෙමු. අපගේ ශක්තිමත් වත්කම් පදනම සහ කළඹ තුළ ගුණාත්මකභාවය හරහා අපි ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තත්ත්වයක් පවත්වා ගෙන ඇත. 2022 ආර්ථික අර්බුදය වැනි ආපදා කාලයන් තේරුම් ගැනීමට මෙය අපට හැකියාව ලබා දී ඇත. අපගේ ද්‍රවශීලතා අවදානම් රුචියේ සීමාවන් තුළ සහ යටිතල පහසුකම්, තාක්ෂණය, පුද්ගල සංවර්ධනය සහ ක්‍රියාවලි නැවත සකස් කිරීම තුළ ආයෝජන සමඟ ප්‍රමාණවත් ද්‍රවශීලතා තත්ත්වය පවත්වා ගැනීමට අපි සමත් වී ඇත්තෙමු. ආපදා කාලවලදී පවා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව රඳවා ගැනීමට මෙය අපව ශක්තිමත් කර ඇත.

ප්‍රධාන සිදුවීම්

ස්කන්ධය මත ඉපයීම්
12.2%

වැදගත් තේමා

- මූල්‍ය කාර්ය සාධනය
- මෙහෙයුම් කාර්යක්ෂමතාව
- සේවක ඵලදායිතාව
- වගකීම්සහගත ණය දීම
- සන්නාම හිමිකම
- ගනුදෙනුකාර ප්‍රවේශය



අභියෝග

- වර්ෂය තුළ කැලඹිලි සහිත ආර්ථික තත්ත්වයන්
- ලාභදායීතාවයට බලපාන ණය දීමේ සීමාවන්.

අවස්ථා

- 2023 දී වර්ධිත ආර්ථික තත්ත්වයන් ලාභදායීතාවය සහ ලාභාංශ ගෙවීම් වැඩි කිරීමට හේතු විය හැක.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

8 DECENT WORK AND ECONOMIC GROWTH

යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

බැංකුවේ මූල්‍ය ශක්තිය සහ ස්ථාවරත්වය සුරක්ෂිත සහ හොඳ වැටුප් සහිත රැකියා සැපයීම සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම් හරහා ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීම ශක්තිමත් කරයි.

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

සාමය, සාධාරණත්වය හා ශක්තිමත් ආයතන

ශක්තිමත් පාලන ව්‍යුහයක්, සදාචාර පරිචයන් සහ කාර්යක්ෂම කළමනාකරණය ආයෝජකයින් වෙත අපගේ ආයාචනය වැඩි කරමින් බැංකුවේ කීර්තිනාමය ගොඩනංවයි.

නිර්මාණය කළ වටිනාකම

රු.මි. 661ක්

විශේෂ බදු හා ලාභාංශ ලෙස කොටස්හිමියන්ට ගෙවන ලදී.

ප්‍රාග්ධන සබඳතා

ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය තුළ ආයෝජනය පරිසරය කෙරෙහි අපගේ බලපෑම අවම කරයි.

ස්වභාවික ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ නව්‍යකරණය තුළ ක්ෂේත්‍රයේ නායකත්වය ආයෝජන ප්‍රාග්ධනය වැඩි කිරීමට දායක වේ.

මූල්‍ය ප්‍රාග්ධනය

අපගේ ආදායම පවත්වා ගැනීම සහ ලාභයේ වැඩිවීම ආයෝජක ප්‍රාග්ධනය වැඩි දියුණු කරයි.



නිෂ්පාදක ප්‍රාග්ධනය


පිරියත හා උපකරණවල ආයෝජනය අඟය නිර්මාණය කිරීමට සහ වැඩිකළ ආයෝජක ප්‍රාග්ධනයට හේතු වේ.

මානව ප්‍රාග්ධනය


සේවකයින්ගේ කුසලතා සහ දක්ෂතා ඉහළ සහ ලාභදායී වර්ධනයක් ඇති කරයි.

ආයෝජක ප්‍රාග්ධන සංඛ්‍යාලේඛණ

ස්කන්ධය මත ඉපයීම



වත්කම් මත ඉපයීම



කොටස්හිමියන්ගේ විස්තර

අපගේ ප්‍රධාන කොටස්හිමියා වන්නේ කොටස්වලින් 92.27%ක් දරන ශ්‍රී ලංකා රජය වන අතර ඉතිරිය වන 7.73% සමූපකාර සමිති විසින් දරනු ලබයි.

එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

2022 වර්ෂයේදී, මහ බැංකුව වැඩිකළ ප්‍රතිපත්ති අනුපාතවල ප්‍රතිඵලයක් ලෙස රට තුළ පැවති භාණ්ඩාගාර බිල්පත්වල ඉහළ අනුපාත හේතුවෙන් බැංකුවේ එකතුකළ ආර්ථික වටිනාකමට සැලකිය යුතු ලෙස බලපා ඇත.

EVA ගණනය කිරීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,	2022 රු '000	2021 රු '000	වෙනස %
ආයෝජිත ස්කන්ධය			
කොටස්හිමි අරමුදල	145,294,131	136,077,096	6.8%
එකතුකළා: අපේක්ෂිත ණය අලාභ සහ වෙනත් අලාභ සඳහා දිමනාව	140,104,909	101,277,028	38.3%
එකතුව	285,399,040	237,354,124	20.2%
ඉපයීම්			
බදු පසු ලාභය	17,192,058	23,720,143	-27.5%
එකතුකළා: හානිකරණ අයකිරීම	33,346,451	14,472,820	130.4%
අඩු කලා: කපා හරින ලද ණය	(271,802)	(187,681)	44.8%
එකතුව	50,266,707	38,005,282	32.3%
ස්කන්ධ පිරිවැය (මාස 12 බරතබන ලද සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2%) අවධානම් වාරිකය සඳහා	27.6%	10.2%	
සාමාන්‍ය ස්කන්ධ පිරිවැය	72,198,620	21,873,885	230.1%
එකතුකළ ආර්ථික වටිනාකම	(21,931,913)	59,879,167	-236.0%

උත්පාදනය කරන ලද සහ බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම

උත්පාදනය කරන ලද සහ බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම අපගේ කොටස් හිමියන් සඳහා අප විසින් උත්පාදනය කර ඇති ධනයේ ප්‍රමාණය සහ බැංකුව විසින් එහි වර්ධනය සඳහා රඳවාගෙන ඇති මුදලේ වෙන්කිරීම පිළිබඳ පෙන්නුම් කිරීමකි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2018 රු. '000	2019 රු. '000	2020 රු. '000	2021 රු. '000	2022 රු. '000	වර්ධනය % 2021 ට අනුව 2022
ආදායම් මූලාශ						
පොළිය	166,441,208	186,714,218	179,717,526	197,330,011	321,935,983	63.1
හුවමාරු	6,016,099	800,416	3,311,844	(965,361)	2,740,436	183.9
කොමිස් සහ ගාස්තු	6,956,292	7,336,594	6,723,826	8,268,168	16,397,745	98.3
ප්‍රාග්ධන ලාභ	162,923	329,071	336,495	143,459	184,223	28.4
වෙනත්	1,707,356	4,548,686	892,017	2,473,543	15,970,222	545.6
එකතුව	181,283,878	199,728,985	190,981,708	207,249,820	357,228,609	72.4
ආදායම භාවිත කිරීම						
තැන්පත්කරුවන්/ණයකරුවන් වෙත පොලී වශයෙන්	111,034,922	125,507,699	118,783,744	114,869,171	246,177,918	114.3
සේවකයින් හට පාරිශ්‍රමික වශයෙන්	19,504,835	19,226,233	19,685,506	22,711,335	26,602,748	17.1
භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වෙත	12,822,211	12,153,293	11,128,830	12,276,709	15,882,049	29.4
මූල්‍ය වත්කම් මත ශුද්ධ හානිකරණ අලාභය	2,623,970	8,488,026	11,567,174	14,472,820	33,346,451	130.4
රජය වෙත – බදු, විශේෂ බදු හා ලාභාංශ	19,814,596	19,817,027	14,444,917	16,328,960	13,944,390	-14.6
ප්‍රජාව වෙත	42,288	35,683	28,703	12,665	38,213	201.7
වර්ධනය සඳහා රඳවාගත්	15,441,056	14,501,024	15,342,833	26,578,159	21,236,840	-20.1
එකතුව	181,283,878	199,728,985	190,981,708	207,249,820	357,228,609	72.4

සටහන: ඉහත දැක්වෙන සංඛ්‍යා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) මත පදනම්ව පිළියෙල කරන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ගෙන් උපුටා ගන්නා ලදී.

ලාභාංශ ගෙවීම සහ ලාභාංශ ප්‍රතිපත්තිය

අපගේ ලාභාංශ ගෙවීමේ ප්‍රතිපත්තිය ස්ථීර විරාමයකදී කොටස්හිමියන්ට ලාභාංශ ගෙවීම් සිදුකරන බවට අපි ව්‍යුහගත කර ඇත. එය කොටස්කරුවන්ගේ ආදායමට සහ බැංකුවේ දිගුකාලීන ව්‍යාපාර ව්‍යාප්තියට සහය වේ. 2022 සඳහා ලාභාංශ ගෙවීම රු.මි. 661ක් විය.

අනාගත දැක්ම

ඉතා කැලඹිලි සහිත වසරක් තුළ වුවත්, බැංකුව ඉතා සතුටුදායක ප්‍රතිඵල සහ ලාභාංශ ගෙවීම් සාක්ෂාත් කර ගැනීමට සමත් වී ඇත.
ආර්ථිකයේ වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවන් සමඟ, 2023 සහ ඉදිරි වසරවල වැඩි ලාභයක් සහ කොටස් හිමිකාර වටිනාකමක් අපේක්ෂා කළ හැකිය.

ප්‍රජා ප්‍රාග්ධනය

සාමාන්‍ය මිනිසාගේ අවශ්‍යතා සපුරාලීමට අපේක්ෂා කරන කාර්යභාරය ඉටු කිරීමෙන්, ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ සංවර්ධනය පෝෂණය කරමින්, සහ සමාජයේ සමස්ත අභිවෘද්ධිය සඳහා දායක වෙමින්, දශක හයකට පමණ පෙර ආරම්භයේ සිටම මහජන බැංකුව ප්‍රජාව සමඟ සිය ශක්තිමත් බැඳීම් රඳවා තබා ගෙන ඇත. මෙම ඉලක්කය සඳහා කැපවීම බැංකුවේ හදවතෙහි පවතින අතර, විශේෂයෙන් අපගේ පැවැත්ම සහ සේවාවන් සඳහා වැඩිම අවශ්‍යතාවයක් ඇති ප්‍රදේශවල අපගේ ගනුදෙනුකරුවන්ට සහ පුළුල් ප්‍රජාවට උපකාරය සහ සහාය ලබා දීමට අපව පොලඹවයි. අපගේ ආයතනික සමාජ සත්කාර වැඩසටහන් බොහොමයක් අවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛතාවය මත පදනම්ව දේශීය ප්‍රජාවන් ඉලක්ක කර ඇත. සියලුම දිස්ත්‍රික්කවල හඳුනාගත් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට උපකාර වන අපගේ පෝෂණ වැඩසටහන සහ ඉතා දුෂ්කර ග්‍රාමීය පාසල්වලට සහය වන ජල හා විදුලි ව්‍යාපෘති උදාහරණ වේ.

අපගේ ප්‍රවේශය

ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ප්‍රජාවගේ යටිතල පහසුකම් සහ පහසුකම් සංවර්ධනය කිරීමේ අපගේ මෙහෙවර අනුව කටයුතු කිරීමේදී, අපගේ ප්‍රජා සේවා වැඩසටහන් ව්‍යාප්ත කිරීමේ මාධ්‍යයක් ලෙස අපගේ සමාජ සත්කාර වැඩසටහන වන 'මහජන මෙහෙවර' දියත් කිරීම ඇතුළු වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇත. ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල මහජනතාවට මූල්‍ය සාක්ෂරතාව සහ ව්‍යාපාරික කුසලතා ලබා දීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇත. එමෙන්ම සිය කුසලතා ප්‍රවර්ධනය කරන ප්‍රජා කටයුතු දිරිමත් කිරීම මගින් ප්‍රජාවේ සංස්කෘතික සම්ප්‍රදායන්, කලාවන් සහ ශිල්ප ආරක්ෂා කිරීමට ද අපි අරමුණු කරමු. ඊට අමතරව, අපගේ උත්සාහයන් තිරසාරත්වය සහ පරිසර සංරක්ෂණය සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කර ඇති අතර අද අප අත්කර ගන්නා දෙයින් අනාගත පරපුරට ප්‍රතිලාභ සැලසෙන බව සහතික කරයි.

ප්‍රධාන සිදුවීම්

රටපුරා ප්‍රජා සංවර්ධනය තුළ **රු.මි. 38.2ක් වන** සැලකියයුතු ආයෝජනය

කොළඹ ප්‍රධාන ජාතික රෝහල් තුනකට අත්‍යවශ්‍ය ඖෂධ, සහ වෛද්‍ය උපකරණ මිලදි ගැනීම සඳහා මෙන්ම වාට්ටු අළුත්වැඩියාව සඳහා **රු.මි. 13.5ක** ආධාර කර ඇත.

රටේ දුෂ්කර ප්‍රදේශවල පිහිටි වරප්‍රසාද නොලත් ග්‍රාමීය පාසල්වලට සූර්ය බලශක්ති පද්ධති සහ පිරිසිදු පානීය ජලය සඳහා **රු.මි. 6.4ක** ආධාර ලබා දී ඇත.



වැදගත් තේමා

- සමාජ ආර්ථික බලපෑම
- වගකීම් සහගත ණයදීම

අභියෝග

- වසරේ පළමු භාගය තුළ ප්‍රවාහන සීමා කිරීම් සහ සීමිත පොදු ප්‍රවාහනය
- ඉහළ යන පිරිවැය සහ අයවැය සීමාවන් හේතුවෙන් බොහෝ ප්‍රජා සේවා ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩලයට සහභාගී වීම වළක්වා ඇත.

අවස්ථා

- මහජන මෙහෙවර ආයතනික සමාජ සත්කාරක මූලපිරීම් යටතේ ප්‍රජාපාදක ක්‍රියාකාරකම් සිදු කරමින් මහජන බැංකුවේ ආයතනික සන්නාමය තවදුරටත් වැඩි දියුණු කිරීම.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය

දරිද්‍රතාව නොමැත

මූල්‍යකරණය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි කිරීම, මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම දරිද්‍රතාවය තුරන් කිරීමට උපකාරී වේ.

සාගින්න නොමැත

කුඩා පරිමාණ ගොවීන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි මූල්‍ය පහසුකම් සැපයීම මගින් කෘෂිකර්මාන්තය තිරසාර කරයි.

යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම

රෝහල්වලට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සහ ළමුන් අතර මන්දපෝෂණය තුරන් කිරීම.

ගුණාත්මක අධ්‍යාපනය

පාසල් පොත් බෙදාහරිමින් අධ්‍යාපනයට සහයවීම.

පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව

දුෂ්කර ග්‍රාමීය පාසල්වලට පානීයජලය ලබාදීම.

දැරියහැකි සහ පිරිසිදු බලශක්තිය

දුෂ්කර ග්‍රාමීය පාසල්වලට සූර්ය බලශක්තිය ලබාදීම සහ ශාඛා සූර්ය බලශක්තියට මාරු කිරීම.

අරමුණු සඳහා හවුල්කාරත්වයන්

ප්‍රජා ව්‍යාපෘති කරගෙන යාමට වෙනත් ආයතන සමඟ හවුල්කාරවීම.

නිර්මාණය කළ අගය

රු.මි. 9.6ක් වටිනා ප්‍රජා පදනම්
සංවර්ධන ණය ගණන
22,150කි.

ප්‍රාග්ධන සබඳතා

අලුතින් නිර්මාණය කරන ලද ආයතනික සමාජ සත්කාරක සන්නාමය වන 'මහජන මෙහෙවර' යටතේ පවත්වනු ලබන ප්‍රජා සත්කාරක ව්‍යාපෘති ජනතාව අතර බැංකුවේ ප්‍රතිරූපය ඉහළ නංවයි.


බුද්ධිමය ප්‍රාග්ධනය

ස්වයං-බැංකු ඒකක හඳුන්වාදීමත් සමඟ, ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම මගින් කඩදාසි පරිභෝජනය අඩු කිරීමට බැංකුව පියවර ගෙන ඇති අතර එය ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීමේදී සහ තිරසාර අනාගතයක් ගොඩ නැගීම සඳහා දායකවීමේදී සහය වී ඇත.

ස්වභාවික ප්‍රාග්ධනය

බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය ප්‍රජා සංවර්ධන ව්‍යාප්ති කටයුතු සඳහා යොදවා ඇති අතර එයට ප්‍රජා සංවර්ධනය පුළුල් කිරීමද ඇතුළත්ය. ප්‍රජා සංවර්ධන කටයුතුවල ආයෝජනය සමාජයේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය දායකත්වයක් බව පෙනී යයි.

මූල්‍ය ප්‍රාග්ධනය



නිෂ්පාදිත ප්‍රාග්ධනය

ස්වයං බැංකුකරණය ඒකක සැපයීම මගින් දුරස්ථ ප්‍රජාවන් සඳහා බැංකු සේවාවල පහසුව සහ ප්‍රවේශ්‍යතාව වැඩි වී ඇති අතර එමගින් බැංකුවේ නිෂ්පාදන ප්‍රාග්ධනය වැඩි වේ.

මානව ප්‍රාග්ධනය

බැංකුව එහි මානව සම්පත්වල වටිනාකම හඳුනාගන්නා අතර ආයතනික සමාජීය සත්කාරක කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් වැඩ කිරීමට සේවකයින් දිරිගන්වනු ලබයි. මේ මගින් කණ්ඩායම් හැඟීම ගොඩ නැගීම මෙන්ම සේවකයන් අතර සමාජ දැනුවත්භාවයද ඇති කරයි.

ආයතනික සමාජ සත්කාරක වැඩසටහන් වල ආයෝජනය

ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති ආයෝජනය (රු.මි.)		ප්‍රජාව පදනම් සංවර්ධනය ණය ගණන		ප්‍රජාව පදනම් සංවර්ධනය ණය (රු.මි.)	
2018	2019	2018	2019	2018	2019
42.3	35.7	42,511	31,686	9,017.6	7,852.4
2020	2021	2020	2021	2020	2021
28.7	12.7	37,064	32,260	22,967.2	16,544.9
2022		2022		2022	
38.2		22,150		9,568.10	

අපගේ ව්‍යූහගත ආයතනික සමාජ සත්කාරක වැඩසටන්වලින් සෞඛ්‍යය සහ වෙනත් සමාජීය කටයුතු, අධ්‍යාපනය, කලාව සහ සංස්කෘතිය සහ පරිසරය ආරක්ෂා කිරීම ශක්තිමත් කර ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එබැවින්, අපගේ අරමුදල්, ආයෝජනය, සහ මූල්‍ය විසඳුම්වලින් විවිධ ජාතික කණ්ඩායම් සහ පුද්ගලයින් ප්‍රතිලාභ ලබයි. පහත වගුව මෙම මූලික ක්ෂේත්‍රවල අපගේ අරමුදල් ආයෝජනය කිරීම පිළිඹිබු කරයි.

ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතිවල ආයෝජන අනුව වර්ගීකරණය - 2022

වර්ගය	ප්‍රමාණය රු. '000
කලාව සහ සංස්කෘතිය	5,800
අධ්‍යාපනය	5,050
පරිසරය	6,435
සෞඛ්‍යය	14,637
වෙනත්	6,291
එකතුව	38,213

අපගේ ප්‍රජා ව්‍යාපෘති

වසර තුළදී, බැංකුවේ ආයතනික සමාජ සත්කාරක (CSR) වැඩසටහන වන මහජන මෙහෙවර අනුග්‍රහයෙන් සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශ මූලික ප්‍රතිලාභීන් බවට පත් වෙමින් විවිධ ප්‍රජා සේවා මූලපිරීම් හරහා ප්‍රමුඛත්වය ලබා ගෙන ඇත. බැංකුව එහි මූලික වටිනාකම් වලට අනුකූලව අඩු වරප්‍රසාදලාභී අංශවලට උපකාර වීමට කැප වී සිටී. 2022 දී, බැංකුව එහි ආයතනික සන්නාමය පිළිබඳව එහි සමාජීය දැනුම ඒකාබද්ධ කිරීමේ අතිරේක පියවරක් ගත්තේය. අධික ආක්‍රමණශීලී අලෙවිකරණ ප්‍රවේශය සුදුසු නොවන වර්තමාන ආර්ථික වාතාවරණය අනුව මෙය බොහෝ පුද්ගලයන් සමඟ හොඳින් අනුනාද වීම සහතික වන තීරණයකි. දැඩි සමාජ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන මෙවැනි ප්‍රජා-පදනම් මූලපිරීම් කාලය සඳහා සුදුසු වූ වඩාත් විචක්ෂණ ආකාරයෙන් බැංකුවේ ආයතනික සන්නාමය ආරක්ෂා කරයි.

සෞඛ්‍යය සහ වෙනත් සමාජ කටයුතු

නිදහසේ උපත

බැංකුව මෙම වසරේ දී නිදහසේ උපත වැඩසටහන තවදුරටත් කරගෙන යාමත් සමඟ ශ්‍රී ලංකාවේ 75 වැනි නිදහස් උත්සව දිනය සමරන ලදී. මහජන බැංකුව 2022 පෙබරවාරි 1 සිට 7 අතර උපදින සෑම දරුවෙකුටම රු. 2,000ක් වටිනා ඉසුරු උදාන තෑගි සහතිකපත් තෑගි වශයෙන් දෙන ලදී. බැංකු නිලධාරීන් සංකේතාත්මකව ඉසුරු උදාන වවුචර්පත් සහ වෙනත් ත්‍යාග අයිතම කාසල් වීදියේ කාන්තා රෝහලේ සහ ද සොයිසා කාන්තා රෝහලේ අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රදානය කළේය. මේ සමඟම, මහජන බැංකුවේ දිවයින පුරා ශාඛා ද මේ ආකාරයෙන් උත්සවය සමරන ලදී.





රෝහල් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ

රු.මි. 5ක් වටිනා අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ කොළඹ පිහිටා ඇති ජාතික රෝහල් වන ලේඩි රිජ්වේ සහ කාසල් වීදියේ රෝහල වෙත පරිත්‍යාග කරන ලදී. වර්තමානයේ අපි මහජන මෙහෙවර මූලපිරීම තුළින් ද සොයිසා රෝහලේ වාට්ටු අළුත්වැඩියා කරමින් සිටිමු.





Feed-a-child වැඩසටහන

ළමුන්ගේ අඩු පෝෂණ මට්ටම් ප්‍රධාන ගැටළුවක් බවට පත්වීමත් සමඟ, මහජන බැංකුව ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ පාසල මනුසත් දෙරන පුණ්‍යායතනය සමඟ හවුලේ දියත් කළ Feed-a-child වැඩසටහනට රු.මි. 1ක් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් විය. සියලුම දිස්ත්‍රික්වල මන්දපෝෂණයෙන් පෙලෙන දරුවන් ප්‍රදේශයේ පවුල් සෞඛ්‍යය නිලධාරීන් මගින් හඳුනා ගන්නා අතර එම වැඩසටහන විසින් ළමා රෝග විශේෂඥයින්ගේ අධීක්ෂණය යටතේ මාස හයක කාලසීමාවක් සඳහා සෑම සති දෙකකට වරක් රු. 6,000ක වටිනාකමට අත්‍යවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය ලබා දෙන්නෙමු. ළමුන්ගේ පෝෂණ තත්ත්වය ප්‍රදේශයේ වෛද්‍යවරුන් සහ නිලධාරීන් විසින් නියාමනය කරනු ලබයි. මෙම වැඩසටහන් මේ දක්වා නුවරඑලිය, මොනරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර ඇත.



ලේ දන්දීමේ කඳවුර

බැංකුවේ 61ක් වැනි සංවත්සරය සැමරීම සඳහා මහජන බැංකුවේ සුභසාධන දෙපාර්තමේන්තුව විසින් බොහෝ පරිත්‍යාගශීලීන්ගේ සහභාගිත්වයෙන් ලේ බැංකුවේ වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙය වාර්ෂිකව සිදු කරන අතර, සෑම වසරකම එහිදී සැලකියයුතු රුධිර ප්‍රමාණයක් ලේ බැංකුව වෙත පරිත්‍යාග කෙරේ.



පරිසරය

දුෂ්කර සහ සම්පත් හිඟ ප්‍රදේශවල පිහිටි පාසල් තුනක් වෙත කි.වෝ. 3 සූර්ය බලශක්ති අපවර්තක පද්ධතිය, ජල නල, සහ ජල ටැංකියක් සපයන ලදී.

- මීමුරේ ගලමුදුන කණිෂ්ඨ පාසල
- බදුල්ල මීගහකිවුල කලුකැලේ විද්‍යාලය
- රත්නපුර, අයගම දුම්බර අංක 02 දෙමළ විද්‍යාලය

මෙම වැඩසටහන තුළින් පාසලේ සිසුන්ට සහ ගුරුවරුන්ට විදුලිය සහ නොකඩවා ජලය සපයනු ලැබේ. ඉන් ප්‍රතිලාභ ලබන පාසල් ලැයිස්තුව පුළුල් කිරීම ඉදිරි වසරේදී සිදු කිරීමට අපේක්ෂිතය.



කලාව සහ සංස්කෘතිය

බැංකුව අපගේ සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කරමින් සම්ප්‍රදායික නැටුම් සහ සංගීතය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස ලොව කීර්තිමත් මහනුවර පෙරහැර උත්සවය වන වාර්ෂික ඇසල පෙරහැරේ ප්‍රදාන අනුග්‍රාහකයා බවට බැංකුව පත්වී ඇත. එමෙන්ම බැංකුව පොසොන් පෝය සැමරීම සඳහා අනුරාධපුර ආගමික උත්සව සහ පුන්‍ය කටයුතු සඳහා නිරන්තරව සහභාගි වී ඇත.



පාසල් පොත් ව්‍යාපෘතිය

මහජන බැංකුවේ බෞද්ධ සංගමය 2022 නොවැම්බර් හි වාර්ෂික පොත් පරිත්‍යාග ව්‍යාපෘතිය තුළ තවත් පියවරක් ගෙන ඇත. බැංකුවේ මහජන මෙහෙවර වැඩසටහන යටතේ මෙය සිදු කරන ලද අතර කොළඹ 10 විහාර මහා දේවී බාලිකා විද්‍යාලයේදී පවත්වනු ලැබීය. ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් පාසල් ළමුන් 200කට පමණ පාසල් පොත් සහ වෙනත් උපකරණ බෙදා දෙන ලදී.



ප්‍රජා පදනම් සංවර්ධන ණයදීම

වරප්‍රසාද නොලත් ප්‍රජාවන් අතර මූල්‍ය සාක්ෂරතාව සහ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීමේ බැංකුවේ උපායමාර්ගය ප්‍රජා පදනම් ණයදීම කෙරෙහි මූලිකව යොමු වී ඇත. කුඩා පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් ඇති කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවන් නඟා සිටුවීමට බැංකුව වැඩසටහන් කිහිපයක් දියත් කර ඇත. 2022දී, රු.මි. 7,331ක් වන ප්‍රජා පදනම් සංවර්ධනය සඳහා ණය 17,100ක් සඳහා බැංකුව සාර්ථකව අරමුදල් ලබා දී ඇත. ඊට අමතරව, බැංකුව ප්‍රතිමූල්‍යකරණය තුළින් රු.මි. 2,236.75ක් වන ප්‍රජා සංවර්ධන ණය 5,050ක් බෙදාහැර ඇත. විවිධ අංශ තුළ මෙවැනි ණය භාවිතා කර ඇති අතර එහි විශාලතම කොටස කෘෂිකාර්මික ක්ෂේත්‍රය සතු වේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට රු.මි. 6,282.11ක් වටිනා ණය 9,547ක් සෘජුවම ලබා දී ඇති අතර, ප්‍රතිමූල්‍ය තුළින් 763.95ක් වන ණය 1,816ක් ප්‍රදානය කරන ලදී.

2022 දී ප්‍රජා පදනම් ණය

	බැංකුව මගින් ලබාදුන් අරමුදල්		ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමවලින් අරමුදල්	
	ණය ගණන	හිඟව ඇති ණය මුදල රු.මි.	ණය ගණන	හිඟව ඇති ණය මුදල රු.මි.
කෘෂිකාර්මික	9,547	6,282.1	1,816	764.0
වාණිජ	1,218	266.4	1,306	781.0
පාරිභෝගික	10	5.0	4	0.6
මූල්‍ය	56	11.4	22	4.5
නිවාස සහ දේපල සංවර්ධනය	15	3.7	13	14.3
කර්මාන්ත	391	47.7	470	157.4
අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම්	5,653	614.8	908	83.5
සේවා	184	48.0	423	214.1
සංචාරක	26	52.2	88	217.4
මුළු එකතුව	17,100	7,331.4	5,050	2,236.8

වත්‍ර ආර්ථික බලපෑම්

බැංකුව ක්‍රියාත්මක ආර්ථිකයට ධනාත්මක වත්‍ර බලපෑමක් නිර්මාණය කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. ජාතියේ බැංකුකරු ලෙස මහජන බැංකුව විශ්‍රාම වැටුප් ගෙවීම්, විශ්ව විද්‍යාල ගෙවීම් සහ රජයේ ගුරුවරුන්ගේ වැටුප් ගෙවීම වැනි නොමිලේ සේවා ලබාදීම හා සම්බන්ධ වේ.

බැංකුව පුනර්‍ය කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිත්‍යාග එකතු කිරීමට ශාඛාවල අවස්ථාව සලසමින් ශ්‍රී දන්ත ධාතුව (ශ්‍රී දළඳා මාලිගාව) බෞද්ධ ශාසනාධන අරමුදලට සහය වී ඇත.

"පීපල්ස් ස්පාර්ක්" යනු නව උපාධිධාරීන් ව්‍යවසායකත්ව කාර්යභාරයට මාරු කිරීම ශක්තිමත් කිරීමට දියත් කර ඇති තවත් එක් ව්‍යාපෘතියකි. බැංකුව ව්‍යාපාර උපායමාර්ග, ඔවුන්ගේ වත්කම් ප්‍රතිව්‍යුහගතකිරීම සහ ඔවුන්ගේ පුනර්ජීවනය සඳහා මඟ පෙන්වීම වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කිරීමට ප්‍රාදේශීය ණය ඒකකවලට සහය වන අතරම අමතර මූල්‍ය සහයද ලබා දේ.

අනාගත දැක්ම

ජනතාව නියෝජනය කරන බැංකුවක් ලෙස, අපගේ මූලයන් සහ පැවැත්ම දිවයින පුරා පුළුල් ප්‍රජාව තුළ මුල්බැසගෙන ඇත. අපගේ කාර්යයන් ගනුදෙනුකරුවන්ගේ සහ සමස්ථයක් ලෙස සමාජයේ පැවැත්ම විසින් මෙහෙයවනු ලබන අතර අපගේ සියලුම උත්සාහයන් තුළ ඔවුන්ගේ සුභසාධනය සඳහා ප්‍රමුඛතාව දීමට අපි බැඳී සිටිමු. විශේෂයෙන් මහජන මෙහෙවරෙහි තේමාත්මක ප්‍රකාශය යටතේ අපි අපගේ කටයුතු අඛණ්ඩව කරන අතරම, ප්‍රජාවට සේවය කිරීමට සහ සියලුම දෙනාගේ අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටින්නෙමු.

ස්වභාවික ප්‍රාග්ධනය

ස්වභාවික ප්‍රාග්ධනය යනු මානවයා ඇතුළු සියලුම ජීවීන්ගේ භාවිතය සහ යහපැවැත්ම සඳහා ලබාගත හැකි පස, ජලය සහ වායුව වැනි ස්වාභාවික සම්පත්වල මිහිකතේ සීමිත ගබඩාවයි. අපි එයින් කුමක් ගනු ලැබුවද, එය ආපසු දිය යුතුය. එබැවින් අපගේ පැවැත්ම රඳාපවතින පහසුවෙන් බිඳෙන පරිසර පද්ධතියට අපි හානි නොකළ යුතුය. අපගේ පාර්ශවකරුවන්ට හැකි විශිෂ්ඨතම දෑ ලබාදීමේ අපගේ කාර්යභාරය තුළ, බැංකුවට මෙම සමහර සම්පත් භාවිතා කිරීම අවශ්‍ය නොවූවත්, අපගේ ව්‍යාපාර කටයුතුවල දී ඒවා අඩු කිරීමට, ප්‍රතිචක්‍රීයකරණය කිරීමට සහ නැවත භාවිතයට සියලු පියවර අපි අරගනිමු.


අපගේ ප්‍රවේශය

පරිසරය සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ කොටසකි. ආරම්භයේ සිටම, භූමියට, විවිධ ක්ෂේත්‍රයනට, අභ්‍යන්තර ජල ප්‍රවාහයන්ට සහ සාගරවලට සම්ප කර්මාන්ත, ව්‍යාපාර සහ ජනතාව වෙත අපගේ අවධානය යොමු කර ඇත. මෙම දැක්ම අපගේ සියලුම මෙහෙයුම්, පරිපාලන තීරණ, ණයදීමේ ප්‍රතිපත්ති, ඩිජිටල් බැංකුකරණ විසඳුම් දක්වා ද හරිත ශාඛාවල අත්‍යවශ්‍ය කොටසක් ලෙස තිරසාරභාවය ඇති කිරීමට කටයුතු කර ඇත. අපගේ කාබන් සහතිකය අනුව විමෝජනය අවම කිරීමට, පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීමට සහ අපගේ මැදිහත්වීම් තුළින් සමස්ථ පාර්ශ්වකාර ප්‍රජාවට පාරිසරික සංරක්ෂණය පිළිබඳව ලොවපුරා ව්‍යාප්ත කිරීමට අපි අඛණ්ඩව උත්සාහ ගනිමු. ක්ෂේත්‍රය තුළ ඩිජිටල්කරණය වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇති අතර, අනෙක් අය ද අනාගත පරිම්පරාව සඳහා බැංකුකරණය තුළ මුළුමනින්ම නව සංකල්පයක් සඳහා මඟ පාදමින් අපගේ පියවර අනුගමනය කරමින් සිටින බව ප්‍රතිඵලවලින් පෙන්වා ඇත.

ආයතනික සමාජ වගකීමට අනුව "මහජන මෙහෙවර" නවෝත්පාදන පියවරක් ලෙස බැංකුව විසින් දියත් කරන ලදී. මෙම කටයුතු මහජන බැංකු සන්නාමයේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත්ව ඇත.

ප්‍රධාන සිදුවීම්

- ශාඛා **20ක්** සූර්ය බලශක්තියෙන් බලගන්වා ඇත.
- ජල පරිභෝජනය **3,318 cu.m.** කින් අඩුකර ඇත.
- විදුලි පරිභෝජනය **කි. වො. 20,344** කින් අඩුකර ඇත.
- ඩිජිටල් ක්‍රමයට ගිණුම් **මිලියන 2.7ක්** විවෘත කර ඇත.
- **රු.බි. 551.9ක්** ඩිජිටල් තැන්පතු රැස් කර ඇත.
- **රු.බි. 1,703ක** වටිනාකමට ATM's සහ SBU ගනුදෙනු **මිලියන 101** සිදු කර ඇත.



වැදගත් තේමා

- වගකිමිසහගත ණයදීම.
- ව්‍යාපාරවලට පාරිසරික බලපෑම.

අභියෝග

- ප්‍රවාහන අර්බුදය සහ ඉන්ධන හිඟය හේතුවෙන් බැංකුවට සේවකයන්ට ප්‍රවාහන පහසුකම් සැපයීමට සිදු වූ අතර, ඉන් පොසිල ඉන්ධන භාවිතය වැඩි වීම.
- වැඩ ඇනහිටීම් සහ පිරිවැය වැඩිවීම නිසා හරිත ශාඛා ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රමාදයන්

අවස්ථා

- පාරිභෝගිකයින්ගේ ඩිජිටල් භාවිතය වැඩි වීම.
- ගමන් සීමා කිරීම් හේතුවෙන් පරිපාලනය, සම්මුඛ සාකච්ඡා, රැස්වීම් (අභ්‍යන්තර හා බාහිර) මාර්ගස්ථ ක්‍රමයන්ට අනුව පවත්වනු ලැබීම.
- ඩිජිටල්කරණය හරහා අභ්‍යන්තර කඩදාසි භාවිතය තවදුරටත් අඩු කිරීම.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණුවලට දායකත්වය



පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව

ශාඛා කාර්යාලවල ජල සංරක්ෂණය



තිරසාර නගර සහ ප්‍රජාවන්

දුෂ්කර ප්‍රදේශවල අඩු වරප්‍රසාද නොලත් පාසල්වලට පිරිසිදු පානීය ජලය සහ සූර්ය බලශක්ති සැපයීම සඳහා ප්‍රජා සේවා ව්‍යාපෘති



දේශගුණ කටයුතු

වායු සම්කරණ භාවිතය නියාමනය සහ සිමාකරමින් දේශගුණ බලපෑම අවම කිරීම.



දැරියහැකි සහ සහ පිරිසිදු බලශක්තිය

බැංකුවේ ශාඛා ගොඩනැගිලි හරිතකරණය



වගකිමිසහගත පරිභෝජනය සහ නිෂ්පාදනය

බැංකු මෙහෙයුම්වලදී කඩදාසි භාවිතය අඩු කිරීම සහ සියලු ගොඩනැගිලිවල විදුලිය සංරක්ෂණය කිරීම ගනුදෙනුකරුවන් සහ කාර්ය මණ්ඩලය සමඟ ඩිජිටල් අන්තර්ක්‍රියා ප්‍රවර්ධනය කිරීම.

නිර්මාණය කළ වටිනාකම

කඩදාසි ප්‍රතිචක්‍රියකරණය
කි.ග්‍රෑ. 5,968 දක්වා වැඩිවීම

5.9 tonCO_2e
සේවකයෙකුට GHG විමෝචන තීව්‍රතාව

2023 වන විට ශාඛා **50**කට සූර්ය බලශක්ති හඳුන්වාදීමට සැලසුම් කිරීම

2022 සඳහා
ISO 14064-1:2018 සහතිකකරණය

ප්‍රාග්ධන සබඳතා

"මහජන මෙහෙවර" සන්නාමය දියත් කිරීම බැංකුවේ සමස්ථ සන්නාම ප්‍රතිරූපය වැඩිකර ඇත.

බුද්ධිමය ප්‍රාග්ධනය

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වසර තුළ ද්‍රවශීලතා ගැටළු සහ ඉහළ උද්ධමනය නිසා ණය දීම සීමා කිරීමේදී දිවයින පුරා සංචාරක ආක්ෂණය සඳහා මාර්ගගතව ප්‍රවේශපත් නිකුත් කිරීමට මධ්‍යම සංස්කෘතික අරමුදල සමඟ හවුලේ සිටුකරණ ඉ-ප්‍රවේශපත් පාරිසරිකමය ආදාළ සහ තිරසාර ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාගත හැකි වීම.

මූල්‍ය ප්‍රාග්ධනය

ශාඛා අතර පුනර්ජනනීය බලශක්තිවලට මාරුවීම ප්‍රධාන විදුලිය භාවිතා කිරීම අඩු කරයි. විශේෂයෙන්, ගාස්තුවල තියුණු වැඩිවීමත් සමඟ සූර්ය බලශක්තියට මාරුවීම අනාගතයේදී මූල්‍ය ප්‍රතිලාභ ගෙනෙනු ඇත. සමාන ප්‍රතිලාභ ජලය සහ කඩදාසි භාවිතය අඩුකිරීමෙන් අපේක්ෂා කළ හැකිය.

නිෂ්පාදිත ප්‍රාග්ධණය

බැංකු ශාඛා සූර්ය බලශක්ති භාවිතා කරන ගොඩනැගිලිවලට සහ LED ආලෝකරණයට මාරු කිරීම අපි අඛණ්ඩව සිදු කරන අතර දිවා විලිය භාවිතය උපරිම කරමු.

අපි ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සමාජයේ ප්ලැටිනම් (GBCSL) සාමාජිකයෙක් වන අතර, අපගේ සියලුම ශාඛා ඔවුන්ගේ හරිත SL ශ්‍රේණිගතකරණ සපුරාලීමට ඉදි කෙරේ.

මානව ප්‍රාග්ධනය

පරිසර සංරක්ෂණයට අදාළ CSR ව්‍යාපෘති සිදු කිරීමට සියලුම ශාඛා සහ ප්‍රාදේශික දිරි ගන්වන අතර ඒ මගින් කාර්ය මණ්ඩලයට දිවයින පුරා ඔවුන්ගේ ප්‍රජාවන්ට තිරසාර භාවය ලබා දිය හැකියි.

විදුලි පරිභෝජනය අවම කිරීම සඳහා විදුලි පංකා, වායු සමීකරණ සහ ආලෝකය භාවිතය කළමනාකරණය කිරීමට සේවකයින්ගෙන් ඉල්ලා සිටීම.

"PEOPLE'S GREEN PULSE" – බැංකුවේ පාරිසරික තිරසාර වැඩසටහන

මෙම වැඩසටහනේ පරමාර්ථය වන්නේ බැංකුවේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම් නියාමනය කිරීමයි. නවතම තිරසාර බැංකුකරණ ව්‍යවහාර පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කරමින් මෙම බලපෑම අඩු කිරීම සඳහා වගකීමට බැඳී සිටී. එමෙන්ම මෙම වැඩසටහන පිළිබඳව ගනුදෙනුකරුවන් සහ පොදු මහජනතාව අතර දැනුවත් බව ඇති කිරීම සිදු කරන අතර, ඒ තුළින් පුළුල් ප්‍රජාවක් තුළ තිරසාර බැංකරණ ව්‍යවහාර පිළිබඳ උපදේශය ව්‍යාප්ත කරනු ලබයි. People's Green Pulse හි පාරිසරික වැඩසටහන් ඉදිරියට ගෙන යාමට සියලු ශාඛා සහ කලාපවල තිරසාරතා නියමයන් ගොඩනගා ඇත.



හරිත ගොඩනැගිලි සංකල්පය

ගොඩනැගිලි	ක්‍රියාවලි	ගනුදෙනුකරුවන්	සේවකයින්	සමාජය
සියලු ඉදිකිරීම් සඳහා හරිත ගොඩනැගිලි ප්‍රත්පත්තිය.: • තෝරාගත් ශාඛා කාබන් විමෝචනය අවම ලෙස සහතික කිරීම. • ගොඩනැගිලි 20ක් සූර්ය බලශක්තියෙන් බලගැන්වීම (2023 දී යෝජිත ස්ථාපන 50) • LEED/GREENSL/ CIOB මාර්ගෝපදේශ අනුව නව ගොඩනැගිලි අනුගමනය කිරීම. • සියලුම ගොඩනැගිලි ඉදිකරන්නන් LEED/ GREENSL/CIOB හරිත සලකුණු සහතිකකිරීම අනුගමනය කිරීම.	කඩදාසි රහිත මෙහෙයුම්: • ATMs සහ CDMs ස්ථාපිත කරන ලදි. • උපයෝගිතා බිල්පත් ගෙවීම සඳහා Kiosks ස්ථාපිත කරන ලදී. • රටේ පුළුල් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය • කඩදාසි රහිත ගිණුම් විවෘත කිරීම සහ ගිණුම් සඳහා ඉ-ප්‍රකාශන • කඩදාසි රහිත ණය පිරිසැකසුම් • මාර්ගගත සහ මොබයිල් බැංකුකරණය • හරපත් සහ ණයපත් • 24/7 මහජන බැංකු ඇමතුම් මධ්‍යස්ථානය	ඉතුරුම් සඳහා හරිත බැංකුකරණය ප්‍රවර්ධනය: • කඩදාසි රහිත චික්ස්ප්‍රස් බැංකුකරණ ගිණුම් විවෘත කිරීම. • කඩදාසි වෙනුවට ඉ-ප්‍රකාශන • කෙටි පණිවිඩ ක්‍රම සහ අන්තර්ජාල බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම. • මුදල් රහිත සමාජය කරා හරපත් නිකුත් කිරීම. • නව ගනුදෙනුකරුවන් සඳහා චික්ස්ප්‍රස් බැංකුකරණය • CDM- මුදල් තැන්තු යන්ත්‍ර, ATM- මුදල් ලබා ගැනීමේ යන්ත්‍ර Kiosk- බිල්පත් ගෙවීම් යන්ත්‍ර ප්‍රවර්ධනය ණය සඳහා හරිත බැංකුකරණය ප්‍රවර්ධනය: • අඩු අනුපාතවලට විදුලි/ හයිබ්‍රිඩ් කාර්, සූර්ය බලශක්ති පද්ධති මිලදි ගැනීමට සහය වීමට හරිත ණය • පරිසර හිතකාමී බලශක්ති මූලාශ්‍ර දිරිගැන්වීම • පරිසරහිතකාමී ව්‍යවහාර/ක්‍රියාවලි දිරිගැන්වීම.	පාරිසරික තිරසාරභාවයේ ප්‍රතිලාභ පිළිබඳ සේවා බලකාය දැනුවත් කිරීම: • සූර්ය බලශක්ති පද්ධති මිලදී ගැනීමට, පරිසර හිතකාමී ගොඩනැගිලි ක්‍රම භාවිතයට සහ විදුලි/හයිබ්‍රිඩ් කාර් මිලදී ගැනීමට සහන පොළී අනුපාත සහිත ණය පහසුකම් සඳහා කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම. • සේවක ණය යෝජනා ක්‍රම යටතේ හයිබ්‍රිඩ් හෝ විදුලි වාහන පමණක් මිලදි ගන්නා බව සහතික කරන බැංකුවේ ප්‍රතිපත්ති. • විද්‍යුත් ලිපි සහ ඩිජිටල් ලේඛන භාවිතා කිරීමට සේවකයින් දිරි ගැන්වීම.	රටේ වඩාත් තිරසාර හරිත බැංකුව ලෙස අපගේ ස්ථානය අත්කර ගැනීම: • බැංකුවේ මෙහෙයුම්වලින් කාබන් විමෝචනය අවම කිරීම. • කාබන් කළමනාකරණය සහ කාබන් වෙළෙඳ ව්‍යවහාර ක්‍රියාවේ යෙදවීම. • පාරිසරික තිරසාරභාවය පිළිබඳ සමාජය දැනුවත් කිරීම. • රුක් රෝපන ව්‍යාපෘතිවල යෙදීම.

හරිත ශාඛා ගොඩනැගිලි

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාවේ (GBCSL) ප්ලැටිනම් යාවජීව සාමාජිකයෙකු ලෙස, මහජන බැංකුව ශාඛා ජාලයේ ඉදිකිරීම් සහ අළුත්වැඩියාවන්හි හරිත සංකල්පය අනුමත කරයි. මෙම ව්‍යාපාති හි GreenSL ශ්‍රේණිගතකරණ ක්‍රමය මෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි මාර්ගෝපදේශවලට අනුව සහතික කරන අතර අපගේ සියලුම ශාඛා ශ්‍රී ලංකා පිළිගැනීම් මණ්ඩලයේ (SLAB) ISO 14065 සහ GHG 002-01 පිළිගැනීම ලබා ගනී. වායුවල තත්ත්වය සහ ජල කළමනාකරණය පිළිබඳ වඩා ඉහළ කාර්යක්ෂමතාවන්ට මෙය සාක්ෂියකි. අනාගතයේදී අපගේ හරිත ශාඛා ලැයිස්තුව පුළුල් කිරීමට සහ 2023 අවසානය වන විට ශාඛා 50 දක්වා ව්‍යාප්ත කිරීමට අපි අපේක්ෂා කරමු.

හරිත ශාඛා විවෘත කිරීම

සම්පූර්ණ ගොඩනැගිලි ඉදිකිරීම් සහ මෙහෙයුම් නඩත්තු සඳහා හරිත ශ්‍රේණිගත සහතිකයක් ලබාගැනීම සඳහා දැනට ක්‍රියාත්මක පහත දක්වා ඇති ශාඛා සහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සඳහා බැංකුව දැනට ඉහත මාර්ගෝපදේශ අනුගමනය කරයි.

ගොඩනැගිලි විස්තරය	ස්ථානය	හරිත තත්ත්වය	ඉදිකිරීම් තත්ත්වය	අපේක්ෂිත හරිත සහතිකරණ දිනය
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ බැංකු ශාඛා ගොඩනැගිල්ල	මාතලේ	හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව සැලසුම් නිර්මාණය කර ඇත.	හරිත ගොඩනැගිලි සභාවේ GREENSL ශ්‍රේණිගතකරණක්‍රමයේ මාර්ගෝපදේශවලට අනුව ක්‍රියාත්මකය	2023 අවසානයට
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ බැංකු ශාඛා ගොඩනැගිල්ල	යාපනය	හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව සැලසුම් නිර්මාණය කර ඇත.	හරිත ගොඩනැගිලි සභාවේ GREENSL ශ්‍රේණිගතකරණ ක්‍රමයේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් ක්‍රියාත්මකය. ව්‍යුහය අවසන් වී ඇත. හරිත ගොඩනැගිලි සභාවේ GREENSL ශ්‍රේණිගතකරණ ක්‍රමයේ මාර්ගෝපදේශවලට අනුව යමින් 2022 දී පැවති ඉදිකිරීම අවසන්ව ඇත.	2024
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ බැංකු ශාඛා ගොඩනැගිල්ල	කෑගල්ල	නාගරික සංවර්ධන අධිකාරියේ පරිසරික සහ භූදර්ශන අංශයේ මාර්ගෝපදේශවලට අනුව සැලසුම් නිර්මාණය කර ඇත.	නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි ශ්‍රේණිගතකරණ ක්‍රමය සපුරාලමින් ඉදිරියට යයි.	2023 අවසානයට
මහජන බැංකුව සඳහා කාර්යාල සංවර්ධනය	නො: 374, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 2	හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව සැලසුම් නිර්මාණය කර ඇත.	හරිත ගොඩනැගිලි සභාවේ GREENSL ශ්‍රේණිගතකරණ ක්‍රමයේ මාර්ගෝපදේශවලට අනුව ඉදිරියට යයි.	2025
සේවක පුහුණු හා නවාතැන් මධ්‍යස්ථානය	පාසිකුඩා	සූර්ය බලශක්තිය භාවිතය, බලශක්ති කාර්යක්ෂමතා ආලෝක සවිකිරීම් සහ ස්ථාපනය, ජලය ජලය කාර්යක්ෂම සනිපාරක්ෂක සවිකිරීම්, ස්වභාවික ආලෝකකරණය, පිරිපහසු ජලය/අපජලය භූදර්ශනය සඳහා නැවත භාවිතය සහ වැසිජලය පොලවට මුදාහැරීම භාවිතා කරමින් හරිත සංකල්ප යොදාගෙන ඉදිකර ඇත.	අවසන්කළ	ක්‍රියාත්මක
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය ගොඩනැගිලි	කෙලින් වීදිය ගාල්ල	හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව සැලසුම් කර නිර්මාණය කර ඇත.	තාවකාලිකව නවතා ඇත	-
යෝජිත ශාඛා ගොඩනැගිල්ල	තඹුත්තේගම, ත්‍රීකුණාමලය, මාන්කුලම්, කින්නියා කල්මුනේ, කඩවත, මැදිරිගිරිය	හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය කර සැලසුම් කර ඇත.	තාවකාලිකව නවතා ඇත	-

අපගේ කාබන් භාවිතය අඩු කිරීම

2019 දී Sustainable Future Group (SFG) විසින් කාබන් දැනුවත් භාවය සහතික කළ ආසියාවේ පළමු රාජ්‍ය බැංකුව ලෙස, අපි බලශක්ති කාර්යක්ෂමතාව, පුනර්ජනනීය බලශක්තිවල ආයෝජනය, වන වගාව ඉහළ නංවා ඇත.

හරිතාගාර වායු (GHG) තොග සාරාංශය 2022

විෂයපථය	විමෝචන මූලාශ්‍රය	GHG විමෝචන (ටොන්)			මුළු විමෝචන
		CO_2	CH_4	N_2O	$tonCO_2e$
විෂයපථය 1	ලිපිද්‍රව්‍ය පිලිස්සීම	44,251	2	0	44
සෘජු විමෝචන	ජංගම පිලිස්සීම	266,188	14	15	271
	සෘජු ඉක්මණින් පහව යන විමෝචන	58,080	0	0	58
	වර්ගීකරණය 1: මුළු ගණන	369	0	4	373
විෂයපථය 2	මිලදී ගත් විදුලිය	1,124,400	0	0	1,124
වක්‍ර විමෝචන	**වර්ගීකරණය 2: මුළු ගණන**	1,124	0	0	1,124
විෂයපථය 3	මිලදී ගත් භාණ්ඩ	129	0	0	0
වෙනත් වක්‍ර විමෝචන	ව්‍යාපාර සංචාර – වායු	2,206	0	11	5
	සේවක වෙනස්වීම	931,588	1,384	6,695	2,745
	වර්ගීකරණය 3: මුළු ගණන	934	39	1,777	2,750
වෙනත් වක්‍ර විමෝචන	සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ අලාභ	115,813	0	0	116
	ජල සම්පාදනයෙන් සපයන ජලය	2,813	0	0	3
	වර්ගීකරණය 16: මුළු ගණන	119	0	0	119
මුළු විමෝචන		2,546	39	1,781	4,366

සේවකයෙකුට GHG විමෝචන තීව්‍රතාව 5.9 $tonCO_2e$ කි.

විෂයපථය 3 (සේවක වෙනස්වීම) තුළ වැඩිවීම හේතුවෙන් වාර්තාකරන වසර සඳහා GHG විමෝචනවල සැලකියයුතු වැඩිවීමක් පවතී.

කඩදාසි අඩුකිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය

ඩිජිටල් මාර්ග වෙත අභ්‍යන්තර හා බාහිර ක්‍රියාවලි පරිවර්තනය කිරීමෙන්, අපගේ මෙහෙයුම්වල කඩදාසි භාවිතය විශාල වශයෙන් අඩු කර ඇත. හැකි සෑම අවස්ථාවකදීම, කඩදාසි අඩුකරමින් මෙන්ම වඩාත් විශ්ලේෂණාත්මක කාර්යයන් මත වැඩ කිරීම සඳහා සේවකයින් නිදහස් කරමින් SBUs, Kiosks, ATMs සහ CDMs වල අපගේ දිවයින පුරා ජාලය බොහෝ ගනුදෙනුකරුවන් ශාඛා කවුළුවල සිට ඩිජිටල් මාර්ග දක්වා විතැන් වී ඇත. බාහිර පාර්ශ්වයන්ට බාරදෙන අවස්ථාවේදී අපිට රහස්‍යතාව සුරක්ෂිත කිරීමට අවශ්‍ය වූ විට පළමුව ඒවා තීරුකරමින් ඉවතදැමූ කඩදාසි අපි ප්‍රතිචක්‍රීයකරණය කළෙමු. බැංකුව 2022 දී කඩදාසි කි.ග්‍රෑ 5,968ක් ප්‍රතිචක්‍රීයකරණය කර ඇත.

අපද්‍රව්‍ය කළමනාකරණය

අපි සම්පත් භාවිතය උපරිම කළ අතර, ස්වභාවික පරිසරය සහ මානව වාසස්ථාන කෙරෙහි එහි ඇති බලපෑම සුරක්ෂිත කළෙමු. බැංකුව විසින් නිපදවන අපද්‍රව්‍ය වර්ගීකරණය කරන අතර ප්‍රතිචක්‍රියකරණය කළහැකි අපද්‍රව්‍ය සහ බැහැරකළ හැකි අපද්‍රව්‍ය ලෙස ඒවා වෙන් කරමු. අදාළ මහනගර/නගර සභා සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කළ තෙවැනි පාර්ශව ප්‍රතිචක්‍රීයකරණ හවුල්කරුවෙක් මගින් අපගේ පොදු අපද්‍රව්‍ය කළමනාකරණයට සහයවන අතර, අපගේ අපජලය ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ රෙගුලාසිවලට අනුව මුදා හරිනු ලැබේ. ඉ-අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණ සේවා සපයන්නන් තෝරා ගැනීමට විනිවිද ටෙන්ඩර් ක්‍රියාවලියක් භාවිතා කෙරේ. ඉලෙක්ට්‍රොනික උපකරණ අළුත්වැඩියා කිරීම සහ නැවත භාවිතය සම්බන්ධ ව්‍යාහාරය විශේෂයෙන් ආනයන සඳහා විදේශ විනිමය සීමාවන් හේතුවෙන් 2022 දී භාවිතා කරන ලදි.

ජල සංරක්ෂණය

වසර තුළ, 18,157 cu.m. ක ජලය පරිභෝජනය කර ඇත. බැංකු ජාලය තුළ ජලය භාවිතා කිරීම අඩු කිරීම බැංකුවේ ප්‍රමුඛතාවක් වී ඇත. ඒ තුළ අපි ගෝලීය ජලහිඟය පිළිබඳ තියුණු දැන්වත්කමක් ලබාගෙන ඇත. සේදුම් කාමර සහ ගෙවතු වගාව සඳහා අපජලය නැවත භාවිතා කිරීමට ජල පිරිපහදු පහසුකමක් අප ගොඩ නගා ඇත. ද්විත්ව සේදුම් ජල භාජන, ස්වයං සේදුම් වැසිකිලි පද්ධති සහ බැංකුවේ සේදුම් කාමරවල ස්වයංක්‍රීය කරාම ස්ථාපනය මේ සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයක් වන අතර අනාගතයේදී මෙවැනි ක්‍රියාමාර්ග බැංකුවේ සමස්ථ ජාලය පුරා ක්‍රියාවට නැංවීමට අපි බලාපොරොත්තු වෙමු. කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ ජලය භාවිතය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා දැන්වීම් ස්ථාපිත කර ඇත. නඩත්තු සහ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් අබණ්ඩව මෙම ක්‍රියාපටිපාටි නියාමනය කරන අතර ජල කාන්දුවීම් සහ වෙනත් ආශ්‍රිත කරුණු නිරන්තරව මෙහෙයවනු ලබයි.

බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම

බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂමතාව

මහජන බැංකුවේදී, අපගේ තිරසාර වර්ධනාකම් ඉහළ නැංවීම පිණිස අපි අපගේ බලශක්ති කාර්යක්ෂමතා උපරිම කිරීමට අපි සෑම පියවරක්ම ගෙන ඇත. විදුලිය සහ ප්‍රවාහනය අපගේ ප්‍රධාන බලශක්ති භාවිතයන් වන අතර ප්‍රවාහනය පිරිවැය මෝටර් රථ ධාවනය සහ ව්‍යාපාරයට අදාළ සංචාරවලින් පැන නගී. සැපයුම් ගැටළු සහ ඉන්ධන හිඟය සංචාර අඩුකර ඇති අතර, අඩු බලශක්ති පරිභෝජනය සහිත ඉලෙක්ට්‍රික් ක්‍රම සහ මෝටර්රථවල අපි අඛණ්ඩව ආයෝජනය කර ඇත. පුනර්ජනනීය බලශක්ති කෙරෙහි අපගේ අවධානයේ කොටසක් ලෙස, මෙම වියදමෙන් සැලකියයුතු කොටසක් බැංකු ශාඛාවල සූර්ය PV බලශක්ති පද්ධති ස්ථාපනය කෙරෙහි කේන්ද්‍ර වී ඇත. මෙම ව්‍යාපෘතිය 2022 වන විට රට පුරා ශාඛා දක්වා ව්‍යාප්ත කර ඇති බව වාර්තා කිරීමට ලැබීම පිළිබඳව අපි සතුටු වෙමු. (සූර්ය පැනල 2022 දී ස්ථාපිත නොකළ අතර 2023 දී 50ක් ස්ථාපිත කිරීමට යෝජිතය) අපි පහත සඳහන් ක්‍රියාපටිපාටි භාවිතා කරන අතර ඉන් අපගේ බලශක්ති අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරමු.:

- බලශක්ති භාවිතය අවම කිරීම සඳහා සියලුම නව යන්ත්‍ර සූත්‍ර සහ ඉලෙක්ට්‍රොනික උපකරණවල "බලශක්ති කාර්යක්ෂමතා අනුපාතය" සලකා බැලීම.
- බලශක්තිය ඉතිරි කිරීම සඳහා ආලෝකය සඳහා LED බල්බ යෙදවීම.
- බලශක්ති කාර්යක්ෂමතා තරු ශ්‍රේණිගත කිරීමක් සහිත තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම.
- ඉන්වර්ටර් තාක්ෂණය සහිත බලශක්ති කාර්යක්ෂම වායු සම්කරණ ස්ථාපනය කිරීම සහ කාලීන සේවාකරණය සහ අළුත්වැඩියා හරහා නිවාරක නඩත්තු කිරීම.
- පරිසර හිතකාමී ශීතකරණ භාවිතා කිරීම.
- දුරස්ථ නියාමන හැකියාවන් සහිත ශබ්ද රහිත, අඩු විමෝචන සහ ඉන්ධන කාර්යක්ෂම ජනක යන්ත්‍ර ස්ථාපනය කිරීම.

බලශක්ති මූලාශ්‍රය	බලශක්ති වර්ගය	පරිභෝජන මට්ටම	
		2022	2021
පුනර්ජනනීය	විදුලිය	5,616.20 (GJ)	5,689.44 (GJ)
පුනර්ජනනීය නොවන	ඉන්ධන – ඩීසල්	2,900.33 (GJ)	
	ඉන්ධන – පෙට්රල්	680.96 (GJ)	3,933.52 (GJ)
එකතුව		9,197.49 (GJ)	9,622.96 (GJ)
සේවකයෙකුට බලශක්ති තීව්‍රතාව 1 kWh = 3.6 MJ	ඩීසල් (ලීටර්)*	38.6 (MJ ලීටරයට)	
	පෙට්රල් (ලීටර්)	34.2 (MJ ලීටරයට)	7.64 (GJ)

ඉන්ධන සහ විමෝචන කළමනාකරණය

ඵලදායී මාර්ග සැලසුම් කිරීම, හරිත වාහන භාවිතය සහ ද්‍රව්‍ය තොග වශයෙන් ප්‍රවාහනය කිරීම මගින් අපගේ ප්‍රවාහන ධාරාවේ සහ ව්‍යාපාරික සංචාරවල ඉන්ධන පරිභෝජනය සහ විමෝචනය අවම කිරීමට අපි පියවර ගෙන ඇත.

2022 වසර සඳහා B - Advancy Certification Lanka Private Limited විසින් ISO 14064-1:2018 අවශ්‍යතාවය සපුරාලීම සඳහා බැංකුව විසින් සහතිකය ලබාගෙන ඇත.

වාර්තාකරණ කාලසීමාව: 2022 ජනවාරි 1 සිට 2022 දෙසම්බර් 31 දක්වා

ආයතනය: මහජන බැංකුව, ශ්‍රී ලංකාව

ප්‍රකාශ අංකය: SL/PB/011020232

නිකුත් කළ දිනය: 2023 පෙබරවාරි 24

සහතික මට්ටම: සාධාරණ

මුළු විමෝචන: CO_2e ටොන් 4,366

සෘජු විමෝචන: CO_2e ටොන් 373

බලශක්ති වක්‍ර විමෝචන: CO_2e ටොන් 1,124

වෙනත් වක්‍ර විමෝචන: CO_2e ටොන් 2869

වජනක විමෝචන: ශූන්‍ය

වගකිමිසහගත මූල්‍ය කරණය සහ හරිත මූල්‍ය

යහපත් මූල්‍යකරණයක් සඳහා දැනුමැති සේවකයින් අත්‍යවශ්‍ය බව පිළිගනිමින්, මූල්‍ය විසඳුම් ඉදිරිපත් කරන අතරතුර ණය ක්‍රියාවලියේදී පාරිසරික වගකීම, පාරිසරික නිසි පිළිවෙල සහ නිවාරණයේ අඩුපාඩුවලින් ඇති වියහැකි වක්‍ර ඍණාත්මක බලපෑම් පිළිබඳව අපි අපගේ කාර්ය මණ්ඩලය පුහුණු කරන්නෙමු. ඊට අමතරව, බැංකුවේ ව්‍යාපාරික කටයුතුවල පාරිසරික බලපෑම, අපගේ ගනුදෙනුකරුවන්ගේ CEA බලපත්‍ර සහ වෙනත් අදාළ පාරිසරික නීති අනුමත කිරීමට පෙර ඇගයීමට ලක් කෙරේ.

අපගේ පාරිසරික ප්‍රතිපත්තියට සහාය දක්වන ගනුදෙනුකරුවන්ට අපි වගකීමෙන් මුදල් සපයන බවට අපගේ දැඩි පාලනයන් මගින් සහතික වේ. සූර්ය බලශක්ති පද්ධති මිලදී ගැනීම සහ දෙමුහුන් සහ විදුලි වාහන මිලදී ගැනීම වැනි පරිසර හිතකාමී මූලපිරීම් සඳහා විශේෂ ණය වැඩසටහන් ඉදිරිපත් කරමින්, අපි හරිත මූල්‍යකරණයට ද සහාය වෙමු.

දේශගුණ කටයුතු

කාලගුණික විපර්යාස කෙරෙහි ඇති වන බලපෑම අවම කිරීම සඳහා බැංකුව මූලපිරීම් කිහිපයක් ගෙන ඇත. දේශගුණික විපර්යාසයන්ට එරෙහි සටන තුළ, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සපුරාලීමේදී සමාලෝචිත වර්ෂයේදී බැංකුව විසින් සිදුකළ කාර්යයන්ට බැංකු ශාඛා ගොඩනැගිලි හරිතකරණය කිරීම, ශාඛා කාර්යාලවල ජල සංරක්ෂණය, දුෂ්කර ප්‍රදේශවල අඩු වරප්‍රසාද ලත් පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සූර්ය බලශක්තිය සැපයීම සඳහා ප්‍රජා සේවා ව්‍යාපෘති බැංකු මෙහෙයුම්වල කඩදාසි භාවිතය අඩු කිරීම සහ සියලුම ගොඩනැගිලිවල විදුලිය සංරක්ෂණය, ගනුදෙනුකරුවන් සමඟ ඩිජිටල් මැදිහත්වීම් ප්‍රවර්ධනය සහ වායු සමීකරණ භාවිතය නියාමනය සහ සීමා කරමින් දේශගුණ වෙනස අඩු කිරීම සඳහන් කළ හැකිය.

අනුකූලතාව

මහජන බැංකුව සියලුම පාරිසරික නීති සහ රෙගුලාසිවලට 100%ක් අනුකූල වී ඇති අතර, වසර තුළ කිසිදු දඩ මුදලකට හෝ සම්පාදකවලට යටත් වී නොමැත.

අනාගත දැක්ම

බැංකුවේ මෙහෙයුම් පද්ධතිය සහ පරිපාලනය සහ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් සමඟ මැදිහත්වීම් තුළින් පාරිසරිමය වශයෙන් දැනුවත්, තිරසාර ව්‍යවහාර නිවැරදිව සේවයේ යොදවා ඇත. මෙය බැංකුවේ පෞරුෂතාව පිළිබඳ අත්‍යවශ්‍ය මූණතක් සහ අනාගත සංවර්ධනයන් දෙස වඩා ඉහළින් ශක්තිමත් ඉදිරිය දැකීමක් බව අපි අවබෝධ කර ගනිමු. පොදුවේ මූල්‍ය සම්පත් සහ විශේෂයෙන් විදේශීය අරමුදල් අඩුවෙන් සපයන ලදපසුගිය වසරේ සන්දර්භය තුළ, වටිනා ස්වභාවික ප්‍රාග්ධනය භාවිතා කිරීමේ ආර්ථිකමය වාසිය අපි දුටුවෙමු. අපි සාක්ෂාත් කරගෙන ඇති සාර්ථකත්වය මත අපි අඛණ්ඩව ගොඩ නැගෙන අතර මහජන බැංකුව ක්ෂේත්‍රය තුළ වඩාත් තිරසාර බැංකුව ලෙස මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සැබැවින්ම හැකි වන බව අපි සහතික කරමු.

137
පාලන වාර්තා

138 / අවදානම් කළමනාකරණ වාර්තාව

168 / ආයතනික යහපාලනය

194 / අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

- 194 / අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව (BAC)
- 195 / අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව (BHRRC)
- 196 / අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (BIRMC)
- 197 / අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව (BECC)
- 198 / අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව (BNC)
- 199 / අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව (BIBC)
- 200 / අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව (BITC)
- 201 / අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව (BSPRC)

202 / මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

204 / අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

අවදානම් කළමනාකරණ වාර්තාව

ලෝකය තුළ ගතික වෙනස්වීම් අවදානම් භූතලය නැවත හැඩගස්වනු ලබයි. අවදානමේ මූල්‍ය සහ මූල්‍ය නොවන අංග අවදානම් කළමනාකරණ තීරණ ගැනීම අඛණ්ඩව හැඩගස්වන අතර, වසංගතවල අනපේක්ෂිත බලපෑම, රටවල් අතර ඇතිවන ගැටීම්, යුද්ධය තත්ත්වයන් සහ ජත්‍යාන්තර දේශපාලනයන් බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීම සහ කඩිනම්බව පරීක්ෂා කර ඇත. අවදානමේ සියලුම අංග, භෞතික හා තත්‍ය පාසටහන් අතර සුනම්‍යකය, සහ වෙනස්වන ගතිකතාවන්ට හුරුවීම සහ නැවත ඇගයීම බැංකුවලට අනිවාර්ය බවට පත්ව ඇත. තාක්ෂණය පදනම් බුද්ධිය මත විශ්වාසය තැබූ වඩාත් ඩිජිටල් වූ ලෝකයක් තුල, බැංකුවේ කීර්ති නාමයේ රඳා පැවැත්ම සඳහා, සයිබර් ආරක්ෂාව හා ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව අන් කවරදාටත් වඩා වැදගත් වී ඇත. ගතික හා පුරෝකත්‍ය මොඩලයන්වල මනා ගැලපීම හරහා ගනුදෙනුකරුවන් හා ආශ්‍රිත අවදානම් මනාව අවබෝධ කර ගැනීම මගින් තරඟකාරී වාසිය හා වර්ධනය සඳහා අවස්ථාවන් ලබාගැනීමට අවස්ථාව උදාවනු ඇත. තවද, ඉතා දුර්වල වෙමින් පවතින ආර්ථික පරිසරයක් තුළ, බැංකුව විසින් ඔවුන්ගේ ණය කළඹ ගතිකව කළමනාකරණය කර ගැනීම අවශ්‍ය වන අතර, අවදානම් කාර්යයන් බැංකුවේ සමස්ථ මෙහෙයුම් සමඟ සම්පව අභ්‍යන්තරව සම්බන්ධ කිරීම අවශ්‍ය කෙරේ. එමෙන්ම, දත්ත ලබාගැනීම වර්ධනය කිරීම මෙන්ම තත්‍ය කාලීන හුවමාරුව, සාකච්ඡාව සහ ප්‍රතිචාරය ශක්තිමත් කිරීමට අවදානම කාර්යය තුළ තත්ත්වය වර්ධනය කිරීම බැංකුවලට අවශ්‍යය.

වෙළෙඳපොලේ සමහර අංශවලට ඇතුළුවන සම්ප්‍රදායික නොවන සම සහභාගිවන්නන් විසින් ඇතිකරන අභියෝගල උසස් තාක්ෂණයේ භාවිතය සමඟ සම්ප්‍රදායික බැංකු මෙහෙයුම් බිඳවැටීම, අඩු ස්ථාවර පිරිවැය සහිත ඉහළින් ගලපන ලද පරිශීලක අත්දැකීම පිරිනමන කඩිසර බෙදාහැරීමේ ක්‍රමවේද සහ විශ්ලේෂණාත්මක මෙවලම් බැංකුකරණ ව්‍යාපාරයේ සමහර ක්ෂේත්‍ර තුළ ආදායම සහ පිරිවැයට අනාගත බලපෑමක් ඇති කරයි.

ශ්‍රී ලංකාව තුළ විශාලතම ගනුදෙනුකාර පදනම සහිත ඩිජිටල්කරණයෙහි ප්‍රමුඛ බැංකුවක් ලෙස, අපගේ ඩිජිටල් පරිනාමනය සහ ස්වයංක්‍රීයකරණ ගමන්මඟ අපගේ ව්‍යාපාර පවත්වා ගැනීමේදි සහ වසංගතය තුළ බාධාරහිත සේවාවක් ලබාදීමේදී ඉහළින් ඵලදායි බව සනාථ කර ඇත. බැංකුවේ යහපත් ඒකාබද්ධ අවදානම කළමනාකරණ කාර්යරාමුව (IRMF) අවදානම් සම්පූර්ණයෙන් හඳුනාගැනීම, ඇගයීම, මැනීම, අවම කිරීම, නියාමනය සහ වාර්තා කිරීමට සහය වේ. අපගේ මෙහෙයුම් සූදානම්වීම සහ වියහැකි බිඳවැටීම්වල යහපත් පූර්ව අවවාද අවදානම් දර්ශක අභියෝගාත්මක වසරින් අපව ඉදිරියට ගෙන යාම සඳහා අපගේ හැකියාව අපගේ ආයතනයේ ඔරොත්තු දීම පෙන්නුම් කරයි. අපි තත්ත්වය සහ අවංකකම සඳහා උසස් ප්‍රමිති යොදා ගැනීමට කටයුතු කරන අතර, අපගේ සන්නාමය සහ කීර්තිනාමය සඳහා මෙන්ම අපගේ පාර්ශ්වකරුවන් සඳහා අවසාන බලපෑමක් සිදු කිරීමට එය අවශ්‍ය වේ. සියලුම අවදානම් වර්ග බැංකුවේ යහපත් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුවට අනුකූලව කළමනාකරණය කර වාර්තා කරනු ලබයි. අපගේ අවදානම් කළමනාකරණ කාර්යරාමුවේ අංග අවදානම හා ප්‍රතිලාභ අතර සුදුසු තුලනයක් ඇති කරමින් විචක්ෂණ සහ මනින ලද අවදානම භාර ගැනීමට සහය වේ.

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුවේ පරමාර්ථ:

- සුදුසු පරිදි බැංකුවේ අවදානම් නිරාවරණ තක්සේරු සහ කළමනාකරණය
- බැංකුවේ ප්‍රාග්ධනයට සම්බන්ධිත අවදානම් නිරාවරණ නියාමනයට ඵලදායි ක්‍රමයක් සංවර්ධනය කිරීම.
- විශේෂයෙන් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති අනුකූලතාව නියාමනයට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- අදාළ සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි බැංකුව පුරා සන්නිවේදනය කිරීමට ඵලදායි සන්නිවේදන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් යොදා ගැනීම හා ඒ සඳහා සහාය දීම.
- බැංකුව තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ස්ථාපිත කිරීම.
- ක්ෂේත්‍රයේ මංසලකුණුවල මනා පරිචයන් තුළ අවදානම් පාලනය පවත්වා ගැනීම.

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව

බැංකුවේ සියලුම අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ ව්‍යුහගත යාන්ත්‍රණයක් සහතික කිරීම සඳහා ආරක්ෂක මාර්ග ත්‍රිත්ව ආදර්ශය, නිශ්චිත අවදානම් සංගහනය, අවදානම් රුචි රාමුව, අවදානම් කළමනාකරණ කාර්යරාමුව, සහ පීඩන පරීක්ෂණය ඇතුළු ඇගයීම් ආදර්ශ සහ ශිල්ප මත පදනම් වන ශක්තිමත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් බැංකුව සතුය. මෙය අන්තර් සම්බන්ධ සහ සාකල්‍ය ක්‍රමයක් වන අතර, ඉන් බැංකුව තුළ අවදානම් ඵලදායීව කළමනාකරණය කරයි.

ආරක්ෂක මාර්ග ත්‍රිත්වය

පළමු ආරක්ෂක මාර්ගය

ව්‍යාපාර මාර්ග/ආයතනික කාර්ය
අවදානම කළමනාකරණය සඳහා අවදානම හඳුනාගැනීම සහ හිමිකාරත්වය සහ අවදානම් බැංකුවේ පිළිගත් ණය රුචිය සහ අවදානම කළමනාකරණ ප්‍රතිපත්ති තුළ ඇති බව සහතික කිරීම.

- පාරිභෝගික, ආයතනික සහ ව්‍යවසාය බැංකුකරණය
- භාණ්ඩාගාරික
- ශාඛා මෙහෙයුම්
- තොරතුරු තාක්ෂණික

දෙවන ආරක්ෂක මාර්ගය

අවදානම් කළමනාකරණය සහ පාලනයන්
අවදානම කළමනාකරණය සහ අනුකූලතාව සඳහා මගපෙන්වීම ලබාදීම, ඵලදායි අවදානම කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් පවත්වා ගැනීම සහ අවදානම් කළමනාකරණ කාර්යරාමුව ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාධීනව නියාමනය කිරීම.

- අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව
- අනුකූලතා ඒකකය
- මූල්‍ය අංශය
- මානව සම්පත් අංශය

තෙවැනි ආරක්ෂක මාර්ගය

සහතිකය
අවදානම් නිරාවරණය, ක්‍රියාවලි සහ පරිචයන්ගේ පැවැත්ම සම්බන්ධයෙන් වූ ස්වාධීන සහ විෂයමූලික සහතික වීම මෙන්ම ඉහළම මට්ටමේ පාලනය සහ අනුකූලතාවය පිළිබඳව සහතික කිරීම.


- අභ්‍යන්තර විගණනය
- බාහිර විගණනය
- නියාමන අනුකූලතාවය

අවදානම් වර්ගීකරණය


ණය අවදානම, වෙලෙඳපොල අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, උපායමාර්ගික අවදානම, අනුකූලතා අවදානම, කීර්තිනාම අවදානම, නෛතික අවදානම සහ සයිබර් ආරක්ෂක අවදානම ඇතුළු තොරතුරු තාක්ෂණ අවදානම මහජන බැංකුවේ ප්‍රධාන අවදානම් වර්ගීකරණ වෙති.

මහජන බැංකුවේ අවදානම් විශ්වය

මහජන බැංකුවේ අවදානම් විශ්වය සඳහා සියළු ව්‍යාපාර මාර්ග, කාර්යයන්, භූගෝලීය ස්ථාන සහ නෛතික ආයතන ඇතුළත් වේ.



අවදානම් රුචි රාමුව



අවදානම් රුචිය

අවදානම් රුචිය තුළින් බැංකුව එහි උපාය මාර්ගික පරමාර්ථ අත්කර ගැනීම පිණිස පිළිගැනීමට අපේක්ෂිත මුළු අවදානම් මට්ටම ප්‍රකාශ කරයි. එමෙන්ම මෙය අවම ප්‍රමාණාත්මක ප්‍රමිති සහ ගුණාත්මක ප්‍රකාශ මගින් අර්ථකථනය කෙරේ. අවදානම රුචිය මගින් නියාමන සංරෝධක සහ ඒ හරහා පාර්ශවකරුවන් වෙත ඇති බැඳීම් කඩකිරීමට පෙර බැංකුවට පිළිගතහැකි උපරිම අවදානම් මට්ටම පෙන්නුම් කරයි. මෙමගින් අදාල අවදානම් හමුවේ වුවද ප්‍රශස්ථ වර්ධන විකල්ප අගය කිරීම මගින් තිරසාර කාර්යසාධනය ඉදිරියට ගෙනයාමට බැංකුව සඳහා රාමුවක් මින් ලබා දේ. බැංකුවේ සමස්ථ ව්‍යාපාර උපාය මාර්ගය, ව්‍යාපාර පරිසරය සහ පාර්ශ්වකාර අවශ්‍යතා සමඟ ගැලපීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව අවදානම් රුචිය සමාලෝචනය කර අනුමත කරයි.

අවදානම් රුචියට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දිනට සහ 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අවදානම් පැතිකඩ පහත දැක්වේ:


	ණය අවදානම් රුචිය			පහත සඳහන් දිනට තත්ත්වය	
	ඉහළ අවදානම	මධ්‍ය අවදානම	අඩු අවදානම	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
ක්‍රීය/මුළු අත්තිකාරම් (උකස් හැර) %	>6	3-6	<3.0	4.77	3.47
කල් ඉක්මවූ %	>12	6-12	<6	12.87	5.11
වෙන්කිරීම් ආවරණය %	<60	60-70	>70	79.9	74.8
ලාභ සහ අලාභ අයකිරීම් %	>50	35-50	<35	162.10	49.38
සංකේන්ද්‍රණය (HHI ක්‍රමය)	>0.25	0.25-0.15	<0.15	0.20	0.16
අයකරගැනීම් %	<10	10-20	>20	13.44	13.00
TOD අතිරික්තය %	>20	10-20	<10	11.76	18.45
අක්වෙරළ නිරාවරණය (OBU) %	>5	3-5	<3	1.97	1.29

	මෙහෙයුම් අවදානම් රුචිය			පහත සඳහන් දිනට තත්ත්වය	
	ඉහළ අවදානම	මධ්‍ය අවදානම	අඩු අවදානම	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
මෙහෙයුම් අලාභ – අභ්‍යන්තර වංචා	>5	1-5	0	4	4
මෙහෙයුම් අලාභ – බාහිර වංචා (උකස්)	>300	150-300	<150	194	82
මුළු මෙහෙයුම් වියදමට මුළු මෙහෙයුම් අලාභ (%)	>1.0	0.5-1.0	<0.5	0.3	0.54
පද්ධති ලබාගැනීමේ හැකියාව (%)					
ඉතා වැදගත් (%)	<97.5	97.5-99.9	>99.9	99.9	99.91
සාමාන්‍යයෙන් වැදගත් (%)	<95	95-97.5	>97.5	99.2	99.53
අඩුවෙන් වැදගත් (%)	<87	87-90	>90	100	100
සාමාන්‍යයට වඩා අඩුවෙන් ප්‍රමාණනය කළ ශාඛා විගණනයේ ප්‍රතිශත	>10	5-10	<5	5.6	9.61


අවදානම් පාලනය

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව පාලන ප්‍රවේශයක් මත ප්‍රතිෂ්ඨාපිත කරන අතර, එයට අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එහි කමිටු විසින් අනුමත කරන ශක්තිමත් කමිටු ව්‍යුහයක් සහ පුළුල් ආයතනික ප්‍රතිපත්ති සහ සීමාවන් ඇතුළත්ය. එමෙන්ම එයට විශේෂ ආයතනික ප්‍රමිති සහ මෙහෙයුම් ක්‍රියාපටිපාටි ද ඇතුළත්ය. අවදානම් අධීක්ෂණය සහ ඒවායේ පුමුඛතාවයන් සඳහා ඉහළම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරන අතර ඒ යටතේ අවදානම් රුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ අවදානම් නිරාවරණවල ඵලදායි කළමනාකරණය සහතික කිරීම ඇතුළත්ය. අවදානම් කළමනාකරණයට අදාළව එහි කාර්යයන් ඉටුකිරීමේදී අනු කමිටු සහ විධායක කමිටු කිහිපයක් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට මනා සහයෝගයක් ලබා දේ. මේ තුළින් අවදානම් ඇතිවීම සහ අවදානම් නිරාවරණ අනුමත කිරීම අතර පැහැදිලි බෙදා වෙන් කිරීමක් කරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අවදානම් කමිටු ඔවුන්ට අදාළ ප්‍රඥාප්තිවල නියමයන් යටතේ ක්‍රියාත්මක වේ.

මහජන බැංකුවේ අවදානම් පාලන රාමුව පහත විස්තර කෙරේ:



බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ කාර්යය ව්‍යුහය



අවදානම් සංස්කෘතිය

අවදානම් කළමනාකරණය ආයතනය තුළ සැම සේවකයෙකුගේම වගකීම බව අප විශ්වාස කරන බැවින් බැංකුව තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් අපි ප්‍රවර්ධනය කරන අතර ඉහළ ඵලදායී අවදානම් තීරණ ගැනීමෙහිලා වැදගත්වන වටිනාකම්, විශ්වාස, ආකල්ප සහ පරිචයන්ගෙන් සමන්විත ධනාත්මක අවදානම් සංස්කෘතියක් බැංකුව තුළ ආයතනගත කරමු. සෑම සේවකයෙකුම අවදානම් කළමනාකරණය සහ අදාල අංශ වෙත වේවා දැනුම් දීම සඳහා වගකීමට බැඳී සිටින අතර, ශක්තිමත් අවදානම් සංස්කෘතියකට සහයවන වගකිම්සහගත හැසිරීම පෙන්නුම් කළ යුතුය. අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම සඳහා මෙන්ම, අවදානම පිළිබඳ දැනුම් මට්ටම වැඩි කිරීම සඳහා අප සේවකයින් නිරන්තරයෙන් පුහුණු කරනු ලබන අතර එමගින් තමන්ගේ කාර්යභාරයට අදාළ අවදානම් කළමනාකරණය කිරීමට අවශ්‍ය කුසලතාවය සහ පළපුරුද්ද ලබා දේ.

බැංකුව තුළ අවදානම් සංස්කෘතිය තහවුරු කරන මූලධර්මවලට පහත දෑ ඇතුළත් වේ.

- බැංකුව විසින් ගනු ලබන අවදානම් සඳහා නිශ්චිත අවදානම් රුචි
- සෑම අවදානමක්ම අවදානම් කළමනාකරණ රාමුව තුළ අනුමත කළ යුතු අතර ප්‍රමාණවත්ව හානිපූර්ණය කල යුතුය.
- අවදානම් පිළිබඳ අඛණ්ඩ නියාමනය සහ කළමනාකරණය

ආතති පරීක්ෂණය

ආතති පරීක්ෂණය යනු අපගේ අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංගයකි. එය අපගේ ව්‍යවසාය සහ සමූහ අවදානම් රුචි ප්‍රකාශයන්ට ඒකාබද්ධ කෙරෙන අතර, අපගේ කළමනාකරණ ක්‍රියාවලීන්ට ඇතුළත් කෙරේ. අපගේ අවදානම් තක්සේරු කිරීමට, අපි අපගේ ව්‍යාපාර හා කළඹ තුළ පවත්නා වූ සංකීර්ණතාවයෙන්, සංඛ්‍යාතයෙන් හා බරපතල බවින් එකිනෙක වෙනස්වුන සිදුවීම් පෙළක් පරීක්ෂාවට ලක් කරයි.

පීඩන පරීක්ෂණයේ වැදගත්කම සහ සංකීර්ණතාව තුළ නිතරව වෙනස්වන විවිධ මූල්‍ය අවස්ථාවන්ට වත්කම් සහ වගකීම් කළඹ ප්‍රතිචාර දක්වන ආකාරය තීරණය කිරීමට යොදා ගනු ලබන අණුකරණ තාක්ෂණයකි. අනපේක්ෂිත අලාභ සහ ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව පිළිබඳ ප්‍රමාණවත් ස්වාරක්ෂක සමූහයට ඇති බව සහතික කිරීමට පීඩන පරීක්ෂණ වරන්වර සිදුකරනු ලැබේ.

ආතති පරීක්ෂණය බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලියේ (ICAAP) අත්‍යවශ්‍ය අංගයකි. ඉපයීම්, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව කෙරෙහි සිදුවියහැකි බලපෑම ඇතුළුව සමූහයේ අවදානම් පැතිකඩ සහ මූල්‍ය තත්ත්වය මත සාර්ව ආර්ථික සහ වෙළෙඳපොල විචල්‍යතාවල බලපෑම අපි තක්සේරු කරමු. සියලූම වැදගත් අවදානම් වර්ග ආතති පරීක්ෂණ අභ්‍යාසය තුළට ඇතුළත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) බැංකුවේ පීඩන පරීක්ෂණ ප්‍රතිඵල සහ එය තහවුරු කරන ප්‍රධාන උපකල්පන පිළිබඳව කලින් කල සමාලෝචන පවත්වනු ලබයි. ICAAP ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් රුචි නියම කිරීම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය සහ නිශ්චිත ප්‍රමිති තුළ අවදානම කළමනාකරණය කිරීම සඳහා ප්‍රාග්ධනය සැලසුම්කරණයට ආතති පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵල අත්‍යවශ්‍ය යෙදුමකි.

බැංකුවේ ආතති පරීක්ෂණ ක්‍රියාවලි පහතින් දැක්වේ.

ආතති පරීක්ෂණය

ණය අවදානම	වෙළෙඳපොල අවදානම	ද්‍රවශීලතා අවදානම	මෙහෙයුම් අවදානම
• වත්කම්වල ගුණාත්මකභාවය පිරහිම. • අදියර වත්කම් විතැන්වීම. • අපේක්ෂිත ආර්ථික අලාභවල බලපෑම. • ඉහළ ණය ගැණුම්කරුවන්ගේ 10ක වත්කම්වල තත්ත්වය වැඩිවීම. • ඉහළ කර්මාන්ත 3ක වත්කම්වල තත්ත්වය වැඩිවීම. • සාමාන්‍ය කළ HHI හි වැඩිවීම	• වෙළෙඳපොල පොළී අනුපාතය තුළ වෙනස්වීම්. • වෙළෙඳපොල විදේශ විනිමය අනුපාතය වල වෙනස්වීම්. • වෙළෙඳපොල කොටස් මිල ගණන්වල වෙනස්වීම්. • වෙළෙඳපොල රත්‍රන් මිල මත පදනම් උකස්කර පිළිබඳ සංවේදීතා විශ්ලේෂණ	• උණුසුම් මුදල්වල/පාරිභෝගික අරමුදල් ආපසු ගැනීම්වල බලපෑම්. • වත්කම් සහ වගකීම් පරිමාවන් හී වෙනස්වීම්වල බලපෑම්. • රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොල වටිනාකමේ බලපෑම. • HQLA හා ශුද්ධ මුදල් පිටත ප්‍රවාහයන්ට පරිමාවන්හි වෙනස්කම් වල බලපෑම.	• පසුගිය වසර 3 (පසුගිය මාස 36) මත පදනම් වූ වාර්තාකළ සාමාන්‍ය අලාභ ප්‍රමාණය • පූර්වාසන්න වසර (පසුගිය මාස 12) මත පදනම් වූ වාර්තාකළ සාමාන්‍ය අලාභ ප්‍රමණය

සුළු, මධ්‍ය සහ විශාල වශයෙන් ආතතියට ලක්වූ සිදුවීම

ප්‍රධාන ප්‍රාග්ධනය, මුළු ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත බලපෑම ව්‍යස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතය මත බලපෑම.

මහජන බැංකුවේ අවදානම් කළමනාකරණය තුළ නව සංවර්ධනයන්

2022 දී බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් වර්ධනයන් සිදුකරන ලදී.

- බැංකුවේ අතිශය වැදගත් කාර්යයන් සහ හුවමාරු සේවාවන් හඳුනා ගැනීම සහ වෙළෙඳපොල අතර හෝ බැංකුවේ විශේෂිත ආතති තත්ත්වයක් තුළ අඛණ්ඩ ව්‍යාපාරික මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා 2021 අංක 09 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගය විසින් ස්ථාපිත ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

අනතුරු ඇඟවීමකින් තොරව මතුවිය හැකි, නැගී එන අවදානම් සමඟ කටයුතු කිරීමට බැංකුවේ සූදානම ශක්තිමත් කරන ලදී. එවැනි මතුවන අවදානම්වලට මුහුණ දීම සඳහා පහත සඳහන් පියවර ගන්නා ලදී.

- පහත පරිදි ණය ඇඟයීම සම්බන්ධයෙන් වැඩ ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ඩිජිටල්කරණය විධිමත් කිරීම.
  - පාරිභෝගික ණය උත්පාදන ක්‍රමය
  - ආයතනික ණය උත්පාදන ක්‍රමය
- නවතම ණය අවදානම් පරිසරයට අනුකූලව ණය ක්‍රියාපටිපාටි අත්පොතේ සමාලෝචනය අවසන් කිරීම සහ ණය මාර්ග කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.
- රජය සතු ව්‍යවසායන්හී (SOE) නිරාවරණය මත ස්ථාපිත ණය සීමා සමීප නියාමනය සහ නිරන්තර සමාලෝචනය.
- වැඩි ප්‍රදේශ ආවරණය කරමින් පීඩන පරීක්ෂණය ශක්තිමත් කිරීම.
- ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී (CISO) විසින් මෙහෙයවන තොරතුරු ආරක්ෂක ඒකකය ශක්තිමත් කිරීම.

- ISO 27001:2013 සහතිකය (තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමය) පවත්වා ගැනීම.
- බැංකුවේ අවදානම් රුචි ප්‍රකාශය පිළිබඳ වරින් වර සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම සහ එය පුළුල් ලෙස භාවිතා කිරීම.
- ඩිජිටල්කරණ වැඩ ක්‍රියාවලිය සහ ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම තවදුරටත් ශක්තිමත් කිරීම.

2023 සඳහා අවධානය

බැංකුකරණය සඳහා ඩිජිටල් මාර්ග භාවිතය වැඩි වීම හේතුවෙන් ඉහළ ගිය තොරතුරු තාක්ෂණ අවදානම අවම කිරීම සඳහා, විභව තර්ජන වලින් ආරක්ෂා වීමට සහ බැංකුවේ පාලනයෙන් බැහැර වූ සාධක නිසා ඇතිවන සිදුවීම්වලට බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ කටයුතු ඇතුළුව ව්‍යාපාරයට වන බලපෑම අවම කිරීමට අපි අපගේ සයිබර් ආරක්ෂණ හැකියාවන් පුළුල් කරන්නෙමු.

තවද, බැංකුව 2023 සිට ISO 27001: 2022 සහතිකය (තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමය) පවත්වා ගන්නෙමු.

ක්‍රියාවලි සමීපව අධීක්ෂණය කිරීම ඇතුළත් අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුවේ ණය පශ්චාත් සමාලෝචන ඒකකය නැවත ස්ථානගත කිරීම මගින් ණය පශ්චාත් සමාලෝචන කාර්යය ශක්තිමත් කරනු ඇත.

බැංකුවේ ණය සාන්ද්‍රණය, භූගෝලීය සීමාවන්, ණය ගැනුම්කරුගේ අවදානම් ශ්‍රේණිගත කිරීම් පදනම් වූ සීමාවන්, රජය සතු ව්‍යවසායන් පිළිබඳ සීමාවන් පිළිබඳ සමීප සමාලෝචනය දිගටම කරගෙන යනු ඇත.

ස්ථාවර පොලී ආයතනික ණය පහසුකම් ප්‍රදානය කිරීම අධෛර්යමත් කරන අතරම ණය දීම මත අවම පොළී අනුපාත සහිත පාවෙන පොලී අනුපාත පැනවීම මගින් ණය කළඹේ වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කරනු ලැබේ.

පිඩනයට පත්/දුර්වල ව්‍යාපාරවල විධිමත් කළමනාකරණය සඳහා ණය ඒකකවල ස්වාධිනත්වය නිර්මාණය කරමින් ව්‍යාපෘති මූල්‍ය සහ පුනරුත්ථාපන ඒකකය ශක්තිමත් කිරීමට අපි අපේක්ෂා කරමු.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය සඳහා පනවන ලද සීමාවන් පිලිපැදීම තවදුරටත් නියාමනය කරනු ලැබේ. විදේශ විනිමය අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා, දැනටමත් මුදල් වර්ග සහ කාලය අනුව පනවා ඇති සීමාවන් සමීපව නියාමනය කරනු ලැබේ.

බාධා රහිත ගනුදෙනුකාර සේවාව සහතික කිරීමට සහ ගනුදෙනුකාර විශ්වාසය වැඩි කිරීමට ඉහළ ක්‍රම ලබාගැනීමේ හැකියාව අපි අඛණ්ඩව සහතික කරමු. සමාජ මාධ්‍ය මත බැංකුව පිළිබඳව අහිතකර අදහස්වලට කඩිනම් අවධානය ධනාත්මකව සැලකිල්ලට ගනු ලබන අතර, බැංකුවේ කීර්තිනාමය තවදුරටත් සුරක්ෂිත කිරීමට භාවිතා කරනු ලැබේ.

ඉදිරියට යන පදනමක් මත, උපාය මාර්ගික පරමාර්ථ අත්කර ගැනීම හෝ එහි ප්‍රගතියට බාධාකරන බාහිර හෝ අභ්‍යන්තර අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ තක්සේරු කිරීම අපි තවදුරටත් සිදුකරමු. තවද, උපාය මාර්ගික සැලැස්ම සඳහා සංශෝධනයන් සාකච්ඡාව සහ පරීක්ෂාකාරී ඇගයීමකින් පසු කළමනාකරණය විසින් ගනු ලැබේ.

ප්‍රධාන අවදානම	අප එය පාලනය කල ආකාරය	ප්‍රධාන පාලනයන් (පාලන ඒකක)	2022 සිට අවදානම් මට්ටම තුළ වෙනස (වැඩිවීම/අඩුවීම/ස්ථාවර)	2023 සඳහා අවධානය
ණය අවදානම	(a) ණය අවදානම් පූර්ව සමාලෝචනය ඇතුළුව නිවැරදි ණය ඇගයීම්. (b) සුවිශේෂී ණය බලධාරීන් සමඟ පූර්ව නිශ්චිත ශක්තිමත් ණය මාර්ගය (c) ව්‍යාපෘති මූල්‍ය පුනරුත්ථාපන ඒකකය (d) ප්‍රති ව්‍යුහගතකරණය සහ ප්‍රතිඋපලේඛණය (e) BRR සහ කාලීන සමාලෝචන සහ BRR මත ස්ථාපිත කළඹ සීමා නියාමනය (f) රජයට අයත් ව්‍යවසාය සීමා ඇතුළුව විස්තීරණ සීමාවන් සැකසීම ක්‍රියාත්මක කිරීම. (g) සුරැකුම්පත්/ඇපකර මුදාහැරීම (h) යාවත් කරන ලද අනුමත ණය පටිපාටි අත්පොතක (CPM) පැවැත්ම. (i) අඛණ්ඩ පසු විපරම් (පසු සමාලෝචනය ඇතුළුව) (j) බැංකුවේ ණය අවදානම් රුචි ප්‍රකාශය අර්ථ දැක්වීම. (k) අඛණ්ඩ කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය	(a) BOD (b) BIRMC (c) BECC (d) BIBC (e) ECC (f) ALCO (g) CRMC (h) අවදානම් කළමනාකරණය සහ ණය පාලන දෙපාර්තමේන්තුව (i) ණය සමාලෝචන ඒකකය (පශ්චාත් ප්‍රදානිත)	වැඩිවිය	ණය ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, ලේඛනවල ගුණාත්මකභාවය සහ ණය කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුවක් ලබා දීම මගින් ගුණාත්මක ණය කළඹක් සහතික කිරීම. ශාඛා මට්ටමින් ණය ගුණාත්මකභාවය තක්සේරු කිරීම ප්‍රාදේශීය අවදානම් නිලධාරීන් (RROs) වෙත පවරාදීම ඉදිරියට ගෙනයාම සහ අඩුපාඩු ඇත්නම් ඒවා නිවැරදි කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම. ණය අවදානම බැංකුවේ පූර්ව නිශ්චිත අවදානම් රුචිය තුළ පවතින බව සහතික කිරීමට විස්තීර්ණ සීමා සැකැස්මක් පවත්වා ගැනීම. රටේ පරිනාමන අවශ්‍යතා ක්ෂේත්‍රවල ණය කෙරෙහි අවධානය නැවත උපලේඛණ කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම සහ පුනරුත්ථාපනය මගින් ආපදා/දුර්වල ණය සඳහා ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගැනීම.

ප්‍රධාන අවදානම	අප එය පාලනය කල ආකාරය	ප්‍රධාන පාලනයන් (පාලන ඒකක)	2022 සිට අවදානම් මට්ටම තුළ වෙනස (වැඩිවීම/අඩුවීම/ස්ථාවර)	2023 සඳහා අවධානය
ණය සංකේන්ද්‍රණ අවදානම	සංකේන්ද්‍රණ අවදානමට අදාළ සීමාවන් කළමනාකරණය කිරීම. – කළඹ අනුව – අංශය/කර්මාන්ත අනුව – SBL/MAL – HHI මැනීම	(a) BOD (b) BIRMC (c) BECC	ස්ථාවර	කර්මාන්තයේ අවදානම් දැක්ම තුළ සහ අවදානම් රුචිය දරාගැනීමේ සීමාව තුළ අංශය/ඇප HHI කළමනාකරණය කිරීම.
වෙළෙඳපොල අවදානම	(a) පාවෙන අනුපාතය (b) NOP සීමා (c) කළඹ සීමා – වෙළෙඳ/AFS/HTM (d) ආතති පරීක්ෂණය (e) වෙළෙඳපල අවදානම් ඇතිවීමට බලපාන හේතූන් සහ සිදුවීම් ඇතිවීම නියාමනය කිරීම. (f) අලාභ වළක්වාගැනීමේ සීමා.	(a) BOD (b) BIRMC (c) ALCO (d) BIBC (e) භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය (TMO)	වැඩිවිය	නියමිත සීමාවන් සහ පරාමිතීන් තුළ වෙළෙඳපොළ අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීම. වෙළෙඳපොල තත්ත්වයට අනුකූලව, වත්කම් සහ වගකීම්වල මිල ගණන් සමීපව නිරීක්ෂණය කිරීම.
පොළී අනුපාත අවදානම	පොළී අනුපාත අවදානම සඳහා සීමා සැකසීම. (a) පාවෙන පොළී අනුපාත (b) කල්පිරීමේ නොගැලපිම් අඩු කිරීම. (c) පොළී අනුපාතය මත D-Gap විශ්ලේෂණය සහ පීඩන පරීක්ෂාව යෙදවීම.	(a) BOD (b) BIRMC (c) ALCO (d) TMO (e) BIBC	වැඩිවිය	පොළී සංවේදී ප්‍රවණතාවයන් යටතේ ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා පොළී අනුපාතික අවදානම විචක්ෂණශීලී මට්ටම්වල පවත්වාගෙන යාම.
කොටස් අවදානම	(a) කළඹ සීමා සැකසීම – ලැයිස්තු ගතකළ/නොකළ S&P SL 20/ ASPI – වෙළෙඳ/AFS (b) ස්කන්ද කොටස් මත ආතති පරීක්ෂණය (c) අලාභ වළක්වාගැනීමේ සීමා.	(a) BIRMC (b) BIBC (c) ALCO (d) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව	වැඩිවිය	ආයෝජන කළමනාකරණය සඳහා සාර්ව ආර්ථික සාධක, කොටස් වෙළෙඳපොල වෙනස්වීම් සහ සමාගම්වල කාර්යසාධනයන් සඳහා වැඩි අවධානය යොමු කිරීම.
විදේශ විනිමය පිළිබඳ අවදානම	(a) සීමා සැකසීම. – NOP සීමා – අන්තර් දින සහ වෙනත් සීමා – ප්‍රතාපාර්ශව සීමා – වෙළෙඳ සීමා (b) FX ව්‍යුත්පන්න (c) FX කල්පිරීම් පරතර විශ්ලේෂණය (d) VaR ගණනය කිරීම.	(a) BOD (b) BIRMC (c) ALCO (d) TMO	වැඩිවිය	නියමිත සීමාවන් තුළ FX තත්ත්වය කළමනාකරණය කිරීම සහ බැංකුවේ FX ද්‍රවශීලතා තත්ත්වය සාධනීය ලෙස හැසිරවීම.
ද්‍රවශීලතා අවදානම	(a) ප්‍රමාණවත් ස්වාරක්ෂණයන් යටතේ LCR, SLAR පවත්වා ගැනීම. (b) SOE නිරාවරණ කළමනාකරණය (c) බාහිර අරමුදල් සඳහා විධිවිධාන යෙදීම. (d) ADR කළමනාකරණය (e) කල්පිරීම් පරතර කළමනාකරණය (f) අවිනිශ්චිත අවස්ථාවන් සඳහා අරමුදල් සැලැස්ම.	(a) BOD (b) BIRMC (c) BIBC (d) ALCO	වැඩිවිය	ප්‍රමාණවත් ස්වාරක්ෂයක් සමඟ නියාමන සීමාවන් පවත්වාගෙන යාම. ණය පහසුකම් ලබාදීමේදී ද්‍රවශීලතා තත්ත්වය සලකා බැලීම. දේශීය සහ ජාත්‍යන්තර ද්විපාර්ශවික සම්බන්ධතා ශක්තිමත් කිරීම.

ප්‍රධාන අවදානම	අප එය පාලනය කල ආකාරය	ප්‍රධාන පාලනයන් (පාලන ඒකක)	2022 සිට අවදානම් මට්ටම තුළ වෙනස (වැඩිවීම/අඩුවීම/ස්ථාවර)	2023 සඳහා අවධානය
මෙහෙයුම් අවදානම	(a) ප්‍රාදේශීය අවදානම් නිලධාරීන් (RRO) (b) ප්‍රාදේශීය විගණන කණ්ඩායම් (c) අවදානම් සහ ස්වයං තක්සේරු පාලනය (RCSA) (d) අබණ්ඩ පුහුණුව සහ සංවර්ධනයන් (f) ඩිජිටල් වැඩප්‍රවාහ භාවිතය (g) මෙහෙයම් අවදානම් සීමා නියාමනය (h) තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය (i) මෙහෙයුම් අලාභ දත්ත ගබඩාව පවත්වා ගැනීම සහ සමාලෝචනය (j) මෙහෙයුම් අලාභ සඳහා ප්‍රමාණවත් රක්ෂණ ආවරණය (k) ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය (j) වංචා අවදානම් ප්‍රතිපත්තිය	(a) BOD (b) BIRMC (c) BAC (d) ORMC (e) අභ්‍යන්තර විගණනය (f) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව	වැඩිවිය	ප්‍රමාණවත් තරම් පාලන සහ ක්‍රියාවලි ක්‍රියාත්මක වන බවත් අදාළ ව්‍යාපාරික කටයුතු ස්වාධීන අධිකාරී මට්ටම් මගින් අධීක්ෂණය සහ ඇගයීම් කරන බවත් සහතික කිරීම. RROs රැකියා කාර්යය ශක්තිමත් කිරීම. මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි පිළිබඳ අබණ්ඩ සමාලෝචනය
පුද්ගල අවදානම	(a) චර්යා සංග්‍රහය (b) විනය ක්‍රියාපටිපාටිය (c) දක්ෂයින් අනුරූපනය හරහා සමාන අවස්ථා (d) සමාජීය ආරක්ෂාව (e) අබණ්ඩ පුහුණුව සහ සංවර්ධනය (f) SHRM ක්‍රම භාවිතය (g) අනුප්‍රාප්තික සැලැස්ම (h) කාර්යසාධනය පදනම් ඇගයීම්	(a) BOD (b) BHRMC (c) HR දෙපාර්තමේන්තුව	වැඩිවිය	මානව සම්පත් මෙහෙයුම් විශිෂ්ඨත්වය පවත්වා ගැනීම සහ දක්ෂයින් රඳවා ගැනීම. අනුප්‍රාප්තික සැලැස්ම සහ උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණ ක්‍රම යොදා ගැනීම. නව මානව සම්පත් කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
තොරතුරු තාක්ෂණ/ තොරතුරු ආරක්ෂක අවදානම	(a) උසස් ආරක්ෂක පද්ධති (a) IS පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. (b) DR සැලැස්ම/DR මධ්‍යස්ථානය (c) ප්‍රවේශ පාලනයන් (d) බලපත්‍රලාභී මෘදුකාංග (e) IT ආරක්ෂණවිධි/ප්‍රමිති පවත්වා ගැනීම. (f) IS විගණනය (g) CISO විසින් මෙහෙයවන තොරතුරු ආරක්ෂක ඒකකය ක්‍රියාත්මක කිරීම.	(a) BOD (b) BIRMC (c) BITC (d) IT මෙහෙයුම් කමිටුව (e) IT දෙපාර්තමේන්තුව (f) ISSC (g) ISOC (h) IS දෙපාර්තමේන්තුව (i) ISC	වැඩිවිය	ඩිජිටල්කරණ ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීමෙන් අත්හුරු ක්‍රමය භාවිතයෙන් ඉවතු කරන කාර්ය සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවදානම අවම කිරීම. තොරතුරු තාක්ෂණ/IS අවදානම (ඇත්නම්) කල්තියා හඳුනාගෙන ඒවා වහාම විසඳීම. දත්ත ආරක්ෂණය සහ පද්ධති තිරසාරභාවය සුරක්ෂිත කිරීම සහතික කිරීම. IS ඒකකය, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් IS කාර්යමණ්ඩලය වෙන් කිරීම.
අනුකූලතා අවදානම	(a) අවංකකම සහ සදාචාර සඳහා ප්‍රමිති (b) සේවකයින් අබණ්ඩව දැනුවත් කිරීම. (c) AML/KYC/CFT ප්‍රතිපත්ති (d) STR/CTR සමාලෝචනය (e) ප්‍රාදේශීය අනුකූලතා නිලධාරී	(a) BOD (b) BIRMC (c) BAC (d) ORMC (e) අභ්‍යන්තර විගණනය (f) නීති දෙපාර්තමේන්තුව (g) අනුකූලතා දෙපාර්තමේන්තුව (h) සමාගම් ලේකම්	ස්ථාවර	බැංකුවේ අනුකූලතා පද්ධති ශක්තිමත් කිරීම මගින් අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.

ප්‍රධාන අවදානම	අප එය පාලනය කල ආකාරය	ප්‍රධාන පාලනයන් (පාලන ඒකක)	2022 සිට අවදානම් මට්ටම තුළ වෙනස (වැඩිවීම/අඩුවීම/ස්ථාවර)	2023 සඳහා අවධානය
උපාය මාර්ගික අවදානම	(a) උපායමාර්ගික සැලැස්ම නිසිකලට ක්‍රියාත්මක කිරීම. (b) නව්‍යකරණ වෙළෙඳපොල පැවැත්ම. (c) වටිනාකම් හා දැක්ම ප්‍රකාශ තුළ බැංකුව මෙහෙයවීම. (d) උපාය මාර්ගික ක්‍රියා නිරන්තර සමාලෝචනය (f) මූලික කාර්යසාධන දර්ශක අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.	(a) BOD (b) BSPRC (c) උපායමාර්ගික සැලසුම් දෙපාර්තමේන්තුව	ස්ථාවර	මූල්‍ය ආයතනවලට අදාළ පරිසර, ව්‍යාපාර ආදර්ශ සහ ගනුදෙනුකාර හැසිරීම තුළ වෙනස්වීම් පිළිබඳ අවධානය නව උපායමාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම. බැංකුවේ නව දැක්ම ප්‍රකාශය සමඟ යාම සඳහා විචක්ෂණ උපායමාර්ග
කීර්තිනාම අවදානම	(a) බහුවිධ අංශ සඳහා අඛණ්ඩ දේශීය සහ ජාත්‍යන්තර සම්මාන (b) වසර හැටක පැවැත්ම (c) රාජ්‍ය හිමිකාරත්වය (d) මූලික කාර්යසාධන දර්ශකවල වර්ධනය (e) විශාලතම ශාඛා ජාලය පවත්වා ගැනීම (f) සැම පිවිසුම් ස්ථානයකදීම ව්‍යාපාර සදාචාර සහ වටිනාකම් පවත්වා ගැනීම. (g) සන්නාම පරාසය (h) නියාමන සහ නීති අවශ්‍යතාවන්ට අනුකූලතාව (i) CSR කටයුතු (j) කාර්යක්ෂම පැමිණිලි කළමනාකරණය (k) අවදානම් උපකරණ පුවරුවට ප්‍රධාන කීර්තිනාම අවදානම් මානයන් ඇතුළත් කිරීම.	(a) BOD (b) BIRMC (c) අලෙවිකරණ දෙපාර්තමේන්තුව	ස්ථාවර	ඩිජිටල් වැඩිදියුණු කිරීම් හරහා පාරිභෝගික තෘප්තිය, ව්‍යාපාර ගතිකත්වයට අනුකූලව සන්නාම වටිනාකම වැඩි දියුණු කිරීම. පිළිගතහැකි මට්ටම්වල කීර්තිනාම අවදානම් පරිමිති නියාමනය. ගනුදෙනුකරුවන් ඩිජිටල් ලෙස ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීම.

ණය අවදානම

ණය අවදානම යනු සමූහයේ ප්‍රධාන අවදානම් නිරාවරණයක් වන අතර, ණය හා අත්තාකරම් කළඹ, මූල්‍ය ඇප, ණයවර ලිපි, ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිකුත්කළ හා සිදුකල ප්‍රතිග්‍රහනයන් තුළින් මෙය ඇති වේ. ගනුදෙනුකරුවෙකුට හෝ ඔවුගේ ඇපකරුට බැංකුවේ ගිවිසුම් බැඳීම් සපුරාලීමට අසමත්වීම තුළින් ඇතිවිය හැකි අලාභය තුළින් මෙය ඇති වේ. ණය අවදානම පැහැර හැරීමේ අවදානම සහ ඇපකරුවන්, සංක්‍රමණ අවදානම, ව්‍යාපාර අංශ හෝ භූගෝලීය කලාපවල සංකේන්ද්‍රණ අවදානම වැනි ආකාරයක් ගනී. ඊට අමතරව, වර්තමාන සාර්ව ආර්ථික සාධක ණය අවදානම වැඩිවීම කෙරෙහි බරපතල ආකාරයෙන් බලපා ඇත.


ණය අවදානම කළමනාකරණය කිරීමේ පරමාර්ථ

- ණය කළඹ තුළ විචක්ෂණ කළමනාකරණය තුළින් මනාව විවිධාංගීකරණය කළ කළඹක් පවත්වා ගැනීම.
- ප්‍රතිඵල උපරිම කිරීම තුළින් ප්‍රශස්ථ අවදානම් ප්‍රදාන ගෙවීම් නිදහස්වීමක් අත්කර ගැනීම.
- ඉහළ ගුණාත්මකභාවයේ කළඹක් පවත්වා ගැනීම සහ අදියර 3 වර්ගීකරණ ණය අවම කිරීම.
- වෙනස්වන සාර්ව ආර්ථික සහ ක්ෂේත්‍රයේ සාධක සමඟ වියහැකි ණය අවදානම මුලිකව හඳුනාගැනීම.

ණය අවදානම කළමනාකරණය

ණය අවදානම බැංකුවේ අවදානම බරතබන ලද වත්කම්වලින් 87%කට වැඩිකොටසක් සඳහා දායක වේ. එම නිසා, ණය අවදානම් කළමනාකරණය යනු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ණය අවදානම් කළමනාකරණ රාමුව යටතේ පවත්වනු ලබන හුදෙක් නියාමන අවශ්‍යතාවයට වඩා ඉදිරියට ගමන් කරන අඛණ්ඩ ක්‍රියාවලියකි. මෙම රාමුවට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, බලතල බෙදීම, අවදානම් ශ්‍රේණිගතකරණ, ඇප කළමනාකරණය, සහ ණය සමාලෝචනය/නියාමනය ඇතුළු අවදානම් පාලන ව්‍යුහයක් ඇතුළත් වේ.

ණය අවදානමේ පාලන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) බැංකුවේ ණය අවදානම් කළමනාකරණය සඳහා පාලනය ලබා දේ. මෙම කමිටුවේ වගකීමට පහත දෑ ඇතුළත් වේ:

- BIRMC සහ ව්‍යාපාර ඒකක සමඟ උපදේශකත්වයෙන් ණය ප්‍රතිපත්ති සකස් කිරීම සහ යාවත් කිරීම.
- වඩා විශාල සහ ඉහළ ණය නිරාවරණ හැසිරවීම සඳහා ණය අනුමත කිරීමේ ව්‍යුහ ස්ථාපිත කිරීම.
- අවිධිමත් ණය සංකේන්ද්‍රණ තුරන් කිරීමට තනි පුද්ගල ණය නිරාවරණ සහ සමස්ථ කළඹ පිළිබඳ කලින්කල සමාලෝචන පැවැත්වීම.
- වඩා ඉහළ ණය නිරාවරණ පිළිබඳ ඵලදායී කළමනාකරණය සහ වෙන්කිරීම්වල ප්‍රමාණාත්මක සහතික කිරීම.
- ණය ශ්‍රේණිගතකරණ ක්‍රම සංවර්ධනය කර පවත්වා ගැනීම.
- පෙර නිශ්චිත සීමාවන්ට ඉහළ ණය යෝජනා අනුමත කිරීම හෝ පහත දැමීම.

ණය අවදානම් කළමනාකරණය

1. ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති සහ පාලන රාමුව

වෙනස්වන මනා ව්‍යවහාර සහ මතුවන අවදානම් සහ අවස්ථා මත පදනම් වී BECC විසින් කලින් කළ ණය අවදානම වැඩරාමුව සමාලෝචන කර යාවත් කිරීම සිදුකරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ණය ප්‍රතිපත්තිය මගින් බැංකුවේ ණය සංස්කෘතිය, නිශ්චිත අවදානම් රුචියට අනුව විචක්ෂණ සීමාවන් සහ පිළියම් සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග නියම කරනු ලබයි.

2. වගකීම්සහගත ණයදීමේ සංස්කෘතිය

ශක්තිමත් අභ්‍යන්තර සන්නිවේදන ක්‍රියාවලියක් සහ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් තුළින් බැංකුව තුළ අවදානම පිළිබඳ දැනුවත් සංස්කෘතියක් සහ වගකීම්සහගත ණයදීම පෝෂණය කරනු ලැබේ. ණය පිරිනැමීම පිළිබඳ ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන අතර, ණය පහසුකම් පිරිනැමීමට හෝ ණය සීමාව වැඩි කිරීමට පෙර ගනුදෙනුකාර ණය ඇගයීමක් පවත්වනු ලැබේ. අභ්‍යන්තර ණය ශ්‍රේණිගතකරණ ආදර්ශ විවිධ ණය සාධක නියෝජනය කරන අතර ගෙවීම පැහැර හැරීම හෝ අලාභයේ සම්භාවිතාව පුරෝකථනය කරයි.

3. බලතල බෙදීම

අධ්‍යක්ෂ මණ්ඩලයට සියලුම ණය අවදානම් නිරාවරණ සඳහා අවසාන බලය සහ වගකීම සතු වේ. ණය බලතල සීමා සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩල විසින් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) වෙත පවරනු ලැබ ඇත. ණය කමිටු සහ ව්‍යාපාර මාර්ග වෙත අනුමත සීමා නැවත පැවරීමේ බලය BECC සතුය. එක් එක් ව්‍යාපාර මාර්ගය සම්බන්ධ කර ඇති අතර විවිධ මට්ටම්වල අවදානම පිළිගැනීමේ නිර්ණායක සහ ණය අනුමත කිරීමේ බලය අනුමත කර ඇත. ණය පහසුකමට යම් පශ්චාත් බෙදාහැරීමේ වැදගත් වෙනස්වීම් (කාලය, ගිවිසුම් හෝ ඇප ව්‍යුහය වෙනස්වීම වැනි) සිදුකිරීමේදි අනුමැතිය අවශ්‍යය. අවදානම් තක්සේරුව සහ පශ්චාත් නියාමනය සඳහා වගකීම බෙදීම ණය අනුමත කිරීමේ මාර්ගෝපදේශ සහ දක්ෂතාවන් හි විශේෂත්වය ඇති කරයි.

ණය අනුමත කිරීමේ බලතල අදාළ ශ්‍රේණියට අනුකූලව පුද්ගලයින්ට වෙත පවරනු ලබන අතර කලින් කල සමාලෝචන පවත්වනු ලැබේ.

4. බන්ධන්දායියන්ගේ අවදානම් ශ්‍රේණිගතකරණය, විචක්ෂණ සීමා

බැංකුව විසින් අභ්‍යන්තර ඇගයීම් ක්‍රමවේද, ලකුණු කාඩ් සහ ලකුණු නවයේ ශ්‍රේණිගතකරණ පරිමාව ඇතුළු ක්‍රියාමාර්ග රාශියක් යොදා ගනිමින් ණය වටිනාකම අගය කරන අතර ණය ගැණුම්කරුවන් වෙත ශ්‍රේණිගතකරණ පැවරීම සිදු කරයි. එක් එක් වර්ගයේ ණය ගැණුම්කරුවන්ට විවිධ අවදානම් ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් සතු වන අතර, ඒවා BIRMC විසින් කලින් කල සමාලෝචනය කර වලංගු කරනු ලැබේ.

5. ණය අවදානම අවම කිරීම සහ ඇප කළමනාකරණය

යම් දෙන ලද ගිණුමකින්, ගනුදෙනුකරුවෙකුගෙන් හෝ කළඹකින් වියහැකි ණය අලාභ අවම කිරීමට බැංකුව විවිධ ක්‍රම යොදා ගනී. මෙයට ප්‍රතිව්‍යුහගතකරණය, ඇප ගිවිසුම් මෙන්ම ණය රක්ෂණය, ණය ව්‍යුත්පන්න, සහ ඇප ඇතුළත්ය. බැංකුවේ ඇප ප්‍රතිපත්තිය පරිදි ඇප ලබාගන්නා අතර ප්‍රධාන වර්ගයේ ඇපවලට නිශ්චල හෝ නිශ්චල නොවන දේපල උකස්කරණ, මුදල් තැන්පතු, පිරියත සහ යන්ත්‍ර, ගබඩාවක උකස්කරණ, පොත් ණය ආයතන සහ පුද්ගල ඇප ඇතුළත්ය.

6. ණය නියාමනය සහ සමාලෝචනය

ඉදිරියට යන පදනම මත ණය අවදානම් ස්ථානගතවීම් සක්‍රීයව නියාමනය කර කළමනාකරණය කරනු ලබයි. ව්‍යාපාර ඒකකවලට අනුයුක්ත ණය නිලධාරීන් විසින් ණය නියාමනය සිදු කරනු ලැබේ. අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව ස්වාධීනව ණය යෝජනාවල පූර්ව සමාලෝචනය සහ පශ්චාත් සමාලෝචනය සිදු කරයි.

ණය නිලධාරීන්ට ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට අදාළ ණය අවදානම් කළමනාකරණය කිරීමට අදාළ ප්‍රවීනත්වය සහ පළපුරුද්ද ඇත. සෑම ණය නිලධාරියෙක්ම/සම්බන්ධතා කළමනාකරුවෙක්ම ඔවුන්ට අදාළ ණය ගැණුම්කරු කළඹේ ණය අවදානම අඛණ්ඩව නියාමනය කිරීමට වගකීමට බැඳී සිටී. කලින් කල සිදුකරන ණය සමාලෝචන වාර්තා වැඩිදුර සමාලෝචනය සහ ණය අවදානම නියාමනය කිරීම සඳහා BIRMC සහ CRMC වෙත ඉදිරිපත් කරනු ලබයි.


7. හානිකරණය

ගෙවීම් පැහැරහැරි ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමට විස්තීර්ණ හා ශක්තිමත් හානිකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවතී. ණය හානිකරණය සඳහා වෙන්කිරීම ශේෂ පත්‍රය තුළ ණය කළඹේ ධාරණ අගයේ අඩුකිරීමක් ලෙස වාර්තා කෙරේ. හානිකරණ ණය සඳහා වෙන්කිරීම් ආදායම් ප්‍රකාශනය තුළ සිදු කරන අතර බැංකුවේ සියලුම නිරාවරණ සඳහා හානිකරණ තක්සේරු කිරීම් පවත්වනු ලබයි. ණය හානිකරණ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ගණනය කර ගිණුම්ගත කරන අතර අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපනය සිදු කරනු ලබයි.

ණය අවදානම් කාර්යසාධන සමාලෝචනය

ශුද්ධ ණය සහ අත්තිකාරම් 2022 අවසානයේදී වාර්ෂිකව 7.3%කින් පහත වැටී ශ්‍රී ලං. රු. බිලියන 1732.15ක් වූ අතර, එය වාර්තාකරණ කාලසීමාව අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මුළු වත්කම්වලින් 55%ක් නියෝජනය කරයි. ණය කළඹ තුළ වත්කම්වල ගුණාත්මකභාවය වසර අවසානය වන විට 3.21% සිට 4.4% දක්වා පහළ වැටුණු තත්ත්වයක් පෙන්නුම් කරයි. සෘණාත්මක සාර්ව විචල්‍යතා හේතුවෙන් අහිතකර ආර්ථික තත්ත්වයන් හී මන්දගාමී ප්‍රතිසාධනය සහ ඩොලර් සහ රුපියල්වල ද්‍රවශීලතාව සීමා කිරීම් ණය කළඹේ අඩු වර්ධනයට හේතු වූ අතර, ක්ෂේත්‍රය තුළ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමකට ලක් වී පැවතුණි.

ආයතනික ගනුදෙනුකරුවන්ගේ අවදානම් විස්තර



මහජන බැංකුවේ උපරිම ණය නිරාවරණය

	අවදානම් ශ්‍රේණිගතකරණය	AAA	AA	A	BBB	BB	B	CCC	CC	C
ආයතනික ගනුදෙනුරුවන් ගණන	22 දෙසැම්බර් 31		17	51	87	82	54	34	13	19
	21 දෙසැම්බර් 31		11	52	87	95	58	38	19	19

ණය සංක්‍රමණ අවදානම

සංක්‍රමණ අවදානම යනු ණය වටිනාකම පහත වැටීමට හේතුවන කාලසීමාවක් පුරා ණය ගැණුම්කරුවෙකුගේ ණය ශ්‍රේණිගතකරණයේ පිරිහීම හේතු කොට ගෙන සිදුවන ණය අවදානමකි. ගනුදෙනුකරුගේ කළඹ ශ්‍රේණිගතකරණයේ පහළ යාම මගින් මෙය පිළිබිඹු කරයි. ආයතනික ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගතකරණයේ සංක්‍රමණය නිරන්තරයෙන් බැංකුව සමීපව නිරීක්ෂණය කරයි. පසුගිය වසර පහ තුළ පහළට ශ්‍රේණිගතකළ ආයතනික ගනුදෙනුකරුවන්ගේ ගණන පහත වගුව තුළ දැක්වේ:

වසර	සංක්‍රාන්තියේදී ගනුදෙනුකරුවන් ගණන	පහළට ශ්‍රේණිගත කළ ගනුදෙනුකරුවන් ගණන
2018	322	19
2019	318	20
2020	320	21
2021	321	11
2022	329	14

පැහැර හැරීමේ අවදානම

පැහැරහැරීමේ අවදානම යනු ණය ගිවිසුමක් මත ණය ගැණුම්කරු හෝ ඇපකරු විසින් ගිවිසුම් ගත බැඳීම් ඉටු නොකිරීම තුළින් ඇති වියහැකි අලාභයයි.

දැඩි ණය ඇගයීම්, පශ්චාත් ණය බෙදාහැරීමේ නියාමනය සහ ඉහළ අයකිරීමේ අනුපාතයක් තුළින් යහපත් ගුණාත්මක කළඹක් බැංකුව පවත්වා ගනු ලැබිය. 2022 සඳහා බැංකුවේ අදියර 3 වත්කම් අනුපාතය 12.78%කි.

පැහැරහැරීමේ අවදානම කළමනාකරණය

අදියර 3 වත්කම්/යල්පැනීම් විශ්ලේෂණ, ශ්‍රේණිගතකරණ සංක්‍රමණය යනාදි විශ්ලේෂණය වැනි අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරමින් අබණ්ඩ පදනමක් මත අපගේ සියලුම ණය නිරාවරණ අපි සමීපව නියාමනය කරමු. අලාභ පිළිබඳ අවදානම වැඩි වී ඇති ණය නිරාවරණ මුල් අවධියේදී හඳුනා ගැනීමට ශක්තිමත් ක්‍රියාවලි ක්‍රියාත්මක කර ඇත. එවැනි නිරාවරණ පොදුවේ පරීක්ෂා කිරීමේ ලැයිස්තුවට ඇතුළත් කරන අතර අයකරගැනීම උපරිම කිරීම සඳහා සමීපව කළමනාකරණය කෙරේ.

තවද, පැහැර හැරීමේ තත්ත්වයට පත්වීමට පෙර පිඩාවට පත් ව්‍යාපාර ආයතනවල පූර්ව සංඥා හඳුනා ගනිමින් ණය අවසානය කළමනාකරණය කරනු ලබයි. එවැනි ආයතනවලට විස්තීර්ණ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් සලකනු ලබන අතර එය ගනුදෙනුකරුට දුෂ්කර අවස්ථාව ජයගැනීම සඳහා පහසු ආපසු ගෙවීමකට හේතු වේ. ව්‍යාපාර ආයතනය ප්‍රතිව්‍යුහගතකරණ අපහසු අවස්ථාවක, පුනරුත්ථාපන ක්‍රියාවලිය යොදා ගනු ලැබේ.

සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු තනි පුද්ගල ඇපකරුවන්, කර්මාන්ත අංශය හෝ භූගෝලීය කලාපවලට බැංකුවේ ණය සහ අත්තිකාරම් සංකේන්ද්‍රණයවීම හේතු කොට ගෙන ඇතිවන අවදානම් මට්ටමකි. රජයට අයත් බැංකුවක් වශයෙන්, මහජන බැංකුව රජයට අයත් ව්‍යවසාය, රජයේ සංවර්ධන වැඩසටහන හා බැඳුණු උකස් සහ නිවාස පහසුකම් සඳහා නිරාවරණ බැංකුව අත්කරගෙන ඇත.

විශාල නිරාවරණ සඳහා සංකේන්ද්‍රණය (2022 දෙසැම්බර් 31 දිනට රු.මි. 100ට වැඩි)*

දෙසැම්බර් 31 දිනට	ක්ෂේත්‍රයේ අංශ ගණන	තනි ගනුදෙනුකරුවන් ගණන	සෘජු නිරාවරණය රු.මි.	වක්‍ර නිරාවරණය රු.මි.	මුළු ගණන රු.මි.	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස සෘජු නිරාවරණය
රාජ්‍ය ව්‍යවසාය සහිත	18	385	977,678	172,114	1,149,792	54.83
රාජ්‍ය ව්‍යවසාය රහිත	17	343	207,997	45,998	253,995	11.66

2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ඉහළම ගනුදෙනුකරුවන් 20 හි තත්ත්වය

වසර	ඉහළ 3%	ඉහළ 5%	ඉහළ 10%	ඉහළ 20%
රාජ්‍ය ව්‍යවසාය ඇතුළුව				
2021	60	68	77	83
2022	52	62	71	78
රාජ්‍ය ව්‍යවසාය නොමැතිව				
2021	10	14	24	38
2022	11	17	29	45

සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය

සංකේන්ද්‍රණ නියාමනය කර පාලනය කිරීමට යොදා ගන්නා මිනුම් ලෙස තනි ණය ගැණුම්කරුවෙකුගේ සීමාව සහ Herfindahl-Hirschman දර්ශකය (HHI) යොදු ගනී. රු.මි. 100ට ඉහළ සියලුම නිරාවරණ (සීමාවට ඉහළ හෝ හිඟව තිබෙන) සඳහා HHI ගණනය කරයි. (සෘජු සහ අසම්භාව්‍ය) ඇපකරුගේ නම සහ අංශ පදනම මත ගණනය කිරීම් කෙරේ. බැංකුවේ කළඹ කර්මාන්ත ක්ෂේත්‍ර 17කට බෙදනු ලබයි. සංකේන්ද්‍රණයේ එක් එක් මට්ටම සඳහා ඉවසුම් මට්ටම් පහතින් දැක්වේ. බැංකුව සංකේන්ද්‍රණ අවදානම් කළමනාකරණය කිරීමට කර්මාන්ත/අංශ සඳහා තනි සීමා සහ රාජ්‍ය සතු ආයතන වෙත වෙනම සීමා ක්‍රියාත්මක කර ඇත.

මිටරය	අඩු සංකේන්ද්‍රණය	මධ්‍යම සංකේන්ද්‍රණය	ඉහළ සංකේන්ද්‍රණය
HHI	<0.15	0.15 - 0.25	>0.25

2022 මූල්‍ය වසර සඳහා මහජන බැංකුවේ කාර්තුමය තත්ත්වය

	2022 මාර්තු 31	2022 ජූනි 30	2022 සැප්තැම්බර් 30	2022 දෙසැම්බර් 31
නම සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් සහිත)	0.14	0.18	0.15	0.15
නම සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් රහිත)	0.01	0.01	0.01	0.01
අංශය සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් සහිත)	0.17	0.20	0.17	0.17
අංශය සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් රහිත)	0.14	0.14	0.13	0.13

ණය අවදානම් ආතති පරීක්ෂණය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම් මත බලපාන සමහර සිදුවීම් තීරණය කිරීමට ණය අවදානම් පිඩන පරීක්ෂණය පවත්වනු ලැබේ.
මෙම පීඩන පරීක්ෂණ වාර්තාව සමාලෝචනය සඳහා BIRMC වෙත ඉදිරිපත් කෙරේ.

	සුළු	මධ්‍යම	විශාල
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත මත හානිකරණ බලපෑමේ වැඩිවීම – ඉහළ අවදානම් පරිසරය තුළ			
අදියර 1 කාණ්ඩයේ සිට අදියර 2 කාණ්ඩයට මාරුවීම.	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.74	11.59	11.45
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.16	16.01	15.87
අදියර 2 කාණ්ඩයේ සිට අදියර 3 කාණ්ඩයට මාරුවීම.	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.68	11.49	11.29
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.10	15.91	15.71
අදියර 1 කාණ්ඩයේ සිට අදියර 2 කාණ්ඩයට සහ අදියර 2 කාණ්ඩයේ සිට අදියර 3 කාණ්ඩයට එකවර මාරුවීම.	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.54	11.20	10.86
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	15.96	15.62	15.28
පැහැරහැරීමේ හැකියාව තුළ කම්පනය	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.83	11.78	11.73
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.25	16.20	16.15
අලාභ දෙන පැහැරහැරීමේ කම්පනය	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.81	11.73	11.66
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.23	16.15	16.08
පැහැරහැරීමේ හැකියාව තුළ සහ අලාභ දෙන පැහැරහැරීමේ කම්පනය	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.73	11.59	11.44
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.15	16.01	15.86
විශාල ණයගැණුම්කරුවන් විසින් ගෙවීම පැහැර හැරීම	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.71	11.63	11.54
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.13	16.04	15.96

වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු පොළී අනුපාත, හුවමාරු අනුපාත සහ ස්කන්ධ සහ වෙළෙඳ ද්‍රව්‍ය මිළ ගණන් වැනි වෙළෙඳපොල මෙහෙයවන විචල්‍යතාවල චලනය හේතු කොට ගෙන ඇති වියහැකි අලාභයයි. බැංකුවේ ප්‍රධාන වෙළෙඳපොල අවදානම් වර්ග යනු පොළී අනුපාත අවදානම, විදේශ විනිමය හුවමාරු අවදානම, ස්කන්ධ අවදානම සහ වෙළෙඳ ද්‍රව්‍ය අවදානම වේ.

බැංකුව වෙළෙඳපල අවදනම සඳහා ප්‍රධාන වශයෙන් නිරාවරණය වනුයේ වෙළෙඳ සහ වෙළෙඳ නොවන කළඹවල් තුළින් ඇතිවන පොළී අනුපාත අවදනම සහ උකස් කළඹ තුළින් ඇතිවන රත්‍රන් මිල අවදනම මඟිනි. බැංකුවේ හිමිකාර වෙළෙඳාම සහ විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ ගනුදෙනු හේතු කොට ගෙන විදේශ විනිමය අවදානමට මධ්‍යස්ථව නිරාවරණය වේ. ස්කන්ධ අවදානමට නිරාවරණය සාපේක්ෂව අඩු වෙළෙඳ කළඹ හේතුකොටගෙන සීමා වේ.


වෙළෙඳපොල අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ ව්‍යාපාර ඒකකවල අවදනම්-ප්‍රතිලාභ සම්බන්ධතා ප්‍රශස්ථ කිරීම.
- පිළිගත නොහැකි අලාභවලට හේතුවන නිරාවරණ වැලැක්වීම.
- බැංකුවේ සියලුම මෙහෙයුම් පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ බව සහතික කිරීම.

මහජන බැංකුවේ වෙළෙඳපොල අවදානම නිරාවරණය

	2022		2021	
	වෙළෙඳ කළඹ රු.මි.	බැංකුකරණ කළඹ රු.මි.	වෙළෙඳ කළඹ රු.මි.	බැංකුකරණ කළඹ රු.මි.
වත්කම්				
භාණ්ඩාගාර බිල්පත්	4,443	2,296	273	-
භාණ්ඩාගාර බැඳුම්කර	872	898,577	1,004	573,471
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	-	-	2,678
ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර	-	7,689	-	7,689
වෙනත් ආයෝජන	242	18,810	282	15,184
වගකීම්				
ණයකර	-	36,603	-	48,862

වෙළෙඳපොල අවදානමේ පාලන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී, බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණය නියාමනය කිරීමට, ප්‍රතිපත්ති සහ අවදානම් රුචි සීමා සකස් කිරීමට සහ වෙළෙඳපොල අවදානම් කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබාදීමට BIRMC වගකීමට බැඳී සිටී.

විධායක මට්ටමේදී, වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වෙළෙඳපොල අවදානම කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සහ පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ පවත්වාගැනීම සඳහා වගකීමට බැඳී සිටී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙළෙඳපොල අවදානම තක්සේරු කිරීම, නියාමනය සහ වාර්තා කිරීම ඇතුළුව දෛනික අවදානම් කළමනාකරණ කටයුතු සඳහා වගකීමට බැඳී සිටී.

භාණ්ඩාගාර ඉදිරි කාර්යාල සහ භාණ්ඩාගාර පසු කාර්යාලවල කාර්යයන්ගෙන් ස්වාධීනව භාණ්ඩාගාර මධ්‍යපෙළ කාර්යාලය (TMO) බැංකුවේ භාණ්ඩාගාර ගනුදෙනු මැනීම සහ නියාමනය සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති අවදානම් සීමාවන්ට අනුකූල වීම සහතික කරයි.

වෙළෙඳපොල අවදානම් කළමනාකරණය

වෙළෙඳපොල අවදානම් ප්‍රතිපත්ති, අවදානම් ඇගයීමේ ක්‍රියාමාර්ග සහ අවදානම් සීමා පිළිබඳ සංයෝගයක් තුළින් කළමනාකරණය කෙරේ.

1. ප්‍රතිපත්ති

බැංකුවේ වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට වත්කම් වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය, භාණ්ඩාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය, විදේශ විනිමය අවදානම් ප්‍රතිපත්තිය සහ ආතති පරීක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය ඇතුළු ප්‍රතිපත්ති කිහිපයක් ඇතුළත් වේ. මෙම ප්‍රතිපත්ති වෙළෙඳපොලට අදාළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම, නියාමනය සහ වාර්තා කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දේ.

2. අවදානම් කළමනාකරණය

අවදානමේ වටිනාකම, පරතර කාලසීමාව, සංවේදිතා විශ්ලේෂණ සහ ආතති පරීක්ෂණ වෙළෙඳපොල අවදානම තක්සේරු කිරීම සඳහා යොදාගනු ලබන මෙවලම් වේ. ඇගයීම් අනුපාත සහ ක්‍රමවේද ස්වාධීන සත්‍යාපනය කිරීමකට යටත් වේ.

3. වෙළෙඳපොල අවදානම් සීමා

වෙළෙඳපොල අවදානම් සීමා තක්සේරු කර ALCO වෙත නිර්දේශ කර ඉන් පසුව අනුමැතිය සඳහා BIRMC වෙත ඉදිරිපත් කෙරේ. විවෘත තත්ත්ව සීමා, ප්‍රතිපාර්ශව සීමා සහ වෙළෙඳ සීමා වැනි සීමා අනුමත වෙළෙඳපොල අවදානම් සීමා මත පදනම් විනිශ්චය කෙරේ. නිෂ්පාදනය, අංශය, ණය ශ්‍රේණිගතකරණ, සහ භූ ප්‍රදේශය මත පදනම් වී සීමා නියාමනය කෙරේ. TMO සීමා අනුව කාර්යසාධනය නියාමනය කරන අතර මාසික පදනම මත ALCO වෙත වාර්තා කරයි. මෙම සීමා ALCO විසින් සිදුවියහැකි වෙළෙඳපොල ගතිකතා මත පදනම් වී විධිමත්ව සමාලෝචනය කරන අතර අවශ්‍යනම් වඩා පටු සන්නාමවලට සමාලෝචනය කෙරේ.

2022 දෙසැම්බර් 31 දිනට වෙළෙඳපොල අවදානම් සීමා සහ තත්ත්වයන්

වෙළෙඳපොල අවදානම	වෙළෙඳපොල අවදානම් රුවිය	
	අනුමත සීමාව	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
විනිමය හුවමාරු ශුද්ධ විවෘත තත්ත්වය	ඇ.ඩො.මි. + 30 ඇ.ඩො.මි. - 25	අනුකූලවිය.
අවදානමේ වටිනාකම (VaR) (විශ්වාසී මට්ටම 99%, 1 දින) – ව්‍යවහාර මුදල	ඇ.ඩො.මි. 250,000	කඩකරනලදී*
– පොළී අනුපාත	ඇ.ඩො.මි. 150	කඩකරනලදී*
සමුච්චිත අලාභ		
– විනිමය හුවමාරු වෙළෙඳාම	ඇ.ඩො.මි. 175,000	අනුකූලවිය.
– විනිමය හුවමාරු වෙළෙඳාම (උපලබ්ධි)	රු.මි. 25	අනුකූලවිය.
– (උපලබ්ධි) නොවූ*	රු.මි. 500	අනුකූලවිය.
ඉදිරි විනිමය හුවමාරු පරතර සීමාව	ඇ.ඩො.මි. 600 මාස	අනුකූලවිය.
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත – වෙළෙඳ	රු.මි. 250	අනුකූලවිය.
– ආයෝජන	රු.මි. 1,000	අනුකූලවිය.
– විකිණීමට තබා ඇති	රු.මි. 20	අනුකූලවිය.
ජාත්‍යන්තර රන් බැඳුම්කර – වෙළෙඳ	ඇ.ඩො.මි. 20	අනුකූලවිය.
– ආයෝජන	ඇ.ඩො.මි. 200	අනුකූලවිය.
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	ඇ.ඩො.මි. 750	අනුකූලවිය.
අන්තර් බැංකු ණය ගැනීම් – මුළු සීමාව	ඇ.ඩො.මි. 723	අනුකූලවිය.
පවත්නා වටිනාකම් පදනම් ස්ථාන (PVBP) සීමාව	රු.මි. 25	අනුකූලවිය.
රන් ඒකක භාර	රු.මි. 2.5	අනුකූලවිය.
ආයතනික ණය සීමාව (ණයකර)	රු.මි. 15	අනුකූලවිය.
බැංකු නොවන PDU සඳහා ප්‍රති මූල්‍ය ගිවිසුම් REPO සීමාව	රු.මි. 1	
– Hair කැපුම් සීමාව	10%	අනුකූලවිය.
Swap අරමුදල් සඳහා සීමාව	මාස 3ට අඩු කාලයක් සඳහා O/S වලින් 75%	අනුකූලවිය.
පොළී අනුපාත අවදානම (D-Gap+VaR on Fwd. FX)	රු.මි. 16.5	අනුකූලවිය.
කොටස් වෙළෙඳ කළඹ තුළ ආයෝජන වටිනාකම	අන්ත 1: රු.මි. 1,000	අනුකූලවිය.
	අන්ත 2: රු.මි. 1,000	අනුකූලවිය.
නැවතුම් අලාභ සීමාව (කොටස් වෙළෙඳාම)	30%	අනුකූලවිය.
S&P SL20 දර්ශකය මත කොටස් ප්‍රතිශතය	අවම 25%	අනුකූලවිය.

** හුවමාරු අනුපාත සහ පොළී අනුපාතවල වෙළෙඳපොල වෙනස්වීමට අනුව*

4. ක්‍රියාමාර්ග උත්ප්‍රේරක

බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණ අවදානම් රුචි ප්‍රකාශනය මගින් නිශ්චය කරන මට්ටම්වල ඇති බව සහතික කිරීම සඳහා, විශේෂ කළමනාකරණ කාර්යයන් ඇතිකරන අවදානම් සීමා විශේෂයෙන් විස්තර කෙරේ.

වෙළෙඳපොල අවදානම සමාලෝචනය

ක්‍රමානුකූල අවදානම ලෙසින්ද හඳුන්වන බැංකුවේ වෙළෙඳපොල අවදානම යන්නෙන් යම් ආයෝජන තීරණයක් හා බැඳුණු අවිනිශ්චිතතාව අදහස් වන අතර එය සමාගම හෝ ක්ෂේත්‍රය සමඟ විශේෂයෙන් බැඳී තිබීම පමණක් නොව උද්ධමනය, පොළී අනුපාත, ගෙවීම් අවස්ථාවේ ශේෂය, මූල්‍ය හිඟය සහ ප්‍රතිපත්ති සහ භූගෝලීය සාධක යනාදිය හා බැඳුණු විවිධ සාර්ව ආර්ථික විචල්‍යතා මත බැඳී පවතී. බැංකුවේ වෙළෙඳපොල අවදානම ව්‍යුත්පන්න වන්නේ ප්‍රධාන වශයෙන් පොලී අනුපාත, විනිමය අනුපාත සහ වෙළඳපොලේ කොටස් මිල යන සැපයුම් සහ ඉල්ලුමේ බලවේග වලින් වන අතර, එය බැංකුවේ ඉපැයීම්වල සංවේදීතාව හෝ එහි ප්‍රාග්ධනයේ ආර්ථික වටිනාකම ඉහත සඳහන් ප්‍රධාන මූලාශ්‍ර අහිතකර වෙනස්කම් වලට සංවේදී වීම වේ. මනාව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයක් හරහා වෙළෙඳපොළ අවදානමට දායක වන විවිධ අංශ කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක වන දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහතික කිරීම මගින් බැංකුව සිය වෙළෙඳපොළ අවදානම නිසි ලෙස කළමනාකරණය කර අවම කරයි. වෙන් කර ඇති අවදානම් රුචි මට්ටම් තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා වෙළඳපල අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට, පාලනය කිරීමට සහ වාර්තා කිරීමට මෙය ඉඩ ලබා දී ඇත. බැංකුවේ භාණ්ඩාගාරය බොහෝ දුරට අනුමත සීමාවන්ට අනුකූලව කටයුතු කර ඇති අතර, රටේ සමාජ-ආර්ථික බලපෑම බැංකුවේ ක්‍රියාකාරිත්වයට සෘජු හා සැලකිය යුතු බලපෑමක් ඇති කළත් සමස්ත වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කරමින්, අපේක්ෂා කළ හැකි ආකාරයෙන් අවදානම් කළමනාකරණය සඳහා අනුමැතිය ලබාගෙන ඇත. වෙළෙඳපොල තත්ත්වය නිරතුරුව සමාලෝචනය කරමින් රජය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෘත්තීමය ආකාරයෙන් නිකුත් කළ මාර්ගෝපදේශ සහ උපදෙස්වලට බැංකුව දැඩිව අනුකූල වී ඇත.

පොළී අනුපාත අවදානම (IRR)

පොළී අනුපාත අවදානමේ උප වර්ගීකරණ පහත දැක්වේ. බැංකුවේ ශුද්ධ පොළී ආදායම වෙළෙඳපොල පොළී අනුපාතවල උච්ඡාවචනවලින් දැඩි ලෙස බලපෑමට ලක්වන විට බැංකුව පොළී අනුපාත අවදානමට නිරාවරණය වේ. පාදක වූ පොළී ඉපයීම් වත්කම්, පොළිය දරන වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම කෙරෙහි සිදුවියහැකි බලපෑමක් මින් ඇත.

පොළී අනුපාත අවදානමේ උප වර්ගීකරණ පහත දැක්වේ:

- **ප්‍රතිමිලකරණ අවදානම –** වෙනස්වන කල්පිරීම් සහිත බැංකුවේ වත්කම් සහ වගකීම්වල ප්‍රතිමිලකරණ කාලවල වෙනස්වීම් තුළින් ඇති වේ.
- **පදනම් අවදානම –** බැංකු කළඹේ සහ අරමුදල්වල ගම්‍යමාන පිරිවැය මත තත්‍ය පොළී ආන්තිකය සහ අපේක්ෂිත පොළී ආන්තිකය අතර වෙනසින් ඇතිවේ.
- **ඵලදායී චක්‍රීය අවදානම –** බැංකුවේ ඉපයීම්/වත්කම් වටිනාකම් මත සෘණාත්මක බලපෑමක් ඇති ඵලදා චක්‍රය තුළ විතැන්වීමෙන් ඇති වේ.

එක් වසරක සීමාව තුළ අවදානමේ ඉපයීම් (1%ක ශුද්ධ බලපෑම)

	මාස 1 දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12
ශුද්ධ වත්කම් (රු.මි.)	93,263	(1,031)	(89,670)	(950,681)
1%ක වෙනස සඳහා අලාභය (රු.මි.)	38.33	(1.72)	(336)	(7,130.11)

පොළී අනුපාත අවදානම කළමනාකණය

පොළී අනුපාත අවදානම සඳහා අවදානම් රුචිය අනුමත කිරීමේ සහ අවදානමට වටිනාකම (VaR) සහ අවදානමේ දී ඉපයීම් (EAR) සඳහා සමස්ථ සීමා සකස් කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

බැංකුවේ වෙළෙඳපොල අවදානම් ප්‍රතිපත්තිය විසින් බැංකුකරණ සහ වෙළෙඳ කළඹ තුළ සියලුම පොළී අනුපාත අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය සහ වාර්තාකරණ අනුකූලතාව සඳහා මාර්ගෝපදේශ සපයයි. අවදානම් රුචිය තුළ පොළී අනුපාත අවදානම් කළමනාකරණය සඳහා භාණ්ඩාගාරය වගකීමට බැඳී සිටින අතර පොළී අනුපාත අවදානම් නියාමනය සඳහා මධ්‍යපෙළ කාර්යාලය වගකීමට බැඳී සිටී.

පොළී අනුපාත අවදානම මැනීම සඳහා යොදාගනු ලබන ශිල්පවලට කාලසීමා පරතර විශ්ලේෂණ, අවදානමට වටිනාකම සහ අවදානමේ දී ඉපයීම් ඇතුළත් වේ. කාලසීමා පරතර සහ පොළී අනුපාත අවදානම වෙත සමස්ථ නිරාවරණය අනුපාත සංවේදී වත්කම් සහ වගකීම් ඒවායේ කල්පිරෙන කාලය මත පදනම් වී බාණ්ඩ කරමින් නිශ්චය කරනු ලබයි.

බැංකුවේ වත්කම් සහ වගකීම් කළඹ ප්‍රතිමිලකරණය පිළිබඳ තීරණය ගැනීම සහ වෙළෙඳපොල පොළී අනුපාතවල කල්පිරීම්වල නොගැලපීම් සහ ප්‍රවණතා අඛණ්ඩව නියාමනය සඳහා ALCO වගකීමට බැඳී සිටී. වෙනස්වන ආර්ථික දර්ශක හේතු කොට ගෙන බැංකුවේ ඉපයීම් සහ ප්‍රාග්ධනය මත සිදුවියහැකි බලපෑම මැනීම සඳහා බැංකුකරණ සහ වෙළෙඳ කළඹේ IRR නිරාවරණ මත කලින් කල පීඩන පරීක්ෂණය පවත්වනු ලබයි.


පොළී අනුපාත අවදානම මාසිකව ඇගයීමට ලක්කර නියාමනය කර වත්කම් සහ වගකීම් කමිටුවේදී සාකච්ඡා කෙරේ.

වත්කම් සහ වගකීම් කල්පිරීමේ නොගැලපීම්

2022	මාස 1 දක්වා රු.මි.	මාස 1-3 රු.මි.	මාස 3-6 රු.මි.	මාස 6-12 රු.මි.	අවුරුදු 1-3 රු.මි.	අවුරුදු 3-5 රු.මි.	අවුරුදු 5ට වැඩි රු.මි.
අනුපාත සංවේදී වත්කම්	386,829	269,247	434,129	216,713	189,525	293,750	917,701
අනුපාත සංවේදී වගකීම්	270,278	523,799	1,167,395	23,453	27,971	128,856	296,031
කාලසීමා පරතර	116,551	(254,552)	(733,265)	193,261	161,554	164,894	621,670
සමුච්ඡිත පරතරය	116,551	(138,001)	(871,266)	(678,005)	(516,451)	(351,557)	270,113

2021	මාස 1 දක්වා රු.මි.	මාස 1-3 රු.මි.	මාස 3-6 රු.මි.	මාස 6-12 රු.මි.	අවුරුදු 1-3 රු.මි.	අවුරුදු 3-5 රු.මි.	අවුරුදු 5ට වැඩි රු.මි.
අනුපාත සංවේදී වත්කම්	309,297	225,075	323,262	603,621	156,123	191,839	607,587
අනුපාත සංවේදී වගකීම්	535,995	347,556	265,952	1,166,484	27,390	52,370	3,232
කාලසීමා පරතර	(226,698)	(122,481)	57,310	(562,863)	128,732	139,469	604,355
සමුච්ඡිත පරතරය	(226,698)	(349,179)	(291,869)	(854,732)	(725,999)	(586,531)	17,824

කාලසීමා පරතර විශ්ලේෂණය භාවිතයෙන් 1%ක අහිතකර පොළී අනුපාත වෙනස හේතු කොට ගෙන ස්කන්ධය මත බලපෑම



IRR ආතති පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය - 0.25%	කම්පනයේ විශාලත්වය - 0.50%	කම්පනයේ විශාලත්වය - 1.00%
2022			
ඉපයීම් මත බලපෑම (රු.මි.)	4,327	8,654	13,054
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	15.86	15.41	14.97
2021			
ඉපයීම් මත බලපෑම (රු.මි.)	3,966	7,932	15,863
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	17.38	16.92	16.02

පොළී අනුපාත අවදානම් සමාලෝචනය

වෙළෙඳපොල තත්ත්වයන් හේතුවෙන් පොළී අනුපාතවල අනපේක්ෂිත අහිතකර චලනයන්/උච්ඡාවචනයන් තුළින් පොළී අනුපාත අවදානම ඇතිවන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ අනාගත මුදල් ප්‍රවාහ හෝ මූල්‍ය උපකරණවල සාධාරණ අගය කෙරෙහි බලපෑම් ඇති කරයි. කාලසීමාව තුළ වරින් වර පොළී අනුපාතවල වෙනස්වීමෙන් ඇති වන අවදානම බැංකුවේ වත්කම්, වගකීම් සහ ශේෂ පත්‍රයේ අයිතම සහ එහි ආර්ථික වටිනාකම තුළ පාදක වූ අගය කාලිනව සමාලෝචනය කිරීමෙන් කළමනාකරණය කර ගැනීමට හැකි අතර එහි ආර්ථික වටිනාකම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග නිවැරදි වේලාවට ක්‍රියාවට නංවන ලදී.

පොළී අනුපාත අවදානම බැංකු ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය කොටසක් වන බව සහ ලාභදායිතාවයේ වැදගත් මූලාශ්‍රයක් වන බව අපි පිළිගනිමින්, වෙළෙඳපොල අවස්ථා නිවැරදි වේලාවට ග්‍රහනය කළේනම් කොටස්හිමි වටිනාකම වැඩි කළ හැකිය. බැංකුව නියමිත සීමවන්ට අනුකූලතාව සහතික කිරීම තුළින් පොළී අනුපාත නිරාවරණය මූලිකවම හඳුනාගැනීම, නියාමනය, පාලනය සහ වාර්තා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇත. බැංකුව රජයේ සුරැකුම්පත්වලින් සැලකියයුතු කොටසක් දරන අතර, ඒ හා බැඳුණ අවදානම් ප්‍රමාණය එහි මිලගණන් වෙළෙඳපොල තුළ පොළී අනුපාත වෙනස්වීම්වලට සංවේදී වන ප්‍රමාණය මත රඳා පවතී. අධීක්ෂණය සහ සමීප නියාමනය සියලුම අභ්‍යන්තර සහ නියාමන අවදානම් අවම කිරීමේ මූලිකාංග සහ වෙළෙඳපොල පොළී අනුපාතවල ප්‍රවණතාවන්ට අනුකූල බව සහතික කිරීමට ක්‍රියාත්මක අතර ඒ තුළින් විචක්ෂණ ආකාරයෙන් පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

විනිමය හුවමාරු අවදානම

විනිමය හුවමාරු අනුපාතවල අහිතකර උච්ඡාවචනයන් හේතුවෙන් බැංකුවේ ඉපයීම් සහ/හෝ ප්‍රාග්ධනයට ඇතිවිය හැකි බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස විනිමය හුවමාරු (FOREX) අවදනම ඇති වේ. විනිමය හුවමාරු අවදානම බැංකුවේ නිරාවරිත ආනයන/අපනයන ගනුදෙනු සහ ප්‍රේෂණ සහ හිමිකාර වෙළෙඳාම වැනි විදේශ ව්‍යවහාර මුදලින් නම්කල ගනුදෙනුවලින් ඇති වේ.

විනිමය හුවමාරු අවදානම කළමනාකරණය

විදේශ විනිමය ගනුදෙනු දැඩි නියාමන රාමුවකින් පාලනය කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත යාන්ත්‍රණය සහ සීමාවන් නියම කරන අතර, තනි පුද්ගල ව්‍යවහාර මුදල් නිරාවරණ සහ සියලු නිරාවරණ සඳහා විවෘත තත්ත්වයන් මත ALCO විසින් නියම කරන නියාමන නියමයන් සහ සීමා තුළ බැංකුව දැඩි පරීමා සීමාවන් නිශ්චය කරයි. බැංකුවේ අවදානම් රුචිය තුළ FOREX කල්පිරීමේ පරතරවලින් ඇතිවන අවදානම් ඉදිරි කල්පිරීම් පරතර සීමා තුළින් කළමනාකරණය කරනු ලබයි. භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව FOREX අවදානම පිළිබඳ සමස්ථ කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. ඉදිරි, මධ්‍ය, සහ පසු කාර්යාල කාර්යයන් අතර පැහැදිලිව රාජකාරි බෙදාහැරීම මගින් ඵලදායී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් සහතික කරයි. විවෘත තත්ත්වය, වත්කම් වගකීම් කල්පිරීම්, ව්‍යවහාර මුදල් නිරාවරණ සහ මුළු නිවාරණ නියාමනය මධ්‍ය කාර්යාලය විසින් ස්වාධිනව සිදුකරයි.

FOREX අවදානම සඳහා නිරාවරණ කළඹ මත අවදානමට අනුව වටිනාකම සහ පීඩන පරීක්ෂාවන් බැංකුව විසින් සිදුකරයි. සමාන්තර අවදානමට අනුව වටිනාකම ගණනය කිරීම් බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය (ෆිනකල්) මත පදනම් වී) සහ ජාත්‍යන්තරව පිළිගත් බ්ලූම්බර්ග් ක්‍රමය විසින් පවත්වනු ලබයි. බැංකුවේ ලාභදායිතාවට සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම්වලට විෂයෝකි බලපෑම පීඩන පරීක්ෂණය තුළින් අගයනු ලබයි.


දෙසැම්බර් 31 දිනට තත්ත්වය

ව්‍යවහාර මුදල	විදේශ විනිමයට සමාන ශුද්ධ විවෘත නිරාවරණය ('000)	රුපියලට සමාන ශුද්ධ නිරාවරණය ('000)
එක්සත් ජනපද ඩොලර්	34,594	12,670,112
යුරෝ	(412)	(160,866)
මහ බ්‍රිතාන්‍ය පවුම්	(10,812)	(4,767,822)
ජපාන යෙන්	23,956	66,599
සිංගප්පූරු ඩොලර්	(596)	(162,816)
චීන යුආන් renminbi	(6)	(307)
ඕස්ට්‍රේලියානු ඩොලර්	(10,694)	(2,661,361)
වෙනත්	-	235,340

විනිමය අනුපාත අවදානම් ආතති පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය - 5%	කම්පනයේ විශාලත්වය - 10%	කම්පනයේ විශාලත්වය - 15%
2022			
ඉපයීම් මත බලපෑම (රු.මි.)	207	414	621
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	16.28	16.26	16.24
2021			
ඉපයීම් මත බලපෑම (රු.මි.)	151	301	452
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	17.82	17.80	17.78

මාස අවසාන විදේශ විනිමය ශුද්ධ විවෘත තත්ත්වය (NOP) සහ දෛනික අවදානමේ වටිනාකම 2022



හුවමාරු අවදානම සමාලෝචනය

විනිමය හුවමාරු අනුපාතය යනු විනිමය හුවමාරු අනුපාතවල වෙනස්වීම් හේතු කොට ගෙන මූල්‍ය උපකරණයක් තුළ වටිනාකමේ උච්චාවචනයන්ගෙන් ඇතිවන අනාගත අලාභය වන අතර, එය මුල්‍ය ගනුදෙනුවක් දේශීය ව්‍යවහාර මුදල් නොවන ව්‍යවහාර මුදලකින් නම් කරනු ලබන අවස්ථාවක පවත්නා මූල්‍යමය අවදානමක් ද වේ. ඇ.ඒ.ඩො. අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතාව නොමැතිකම සහ නියමිත පරිදි ඇ.ඒ.ඩො/රුපියල් විනිමය අනුපාතිකය මත පීඩනය හේතුවෙන්, බැංකුව, ක්ෂේත්‍රය සහ සමස්ථ රට පසුගිය වසර තුළ අභියෝග කිහිපයකට මුහුණ දුන් අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සහාය ඇතිව බැංකු විසින් තීරණාත්මක තත්ත්වයන් හොඳින් කළමනාකරණය කර ඇත. තවද, දැඩි FX සීමා පිළිපැදීම, FX ශුද්ධ විවෘත තත්ත්වය මෙන්ම සැම අවස්ථාවකම අනුමත පරාමිති තුළ තනි මුදල් ඒකක සීමා තත්ත්ව පවත්වා ගැනීම විදේශ විනිමය අවදානම විචක්ෂණව කළමනාකරණය කර ගැනීමට බැංකුව ශක්තිමත් කර ඇති බව බැංකුවේ භාණ්ඩාගාරය සහතික කරයි. දැඩි අවදානම් ඉවසීමේ සීමාවන් නිර්වචනය කර ඇති අතර දිනපතා ස්වාධීනව නියාමනය කරනු ලැබේ. මෙමගින් භාණ්ඩාගාර අලෙවිකරුවන්ට මෙම සීමාවන් තුළ ක්‍රියාත්මක වීමටත්, FX අනුපාතවල උච්චාවචනයන් නිසා ඇති විය හැකි අලාභ අවම කර බැංකුවේ අවදානම් රුචිය තුළ පවත්වාගෙන යාමත් සහතික කිරීම මගින් මෙම නිරාවරණ හරහා ඇතිවන අවදානම අවම කිරීමට ඉඩ සලසයි. තවද, භාණ්ඩාගාර මැදි කාර්යාලය ඉදිරියට යන පදනමක් මත FX තත්ත්ව සීමාවන්ට පිළිපැදීම ස්වාධීනව නිවැරදි කරගෙන නියාමනය කරයි.

ස්කන්ධ මිල කළමනාකරණය

ස්කන්ධ මිල ගණන්වල උච්ඡාවචනයන් හේතු කොට ගෙන ස්කන්ධයක හෝ කොටස් කළඹක වෙළෙඳපොල වටිනාකම පහත වැටීමක් නිසා ස්කන්ධ මිල අවදානම ඇති වේ. බැංකුවේ ස්කන්ධ මිල අවදානම් නිරාවරණය පරිපාලිත සමාගම්වල උපාය මාර්ගික ආයෝජන රහිත එහි විකිණීමට තබා ඇති කළඹ තුළින් ඇති වේ. බැංකුවේ ස්කන්ධ අවදානම් නිරාවරණය ස්කන්ධ කොටස්වල අඩු ආයෝජනවල ප්‍රතිඵලයක් ලෙස සාපේක්ෂව සීමා කෙරේ.

ස්කන්ධ අවදානම කළමනාකරණය

ආයෝජනවලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සහ නිශ්චිත අවදානම් රුචිය තුළ ආයෝජන කළමනාකරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) විසින් සිදුකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ආයෝජන බැංකුකරණ ප්‍රතිපත්ති අත්පොත තුළින් පරිමාව සහ නැවතුම් අලාභ සීමා ඇතුළුව ස්කන්ධ අවදානම කළමනාකරණය සඳහා ක්‍රියාපටිපාටි, මෙවලම් සහ ශිල්ප පැහැදිලි කරයි. ආයෝජන බැංකුකරණ කමිටුව කොටස් වෙළෙඳපොල මිල ගණන්වල චලනයක්, ආයතනවල කාර්ය සාධනය සහ සාර්ව ආර්ථික කොන්දේසි විධිමත්ව නියාමනය කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙළෙඳපොල අවදානම් කාර්යය මගින් යෝජිත ස්කන්ධ ගනුදෙනු, හානිකරණ තක්සේරු කිරීම් සහ සීමාවට අනුව ස්වාධීනව නිරාවරණ සමාලෝචනය කරයි. එමෙන්ම මෙම ඒකකය වෙළෙඳ නොවන ස්කන්ධ අවදානම් රාමුව තුළ ස්වාධීන පාලනයක් පවත්වා ගනී.

ස්කන්ධ අවදානම පිළිබඳ ආතති පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය – 5%	කම්පනයේ විශාලත්වය – 10%	කම්පනයේ විශාලත්වය – 15%
ස්කන්ධ කළඹ තුළ උපරිම වෙළෙඳපොල වටිනාකම (රු.මි.)	69	138	275
උපායමාර්ගික ස්කන්ධවල සාධාරණ වටිනාකම (රු.මි.)	19	38	75
මුළු බලපෑම (රු.මි.)	88	175	351

ස්කන්ධ මිල අවදානම සමාලෝචනය

ස්කන්ධ මිල අවදානම යනු තනි ස්කන්ධවල මිල ගණන් හෝ වෙනස්වීම් තුළින් ඇතිවිය හැකි අලාභයයි. ස්කන්ධ වෙළෙඳපොල ඉහළින් උවදුරට පත්වියහැකි වුවද, බැංකුවේ ස්කන්ධ කළඹ එහි සමස්ථ වත්කම් කළඹට සාපේක්ෂව නොවැදගත්වන අතර ඒ අනුව ස්කන්ධ කළඹ තුළින් ඇතිවන අවදානම ඉතා සුළුය. කොළඹ කොටස් වෙළෙඳපොලේ වෙළෙඳාම ඩොලර් තත්ත්වයේ හිඟය විසින් ඇතිකළ ආර්ථික අර්බුදය, උද්ධමනය ඉහළයාම සහ බැංකු පද්ධතිය වෙතට ආයෝජකයින් ආකර්ෂණය කළ වඩා ඉහළ තැන්පතු පොළී අනුපාත ඉස්මතු කරමින් කිහිප අවස්ථාවකදි නවතා දමන ලදී. රට/ලෝකය තුළ ආර්ථික කොන්දේසි සියල්ල අඛණ්ඩව ඉහළ ගියද, ස්කන්ධ වෙළෙඳපොල පිළිබඳ වෙළඳපොල දර්ශනය ස්කන්ධ වෙළෙඳපොල නිවැරදිව කියවීමට සහ ක්‍රමෝපායික ස්කන්ධ ආයෝජන තීරණ ගැනීමට IBU ට සහය වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන්ට දැඩි අනුකූලතාව සහතික කිරීම සමඟ මෙය ස්කන්ධ අවදානම කාර්යක්ෂමව අවම කර කළමනාකරණය කර ගැනීමට බැංකුවට හැකියාව ලබා දී ඇත.

වෙළෙඳ ද්‍රව්‍ය අවදානම

මහජන බැංකුව රත්‍රන් ඇප දරන උකස් කළඹ තුළින් වෙළෙඳ ද්‍රව්‍ය අවදානමට නිරාවරණය වේ. බැංකුව උකස් වෙළෙඳපොල තුළ ඉහළ වෙළෙඳපොල කොටසක් දරා ගනී. රත්‍රන් මිල ගණන්වල උච්ඡාවචනයන් මඟින් රත්‍රන්වලට බලපෑම් සිදු කරයි.

වෙළෙඳ ද්‍රව්‍ය අවදානම කළමනාකරණය

වෙළෙඳ ද්‍රව්‍ය ඉතා පරීක්ෂාකාරී ක්‍රියාවලියක් තුළින් කළමනාකරණය කෙරේ. පූර්ව බෙදාහැරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් එනම් උකස් කළ භාණ්ඩවල රන් අන්තර්ගතය තීරණය කිරීම, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි සම්ප්‍රජන්‍ය පැවැත්වීම, වටිනාකමට අනුපාතය, විචක්ෂණ ණය පවත්වා ගැනීම, රත්‍රන් මිල ගණන් අඛණ්ඩව තක්සේරු කිරීම සහ තරඟකරුවන්ගේ පිරිනැමීම් සහ භාණ්ඩ සොරකම් කිරීමෙන් ඇතිවන අලාභයන්ට අනුව රක්ෂණ ආවරණයක් ලබාගැනීම ක්‍රියාත්මක කරන ලදී.


පශ්චාත් බෙදාහැරීමේ ක්‍රියාමාර්ගවලට විධිමත්ව උකස්කළ භාණ්ඩ පිළිබඳ ස්වාධීන ඇගයීම් පැවැත්වීම, 5% ක සාම්පල්වල දෛනික සත්‍යාපනය කිරීම, සහ මුදා නොගත් භාණ්ඩ කලින් කළ වෙන්දේසි කිරීම ඇතුළත්ය.

වෙළෙඳ ද්‍රව්‍ය අවදානම සමාලෝචනය

වෙළෙඳ ද්‍රව්‍ය අවදානම යනු වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන්වල වෙනස්වීම් සහ උච්ඡාවචනයන්ට නිරාවරණයයි. බැංකුව දැනට වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳාම තුළ නිරත නොවන අතර බැංකුවේ උකස් ව්‍යාපාරයට අදාළවන වෙළෙඳ ද්‍රව්‍ය අවදානමට පමණක් නිරාවරණය වේ. බැංකුව උකස් කටයුතුවල පුරෝගාමියෙක් වන අතර පහසුවෙන් අලෙවිකළ හැකියයි සලකනු ලබන රත්‍රන් මඟින් එහි නිරාවරණයට සහය වේ. නියාමක විසින් පනවනු ලබන පැවරුම් අවදානම් බර තුළින් පහසු මට්ටමක LTV අනුපාතයක් පවත්වා ගැනීම මඟින් උකස් ණයට ආවේනික අවදානම කළමනාකණය කර අවම කිරීම සඳහා බැංකුව ක්‍රියාමාර්ග ගෙන ඇත. ඊට අමතරව, තරඟකරුවන්ගේ නිෂ්පාදන ලක්ෂණ සමඟ ALCO විසින් රත්‍රන්වල වෙළෙඳපොල මිලගණන් කලින් කල තක්සේරු කර විශ්ලේෂණය සහ නියාමනය කරනු ලබයි. රත්‍රන්වල නිරවද්‍යතාව ඇගයීම සඳහා බැංකුවල උකස් මධ්‍යස්ථාන තුළ ඉතා නවීන උපකරණ බැංකුව සතු වේ. බැංකුවේ උකස් කටයුතු මෙහෙයවන කාර්ය මණ්ඩලය මනාව පළපුරුදු සහ ප්‍රවීනත්වය ඇති අය වුවත්, උකස් කටයුතු සහ ඒ මත සංකේන්ද්‍රණය වන අවදානම් ක්ෂේත්‍රවලට අදාළ නව තක්ෂණය පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත් කිරීමට එකී සේවකයින් වෙත කලින් කල පුහුණුව ලබා දේ. උකස් කළඹ සඳහා රක්ෂණ ආවරණය ක්‍රියාත්මකව පවතී. වෙළෙඳපොල රත්‍රන් වටිනාකම සමඟ හානිකරණ වෙන්කිරීම් සිදුකරන අතර පැහැර හැරී අත්තිකාරම් අයකර ගැනීමට විධිමත් වෙන්දේසි පවත්වනු ලබයි. තවද, බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය බර පහසු කිරීමට මාසික පදනමක් මත ආපසු ගෙවීමට පහසුකම් සලසා ඇති අතර මෙය අපගේ ස්වයං බැංකුකරණ ඒකක හරහා ද සිදුකළ හැකිය. මෙම සියලුම ක්‍රියාමාර්ග උකස් කටයුතු සමඟ බැඳුණු එහි වෙළෙඳ ද්‍රව්‍ය අවදානම විචක්ෂණව කළමනාකරණය කර අවම කිරීමට බැංකුව ශක්තිමත් කරයි.

2022 වසර තුල, රත්‍රන්වල වෙළෙඳපොල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර LTV තවදුරටත් පහත වැටුණි. නමුත් වෙළෙඳපොලේ මෙන්ම බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය සහ රත්‍රන් මිල මත හුවමාරු අනුපාතයේ බලපෑම සලකා බැලීමේදී, වෙළෙඳ ද්‍රව්‍ය අවදානම කළමනාකරණය කිරීමට වෙළෙඳපොලට සාපේක්ෂව අඩු උකස්කර අත්තිකාරම් ප්‍රමාණයක් බැංකුව පවත්වා ගනී.

2022 දී රත්‍රන් මිල වෙනස්වීම



ද්‍රවශීලතා අවදානම

පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව බැංකුවට එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ඇති නොහැකියාව හේතු කොට ගෙන ද්‍රවශීලතා අවදානම ඇතිවේ. සුරැකුම්පතක් හෝ දැඩි වත්කමක් මුදල් බවට පරිවර්තනය කරන විට ප්‍රාග්ධනය සහ/හෝ ආදායමේ අලාභයක් හේතු කොට ගෙන මෙය සාමාන්‍යයෙන් සිදුවේ.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණයේ පරමාර්ථ

ගෙවීමට සිදුවන අවස්ථාවේදි එය සපුරාලීමට, ද්‍රවශීලතා පීඩනයන්ට ඔරොත්තුදීම සහ ද්‍රවශීල සහ අරමුදල් අවදානම් එහි අවදානම් රුචිය තුල කළමනාකරණය කර ගැනීමට බැංකුව ශක්තිමත් කිරීම.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

නියමිත අවස්ථාවට බැංකුවට එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාව පවත්වා ගනු ලබන බව සහතික කිරීමට මනාව සකස්කළ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ වැඩරාමුවක් බැංකුව ක්‍රියාවට නංවා ඇත. ALCO ද්‍රවශීලතා අවදානම් පාලනය කර කළමනාකරණය කරමින් සහ බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අබණ්ඩව නියාමනය කරමින් අභ්‍යන්තර ද්‍රවශීල ඉලක්ක සහ නියාමන ද්‍රවශීල අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීම කරයි. නියමිත අවදානම් සීමා තුළ බැංකුවේ අරමුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන්ගේ දෛනික කළමනාකරණය සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී භාණ්ඩාගාර, ආයෝජන බැංකුකරණ, මූල්‍ය ආයතන වගකීමට බැඳි සිටී. භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය විසින් ස්වාධිනව බැංකුවේ ද්‍රවශීලකා මට්ටම් අබණ්ඩව නියමනය කර යම් කඩවිම් වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය, BIRMC සහ ALCO විසින් ප්‍රධාන ද්‍රවශීලතා දර්ශක නිශ්චිත පරාමිති තුළ පවතින බව සහතික කිරීමට ඒවායේ කාර්යසාධනය විධිමත්ව සමාලෝචනය කරයි.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණ රාමුව

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංග පහතින් දැක්වේ:

1. ද්‍රවශීලතාව මැනීම

ද්විත්ව ප්‍රවාහ ප්‍රවේශය සහ කොටස් ප්‍රවේශය යන දෙක ද්‍රවශීලතාව මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනී. ද්විත්ව ප්‍රවාහ ප්‍රවේශය වත්කම් සහ වගකීම්වල කල්පිරීම මත පදනම් වී විවිධ කාල සීමාවන් හී මුදල් ගලාඒම සහ ගලායාම්වල නොගැලපිම් විශ්ලේෂණය කරයි. කොටස් ප්‍රවේශය ප්‍රධාන අනුපාත භාවිතා කරමින් ද්‍රවශීලතාව මැනීම සිදුකරයි. මෙම අනුපාතවලට තැන්පතුවලට ණය අනුපාතය, බැඳීම් අනුපාතය (අයිරාවල භාවිතා නොකළ කොටස/භාවිතා නොකළ අන්තර් බැංකු මාර්ග), ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත සහ සම්චිවිත නොගැලපිම් ඇතුළත්ය.

2. විවිධාංගීකරණය කළ අරමුදල් පදනම

බැංකුව වෙළෙඳපොල කොන්දේසි, නියාමන ප්‍රතිෂ්ඨාවන්, සහ පොළී අනුපාත චලනයන්ගේ ප්‍රවණතාවන් මත රැඳෙමින් විවිධ මූලාශ්‍රයන්ගෙන් ද්‍රවශීලතා ලබාගනී. බැංකුවේ මුළු අරමුදල් පදනමෙන් 78.2%ක් සඳහා දායක වෙමින් තැන්පතු විශාලතම අරමුදල් මූලාශය වන අතර ඉන්පසුව අනෙකුත් ණයගැහීම් (9.1%) සහ කොටස්හිමියන්ගේ අරමුදල් (5.1%) පවතී. බැංකුවට සාපේක්ෂව ඉතුරුම්වල ඉහළ කොටසක් ඇති අතර, එය අර්ධ – ස්ථාවර මූලාශ්‍රයක් ලෙස සලකනු ලබයි.

3. සම්භාව්‍ය අරමුදල් සැලැස්ම

පිඩන කොන්දේසි තුළ ද්‍රවශීල අවශ්‍යතාවන් කළමණාකරණය කෙරෙහි මඟපෙන්වීම් ලබා දීම සඳහා බැංකුවට විස්තීර්ණ සම්භාව්‍යතා අරමුදල් සැලැස්ම (CFP) ක් ඇත. මේ තුළින් කොටස්හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීම සහ ද්‍රවශීල අර්බුද අවස්ථාවකදි වෙළෙඳපොල විශ්වාසය පවත්වා ගැනීම සහතික කරයි. CFP විසින් සක්‍රියකරණය සඳහා විශේෂ පූර්ණ ස්ථාන පැහැදිලි කරන අතර පහත සඳහන් ක්‍රියාදාම තුළ සක්‍රීය කරනු ලැබේ.

- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය මාසයක් තුළ 20%ට පහළ වැටීම.
- අන්තර් බැංකු ඇමතුම් මුදල් අනුපාත අබණ්ඩව හත්වැනි දිනට 25% කින් වැඩිවීම.
- අදියර 3 ණය අනුපාතය 50%ට වඩා වැඩිවීම.
- අපේක්ෂිත තැන්පතු ඉවත්කර ගැනීම් විශාලවීම.
- තැන්පතු අනුපාතයට ඒකාබද්ධ ණය දින 15ක කාලයක් 105% ඉක්මවීම.
- වෙළෙඳපොල සහභාගිවන්නන් විසින් ඉවත්කර ගන්නා ඒක්ෂණ පහසුකම් හෝ බැංකුවේ ණය ගැනීම් සඳහා වෙළෙඳපොල අනුපාතයට වැඩි වාරිකයක් පැනවීම.
- ණය ශ්‍රේණිගතකරණය මට්ටම් දෙකකට වඩා වැඩිපුර පහත වැටීම.

ප්‍රධාන දර්ශක	2022 දෙසැම්බර් 31 දිනට තත්ත්වය (%)
තැන්පතුවලට ණය අනුපාතය	
රුපියල්	74.64
විදේශීය ව්‍යවහාර	123.36
බැඳීම් අනුපාතය	
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය	
දේශීය බැංකු ඒකක	21.37
අක්වෙරළ බැංකු ඒකකය	20.05

	දේශීය බැංකු ඒකකය				අක්වෙරළ බැංකු ඒකකය (අ.ඩො. '000)			
	2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	සුළු	මධ්‍යම	ප්‍රධාන	2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	සුළු	මධ්‍යම	ප්‍රධාන
කම්පනයේ විශාලත්වය		5	10	15		5	10	15
ද්‍රවශීල වත්කම්	540,471				70,182			
මුළු වගකීම්	2,529,374				349,997			
සිදුවීම I – මුළු වගකීම්වල වැඩිවීම								
වගකීම්වල වැඩිවීම		126,469	252,937	379,406		17,499.85	35,000	52,500
සංශෝධිත මුළු වගකීම්		2,655,843	2,782,311	2,908,780		367,497	384,997	402,497
සංශෝධිත ද්‍රවශීල වත්කම්		540,471	540,471	540,471		70,182	70,182	70,182
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය (%)	21.37	20.35	19.43	18.58	20.05	19.10	18.23	17.44
සිදුවීම II – වගකීම් එසේම තිබියදී ද්‍රවශීල වතකම්වල පහළයාම සහ වෙනත් වත්කම් ඉහළ යාම.								
ද්‍රවශීල වත්කම්වල පහළයාම		27,024	54,047	81,071		3,509	7,018	10,527
සංශෝධිත මුළු වගකීම්		2,529,374	2,529,374	2,529,374		349,997	349,997	349,997
සංශෝධිත ද්‍රවශීල වත්කම්		513,447	486,424	459,400		66,673	63,164	59,655
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය	21.37	20.30	19.23	18.16	20.05	19.05	18.05	17.04
සිදුවීම III – සමාන ප්‍රමාණයෙන් මුළු වගකීම් සහ ද්‍රවශීල වත්කම් පහළ යාම								
වත්කම්වල පහළයාම		126,469	252,937	379,406		17,500	35,000	52,500
සංශෝධිත මුළු වගකීම් (රු.බි.)		2,402,905	2,276,437	2,149,968		332,497	314,997	297,497
සංශෝධිත ද්‍රවශීල වත්කම්(රු.බි.)		414,002	287,534	161,065		52,682	35,182	17,682
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය	21.37	17.23	12.63	7.49	20.05	15.84	11.17	5.94

ද්‍රවශීල අවදානම් සමාලෝචනය

ද්‍රවශීලතා අවදානම යනු ගෙවීම් බැඳීම් ගෙවියයුතු බවට පත්වන අවස්ථාවේදී ගෙවීමට නොහැකියාවෙන් හෝ තිරසාර පිරිවැයකට එසේ කිරීමට නොහැකිවීමෙන් ඇතිවන දැරීමේ අලාභ පිළිබඳ අවදානමයි. නියාමන මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව බැංකුව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. බැංකුවේ ද්‍රවශීලතා සහ අරමුදල් රාමුවේ පරමාර්ථය වන්නේ නියමිත වේලාවට සහ වෙළෙඳපල ප්‍රවේශය ලාභදායීව පවතින විට අරමුදල් කැපවීම් සහ තැන්පතු ආපසු ගැනීම් සපුරාලිය හැකි බව සහතික කිරීමයි. වත්කම් සහ වගකීම්වල ගිවිසුම්ගත සහ චර්යාත්මක කල්පිරීම, ප්‍රධාන ද්‍රවශීලතා අනුපාත, මාසික ද්‍රවශීලතා පුරෝකථන සහ පරතර වත්කම් සහ වගකීම් කමිටු (ALCO) රැස්වීම්වලදී සමාලෝචනය කෙරේ.

2022 දී බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත නියාමන අවම මට්ටම්වලට වඩා ඉහළින් පවත්වා ගෙන ගොස් ඇත. තවද, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය ද අවශ්‍ය මට්ටමට ඉහළින් පවත්වා ගනි. සියලුම මුදල් සහ දේශීය මුදල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය වසර පුරාම අවශ්‍ය අනුපාතවලට ඉහළින් පැවතුණි.

ද්‍රවශීලතා අවදානම් නිරාවරණය, දෛනික ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතා අතිරික්තයක් සහ සංචිත පවතින බව සහතික කිරීම සඳහා සහ හදිසි ද්‍රවශීලතා කම්පනය සමඟ කටයුතු කිරීම සඳහා සීමාවන් සහ ප්‍රේරක සමඟ භාණ්ඩාගාරය විසින් කළමනාකරණය කරනු ලැබේ. භාණ්ඩාගාරය විසින් බැංකුවේ සමස්ත ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව දෛනික පදනමක් මත කළමනාකරණයට වාර්තා කරයි. බැංකුව යහපත් ද්‍රවශීලතා අවදානම් කළමනාකාරණ උපායමාර්ග තුළින් වත්කම් සහ වගකීම් ගොගැලපීම් කළමනාකරණය කිරීමට සක්‍රීය ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අභ්‍යන්තර ක්‍රියාවලි, සේවකයින් සහ පද්ධති ප්‍රමාණවත් නොවීම හෝ අසාර්ථකවීම තුළින් ඇතිවන හෝ ස්වභාවික ආපදා, සමාජ සිදුවීම් හෝ දේශපාලන සිදුවීම් වැනි බාහිර සිදුවීම් තුළින් ඇතිවන සෘජු හෝ වක්‍ර අලාභයයි. බාසල් II නිර්වචනයට අනුව, මෙහෙයුම් අවදානමට උපායමාර්ගික සහ කීර්තිනාම අවදානම හැර නෛතික අවදානම ඇතුළත්ය. ව්‍යාපාර කටයුතු, නිෂ්පාදන සහන ක්‍රියාවලිවල ස්වභාවික චර්යාව තුළ මෙහෙයුම් අවදානම් පවතී. තාක්ෂණික අවදානම, සේවක අවදානම සහ නෛතික අවදානම වැනි මෙහෙයුම් අවදානම්වලට බැංකුව නිරාවරණය වේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ පරමාර්ථ


- මෙහෙයුම් දුර්වලතාවයන් හේතුකොටගෙන ඇතිවන අලාභ අවම කිරීම මගින් සිදුවියහැකි විශාල අවදානම් අලාභ වැලැක්වීම.
- විවිධ අංශ සහ ව්‍යාපාර ඒකකවල මෙහෙයුම් අවදානම පිළිබඳ පොදු අවබෝධයක් සංවර්ධනය කරමින් බැංකුව තුළ අවදානම් පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- අභ්‍යන්තර හැකියා ගොඩ නගා ඉහළ නංවමින් වැදගත් සහ විපත්තිකාර අවදානම්වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම.
- අභ්‍යන්තර මූලාශ්‍ර මනාව කළමනාකරණය සහ බැංකුවේ මෙහෙයුම් ඵලදායී ආකාරයෙන් පාලනය කිරීම තුළින් පිරිවැය ඉතුරුම් ලබාගැනීම.

මෙහෙයුම් අවදානම කළමනාකරණය

බාසල් II යෝජනාව පරිදි, මෙහෙයුම් අවදානම් පුළුල් ක්ෂේත්‍ර හතකට වර්ගීකරණය කරනු ලැබ ඇත. බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මගින් මෙහෙයුම් අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමට අදාල ප්‍රතිපත්ති, ව්‍යුහ සහ ක්‍රියාවලි පැහැදිලිව දක්වයි. ප්‍රතිපත්ති සකස් කිරීමට සහ බැංකුව තුළ ශක්තිමත් අවදානම කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීමට ඒකාබද්ධ අවදානම් කලමණාකරණ කමිටුව (BIRMC) විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දේ. මෙහෙයුම් අවදානම් ජනනය වන ස්ථානයේදී හඳුණාගැනීම සඳහා වන පළමු ආරක්ෂක පෙල ලෙස ශාඛා ජාලය සහ ව්‍යාපාර ඒකක ක්‍රියාත්මක වේ.

ඔවුන් විසින් මෙහෙයුම් අලාභ සිදුවීම් අවදානම් කළමනාකරණ අංශයට වාර්තා කරන අතර එම අංශය ඒ සඳහා දත්ත ගබඩාවක් පවත්වා ගනී. බැංකුව තුළ මෙහෙයුම් අවදානම් මැනීමට, තක්සේරු කිරීමට සහ වාර්තා කිරීමට ව්‍යුහගත යාන්ත්‍රණයක් බැංකුව තුළ ස්ථාපිත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය වෙත සහතික කිරීමක් සඳහා ජාලය පුරා සමස්ථ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අභ්‍යන්තර විගණනය ඔස්සේ කලින් කල සමාලෝචනය කරයි.

මෙහෙයුම් අවදානම්වල පාලන ව්‍යූහය



..... සෘජු වාර්තාකරණ මාර්ග
— ව්‍යුහගත වාර්තාකරණ මාර්ග

මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම සහ ඇගයීම

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපාර ඒකක සමඟ මෙහෙයුම් අවදානම් සිදුවිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කරයි. සියලුම කාර්ය මණ්ඩලය මෙහෙයුම් අවදානම් නිරාවරණය පිළිබඳ පුහුණු කරන අතර මෙම අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා සක්‍රීයව නිරත කරයි.

නිශ්චිත මෙහෙයුම් අවදානම් පරාමිතිවලට අනුව නිරාවරණ ඇගයීම සඳහා ප්‍රධාන ව්‍යාපාර ඒකක විසින් අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) සිදුකරනු ලබයි. ව්‍යාපාර ඒකක විසින් වාර්තා කරන අලාභ සිදුවීම් සහ ආසන්න අලාභවලට අමතරව, (RCSA) හි ප්‍රධාන සොයාගැනීම් මගින් අවදානම් කළමනාකරණය තුළ වියහැකි පරතර හඳුනාගෙන ඒ සඳහා කාර්යය සැලසුම්වලට මාර්ගයක් සොයා ගනී. නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ කටයුතු මත මෙහෙයුම් අවදානම් අඛණ්ඩව පදනමක් මත ඇගයීම් සිදු කෙරේ.

සීමා සහ ඉවසුම් මට්ටම්

බැංකුවේ අවදානම් රුචි ප්‍රකාශනය තුළ මෙහෙයුම් අවදානම් දර්ශක සඳහා විශේෂ සීමා සහ ඉවසුම් මට්ටම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇත. මෙයට මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් අලාභවල මුළු වටිනාකම, අභ්‍යන්තර සහ බාහිර අලාභ සිදුවීම් සංඛ්‍යාව සහ විගණන ප්‍රමිති සාමාන්‍යයට වඩා අඩුවෙන් ශ්‍රේණිගතකළ ශාඛා ප්‍රතිශතය ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදුකරනු ලබන විධිමත් වාර්තාකරණය, අවශ්‍ය අවස්ථාවේදි නිවැරදි ක්‍රියාමාර්ග සහතික කරයි.

මෙහෙයුම් අවදානම අවම කිරීම


බැංකුව තුළ යහපත් මෙහෙයුම් පරිසරයක් පවත්වා ගැනීම සඳහා අවදානම් අවම කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙයට පහත දෑ ඇතුළත් වේ:

- මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තීර්ණ රාමුවක් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීමට අර්බුද කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ ආපදා පිළියම් සැලසුම්.
- රාජකාරී බෙදීම.
- මෙහෙයුම් අලාභ රක්ෂණය තුළින් තෙවැනි පාර්ශ්වයකට මාරු කිරීම.
- බාහිර හවුල්කරුවන් තෝරාගැනීම සහ නියාමනය සඳහා දැඩි නිර්ණායක යොදා ගැනීම.
- සේවක මණ්ඩලයට අඛණ්ඩව පුහුණුව ලබාදීම මගින් අවදානම පිලිබඳ දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- නව නිෂ්පාදන සහ සේවා දියත් කිරීමට පෙර, මෙහෙයුම් අවදානමේ වියහැකි බලපෑම් පිළිබඳ විශ්ලේෂණයක් පැවැත්වීම.


අවදානම වාර්තාකරණය

අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් අවදානම් සිදුවීම්, අලාභ සහ ආසන්න අලාභ පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වා ගනිමින් අවදානමේ හේතුව, ප්‍රවණතා සහ වාරගණන ක්‍රමානුකූලව හඳුනා ගැනීමට පහසුව ඇති කරයි. සැලකියයුතු අලාභ සිදුවීම්, මතුවන ගැටළු, අවදානම් පාලනය, අවදානම් නියාමනය සහ සමාලෝචනය පිළිබඳ තොරතුරු කාර්තුමය වාර්තා තුළින් වාර්තා කරනු ලබයි. මෙම තොරතුරු අවදානම් කමිටු වාර්තාවන්ට ඇතුලත් කරන අතර එය BIRMC සහ/හෝ ORMC වෙත ඉදිරිපත් කෙරේ. අවදානමේ වියහැකි බලපෑම සහ වාරගණන මත පදනම් ව, පාලන දුර්වලතා මෙහෙයුම් අවදානම් කමිටුව වෙත වාර්තා කරනු ලබයි.

මෙහෙයුම් අලාභ




සිදුවීම් අනුව මෙහෙයුම් අලාභ (සංඛ්‍යාව) – 2022



- අභ්‍යන්තර වංචා – 1.08%
- බාහිර වංචා – 57.14%
- සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය – 0.00%
- සේවා රැකියා නියුක්ති පරිචය සහ සේවා ස්ථාන ආරක්ෂාව – 0.00%
- භෞතික වත්කම්වලට අලාභ – 1.62%
- ව්‍යාපාර බාධාවන් සහ පද්ධති ඇණහිටීම් – 0.00%
- ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම හා ක්‍රියාවලි කළමනාකරණය – 40.16%

සිදුවීම් අනුව මෙහෙයුම් අලාභ වටිනාකම – 2022



- අභ්‍යන්තර වංචා – 26.14%
- බාහිර වංචා – 20.79%
- සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය – 0.00%
- සේවා නියුක්ති පරිචය සහ සේවා ස්ථාන ආරක්ෂාව – 0.00%
- භෞතික වත්කම්වලට අලාභ – 0.71%
- ව්‍යාපාර බාධාවන් සහ පද්ධති ඇණහිටීම්- 0.00%
- ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම හා ක්‍රියාවලි කළමනාකරණය – 52.36%

අලාභ සිදුවීම	2022				2021			
	සංඛ්‍යාව	මුළු ගණනින් ප්‍රතිශතය	වටිනාකම රු.මි.	මුළු වටිනාකමින් ප්‍රතිශතය	සංඛ්‍යාව	මුළු ගණනින් ප්‍රතිශතය	වටිනාකම රු.මි.	මුළු වටිනාකමින් ප්‍රතිශතය
අභ්‍යන්තර වංචා	4	1.08	41.59	26.14	4	1.84	52.64	23.48
බාහිර වංචා	212	57.14	33.07	20.79	100	46.08	121.07	54.00
සේවා නියුක්ති පරිචය සහ සේවා ස්ථාන ආරක්ෂාව	0	0.00	0	0.00	0	0.00	0	0.00
සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය	0	0.00	0	0.00	0	0.00	0	0.00
භෞතික වත්කම්වලට අලාභ	6	1.62	1.13	0.71	6	2.76	0.37	0.17
ව්‍යාපාර බාධාවන් සහ පද්ධති ඇණහිටීම්	0	0.00	0	0.00	4	1.84	0.35	0.16
ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය	149	40.16	83.31	52.36	103	47.47	49.79	22.21
එකතුව	371	100.00	159.1	100.00	217	100.00	224.22	100.00

මෙහෙයුම් අවදානම සමාලෝචනය

සිදුවීම් සහ වටිනාකම හා වාර ගණන යන දෙවර්ගය අනුව බාසල් II අලාභ සිදුවීම් වර්ගය යටතේ පසුගිය වසර දෙක තුළ මෙහෙයුම් අලාභවල සැසැඳීමක් ඉහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

2022 වසර සඳහා වාර්තාකළ මුළු අලාභ ප්‍රමාණය රු.මි. 159.1කි. 2022 වසර සඳහා ඉහල අලාභ මූලාශ්‍රයන් (වටිනාකම අනුව) බාහිර වංචා, අභ්‍යන්තර වංචා සහ ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය වූ අතර එයට පහත දෑ ඇතුළත්ය.

- මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ශාඛා හතරක GLs හි රුපියල් මිලියන 38.1ක Backlog අතපසු වූ ශේෂයන් කිවැරදි කිරීම.
- පසුගිය වසර කිහිපයකට අදාලව පැවති රුපියල් මිලියන 36.8ක දිගුකාලීන හිඟය 2022 වර්ෂය තුළ මෙහෙයුම් අලාභ වෙත මාරු කිරීම.
- පසුගිය වසරේ ණය ආශ්‍රිත කටයුතුවලින් පැනනැගුණු මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 0.8කි.

ඉහත දෑ හැරුණු විට, වසර සඳහා වාර්තාකළ මුළු මෙහෙයුම් අලාභය රු. මිලියන් 83.4කි.

තාක්ෂණික අවදානම

තාක්ෂණික අවදානම යනු රහස්‍යතාව, අවංකකම පිළිබඳ කඩකිරීම් හෝ තොරතුරුවල තත්ත්වය අහිමිවීම හේතු කොට ගෙන ඇතිවන මූල්‍ය අලාභ, නියාමන සම්බාධක හෝ කීර්තිනාම අලාභයන්ය. මෙහෙයුම් කාර්යක්ෂමතාව, වේගය, පිරිවැය ඉතුරුම් සහ නිරවද්‍යතාව අත්කර ගැනීමට තාක්ෂණය ප්‍රධාන තරඟකාරී වාසියකි. ඩිජිටල්කරණය තුළ නායකයා ලෙස, බැංකුව තොරතුරු තාක්ෂණය මත ඉහළින් රඳා පවත්නා බැවින් බැංකුව තාක්ෂණික අවදානමට නෛසර්ගිකව නිරාවරණය වේ. තොරතුරුවලට කාවැදීම සහ සොරකම් කිරීම වැනි සයිබර් අවදානම, පද්ධති බිඳවැටීම් සහ දෝෂ, තාක්ෂණය යල්පැනීම, සහ ව්‍යාපාර පරිමාවන්ට සහයවීම සඳහා ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් ඇතුළුව තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත අවදානම් රාශියකට බැංකුව නිරාවරණය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ (IT) කමිටුව, තොරතුරු ආරක්ෂණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් කමිටුව බැංකුවේ තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව පාලනය කරනු ලබයි. මෙම කමිටු තොරතුරු ආරක්ෂණ උපායමාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිර්දේශ කරයි. එමෙන්ම එම කමිටුව බැංකුව තුළ පද්ධති ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව සහ නව සහ උසස් තොරතුරු පද්ධති භාවිතය තක්සේරු කරයි.

බැංකුව තුළ තොරතුරු පද්ධතිවල ශක්තිමත්භාවය සුරක්ෂිත කිරීම සඳහා, තොරතුරු ආරක්ෂණ දෙපාර්තමේන්තුව සහ IT දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඔඹ අවදානම් දර්ශක විධිමත්ම නියාමනය කරනු ලබයි. අනුරූප අවදානම් සීමා සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා කළමනාකරණ අවධානය යොමු කිරීමට නිශ්චය කර ඇත.

බැංකුවේ තොරතුරු තාක්ෂණ (IT) අවදානම් දර්ශක

වර්ගය	පද්ධති	සත්‍ය ලබා ගැනීමේ හැකියාව	මුළු වැඩකරන කාලය සහ සීමාවන්ගේ ප්‍රතිශතයක් ලෙස ලබාගැනීමේ හැකියාව	
ඉතා වැදගත්	– මධ්‍යම ATM ස්විචය – NOVUS ස්විචය – මධ්‍ය බැංකුකරණ පද්ධතිය/ SIBS අතුරුමුහුණත – SWIFT – ණය/හරපත් කළමනාකරණ පද්ධතිය SLIPS	99.9%	>99.9% 97.5%-99.9% <97.5%	කොළ – අඩු අවදානම කහ – මධ්‍ය අවදානම රතු – ඉහළ අවදානම
මධ්‍යස්ථව වැදගත්	– ප්‍රතිරූප ග්‍රහනය සහ ඉදිරිපත් කිරීමේ ක්‍රමය – වෙබ් ප්‍රේෂණ ක්‍රමය – පිනකල් භාණ්ඩාගාරය – ATM ((තනි පුද්ගල) – PRIME 4 – CIB/CMB/ORA – RIB/RMB – එක්ස්ප්‍රස් බැන්කින් – RLOS	99.2%	>97.5% 95%-97.5% <95%	කොළ – අඩු අවදානම කහ – මධ්‍ය අවදානම රතු – ඉහළ අවදානම
අඩු වැදගත්	– IHRM පද්ධතිය – පීපල්ස් බැංකුවේ වෙබ් අඩවිය	100% >	90% 87%-90% <87%	කොළ – අඩු අවදානම කහ – මධ්‍ය අවදානම රතු – ඉහළ අවදානම

තාක්ෂණික අවදානම් අඛණ්ඩව අවම කිරීම සඳහා බැංකුවේ දැක්ම අනුව යමින් බැංකුව තුළ විස්තීර්ණ තොරතුරු තාක්ෂණ ආරක්ෂක උපායමාර්ගයක් ස්ථාපිත කෙරේ. තොරතුරු තාක්ෂණ ආරක්ෂක උපායමාර්ගය ඇතිවන තර්ජන වාතාවරණය අවම කිරීමට ආයතනික කළමනාකරණය සහ නවීන තාක්ෂණය සමඟ ශක්තිමත් කරනු ලබයි. පාදක මායිම් ආරක්ෂක ප්‍රමිතිවලට අමතරව CIS සහ NISI පාලනයන්ට අනුකූලව පාලනයන් තෝරා ගැනේ. තොරතුරු ආරක්ෂක අවදානම අවම කිරීම පහත පරිදි වේ:

තොරතුරු තාක්ෂණ (IT) අවදානම අවම කිරීම

- ඉහළින් ආරක්ෂිත සහතිකලත් දත්ත මධ්‍යස්ථානවල සියලුම වැදගත් සජීවී සහ ආපදා පිළියම් සර්වර් තැබීම.
- විධිමත් කාලාන්තර තුළ සියලුම වැදගත් පද්ධති සඳහා ආපදා පිළියම් පරීක්ෂණ පැවැත්වීම.
- ප්‍රමිතිකරණය පිළිබඳ ජාත්‍යන්තර ආයතනයෙන් තොරතුරු ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සඳහා ලොව ඉහළම පිළිගැනීම වන ISO /IEC 27001:2013 සහතිකයට (2022 සිට 2023 දක්වා 27001ට අනුකූල වනු ලැබේ) අනුකූලව සමස්ථ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලි පවත්වා ගැනිම.
- දත්ත අහිමිවීමේ අවදානම වැලැක්වීමට මනාව ස්ථාපිත තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහයක් පවත්වා ගැනීම.
- Server කාමර සහ UPS කාමරවල ගිනි ආරක්ෂණය සහ දුම් සේවීමේ උපකරණ ස්ථාපනය.
- අඛණ්ඩ මෙහෙයුම් සඳහා ආපදා පිළියම් සැලැස්ම.
- ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියා පත්කිරීම සහ ගෝලීය මනා පරිචයන්ට අනුව බැංකුවට මධ්‍යගත උපායමාර්ගික දිශානතිය ලබාදීම.

තොරතුරු තාක්ෂණ (IT) සමාලෝචනය

- සියලුම තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්‍රියාවලි සඳහා චර්යානුගත සහ චර්යානුගත නොවන අවදානම් තක්සේරුකිරීම් පැවැත්වීම සහ එය තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් කමිටුව තුළින් පසුවිපරම් කිරීම.
- බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි පිළිබඳ කලින් කල සමාලෝචනය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- වැදගත් පද්ධති සහ වැදගත් යටිතලපහසුකම් සඳහා පිවිසුම් මාර්ග සමාලෝචනය
- වැදගත් පද්ධතිවල පරිශීලක පිවිසුම් හිමිකම් සමාලෝචනය
- අභ්‍යන්තර හෝ බාහිරව දියුණු කළ සියලු වැදගත් පද්ධති සඳහා කේත සමාලෝචන පැවැත්වීම.
- වෙබ් පදනම් යෙදුම් ඇතුළුව සියලුම පද්ධති සඳහා අභ්‍යන්තර/බාහිර අවදානමට ලක්වීමේ තක්සේරු පැවැත්වීම සහ කාලීන ආකාරයෙන් ගැටළු නිවැරදි කිරීම.

සේවක අවදානම

සේවක අවදානම යනු අක්‍රමික සේවක කටයුතු, ප්‍රමාණවත් නොවන මානව සම්පත්, සහ සේවකයින්ට අදාළ රෙගුලාසිවලට බැංකුව අනුකූල නොවීම හේතු කොට ගෙන ඇතිවන අලාභයන්ය.

මානව සම්පත් හා අදාළ අවදානම් කළමනාකරණය කිරීම, බැංකුව තුළ සේවක පරිචයන්හි සමරූපිබව සහතික කිරීම, සහ සේවක ප්‍රතිපත්ති, ඵලදායි බඳවාගැනීමේ පරිචයන් යොදා ගැනීමට සහ සේවක වටිනාකම් කොටස වැඩි කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම සඳහා බැංකුව විස්තරාත්මක මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කර ඇත. පුහුණු දක්ෂ කාර්ය මණ්ඩලයේ සේවය හැර යාම, නිපුණතාවය සහ ඵලදායිතාව පිරිහීමට හේතු වන අතර එය බැංකුවේ තරඟකාරීත්වය කෙරෙහි අහිතකර ලෙස බලපානු ලබයි. සුදුසුකම් සහිත, දක්ෂ පුද්ගලයින් බඳවාගැනීම සහ අගනා ප්‍රතිඵල ලබාදෙන සේවා පරිසරයක් තුළින් ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයින් රඳවා ගැනීම අභියෝගයකි.

සේවක අවදානම සමාලෝචනය

සේවකයින් අනෙතුත් වත්කම්වල සමස්ථ කාර්යසාධනය තුළ ප්‍රධාන කේන්ද්‍රය වන බැවින් ඕනෑම ව්‍යාපාරයක් තුළ සේවකයින් වඩාත් වැදගත් වත්කම වේ. එබැවින් සේවක අවදානම් පිළිබඳ පූර්ව අපේක්ෂාවන් සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තිරසාර ව්‍යාපාරය ආදර්ශය තුළ බැංකුවේ සාර්ථකත්වය සඳහා ඉහළ වැදගත්කමක් ගනී. බැංකුවට අඛණ්ඩ පදනමක් මත මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ඇති අතර, ඒ තුළින් කාර්ය මණ්ඩලය අවශ්‍ය දැනුම සහ නිපුණතා සමඟ යාවත් කර තබා ගන්නා අතර, එය ගනුදෙනුකරුවන්ට ලබාදෙන වටිනාකර වැඩි කිරීමට කාර්ය මණ්ඩලයට සහය වන අතරම දැනුම, නිෂ්පාදන ප්‍රවර්ධන උපාය මාර්ග නොමැතිකම හේතුවෙන් ව්‍යාපාරයට ඇතිවන අවදානම් අවම කරයි. ඒ තුළින් ගනුදෙනුකරුවන් හරහා කීර්තිනාමය හා සන්නාම ප්‍රතිරූපය වැඩි කරයි. තවද, වැඩ කිරීමේ බාධා අඩුකිරීම, මූල්‍ය දුෂ්කරතාවලින් සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂාකිරීම, සේවක පිරිවැටුම අවම කිරීම සහ වසංගතය තුළ සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් පවත්වා ගැනීම සේවක අවදානම කළමනාකරණය තුළ ඉහළ වැදගත්කමක් ලෙස සලකනු ලබයි.

නෛතික අවදානම

නෛතික අවදානම යනු අදාළ රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් දරනු ලබන දඩමුදල්, දණ්ඩන, කීර්තිනාමය අහිමිවීම වැනි අවදානම් සහ ගිවිසුම් හෝ ලේඛණ ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙන ඉපයිම්වලට ඇතිවන අලාභයන්ය.

නෛතික අවදානම බැංකුවේ නීති දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරන අතර, සේවාදායකයින් සමඟ ගිවිසුම්වලට ඇතුළත් විමේදි විධිමත් අභ්‍යන්තර ක්‍රියාපටිපාටි අනුගමනය කෙරේ. සියලුම නෛතික බැඳුම් ගිවිසුම් බැංකුවේ අනුකූලතා සහ නීති අංශය විසින් නියමිත පරිදි අත්සන් කර ඇති බව සහතික කිරීම සඳහා ව්‍යාපාර ඒකක වගකීමට බැඳී සිටී.

කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු ඉපයිම්, වත්කම් සහ වගකීම් සහ සන්නාම වටිනාකම කෙරෙහි අහිතකර ලෙස බලාපන සිදුවීමකින් හෝ අවස්ථාවකින් ඇතිවන වක්‍ර අලාභයයි. ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම වැනි අනෙකුත් අවදානම් මගින් ද කීර්තිනාම අවදානම ඇති කරයි.

මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස දශක හයකට අධික කාලයක් පුරා නොකැලැල් කීර්තිනාමයක් පවත්වා ගෙන ඇති බැවින් බැංකුවේ කීර්තිනාමය කෙරෙහි ඍණාත්මක බලපෑම අවම වේ. ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය යහපත් කීර්තිනාමයක් සඳහා ප දනම සකස් කරන අතර, ඉන් බැංකුවේ අවංකත්වය සහ වගවීම, සේවකයින්ගේ නිපුණත්වය, සහ උසස් නිෂ්පාදන ගුණාත්මකභාවය පිළිබිඹු කරයි.

පුර්ව අනතුරු හැගවීම් දර්ශක තුළින් බැංකුව කීර්තිනාම අවදානම නියාමනය කරයි. ගනුදෙනුකාර පැමිණිලි නිරාකරණ ඒකකය මගින් කාර්යක්ෂමව සහ ඵලදායීව ගනුදෙනුකරුවන්ගේ සියලුම පැමිණිලි ආමන්ත්‍රණය කරයි. සමාජ මාධ්‍ය හේතු කොට ගෙන කීර්තිනාම අවදානමේ විෂය ක්ෂේත්‍රය පුළුල් වී ඇති අතර, ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පැමිණිලි ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මේවාට බැංකුවේ වෙබ් අඩවිය, මුහුණු පොත, ඇමතුම් මධ්‍යස්ථානය, විද්‍යුත් ලිපිනය සහ තැපැල් ලිපිනය වැනි ක්‍රම ඇතුළත්ය.

සන්නිවේදන ප්‍රතිපත්ති, අචාර්ධර්ම සංග්‍රහය සහ සදාචාර ඇතුළත් සුදුසු ක්‍රියාමාර්ග බැංකුවේ සේවකයින් විසින් අනුගමනය කිරීම සඳහා ක්‍රියාවට නංවා ඇත. ආයතනික උපාය මාර්ගයේ කොටසක් ලෙස ආයතනික සමාජීය වගකීම්සහගත (CSR) වැඩසටහන් තුළ බැංකුවේ සක්‍රීය දායකත්වය සහ සමාජ මාධ්‍ය අවකාශ තුළ මාධ්‍ය භාවිතය ඔස්සේ සන්නාම දෘශ්‍යතාව ඉදිරියට ගෙනයාමට සහය වේ.

කීර්තිනාම අවදානම අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඇගයීම් ක්‍රියාවලියට අදාල (ICAAP) මාර්ගෝපදේශ මත පදනම් වී බැංකුව විසින් සංවර්ධනය කළ විස්තරාත්මක ලකුණු කාඩ්පතක් මගින් තක්සේරු කෙරේ.

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම අදාළ නීති, රෙගුලාසි, ආචාර ධර්ම සංග්‍රහ සහ මනා ව්‍යවහාර පිළිබඳ ප්‍රමිතිවලට අනුකූල නොවීම හේතුවෙන් ඇතිවන අතර මූල්‍යමය අලාභ සහ කීර්තිනාම අලාභවලට හේතුවේ. බැංකුවේ කීර්තිනාමය පවත්වාගෙන යාම සහ ඉහළ නැංවීම සඳහා අනුකූලතාවය සහය වේ.

බැංකුවේ සේවකයින් අදාළ නීති සහ රෙගුලාසි සහ මනා ව්‍යවහාරවලට අනුකූල බව සහතික කිරීම සඳහා බැංකුව විසින් අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇති අතර, විස්තීර්ණ අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, සහ යහපත් පාලන රාමුවක් ක්‍රියාත්මක කර ඇත.

අනුකූලතා අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- බැංකුවේ කීර්තිනාමය සහ සන්නාමය ඉහළ නැංවීම.
- ගනුදෙනුකාර විශ්වාසය සහ භාරය වැඩි කිරීම.
- පහසු සහ කාර්යක්ෂම මෙහෙයුම් ඇති කිරීම.
- සේවක අවංකකම ශක්තිමත් කිරීම.
- ඉහළම තත්ත්වයේ නිෂ්පාදන සහ සේවා ලබාදීම.
- බැංකුවේ ශක්තිය සහ ස්ථාවරත්වය වැඩි කිරීම.
- බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කිරීම.

අනුකූලතා අවදානම් පාලනය



අදාළ බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර මාර්ගෝපදේශ සමඟ අනුකූලතාව සහතික කිරීමේ ඉහළම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයට තම අනුකූලතා කාර්යයන්හි දී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් විධිමත් පරිදි සහය වේ. BIRMC වෙත සෘජුවම වාර්තාකරන විශේෂ ඒකකය විසින් බැංකුව සම්පූර්ණයෙන් අනුකූල බව සහතික කරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන කාර්යයට අමතරව, අනුකූලතා ඒකකය බැංකුවේ සමස්ත අනුකූලතාව මට්ටම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහතිකය ලබා දේ.

බැංකුවේ අනුකූලතා අවදානම ලකුණු පහක ශ්‍රේණිගතකරණ පරිමාණයේ ලකුණු කාඩ්පතක් තුළින් ඇගයීමට ලක් කරන අතර ඒ තුළින් අභ්‍යන්තර මනා පරිචයන් සහ බාහිර රෙගුලාසිවලට බැංකුවේ අනුකූලතාව ශ්‍රේණිගත කරයි. මෙම ලකුණු කාඩ්පත BIRMC වෙත ඉදිරිපත් කෙරේ.

විශේෂ අනුකූලතා නිලධාරී නිරන්තර තක්සේරු තුළින් බැංකුවේ අනුකූලතා තත්ත්වය පාලනය කරන අතර, BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එහි තත්ත්වය වාර්තා කරනු ලබයි.

අනුකූලතා දෙපාර්තමේන්තුවට පවරනු ලබන රාජකාරී අනිවාර්ය අනුකූලතා කාර්යයන් සහ සහයෝගී අනුකූලතා කාර්යයන් වශයෙන් දෙවර්ගයකි.

අනිවාර්ය අනුකූලතා කාර්යයන්

- නියාමන අවශ්‍යතාවන්ට අනුකූල නොවීමේ අවදානම ඉවත් කිරීමට හෝ අවම කිරීමට අනුකූලතා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම මගින් කීර්තිනාම අවදානමෙන් බැංකුව ආරක්ෂා කිරීම.
- මනා පරිචයන් පැහැදිලිව දක්වමින් සියලුම සේවකයින් සඳහා අචාරධර්ම/සදාචාර සංග්‍රහයක් සංවර්ධනය කිරීම සහ සැම මට්ටමකදීම අනුකූලතාව සහතික කිරීම නියාමනය.
- බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු විසින් පිළිපැදියයුතු ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) රෙගුලාසිය හා බැඳුණු මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදී අරමුදල්කරණයට විරුද්ධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- පැහැදිලි සහ කාලීන සන්නිවේදනය සහ අනෝන්‍ය අවබෝධය මත පදනම් වී නියාමකයින් සමඟ විධිමත් සම්බන්ධතා සහ මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම.
- බැංකුව තුළ අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කිරීම.
- බැංකුවට අදාළ නව නියාමන සහ රෙගුලාසි සංවර්ධනයන් පිළිබඳ අවධානයෙන් සිටීම සහ ඒවා ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- අනුකූලතා ගැටළු ඇතිකරන නීතිය තුළ සියලුම අදාළ නියාමන සංවර්ධනයන් සහ වෙනස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම.
- අනුකූලතාවයේ යම් කඩකිරීම් ඉස්මතු කිරීම සහ පිළිගතහැකි කාලරාමුවක් තුළ එය ආමන්ත්‍රණය කර නිවැරදි කිරීම සඳහා කළමනාකරණය සමඟ කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සහ මාර්ගෝපදේශවලට අනුව සහ නීතියෙන් දක්වා ඇති ආකාරයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අනුකූලතාව පිළිබඳ වාර්තා සතිපතා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂිකව ඉදිරිපත් කිරීම.
- අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත කාර්තුමය අනුකූලතා වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසික අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් මත පදනම් වී ගනුදෙනුකාර ප්‍රඥාප්තියක් ස්ථාපිත කිරීම.
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත පදනම් වී ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය සකස් කිරීම, ක්‍රියාත්මක කර නියාමනය කිරීම.
- මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදී අරමුදල්කරණය වැලැක්වීමට මූල්‍ය බුද්ධි ඒකකය වෙත ගනුදෙනු නියාමනය සහ සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම සඳහා ක්‍රම සහ පාලනයන් ස්ථාපිත කිරීම.
- මුදල් විශුද්ධිකරණයට විරුද්ධවීම ඇතුළුව අනුකූලතාව පිළිබඳ සේවකයින් පුහුණු කිරීම සහ ශාඛා ජාලය හරහා පුහුණුව ඇති කිරීමට ඉ-ඉගෙනුම් මොඩියුලයක් සංවර්ධනය කිරීම.
- චර්යාධර්ම සංග්‍රහයක් සංවර්ධනය කිරීම ඇතුළුව අනුකූලතා අවදානම සහ කීර්තිනාම අවදානම අවම කිරීමට ප්‍රතිපත්ති සකස්කර ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
- ණය තොරතුරු කාර්යාංශය සමඟ සම්බන්ධ වෙමින් ගනුදෙනුකරුවන්ගේ ණය විස්තර පවත්වා ගැනීම සහ යාවත්කිරීම.

සහයෝගී අනුකූලතා කාර්යයන්

- නියාමන, කීර්තිනාම, සහ සදාචාර කරුණු සම්බන්ධයෙන් කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා ලබාදීම.
- සාර්ථක හැකියාකරුවෙක් ලෙස අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.
- දේශීය නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව, අභ්‍යන්තර අනුකූලතාව සහ සදාචාර ප්‍රමිති සමඟ අනුකූල නව නිෂ්පාදන සහ ක්‍රම ව්‍යුහගතකරණයේදී යෙදවුම් ලබාදීම.
- විධිමත් කාලාන්තරයන් තුළ තක්සේරු කිරීම් සහ සමාලෝචනය කිරීම මගින් අභ්‍යන්තර සහ බාහිර රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම.
- අභ්‍යන්තර සහ බාහිර කමිටුවලට අදාළ අනුකූලතා කාර්යයන් නියෝජනය කිරීම.
- කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති පැහැදිලිව සන්නිවේදනය කිරීම.
- අනුකූලතා ගැටළු ආමන්ත්‍රණය කිරීමට බැංකුවේ අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යය සමඟ සම්බන්ධවීම.
- විගණනය මගින් හඳුනාගන්නා අනුකූලතා ගැටළු පිළිබඳ පසුවිපරම් කිරීම.
- විගණකවරු හා සම්බන්ධ වී අවදානම පදනම් තක්සේරු කිරීම මත සසම්භාවී අනුකූලතා විගණනයක් පැවැත්වීම.

අනුකූලතා වාර්තාකරණය

අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. මෙයට ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තු සහ ශාඛාවල ප්‍රධානීන්ගෙන් සංඥාවන්, අනුකූල නොවීමේ සිදුවීම්, සේවක පුහුණුව සහ ශාඛා තක්සේරු කිරීම් ඇතුළත් වේ. නියමිත කාර්තුව තුළ යම් විශේෂ අනුකූලතාවට අදාළ කරුණු පිළිබඳ BIRMC සහ BAC වෙත කාර්තුමය වාර්තා ඉදිරිපත් කෙරේ.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණය වැලැක්වීම

අපරාධ කටයුතුවල හානිකර නෛතික, ආර්ථික සහ සමාජීය ප්‍රතිවිපාක සමඟ කටයුතු කිරීමට ජාතීන් උත්සාහ ගන්නා බැවින්, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණය සඳහා සැලකියයුතු අවධානයක් අඛණ්ඩව ලැබේ. මහජන බැංකුව ගනුදෙනුකරු හඳුනාගැනීමට අදාළව දැඩි ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, සහ පාලන ප්‍රමිති, ඇති කරමින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණයේ ඉහළයන පැවැත්ම වැලැක්වීම පිණිස බැංකුව සෑම උත්සාහයක්ම ගෙන ඇත. බැංකුව මත අවදානම් ඇතිකළ හැකි කටයුතු වැලැක්වීමට සහ/හෝ සොයා ගැනීමට නිසි සම්ප්‍රජන්‍ය, ගනුදෙනු නියාමනය, ගෙවීම් සහ නාම නිරාවරණ, සැකසහිත කටයුතු විමර්ෂණය හා වාර්තාකරණය, සහ නව නිෂ්පාදන හා සේවා ඇගයීම මෙය තවදුරටත් ශක්තිමත් කරයි. මුදල් විශුද්ධිකරණය, ඔබගේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ සංකල්පය, ගනුදෙනුකරුගේ

නිසි පැවැත්ම පිළිබඳ සංකල්පය වැනි ක්ෂේත්‍ර පිළිබඳ ව්‍යුහගත වැඩසටහන් සහ ඉ-ඉගෙනුම් මොඩියුල තුළින් තෝරාගත් සේවකයින් පුහුණු කෙරේ. පොදුවේ විශාල සහ සැකසහිත ගනුදෙනු විශ්ලේෂණය කර ඇගයීමට ලක්කර මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු.

අනුකූලතා අවදානම් සමාලෝචනය

ශාඛා මට්ටමේ අනුකූලතා තක්සේරු කිරීම් ප්‍රාදේශීය අනුකූලතා නිලධාරීන් විසින් අවදානම් පදනම් ප්‍රවේශයක් මත පවත්වනු ලබන අතර, තෝරාගත් ශාඛාවන්වලදී අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචන පවත්වනු ලබයි. ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් ඒකක අවදානම් පදනම් ප්‍රවේශයක් මත දෙපාර්තමේන්තු/ඒකක තෝරා ගනිමින් අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කිරීම් පවත්වනු ලබයි. එමෙන්ම මූල්‍ය ගනුදෙනු සිදුකරන පරිපාලිත සමාගම් අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් වසර දෙකකට වරක් පවත්වනු ලබන වාර්ෂික පරීක්ෂා කිරීම්වලට අමතරව ප්‍රශ්නාවලියක් තුළින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කෙරේ.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු අහිතකර ව්‍යාපාර තීරණ, තීරණ අවිධිමත්ව ක්‍රියාත්මක කිරීම, අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය සහ මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම්වලට ප්‍රමාණවත් නොවන ප්‍රතිචාර හේතු කොට ගෙන ඉපයීමට සහ ස්වශක්තතාවට ඇතිවන අලාභයයි. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකරණය විසින් අනුමත කරන ලද උපාය මාර්ගික සැලැස්ම තුළින් එහි උපාය මාර්ගික අවදානම් කළමනාකරණය කරයි.

ව්‍යාපාර ඒකක සමඟ විවිධ මට්ටමේ සාකච්ඡා තුළ පුළුල් පාර්ශ්වකාර සහභාගිත්වය තුළින් උපාය මාර්ගික සැලැස්ම සකස් කරනු ලබයි. අවදානම වැදගත්වන අවස්ථාවකදී, බැංකුවේ ඉපයීම්වලට සිදුවන බලපෑම වැලැක්වීමට හෝ අවම කිරීමට කළමනාකරණ කාර්යයන් කිහිපයක් සංවර්ධනය කෙරේ. ALCO සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතිපතා පදනමක් මත ව්‍යාපාර කාර්යසාධනය සොයා බලනු ලබයි. එක් එක් ව්‍යාපාර ඒකකය සඳහා අයවැයගත ඉලක්කවලට අනුව සැබෑ කාර්යසාධනය නියාමනය කරන අතර, අවශ්‍යනම් ව්‍යාපාර පරිසරය තුළ යම් වෙනස්වීම්වලට ගැලපීම සඳහා උපායමාර්ග නැවත සමාලෝචය කෙරේ.

බැංකුවේ ප්‍රමාණය, සංකීර්ණතාව සහ මෙහෙයුම්වල විදග්ධතාව, පාරිසරික විශ්ලේෂණ මෙන්ම ගනුදෙනුකරුගේ පැතිකඩ ඇතුළු සාධක ගණනාවක් පිළිබඳ සැලකිල්ලට ගනිමින් උපායමාර්ගික අවදානම ලකුණු කාඩ්පතක් භාවිතා කරමින් තක්සේරු කෙරේ. මෙම ලකුණු කාඩ්පත උපායමාර්ගික අවදානම අවම කිරීමට සිදුකළයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහය වේ.

සමූහයේ අවදානම් කළමනාකරණය

බැංකුවේ ප්‍රධාන පරිපාලිත සමාගම් වන පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී විසින් අවදානම් නිරාවරණ හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ නියාමනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ රාමුවලට ව්‍යුහගත කෙරේ. මහජන බැංකුව පහත සඳහන් ව්‍යුහ සහ යාන්ත්‍රණ තුළින් සමූහ ආයතනයේ අවදානම් කළමනාකරණ අංශ පාලනය කෙරේ.

- සමූහයේ අවදානම් රුචිය සහ උපාය මාර්ගය බැංකු මට්ටමෙන් සකස් කරයි.
- වාර්තාකරණ ව්‍යුහ සහ ක්‍රියාවලි සහ සීමාවන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි.
- ප්‍රධාන අවදානම් දර්ශක, ඉහළයන මට්ටම්, සීමාවන් එක් එක් සමූහයේ ආයතනවලට නියම කර ඇති අතර බැංකුවේ නිරාවරණය රු.මි. 500 ඉක්මවයි.
- මහජන බැංකුවේ විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ප්‍රමාණත්වය සමාලෝචනය කර සහතික කරයි.
- සමහර අවස්ථාවලදී, මහජන බැංකුව පරිපාලිත සමාගම්වලට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා අධ්‍යක්ෂවරු නම් කරයි.
- මහජන බැංකුවේ BIRMC විසින් කලින් කල පරිපාලන සමාගම්වල අවදානම් පැතිකඩ සමාලෝචනය කරයි.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සමූහ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවලට පිවිසීම ඇත.

2022 දී ප්‍රධාන වර්ගීකරණ සඳහා සමූහයේ අවදානම් ශ්‍රේණිගතකරණ

	ණය අවදානම	වෙළෙඳපොල අවදානම	මෙහෙයුම් අවදානම	අනුකූලතා අවදානම	උපායමාර්ගික අවදානම	කීර්තිනාම අවදානම
මහජන බැංකුව	මධ්‍යම	මධ්‍යම	මධ්‍යම	අවම	අවම	අවම
පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	මධ්‍යම	මධ්‍යම	මධ්‍යම	අවම	මධ්‍යම	මධ්‍යම
පීපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී	අවම	අවම	මධ්‍යම	අවම	මධ්‍යම	මධ්‍යම

ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය පිළිබඳව සභාපතිතුමාගේ පණිවිඩය

සාර්ව ආර්ථික දෘෂ්ටිකෝනයකින් බැලීමේදී, 2022 වසර පසුගිය වසර පුරා පැවති ආර්ථික පීඩන සහ පීඩන සිදුවීම්වල එකතුවකි. එය මෙයට පෙර නොදුටු මට්ටමකට රටේ බාහිර සංචිත පහත වැටුණු වසරක් විය. රුපියල් 80%ට ආසන්නව අවප්‍රමාණය වූ අතර, උද්ධමනය ආසන්න වශයෙන් 70.0% දක්වා ඉහළ ගියේය. ප්‍රතිපත්ති අනපාත පෙර නොවූ විරූ ආකාරයෙන් වැඩි වූ අතර උද්ධමන පීඩනය වැඩි වෙමින් මේ සියලුම දෑ රටේ ණය ශ්‍රේණිගතකරණය ඓතිහාසික මට්ටමක් දක්වා පහළ වැටීමට හේතු වූ අතර රටේ ආර්ථිකය හිදහසින් පසු ඉතා තියුණුම මට්ටම වූ 11.0%ට ආසන්නව සංකෝචනය විය. එමනිසාම 2022 වසර ලාභය කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කිරීමට වඩා ගනුදෙනුකරුවන්ගේ බැඳීම් ඔවුන්ට අවශ්‍ය අවස්ථාවේදි සුරක්ෂිත කිරීම, ද්‍රවශීළතාව සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා ආයතනයේ සමස්ත අවදානම් කළමනාකරණය සහ පාලන රාමුව ශක්තිමත් කිරීම එහි අවධානය වූ අතර එහිදි හැකි සෑම අවස්ථාවකදිම කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සියලුම සාකච්ඡාවන් සහ තීරණ ගැනීමේදී ප්‍රධාන විය. වගකිම්සහගත රාජ්‍ය බැංකුවක් ලෙස එකතුකළ බර දරා ගැනීම ඇතුළුව මේ සියලුම දෑ සලකා බැලීමේදී, ප්‍රමාණාත්මක සහ විශේෂයෙන් ගුණාත්මක පෙරමුණක අපගේ 2022 වසරේ ප්‍රතිඵල පිළිබඳව අපි සතුටට පත් වෙමු.

සමාලෝචිත වසර තුළ, මෙම සංකීර්ණ වාතාවරණය හමුවේ බැංකුවේ ස්ථාවරත්වය සහ අඛණ්ඩතාව සහතික කිරීමට පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහනවයක් විය. මේවා අනෙකුත් විවිධ අනුකමිටු විචාරණයන්ට අමතරව විය. සමාලෝචිත වසර තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය සාර්ව ආර්ථික තත්ත්වයන් හි ගම්‍යතා තක්සේරු කිරීමට, ප්‍රතිපත්ති රාමු සමාලෝචනය, සහ සමස්ථ අවදානම් කළමනාකරණය සහ පාලන රාමුව ශක්තිමත් කිරීමට සැලකියයුතු කාලයක් ගත කර ඇත. අපගේ ඩිජිටල්කරණ උත්සාහයේ පුරෝගාමීයාවීම සාකච්ඡාවේ ප්‍රධාන කරුණක් විය. 2022 මාර්තු සහ අප්‍රේල් මාසවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගේ ඉල්ලා අස්වීම් සිදු වූ නමුත් පසුව සම්පූර්ණ කරන ලදී. වර්තමානයේදී, අධ්‍යක්ෂ මණ්ඩල හතරක් (04) පිරවීමට ඇති අතර නුදුරු කාලයකදී මුදල් අමාත්‍යංශය විසින් එය සිදු කරනු ඇතැයි අපි සාධාරණව අපේක්ෂා කරමු.

අනුකූලතාව

මෙම වාර්තාව බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගයට අනුකූලව විගණකාධිපති විසින් දක්වා ඇති "සිද්ධිවාචක සෙවුම් වාර්තාව" විස්තර කරනු ලබයි. ඉන් අපගේ පාලනය ක්‍රියාවට නැංවීමේ ප්‍රවේශය, 2021 දී අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයුම් සහ වසර තුළ එහි රාජකාරී මුදාහැරීම සාධාරණය කරනු ලබයි. එමෙන්ම ඉන් අනුකූලතා මට්ටම ද තීරණය කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, මහජන බැංකුව නියාමන අනුකූලතාවයෙන් ඉදිරියට ගොස් ඇති අතර තිරසාරභාවය සහතික කිරීමට අදාළ ESG රාමුව සහ ප්‍රමිති ස්වේච්ඡාවෙන් යොදා ගැනීම මගින් මෙහෙයවනු ලැබේ.

ඉදිරි ගමන්මඟ

සෑම අර්බුදයකින්ම අවස්ථාවක් පැමිණීමත් සමඟ සහ ශ්‍රී ලංකාව සඳහා, මෙම තීරණාත්මක අවස්ථාව එහි සංවර්ධන ආදර්ශය හරිත, ඔරොත්තුදෙන සහ සියලු දෑ ඇතුළත් වර්ධනය කරා නැවත සකස් කිරීමට අවස්ථාවකි. මහජන බැංකුව – ජාතික බැඳීම් තුළ එහි ධජය දරන්නාවීම සහ ජාතියේ අභිමානය වීම තුළ එහි ආචාර විධිවලට සත්‍යගරුක වෙමින් – රට පුනර්ජීවනය වීමට සහ මේ රටේ පුරවැසියන්ගේ ජීවිත සහ ජීවනෝපායන් නැවත ගොඩ නඟා ගැනීමටත් බලා සිටින අවස්ථාවේදී එහි කාර්භාරය අඛණ්ඩවම කරනු ඇත.!

අපි අනාගතය අපේක්ෂා කරමු!



සුජීව රාජපක්ෂ
සභාපති

2023 මාර්තු 2
කොළඹ


2022 වසරේදී පුරෝකථනය කළනොහැකි වෙළෙඳපොල තත්ත්වයන්ගේ අභියෝග තුළින් ඵලදායීව ඉදිරියට යාමට සහ ස්ථාවර වර්ධනයක් අත්කර ගැනීමට බැංකුව සමත් විය. බැංකුව වඩාත් ඔරොත්තු දෙන සහ නැවත ප්‍රාණවත් වී මතු වූ අතර, අපගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය අපගේ සංඛ්‍යාවල පමණක් නොව අපගේ ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය තුළ ද පිළිබිඹු කෙරේ. මෙම වාතාවරණයන් අපගේ සීමාවන් ඉහළට සහ ඉන් ඔබ්බට විසිවීමට සහ අපගේ තිරසාර වැඩසටහන අපගේ ව්‍යාපාරය සහ තාක්ෂණික මාරුවීම් සහ ආයතනික වර්ධනය සමඟ පෙළ ගැස්වීමට අපව ඉදිරියට ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම අවධාරණය කරමින්, ගනුදෙනුකරුවන්ට සහයවෙමින් සහ රජයේ ආර්ථික පුනර්ජීවන සැලැස්මට සම්පූර්ණයෙන් කැපවෙමින් සමාගමේ උපායමාර්ගය මෙහෙයවීමට සහ 2022 දී එහි ක්ෂේත්‍ර කිහිපයක අවදානම පැතිකඩ වර්ධනය කිරීමට සහය විය. සමාජයට ආපසු දීම කිසිදිනකවක් මෙතරම් වැදගත් නොවීය. මේ සම්බන්ධයෙන්, තිරසාර මෙහෙයුම් පවත්වා ගැනීම පිණිස එහි පාර්ශවකරුවන් සියලුම දෙනා වෙත ඉහළ වගවීම, විනිවිදභාවය, යහපාලනය සහ යහපත් මූල්‍ය සහ අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරන ලදී.

බැංකුකරණ අංශයේ සහ සමස්ථයක් ලෙස ආර්ථිකයේ විධිමත් ක්‍රියාකාරිත්වයට ඵලදායී ආයතනික පාලනය තීරණාත්මකය. බැංකුවේ ආයතනික යහපාලන රාමුව බැංකුව පාලනය කර කළමනාකරණය කිරීම සඳහා භාවිතා කරන කාර්යභාරයන්, වගකීම්, ව්‍යාවහාර සහ ක්‍රියාවලි අර්ථවත් කරමින්. බලතල සහ තීරණ ගැනීමේ ආයතන පිළිබඳව පැහැදිලි සහ ඵලදායී හඳුනා ගැනීම සහ නිරූපනයක් ලබාදීම මඟින්, මෙම රාමුව එහි පාර්ශවකරුවන් වෙත අවංකභාවය සහ වගවීම සමඟ දියුණුවීමට, තිරසාරව රැඳී සිටීමට සහ ක්‍රියාත්මක වීමට බැංකුව ශක්තිමත් කර ඇත.


අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ස්ත්‍රීපුරුෂ විවිධත්වය



පිරිමි – 83%
කාන්තා – 17%

අධ්‍යක්ෂ මණ්ඩල සමබරතාව



ස්වාධීන – 42%
ස්වාධීන නොවන – 8%
විධායක – 0%
විධායක නොවන – 50%

වයස් විවිධත්වය



>60 – 33%
50-60 – 33%
40-50 – 33%

මූල්‍ය සහ ගිණුම්කරණය
4/6 ★★★★☆☆

ව්‍යාපාර පරිපාලනය
2/6 ★★☆☆☆☆

විගණනය
1/6 ★☆☆☆☆☆

මානව සම්පත් හා කළමනාකරණය
3/6 ★★★☆☆☆

නීතිය
2/6 ★★☆☆☆☆

ආර්ථික විද්‍යා
3/6 ★★★☆☆☆

වාණිජ
1/6 ★☆☆☆☆☆

ජාත්‍යන්තර සංවර්ධනය
1/6 ★☆☆☆☆☆

අයවැයකරණය
1/6 ★☆☆☆☆☆

පාලන රාමුව

රෙගුලාසි

- 1961 අංක 29 දරණ මහජන බැංකු පනත (සංශෝධිත පරිදි)
- 1988 අංක 30 දරණ මහජන බැංකු පනත (සංශෝධිත පරිදි)
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ
- 1953 අංක 24 දරණ හුවමාරු පාලන පනත
- 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත
- 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
- බලපත්‍රලාභී වාණිජ බැංකුවල ආයතනික පාලනය සඳහා 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගය

ස්වේච්ඡා ප්‍රමිති

- 2007 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච්ඡේදය
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශයේ ගෝලීය වාර්තාකරණ ප්‍රවේශ සම්මතයන්
- එක්සත් ජාතීන්ගේ තිරසාරත්ව සංවර්ධන අරමුණු (SDGs)
- IFRS [පෙර ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය (IIRC)] විසින් නිකුත් කළ ජාත්‍යන්තර <IR> රාමුව

අභ්‍යන්තර රාමුව

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥාප්තිය
- අනුකමිටු සහ කළමනාකරණ කමිටුවල යොමු නිර්දේශ
- අධ්‍යක්ෂවරු සඳහා ව්‍යාපාර චර්යා සහ සදාචාර සංග්‍රහය
- විස්තරාත්මක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි
- සේවකයින් සඳහා සදාචාර සංග්‍රහය
- ගනුදෙනුකාර ප්‍රඥාප්තිය
- අභ්‍යන්තර විගණනය
- අභ්‍යන්තර පාලනයන්

අභ්‍යන්තර යාන්ත්‍රණ

- අවදානම් කළමනාකරණය
- උපායමාර්ගික සහ ආයතනික සැලසුම් කිරීම.
- අයවැයකරණය
- මානව සම්පත් කළමනාකරණය
- IT පාලනය
- පාර්ශවකාර සහභාගිත්වය

වගවීම | **විනිවිදභාවය** | **සාධාරණත්වය** | **වගකීම**


අපගේ ආයතනික වටිනාකම්

ජාතියේ අභිමානය වීම | **ගනුදෙනුකාර අවධානය සහ කඩිසරකම** | **අවංකකම සහ වගවීම** | **අබණ්ඩ ඉගෙනුම් සංස්කෘතිය සහ කණ්ඩායම් හැඟීම** | **සවිබලගැන්වීම සහ විවිධත්වය**

වටිනාකම් නිර්මාණය

පාර්ශවකාර වටිනාකම් නිර්මාණය | **උපායමාර්ගික ප්‍රතිඵල**

ආයතනික යහපාලන රාමුව



බැංකුවේ ආයතනික යහපාලන ව්‍යුහය මූලික ස්ථර දෙකකින් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ක්‍රමෝපායික මෙහෙයවීම, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන්කිරීම සහ අවදානම් රුචිය පිළිබඳ පාලනය ලබා දී ආයතනික කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා සිදු කරයි. බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන් සඳහා හුවමාරු වටිනාකම නිර්මාණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

2022 සඳහා ප්‍රමුඛ අවධානය

- බැංකුවේ උපායමාර්ගික සැලැස්මට අනුකූල අවශ්‍ය අවස්ථාවේදී බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, ප්‍රධාන ප්‍රමිතික සමාලෝචනය කර අනුමත කිරීම.
- වෙනස්වන සාර්ව ආර්ථික තත්ත්වයන්ට ගැලපීම.
- අවදානම් ඵලදායීව කළමනාකරණය
- තිරසාරභාවය වැළඳගැනීම.

සහතික කිරීම

විගණකාධිපතිවරයා විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා සහතිකය සපයනු ලබන අතර, එය පිළිවෙලින් පිටු අංක 207 සිට 208 දක්වා සහ 202 සහ 203 හි ප්‍රකාශයට පත් කෙරේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ආයතනික යහපාලන සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති, 2007 අංක 11 දරන බැංකු පනතෙහි නියෝගය කෙරෙහි වන අනුකූලතා මට්ටම පිළිබඳවද සහතික කිරීමක් කරයි.

ආයතනික යහපාලන සඳහා වන මනා පරිච සංග්‍රහය සමඟ අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය (ප්‍රතිපත්තිය අ. 1)

මුදල් අමාත්‍යවරයා විසින් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

සියළුම අධ්‍යක්ෂවරුන් ගෞරවනීය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයින් වෙති. වර්තමාන සභාපතිවරයා, විශේෂයෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 31කට අධික පළපුරුද්දක් සහිත මනාව පරිණත වෘත්තීයවේදියෙකි. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පුළුල් පරාසයක පැතිරුණු නිපුණතාවයන් සහ පළපුරුද්ද බැංකුවේ අවදානම් කළමනාකරණ හා පාලන ක්‍රියාවලිය පොහොසත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සම්පූර්ණ විස්තර පිටු අංක 26 සහ 27 හි ඉදිරිපත් කරයි.

නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම

(ප්‍රතිපත්තිය අ. 1.1)

අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් සෑම මසකටම වක් වරක් රැස්වන අතර අවශ්‍යතාව මත පදනම් වී අමතර රැස්වීම් කැඳවනු ලබයි. 2022 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය 19වරක් රැස්වූ අතර, සෑම රැස්වීමක්ම ඉහළ පැමිණීමකින්, සක්‍රීය සහභාගීත්වයකින්, අර්ථාන්විත හා විවෘත සංවාදයන්ගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ තමන් සාමාජිකත්වය දරන කමිටුවල රැස්වීම් වෙත සහභාගී වීම අවශ්‍ය වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට නොපැමිණීමේ අවස්ථාවක් වී නම් එයට පෙර යොදාගත් ව්‍යාපාරික, පෞද්ගලික වගකීම් හෝ අසනීප තත්ත්වයන් හේතු විය හැකිය.

එයට අමතරව, නඩය පත්‍රයේ ඇතුළත් විශේෂිත අයිතමයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආරාධනාව මත, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් නොවන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව සාමාජිකයින් සහ උපදේශක සාමාජිකයින්හට සහභාගී විය හැක. තවද, බැංකුවේ උපායමාර්ගය සම්බන්ධ කරුණු පිළිබඳ විධිමත් පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත ඉදිරිපත් කිරීමට ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම සහ/හෝ බාහිර විශේෂඥයින් වෙත අවසරය හිමි වේ.

2022 වසරේදී එක් එක් අධ්‍යක්ෂවරයාගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අදාළ කමිටු රැස්වීම් වෙත පැමිණීම පහත වගුවෙහි:

අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	අධ්‍යක්ෂය මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල විධායක නාම යෝජනා කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව
සුජීව රාජපක්ෂ මහතා	ස්වාධීන විධායක නොවන	19/19	-	9/9	-	-	6/6	-	-	4/4
කුමාර් ගුණවර්ධන මහතා	ස්වාධීන විධායක නොවන	19/19	-	9/9	-	24/24	4/4	3/3	5/5	-
සුදර්ශන් අහංගම මහතා*	ස්වාධීන විධායක නොවන	4/4	2/2	-	-	-	2/2	-	-	-
ඉසුරු බාලපටබැඳි මහතා	ස්වාධීන විධායක නොවන	17/19	-	-	4/4	-	-	3/3	-	4/4
කීර්ති ගුණතිලක මහතා	ස්වාධීන විධායක නොවන	18/19	5/5	-	-	22/24	4/4	-	5/5	2/4
මංජුල වෙල්ලාලගේ මහතා	ස්වාධීන විධායක නොවන	17/19	-	9/9	-	19/24	-	-	-	-
කේ ඒ විමලේන්තිරාජා මහතා**	ස්වාධීන විධායක නොවන	1/2	1/2	-	-	-	-	-	-	-
හද්‍රානි ජයවර්ධන මිය***	ස්වාධීන විධායක නොවන	3/4	-	-	-	-	2/2	-	-	-
විෂාඛා අමරසේකර මිය	ස්වාධීන විධායක නොවන	15/15	3/3	-	4/4	-	-	2/2	-	-
දුෂ්මන්ත තොටවත්ත මහතා	ස්වාධීන විධායක නොවන	10/10	3/3	-	1/1	-	-	-	-	-

** සුදර්ශන් අහංගම මහතා 2022 අප්‍රේල් 7 දින සිට ඉල්ලා අස්විය.*
*** කේ. ඒ. විමලේන්තිරාජා මහතා 2022 මාර්තු 2 දින සිට ඉල්ලා අස්විය.*
**** හද්‍රානි ජයවර්ධන මිය 2022 මැයි 6 දින සිට ඉල්ලා අස්විය.*

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

(ප්‍රතිපත්තිය අ. 1.2)

බැංකුවට නායකත්වය, අධීක්ෂණය, පාලනය, සංවර්ධනය ලබාදීමට සහ බැංකුවේ දිගු කාලීන සාර්ථකත්වය සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. එමෙන්ම ඔවුන් අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කොටස් හිමිකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම ද සිදුකරයි. බැංකුව තුළ නිවැරදි සංස්කෘතියක් පෝෂණය කිරීම, වටිනාකම් ඇති කිරීම සහ සදාචාර හැසිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

කාලීන වැදගත්කම පවත්වාගෙන යාම සඳහා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරෙන, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කෙරුණු කරුණුවලින් සමන්විත විධිමත් කාර්ය සටහනක් පවති. සාරාංශගතකළ අයිතම ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කෙරුණු කරුණු පහත වගුවේ සාරාංශ කෙරේ.

යහපාලනය	උපාය මාර්ගය හා දිශානතීන්	අවදානම් කළමනාකරණය වගවීම සහ පාලනය
යහපාලන සැකසුම් සමාලෝචනය	උපායමාර්ගය හා වාර්ෂික අයවැය අනුමත කිරීම.	මූල්‍ය ප්‍රකාශ, වෙළෙඳපොල වෙත වෙනත් යාවත්කාලීනයන් සහ ලාභාංශ සඳහා වන නිර්දේශ අනුමත කිරීම.
අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු සාමාජිකයන් සඳහා විෂය නිර්දේශ	අත්කරගැනීමේ සහ බැහැර කිරීමේ සඳහා අනුමැතිය ලබාදීම.	අධිකාරිත්ව සීමාවන්, මූල්‍ය හා භාණ්ඩාගාර ප්‍රතිපත්ති අනුමත කිරීම.
	අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සහ අවදානම් රුචිය සහතික කිරීම.	අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ සමාලෝචනය
		සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්ති අනුමත කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම්වලින් සමහරක් අනු කමිටු වෙත පවරනු ලැබ ඇත. එක් එක් කමිටුවට පවරන ලද කාර්යයන්හි විෂය පථය සහ වසර තුළ අත්කර ගත් ප්‍රගතිය පිළිබඳව මෙම වාර්තාවේ පිටුව 194 සිට 201 දක්වා ඉදිරිපත් කර ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ඵලදායීතාවය නියාමනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පවරනු ලැබ ඇත. බැංකුවේ "අවදානම ඉවසීම" සම්බන්ධයෙන් නිර්ණය කිරීමේ පරම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය රඳවාගනී. අවදානම් කළමනාකරණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන අතර එයට හඳුනාගත් අවදානම් සහ අවිනිශ්චිතතාවයන් නියාමනය, පාලනය සහ වාර්තාකිරීම ඇතුළත් වේ. එයට අමතරව, අවදානම් කළමනාකරණයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සභාපතිවරයා විසින් යොමුකළ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කරයි.

ව්‍යාපාරයට අදාළ වන පරිදි රටේ නීතිරීති වෙත අනුකූලතාවය සහ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය

(ප්‍රතිපත්තිය අ. 1.3)

බැංකුව විසින් සිදුකරනු ලබන විවිධ ව්‍යාපාරික කටයුතුවලට අදාළ වන, රටේ නීතිරීතිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහිකවද, තනි පුද්ගලයින් වශයෙන්ද කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. එමනිසා, අදාළ සියලුම නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව පවත්වා ගැනීමට අදාළ සියලුම ක්‍රියාපටිපාටි සහ පාලනයන් ක්‍රියාත්මකව ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

සමහර කරුණු සම්බන්ධව වරින් වර ස්වාධීන විනිශ්චය ලබාගැනීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. ඒ අනුව, ඔහුගේ/ඇයගේ රාජකාරී සහ වගකීම් මුදාහැරීමට අදාළ යම් කරුණු පිළිබඳ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් (නීති, ගිණුම්කරණ හා මූල්‍ය උපදෙස් ඇතුළුව එයට සීමා නොවී) ලබාගැනීමේ හැකියාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සතු වේ.

සමාගම් ලේකම්

(ප්‍රතිපත්තිය අ. 1.4)

සෑම අධ්‍යක්ෂවරයකුටම ලේකම්වරයා හමුවිය හැකි වේ. සියලුම වකඟ වූ ක්‍රියාපටිපාටීන් සහ අදාළ නීතිරීති හා රෙගුලාසි නිසි පරිදි අනුගමනය කරන බව තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වගකීමට බැඳී සිටී. ඊට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් සියළුම කමිටුවල ලේකම් ධූරය දරමින් සියළුම රැස්වීම්වලට අදාළ වාර්තා පවත්වාගෙන යනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාට අදාළ සෙසු වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ.

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනු කමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ කරුණු සම්බන්ධීකරණය කිරීම.
- සියළු කටයුතු මහජන බැංකු පනත සහ අදාළ නීතිරීති වලට අනුකූලව සිදු කිරීම.
- අදාළ නීතිකරණ සහ මනා පරිචයන්ට අනුකූලව, සිය කාර්යභාරයන් සහ වගකීම් සම්බන්ධයන් අධ්‍යක්ෂවරුන්ට සහයවීම ඇතුළුව, ආයතනික යහපාලන පිළිබඳ මනා පරිචයන් යොදා ගැනීම සඳහා පහසුකම් සැකසීම.
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරීත්වය අතර සන්නිවේදන සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කිරීම.
- නියාමන අවශ්‍යතාවයන්ට අනුව සම්බන්ධිත පාර්ශ්ව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් තහවුරු කිරීම.
- මහජන බැංකුව සියළුම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කිරීමේදී, මහජන බැංකු පනත සහ අනෙකුත් නෛතික තත්ත්වයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සහයෝගිත්වයෙන් නීති උපදෙස් පැතීම.

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන විනිශ්චය

(ප්‍රතිපත්තිය අ. 1.5)

අධ්‍යක්ෂවරුන් විසින් බැංකුවේ තීරණ සම්බන්ධයෙන් ස්වාධීන විනිශ්චයක් ලබාදීම අවශ්‍ය වේ. පළපුරුදු වෘත්තිකයින් වශයෙන්, ඔවුන්ගේ කාර්යභාරයන් සෙසු අයගේ කවර හෝ බලපෑමකින් තොරව ඉටු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ගතික උපකාරී දායකත්වය ප්‍රවර්ධනය කරයි.

අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් කාලයක් සහ ප්‍රයත්නයක් වෙනුවෙන් කැපවීම

(ප්‍රතිපත්තිය අ. 1.6)

අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමාලෝචනය සඳහා රැස්වීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් වැය කළ යුතු වන අතර, අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමින් අදාළ ගැටළු සම්බන්ධ පසු විපරම් සිදුකිරීම අවශ්‍ය වේ.

එමෙන්ම, සියළුම රැස්වීම්වලදී, අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සතුටුදායක අයුරින් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් වැය කරන බව සහතික කිරීමද අධ්‍යක්ෂවරුන්ගෙන් බලාපොරොත්තු වේ.

අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව

(ප්‍රතිපත්තිය අ. 1.7)

අඛණ්ඩ සංවර්ධනය සඳහා අදාළ පුහුණු ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හිමිකම ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය/කමිටු වෙත අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තහවුරු කිරීම පිණිස, බැංකුව විසින් මෙහෙයුම් සිදුකරනු ලබන වෙළෙඳපොල සම්බන්ධයෙන් සිය දැනුම, නිපුණත්වය හා අවබෝධය වර්ධනය කිරීම උදෙසා අධ්‍යක්ෂවරුන් වෙත පුහුණුව සහ යාවත්කාලීන ලබාදෙනු ලැබේ. මෙයට බැංකුවේ මෙහෙයුම්, ආයතනික යහපාලන, නෛතික හා නියාමන සංවර්ධනයන් පිළිබඳ ජ්‍යේෂ්ඨ විධායකයින්ගේ හෝ උපදේශකවරුන්ගේ ලිඛිත වාර්තා සහ ඉදිරිපත් කිරීම් ඇතුලත් වේ.

සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී

(ප්‍රතිපත්තිය අ. 2)

සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO)/සාමාන්‍යාධිකාරී (GM) මහජන බැංකුවේ නායකත්වය සඳහා සහ අවංකකම සහ විශ්වාසනීයත්වය සම්බන්ධ ඉහළම සම්මතයන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි සාමූහිකව වගකීමට බැඳී සිටින අතරම, සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී අතර වගවීම සහ වගකීම පිළිබඳ පැහැදිලි සහ බලාත්මක වෙන් කිරීමක් පවතී. එක් එක් පුද්ගලයා විශේෂිත කාර්යභාරයක් ඉටු කරන අතර, බලසමතුලනය සහ කිසිදු පුද්ගලයකු තීරණ හා පාලන බලය අනිසි ලෙස භාවිතයෙන් වැළැක්වීම තහවුරු කිරීම එහි අරමුණයි.

ඵලදායී මෙහෙයුම් සහ එහි නෛතික හා නියාමන වගකීම් සම්පූර්ණයෙන් මුදාහරින බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය දීම, මෙහෙයවීම සහ කළමනාකරණය සඳහා සභාපතිවරයා වගකීමට බැඳී සිටී. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ මූලික වගකීම වනුයේ බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමයි.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ධූරයන් ඒකාබද්ධ කරමින් එක් පුද්ගලයකු වෙත පැවරීමේ තීරණය සාධාරණීකරණය කිරීම සහ විශේෂ කොට දැක්වීම

(ප්‍රතිපත්තිය අ. 2.1)

එක් පුද්ගලයකු වටා තීරණ ගැනීම සම්බන්ධ අසීමිත බලයක් කේන්ද්‍රගතවීම වලක්වමින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී යන ධූරයන් පැහැදිලිව බෙදා වෙන් කොට ඇත.

සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා පිළිබඳ මෙම වාර්තාවේ පිටු අංක 26 සහ 30 හි විස්තර කර ඇත.

සභාපතිවරයාගේ කාර්යභාරය

(ප්‍රතිපත්තිය අ. 3)

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහ කළමනාකාරිත්වය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය ඵකඟත්වය පළ කරන ලද ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්තීන් ඵලදායක ලෙස ක්‍රියාවට නංවනු ලබන බවට තහවුරු කිරීම සභාපතිවරයාගේ වගකීම වේ. එමෙන්ම සභාපති යහපාලන ව්‍යාවහාර යොදා ගැනීම සඳහා නායකත්වය සපයන අතර, කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනය සහතික කිරීමට අධීක්ෂණය සපයයි.

අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම

(ප්‍රතිපත්තිය අ. 3.1)

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය ලබාදීම පමණක් නොව, බැංකුවේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ පරම අභිමතය සුරැකීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණයද සභාපතිවරයාගේ වගකීම වේ. ඒ අනුව, සභාපතිවරයා පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වගකීමට බැඳේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඵලදායී අයුරින් සැලසුම්කර පවත්වනු ලබන බවට තහවුරු කිරීම.
- වෙනත් අධ්‍යක්ෂවරුන් විවිධ අනුකමිටු සාමාජිකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව දැනුවත් වෙමින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා න්‍යාය පත්‍රය සැකසීම.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත නිවැරදි කාලීන හා පැහැදිලි තොරතුරු ලැබෙන බවට තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා නිවැරදිව ලේඛණගත කොට අධ්‍යක්ෂවරුන් අතර බෙදාහැරෙන බවට තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය සහ පාලනය සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ තනි අධ්‍යක්ෂවරුන් සඳහා කාලීන ආකාරයෙන් ගැටළු සාකච්ඡා කිරීම සඳහා උපකාරී වටපිටාව නිර්මාණය කිරීම.
- විනිවිද සංස්කෘතියක් ප්‍රවර්ධනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු සම්බන්ධයෙන් උපකාරී සහ යහපත් අදහස් හුවමාරු කරගැනීමට නිරතවීම සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන් දිරි ගැන්වීම සහ ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට දායක වීම පහසු කිරීම.
- සමූහයේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති සැකසීමේදී සහ නිර්ණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් වශයෙන් පරිපූර්ණ කාර්යභාරයක් ඉටුකරන බවට සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ බැංකුවේ පරම අභිමතය අනුව ගනු ලබන බවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵකඟත්වය තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අර්ථවත් ප්‍රතිචාර ඇති කිරීමට ස්වයං තක්සේරුකරණය සඳහා නායකත්වය දීම.

මූල්‍යමය විචක්ෂණභාවය

(ප්‍රතිපත්තිය අ. 4)

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවයෙන් යුතු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වේ. මෙහිදී මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් මාර්ගෝපදේශකත්වය සපයනු ලබන ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයකු සභභාගී වේ. මෙයට අමතරව සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ පුළුල් වෘත්තීය පළපුරුද්ද තුළින් අත්කරගත් ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවය සහිත අය වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය

(ප්‍රතිපත්තිය අ. 5)

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් අට දෙනෙකු සමඟ මනා සමතුලනයකින් යුක්ත වන අතර, එයින් හය දෙනෙක් ස්වාධීන නිලය තුළ කටයුතු කරයි. මෙය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලන සඳහා වන මනා පරිච සංග්‍රහය විසින් දක්වා ඇති අවමයට ඉහළ අගයකි.

සියළුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් කළමනාකරණය පිළිබඳ ස්වාධීන වන අතර වැදගත් මැදිහත් වීමක් තිබියහැකි හෝ නිදහස් හෝ ස්වාධීන විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම සමඟ වැදගත් මැදිහත් වීම සාධාරණව ගම්‍යමාන වියහැකි යම් ව්‍යාපාරික හෝ වෙනත් සබඳතාවයකින් තොර වේ.

සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් විශේෂ නිර්ණායකවලට අනුව ස්වාධීන බව/ස්වාධීන නොවන බව සම්බන්ධ අත්සන් තබන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කරන අතර ස්වාධීනත්වය නිර්ණය කිරීම උදෙසා නිර්ණායකවලට අනුකූලතාවය සහතික කිරීම සඳහා ඔවුන් ඇගයුමට ලක් කෙරේ.

සමාලෝචනයට ලක් වූ වසර තුළ, විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීම අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් උද්ගත නොවීය. තවද සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ධූරයන් බෙදා වෙන්කිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ අවශ්‍යතාවයද උද්ගත නොවීය.

තොරතුරු සැපයීම

(ප්‍රතිපත්තිය අ. 6)

සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ප්‍රමාණවත් දැනුම්දීමක් සමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින නියම කරගනු ලැබේ. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල හෝ කමිටු රැස්වීමකට පෙර, න්‍යායපත්‍රය, අන්තර්ගතය සහ කළමනාකරණ ඉදිරිපත්කිරීම් ඇතුළු අදාළ සියලුම පත්‍රිකා රැස්වීමට වැඩකරන දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත ලැබීමට සලස්වනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් තහවුරු කෙරේ. රැස්වීම්වලට සභභාගී විය නොහැකි අධ්‍යක්ෂවරුන් සඳහා ලේඛණගත වාර්තා ඔස්සේ ඔවුන් යාවත්කාලීන කරමින් ඊළඟ රැස්වීමේදී අදාළ කරුණු සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකෙරේ.

දෙන ලද මාසයක් සඳහා මාසික ගිණුම් වාර්තා පිළියෙල කොට එක් එක් අංශයේ/පරිපාලිතයේ මූලික කාර්යසාධන දර්ශක සමගින් අධ්‍යක්ෂවරුන් අතර බෙදා හැරේ. සපයන ලද තොරතුරු ප්‍රමාණවත් නොවන බවට හෝ අපැහැදිලි බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලැබුවහොත්, වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමේ හැකියාව ඔවුන් සතු වේ. වැඩිදුර අවශ්‍ය බව කල්පනා කරන්නේනම්, අදාළ කළමනාකරණ කාර්ය මණ්ඩල පිරිස් කැඳවනු ලැබිය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම්

(ප්‍රතිපත්තිය අ. 7 සහ අ. 8)

මහජන බැංකු පනත අනුව, විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් 10ක උපරිමයක් දක්වා පත් කරනු ලබන අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කෙරේ. වසර තුනක් සඳහා පත්කිරීම් සිදුකෙරෙන අතර 2007 අංක 11 දරන බැංකුකරණ පනතෙහි නියෝගය අනුව, වසර නවයක උපරිම කාලසීමාවකට හෝ වයස අවුරුදු 70 යන දෙකෙන් කලින් එළඹෙන දිනයට යටත් වේ.

අධ්‍යක්ෂ ධූරයන් සඳහා වන සියළුම පත්කිරීම් අධ්‍යක්ෂවරුන් සඳහා යෝග්‍යතා හා නිශ්චිත ක්‍රියාපටිපාටිය යටතේ වන බව ඇගයුම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයුම

(ප්‍රතිපත්තිය අ. 9)

සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයුම් පිරික්සුම් ලැයිස්තුව තුළ දක්වා ඇති සියලුම නිර්ණායකයන් ඇතුළත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් වාර්ෂිකව ඔහුගේ/ඇයගේ කාර්යසාධනය සහ සමස්තයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්සාධනය පිළිබඳ ස්වයං ඇගයුමක් සිදුකරනු ලබයි. අදාළ ප්‍රතිචාරයන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් එක්රැස් කොට සාරාංශගත වාර්තාවක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.

අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු අනාවරණය

(ප්‍රතිපත්තිය අ. 10)

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සංග්‍රහය තුළ දක්වා ඇති තොරතුරු පහත පරිදි මෙම වාර්ෂික වාර්තාවේ අනාවරණය කෙරේ:

- පිටු අංක 26 සිට 27 දක්වා නම, සුදුසුකම්, කෙටි විස්තරයක් සහ විශේෂඥභාවයේ ස්වභාවය
- පිටු අංක 172 හි 2022 වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් සහ පැමිණීම්
- පිටු අංක 171 හි අධ්‍යක්ෂවරයා සභාපති හෝ සාමාජිකයකු වශයෙන් සේවය කරන කමිටුවල නම්
- පිටු අංක 294 සිට 298 දක්වා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ප්‍රධාන විධායක නිලධාරීවරයා සම්බන්ධ ඇගයුම

(ප්‍රතිපත්තිය අ. 11)

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සම්බන්ධ ඇගයුම අධ්‍යක්ෂ මණ්ඩලයේ වැදගත්ම වගකීම් වලින් එකකි. මෙමගින් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගේ බැංකුවේ නායකත්වය සහ කාර්යසාධනය පිළිබඳ ඵලදායී සංවාදයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා හට විධිමත් අවස්ථාවක් උදා වේ. ක්‍රමෝපායික සැලසුම්කරණය සහ කාර්යසාධන කළමනාකරණය යටතේ සකස් කළ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සඳහා මූලික කාර්යසාධන දර්ශක මණ්ඩලයක් විසින් කාර්තුමය ලෙස සමාලෝචනය කර එම සමාලෝචනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව සමාලෝචනය සඳහා ඉදිරිපත් කරයි. මෙම ඉලක්ක අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තහවුරු කොට, වාර්ෂික ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ඇගයුම් ක්‍රියාවලියෙහි පදනම වශයෙන් යොදා ගනී.

ගතයුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් සමඟ කවර හෝ අහිතකර විචල්‍යයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වගකීමෙන් බැඳී සිටී.

අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායකයින්ගේ පාරිශ්‍රමික ක්‍රියාපටිපාටිය

(ප්‍රතිපත්තිය ආ. 1, ආ. 1.1, ආ. 1.2, ආ. 1.3)

මුදල් අමාත්‍යාංශය මගින් සකසනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික තීරණය කරනු ලබයි. කිසිදු අධ්‍යක්ෂවරයකු ස්වකීය ඔහුගේ/ඇයගේ පාරිශ්‍රමික තීරණය කිරීම සඳහා සහභාගී නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මගින් බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්ති හා සාමූහික ඵලඥතාවකට අනුව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කෙරේ. බැංකුවේ විශිෂ්ට කාර්යසාධනයක් සහිත, සුදුසුකම් ලත් සහ පළපුරුදු සේවකයින් ආකර්ශනය, රඳවාගැනීම සහ දිරිමත් කිරීමට හැකි වන අයුරින් පාරිශ්‍රමික සකසනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සාමූහික ඵලඥතාවය යටතේ සිය පාරිශ්‍රමික සම්බන්ධ අනුමැතිය සඳහා අවසාන බලධාරියා වන මුදල් අමාත්‍යවරයා වෙත අදාළ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

සිය කාර්යභාරයන් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මගින් අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හිදී බැංකුවට පිටතින් වෘත්තීය උපදෙස් පතනු ලැබේ. පාරිශ්‍රමික ප්‍රතිපත්ති ප්‍රකාශය සහ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි සාමාජිකයින්ගේ නම් හෙළිදරව් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පිටු අංක 195 හි ඉදිරිපත් කෙරේ. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන මුළු පාරිශ්‍රමික පිටු අංක 192 හි දැක්වේ.

කොටස් හිමිකරුවන් සමග සබඳතා

(ප්‍රතිපත්තිය අෑ. 1. අෑ. 2)

ශ්‍රී ලංකා රජය ප්‍රධාන කොටස් හිමිකරු වන රාජ්‍ය බැංකුවක් වශයෙන්, මහජන බැංකුව සෘජුවම මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතට පත් වේ. රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සමඟ පෙළ ගැසීම සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වේ.

වාර්ෂික වාර්තාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂාවන්ගෙන් මුද්‍රණය කෙරෙන අතර, මුදල් අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත සංසරණය කෙරේ. අමාත්‍යාංශයට අදාළ කරුණු සඳහා බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වේ.

ප්‍රධාන සහ වැදගත් ගනුදෙනු

(ප්‍රතිපත්තිය අෑ. 3)

පිටු අංක 294 සිට 298 දක්වා සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ යටතේ, මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 45 හි හෙළිදරව් කරන ලද කරුණු හැරුණු විට බැංකුවේ හෝ සමූහයේ ශුද්ධ වත්කම් පදනම වෙනස්වීමකට හාජනය වන ආකාරයේ කිසිදු ගනුදෙනුවක් නොවිය.

මූල්‍ය වාර්තාකරණය

(ප්‍රතිපත්තිය අෑ. 1)

මෙම වාර්ෂික වාර්තාව මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අනාගත කටයුතු පිළිබඳ සමතුලිත විග්‍රහයක් ඉදිරිපත් කෙරේ. අවබෝධය සහ පැහැදිලි බව වැඩි කිරීම සඳහා, තොරතුරු ඉදිරිපත් කිරීමේදී ප්‍රකාශනාත්මක හා දෘෂ්‍ය සංරචකයන් ද්විත්වයම යොදා ගැනුනි. මෙම වාර්තාව තුළ අපගේ කාර්යසාධනය සම්බන්ධ සමතුලිත දැක්මක් අපි ලබාදී ඇති අතර, අනෙකුත් සන්නිවේදන මුදල් අමාත්‍යාංශය සහ නියාමකයින් ඇතුළුව අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික වාර්තාව තුළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අතුරු සන්නිවේදන නිකුතුවේදී අනුකූලතාව සහතික කිරීමට බැංකුව සැම පියවරක්ම ගෙන ඇත.

සංග්‍රහය අනුව අවශ්‍ය පරිදි පහත දැක්වෙන හෙළිදරව් කිරීම් මෙම වාර්තාවේ ඇතුළත් කෙරේ:

- පිටු අංක 206හි ඉදිරිපත් කොට ඇති මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනයෙහි ඔවුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් වේ.
- පිටු අංක 202 සහ 203හි මූල්‍ය වර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය.
- පිටු අංක 40 සිට 136 දක්වා කළමනාකරණ විග්‍රහය
- පිටු අංක 206හි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය තුළ සමාගමෙහි අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ ප්‍රකාශය ඇතුළත් කෙරේ.
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් 43හි පිටු අංක 294 සිට 298 දක්වා කොටසෙහි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳව හෙළිදරව් කෙරේ.

අභ්‍යන්තර පාලන සහ විගණන කමිටුව

(ප්‍රතිපත්තිය අ. 2 සහ අ. 3)

බැංකුවේ පාර්ශ්වකාර අභිමතයන් සහ වත්කම් සුරැකීම සඳහා අවශ්‍ය යෝග්‍ය හා ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා මනා අභ්‍යන්තර පාලන ක්‍රම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එහි වගකීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවේ. එහිදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධ කාර්යභාරයන් ඉටු කිරීමේදී ද අධ්‍යක්ෂ මණ්ඩල වෙත සහාය ලබාදෙයි. මෙම කමිටුවල කාර්යභාරයන් සහ වගකීම් පිටු අංක 196හි කමිටු වාර්තාවල දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්මේන්තුවේ සහාය හිමි වේ. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් පිටු අංක 138 සිට 167 දක්වා ඉදිරිපත් කෙරේ. බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සහය වේ. අභ්‍යන්තර විගණන දෙපාර්මේන්තුව මගින් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත අඛණ්ඩ පදනමක් මත වාර්තා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි කාර්යභාරයට එබඳු විගණනයන්හි විෂය පථය සහ ප්‍රතිඵල මෙන්ම ඵලදායීතාවය විශ්ලේෂණය කිරීම ඇතුළත්ය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, බැංකුවේ බාහිර විගණනය සිදුකරනු ලබන විගණකාධිපතිවරයා සමඟ සම්බන්ධීකරණය කිරීම තුළ මූලික කාර්යභාරයක් ඉටු කරයි.

ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහය සහ ආයතනික යහපාලන වාර්තාව

(ප්‍රතිපත්තිය අ. 4 සහ අ. 53)

බැංකුවට ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහ දෙකක් පවතින අතර, ඉන් එකක් අධ්‍යක්ෂවරුන් වෙත සහ දෙවැන්න සේවකයින් සඳහා අදාළ වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අදාළ සංග්‍රහයන් නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කරමින් බැංකුවේ වෙනස්වන මෙහෙයුම්වලට අදාළත්වය හා ප්‍රමාණවත්භාවය තහවුරු කිරීමේ වගකීම උසුලයි. ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහයන් ආයතනික යහපාලන පිළිබඳ මනා පරිච සංග්‍රහයේ 1 උපලේඛණයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

පිටු අංක 168 සිට 204 දක්වා ඇති මෙම ආයතනික යහපාලන වාර්තාව, ප්‍රතිපත්ති අ. 5හි දක්වා ඇති පරිදි, ආයතනික යහපාලන පිළිබඳ මනා පරිච සංග්‍රහය සමඟ අනුකූලව ප්‍රමාණය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය සමඟ අනුකූල වේ.

කොටස් හිමිකාර සබඳතා

(ප්‍රතිපත්ති ඉ සහ ඊ)

මහජන බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකරු ශ්‍රී ලංකා රජය වන බැවින්, සංග්‍රහය ආශ්‍රිත විධිවිධාන අදාළ නොවේ.

තිරසාරත්ව වාර්තාව

(ප්‍රතිපත්තිය උ)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව සඳහා තිරසාරත්ව ප්‍රතිපත්තියක් අනුමත කොට, එහි දර්ශනය, අරමුණු සහ සමාජ හා පාරිසරික සංවර්ධනය උදෙසා වන ක්‍රමෝපායික ඉලක්ක ක්‍රියාවට නැංවන බවට තහවුරු කෙරෙන්නා වූ පාලන ව්‍යුහයක් ස්ථාපනය කරනු ලැබ ඇත. ඒ අනුව, සෑම භූගෝලීය කලාපයක් තුළම බැංකුවේ මෙහෙයම් තුළ තෙවැදෑරුම් මාර්ගයේ වටිනාකම ඇතුළත් කර ඇත. සංග්‍රහයේ ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ තිරසාරත්ව ව්‍යාපාරික ව්‍යාපෘතීන් පහත විස්තර කෙරේ.

ප්‍රතිපත්තිය 1	–	ආර්ථික තිරසාරත්වය – පිටු අංක 68 සිට 71 දක්වා මූල්‍ය ප්‍රාධානිගේ සමාලෝචනයි.
ප්‍රතිපත්තිය 2	–	පරිසරය – පිටු අංක 129 සිට 136 දක්වා ස්වභාවික ප්‍රාග්ධනය
ප්‍රතිපත්තිය 3	–	ශ්‍රම ක්‍රියාකාරකම් – පිටු අංක 95 සිට 107 දක්වා මානව ප්‍රාග්ධනය
ප්‍රතිපත්තිය 4	–	සමාජීය – පිටු අංක 108 සිට 136 දක්වා සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය
ප්‍රතිපත්තිය 5	–	නිෂ්පාදන වගකීම – පිටු අංක 108 සිට 144 දක්වා සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය
ප්‍රතිපත්තිය 6	–	පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, සහභාගීත්වය සහ ඵලදායි සන්නිවේදනය, පිටු අංක 47 සිට 49 දක්වා පාර්ශ්වකාරසහභාගිත්වය
ප්‍රතිපත්තිය 7	–	වාර්තාකරණ ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් විධිමත් කළ යුතු සහ නිරන්තරව සිදුවිය යුතු තිරසාර වාර්තාකරණය – පිටු අංක 3 සිට 6 දක්වා අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳ

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**		
	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන ආකාරයෙන් බැංකුවේ සුරක්ෂිතතාව සහ ප්‍රබලත්වය ශක්තිමත් කරනු ඇත.		
අ	උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් සැකසීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2022-2024 උපායමාර්ගික සැලසුම ක්‍රියාත්මකය උපායමාර්ගික සැලසුම්සහ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී විසින් බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ සියලූම ව්‍යාපාර ඒකක ප්‍රධානීන්ට සන්නිවේදනය කර ඇත. තවද, 2022-2024 උපායමාර්ගික සැලසුම පිළිබඳ දැනුවත් කිරීමේ සැසි මාණ්ඩලික පුහුණු පාසලේදී සහකාර සාමාන්‍යාධිකාරී සහ ඉහළ මට්ටමේ නිලධාරීන් වෙත පවත්වා ඇත.	අනුකූල විය.
ආ	අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණය ඇතුළු සමස්ත ව්‍යාපාර උපායමාර්ග අනුමත කිරීම.	උපායමාර්ගික සැලැස්මට බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ සහ සමස්ත ව්‍යාපාර උපායමාර්ග ඇතුළත්ය. අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ක්‍රියාත්මකය. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත. 2022-2024 උපායමාර්ගික සැලස්මට 2022 ඇතුළුව අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා සමස්ථ ව්‍යාපර උපායමාර්ගය, මැනියහැකි ඉලක්ක ඇතුළත්ය.	අනුකූල විය.
ඇ	අවදානම් කළමනාකරණය	අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) සහ අදාළ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් බැංකුවේ සියලූම අවදානම් තක්සේරු කිරීමේ වැඩසටහන් සිදු කරයි. එමෙන්ම BIRMC බැංකුවේ නව ක්‍රමෝපායන්, නව ක්‍රමෝපායන් තුළින් පැනනගින අවදානම් සහ එවැනි අවදානම් අවම කරගැනීම සඳහා වන මාර්ගයන් පිළිබඳ සාකච්ඡා කරයි. තවද, බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ඉහත (ආ)හි දක්වා ඇති පරිදි සමාලෝචනය කර ඇත.	අනුකූල විය.
ඈ	සියළුම පාර්ශ්වකරුවන් සමඟ අදහස් හුවමාරු කරගැනීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම පාර්ශ්වකරුවන් සමඟ ඵලදායි ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කොට ක්‍රියාවේ යොදවනු ලැබ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ රැස්වීම්වලදී සන්නිවේදන ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.	අනුකූල විය.
ඉ	අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධති	අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය IAD විසින් සමාලෝචනය කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද, 2021 කළමනාකරණ තොරතුරු දෙපාර්තමේන්තුව ඇතුළුව මූල්‍ය සහ කළමනාකරණ ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ විගණනය BAC සඳහා ඉදිරිපත් කර තිබුණි.	අනුකූල විය.
ඊ	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMPs)	2019 අංක 1 දරන බැංකු පනත් තීරණය කිරීම පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍ර.වි.නි, ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්, ප්‍රධාන අවදානම් නිලධාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), මූල්‍ය ප්‍රධානී, CIA, අනුකූලතා නිලධාරී, භාණ්ඩාගාර ප්‍රධානී, නීති ප්‍රධානී, IT ප්‍රධානී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගයේ 3(1) (i) (B) වගන්තිය යටතේ වැටෙන පහත වර්ගයේ වෙනත් නිලධාරීන් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වශයෙන් නිර්වචනය කොට ඇත. තවද, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමට ලක් කර ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
උ	අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ අධිකාරිත්ව වපසරිය සහ ප්‍රධාන වගකීම් නිර්වචනය	අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය අතර අධිකාරිත්වය සහ වගකීම් සම්බන්ධ පැහැදිලි වෙන් කිරීමක් පවතී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් බැංකුවේ ක්‍රමෝපායික තීරණ ගැනීම කෙරෙහි වගකීම උසුලයි. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ ක්‍රියාවේ යෙදවීම සහ මෙහෙයුම් සඳහා වගකිව යුතු වේ. තවද, ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ 1.3 හි ප්‍රධාන විධායක නිලධාරියාගේ අධිකාරිත්ව වපසරිය සහ ප්‍රධාන වගකීම්වලට අදාළ විධිවිධාන ඇතුළත්ය. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සම්පූර්ණයෙන්ම මෙහෙයුම් මත පදනම් වන අතර, ඒවා ඔවුන්ගේ කාර්ය විස්තරයන්හි විශේෂිතව දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ අධිකාරිත්වය පැවරුම් වගකීම් සීමා යටතේ දක්වා ඇත.	අනුකූල විය.
ඌ	ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල විසින් බැංකුවේ කටයුතු අධීක්ෂණය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය මගින් බැංකුවේ කටයුතු අධීක්ෂණය යෝග්‍ය පරිදි සිදු කරනු ලැබ ඇත.	අනුකූල විය.
එ	ස්වකීය පාලන ක්‍රියාකාරකම්වල ඵලදායීත්වය ඇගයීම		
	(i) අධ්‍යක්ෂවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය තෝරාගැනීම, නම්කිරීම සහ පත් කිරීම.	මහජන බැංකු පනතෙහි 8 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. ඔවුන්ගෙන් දෙදෙනෙක් සමූපාකාර විෂයභාර අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන අතර, ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ තෝරාගැනීම, නම්කිරීම සහ නිර්දේශ කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විසින් සිදුකරන අතර අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගෙන ඇත.	අනුකූල විය.
	(ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය, සහ	බැඳියා පිළිගැටුම් නිසි පරිදි වාර්තා කරනු ලැබ ඇත.	අනුකූල විය.
	(iii) දුර්වලතා තීරණය කිරීම සහ අවශ්‍ය විට වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් වාර්තා ලබාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි.	අනුකූල විය.
ඒ	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලසුම	ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික සැලසුම ක්‍රියාවට නංවා ඇත.	අනුකූල විය.
ඔ	ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග නිරන්තර රැස්වීම්	ක්‍රියාකාරී අංශයන් සම්බන්ධ කරුණු පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය කැඳවනු ලැබේ.	අනුකූල විය
ඕ	නියාමන වටපිටාව සහ නියාමන අධිකාරිය සමඟ ඵලදායී සබඳතාවක් පවත්වාගෙන යාම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන පරිසරය අවබෝධ කර ගැනීමට ක්‍රියාමාර්ග රැගෙන ඇති අතර ක්‍රියාවලි ක්‍රියාවට නංවා ඇති අතර, බැංකුව නියාමකයින් සමඟ සම්බන්ධතා පවත්වා ගනී. අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කරන ලද අවස්ථාවේදී, සමාගම් ලේකම්වරයා විසින් ඔවුන් වෙත ආයතනික පාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහය 1.3, සහ දැනට සේවයේ යෙදෙන අධ්‍යක්ෂවරුන් ආදී තොරතුරු ලබාදෙනු ලැබේ. 2022 පෙබරවාරි 28 දින පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයේදී මතු වූ කෙටුම්පත් අධීක්ෂණ වාර්තාව 2022 දෙසැම්බර් 22 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමට ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ රැස්වීම්වලදී ප්‍රධාන විධායක නිලධාරියාගේ පැමිණීම නියාමක සමඟ පවත්වන සම්බන්ධතාවයට වැඩිදුර සාක්ෂියකි.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
ක	බාහිර විගණකවරුන් යොදාගැනීම.	මහජන බැංකු පනතෙහි 34 වැනි වගන්තියෙන් දැක්වෙන පරිදි විගණකාධිපති බැංකුවේ විගණකවරයා වේ.	අනුකූල විය.
3.1 (ii)	සභාපති හා ප්‍ර.වි.නි. පත් කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් නියම කිරීම.	මහජන බැංකු පනතෙහි 10 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා පත්කිරීම, අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබේ. ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන, සුජීව රාජපක්ෂ මහතා 2022 දෙසැම්බර් 21 දින සිට මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් බැංකුවේ සභාපති ලෙස නැවත-පත්කර ඇත. වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී ක්ලයිව් ෆොන්සේකා මහතා (2022 දෙසැම්බර් 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද අතර මාස හයකින් වැඩබලන පත්වීම දීර්ඝ කර ඇත.) ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.22 සහ 2.23 මගින් සභාපතිවරයාගේ බලතල සහ කාර්යභාරයන් පිළිබඳ නිර්වචනය කෙරේ. බැංකුවේ ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ (CBPCG) වගන්ති 3.9 උපලේඛණය III මගින් ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයන්, රාජකාරී සහ වගකීම් පිළිබඳව නිර්වචනය කෙරේ.	අනුකූල විය.
3.1 (iii)	විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2022 වසර තුළ බැංකුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 19ක් පවත්වන ලදී. 2022 වසර තුළ චක්‍රලේඛණ යෝජනා 69 ක් සම්මත කරන ලද අතර ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී විධිමත්ව අනුමත කරන ලදී.	අනුකූල විය.
3.1 (iv)	අධ්‍යක්ෂවරුන්ට න්‍යාය පත්‍රය සඳහා යෝජනා ඇතුළත් කිරීම සඳහා වැඩපිළිවෙල	ව්‍යවහාරයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන් කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරයි. ආයතනික පාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහය 1.3 හි 2.16 (ආ) වගන්තිය පරිදි, සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට විධිවිධානයන් ක්‍රියාත්මකව පවතින අතර එහිදී එවැනි කරුණු සහ යෝජනා බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනයට සහ අවදානම් කළමනාකරණයට සම්බන්ධ විය යුතුය.	අනුකූල විය.
3.1 (v)	රැස්වීම පිළිබඳ නිවේදන	ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ 1.3 හි අධ්‍යක්ෂ මණ්ඩලය ලේකම්වරයාගේ කාර්යභාරයට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ලේකම්වරයා විසින් එක් එක් වසර සඳහා විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධ දින දර්ශනයක් සැකසීම සඳහා වගකීමේ විධිවිධානය ඇතුළත්ය. 2022 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දින දර්ශනය 2021 නොවැම්බර් 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත. තවද, පරිචයක් ලෙස, සෑම අධ්‍යක්ෂවරයකුටම විධිමත් රැස්වීම් වෙත සහභාගී වීමේ අවස්ථාව ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවම වශයෙන් දින 7කට පෙර දැනුම්දීමක් සිදු කෙරේ. එමෙන්ම, 2022 වසරේ පැවති විශේෂ සහ හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 7 සඳහා විධිමත් දැනුවීම් ලබා දී ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.1 (vi)	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඉදිරිපත් කළ අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීමේ කාර්ය සටහනට අනුව, සියළුම අධ්‍යක්ෂවරුන් 2022 වසර තුළ පවත්වන ලද රැස්වීම්වලින් තුනෙන් දෙකකට සහභාගී වී ඇත. සමහර අධ්‍යක්ෂවරුන් මාර්ගගතව සහභාගි වී ඇති අතර කිසිදු අධ්‍යක්ෂවරයෙක් අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි නොවී සිට නැත.	අනුකූල විය.
3.1 (vii)	සමාගම් ලේකම්වරයා පත්කිරීම සහ වගකීම් පැවරීම.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නීතිඥයෙක් වන අතර ඔහු/ඇය 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ 2.5.ඒ වගන්තිය සපුරාලයි. 2022 දෙසැම්බර් 22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩබලන ලේකම්වන, ශ්‍යාමා විජේකෝන් මහතාමය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස උසස් කර ඇත.	අනුකූල විය.
3.1 (viii)	සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් වෙත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රවේශය	ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.25 හි මේ සම්බන්ධ විධිවිධානයක් පවතී.	අනුකූල විය.
3.1 (ix)	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යාම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ (1.3 පිටපත)හි අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ කාර්යභාරයන් ඇමුණුම (iv) යටතේ මේ සම්බන්ධ විධිවිධානයක් ඇතුළත්ය. තවද, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇසුරුවක් තුළින් ප්‍රවේශය ඇත.	අනුකූල විය.
3.1 (x)	වාර්තා ප්‍රමාණවත් විස්තර සහිත වීම සහ නියාමන සහ අධීක්ෂණ අධිකාරීන් වෙත විමර්ශන ලේඛණ වශයෙන් සැළකිය හැකි වීම.	ලබා දී ඇති නිර්ණායක සහ සාමාජිකයින්ගේ තනි අදහස්, මණ්ඩලයේ අවසාන තීරණය, බැංකුවේ උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූලද යන්න වැනි අවශ්‍ය තොරතුරු අඩංගු බවට තොරතුරු මණ්ඩල වාර්තා සාක්ෂි ආවරණය කරමින් සවිස්තරාත්මක වාර්තා තබා ඇත. වැඩිදුර වාර්තා සහ භාවිතා කරන තොරතුරු තීරණවලට එළඹීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහන් කර ඇත.	අනුකූල විය.
3.1 (xi)	ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ හැකියාව	යෝග්‍ය අවස්ථාවන්හිදී බැංකුවේ වියදම මත, ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් පවතී.	අනුකූල විය.
3.1 (xii)	බැඳියා පිළිගැටුම සම්බන්ධයෙන් කටයුතු කිරීම.	1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති 11 මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳියා පිළිගැටුම සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ. අධ්‍යක්ෂවරුන්ට ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප සම්බන්ධයක් ඇති හෝ ඔහුට හෝ ඇයට සැලකියයුතු සම්බන්ධයක් ඇති කාරණාවකදී ඔහු ඡන්දය දීමෙන් වැලකී සිටීම සහ ඍණපූරණයකදී ගණනය නොකර සිටීම තුළින් මෙම ක්‍රියාපටිපටිය මගින් තවදුරටත් තහවුරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.13 හිද මේ සම්බන්ධ විධිවිධානයක් පවතී.	අනුකූල විය.
3.1 (xiii)	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා වෙන් කරන ලද කරුණු සම්බන්ධ නිල කාර්ය සටහන	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි වගන්ති 2.28හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කරන ලද බලතල පිළිබඳව නිර්වචනය කෙරේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.1 (xiv)	නුබුන්වත්භාවය පිළිබඳ ගැටළු පවතී නම් මහ බැංකුව වෙත දැනුම්දීම.	බැංකුව එහි බැඳීම් සපුරාලීමට හොඳැකි වන හෝ නොහැකි බවට හඳුනාගතහැකි බවට සලකන්නේනම්, බැංකුව යම් තීරණයක් ගැනීමට හෝ ක්‍රියාත්මක කිරීමට පෙර ඒ බව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිමේ අවශ්‍යතාව සම්බන්ධය අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ය.	අනුකූල විය.
3.1 (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව	මුදල් මණ්ඩලය විසින් ඉල්ලා සිටින ලද මට්ටම් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව වෙත ප්‍රාග්ධනය සපයනු ලැබ ඇත. අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කරන මාසික අනුකූලතා සහතිකය තුළින් මෙය ආමන්ත්‍රණය කොට ඇත.	අනුකූල විය.
3.1 (xvi)	වාර්ෂික වාර්තාව තුළ ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත්කිරීම.	මෙම නියෝගයෙහි වගන්ති 3 ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය ආයතනික පාලන වාර්තාව 2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 177 සිට 193 දක්වා ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.	අනුකූල විය.
3.1 (xvii)	අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයුම	සමාගම් ලේකම්වරයා විසින් වාර්ෂිකව සියළුම අධ්‍යක්ෂවරුන් වෙතින් ඇගයුම් අයදුම්පත් ලබාගනී. සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ඇගයුම් ආකෘති 2022 වසර සඳහා ලබාගත හැකි අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමය නියමිතය.	අනුකූල විය.
3.2	**අධ්‍යක්ෂවරුන් සංයුතිය**		
3.2 (i)	අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව	2022 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හතකට (7) නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විය. 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ ධූරය දරන ලද අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ. සුජීව රාජපක්ෂ මහතා කුමාර් ගුණවර්ධන මහතා සුදර්ශන් අහංගම මහතා (2022 අප්‍රේල් 7 දින සිට ඉල්ලා අස්විය.) ඉසුරු බාලපටබැඳි මහතා කේ ඒ විමලේන්තිරාජා මහතා (2022 මාර්තු 2 දින සිට ඉල්ලා අස්විය.) කීර්ති ගුණතිලක මහතා මංජුල වෙල්ලාලගේ මහතා භද්‍රානී ජයවර්ධන මිය (2022 මැයි 6 දින සිට ඉල්ලා අස්විය.) විශාඛා අමරසේකර මහත්මිය (2022 මාර්තු 2 දින සිට පත්කරන ලදී.) දුෂ්මන්ත කොටවත්ත මහතා (2022 ජූලි 8 දින සිය පත්කරන ලදී.)	අනුකූල විය.
3.2 (ii) (අ) සහ (ආ)	අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය	කිසිදු අධ්‍යක්ෂවරයකු වසර නවයක සේවා කාලය ඉක්මවා ගොස් නොමැත. අදාළ නැත.	අනුකූල විය.
3.2 (iii)	අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු නොමැත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.2 (iv)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු	වසර තුළදී නියෝගයට අනුකූලවීම සඳහා ප්‍රමාණවත් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය. 2022 වසර තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් පහත පරිදි වේ, සුජීව රාජපක්ෂ මහතා කුමාර් ගුණවර්ධන මහතා සුදර්ශන් අහංගම මහතා ඉසුරු බාලපටබැඳි මහතා කීර්ති ගුණතිලක මහතා මංජුල වෙල්ලාලගේ මහතා දුෂ්මන්ත කොටවත්ත මහතා	අනුකූල විය.
3.2 (v)	විකල්ප ස්වාධීන අධ්‍යක්ෂවරු	මහජන බැංකු පනතෙහි විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති අතර වසර තුළ එබඳු තත්ත්වයක් උද්ගත නොවීය.	අනුකූල විය.
3.2 (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා නිර්ණායක	1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති 8 යටතේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සිදුකෙරේ. මුදල් අමාත්‍යාංශය සහ වෙළෙඳ අමාත්‍යාංශයේ නියෝජිතයින් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් වන අතර අනෙකුත් අධ්‍යක්ෂවරු ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති.	අනුකූල විය.
3.2 (vii)	ගණපූරණයෙන් හරි අඩකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම.	බැංකුවේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අතර බැංකුවේ මනා පරිච සංග්‍රහයේ 2.3 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යවස්ථාපිත ගණපූරණය පහකි. 2022 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඉදිරිපත් කරන පැමිණීම් පරිදි, සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණයට අනුකූලතාවය දක්වා ඇති බව සනාථ කර ඇත.	අනුකූල විය.
3.2 (viii)	සන්නිවේදනය තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හඳුනාගෙන අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩයන් වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම.	සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, 2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 172 හි හෙළිදරව් කොට ඇත.	අනුකූල විය.
3.2 (ix)	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සඳහා නිල හා විනිවිද ක්‍රියාපටිපාටිය	1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 8 වගන්තිය යටතේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සිදුකෙරේ.	අනුකූල විය.
3.2 (x)	තාවකාලික පුරප්පාඩු සපුරාලමින් අධ්‍යක්ෂවරුන් යළි පත්කිරීම.	විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන බැවින් එවැනි තත්ත්වයක් උද්ගත නොවීය.	අනුකූල විය.
3.2 (xi)	අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම පිළිබඳ හේතු දැක්වීම.	මහජන බැංකු පනතෙහි 8 (4) වගන්තියේ විධිවිධාන අනුව, විෂය භාර අමාත්‍යවරයා වෙත ලිපියක් භාරදීමෙන් ඉල්ලා අස්වීම සිදුකිරීමට අධ්‍යක්ෂවරයකුට හැකි වේ. තවද, අමාත්‍යවරයා හට ගැසට් නිවේදනයක් නිකුත් කරමින් අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීමේ හැකියාවද පවතී. අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම සහ එම ඉල්ලා අස්වීමට හේතු ශ්‍රී ලංකා මහ බැංකුවට විධිමත් පරිදි දැනුම් දෙනු ලැබේ.	අනුකූල විය.
3.2 (xii)	කිසියම් බැංකුවක අධ්‍යක්ෂවරුන් හෝ සේවකයින් බවට පත්වන අයට වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු බවට පත්වීමේ තහනම	වාර්ෂික ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගෙන ඇත. තවද, අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ යාවත් කිරීම කාර්තුමය පදනමක් මත බෙදාහරිනු ලැබේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.3	**අධ්‍යක්ෂවරුන්ගේ හැකියාව හා යෝග්‍යතාවය ඇගයීමේ නිර්ණායකය**		
3.3 (i)	අධ්‍යක්ෂවරයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු වේ. සංක්‍රාන්ති විධිවිධාන	මනා පරිච සංග්‍රහයෙහි වගන්ති 2.1 යනතේ විධිවිධාන ලබාගත හැක. වසර 2022 තුළදී අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන කිසිදු අධ්‍යක්ෂවරයක් වයස අවුරුදු 70 ඉක්මවා නොමැත.	අනුකූල විය.
3.3 (ii)	අධ්‍යක්ෂවරුන්, සමාගම් 20කට වැඩි සංඛ්‍යාවක සහ විශේෂිත ව්‍යාපාර ආයතන වශයෙන් වර්ගීකරණය වන සමාගම් 10කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු නොකළ යුතුය.	අධ්‍යක්ෂවරුන්ගේ දිවුරුම් ප්‍රකාශ පරීදි, වසර තුළදී කිසිදු අධ්‍යක්ෂවරයකු, පරිපාලිතයන් සහ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව, සමාගම්/ව්‍යාපාර/ආයතන 20කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයකු නොවීය.	අනුකූල විය.
3.3 (iii)	බලපත්‍රලාභී බැංකුවක සිය තනතුර නැවැත්වීමේ දිනයේ සිට මාස හයක නිදහස් කාලසීමාවක් ඉක්මවා යාමට පෙර යම් අධ්‍යක්ෂ හෝ ප්‍ර.වි.නි. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍ර.වි.නි. ලෙස පත් නොකළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඉදිරිපත් කළ සහතික කිරීම අනුව, 2022 වසර තුළ වෙනත් බැංකුවකින් පත්කරන ලද අධ්‍යක්ෂවරයෙක්/ප්‍ර.වි.නි. නොවීය.	අනුකූල විය.
3.4	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද කළමනාකරණ කාර්යයන්**		
3.4 (i)	පැවරීම කටයුතු අවබෝධතාව සහ අධ්‍යයනය	මහජන බැංකු පනතෙහි වගන්ති 32 වගන්තිය ප්‍රකාර සිය බලතල බැංකුවේ ඕනෑම නිලධාරියකු වෙත පැවරීමේ සහ අවස්ථානුකූලව එය පාර්ශ්වීය වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම අවලංගු කිරීමේ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.	අනුකූල විය.
3.4 (ii)	බලය පැවරීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවිය යුතු වේ.		අනුකූල විය.
3.4 (iii)	බැංකුවේ මෙහෙයුම් සමඟ අදාළත්වය තහවුරු කිරීම සඳහා බලය පැවරුම් කටයුතු සමාලෝචනය	පවරන ලද බලතල බැංකුවේ අවශ්‍යතාවන්ට අදාළව පවත්නා බව සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ. වැඩිදුර ක්‍රමවේදයක් සකස් කර 2022 ජුනි 15 දින අනුකමිටු ඇගයිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.
3.5	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා**		
3.5 (i)	කාර්යභාර බෙදා වෙන්කිරීම්	සභාපති සහ ප්‍ර.වි.නි.ගේ කාර්යභාරයන් අදාල විෂයභාර අමාත්‍යවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන පුද්ගලයින් දෙදෙනෙක් විසින් සිදුකරයි.	අනුකූල විය.
3.5 (ii)	විධායක නොවන සභාපති සහ ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු පත්කිරීම.	2021 දෙසැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුවේ සභාපති ලෙස නැවත පත්කරන ලද සුජීව රාජපක්ෂ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. එමනිසා, ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් පත්කිරීමේ අවශ්‍යතාවන් පැන නැගුනේ නැත.	අනුකූල විය.
3.5 (iii)	සභාපති සහ ප්‍ර.වි.නි.ගේ අනන්‍යතාව සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමඟ යම් සම්බන්ධතා අනාවරණය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ ප්‍රධාන මූල්‍ය කළමනාකරුවන් සමඟ සියලු ගනුදෙනු වෙන වෙනම අනාවරණය කර ඇති අතර BIRMC වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.5 (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීමේ ක්‍රියාවලි	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව ස්වයං ඇගයීමේ ආකෘති ලබා ගන්නා අතර, ස්වයං ඇගයීම් ආකාතිවල මෙම නිර්ණායක් ඇතුළත්ය.	අනුකූල විය.
3.(5) (v)	නඩාය පත්‍රය පිළිබඳ වගකීම සභාපති දරන නමුත් සමාගමේ ලේකම් වෙත පැවරිය හැකි වේ.	සභාපතිවරයා සමග උපදේශකත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා නඩාය පත්‍රය සකසනු ලැබේ.	අනුකූල විය.
3.5 (vi)	අධ්‍යක්ෂවරුන් නිසි පරිදි දැනුවත් කොට ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවට තහවුරු කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතු වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් නිසි පරිදි දැනුවත් කොට ඇති බවට සභාපතිවරයා තහවුරු කරයි. කියවා බැලීමට ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් අධ්‍යක්ෂවරුන් වෙත නඩාය පත්‍රය සහ අදාළ පත්‍රිකා ලබාදෙනු ලැබේ. පසුගිය මාසයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වර්තා අධ්‍යක්ෂවරුන් අතර බෙදාහරින අතර වලංගු කිරීම/අනුමැතිය සඳහා ඉන්පසු එළඹෙන රැස්වීමේදී සභාගත කෙරේ.	අනුකූල විය.
3.5 (vii)	සියළුම අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ බැංකුවේ අභිමතයන් කෙරෙහි පෙරමුණ ගෙන කටයුතු කිරීම දිරිමත් කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව ඇගයීමේ ආකෘති ලබා ගනී. 2022 වසර සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් ඇගයීමේ ආකෘති අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.	අනුකූල විය.
3.5 (viii)	සියළුම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරුන් අතර සබඳතා දිරිමත් කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව ස්වයං ඇගයීමේ ආකෘති ලබා ගන්නා අතර සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන බැවින්, ස්වයං ඇගයීම් ආකෘතියෙහි වෙන වෙන කොටස් ඇතුළත් කර නොමැත.	අනුකූල විය.
3.5 (ix)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ විධායක වගකීම් සෘජු අධීක්ෂණයෙන් වැළකීම.	සභාපතිවරයා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සහ විධායක රාජකාරී සම්බන්ධයෙන් අධීක්ෂණය සඳහා සෘජුව සහභාගී නොවේ.	අනුකූල විය.
3.5 (x)	කොටස් හිමිකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනය සහතික කිරීම.	බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සන්නිවේදනය පවත්වාගනී. තවද, භාණ්ඩාගාර නියෝජිතයින් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර ඒ අනුව කොටස්හිමියාගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කෙරේ.	අනුකූල විය.
3.5 (xi)	ප්‍රධාන විධායක නිලධාරී දෛනික මෙහෙයුම්වල ඉහළම විධායක කාර්ය භාර නිලධාරී ලෙස කටයුතු කරයි.	මනා පරිච සංග්‍රහයෙහි ඇමුණුම iii මනා හි 2.22 වගන්තිය (ප්‍ර.වී.හි.ගේ කාර්යයන් හා වගකීම්) පරිදි, ඔහු බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරයේ දෛනික කළමනාකරණයේ ඉහළම විධායක කාර්ය භාර නිලධාරී වේ.	අනුකූල විය.
3.6	**අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ කමිටු**		
3.6 (i)	අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපනය, ඔවුන්ගේ කාර්යයන් සහ වාර්තාකරණය	බැංකුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව නමින් කමිටු හතරක් පිහිටුවා ඇත. ඉහත අවම අවශ්‍යතාවය හැර, බැංකුව අමතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හතරක්ද පිහිටුවා ඇත. මෙම කමිටුවල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම සහ සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර සභාගත කෙරේ. 2022 වාර්ෂික වාර්තාවේ 194 සිට 201 දක්වා පිටුවල එක් එක් අනුකමිටුවල වාර්තා ඇතුළත් වන අතර එම වාර්තාවලට එම කමිටුවල රාජකාරී, කාර්යභාරයන්, සහ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් ඇතුළත්ය.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.6 (ii)	විගණන කමිටුව		
a.	කමිටුවේ සභාපතිවරයා ගිණුම්කරණය සහ/හෝ ගණනය තුළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයක් වීම.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 ජූලි 8 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලදී. තොටවත්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ උපාධිය)ක් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCA) අධි සාමාජිකයෙකි. ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස බොහෝ රාජ්‍ය ආයතන සහ පුද්ගලික ආයතනවල වසර 38කට වැඩි පළපුරුද්ද සහිත වාර්තාවක් ඇති මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ග කළමනාකරණය සහ මහජන සම්බන්ධතා යන ක්ෂේත්‍රවල විස්තීර්ණ පළපුරුද්ද ඇති ප්‍රවීන නායකයෙකි.	අනුකූල විය.
b.	කමිටුව සම්පූර්ණයෙන්ම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේන් සමන්විත වීම.	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.	අනුකූල විය.
c.	විගණන කමිටු කාර්යයන්		
	(i) අදාළ ව්‍යවස්ථාවන්ට අනුකූලව ලබාදිය යුතු විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම.	රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. එමනිසා, බාහිර විගණකගේ සහභාගිත්වය තුළ ඉටුකිරීමට කාර්යභාරයක් මෙම කමිටුවට නොමැත.	අනුකූල විය.
	(ii) වරින් වර විගණකවරුන්ට නිකුත්කරන ශ්‍රී.ලං.ම. බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.	වරින් වර විගණකවරුන්ට නිකුත්කරන ශ්‍රී.ලං.ම. බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු පිළිබඳ කමිටුව නිර්දේශ කර ඇත.	අනුකූල විය.
	(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම සහ	අවශ්‍ය අවස්ථාවලදී කමිටුව විසින් අදාළ ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.	අනුකූල විය.
	(iv) සේවා කාලය, විගණන ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීම සහ සේවය තහනම් කිරීම	රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.	අනුකූල විය.
d.	බාහිර විගණකගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියෙහි ඵලදායිතාව සමාලෝචනය සහ නියාමනය	විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ.	අනුකූල විය.
e.	බාහිර විගණකගේ විගණන නොවන කාර්යන් සඳහා වෙන්කිරීම්	විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ.	අනුකූල විය.
f.	විගණනයේ විෂයපථය නිර්ණය කිරීම.	2022 නොවැම්බර් 16 දින පැවති විගණන කමිටු රැස්වීමේදී විගණනය ඇරඹීමට පෙරාතුව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමග විගණනයේ ස්වභාවය සහ විෂයපථය සාකච්ඡාකර සමාලෝචනය කර ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
g.	බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය	හෙළිදරව් කිරීම සඳහා පෙර සූදානම් කළ කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වාර්තා මුල්‍ය ප්‍රධානී විසින් කමිටුවට ඉදිරිපත් කරන විට, බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට ඇත. මුල්‍ය ප්‍රධානී විසින් 2022 වසර සඳහා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රධාන මූල්‍ය අනුපාත සහ උපකරණ පුවරුව ඉදිරිපත් කර ඇත. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා එය නිර්දේශ කර ඇත.	අනුකූල විය.
h.	අතුරු සහ අවසන් විගණනයන් සම්බන්ධයෙන් බාහිර විගණක සමඟ සාකච්ඡා කිරීම.	කමිටුව විගණකාධිපතිගේ නියෝජිතයා සමඟ රහසිගත සාකච්ඡාවක් පවත්වා ඇත.	අනුකූල විය.
i.	කළමනාකරණ ලිපිය සහ බැංකුවේ ප්‍රතිචාරය සමාලෝචනය	කමිටුව 2021 සඳහා කළමනාකරණ ලිපිය සහ එහි ප්‍රතිචාර සමාලෝචනය කළ අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය.
j.	**අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය**		
	(i) අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යයන් හී ප්‍රමාණවත්භාවය, සහ එහි රාජකාරී කරගෙන යාමට අවශ්‍ය බලය පිළිබඳ සෑහීමට පත්වීම.	කමිටුව මගින් විගණන සැලැස්ම සමඟ අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යය සාකච්ඡා කර ඇත.	අනුකූල විය.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල	සහකාර සාමාන්‍යාධිකාරී – විගණන විසින් 2022 නොවැම්බර් 16 දින විගණන සැලැස්ම 2023 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර කමිටුව විසින් විගණන සැලැස්ම සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය, මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණවල තත්ත්වය, ජාතික විගණන කාර්යාලය විසින් මතුකළ විමසුම්, මූලික කාර්යසාධන දර්ශක අත්කර ගැනීම් යනාදිය සාකච්ඡා කර ඇත. කමිටුව 2022 පෙබරවාරි 25 දින පැවති රැස්වීමේදී 2022 සඳහා විගණන සැලැස්ම සමාලෝචනය කර ඇත. කමිටුව 2022 සැප්තැම්බර් 16 දින පැවති රැස්වීමේදී 2022 විගණන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්මේ සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කර ඇත. තවද, විගණන කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ පිළිබඳ ගන්නාලද ක්‍රියාමාර්ග සහතික කරයි.	අනුකූල විය.
	(iii) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම.	එම්.එම්.ඒ. රිසාන් (ප්‍රධාන කළමනාකරු – විගණන) මහතාගේ කාර්යසාධන ඇගයීම 2022 පෙබරවාරි 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඊ ඒ එම් දිසානායක (සහකාර සාමාන්‍යාධිකාරී – විගණන) මහතාගේ කාර්යසාධන ඇගයීම 2022 සැප්තැම්බර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ජී එස් ගලප්පත්ති (සහකාර සාමාන්‍යාධිකාරී – විගණන)මහතාගේ කාර්යසාධන ඇගයීම 2022 සැප්තැම්බර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. එම් එම් එම් රිසාන් (ප්‍රධාන කළමනාකරු – විගණන) මහතාගේ කාර්යසාධන ඇගයීම 2022 නොවැම්බර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය.
	(iv) ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම සහ අවසන් කිරීම, නිර්දේශ කිරීම.	අදාළ නැත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
	(v) කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ පත්කිරීම හෝ අවසන් කිරීම ඇගයීමට ලක් කරන අතර එයට ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර සේවා සපයන්නන් ඇතුළත්ය. එමෙන්ම ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන් වෙත අවස්ථාවක් ලබා දේ.	අදාළ නැත.	අනුකූල විය.
	(vi) අභ්‍යන්තර විගණන අංශය එහි විගණන කටයුතුවලින් ස්වාධීන වන අතර එය අපක්ෂපාතිව, කාර්යක්ෂමව සහ නිසි වෘත්තිය ආරක්ෂා සහිතව කටයුතු කරයි.	2022 අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ තහවුරු කිරීම 2022 සැප්තැම්බර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය.
k.	අභ්‍යන්තර විමර්ශන	2022 ජූනි 20 දිනට විමර්ෂණ සහ විමසුම් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද අභ්‍යන්තර විමර්ෂණයේ ප්‍රගතිය 2022 සැප්තැම්බර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය.
l.	විගණන කමිටු රැස්වීම් වෙත සහභාගීවන්නන්	මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු නොමැති බැවින් මෙය අදාළ නොවේ.	අනුකූල විය.
m.	ප්‍රකාශිත අධිකාරී බලය, සම්පත් සහ තොරතුරු සඳහා ප්‍රවේශය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ආයතනික පාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ 1.3 හි 6.1.7 වගන්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අයිතීන් පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර කමිටුව එබඳු අධිකාරීත්වයකින් සමන්විත වන බවටද තහවුරු කෙරේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය නිර්දේශය 2022 සැප්තැම්බර් 16 දින පැවති රැස්වීමේදී කමිටුව විසින් තවදුරටත් සමාලෝචනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරයි.	අනුකූල විය.
n.	නිතිපතා පැවැත්වෙන රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් 2022 වසර සඳහා රැස්වීම් පහක් (05) පවත්වනු ලැබ ඇති අතර, ඒවායේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් පවත්වා ගෙන යනු ලැබේ.	අනුකූල විය.
o.	වාර්ෂික වාර්තාවේ අනාවරණය	2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 194 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු පිළිබඳ විස්තර හෙළිදරව් කොට ඇත. රැස්වීම් සංඛ්‍යාව සහ අදාළ රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම ආදී තොරතුරු 2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 172 හි අනාවරණය කොට ඇත.	අනුකූල විය.
p.	රැස්වීම් කාර්යය සටහන් පවත්වාගෙන යාම.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා පත්කර ඇති අතර ඔහු විසින් රැස්වීම් වාර්තා තබනු ලැබේ.	අනුකූල විය.
q.	තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය සහ බාහිර විගණක සමඟ සම්බන්ධය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය කාර්ය මණ්ඩල චක්‍රලේඛයක් මගින් කාර්ය මණ්ඩලයට දැනුම් දී ඇති අතර ප්‍රතිපත්තියට සිදුකරන සංශෝධන විගණන කමිටුව විසින් සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.6 (iii) මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව			
(a)	බැංකුවේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීසහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය	මුදල් අමාත්‍යාංශය මගින් සකසන ලද උපදෙස් මත අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්ට අනුව, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂය නිර්දේශය සමාලෝචනය කර ඇති අතර, ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට අදාළ පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍ය ගෙවීම්) නිර්ණය කිරීම සඳහා කමිටුව මගින් වන්දි/පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවනු ලැබ ඇත. කෙසේවෙතත්, බැංකුවේ සාමුහික ගිවිසුම අනුමැතිය ලබාගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.
(b)	අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි/ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළ අරමුණු සහ ඉලක්ක සැකසිම.	ප්‍ර.වි.නි සහ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළ අරමුණු හා ඉලක්ක 2022 මාර්තු 2 දින අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව මගින් ලේඛණගත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ස්වභාවය “විධායක නොවන” වෙති. එමනිසා අරමුණු සහ ඉලක්ක පවරා නොමැත.	අනුකූල විය.
(c)	ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල කාර්යසාධනය තක්සේරු කිරීම.	බැංකුවේ ආයතනික හා විධායක කළමනාකරණය සඳහා නව කාර්යසාධන ඇගයීම් මාර්ගකයක් සංවර්ධනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයයේ ලේකම්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ප්‍ර.වි.නි/සමානාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.	අනුකූල විය.
(d)	ප්‍ර.වි.නි ආශ්‍රිත කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හිදී හැරුණු විට, කමිටුවේ සියළුම රැස්වීම් වෙත ප්‍ර.වි.නි සහභාගි වේ.	අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවේ සංශෝධිත විෂය ක්ෂේත්‍රය සහ 2019 සැප්තැම්බර් 30 දින පැවති රැස්වීම මත, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීට අදාළ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන විටදී හැර කමිටුවේ සෑම රැස්වීමකදීම සහභාගි විය යුතු බව සනාථ කරයි.	අනුකූල විය.
3.6 (iv) නාමයෝජනා කමිටුව			
a.	අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය පත්කිරීම.	මහජන බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ. අනුප්‍රාප්තික සැලැස්ම 2022 සැප්තැම්බර් 8 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමත කරන ලදී. කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ ඊට ඉහළ මට්ටම සඳහා බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර ඇත. කෙසේවෙතත්, ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද විශේෂයෙන් ඉහළ බඳවා ගැනීමේ පටිපාටියේ නොමැත.	අනුකූල විය.
b.	අධ්‍යක්ෂවරුන් නැවත පත්කිරීම.	මහජන බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් කරනු ලැබීම හේතුවෙන් මෙම අවශ්‍යතාවය මතු නොවේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
c.	ප්‍ර.වි.නි ඇතුළුව ප්‍රධාන කළමනාකාරීත්ව ධූරයන් වෙත පත්කිරීමේදී සුදුසුකම් ලැබීමේ නිර්ණායකය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය ලෙස සලකන ලබන ප්‍ර.වි.නි, නියෝජ්‍ය හා සහකාර සාමාන්‍යාධිකාරී වැනි තනතුරුවලට පත් කිරීමේදී සළකා බැලීමට නියමිත සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ලක්ෂණ ආදිය ඇතුළත් තෝරාගැනීමේ නිර්ණායකයක් අනුමත කරනු ලැබ ඇති අතර එය ඔවුන්ගේ රැකියා විස්තරයට ඇතුළත් කර ඇත. කමිටුව බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය තෝරා ගැනීම සහ බඳවා ගැනීම සඳහා ඇගයීම් නිර්ණායකවලට අනුමැතිය ලබාදී ඇත. සියලුම ප්‍රධාන කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය සඳහා තෝරා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීම නාමයෝජනා කමිටුව විසින් සිදුකරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. තවද, බඳවා ගැනීමේ පරිපාටිය BHRRC වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.
d.	යෝග්‍ය සහ නිසි පුද්ගලයින්	2022 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශයන් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගෙන ඇති අතර ශ්‍රී.ලං.ම.බැ. වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය.
e.	අනුප්‍රාප්තික සැලැස්ම සහ නව විශේෂඥතාවය	අධ්‍යක්ෂ මණ්ඩලය මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය විසින් පත්කරනු ලබයි. ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාවට නංවා ඇත.	අනුකූල විය.
f	කමිටු සභාපතිවරයා සහ වඩා යහපත් වන පරිදි අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩිදෙනෙක් ස්වාධීනවීම ප්‍ර.වි.නි ආරාධිතව රැස්වීම් වලට සහභාගී වේ.	2022 දෙසැම්බර් 26 දිනට කමිටු සභාපතිත්වය 2022 දෙසැම්බර් 21 දින නැවත පත්කළ ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන, සුජීව රාජපක්ෂ මහතා විසින් විසින් දරනු ලැබේ. කුමාර් ගුණවර්ධන සහ කීර්ති ගුණතිලක අනෙකුත් සාමාජිකයින් වෙති. ප්‍ර.වි.නි. ආරාධිතව නාම යෝජනා කමිටු රැස්වීම් වෙත සහභාගී වේ.	අනුකූල විය.
3.6 (v)	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)/ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව		
a.	BIRMC සංයුතිය	කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණ සහ වෙනත් ආරාධිත වෘත්තිකයින්ගෙන් (ප්‍රධාන අනුකූලතා නිලධාරී ඇතුළුව) සමන්විත වේ. අනෙකුත් නිලධාරීන් ආරාධනයෙන් සහභාගි වෙති. කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන්නේ විශාඛා අමරසේකර මහත්මිය (BIRMC හි සභාපතිනි), ඉසුරු බාලපටබැඳි මහතා, දුෂ්මන්ත තොටවත්ත මහතා, රංජිත් කොඩිතුවක්කු මහතා වන අතර ආරාධනයෙන් රෝෂිණී විජේරත්න මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), සමන්ති සේනානායක මහත්මිය – සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ ඊ වී චිමි දිසානායක – ප්‍රධාන අභ්‍යන්තර විගණක කමිටුවට සහභාගි වේ.	අනුකූල විය.
b.	අවදානම් කළමනාකරණය	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින්, කළමනාකරණ තොරතුරු සහ අදාළ අවදානම් දර්ශකයන් ඔස්සේ, මාසික පදනමක් මත ණය, වෙළඳෙපොල, බැංකුවේ ක්‍රමෝපායික, මෙහෙයුම් සහ ද්‍රවශීලතා අවදානම් වැනි අවදානම් තක්සේරු කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාවට නංවනු ලැබ ඇති අතර, එබඳු අවදානම් කාර්තුමය අවදානම් වාර්තාව සහ අවදානම් අනුකෘතික වගුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.	අනුකූල විය.
c.	අවදානම සම්බන්ධව කළමනාකරණ මට්ටමේ කමිටුවල සමාලෝචනය	කමිටුව මගින්, වර්තමාන යොමු නිර්දේශවලට (TOR) සාපේක්ෂව, සියළුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්බව සහ ඵලදායීත්වය තක්සේරු කරනු ලැබ ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
d.	විචක්ෂණ මට්ටම් ඉක්මවා යන අවදානම් අවම කරගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග	කමිටුව මගින් විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් ඉක්මවා යන ලද අවදානම් දර්ශකයන් සමාලෝචනය කොට ඒ කෙරෙහි සැළකිල්ල යොමු කරනු ලැබ ඇත.	අනුකූල විය.
e.	රැස්වීම් වාර ගණන	2022 මූල්‍ය වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් රැස්වීම් හතරක් (04) පමණක් පවත්වා ඇත.	අනුකූල විය.
f.	විශේෂිත අවදානම් හඳුනා ගැනීමට සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහි ක්‍රියා එරෙහි ක්‍රියාමාර්ග	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ සහතික කිරීම අනුව, මෙය BHRRC නමින් හඳුන්වන වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් මගින් මෙහෙයවනු ලබයි.	අනුකූල විය.
g.	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් තක්සේරුකරණ වාර්තාව	කමිටුව සමාලෝචනය සඳහා අවදානම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.	අනුකූල විය.
h	අනුකූලතා කාර්යය	නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස් වෙත බැංකුවේ අනුකූලතාවය ඇගයීම සඳහා කමිටුව විසින් අනුකූලතා කාර්යයක් කමිටුව ස්ථාපිත කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල සමාජිකයෙකු වශයෙන් පත් කරන ලද අනුකූලතා නිලධාරියා විසින් අවශ්‍යතා/රෙගුලාසි සම්බන්ධ මාසික වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද, අනුකූලතා අවදානම සම්බන්ධ වාර්තාවක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ද භාරදෙනු ලබයි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුවත්කම සඳහා අනුකූලතා නිලධාරි විසින් මාසිකව අනුකූලතා වාර්තාවක් ඉදිරිපත් කරයි. බැංකුවේ සෑම ව්‍යාපාරික මෙහෙයුම් අංශයක් පුරාම අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්තීන් සමග බැංකුවේ අනුකූලතාවය තහවුරු කිරීම පිණිස, අනුකූලතා කාර්යය මගින් වාර්ෂිකව සෑම අංශ ප්‍රධානියකුගෙන්ම තහවුරුවක් ලබාගනී.	අනුකූල විය.
3.7	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**		
3.7 (i)	බැඳියා පිළිගැටුම වැළැක්වීම	2011.09.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14හි සම්බන්ධිත පාර්ශ්ව වර්ගීකරණ පිළිබඳ සාකච්ඡා කෙරෙන ලේඛණගත සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුවේ කවර හෝ ගනුදෙනුවක් අදාළ සම්බන්ධිත පාර්ශවයක් සමග සිදුකිරීමෙන් මතුවිය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගන්නා ආකාරය දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල සහ ඔවුන්ගේ සමීප ඥාතීන් ඉහත මනා පරිච සංග්‍රහයේ සම්බන්ධිත පාර්ශව ලෙස සඳහන් කර නොමැත. කෙසේවෙතත්, මූල්‍ය ප්‍රධානී 2018.03.16 දිනැති සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර ඇති අතර එය විගණන කමිටුව විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය ඇතුළු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කාර්තුමය වශයෙන් BIRMC වෙත ඉදිරිපත් කෙරේ.	අනුකූල විය.
3.7 (ii)	නියෝගය මගින් ආවරණය වන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14හි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග හඳුනාගන්නා ලේඛනගත ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුවේ කවර හෝ ගනුදෙනුවක් අදාළ සම්බන්ධිත පාර්ශවයක් සමඟ සිදුකිරීමෙන් මතුවිය හැකි බැඳියා පිළිගැටුම් වලක්වා ගන්නා ගන්නා ආකාරය දක්වා ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.7 (iii)	තහනම්කළ ගනුදෙනු	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14හි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග පිළිබඳ හඳුනා ගැනෙන ලේඛණගත ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුව මගින් කවර එවැනි පාර්ශ්වයක් වෙත, සමාන ආකාරයේ ගනුදෙනුවකදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවකුට ලබා නොදෙන ආකාරයේ "වඩාත් හිතවාදී සැලකීමක්" ලබාදීම සිදු නොකල යුතු බවට ප්‍රකාශ කෙරේ. අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් ලද ප්‍රකාශන සහ තොරතුරු මත පදනම්ව, බැංකුව පද්ධතියේ ජාතික හැඳුනුම්පත සහ CIF තුළින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගන්නා අතර, කාර්තුමය පදමනක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කෙරේ. එම යෝජනා මහබැංකුවේ මාර්ගෝපදේශ සමඟ අනුකූලවන බව සහතික කිරීම සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුවට පහසුකම් ලබාදීමට යෝජනා ඉදිරිපත් කිරීමට ස්ථාපිත ක්‍රියාවලියකි. බැංකුව මගින් සමාන ආකාරයේ ව්‍යාපාර කටයුත්තකදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවන් හට පිරිනමනු ලබන සැළකිල්ලට වඩා "වැඩි හිතවාදී සැළකීමක්" සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබානොදෙන බවට මේ මගින් තහවුරු කරයි.	අනුකූල විය.
3.7 (iv)	අධ්‍යක්ෂවරයකු වෙත හෝ අධ්‍යක්ෂවරයකුගේ සමීප ඥාතියකු වෙත අනුග්‍රහය දැක්වීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 ඈ හි ප්‍රකාරව අධ්‍යක්ෂවරයකු වෙත හෝ අධ්‍යක්ෂවරයකුගේ සමීප ඥාතියකු වෙත සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත අනුග්‍රහය (සමීප සම්බන්ධතා) දැක්වීම පිළිබඳව සාකච්ඡා කෙරෙන ලියවිල්ලක් ඇති අතර, එවැනි අනුග්‍රහය දැක්වීමක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කිරීම සඳහා, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් ඡන්දය භාවිත කළ යුතු අතර මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරන එකී ආරක්ෂාවක් තුළින් මෙම පහසුකම් ආරක්ෂා වේ. කෙසේවෙතත්, ඉහත පරිච සංග්‍රහයේ KMPs පහසුකම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කර නොමැත. 2022 වසර තුළ, අපගමනයන් කිසිවක් සිදු වී නොමැත.	අනුකූල විය.
3.7 (v)	බැංකුවේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පසුව පත් කෙරෙන පුද්ගලයින්, එම පුද්ගලයින් හා සම්බන්ධ අයවළුන්, හෝ එම පුද්ගලයින්ගේ සමීප ඥාතීන් වෙත දක්වන ලද අනුග්‍රහය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 ඉ මගින් අංක 3(7) (v)ට අවශ්‍ය පරිදි ලේඛණගත ප්‍රතිපත්තියක් ඇතුළත් වේ. 2022 වසර තුළ, අපගමනයන් කිසිවක් සිදු වී නොමැත.	අනුකූල විය.
3.(7) (vi)	බැංකු සේවකයින් හෝ ඔවුන්ගේ සමීප ඥාතීන් වෙත හිතවාදී සැළකිල්ල හෝ අනුග්‍රහය දැක්වීම.	ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ගනුදෙනු BIRMC වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය.
3.7 (vii)	මුදල් මණ්ඩල අනුමැතිය යටතේ අනුග්‍රහය දැක්වීම් ප්‍රේෂණ	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 ඊ ප්‍රකාරව මේ සම්බන්ධයෙන් බැංකුව සතුව ක්‍රියාවලියක් පවතී. 2022 වසර තුළ, අපගමනයන් කිසිවක් සිදු වී නොමැත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
3.8	**අනාවරණය කිරීම්**		
3.8 (i)	වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම.	බැංකුව මගින් මහබැංකුවේ නිශ්චිත ආකෘතින්ට සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වාර්ෂික/කාර්තුමය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදුකෙරේ. සියලුම වාර්ෂික/කාර්තුමය මූල්‍ය ප්‍රකාශ සකස් කර භාෂා තුනෙන්ම පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරේ.	අනුකූල විය.
3.8 (ii)	**වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම්**		
a.	විශේෂිත හෙළදරව් කිරීම් ඇතුළුව, වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද බව හැඟවෙන ප්‍රකාශයක්	මෙම කරුණු සම්බන්ධ ප්‍රකාශයක් 2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 206හි මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ ඇතුළත් වේ.	අනුකූල විය.
b.	බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 203හි "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" යටතේ හෙළිදරව් කොට ඇත.	අනුකූල විය.
c	අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායිතාව පිළිබඳ බාහිර විගණකගේ සහතිකය	2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 204 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධ "විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව" හෙළිදරව් කොට ඇත.	අනුකූල විය.
d	නම්, යෝග්‍යතාවය බැංකුව සමඟ ගනුදෙනු සහ බැංකුව මගින් ගෙවනු ලබන මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු	2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 26 සිට 27 දක්වා අධ්‍යක්ෂවරුන් විස්තර යටතේ නම්, සුදුසුකම් සහ අත්දැකීම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර හෙළිදරව් කොට ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිටු අංක 239 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 13 යටතේ හෙළිදරව් කොට ඇත. 2022 දී අධ්‍යක්ෂවරු සමඟ පාරිශ්‍රමික සහ ගනුදෙනුවල මුළු වටිනාකම රු '000 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ 6,405.0 රැකියාවෙන් පසු විශ්‍රාම වැටුප් - අවසන් කිරීමේ ප්‍රතිලාභ - කොටස් පදනම් ගෙවීම් - අනෙකුත් දිගු සහ කාලීන ගෙවීම් - ණය පත් ඇතුළුව ණය සහ අත්තිකාරම් 26,832.4 තැන්පතු 74,313.0 ආයෝජන -	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	තත්ත්වය
e.	බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස එක් එක් සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද මුළු අනුග්‍රහය	2022 දී සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද මුළු අනුග්‍රහය 2022 දී පාරිශ්‍රමික සහ ගනුදෙනුවල මුළු වටිනාකම	අනුකූල විය.

	රු '000	බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස (%)
අධ්‍යක්ෂවරු	26,832.4	0.02
අධ්‍යක්ෂවරුන්ගේ සමීප පවුලේ සාමාජිකයින්	-	-
ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP)	202,511.9	0.17
ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප පවුලේ සාමාජිකයින්	21,161.0	0.02
පරිපාලිත සමාගම්	54,671.1	0.05
උප පරිපාලිත සමාගම්	392,519.7	0.34
රජය සහ රජය සම්බන්ධ ආයතන	856,610,615.6	736.56
බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ සමීප පවුලේ සාමාජිකයෙක් සමඟ ඇති සැලකියයුතු සම්බන්ධතාව	10,177.0	0.01

f.	KMP සමඟ පාරිශ්‍රමික සහ ගනුදෙනුවල ලද මුළු අනුග්‍රහය	2022 දී KMP සමඟ පාරිශ්‍රමික සහ ගනුදෙනුවල ලද මුළු අනුග්‍රහය	අනුකූල විය.

	රු '000
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	526,381.3
රැකියාවෙන් පසු විශ්‍රාම වැටුප්	56,409.6
අවසන් කිරීමේ ප්‍රතිලාභ	-
කොටස් පදනම් ගෙවීම්	-
අනෙකුත් දිගුකාලීන ගෙවීම්	-
ණය කාඩ් ඇතුළුව ණය සහ අත්තිකාරම්	202,511.9
තැන්පතු	486,200.4
ආයෝජන	-

g.	බාහිර විගණකගේ අනුකූලතාවය පිළිබඳ සහතික කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික යහපාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සිද්ධිවාචක සොයාගැනීම් වාර්තාව ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාවේ ඇතුළත් කොට ඇත.	අනුකූල විය.
h.	විවක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති හා අභ්‍යන්තර පාලනයන් වෙත අනුකූලතාව තහවුරු කෙරෙන වාර්තාව	2022 වාර්ෂික වාර්තාවේ පිටු අංක 206 හි මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ මෙය හෙළිදරව් කොට ඇත.	අනුකූල විය.
i.	අනුකූලතා නොවන වාර්තාව	නොමැත.	අනුකූල විය.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව (BAC)

සංයුතිය

වසර අවසානය වන විට කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

සභාපති

දුෂ්මන්ත තොටවත්ත මහතා

අනෙකුත් සාමාජිකයින්

විශාඛා අමරසේකර මහත්මිය

කීර්ති ගුණතිලක මහතා

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), මූල්‍ය ප්‍රධානී සහ සහකර සාමාන්‍යාධිකාරී (අනුකූලතා) ආරාධනයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලට ආරාධනයෙන් සහභාගී වේ. රජයේ විගණක අධිකාරී ද ආරාධිතව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වෙති.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රැස්වීම් පහක් (05) ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ගණපූරණය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් (02) දෙදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකුකරණ පනත් නියෝගයේ විධිවිධාන ප්‍රකාරව, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි කටයුතු කමිටුවෙහි ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ප්‍රඥප්තිය මත පදනම් විය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිශ්චිතව පහත දැක්වෙන කාර්යභාරයන් ඉටු කරයි:

- ව්‍යවස්ථාව යටතේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා වෙත අනුකූලතාවය තහවුරු කිරීම පිණිස මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය
- අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණය පිළිබඳ පරීක්ෂා කිරීම.
- බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම.
- නීතිරීති හා රෙගුලාසි සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් වෙත අනුකූලතාවය නියාමනය කිරීම සඳහා පවතින ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කිරීම.

2022 දී අනාගත කටයුතු

සමාලෝචනයට ලක් වන වසර තුළ පහත දැක්වෙන කරුණු කෙරෙහි කමිටුවේ අවධානය යොමු විය.

- 2022 වසර සඳහා බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදීම සඳහා නිර්දේශ කරන ලදී.
- 2020.11.30 දිනට ශ්‍රී.ලං.ම.බැ. සීමිත විෂය ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ පසුවිපරම් පරීක්ෂණයන්හිදී මතු කරන ලද ගැටළු සාකච්ඡා සහ සමාලෝචනය කොට නිවැරදි කිරීමේ ප්‍රගතිය නියාමනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පිළිබඳ නිරන්තර සමාලෝචනය.
- තොරතුරු පද්ධති ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කොට යෝග්‍ය වෙනස්වීම් නිර්දේශ කරන ලද අතර ඒවායේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කිරීම.
- ශාඛා මෙහෙයුම්වල විෂමතා පිළිබඳ මූලික හේතු විශ්ලේෂණය වැනි විශේෂ වාර්තා සමාලෝචනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් අභ්‍යන්තර විගණන වාර්තා, ඒවායේ හඳුනාගත් ඌනතාවයන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්/අංශ ප්‍රධානීන් විසින් දක්වන ලද ප්‍රතිචාරයන් සළකා බලමින් අදාළ ඌනතාවයන් මගහැරවීම සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් නියාමනය කරන ලදී.


අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රැස්වීම්වල වාර්තා දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

2022 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, ශ්‍රී.ලං.ම.බැ. ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මගින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යන ලදී.

විගණන කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් ඉල්ලා සිටින ලද සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලතාවය දැක්වීම සඳහා අවශ්‍ය වූ සියළුම තොරතුරු සහ ලේඛණ සපයන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් තහවුරු කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් පවතින බවටත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය සියළුම වැදගත් කරුණු සහිතව සම්පාදනය කරන ලද බවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි අදහස වේ.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ප්‍රඥාප්තියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට බැඳී සිටින අතර ඵලදායී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ ප්‍රවර්ධනය කරනු ඇත.



දුෂ්මන්ත තොටවත්ත මහතා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2023 පෙබරාවරි 27

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව (BHRRC)

සංයුතිය

වසර අවසානය වන විට කමිටුව 2ට නොඅඩු සහ 3ට නොවැඩි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වූ අතර ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සෑම රැස්වීමකටම සහභාගි වීම අවශ්‍යය.

සභාපති

සුජීව රාජපක්ෂ මහතා

අනෙකුත් සාමාජිකයින්

ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ

මංජුල වෙල්ලාලගේ මහතා – අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී (වැඩබලන)
(2023 පෙබරවාරි 27 දින සිට)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ආරාධිතව රැස්වීම්වලට සහභාගී වන අතර බැංකුවේ වෙනත් නිලධාරීන්ට ද ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි වියහැක.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රැස්වීම් නවයක් (09) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි ගණපූරණය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් සහ ප්‍රවිනි/සාමාන්‍යාධිකාරිය.

කමිටුවේ කාර්යභාරය

- මානව සම්පත් හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් උපායමාර්ග ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වගකීමට බැඳී සිටී.
- බඳවා ගැනීමේ දී සහ වැටුප් සහ වෙනත් සේවක ප්‍රතිලාභ තීරණය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.
- කමිටුව ආයතන සහ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයින්ගේ රැකියා ගිවිසුම් සමාලෝචනය කරන අතර ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අරමුණු සහ ඉලක්ක සකස් කරයි.
- වර්ෂවර සකස්කළ අරමුණු සහ ඉලක්කවලට අනුව ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සිදුකරන අතර පාරිශ්‍රමික හා ප්‍රතිලාභ සංශෝධනය සඳහා පදනම තීරණය කරයි.

අනාගත අවධානය

සියලුම මානව සම්පත් සහ පාරිශ්‍රමික වැඩපිළිවෙල බැංකුවේ උපායමාර්ගය සමඟ වන බව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහතික කර සිටී.



සුජීව රාජපක්ෂ මහතා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (BIRMC)

සංයුතිය

කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරිවරයා සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) ගෙන් සමන්විත වන අතර බැංකුවේ වෙනත් නිලධාරීන් ආරාධනය අනුව සහභාගි විය හැකිය.

සභාපති

විශාඛා අමරසේකර මිය

අනෙකුත් සාමාජිකයින්

දුෂ්මන්ත තොටවත්ත මහතා – අධ්‍යක්ෂ

ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී (වැඩබලන)

රෝෂිනී විජේරත්න මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් නිලධාරියෙකුට ආරාධනය අනුව සහභාගි විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රැස්වීම් හතරක් (04)ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි ගණපූරණය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් සහ ප්‍රවිනි/සාමාන්‍යාධිකාරිය.

කමිටුවේ කාර්යභාරය

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද අවදානම් පරාමිති තුළ බැංකුවේ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම සඳහා කමිටුව වගකීමට බැඳී සිටී.
- යෝග්‍ය වූ අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු යොදාගනිමින්, ණය, වෙළඳෙපොල, ද්‍රවශීලතා, මෙහෙයුම්, තෙරතුරු තාක්ෂණ හා ක්‍රමෝපායික ආදී සියළුම අවදානම් තක්සේරු කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීමද කමිටුව සතු වේ.
- අවදානම් කළමනාකරණයට අදාළ වෙනත් වගකීම් අතර, කමිටුව මගින් ණය, මූල්‍ය, මෙහෙයුම්, නෛතික/අනුකූලතා ආශ්‍රිතව අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් අදාළ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමද සිදුකෙරේ.
- විශේෂ අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක ණය සීමාවන් තුළ එවැනි අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව වැනි කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණතාව සහ ඵලදායිත්වය සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.



විශාඛා අමරසේකර මිය
සභාපතිනිය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව (BECC)

සංයුතිය

වසර අවසානයේදී (එනම් 2022 දෙසැම්බර් 26) දිනට කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරිවරයාගෙන් සමන්විත විය.

සභාපති

කුමාර් ගුණවර්ධන මයා

අනෙකුත් සාමාජිකයින්

කීර්ති ගුණතිලක මයා – අධ්‍යක්ෂ

මංජුල වෙල්ලාලගේ මයා – අධ්‍යක්ෂ

රංජිත් කොඩිතුවක්කු මයා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී
(2022 දෙසැම්බර් 26 දිනට)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් ණය මාර්ග නිලධාරියෙකුට ආරාධනය අනුව සහභාගි විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රැස්වීම් විසි හතරක් (24)ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි ගණපූරණය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් ඇතුළු සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ණය කළමනාකරණ ව්‍යූහය අනුමත කිරීම සහ පැවරුම් මට්ටම ඇතුළුව ණය අනුමත කරන බලතල ස්ථාපිත කිරීම.
- ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීට පවරන ලද සීමාවන්ට වැඩි සියලුම ණය අනුමත කිරීම සහ සුදුසු අවස්ථාවලදී අමතර විකඟතා, ගිවිසුම් පැනවීම.
- ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීට ලබාදුන් අධිකාරියට වැඩි විකවර නිරවුල් කිරීම, පොළී සහන යෝජනා අනුමත කිරීම.
- ණය ආශ්‍රිත පද්ධති, ඒවායේ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය, නියාමනය සහ කළඹේ තත්ත්වය ඉහළ නැංවීමට කළඹේ අවදානම් මට්ටම් කළමනාකරණය කිරීම.
- පාලන ණය අවදානමේ විචක්ෂණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව බැංකුවේ ඵලදායී ණය අවදානම් කළමනාකරණය සහතික කිරීමට බැඳී සිටී.



කුමාර් ගුණවර්ධන මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව (BNC)

සංයුතිය

වසර අවසානයේදී කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත විය.

සභාපති

සුජීව රාජපක්ෂ මයා

අනෙකුත් සාමාජිකයින්

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා - අධ්‍යක්ෂ

මංජුල වෙල්ලාලගේ මයා - අධ්‍යක්ෂ

(2023 පෙබරවාරි 27 දින සිට)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

වැඩබලන ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී ආරාධනයෙන් රැස්වීමට සහභාගි වේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රැස්වීම් හයක් (06) ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවෙහි ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකි (03).

කමිටුවේ කාර්යභාරය

- කමිටුවේ ප්‍රධාන වගකීම වන්නේ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී හා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරා ගැනීමට/පත් කිරීමට ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීමයි. කමිටුව ප්‍රධාන වගකීම වන්නේ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී හා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවල පත් කිරීම හෝ උසස් කිරීම සඳහා යෝග්‍යතා නිර්ණායක කමිටුව සකස් කරයි.
- එමෙන්ම කමිටුව අමතර/නව ප්‍රවීනයන් සඳහා අවශ්‍යතාව සලකාබැලීම සහ විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලැස්ම සඳහා වගකීමට බැඳී සිටී.
- ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවල පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලියයුතු සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික ආකල්ප වැනි නිර්ණායක සකස් කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව බැංකුවේ සම්මත දිශානතියට අනුකූලව ආයතන සහ විධායක කළමනාකාරිත්වයේ සම්මත පත්වීම් සහතික කිරීමට බැඳී සිටී.



සුජීව රාජපක්ෂ මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව (BIBC)

සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු තිදෙනෙකු, ප්‍ර.වි.නි/ සාමාන්‍යාධිකාරීවරයා, භාණ්ඩාගාර ප්‍රධානී, සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) සහ ආරාධනය මත වෙනත් යම් නිලධාරියෙකුගෙන් සමන්විත වේ.

සභාපති

කුමාර් ගුණවර්ධන මයා

අනෙකුත් සාමාජිකයින්

විශාඛා අමරසේකර මිය – අධ්‍යක්ෂ

ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ

රංජිත් කොඩිතුවක්කු මයා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී

රෝෂිනී විජේරත්න මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ)

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී (වැඩබලන) (2022 දෙසැම්බර් 26 දිනට)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් නිලධාරියෙකුට ආරාධනය අනුව සහභාගි විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රැස්වීම් තුනක් (03) ක් පවත්වන ලදී.

ගණපූරණය


අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවෙහි ගණපූරණය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ආයෝජන බැංකුකරණ ආදර්ශය නිරන්තර සමාලෝචනය
- IBU මෙහෙයුම්වල සමාලෝචනය
- අනාගත සේවාදායකයින්ගේ නම් නිශ්කාශනය
- හවුල් කළමනාකරණ ගැටළු සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම.
- කළමනාකරණ ගාස්තු/තැරැව්කාර හුවමාරු පදනම අනුමැතිය
- නව ආයෝජන සහ බැංකු නිෂ්පාදන ඇතුළත් කිරීම සහ හඳුන්වාදීම සමාලෝචනය

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව බැංකුවේ ඵලදායී ආයෝජන සහතික කිරීමට අවධානය යොමු කරනු ඇත.



කුමාර් ගුණවර්ධන මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව (BITC)

සංයුතිය

වසර අවසානයේදී කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක්, ප්‍රධාන තොරතුරු නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ)ගෙන් සමන්විත විය. කමිටුවේ සාමාජිකයින් අධ්‍යක්ෂ නාමයෝජනා කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ.

සභාපති

කීර්ති ගුණතිලක මයා

අනෙකුත් සාමාජිකයින්

කුමාර් ගුණවර්ධන මයා – අධ්‍යක්ෂ

ධම්මික දාස මයා – ප්‍රධාන තොරතුරු නිලධාරී

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ)

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනය අනුව සහභාගි විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රැස්වීම් පහක් (05) ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවෙහි ගණපූරණය ප්‍රධාන තොරතුරු නිලධාරී ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

කමිටුව පහත කාර්යයන් ඉටු කිරීමට සවිගන්වා ඇත.

- තොරතුරු තාක්ෂණයේ සමස්ථ ප්‍රගතිය සමාලෝචනය
- අරමුදල්, පිරිස සහ උපකරණ අනුව තොරතුරු තාක්ෂණ සම්පත්වල ප්‍රමාණතාව සහ වෙන් කිරීම නිර්දේශ කිරීම.
- බැංකු අතර තොරතුරු තාක්ෂණ උපායමාර්ග, ආයෝජන හා ව්‍යාපෘති සඳහා තොරතුරු තාක්ෂණය මගින් ගනු ලබන මූලපිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ තොරතුරු තාක්ෂණය විසින් ආරම්භ කළ අරමුදල් ප්‍රමුඛතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව තොරතුරු තාක්ෂණ සහ මෙහෙයුම් බැංකුවේ උපායමාර්ගයන් හා පෙළ ගැසී ඇති බව සහතික කරනු ඇත.



කීර්ති ගුණතිලක මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව

2023 පෙබරවාරි 27

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව (BSPRC)

සංයුතිය

වසර අවසානයේදී කමිටුව සභාපති, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගෙන් සමන්විත විය.

සභාපති

සුජීව රාජපක්ෂ මයා

අනෙකුත් සාමාජිකයින්

ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ

විශාඛා අමරසේකර මිය – අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී (වැඩබලන)

(2023 පෙබරවාරි 27 දින සිට

ආරාධනයෙන් නිරන්තරව සහභාගිවන්නන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උපාය මාර්ග සැලසුම්, කාර්යසාධන කළමනාකරණ හා පර්යේෂණ) සහ බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනය අනුව සහභාගි විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

රැස්වීම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රැස්වීම් හතරක් (04) ක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවෙහි ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

- උපායමාර්ගික සැලසුම් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මතු වූ හා සාකච්ඡා කළ ප්‍රධාන කරුණු සමාලෝචනය හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- නිර්දේශ මත පදනම් වී ප්‍රතිපත්ති සංවර්ධනය
- උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි සඳහා මඟපෙන්වීම සහ මෙහෙයවීම ලබාදීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව බැංකුවේ දැක්ම සම්පූර්ණ කිරීම පිණිස එහි භාරකාර වගකීම ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.



සුජීව රාජපක්ෂ මයා
සභාපති
උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව

2023 පෙබරවාරි 27

මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

2007 අංක 11 දරන බැංකු පනතෙහි නියෝග යේ වගන්තිය 3:8 (ii) (ආ) ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහජන බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය ආශ්‍රිතව අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

බැංකුවේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ප්‍රමාණවත්බව සහ ඵලදායීතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") විසින් දරනු ලැබේ. එබඳු ප්‍රමාණවත්භාවයක් සහ ඵලදායීතාවයක් සම්බන්ධයෙන් සළකා බලන කල, බැංකුකරණ ව්‍යාපාරයේදී කළමනාකරණය කරන ලද පදනමක් මත ප්‍රතිලාභ හා අවදානම සමතුලනය අවශ්‍ය වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබන අතර, ඒ නිසාම අභ්‍යන්තර පාලන ක්‍රම මූලිකව බැංකුවේ අවදානම් දරා ගැනීමේ සුදානම ආශ්‍රිත සීමාවන් හෝ දර්ශකයන්ගෙන් කවර හෝ අපගමනයන් වෙතොත් ඒවා විශේෂ කොට දැක්විය හැකි පරිදි සකස් කරනු ලබයි.

මෙම තත්ත්වය තුළ, මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය අලාභ හෝ චංචා ආශ්‍රිත ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන්, අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සපයනු ලැබිය හැක්කේ, සාධාරණ සහතිකයක් වන නමුත් පූර්ණ සහතිකයක් නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මගින්, බැංකුව මුහුණදෙන සැළකිය යුතු අවදානම් හඳුනාගැනීම, තක්සේරුකරණය සහ කළමනාකරණය සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කරනු ලැබ ඇති අතර, මෙම ක්‍රියාවලියට ව්‍යාපාරික වටපිටාව හෝ නියාමන උපදේශයන්හි වෙනස්වීමක් සිදු වූ වහාම මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම ඇතුළත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සම්බන්ධයෙන් බැංකුවල අධ්‍යක්ෂවරුන් වෙත මාර්ගෝපදේශ" වලට අනුකූලව නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අදාළ මාර්ගෝපදේශයන්හි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිවලට අනුව මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය තක්සේරු කරනු ලැබ ඇත.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

මුහුණ පෑ අවදානම් හඳුනා ගනිමින් හා තක්සේරු කරමින් අවදානම හා පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපාරිපාටීන් ක්‍රියාත්මක කිරීමේදී, සහ මෙවැනි අවදානම් අවම කර පාලනය කිරීම සඳහා යෝග්‍ය වන අභ්‍යන්තර පාලනයන් සැකසීම, මෙහෙයවීම සහ නියාමනය තුළ කළමනාකාරීත්වය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකසුම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී, යොදාගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලීන්හි ප්‍රධාන ගති ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව සහ සුපිළිපන් බව සමාලෝචනය කිරීමේදී යොදාගත් ප්‍රධාන ක්‍රියාවලීන් වෙත පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ:


- බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතුවල ඵලදායීතාවය සහ බැංකුවේ මෙහෙයුම්වල ආයතනික අරමුණු, ක්‍රමෝපායන් සහ වාර්ෂික අයවැය කෙරෙහි මෙන්ම අනුමත ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝගයන් කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම උදෙසා මණ්ඩලය විසින් අනුකමිටු ස්ථාපනය කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින්, නියැදි හා ආවර්තිත ක්‍රියාපටිපාටීන් භාවිත කරමින් අඛණ්ඩවම අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් කෙරෙහි අනුකූලතාව සහ ඵලදායීත්වය පරීක්ෂා කරනු ලබන අතර, අනනුකූලතාවය සම්බන්ධ කවර හෝ සැළකිය යුතු සොයාගැනීමක් විශේෂ කොට දක්වනු ලැබේ. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් ලබාදීමේ අරමුණින් යුතුව, ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින්, සියළුම චේකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකෙරේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමාලෝචනය සඳහා ඔවුන්ගේ නිරන්තර රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, අභ්‍යන්තර විගණන අංශය, නියාමන අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කොට, අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය තක්සේරු කරනු ලැබේ. ඔවුන් විසින් විගණනයන්හි විෂයපථය හා තත්ත්වය සම්බන්ධ නිශ්චිත අවධානයකින් යුතුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනයද සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තා නිරන්තර පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කෙරේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ ඉදිරිපත් කෙරේ. (පිටු අංක 194 බලන්න).
- අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයුමට ලක් කිරීමේදී බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් අඛණ්ඩවම, බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළුම ක්‍රියාපටිපාටීන් සහ පාලනයන් විශ්ලේෂණය හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් අඛණ්ඩ පදනමක් මත මෙම ක්‍රියාපටිපාටීන් හා පාලනයන්ගේ සැකසුම හා ඵලදායීතාවය සම්බන්ධ යෝග්‍යතාවය නිර්ණය කරනු ලබයි.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS සහ SLFRS අනුගමනය කිරීමේදී, හඳුනාගැනීම, මිනුම්කරණය, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම සම්බන්ධ අවශ්‍යතා වෙත අනුකූලවීම සඳහා අදාළ ක්‍රියාවලීන් වෙත ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදුකෙරෙමින් පවතින අතරතුර, ණය හා අත්තිකාරම් හානිකරණය, ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම්, කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ අවදානම් කළමනාරණය හා සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීම් සම්බන්ධ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකෙරේ. මෙම ඇගයුම සඳහා බැංකුවේ පරිපාලිතයන් ඇතුළත් නොකරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2018 දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 (මූල්‍යමය උපකරණ) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. අවශ්‍ය ආදර්ශ ක්‍රියාත්මන කරන ලද අතර, ක්‍රියාවලි සහ පාලනයන් සැලසුම් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් කළමනාකරණ තොරතුරු පිළිබඳ ක්‍රියාවලි සහ SLFRS 9 අනුව වලංගුභාවය සහ අනුකූලතාවය සඳහා අවශ්‍ය වාර්තා පාලනයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

- සම්පූර්ණ ශාඛා ජාලය ආවරණය කරමින් පරිගණක සහය විගණන ශිල්ප/මෙවලම් භාවිතා කරමින් බැංකුවේ සමහර තෝරාගත් ක්‍රියාවලි පිළිබඳ දත්ත විශ්ලේෂණයක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් සැලකියයුතු සියලුම සොයා ගැනීම් ඔවුන්ගේ කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
- 2021 මූල්‍ය වර්ෂයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් දක්වන ලද අදහස් සැළකිල්ලට ගනිමින් අදාළ අවස්ථාවන්හිදී ඒවා යොදාගැනීමට පියවර ගැනුනි. ඵළඹෙන වසරේදී සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගැනීම ආශ්‍රිත පාලන ලේඛණගත කිරීම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිසි පියවර ගන්නා ලදී.

තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලීන් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය තුළින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබාදීමට සැලසුම් කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,



දුෂ්මන්ත තොටවත්ත
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව



විශාඛා අමරසේකර මිය
අධ්‍යක්ෂ

2023 මාර්තු 2

අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/D/PB/2023/04
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 20 March 2023

මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරනු ලබන්නේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුලත් වන මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ("ප්‍රකාශනය") පිළිබඳ තහවුරුවකි.

කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ" ප්‍රකාරව ප්‍රකාශනය පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීමට බැඳී සිටී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050 ට (සංශෝධිත) මාගේ වගකීම සහ අනුකූලතාව

මගේ වගකීම් වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධයෙන් බැංකුව සඳහා වන තහවුරු වාර්තාව තහවුරු කිරීමේ කාර්යයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE) 3050 (සංශෝධිත)ට අනුකූලව මම මගේ කාර්යය සිදු කළෙමි. කලමනාකාරිත්වය සියලුම වැදගත් අංශයන් හි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සකස් කර ඇතිද යන්න පිළිබඳ සීමිත සහතිකයක් ලබාගැනීමට මා විසින් ක්‍රියාපටිපාටි සැලසුම්කර ඉටුකළයුතු බව මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ. මෙම සහහභාගිත්වයේ අරමුණ සඳහා, යම් වාර්තා යාවත් කිරීම හෝ නැවත නිකුත් කිරීම මෙන්ම මෙම සහභාගිත්වය තුළ, මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සඳහා මා වගකීමට බැඳී නොමැත.

ඉටු කරන ලද කාර්යය සාරාංශය

මගේ කාර්යය සිදුකරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීම සඳහාය.

ඉටු කරන ලද ක්‍රියාපටිපාටීන්, නියෑදි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලීන් සඳහා උපකාරී වන ලිපි ලේඛනවල පැවත්ම මත මූලික වශයෙන් සීමා වේ.

ප්‍රකාශනයෙන් සියළුම අවදානම් හා පාලනයන් අනාවරණය වන්නේදැයි මවිසින් සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටිය පිළිබඳ මතයක් පළකිරීම හෝ SLSAE 3050 (සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ. එසේම වාර්ෂික වාර්තාවේ අනාවරණය වන කිසියම් සැලකිය යුතු ගැටළුවල වැදගත් අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලබන ක්‍රියාවලීන්ගෙන් ඇත්ත වශයෙන්ම ගැටළුවලට පිළියම් යෙදෙන්නේ ද යන්න මා විසින් සලකා බැලීමත් SLSAE 3050 (සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ.

ප්‍රකාශනය සකස් කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව සම්බන්ධයෙන් බංකුවේ ස්වභාවය පිළිබඳ මගේ අවබෝධය සම්බන්ධයෙන් මගේ විනිශ්චය තෝරාගත් ක්‍රියාපටිපාටිය මත රැඳී පවතී. මම ලබාගත් සාක්ෂි මාගේ නිගමනය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි පදනම් කරගෙන, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීත්වය සමාලෝචනයෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර ඇති ක්‍රියාවලිය සම්බන්ධයෙන් මගේ අවබෝධයට අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු කිසිවක් අපගේ අවධානයට ලක් වී නොමැත.

ඩබ් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

2023 මාර්තු 20

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

205

මූල්‍ය ප්‍රකාශන

206 / මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

207 / මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

209 / ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

210 / විස්තීර්ණ ආදායම සම්බන්ධ ප්‍රකාශය

211 / මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

212 / ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

214 / ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

216 / මුදල් ප්‍රවාහ ප්‍රකාශය

217 / මුදල් ප්‍රකාශවලට සටහන්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

අධ්‍යක්ෂවරුන්ගේ සහ විගණකවරුන්ගේ වගකීම පැහැදිලි කිරීම සඳහා මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත සඳහන් ප්‍රකාශ තුළ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ

බැංකුව මගින් එහි සියලු ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත්ව ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ අදාළ වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ලාභ/අලාභ පිළිබඳ සත්‍ය වූද සාධාරණ වූද අදහසක් ලබාගත හැකි ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කෙරෙන බවට තහවුරු කිරීමේ වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් පවත්වනු ලබන සමාලෝචන රැස්වීම් සහ විගණන කමිටුව ඔස්සේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ කළමනාකාරිත්වයෙහි වගකීම් අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 194 පිටුවෙහි ඉදිරිපත් කොට ඇත.

2022 වර්ෂය වෙනුවෙන් වන පිටු අංක 209 සිට 324 දක්වා ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී තමන් සාධාරණ වූද විචක්ෂණශීලී වූද විනිශ්චයන් සහ ඇස්තමේන්තු මූලික කර ගනිමින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකමතික පදනමක් මත යොදා ගනු ලැබූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි.

අඛණ්ඩතා පැවැත්ම

බැංකුවට දැකියහැකි අනාගතයක් සඳහා එහි ව්‍යාපාර කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇතැයි යන අදහස සමඟ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අධ්‍යක්ෂවරු අඛණ්ඩතා පැවැත්ම පදනම යොදාගෙන ඇත.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායි සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර ඇත. මෙය අභ්‍යන්තර පරීක්ෂාවන්, අභ්‍යන්තර විගණනය සහ නිසි ආකාරයෙන් බැංකු ව්‍යාපාරය කරගෙන යාමට සහ වත්කම් ආරක්ෂා කිරීමට සහ වාර්තාවල නිරවද්‍යතාව සහ විශ්වාසය ආරක්ෂා කිරීමට අවශ්‍ය මූල්‍ය සහ වෙනත් පාලනයන්ගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලනය, අවදානම් රුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල ඵලදායිත්වය සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් ආශ්‍රිත රාජකාරී ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවන අතර අවදානම් පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති රාමුව, ප්‍රමිති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම ප්‍රමාණාත්මතාව සහ ඵලදායිතාව සහතික කරමින් අවදානමට අදාළ සියලුම අංශවලට ස්වාධීනව පාලනය ලබා දේ. අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව 196 පිටුවේ දැක්වේ. විචක්ෂණ අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති හා අභ්‍යන්තර පාලන වලට අනුකූලව කටයුතු කරන ලද බවටත් ඕනෑම කරුණක පවතින අනනුකූලතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව විගණකාධිපති බැංකුවේ විගණකවරයා වන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ අවසන් මතය නිකුත් කරන අතර, එය පිළිවෙලින් 202 සහ 203 යන පිටුවල ප්‍රකාශ කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගය සමඟ අනුකූලතා මට්ටම් සහතික කරයි.

අනුකූලතාව

මෙම වාර්තාවේ පිළියෙල කොට ඉදිරිපත් කොට ඇති 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ ඊට අදාළ සංශෝධන සමඟ අනුකූල වේ. බාහිර විගණකවරයාගේ වාර්තාව අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් මගින් එදිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කරයි. ඒ අනුව, මෙම ප්‍රකාශය තුළ දක්වා ඇති පරිදි සිය වගකීම් මුදාහැර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2023 පෙබරාවරි 27

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව



මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මහජන බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී.

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (1) වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයාට පැවරෙන බලතල අනුව 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද නියෝගයක් මගින් එකී පනතේ 11 කොටසේ විධිවිධානවලින් බැංකුව නිදහස් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 බැංකුවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

බැංකුවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කරන එහි ඇති මාගේ විගණන වාර්තාව ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව මම කියවීමේදී, එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතීනම්, යථා කාලයේදී සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථා තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකාරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, වේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී වෙනත් කරුණු අතර, මා හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ සැලකියයුතු දුර්වලතා ඇතුළුව වැදගත් විගණන සොයාගැනීම් පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන ඇතුළත්ය

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (අෘ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (අෘ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෘ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුව සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

2.2.4 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.



ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	වෙනස %	2022 රු. '000	2021 රු. '000	වෙනස %
දළ ආදායම	6	357,228,609	207,249,820	72.4	391,204,198	236,795,041	65.2
පොළි ආදායම		321,935,983	197,330,011	63.1	351,386,736	222,362,450	58.0
පොළී වියදම		(246,177,918)	(114,869,171)	114.3	(260,351,661)	(125,487,671)	107.5
ශුද්ධ පොළී ආදායම	7	75,758,065	82,460,840	-8.1	91,035,075	96,874,779	-6.0
ගාස්තු හා කොමිස් ආදායම්		16,397,745	8,268,168	98.3	17,213,747	9,645,136	78.5
ගාස්තු හා කොමිස් වියදම්		(828,675)	(597,786)	38.6	(828,675)	(597,786)	38.6
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	8	15,569,070	7,670,382	103.0	16,385,072	9,047,350	81.1
වෙළෙඳ කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	9	17,026,226	(1,345,029)	-1365.9	17,019,836	(1,207,608)	-1509.4
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	10	1,868,655	2,996,670	-37.6	5,583,879	5,995,063	-6.9
මුළු මෙහෙයුම් ආදායම		110,222,016	91,782,863	20.1	130,023,862	110,709,584	17.4
හානිකරණ අලාභයන්	11	(33,346,451)	(14,472,820)	130.4	(34,352,837)	(14,485,458)	137.2
ශුද්ධ මෙහෙයුම් ආදායම		76,875,565	77,310,043	-0.6	95,671,025	96,224,126	-0.6
සේවක මණ්ඩල වියදම්	12	(26,602,748)	(22,771,935)	16.8	(32,200,568)	(27,743,883)	16.1
වෙනත් වියදම්	13	(20,738,787)	(17,289,578)	19.9	(26,787,783)	(22,771,171)	17.6
මූල්‍ය සේවාවන් මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය		29,534,030	37,248,530	-20.7	36,682,674	45,709,072	-19.7
මූල්‍ය සේවා මත බදු		(8,195,633)	(6,861,930)	19.4	(9,992,022)	(8,473,708)	17.9
මූල්‍ය සේවා මත බදු වලට පසු මෙහෙයුම් ලාභය		21,338,397	30,386,600	-29.8	26,690,652	37,235,364	-28.3
ආශිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස (බදු පසු)		-	-		-	10,893	-100.0
බදු පෙර ලාභය		21,338,397	30,386,600	-29.8	26,690,652	37,246,257	-28.3
ආදායම් බදු වියදම්	14	(4,146,339)	(6,666,457)	-37.8	(6,165,213)	(9,158,609)	-32.7
වසර සඳහා ලාභය		17,192,058	23,720,143	-27.5	20,525,439	28,087,648	-26.9
ලාභය බෙදියන ආකාරය							
බැංකුවේ කොටස් හිමියන්		17,192,058	23,720,143	-27.5	19,571,989	26,350,975	-25.7
පාලනයට යටත් නොවන හිමිකම්		-	-		953,450	1,736,673	-45.1
		17,192,058	23,720,143	-27.5	20,525,439	28,087,648	-26.9
කොටසකට ඉපයීම	15						
සාමාන්‍ය කොටසකට අදාළ මූලික ඉපැයුම් (රු.)	15.1	17,192	23,720	-27.5	19,572	26,351	-25.7
සාමාන්‍ය කොටසකට අදාළ තනුක ඉපැයුම් (රු.)	15.2	70	97	-27.5	80	108	-25.7

පිටු අංක 217 සිට 324 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් ලෙස සැලකේ.

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වසර සඳහා ලාභය	17,192,058	23,720,143	20,525,439	28,087,648
වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම්)				
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය නොකරන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මිනිනු ලබන ස්කන්ධ උපකරණ මත ශුද්ධ ලාභ/අලාභ	52,869	(316,074)	(121,202)	(312,977)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	(3,304,393)	12,959,137	(3,177,074)	12,943,725
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ලාභ/(අලාභ) වල විලම්බිත බදු බලපෑම	991,318	(3,110,193)	953,496	(3,106,359)
ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන ලාභය	3,507,183	3,672,851	4,379,820	3,822,851
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය ලාභය මත විලම්බිත බදු බලපෑම	(1,052,155)	(881,484)	(1,313,946)	(917,484)
ආරම්භක ශේෂය මත ආදායම් බදු අනුපාතයේ වෙනස මත විලම්භිත බදු බලපෑම	(2,056,688)	245,293	(2,056,688)	245,293
	(1,861,866)	12,569,530	(1,335,594)	12,675,049
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කරන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මිනිනු ලබන ණය උපකරණ මත ශුද්ධ ලාභ/අලාභ (අපේක්ෂිත ණය අලාභ (ECL) ඇතුළුව)	(12,354)	713	(299,989)	(92,557)
ඉහත කරුණු මත විලම්බිත බදු බලපෑම	-	-	137,822	30,075
විදේශ මෙහෙයුම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශ පරිවර්තනය මත ශුද්ධ ලාභ/(අලාභ)	-	-	1,458,432	174,124
	(12,354)	713	1,296,265	111,642
වසර සඳහා වෙනත් විස්තීර්ණ විස්තීර්ණ ආදායම (බදු පසු)	(1,874,220)	12,570,243	(39,329)	12,786,691
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	15,317,838	36,290,386	20,486,110	40,874,339
ලාභය බෙදීයන ආකාරය				
බැංකුවේ කොටස් හිමියන්	15,317,838	36,290,386	18,561,941	39,105,903
පාලනයට යටත් නොවන හිමිකම්	-	-	1,924,169	1,768,436
	15,317,838	36,290,386	20,486,110	40,874,339

පිටු අංක 217 සිට 324 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් ලෙස සැළකේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2022 රු. '000	බැංකුව 2021 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2022 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් හා මුදල් සමාන දෑ	17	66,842,171	57,538,351	16.2	68,077,027	58,836,831	15.7
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	18	67,602,313	56,717,820	19.2	67,602,313	56,717,820	19.2
බැංකුවල ඇති තැන්පතු	19	–	–	–	3,028,550	3,325,726	-8.9
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	14,882,584	441,877	3268.0	14,882,584	441,877	3268.0
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	21	5,556,754	1,558,850	256.5	5,915,926	2,553,546	131.7
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව							
බැංකුවලට ණය හා අත්තිකාරම්	22	7,689,150	10,131,952	-24.1	7,689,150	13,398,055	-42.6
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	23	1,783,106,693	1,835,697,108	-2.9	1,915,771,684	1,990,689,061	-3.8
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	24	913,099,927	587,320,182	55.5	928,885,518	600,079,625	54.8
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ වටිනාකමට							
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මිනිනු ලබන ස්කන්ධ උපකරණ	25	1,661,656	1,621,375	2.5	1,844,574	1,889,144	-2.4
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සෙ සාධාරණ අගයට මිනිනු ලබන ණය උපකරණ	26	10,378,370	9,399,272	10.4	11,428,832	10,596,723	7.9
පරිපාලිතයන්හි ආයෝජන	27	4,280,522	3,572,824	19.8	–	–	–
දේපළ, පිරියත හා උපකරණ සහ වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්	28	49,330,080	46,761,157	5.5	59,780,131	56,432,293	5.9
අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය	29	1,719,177	2,077,544	-17.2	1,859,475	2,252,557	-17.5
වෙනත් වත්කම්	30	45,879,055	34,802,224	31.8	46,368,814	35,396,730	31.0
මුළු වත්කම්		2,972,028,452	2,647,640,536	12.3	3,133,134,578	2,832,609,988	10.6
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	31	111,452,491	107,745,916	3.4	122,696,978	122,397,825	0.2
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	1,888,478	1,761,220	7.2	1,888,478	1,761,220	7.2
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	32	2,371,518,898	2,071,532,612	14.5	2,450,079,037	2,168,674,742	13.0
වෙනත් ණය ගැනීම්	33	191,527,573	241,419,125	-20.7	191,527,573	241,419,125	-20.7
ප්‍රවර්තන බදු බැරකම්		6,372,157	6,452,823	-1.3	8,297,080	8,512,150	-2.5
ශුද්ධ විලම්බිත බදු බැරකම්	34	606,207	2,687,330	-77.4	570,529	3,194,714	-82.1
වෙනත් බැරකම්	35	106,765,050	31,102,734	243.3	115,961,714	43,451,531	166.9
යටත් කරන ලද කාල ණය	36	36,603,467	48,861,680	-25.1	52,781,563	65,560,465	-19.5
මුළු වගකීම්		2,826,734,321	2,511,563,440	12.5	2,943,802,952	2,654,971,772	10.9
ස්කන්ධය							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	37	12,201,998	12,201,998	–	12,201,998	12,201,998	–
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	38	10,070,131	9,210,528	9.3	10,070,131	9,210,528	9.3
වෙනත් සංචිත	39	38,397,830	35,902,287	7.0	41,452,506	38,160,081	8.6
රඳවාගත් ඉපැයුම්	40	84,624,172	78,762,283	7.4	111,194,555	104,755,265	6.1
කොටස්හිමියන්ගේ මුළු හිමිකම්		145,294,131	136,077,096	6.8	174,919,190	164,327,872	6.4
පාලනයට යටත් නොවන හිමිකම්		–	–	–	14,412,436	13,310,344	8.3
මුළු හිමිකම්		145,294,131	136,077,096	6.8	189,331,626	177,638,216	6.6
මුළු හිමිකම් සහ වගකීම්		2,972,028,452	2,647,640,536	12.3	3,133,134,578	2,832,609,988	10.6
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41	370,648,773	428,771,195	-13.6	375,288,336	443,842,195	-15.4

පිටු අංක 217 සිට 324 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් ලෙස සැළකේ.

සහතික කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

අසාමි ඒ අහමට්

මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.
මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් පහත අත්සන් යොදා ඇත.

සුජීව රාජපක්ෂ
සභාපති
2023 මාර්තු 2
කොළඹ

දුෂ්මන්ත තොටවත්ත
අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී (වැඩබලන)

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස්	පැවරූ ප්‍රාග්ධනය
	රු. '000	රු. '000
2021 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)	-	-
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	-	-
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
ගැලපීම: 2022 අංක 14 දරණ අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බදු (සටහන 14.5)		
2022 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම් (සටහන 38)	-	-
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ (සටහන 39.6)	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – බැංකුව

සංචිත					
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	**ප්‍රත්‍යාගණන සංචිත රු. '000**	**වෙනත් සංචිත රු. '000**	**FVOCI මූල්‍ය වත්කම් සඳහා ඇති සංචිත රු. '000**	**රඳවාගත් ඉපයුම් රු. '000**	**එකතුව රු. '000**
8,024,521	18,748,933	13,574,329	535,975	48,897,842	101,983,598
–	–	–		23,720,143	23,720,143
–	2,791,367	–	(315,361)	10,094,237	12,570,243
–	2,791,367	–	(315,361)	33,814,380	36,290,386
1,186,007	–	567,044		(1,753,051)	–
–	–	–		(2,196,888)	(2,196,888)
1,186,007	–	567,044	–	(3,949,939)	(2,196,888)
9,210,528	21,540,300	14,141,373	220,614	78,762,283	136,077,096
				(5,439,713)	(5,439,713)
9,210,528	21,540,300	14,141,373	220,614	73,322,570	130,637,383
–	–	–	–	17,192,058	17,192,058
	2,455,028		40,515	(4,369,763)	(1,874,220)
–	2,455,028	–	40,515	12,822,295	15,317,838
859,603	–	–	–	(859,603)	–
–	–	–	–	(661,090)	(661,090)
859,603	–	–	–	(1,520,693)	(661,090)
10,070,131	23,995,328	14,141,373	261,129	84,624,172	145,294,131

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස්	පැවරූ ප්‍රාග්ධනය
	රු. '000	රු. '000
2021 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය		
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්		
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ		
ගෙවූ ලාභාංශ		
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
ගැලපීම: 2022 අංක 14 දරණ අධිභාර පනත යටතේ අයකළ අධිභාර බදු (සටහන 14.5)		
2022 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම් (සටහන 38)	-	-
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ (සටහන 39.6)	-	-
ගෙවූ ලාභාංශ	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – සමූහය

සංචිත							
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	වෙනත් සංචිත රු. '000	FVOCI මූල්‍ය වත්කම් සඳහා ඇති සංචිත රු. '000	රඳවාගත් ඉපයුම් රු. '000	එකතුව රු. '000	පාලනයට යටත් නොවන හිමිකම් රු. '000	මුළු හිමිකම් රු. '000
8,024,521	20,587,993	13,842,861	492,808	72,268,676	127,418,857	11,691,908	139,110,765
				26,350,975	26,350,975	1,736,673	28,087,648
	2,876,867	130,593	(338,085)	10,085,553	12,754,928	31,763	12,786,691
–	2,876,867	130,593	(338,085)	36,436,528	39,105,903	1,768,436	40,874,339
1,186,007		567,044		(1,753,051)	–		–
				(2,196,888)	(2,196,888)	–	(2,196,888)
					–	(150,000)	(150,000)
1,186,007	–	567,044	–	(3,949,939)	(2,196,888)	(150,000)	(2,346,888)
9,210,528	23,464,860	14,540,498	154,723	104,755,265	164,327,872	13,310,344	177,638,216
				(7,309,533)	(7,309,533)	(623,273)	(7,932,806)
9,210,528	23,464,860	14,540,498	154,723	97,445,732	157,018,339	12,687,071	169,705,410
–	–	–	–	19,571,989	19,571,989	953,450	20,525,439
	2,929,733	565,090	(202,398)	(4,302,473)	(1,010,048)	970,719	(39,329)
–	2,929,733	565,090	(202,398)	15,269,516	18,561,941	1,924,169	20,486,110
859,603	–	–	–	(859,603)	–	–	–
–	–	–	–	(661,090)	(661,090)	–	(661,090)
–	–	–	–	–	–	(198,804)	(198,804)
859,603	–	–	–	(1,520,693)	(661,090)	(198,804)	(859,894)
10,070,131	26,394,593	15,105,588	(47,675)	111,194,555	174,919,190	14,412,436	189,331,626

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	බැංකුව 2022 රු. '000	බැංකුව 2021 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය 2021 රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්					
බදු පෙර ලාභය		21,338,397	30,386,600	26,690,652	37,246,257
ගැලපීම					
බදු පෙර ලාභවල ඇතුළත් මුදල් නොවන අයිතම	46	26,915,055	21,016,209	29,402,338	23,549,038
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	47	(5,472,100)	(206,371,943)	19,946,214	(218,238,165)
මෙහෙයුම් බැරකම්වල වෙනස්වීම්	48	324,168,512	382,453,165	300,749,935	388,521,877
පරිපාලිත හා වෙනත් ව්‍යාපාර වෙතින් ලද ලාභාංශ ආදායම		(908,626)	(1,802,759)	(207,360)	(174,065)
යටත් කරන ලද ණය මත පොලී වියදම		5,503,630	5,103,325	7,060,585	6,966,957
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්/පාරිතෝෂික වෙනුවෙන් දායක මුදල් ගෙවීම		2,742,148	955,663	2,844,351	1,081,522
ගෙවන ලද බදු		(13,865,366)	(7,185,466)	(19,216,590)	(9,544,600)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		360,421,650	224,554,791	367,270,125	229,408,820
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්					
දේපළ පිරියත සහ උපකරණ මිළදී ගැනීම		(1,974,640)	(1,527,988)	(2,526,931)	(1,997,410)
දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		174,560	79,213	237,350	143,299
මූල්‍ය ආයෝජන මිළදී ගැනීම්		(329,002,099)	(232,273,659)	(332,028,247)	(236,240,351)
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිළදී ගැනීම්		(293,921)	(2,013,497)	(305,693)	(2,025,351)
පරිපාලිත සහ වෙනත් ව්‍යාපාර වල ආයෝජන තුළින් ලද ලාභාංශ		908,626	1,802,759	207,360	174,065
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතාකළ) ලද ශුද්ධ මුදල		(330,187,474)	(233,933,172)	(334,416,161)	(239,945,748)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ					
යටත් කරන ලද ණය මගින් ලද මුදල	36.1	-	5,000,000	-	15,000,000
යටත් කරන ලද ණය ආපසු ගෙවීම	36.1	(12,500,000)	-	(12,500,000)	(7,230,443)
යටත් කරන ලද ණය මත පොලී ගෙවීම්	36.1	(5,261,843)	(4,799,341)	(7,339,487)	(6,044,084)
කල්බදු වගකීම් ආපසු ගෙවීම	35.4	(2,507,423)	(2,548,281)	(2,914,389)	(2,904,035)
පාලනයට යටත් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම්		-	-	(198,804)	(150,000)
වෙනත් ස්කන්ධ හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ/බදු		(661,090)	(2,196,888)	(661,090)	(2,196,888)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		(20,930,356)	(4,544,510)	(23,613,770)	(3,525,450)
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		9,303,820	(13,922,891)	9,240,196	(14,062,377)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		57,538,351	71,461,242	58,836,831	72,899,208
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		66,842,171	57,538,351	68,077,027	58,836,831

මුදල් ප්‍රකාශවලට සටහන්

1. වාර්තාකරණ ආයතනය

1.1 ආයතනික තොරතුරු

මහජන බැංකුව ("බැංකුව") යනු 1961 අංක 29 දරණ බැංකු පනත යටතේ 1961 ජූලි මස 01 වැනි දින පිහිටුවන ලද ශ්‍රී ලංකාව මූලස්ථානය කොටගත් රජය සතු බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, නො 75 දරණ ස්ථානයේ පිහිටා ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ බැංකුවේ හා එහි පරිපාලිතයන්හි (පොදුවේ "සමූහය" ලෙස හැඳින්වෙන) මූල්‍ය තොරතුරු සහ ස්කන්ධ හිමිකම් තොරතුරුවලින් සමන්විත වේ.

මහජන බැංකුව සමූහයේ අවසාන මව් සමාගම වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුව

බැංකුවේ කටයුතු තැන්පතු භාරගැනීම, ණය පහසුකම් ලබාදීම, පුද්ගලික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය, උකස් ගැනීම, ජාත්‍යන්තර වෙළෙඳාම, රජයේ සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, ණය කාඩ්පත් මෙහෙයුම්, ආයෝජන බැංකුකරණය සහ විදේශ විනිමය බැංකුකරණය වෙනුවෙන් අක් වෙරළ බැංකුකරණ ඒකකය යනාදියෙන් සමන්විත වේ.

පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම්හි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී	මූල්‍ය කල්බදු සේවා, කුලී පිට ගැනුම් වත්කම් මූල්‍ය ණය, කාලීන ණය, ඉස්ලාමීය මූල්‍ය කටයුතු, ආන්තිකල වෙළෙඳාම, කොටස් වෙළෙඳාම, ණය සාධන පත්‍ර නිකුත් කිරීම, මූල්‍යමය අන්තර් සාධනය (ෆැක්ටරින්), රන් ණය ලබාදීම සහ මහජන තැන්පතු ඒකරාශී කිරීම ප්‍රධාන කටයුතු වේ.
සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	සංචාර සංවිධානය කිරීම සහ ගුවන් ටිකට්පත් වෙන් කරදීම. (සංචාරක නියෝජිත)

උප පරිපාලිත සමාගම්

උප පරිපාලිත සමාගම්හි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම	රථවාහන කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම, රථවාහන තක්සේරු කිරීම, රථවාහන විකිණීම, රක්ෂණ තක්සේරුකරණය සහ රථවාහන අළුත්වැඩියා
සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් පවත්වාගෙන යාම සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම්.
පීපල්ස් ඉන්සුරන්ස් පීඑල්සී	පොදු රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම.
පීපල්ස් මයික්‍රෝ කොමර්ස් සමාගම	අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවාවන් සැපයීම.
සීමාසහිත පීපල්ස් ලිසින් හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම	කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම හා පවත්වාගෙන යාම.
සීමාසහිත ලංකන් ඵලායන්ස් ෆයිනෑන්ස් සමාගම	නිශ්චල හා චංචල දේපළ සඳහා කල්බදු සැපයීම සහ ණය සැපයීම

2. ගිණුම්කරණ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සහ බැංකුවේ වෙන් වෙන් වූ මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) අනුකූලව සකස් කොට ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වේ. මෙම මූල්‍ය ඉදිරිපත් කිරීම 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවන්ට ද අනුකූල වේ.

2.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ අවශ්‍යතාවයන්ට ද 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එහි සංශෝධනයන් හී අවශ්‍යතාවන්ටද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) ද අනුකූලව ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම SLFRSs සහ LKASs ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වෙබ් අඩවිය වන www.casrilanka.com ලබාගත හැකිය.

මෙම මූල්‍ය ප්‍රකාශවල පහත සඳහන් සංරචක ඇතුළත්ය:

ආදායම් ප්‍රකාශය සහ ලාභාලාභ ප්‍රකාශය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	සමාලෝචිත වසර සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ලබාදීම.
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	වසර අවසානයට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදීම.
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	සමාලෝචිත වසර තුළ කොටස්හිමියන්ගේ සියලුම වෙනස්වීම් පෙන්නුම් කිරීම.
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	මුදල් හා මුදලට සමාන දෑ ජනනය කිරීමට සහ එම මුදල් ප්‍රවාහ භාවිතා කිරීමට බැංකුවේ සහ සමූහයේ හැකියාව පිළිබඳ පරිශීලකයින්ට තොරතුරු ලබාදීම.
මුදල් ප්‍රකාශනවලට සටහන්	සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත වේ.

2.3 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 මාර්තු 2 දින අනුමැතිය ලබා දෙන ලදී.

3. මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ වෛතිහාසික පදනම යොදා ගනිමින් සකස් කොට ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවකින් තොරව එය ඒකාකාර ලෙස ආදේශ කර ගනු ලැබ ඇත:

අයිතමය	මිණුම්කරණ පදනම	සටහන
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	20
ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයක් ගන්නා මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	21
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයක් ගන්නා ණය උපකරණ	සාධාරණ අගයට	25 සහ 26
ඉඩම් හා ගොඩනැගිලි	අත්පත් කරගනු ලබන අවස්ථාවේ පිරිවැයට මිනුම් කොට පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ කවර හෝ හානිකරණ අලාභ අඩු කොට ප්‍රත්‍යාගණිත අගයට මිනුම්කරණය කෙරේ.	28
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	බැරකම ආයුගණක පදනමින් අගය කොට සැලසුම් වත්කම්වල ශුද්ධ වකතුව අඩු කොට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන අගයට හඳුනාගනේ.	35

3.1 ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය

ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ බැංකුවේ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර ආසන්නතම දහසට වටයනු ලැබ ඇත.

3.2 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 1- "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුව, සමාන අයිතම වල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම වීවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමය" උපයෝගී කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කොට ඇත. මුදල් හා මුදල් සමාන දෑ දැනුවත් මූලකට පහසුවෙන් හැරවිය හැකි කෙටි කාලීන අධිද්‍රවශීලතා ආයෝජනවලින් සමන්විත වන අතර, වටිනාකමේ නොසැලකියයුතු වෙනස්වීම්වලට යටත් වේ. අතැති මුදල්, බැංකු ශේෂ, ඇමතුම් සහ කෙටි දැන්වීම් මුදල්වලින් මුදල් හා සමාන දෑ සමන්විත වේ.

3.4 සංසන්දනාත්මක තොරතුරු

වඩා යහපත් ඉදිරිපත් කිරීමක් ලබාදීමේ අරමුණින් ප්‍රවර්ථන ගිණුම් වර්ෂය හා අනුගත වන පරිදි අවශ්‍ය අවස්ථාවේදී සංසන්දනාත්මක තොරතුරු ගැලපුම් කොට ඇත.

4. සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබ ඇති අගයයන් නිශ්චය කිරීම සඳහා කළමනාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්විය හැක.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ උපකල්පන නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තුවලට අදාළ ප්‍රතිශෝධන ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළදී හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන්හිදී හඳුනා ගනී.

ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගනු ලැබ ඇති අගයන් මත වඩාත්ම සැළකිය යුතු බලපෑම ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී යොදා ගත් විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

4.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය සිදුකොට ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්වේ.

තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් නැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

4.2 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

ආයුගණක ඇගයීම් ශිල්ප ක්‍රමය භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල අගය නිර්ණය කරනු ලැබේ. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත ප්‍රමාණය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතික පිළිබඳ උපකල්පන සිදු කිරීම ආයුගණක ඇගයීම හා සම්බන්ධ වේ. සියළු උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් මෙබඳු ඇස්තමේන්තු සැලකියයුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ. මෙහිදී භාවිත කෙරෙන උපකල්පන සඳහා 35.1.5, සහ 35.2.5 සටහන් බලන්න.

4.3 දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ අගය

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ බදු ඉඩම්වල පවතින ගොඩනැගිලි කවර සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභයන් අඩු කිරීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත දිනයට සාධාරණ අගයට පිළිබිඹු කොට ඇත. එබඳු දේපළවල සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා සමූහය මගින් ස්වාධීන ඇගයීම් විශේෂඥයන් යොදවන ලදී. සමාන වත්කම්වල ප්‍රවර්තන අගය පවතින විට මෙවැනි වත්කම්වල අගය තක්සේරු කිරීමේදී එබඳු සාක්ෂි සළකා බලනු ලැබේ.

4.4 දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජ්‍ය ජීව කාලය

සමූහය සෑම වාර්තාකරණ දිනයකදීම දේපළ, පිරියත සහ උපකරණවල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ජීව කාල සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම වටිනාකම්, අනුපාතික හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයෙහි විනිශ්චය යොදා ගනු ලබන බැවින් ඒවා අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

සමූහය ආදායම් බදුවලට යටත් වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ සකසනු ලබන අවස්ථාවේදී අදාළ කරගත හැකි බදු නීති අර්ථකතනය කිරීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තන, විලම්බිත හා වෙනත් බදු සහ මුළු ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ.

4.5 බැඳීම් සහ අසම්භව්‍යතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානම් ගණනය කෙරේ. අසම්භව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය ආකාරයට මිනුම්කරණය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු වන උද්ගත විය හැකි වගකීම් වේ. අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී හඳුනා නොගැනෙන නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් හැර හෙළිදරව් කරනු ලැබේ. බැඳීම් සහ අසම්භව්‍යතා පිළිබඳ විස්තර 41 සටහනෙහි දැක්වේ.

4.6 ආයෝජන දේපළ වර්ගීකරණය

කිසියම් දේපළක් ආයෝජන දේපළක් වශයෙන් සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය භාවිත කිරීම අවශ්‍යය. සිය විනිශ්චය නිත්‍ය ලෙස ක්‍රියාත්මක කළ හැකි වන පරිදි සමූහය මිනුම් දඩු සකස් කොට ඇත. එහිදී බදු කුලී උපයන හෝ ප්‍රාග්ධන අගය ඉහළ යාමෙන් ඉපැයීම් දරන හෝ දෙයාකාරයෙන්ම ඉපැයීම් දරන දේපළ ද, සමූහයේ වෙනත් වත්කම්වලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ගලන උත්පාදන ද ආයෝජන දේපළ ලෙස සලකනු ලබයි. වෙනත් ආකාරයකින් කිවහොත්, මෙහෙයුම් සඳහා හෝ සේවා සැපයුම් ක්‍රියාවලියේදී හෝ පරිපාලනමය කාර්යයන් සඳහා භාවිතා කළ හැකි දේපළක් ද, තනි වත්කමක් ලෙස සෘජු මුදල් ගලනයක් සිදුනොකරන දේපළක් ද දේපළක්, පිරියතක් සහ උපකරණයක් වශයෙන් සැළකේ.

මෙවැනි දේපළවල වර්තමාන භාවිතය සැළකිල්ලට ගනිමින් වාර්ෂික පදනමක් මත සමූහය විසින් එහි දේපළවල ගිණුම්කරණ වර්ගීකරණය තක්සේරු කෙරේ.

4.7 වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

සෑම වාර්තාකරණ දිනයකදීම සිදුකරනු ලබන උපකල්පනයන් එදිනට පවතින විශිෂ්ටතම ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වසනීය ආකාරයෙන් මිනුම් ගත කරන බවට තහවුරු කිරීම සඳහා බැංකුවට අභ්‍යන්තර පාලන ක්‍රම අයත් වුවද, සැබෑ අගයයන් එකී ඇස්තමේන්තුවල අගයන්ගෙන් වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ එයට පාදක වූ උපකල්පනයන් නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තු වෙත ප්‍රතිශෝධනයන් අදාළ ඇස්තමේන්තු ප්‍රතිශෝධනයට ලක් වන කාලසීමාව තුළ සහ බලපෑමට ලක්වන කවර හෝ අනාගත කාලසීමාවකදී හඳුනාගනී.

විනිශ්චය, ඇස්තමේන්තු සහ උපකල්පන කෙරෙහි වඩාත්ම සංවේදී ගිණුම්කරණ ප්‍රමිතීන් පහත විශේෂ කොට දක්වා ඇත:

(i) සාධාරණ අගය මිනුම්කරණය

මූල්‍යමය උපකරණවලින් සැළකිය යුතු ප්‍රමාණයක් මූල්‍යමය වාර්තාකරණ දිනයේ සාධාරණ අගය අනුව දක්වනු ලැබේ.

සාධාරණ අගය යනු අදාළ මිනුම්කරණ දිනයේදී වෙළෙඳපොල සහභාගී වන්නන් අතර නිශ්චිත ගනුදෙනුවකදී වත්කමක් විකිණීමේදී හිමි වන හෝ බැරකමක් මාරු කිරීමේදී ගෙවීමට සිදු වන මිළ වේ.

කිසියම් වත්කමක හෝ බැරකමක වර්ගීකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එය සාධාරණ අගය අනුව මිනුම්කරණයට ලක් වන අවස්ථාවකදී හැකි සෑම විටම සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ බැංකුවට ආසන්නතම ප්‍රවේශය සහිත වඩාත්ම වාසිදායක ක්‍රියාකාරී වෙළෙඳපොලක තබන ලද ලංසුව හෝ ඉදිරිපත් කරන ලද මිළ සැළකිල්ලට ගනිමිනි. සුදුසු පරිදි සාධාරණ අගය වෙත ණය අවදානම සඳහා වන ගැළපුමක්ද ඇතුළත් කෙරේ.

ක්‍රියාකාරී වෙළෙඳපොලක් තුළ ලංසුගත මූල්‍ය බැරකමක ශුද්ධ විවෘත තත්ත්වයක් සඳහා සාධාරණ අගය ඉදිරිපත් කෙරෙන වර්තමාන මිළ වන අතර, මූල්‍ය වත්කමක් සඳහා සාධාරණ අගය ලංසුගත මිළ රඳවාගත් හෝ නිකුත් කරන ලද උපකරණයෙහි ඒකක සංඛ්‍යාවෙන් ගුණ කරන ලද අගය වේ.

කිසියම් වත්කමකට හෝ බැරකමකට සක්‍රීය වෙළෙඳපොලෙක් නොමැති අවස්ථාවක, බැංකුව මගින් සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා යෝග්‍ය තක්සේරුකරණ ශිල්පීය ක්‍රම භාවිත කරනු ලබන අතර, එහිදී වාර්තාකරණ දිනයේ වෙළෙඳපොල තත්ත්වයන් සහ අවදානම් මත පදනම්ව, ආසන්න නුදුරු කාලයකදී සිදුකරන ලද ගනුදෙනු වලින් ලබාගන්නා ලද මිළ ගණන් භාවිතය, වට්ටම්ගත මුදල් ප්‍රවාහ විමර්ශනයන්, වරණීය මිළකරණ ආකෘතීන් සහ වෙනත් තක්සේරුකරණ තාක්ෂණයන් ඇතුළත් කරගැනේ. එසේ කිරීමෙන්, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල යෙදවුම් උපරිම වශයෙන් යොදාගැනෙන සහ ආයතන විශේෂිත යෙදවුම් කෙරෙහි අවම විශ්වාසයක් තබනු ලබන තක්සේරුකරණ ක්‍රමවේදයක් භාවිතා කෙරේ.

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයක සාධාරණ අගය පිළිබඳ වඩාත් හොඳ සාක්ෂිය වන්නේ එම උපකරණයේ සාධාරණය අගය එම උපකරණය තුළ නිරීක්ෂණය කළ හැකි වෙනත් වර්තමාන වෙළෙඳපොල ගනුදෙනු මගින් සන්සන්දනාත්මකව ඔප්පු කරන්නේනම් (උදා: නවීකරණය හෝ ප්‍රති ඇසුරුම්ගත කිරීමකින් තොරව), හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොලක දත්ත පමණක් විචල්‍යයන් වශයෙන් ඇතුළත් වන තක්සේරුකරණ ක්‍රමවේදයක් මත පදනම් වන්නේනම් මිස ගනුදෙනු මිලය. එවැනි සාක්ෂි පවතින විටකදී බැංකුව මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ සම්බන්ධයෙන් ගනුදෙනු මිළ සහ සාධාරණ අගය අතර වෙනස හඳුනාගනී. (උදා: පළමු දිනයේ සිට).

(ii) ණය සහ අත්තිකාරම් මත හානිකරණ අයකිරීම්

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ කාල ගණනය ඇස්තමේන්තු ගත කිරීමේදී විනිශ්චය වැදගත් වේ. මෙම මුදල් ප්‍රවාහ පිළිබඳව ඇස්තමේන්තු සිදුකිරීමේදී, බැංකුව ප්‍රධාන වශයෙන් ණයගැතියාගේ මූල්‍ය තත්ත්වය සහ එම ඇපවල උපලබ්ධි වටිනාකම පිළිබඳ විනිශ්චයන් සිදුකරයි. මෙම ඇස්තමේන්ත සාධක ගණනාවක් පිළිබඳ උපකල්පන මත පදනම්වන අතර, හානිකරණ දීමනාව වෙත අනාගත වෙනස්කම් ඇති කරමින් සැබෑ ප්‍රතිඵල එකිනෙකට වෙනස් විය හැකිය.

හානිකරණය සම්බන්ධ සාමූහික තක්සේරුකරණයකදී ණය සැලසුම් පෙළ ආශ්‍රිත දත්ත (ණය තත්ත්වය/හිඟ මුදල් මට්ටම්, ණය භාවිත කිරීම වැනි) සහ අවදානම පිළිබඳ අවධානය සහ ආර්ථික දත්ත (සේවා වියුක්ති මට්ටම්, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදිත අනුපාතය ඇතුළුව) සැළකිල්ලට ගනී.

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන සියලුම කාලසීමාවන් සඳහා සටහන 5.1 සිට සටහන 5.23 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය සමූහය ස්ථිරවම යොදා ගෙන ඇත.

5.1 ඒකාබද්ධකරණ පදනම

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ඒකාබද්ධකරණ කාර්යය සඳහා බැංකුවේ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාකාර ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කරමින්, මහජන බැංකුවේ වාර්තාකරණ වර්ෂයන් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබේ.

5.1.1 ව්‍යාපාර සංයෝජන

අත්පත් කරගත් දිනට උදා: පාලනය සමූහය වෙත මාරුකරනු ලැබූ දිනට, අත්පත් කරගැනීමේ ක්‍රමය භාවිත කරමින් ව්‍යාපාර සංයෝජන සඳහා ගණන් දෙනු ලැබේ. අත්පත් කරගැනීමේදී මාරු කරන ලද ප්‍රතිශ්ධාව මෙන්ම අත්පත් කරගත් හඳුනාගත හැකි ශුද්ධ වත්කම් ද සාමාන්‍යයෙන් සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ. පැන නගින ඕනෑම කීර්තිනාමයක් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කෙරේ. මිලදී ගැනීම මත පැන නගින ලාභය වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ගනුදෙනු පිරිවැය ණය හෝ ස්කන්ධ සුරැකුම් නිකුත් කිරීම හා සම්බන්ධව ඇත්නම් හැර, දරන ලද වියදමක් ලෙස සලකනු ලබයි.

පෙර සිට පවතින සබඳතා පියවීමට අදාළ මුදල් ප්‍රමාණ මාරු කරන ලද ප්‍රතිශ්ධාවට ඇතුළත් නොවේ. එබඳු මුදල් ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ තුළ හඳුනාගනී.

ගෙවිය යුතු කවර හෝ අසම්භව්‍ය ප්‍රතිශ්ධාවක් අත්පත් කරගත් දිනට සාධාරණ අගය අනුව මිනුම්කරණය සිදු කෙරේ. අසම්භව්‍ය ප්‍රතිශ්ධාව ස්කන්ධ ලෙස වර්ග කෙරේ නම්, එය නැවත මිනුම්කරණය සිදු නොකරන අතර, ස්කන්ධ තුළ පියවීමට ගණන් දෙනු ලැබේ. නැතිනම් අසම්භව්‍ය ප්‍රතිශ්ධාවෙහි සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.1.2 පාලනයට යටත් නොවන හිමිකම් (“NCI”)

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටසට මිනුම්කරණය කෙරේ. පාලනය අහිමිවීමට හේතු නොවන ආකාරයෙන් පරිපාලිත සමාගමක සමූහය සතු හිමිකම් වෙනස්වීම් ස්කන්ධ ගනුදෙනු ලෙස ගණන් දෙනු ලැබේ.

5.1.3 පරිපාලිත සමාගම්

“පරිපාලිත” සමාගම් යනු සමූහය විසින් පාලනය වනු ලබන ආයෝජිතයන් වේ. සමූහයට ආයෝජිතයා සමග මැදිහත් වීම හේතුවෙන් එය විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වේ නම් හෝ විචල්‍ය ප්‍රතිලාභවලට හිමිකම් ලැබේ නම් සහ ආයෝජිතයා මත සමූහය සතු බලතල හරහා බලපෑමක් කිරීමේ හැකියාව සමූහය සතු වේ නම්, එවිට සමූහය ආයෝජිතයා පාලනය කරයි. පාලනය ආරම්භ වන දින සිට අවසාන වන දින තෙක් පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරනු ලබයි.

5.1.4 පාලනය අහිමි වීම

සමූහයට පරිපාලිත සමාගමක පාලනය අහිමි වූ විට, පරිපාලිත සමාගමෙහි වත්කම් හා බැරකම් සහ ස්කන්ධ හා සබැඳි කවර හෝ පාලනයට මැදිහත් නොවන හිමිකම් සහ වෙනත් සංරචකයන් හඳුනා නොගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ලාභය හෝ අලාභය, ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී. පාලනය අහිමි වූ විට, පෙර පැවති පරිපාලිත සමාගමෙහි රඳවාගනු ලැබූ කවර හෝ හිමිකමක් සාධාරණ අගයට මිනුම්කරණය කරනු ලබයි.

5.1.5 ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරෙන ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අන්තර් සමූහ ශේෂ සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු තුළින් පැන නගින උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ සහ අලාභ හැර) ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ ද උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරෙන ආකාරයටම ඉවත් කෙරෙන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි කිසිවක් නොපවතින තාක් දුරට එසේ කරනු ලැබේ.

5.2 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල්වලින් සිදු වන ගනුදෙනු එම ගනුදෙනුව සිදු වූ දිනට බලපැවැත්වූ විනිමය තත්කාලීන අනුපාතිකය මත මූලිකව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් හා බැරකම් වාර්තාකරණ දිනට විනිමය තත්කාලීන අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලකින් ඓතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, ඒවා හඳුනාගැනීමේ දිනට තත්කාලීන අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, සාධාරණ අගය නිශ්චය කෙරෙන දිනයට පවතින තත්කාලීන විනිමය අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ.

5.3 මූල්‍ය උපකරණ – මුල්වරට හඳුනාගැනීම

5.3.1 හඳුනාගැනීමේ දිනය

මූල්‍යමය වත්කම් හෝ බැරකම් බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත් වූ දින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගන්නා අතර එය සාමාන්‍යයෙන් වෙළෙඳාම් දිනය වේ. ණය සහ අත්තිකාරම් ණයගැතියන් වෙත මුදල් අත්තිකාරම් (හෝ බේරුම්කල) කල දිනයට හඳුනා ගනී.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. අනෙකුත් සියළු මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගනී.

මූල්‍ය වත්කම් සහ බැරකම් සම්බන්ධ විධිමත් නොවන මිළදී ගැනීම් වෙළෙඳාම් දිනට එනම් බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම් විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත්වන දිනයේදී හඳුනා ගනී.

විධිමත් මිලදී ගැනීමක් යනු අදාළ වෙළෙඳපොලෙහි නියමයක් හෝ ප්‍රඥප්තියක් මගින් පොදුවේ ස්ථාපනය කරන ලද කාලරාමුව තුළ වත්කම් භාරදීම අවශ්‍ය වන නියමයන් සහිත ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිලදී ගැනීමකි.

5.3.2 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික "දින 1" වෙනස

සියළු කාර්ය මණ්ඩල ණය වෙළෙඳපොල පොලී අනුපාතවලට පහළ අගයකට පිරිනමන අතර, ඒවා සාධාරණ අගයට හඳුනාගනී. සාධාරණ අගය සහ මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස දින එක වෙනස ලෙස සළකා සළුල පොලී අනුපාතිකය යොදාගනිමින් ණය මුදලේ ඉතිරි කාලය තුළ ආදායම් ප්‍රකාශයෙහි සේවක පිරිවැය ලෙස ක්‍රමක්ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොලී ආදායමක් ලෙස ද පෙන්වනු ලැබේ. එමනිසා අදායම් ප්‍රකාශයෙහි ශුද්ධ ප්‍රතිඵලය ශූන්‍ය වේ.

5.4 මූල්‍ය උපකරණ මුල් අවස්ථා මිණුම්කරණය

පහත සටහන් 5.4.1. සහ 5.4.2. හි දක්වා ඇති පරිදි මුල් අවස්ථා හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය ඒවායේ කොන්දේසි සහ අදාළ උපකරණ කළමනාකරණය සඳහා වන ආකෘතිය මත රඳා පවතී. ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට වාර්තා කෙරෙන මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් හැරුණුවිට මූල්‍ය උපකරණ මුල් අවස්ථාවේදී ඒවායේ සාධාරණ අගයට එකතු කර මිනුම්කරණය කෙරේ.

5.4.1 ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය

නිශ්චිත ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය පිළිබිඹු කෙරෙන මට්ටමකින් සමූහයේ ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. තනි තනි උපකරණයක් කළමනාකාරිත්වයේ අභිමතය මත සමූහයේ ව්‍යාපාර අකෘතිය රඳා නොපවතී. ඒ අනුව සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය සඳහා උපකරණයෙන් උපකරණයට වෙළඹුමක් නොවූවද ඉහළ මට්ටමේ එකතුකළ කළඹක් වන අතර පහත දැක්වෙන ආකාරයේ නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ.

- අදාළ ව්‍යාපාර අකෘතිය තුළ දරා සිටින ව්‍යාපාර අකෘතිය සහ මූල්‍ය වත්කම්වල කාර්යසාධනය තක්සේරු කරනු ලබන සහ සමූහයේ ප්‍රධාන කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලබන ආකාරය;
- ව්‍යාපාර ආකෘතියෙහි (සහ ව්‍යාපාර ආකෘතිය තුළ දරා සිටින මූල්‍ය වත්කම්වල) කාර්යසාධනය සඳහා බලපෑ හැකි අවදානම් සහ විශේෂයෙන් අදාළ අවදානම් කළමනාකරණය කර ගනු ලබන ආකාරය;
- ව්‍යාපාරයේ කළමනාකරුවන් වෙත වැටුප් ගෙවනු ලබන ආකාරය. (කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ අගය හෝ එක්රැස් කරගත් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත වැටුප් ගෙවීම පදනම් වනවාද යන්න).

"නරකම සිද්ධිය" හෝ "පීඩිතම සිද්ධිය" වශයෙන් සිද්ධීන් සැළකිල්ලට නොගෙන සැළකිය යුතු අපේක්ෂිත සිද්ධීන් මත ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය පදනම් වේ. සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් මුදල් ප්‍රවාහ උපලබ්ධිවේනම්, එම ව්‍යාපාර ආකෘතිය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය පූර්ව කාලසීමාවක ඇති නොවන අතර වෙනස්වීමක්ද සිදු නොවේ. කෙසේවුවද, අලුතින් උත්පාදනය වූ හෝ අලුතින් මිලදී ගත් මූල්‍ය වත්කම් සඳහා සමූහය විසින් ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීමේදී, සමූහය මගින් අනෙකුත් අදාළ තොරතුරු සමඟ අතීතයේදී මුදල් ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය පිළිබඳ තොරතුරු සැළකිල්ලට ගනු ලැබේ.

5.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂණය – මුල් මුදල හා පොළිය පමණක් ගෙවීම (SPPI පරීක්ෂණය)

සමූහය මගින් මුල් මුදල හා පොළිය පමණක් ගෙවීමේ පරීක්ෂණය සපුරාලන්නේද යන්න හඳුනා ගැනීමට මූලික ණය වැඩපිළිවෙලෙහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරු කරයි. මෙහිදී ඒවා හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී ගෙවීම් ලෙස සැලකේ.

මෙම කාර්යය සඳහා "මුල් මුදල" යනුවෙන් මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථකතනය කෙරේ. කෙසේවුවද, එම මුල් මුදල මූල්‍ය වත්කමේ ජීව කාලය තුළ වෙනස් විය හැක.

මෙම කාර්යය සඳහා "පොළිය" යන්න මුදලේ කාල අගය, නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ හිඟ මුල් මුදල ආශ්‍රිත බැර අවදානම සහ වෙනත් මූලික ණය දිමේ අවදානම් හා පිරිවැය මෙන්ම ලාභ ආන්තිකය සඳහා ප්‍රතිඝාතය සමන්විත වේ. සමූහය විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම්කළ ව්‍යවහාර මුදල සහ පොලී අනුපාතය පිහිටුවන ලද කාලසීමාව ආදී අදාළ කරුණු සළකා බලනු ලැබේ.

5.5 මූල්‍ය වත්කම් හා බැරකම් වල මිනුම්කරණ කාණ්ඩ

වත්කම් සහ උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ කළමනාකරණය සඳහා ආයතනයේ ව්‍යාපාර ආදර්ශයේ සංයෝජනයක් මත පදනම්ව තක්සේරු කරන ස්කන්ධ උපකරණ සහ ව්‍යුත්පන්නයන් හැර, සියළුම මූල්‍ය වත්කම් පහත මිනුම්කරණ කාණ්ඩ මගින් මනිනු ලැබේ–

- ක්‍රමක්ෂය පිරිවැය (සටහන 5.5.1.)
- වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව (සටහන 5.5.2)
- වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව (සටහන 5.5.2)

5.5.1 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ණය උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ.:

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට රඳවා ගැනීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන, පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. ණය හානිකරණ මිනුම්කරණය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය තුළ දක්වා ඇති ණය අලාභ ආදර්ශය හැර පියවර තුනක් මත පදනම් වේ.

බැංකු වෙත ණය හා අත්තිකාරම්, වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකාරම්

පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන බැවින් සමූහය මගින් කල්බදු සහ කුලිපිට ගැනිමේ ගිවිසුම් ඇතුළුව බැංකු වෙත ණය හා අත්තිකාරම් සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරනු ලබයි:

- මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටීම.
- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවන මුදල් ප්‍රවාහවලට විශේෂ දිනවල ඇතිකරන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන්.

5.5.2 වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ණය උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ:

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන, පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. සාධාරණ අගය වෙනස්වීමෙන් පැන නගින ලාභ හෝ අලාභ වෙන් වූ ස්කන්ධ සංරචකයක් ඇතුළත වෙනත් විස්තීර්ණ ආදායම තුළ ඇතුළත් කෙරේ.

හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්තනයන්, පොලී ආදායම සහ විදේශ ව්‍යවහාර මුදල් ලාභ හෝ අලාභයන් ලාභ හා අලාභ තුළ හඳුනාගනී. බැහැර කිරීම මත, වෙනත් විස්තීර්ණ ආදායම තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධයේ සිට ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවර්ගකරණය කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැයේදී මූල්‍ය වත්කම්වලට යොදා ගත් පරිදි ණය හානිකරණය මැනීම අදියර තුනේ අපේක්ෂිත ණය අලාභවල ආකෘති මත පදනම් වේ. අපේක්ෂිත ණය අලාභ ආකෘතිය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය හි දක්වා ඇත.

ස්කන්ධ උපකරණ

SLFRS 3 "ව්‍යාපාර සංයෝජන" ප්‍රමිතිය අදාළ වන ව්‍යාපාර සංයෝජනයක් තුළ බැංකුව විසින් හඳුනාගන්නා විකිණීම සඳහා දරා නොගන්නා හෝ අසම්භාව්‍ය ප්‍රතිශ්ධාවක් නොවන ස්කන්ධ උපකරණවල ආයෝජනය වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන අතර එහිදී වෙනස් නොකලැකි තේරීමක් කළමනාකරණය විසින් සිදුකර ඇත. පැහැර හැරීමකින් වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය යොදා ගැනීමට කළමනාකරණය විසින් වෙනස් නොකලැකි තේරීමක් නොකරන කළඹ සඳහා, එවැනි ආයෝජන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

වෙනත් විස්තීර්ණ ආදායම තුළ ඉදිරිපත් කෙරෙන මුදල් ප්‍රමාණයන් පසුව ලාභ හෝ අලාභ වෙත මාරු නොකෙරේ. එවැනි ආයෝජනයන්හි ලාභාංශ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

5.5.3 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් අනුව වන අයිතමයන් පහත දැක්වෙන කරුණුවලින් සමන්විත වේ:

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින:

(ආ)මුල් වරට හඳුනාගැනීම මත ලාභ හෝ අලාභ මත සාධාරණ අගය වශයෙන් විශේෂයෙන් නම් කරන ලද අයිතම, සහ

(ඇ)හුදෙක් මුල් මුදල හෝ පොලී ගෙවීම් නියෝජනය නොකරන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණ.

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව දරා සිටින මූල්‍ය උපකරණ දරා ඇති බවට ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් ගනුදෙනු පිරිවැය සමඟ මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. පසුව, ඒවා සාධාරණ අගය අනුව මිනුම්කරණය කොට කවර හෝ ලාභ හෝ අලාභ ඒවා පැන නගින අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

මූල්‍ය වත්කමක් සාධාරණ අගය අනුව මිනුම්කරණය කරනු ලබන අවස්ථාවේදී, ණය අවදානමෙහි වෙනස්වීම් වෙත ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නියෝජනය වන පරිදි, සමපාර්ශ්වයේ ණය වටිනාකම පිළිබිඹු වන අයුරින් ණය තක්සේරු ගැළපුමක් ඇතුළත් කෙරේ.

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් වෙළෙඳාම පිණිස දරා සිටින බවට වර්ගීකරණයට ලක් වනුයේ එය නුදුරු කාලයේදී විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීමේ මූලික අරමුණින් යුතුව අත්පත් කරගැනීම හෝ දරනු ලැබීම සිදුවූයේ නම්, හෝ එක්ව කළමනාකරණය කරනු ලබන මූල්‍ය උපකරණ කළඹක කොටසක් නිර්මාණය කරනු ලබයි නම්, එමගින් කෙටි කාලීන ලාභ ලැබීමේ සාක්ෂි සහිතනම් හෝ එය සුදුසුකම් ලබන ඉදිරි රැකුම් සබඳතාවයක නොවන ව්‍යුත්පන්නයක් වන්නේ නම් පමණි.

වෙළෙඳ ව්‍යුත්පන්නයන් සහ වෙළෙඳ සුරැකුම් වෙළෙඳාම පිණිස දරා සිටින වශයෙන් වර්ගීකරණය කෙරෙන අතර සාධාරණ අගය අනුව හඳුනා ගනී.

(ආ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කරන ලද මූල්‍ය උපකරණ

මුල් වරට හඳුනාගැනීම මත, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කෙරේ. කිසියම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරනු ලබන්නේ, එසේ කිරීම තුළින් වත්කම් හෝ බැරකම් වෙනස් වූ පදනම් මත මිනුම්කරණය ඔස්සේ පැන නැගිය හැකි මිනුම්කරණ සහ හඳුනාගැනීමේ අනනුකූලතාවයන් සම්පූර්ණයෙන් ඉවත් කරයිනම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් පමණි. (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීම)

කිසියම් මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව වශයෙන් නම් කරනු ලබන්නේ එමගින් ගිණුම්කරණ නොගැළපීම ඉවත් කෙරේ නම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් හෝ:

- ධාරක ගිවිසුමක් අන්තර්ගත ව්‍යුත්පන්න එකක් හෝ වැඩි ගණනකින් සමන්විත වන්නේ නම්: හෝ

- මූල්‍ය වත්කම් හා බැරකම් ද්විත්වයම කළමනාකරණය සහ ඒවායේ කාර්යසාධනය ලේඛණගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමෝපායකට අනුකූලව සාධාරණ අගය පදනමක් මත තක්සේරු කෙරෙන්නේ නම් පමණි.

මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය නම් කරනු ලබන අවස්ථාවකදී, බැංකුවේ ස්වකීය බැරකම් තත්ත්වය තුළ ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල පොලී අනුපාතිකයන්ට ඉහළින් බැරකම පැතිරීමේ වෙනස්වීම් නිර්ණය කිරීමෙන් ගණනය කරනු ලබන අතර, වෙනත් විස්තීර්ණ ආදායම තුළ වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

5.5.4 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ යනු ගිවිසුම් වන අතර ඒවායේ වටිනාකම එයට පාදක වූ මිල, දර්ශක හෝ වෙනත් විචල්‍යන් එකක් හෝ කිහිපයකින් ව්‍යුත්පන්න වන අතර. සාමාන්‍යයෙන් මේවා හුවමාරු, ඉදිරිගාමී අනුපාතික ගිවිසුම්, අනාගතයන් සහ වරණයන්ගෙන් සමන්විත වේ.

ව්‍යුත්පන්නයන් බලාත්මක ඉදිරි රැකුම් සබඳතාවයක කොටස් වූ සහ ඉදිරි රැකුම් ව්‍යුත්පන්නයන් වශයෙන් නම් කරන ලද අවස්ථාවක හැරුනු විට, සියළු ව්‍යුත්පන්නයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේදී සාධාරණ අගය අනුව හඳුනාගැනෙන අතර වෙළෙඳ කටයුතු වශයෙන් වර්ගීකරණය කෙරේ. ව්‍යුත්පන්නයක ධාරක අගය ගිවිසුමෙහි ජීව කාලය පුරා සාධාරණ අගයට ප්‍රතිමිනුම්කරණය කෙරේ. ව්‍යුත්පන්නයන් ඒවායේ සාධාරණ අගට ධනාත්මක වන විට වත්කම් වශයෙන්ද සාධාරණ අගය ඍණාත්මක වන විට බැරකම් වශයෙන්ද ඉදිරියට ගෙන යනු ලබයි.

5.5.5 මූල්‍ය වත්කම් හා බැරකම් ප්‍රතිවර්ගීකරණය

SLFRS 9 ප්‍රමිතිය යොදා ගැනීමත් සමඟ, බැංකුව මගින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු එහි මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණ කරන ලද්දේ එබඳු මූල්‍ය වත්කමක් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතියෙහි වෙනසක් සිදුවුවහොත් පමණි. එබඳු ප්‍රතිවර්ගීකරණය ප්‍රතිවර්ගීකරණ දිනයේ සිට අනාගතයේ භාවිත කළ හැකි වශයෙන් යොදා ගැනේ. මූල්‍ය වගකීම් ප්‍රතිවර්ගීකරණය නොකරනු ලැබේ.

5.6 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය නොකෙරෙන පහත දැක්වෙන මූල්‍ය වත්කම් කාණ්ඩයන් සඳහා අපේක්ෂිත ණය අලාභය මැන බැලීම සඳහා බැංකුව/සමූහය විසින් අදියර තුනක ප්‍රවේශයක් යොදා ගනු ලබයි:

- ක්‍රමක්ෂය පිරිවැයට සහ වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන ණය සාධන පත්‍රය
- ණය බැඳීම්: සහ
- මූල්‍ය ඇප ගිවිසුම්.

ස්කන්ධ ආයෝජනයන් මත කිසිදු අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගනු නොලැබේ.

මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත දැක්වෙන අදියර තුන හරහා සංක්‍රමණය වේ:

අදියර 1: මාස 12 අපේක්ෂිත ණය අලාභය

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් නොමැති වූ සහ ආරම්භයේ පටන් ණය හානිකරණය වී නොමැති නිරාවරණ සඳහා, ඊළඟ මාස 12 තුළ ඇති විය හැකි පැහැර හැරීමේ සිදුවීමේ සම්භාවිතාව ආශ්‍රිත ජීවකාල අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනාගනී.

බැංකුව සැළකිය යුතු ණය පිරිහීමක් නොමැති ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 අපේක්ෂිත ණය අලාභය තීරණය කරයි. (එනම් පසුගිය හිඟ දින 30ට අඩු)

අදියර 2: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් නොකළ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහිත එහෙත් ණය හානිකරණයක් නොමැති නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභයක් (එනම් මූල්‍ය වත්කමෙහි ඉතිරි වූ ජීව කාලය පිළිබිඹු කරන) හඳුනාගනී.

බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය පහසුකම් හැරුනු විට, ප්‍රමිතියෙහි අවශ්‍යතාවන්ට අනුව සැළකිය යුතු හානිකරණය නියමිත දිනයෙන් පසු දින 30 ක් ගතවූ යන නිශ්ප්‍රභාත්මක උපකල්පනය ඔස්සේ මිනුම්ගත කෙරේ.

බැංකුව ණය පහසුකම්/නිරාවරණ, ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත ණය, මහ බැංකුව (CBSL) මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය අනුව අදියර 2 යටතේ සළකා බැලීම කෙරෙහිද බැංකුවේ අවධානය යොමුව ඇත.

අදියර 3: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් වූ

කිසියම් වත්කමක ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වෙත අහිතකර බලපෑමක් ඇති කරන ආකාරයේ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදු වී ඇති විට ණය හානිකරණයට ලක් වූ වශයෙන් නිරාවරණ තක්සේරු කෙරේ. ණය හානිකරණයට ලක් වූ නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභය හඳුනාගන්නා අතර, පොළී ආදායම දළ ධාරණ වටිනාකමට වඩා ක්‍රමක්ෂය පිරිවැය අනුව සථල පොලී අනුපාතිකය (දළ ප්‍රතිපාදන වලින් ශුද්ධව) යොදා ගනිමින් ගණනය කෙරේ.

SLFRS 9 ප්‍රමිතියෙහි දක්වා ඇති පරිදි සහ අක්‍රීය ණයවලට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයන්ට යටත්ව බැංකුව, ගනුදෙනුකරුවකුගේ ගිවිසුම්ගත ගෙවීම් නියමිත දිනට වඩා දින 90 කට වැඩි සංඛ්‍යාවක් කල් ගතව ඇති විට අදාළ ණය පහසුකම පිළිබඳව තීරණයකට එළඹේ. ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම්/වත්කම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ප්‍රතිසැකසුම්ගත ණය අදියර 3 යටතේ වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන් අනුව අදාළ සියළුම ණය පහසුකම්/ගනුදෙනුකරුවන් අක්‍රීය වශයෙන් වර්ගීකරණයට ලක් වේ.

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය වූ (POCI) මූල්‍ය වත්කම්: මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම් අදියර 3 තුළ වරගීකරණය කෙරේ. වාර්තාකරණ දිනයේදී සමූහයට POCI ණය නොමැත.

5.6.1 හානිකරණයේ අදියර නිශ්චය කිරීම

එක් එක් වාර්තාකරණ දිනයේදී, වාර්තාකරණ දිනය හා මූලික හඳුනාගැනීමේ දිනය අතර අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ ගෙවීම් පැහැරහැරීමක් සිදුවීමේ අවදානම හා සසඳමින්, බැංකුව මූලික හඳුනාගැනීමේ සිට වත්කම් සම්බන්ධ සැළකිය යුතු ණය අවදානමෙහි වැඩිවීමක් පවතීද යන්න තක්සේරු කරයි. බැංකුව මගින් මෙම අරමුණ උදෙසා අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් නොමැතිව ලබාගත හැකි අදාළ වන සාධාරණ සහ සහයෝගී තොරතුරු මෙහිදී සළකා බලනු ලබයි. මෙයට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු මෙන්ම අනාගතය දකින විශ්ලේෂණ ඇතුළත්ය.

වත්කම් තත්ත්වය පිරිහීමට ලක්වන බැවින් නිරාවරණයක් අපේක්ෂිත ණය අලාභයෙහි අදියර ඔස්සේ සංක්‍රමණය වේ. පසු කාලපරිච්ඡේදයකදී වත්කමෙහි තත්ත්වය වැඩිදියුණු වුවහොත් සහ කවර හෝ පෙර හඳුනාගත් ණය අවදානම් වැඩිවීමක් ප්‍රතිවර්තනට වුවහොත්, එවිට අඩමාන ණය සඳහා වෙන්කිරීම ජීව කාල අපේක්ෂිත ණය අලාභයෙහි සිට මාස 12 අපේක්ෂිත ණය අලාභය වෙත ප්‍රතිවර්තනය වේ. මූලික හඳුනාගැනීමේ සිට සැළකිය යුතු අන්දමින් පිරිහීමට ලක් නොවූ, හෝ පිරිහීම බැංකුවේ ආයෝජන ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක තුළ පවතින, හෝ පසුගිය හිඟ දින 30 කට අඩු නිරාවරණ පහළ ණය අවදානමක් සහිත ඒවා බවට සැළකේ. මෙවැනි මූල්‍ය වත්කම් සඳහා අඩමාන ණය වෙන්කිරීම මාස 12 අපේක්ෂිත ණය අලාභය මත පදනම් වේ. වත්කමක් එක්රැස් කරගත නොහැකි විටකදී, එය අදාළ වෙන් කිරීමෙන් කපා හරිනු ලබයි. එබඳු වත්කම් කපා හැරෙනුයේ, සියළුම අවශ්‍ය ක්‍රියාපටිපාටීන් සම්පූර්ණ කිරීමෙන් සහ අලාභ ප්‍රමාණය තීරණය කිරීමෙන් අනතුරුවය. පෙර කපාහරිනලද ප්‍රමාණවල පසුකාලීන අයකිරීම් ආදායම් ප්‍රකාශයේ වියදම් ප්‍රමාණය අඩු කරයි.

බැංකුව යම් නිරාවරණයක ණය අවදානම කේවල හෝ සාමූහික පදනමක් මත සැළකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇතිද යන්න තක්සේරු කරයි. හානිකරණයේ සාමූහික තක්සේරුකරණ අරමුණු උදෙසා, මූල්‍ය සාධන පත්‍ර ගිණුම් සාධන පත්‍ර වර්ගය, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, මූලික හඳුනාගැනීමේ දිනය, කල්පිරීම දක්වා ඉතිරි කාලසීමාව, ක්ෂේත්‍රය සහ වෙනත් කරුණු සැළකිල්ලට ගනිමින්, පොදු ණය අවදානම් ලක්ෂණ අනුව කාණ්ඩගත කෙරේ.

5.6.2 මූල්‍ය වත්කම් කපා හැරීම

ණය සහ ණය සුරැකුම්පත් අයකරගැනීමේ යථාර්තවාදී අපේක්ෂාවක් නොමැති විට වාර්ෂිකව (අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්) කපා හරිනු ලබයි. මෙය පොදු අවස්ථාවක් වන්නේ කපාහැරීමට යටත් මුදල ආපසු ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ උත්පාදනය කළ හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර ණයකරුට නොමැති බව බැංකුව තීරණය කරන අවස්ථාවේදීය. එසේ වුවත්, එම විශේෂ පහසුකම් කපාහැරීමට වසර දෙකකට එනම් කිසිදු මුදලක් ආපසු නොගෙවන ලද වසර දෙකකට පෙර (එනම් බැංකුව පොදුවේ සෑම වසරකම ජූනි 30 ලෙස සලකා බලමින් කපා හැරීමට පෙර වසර දෙක) අක්‍රීය ණය වර්ගීකරණයට මාරු කරනු ලබයි. කෙසේවෙතත්, කපාහරින මූල්‍ය වත්කම් හිඟ මුදල අයකර ගැනීම සඳහා බැංකුවේ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවලට යටත් වේ.

5.6.3 අපේක්ෂිත ණය අලාභ මිණුම්කරණය

අපේක්ෂිත ණය අලාභ අපක්ෂපාතී සහ සම්භාවිතාව මත බර තබන ලද අපේක්ෂිත අලාභවල ඇස්තමේන්තුවලින් ව්‍යුත්පන්න වන අතර, පහත දැක්වෙන පරිදි මිනුම්කරණය කෙරේ:

- වාර්තාකරණ දින වන විට ණය හානිකරණය නොවූ මූල්‍ය වත්කම්: සියළුම මුදල් හිඟයන්හි වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කමෙහි ජීව කාලය මුළුල්ලේ සඵල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ. මුදල් හිඟය යනු, ගිවිසුම අනුව බැංකුවට අය විය යුතු මුදල් ප්‍රවාහ සහ බැංකුව ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසය.
- වාර්තාකරණ දින වන විට ණය හානිකරණය නොවූ වත්කම්: දළ ධාරණ මුදල් ප්‍රමාණය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස සඵල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ.
- ඉටුනාකරන ලද ණය බැඳීම්: බැඳීම ඉටු කළහොත් බැංකුව වෙත අය විය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ බැංකුව ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසෙහි වර්තමාන වටිනාකම වේ.
- මූල්‍යමය ඇප ගිවිසුම්: බැංකුව මගින් අය කර ගැනීමට අපේක්ෂා කරනු ලබන කවර හෝ මුදලක් අඩුකොට, දරන්නා වෙත ප්‍රතිපූර්ණය කිරීමට අපේක්ෂිත ගෙවීම් වශයෙන් වේ.

අපේක්ෂිත ණය අලාභයන් අදායම් ප්‍රකාශය තුළ අඩමාන ණය සඳහා වෙන්කිරීමක් යොදාගනිමින් හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය සාධන පත්‍ර මිනුම්කරණය කෙරෙන අවස්ථාවන් හිදී, අපේක්ෂිත ණය අලාභයන් මිනුම්කරණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් සඳහා යොදාගත් තුන් අදියර ප්‍රවේශය මත පදනම් වේ. බැංකුව මගින් ප්‍රතිපාදන ගාස්තුව ආදායම් ප්‍රකාශය තුළද, අනුරූප මුදල වෙනත් විස්තීර්ණ ආදායම තුළද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වත්කමෙහි ධාරණ වටිනාකමෙහි කිසිදු අඩු නොකර ද හඳුනා ගැනේ.

5.7 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගැනීම බැහැර කිරීම

5.7.1 මූල්‍ය වත්කම්

වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය අවසන් වූ විට හෝ වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය බැංකුව වත්කමෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභයන් නිත්‍ය වශයෙන් අන් අයට පවරා තිබීම යන අවස්ථාවන්හිදී බැංකුව විසින් මූල්‍ය වත්කමක් හඳුනාගැනීම බැහැර කරනු ලැබේ. බැංකුව විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවාගෙන සිටින මාරු කරන ලද මූල්‍ය වත්කම කවර හෝ හිමිකමක් වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනාගනී.

5.7.2 මූල්‍ය වගකීම්

බැරකම යටතේ පවතින බැඳීම අත්හළ විට හෝ අදාළ ගිවිසුම අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට බැංකුව මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

5.7.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරන්නේ, වටිනාකම් හිලව් කිරීමට බැංකුවට නීතිමය අයිතියක් ඇති සහ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් වත්කම උපලබ්ධි කර ඒ සමඟම බැරකම් නිරවුල් කිරීමට අභිප්‍රායක් ඇති අවස්ථාවලදී පමණි.

5.8 කල්බදු

5.8.1 මූල්‍ය කල්බදු ආදායම

නෛතික හිමිකම හැර හිමිකාරිත්වය හා සබැඳි සියළුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැළකිය යුතු ලෙස ගනුදෙනුකරුවන් වෙත මාරුකරමින් ගනුදෙනුකරුවන් වෙත කල්බදු මත ලබාදෙන ලද වත්කම් මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ලැබිය යුතු මුදල් ලැබිය යුතු කල්බදු කුලිය යටතේ ඇතුළත් කරනු ලබයි. ලැබුනු මූලික කුලිය අඩු කිරීමෙන් පසුව, කල්බදු ශේෂයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කොට ඇත.

කල්බදු මත ලබාදී ඇති වත්කම්වල පිරිවැය ඉක්මවා ලැබිය යුතු සමුච්චිත කුලීවල අතිරික්තයෙන් මුළු නොපියවූ ආදායම සැදුම් ලබයි. කල්බදු දීම ක්‍රියාත්මක වූ මාසයෙන් ආරම්භ වූ බදු කාලසීමාව පුරා නොඉපයූ ආදායම, බද්දේ ඉතිරිව පවතින ලැබිය යුතු ශේෂයට සමානුපාතිකව ආදායමට ඇතුළත් කෙරේ.

5.8.2 SLFRS 16 – කල්බදු

SLFRS 16 (කල්බදු) මගින් කල්බදු හඳුනාගැනීම, අගයකිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම පිළිබඳ මූලධර්ම නියම කරයි.

සමූහය කල්බදු ආරම්භ කරන දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් සහ කල්බදු වගකීම් හඳුනාගනී. භාවිතයට අයිතිය ඇති වත්කම් මූලිකව ආරම්භක දිනයට හෝ ඊට පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ මුල් මුදල ඇතුළත් පිරිවැයට මනිනු ලැබේ. භාවිතයට අයිතිය ඇති වත්කම් පසුව ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. ඊට අමතරව, භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරන අලාභ ඇත්නම් කලින් කල අඩුකරන අතර, කල්බදු වගකීමේ සමහර නැවත මැනීම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු වගකීම් මූලිකවම ආරම්භක දිනය ගෙවා නොමැති වර්තමාන වටිනාකමට අගය කරන අතර කල්බද්දේ ගම්‍ය පොළී අනුපාතය හෝ එම අනුපාතය පහසුවෙන් තීරණය කර නොහැකිනම් සමූහයේ වර්ධක ණය අනුපාතය භාවිතයෙන් වට්ටම් කෙරේ.

පොදුවේ, සමූහය එහි වර්ධක ණය අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි. කල්බදු වගකීම පසුව ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති අවස්ථාවේදී එය නැවත මනිනු ලබයි.

ඊට අමතරව, බැංකුව/සමූහය විසින් LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස මෙයට පෙර වර්ගීකරණය කළ කල්බදුවල SLFRS 16 විසින් අවසර දෙන ලද පහත සඳහන් ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගනු ලැබීය.

- සාධාරණ සමාන ගතිලක්ෂණ සහිත කල්බදු කළඹකට තනි වට්ටම් අනුපාතයක් යොදා ගැනීම.
- මූලික යොදා ගැනීමේ දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් අගය කිරීමේ මූලික සෘජු පිරිවැය ඉවත් කිරීම.

සමූහය මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 28 යටතේ භාවිතයට අයිතිය ඇති වත්කම් ඉදිරිපත් කරන අතර අනුරූප කල්බදු වගකීම සටහන 35 “වෙනත් වගකීම්” හි ඉදිරිපත් කෙරේ.

5.9 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් හා කෙටිකාලින අරමුදල්වලට අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, ඒක්ෂණ මුදල් සහ කෙටිකාලීන දැනවීම් මුදල් ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 17 හි මුදල් සහ කෙටිකාලීන අරමුදල පිළිබඳ විස්තර දක්වා ඇත.

5.10. අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න

අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්නවලට වෙළෙඳ වත්කම් සහ බැරකම් වශයෙන් වර්ගීකරණය නොකරන ලද සියළුම ව්‍යුත්පන්න වත්කම් සහ බැරකම් ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මිනුම් කෙරේ.

5.11 ආයෝජන දේපල

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු දෙකම වෙනුවෙන් දරා සිටින වනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා නොපවතින දේපල ආයෝජන දේපල වේ. මේවා භාණ්ඩ හා සේවා නිපැයුම හෝ සැපයුම හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

5.11.1 හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපළ හා සබැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ සම්භාවිතාවක් පවතී නම් සහ ආයෝජන දේපලෙහි පිරිවැය විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි වේ නම් ආයෝජන දේපළ හඳුනාගැනීම සිදුවේ.

5.11.2 මිනුම්කරණය

ආයෝජන දේපළක් මූලිකමව එහි පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. මිලට ගත් ආයෝජන දේපළක පිරිවැය, එය මිලදීගත් මිල සහ සෘජුවම ආරෝපනය වන වියදම් වලින් සැදුම් ලබයි. ස්වයං නිර්මිත ආයෝජන දේපළක පිරිවැය, ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම අවසන් කරන ලද දිනට එහි පිරිවැය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS-40 “අයෝජන දේපළ” අනුකූලව සමූහය ආයෝජන දේපළ සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනී. ඒ අනුව, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ඉඩම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට සඳහන් කරනු ලැබේ.

5.12 අස්පෘශ්‍ය වත්කම් හා කීර්තිනාමය

5.12.1 කීර්තිනාමය

අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරගත් පරිපාලිත සමාගමෙහි ශුද්ධ හඳුනාගත හැකි වත්කම්වල සමූහයේ කොටස සතු සාධාරණ අගය ඉක්මවන අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය නියෝජනය කරයි. ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය හානිකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව හෝ සිදුවීම් හෝ පවතින තත්ත්වයන් වෙනස්වීම් එය හානි වී ඇති බව හඟවයි නම්, එයටත් වඩා අඩු කාල රාමු තුළ පරීක්ෂා කර සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට ධාරණය කෙරේ. කීර්තිනාමය මත හානිකරණ අලාභ ප්‍රතිවර්තනය නොකෙරේ.

5.12.2 මාදුකාගංය

සමූහය විසින් අත්පත් කරගන්නා ලද මෘදුකාංග, සමුච්චිත ක්‍රමක්ෂය සහ හානිකරණ අලාභ අඩු කර පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ.

සමූහය විසින් අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ සිය අභිප්‍රාය සහ හැකියාව විදහා දැක්වීමට, අනාගත ආර්ථික ප්‍රතිලාභ උපදවන ආකාරයෙන් මෘදුකාංගය භාවිතා කිරීමට සහ අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ පිරිවැය විශ්වසනීය අයුරින් මැනිය හැකි වූ විට, අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග මත වියදම වත්කමක් ලෙස හඳුනා ගනී. අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංගවල ප්‍රාග්ධනිත පිරිවැයට එම මෘදුකාංගය සකස් කිරීම වෙනුවෙන් සෘජුවම පැවරිය හැකි සියළු පිරිවැය සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ඇතුළත් වන අතර, එම ප්‍රාග්ධනිත පිරිවැය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ. සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් හානිකරණය අඩු කළ ප්‍රාග්ධනිත පිරිවැයට අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග සඳහන් කරනු ලැබේ.

මෘදුකාංග වත්කම් වෙනුවෙන් පසුකාලීනව කෙරෙන වියදම් ප්‍රාග්ධනායනය කරනු ලබන්නේ එය සම්බන්ධව ඇති නිශ්චිත වත්කමෙහි ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ඒ මගින් වැඩි වන විට පමණි. අනෙකුත් සියළුම වියදම් ඒවා දරන ලද ආකාරයට වියදම් කෙරේ.

5.12.3 ක්‍රමක්ෂය

මෘදුකාංග භාවිතයට ලබාගත හැකි දින සිට එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය තුළ සරල මාර්ගික පදනමක් මත ක්‍රමක්ෂය කෙරේ. වර්තන හා සාපේක්ෂ කාලසීමාවන් සඳහා මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීව කාල සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැලපීම් කරනු ලැබේ.

5.13 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

5.13.1 හඳුනාගැනීමේ පදනම

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් තිබේද යන්න බැංකුව සෑම වාර්තාකරණ දිනටම තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇති නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, බැංකුව වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්මේන්තු කරයි.

වත්කමේ නැවත අයකර ගත හැකි වටිනාකම යනු වත්කමක හෝ මුදල් ජනන ඒකකයක විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක වත්කම හානිකරණ වූ ලෙස සලකනු ලබන අතර, එහි නැවත අය කරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරු පිළිබිඹු කරන බදු වලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී, සුදුසු තක්සේරු ක්‍රමයක් භාවිත කෙරේ. තක්සේරු ගුණිත, ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන පරිපාලිත සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් මිල ගණන් හෝ වෙනත් පවතින සාධාරණ අගය දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කරනු ලැබේ.

5.13.2 මිනුම්කරණය

කීර්තිනාමය හැර වෙනත් වත්කම් සඳහා, පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභ තවදුරටත් නොපවතීද නැතහොත් අඩුවීද යන්න පිළිබඳ හැඟවීමක් තිබේද යන්න සම්බන්ධයෙන් සෑම වාර්තාකරන දිනටම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි හැඟවීමක් පවතී නම්, බැංකුව වත්කමෙහි හෝ මුදල් ජනන ඒකකයෙහි නැවත අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි. අවසන් වරට හානිකරණ අලාභය හඳුනාගැනීමේ සිට වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම නිශ්චය කිරීම පිණිස භාවිත කරන ලද උපකල්පනවල වෙනසක් සිදුවී තිබේ නම් පමණක් පූර්වයෙන් හඳුනාගනු ලැබූ හානිකරණයක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂයේදී වත්කම් වෙනුවෙන් කිසිදු හානිකරණයක් හඳුනාගෙන නොතිබිණි නම්, වත්කමෙහි ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම නොඉක්මවන පරිදි ක්ෂය අඩු කළ නිශ්චය කළ හැකිව තිබූ ධාරණ අගය නොඉක්මවන පරිදි ප්‍රතිවර්තනය සීමා කරනු ලැබේ. එවැනි ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

කීර්තිනාමය සම්බන්ධ හානිකරණ අලාභ, අනාගත කාලපරිච්ඡේදයන් තුළ ප්‍රතිවර්තනය නොකෙරේ.

හානිකරණය වීම සම්බන්ධයෙන් කීර්තිනාමය වාර්ෂිකව හෝ සිදුවීම් හෝ තත්ත්වයන්හි වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණය වී ඇති බව හැඟවේ නම් එයට වැඩි වාරග ණනක් සමලෝචනය සිදු කෙරේ. හානිකරණ පරීක්ෂා කිරීමේ කාර්යය වෙනුවෙන්, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය, එම අත්පත් කරගැනීමේ දිනයේ සිට අත්පත් කරගනු ලැබූ සමාගමෙහි අනෙකුත් වත්කම් හා බැරකම් බැංකුවේ මුදල් ජනන ඒකක හෝ සමූහයේ මුදල් ජනන ඒකක කාණ්ඩ වලට පවරා තිබේද යන්න නොසළකා, එම සංයෝජනය සහ ක්‍රියාවන් වෙතින් ප්‍රතිලාභ ලැබීම අපේක්ෂිත එම එක් එක් ඒකකය වෙත පවරනු ලැබේ. කීර්තිනාමය පවරනු ලැබූ එක් එක් එකකය, අභ්‍යන්තර කළමනාකරණ කාර්යයන් වෙනුවෙන් කීර්තිනාමය අධීක්ෂණය කරනු ලබන අවම මට්ටම නියෝජනය කරන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 "මෙහෙයුම් ඛණ්ඩ" සමඟ අනුකූලව මෙහෙයුම් ඛණ්ඩයකට වඩා විශාල නොවේ.

කීර්තිනාමය මුදල් ජනන ඒකකයක (හෝ මුදල් ජනන ඒකක සමූහයක) කොටසක් සහ එම ඒකකය තුළ උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම්වල කොටසක් නිර්මාණය කරන විට, එම මෙහෙයුම උපයෝජ්‍ය කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කිරීමේදී උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම හා සබැඳි කීර්තිනාමය මෙහෙයුමෙහි ධාරණ අගයට ඇතුළත් කරනු ලැබේ. මෙම තත්ත්වය තුළ උපයෝජ්‍ය කරනු ලබන කීර්තිනාමය, උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුමෙහි සහ රඳවාගත් මුදල් ජනන ඒකකවල කොටසෙහි සාපේක්ෂ අගයන් මත පදනම්ව මිනුම්කරණය කෙරේ.

පරිපාලිත සමාගම් විකිණීම සිදුකෙරෙන විට, විකිණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වෙනස සමුච්චිත පරිවර්තන වෙනස්කම් හා කීර්තිනාමය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

5.14 විශ්‍රාම ප්‍රතිලාභ

5.14.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

5.14.1.1 1996 පෙර – විශ්‍රාම භාර අරමුදල

1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවේ සේවයට බඳවා ගත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුමක් බැංකුව ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා වෙනමම පරිපාලනය කෙරෙන අරමුදලක් වෙත දායකත්වය ලබාදීම අවශ්‍ය වේ. මෙම විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ වියදම, ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් වෙනමම තීරණය කරනු ලැබේ.

අඩු කිරීම් නොමැතිව මෙතෙක් හඳුනාගෙන නොමැති අතීත සේවා පිරිවැය, බැඳීම් සෘජුවම පියවීමට ඇති සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මෙතෙක්

හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ අඩු කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයෙන් නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සමන්විත වේ. යම් වත්කමක අගය මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ සහ අතීත සේවා පිරිවැය එකතුව, සැලසුමෙන් ආපසු ගෙවීම් ආකාරයෙන් පවතින කවර හෝ ආර්ථික ප්‍රතිලාභ හෝ සැලසුම වෙත අනාගත දායකත්වයන්ගේ අඩු කිරීම් වලට සීමා කෙරේ.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණනය පිළිබඳ උපදේශක පියල් එස් ගුණතිලක මහතා විසින් 2022 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

විශ්‍රාම ගන්නා සේවකයින් වෙත බැංකුව පහත දැක්වෙන පදනම මත විශ්‍රාම වැටුපක් ලබා දේ. සේවකයකු වසර 10 සම්පූර්ණ කළ පසු හා සාමාන්‍ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සම්පූර්ණ කල පසු විශ්‍රාම වැටුප් ලැබීමේ සුදුසුකම් ලබයි. ගෙවනු ලබන විශ්‍රාම වැටුපේ ප්‍රමාණය පහත පරිදි සේවා කාලය මත රඳා පවතී:

සේවා කාලය		විශ්‍රාම වැටුපේ ප්‍රමාණය
i.	වසර 10 සිට 20 දක්වා	අවසන් වරට ලද දළ වැටුපෙන් 80%
ii.	වසර 21 සිට 29 දක්වා	අවසන් වරට ලද දළ වැටුපෙන් 80 සහ වසර 20 ට වැඩි එක් සේවා වසරක් සඳහා 1% බැගින්
iii.	වසර 30 සහ ඉහළ	අවසන් වරට ලද දළ වැටුපෙන් 90%

විශ්‍රාම වැටුප් භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වෙනම පවත්වා ගෙන යනු ලබන අතර, එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට යටත් වේ. මූල්‍ය ප්‍රකාශ මෙන්ම විගණකගේ වාර්තාවද ඉදිරිපත් කරනු ලබන අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. අරමුදල අවශ්‍ය මට්ටම්වල සිදුකරන බව සහතික කිරීමේ බැඳීමක් බැංකුවට ඇති බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව බැංකුවේ නිරාවරණ පිළිබඳ සමාලෝචනය සඳහා ද ඉදිරිපත් කරනු ලැබේ. විශ්‍රාමිකයා ජීවත් වන තාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවීමට නියමිතය.

5.14.1.2 1996 පසු – විශ්‍රාම අරමුදල

මුදල් අමාත්‍යාංශය මගින් අනුමත කළ පරිදි, 1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුවේ සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා නව විශ්‍රාම අරමුදලක් හඳුන්වාදීමේ කටයුතු බැංකුව විසින් අවසන් කොට ඇත. බැංකුව විසින් මෙය නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වශයෙන් නිගමනය කර තිබෙන බැවින්, අතිරික්තය/හිඟය LKAS 19 අනුව වාර්තා කොට ඇත.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණනය පිළිබඳ උපදේශක පියල් එස් ගුණතිලක මහතා විසින් 2022 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

5.14.1.3 පාරිතෝෂිකය

1996 ජනවාරි 1 දින හෝ පසුව බැංකුවේ සේවයට බැඳුනු සේවකයින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබන අතර, එසේ නැතහොත් යෝජිත පශ්චාත් 1996 නව විශ්‍රාම වැටුප් වැටුප් අරමුදලට එක්වීමට මනාපය පළ කළ හැකි අතර, එවිට පාරිතෝෂිකයට ඇති අයිතිය අහෝසි වේ.

විශ්‍රාම ගැනීම හැරුනු විට, අන් ආකාරයකින් සේවය අවසන් කරන ලද සෙසු සේවකයින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වසරකටම වසර 5 කට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින් සඳහා අඛණ්ඩව සේවය කළ සෑම වසරක් වෙනුවෙන් සේවය නතර කරන ලද මූල්‍ය වසරේ අවසන් මාසයට අදාළ දළ වැටුපෙන් එක් අර්ධයක අනුපාතයට සමාජිතික පාරිතෝෂිකය ලැබීමේ සුදුසුකම් ලබති.

වසර පහකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති සාමාජිකයෙක් පූර්ණ හා සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුවහොත්, ඔහු ආබාධිත පාරිතෝෂික ලබාගැනීමට සුදුසුකම් ලබයි. තවද, වසර පහක අවම සේවා කාලයක් සහිත ක්‍රියාකාරී සාමාජිකයකු, සේවයේ නියුතුව සිටියදී වියෝ වුවහොත්, ඔහුගේ උරුමකරුවන් හට පාරිතෝෂික ප්‍රතිලාභයක් ගෙවනු ලැබේ.

බැංකුව එවැනි පාරිතෝෂික ගෙවීමේ බැරකම් වෙනුවෙන් මාසික වෙන්කිරීමක් සිදුකරන අතර, මෙම වටිනාකම බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිබිඹු කෙරේ. බැංකුව මගින් ආයුගණක තක්සේරුව මත පදනම්ව වෙන් කිරීමක් සිදුකරන ලදී. කෙසේවුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුව විසින් ආයුගණක තක්සේරුව මත පදනම් වී පාරිතෝෂික බැරකම් වෙනුවෙන් වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත.

බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලබා දේ. එම සමාගම්වල වසරක සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත. මෙම බැරකම් වෙනුවෙන් බාහිරව මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.14.2 නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත ගෙවියයුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ඉටු කරනු ලබන සේවාවන්ට අනුව සිදුකෙරෙන අතර, එය කාර්යමණ්ඩල වියදම් යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකමක් ලෙස වාර්තා කෙරේ.

බැංකුව පහත සඳහන් සැලසුම් සඳහා දායකත්වය ලබා දේ:

5.14.2.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයින් සේවකයින්ගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැර) 12% ක් සහ 8% ක් ලෙස පිළිවෙලින් අර්ථසාධක අරමුදලට දායක වේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලක් වන අතර එය අභ්‍යන්තර වශයෙන් පවත්වාගෙන යනු ලැබේ.

5.14.2.2 සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක භාරකාර අරමුදල වෙත බැංකුව සේවකයාගේ අතීකාල නොමැති දළ වැටුපෙන් 3% ක් දායක වේ.

5.15 වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් සැලසුම (1996 ට පෙර/1996 ට පසු)

සුදුසුකම් ලත් ආයුගණකවරයකුගේ උපදෙස් මත පදනම් වී, මෙම යෝජනා ක්‍රමය යටතේ අනාගත බැඳීම් සපුරාගැනීම සඳහා බැංකුව වෙනම අරමුදලක් පවත්වා ගෙන යයි. තවද, මෙම අරමුදලට සහභාගිවන්නන්/සේවකයින්ගේ දායකත්වය තුළින් පමණක් අරමුදල් ලබාගනී.

5.16 වෙන්කිරීම

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යාමේ ඉඩකඩ පවතින විට හා බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විට, වෙන් කිරීම් හඳුනාගනී. යම් වෙන් කිරීමකට අදාළ වියදම ප්‍රතිපූර්ණයක් වේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

5.17 බැඳීම් සහ අසම්භාවතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී සියලුම ප්‍රත්‍යක්ෂ අවදානම් ගණනය කෙරේ. වෙන් වශයෙන් හෝ අන් ආකාරයකින් බැංකුව වගකීම් සහිත පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමක යම් අසම්භාව්‍යතා සහ ප්‍රාග්ධන බැඳීම්වල බැංකුවේ කොටස යෝග්‍ය අනාවරණයන් සමඟ ඇතුළත් කෙරේ.

5.17.1 හඳුනාගැනීමේ පදනම

සාමාන්‍ය ව්‍යාපාර ව්‍යවහාරය තුළ, බැංකුව විසින් ණයවර ලිපි, ඇපසුරුකුම් සහ ප්‍රතිග්‍රහනයන් අඩංගු මූල්‍ය ඇප ලබා දේ. මුදල් ඇප පහසුකමේ වටිනාකමට ඇති බැඳීම් යටතේ මුදල් තුළ මූලිකව හඳුනා ගනී.

අසම්භාව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය අයුරින් මිනුම් කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විය හැකි වගකීම් වේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු නොලබන අතර ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

5.17.2 අගයකිරීම

මුදල් ඇපවලට අදාළ බැඳීම තුළ යම් වැඩිවීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කෙරේ. ලැබෙන වාරික ඇපයේ ජීවකාලය පුරා සරල මාර්ගික පදනමක් මත "ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම" තුළ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

5.18 බදු

5.18.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම්වලට ඇතුළත් වනුයේ අදාළ මූල්‍ය වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්ය. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගන්නා බදු අනුපාත සහ බදු නීති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට පනවනු ලබන හෝ පසුකාලීනව පනවනු ලබන ඒවාය. ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුකූලව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 14 හි දක්වා ඇති අනුපාතයකට බදු අරමුණ ගලපා ඇති වර්ෂයේ ලාභ පදනම මත බදුකරණ සඳහා වෙන්කිරීම සිදු කෙරේ.

5.18.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත බදු වෙන් කෙරේ.

5.18.2.1 විලම්බිත බදු බැරකම

පහත සඳහන් අවස්ථාවලදී හැර සියළු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනා ගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන හා ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයටද බදු අයකර ගත හැකි ලාභයට හෝ අලාභයටද බලපෑමක් නොකරන ගනුදෙනුවක කීර්තිනාමය හෝ වත්කමක් හෝ බැරකමක් මූලික හඳුනාගැනීම තුළින් විලම්බිත බදු බැරකම පැනනගින විට, සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය සඳහා කාලය නියම කිරීම පාලනය කළ හැකි හා දැකියහැකි අනාගතයේදී එම තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොවීමේ සම්භාවිතාවක් පවතින විට.

5.18.2.2 විලම්බිත බදු වත්කම්

සියළු අඩු කළ හැකි වෙනස්කම් වෙනුවෙන් විල්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. පහත සඳහන් අවස්ථාවන්හිදී හැරුනු විට භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉරිදියට ගෙනයාම උපයෝජනය කිරීම සඳහා යොදාගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තාක් දුරට භාවිත නොකළ බදු ණය හා භාවිත නොකළ බදු අලාභ ඉදිරියට ගෙන යාමට හැකියාව ඇත.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදි ගිණුම්කරණ ලාභයට හෝ බදුකළහැකි ලාභය හෝ අලාභයට බලපෑමක් නොවන ගනුදෙනුවක් තුළ වත්කමක් හෝ වගකීමක් මූලිකව හඳුනාගැනීමෙන් බදුකළහැකි තාවකාලික වෙනස්විම්වලට අදාළ විලම්භීත බදු වත්කම් උද්ගත වන විට, සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්විම් දැකියහැකි අනාගතයේදී ප්‍රතිවර්තනය වීමේ සහ තාවකාලික වෙනස උපයෝජනය කිරීම පිණිස බදු අය කළ හැකි ලාභ ලබාගැනීමේ හැකියාව පවතින තාක් දුරට විලම්බිත බදු වත්කම් හඳුනා ගනී.

සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ එම වත්කම සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට අවස්ථාව සැලසීම පිණිස ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ පැවතීමේ හැකියාවක් නොමැති තාක් දුරට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම යළි තක්සේරු කර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම ආපසු අය කර ගැනීමට අවස්ථාව සැලසීමට හැකියාව පවතින තාක් දුරට හඳුනාගනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට පනවනු ලැබ ඇති හෝ පසුකාලීනව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි වීමට හෝ බැරකම් බේරුම් කිරීමට නියමිත වර්ෂයට අදාළ වනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාතික වලට විලම්බිත බදු වත්කම් හා බැරකම් මිනුම්කරණය කරනු ලැබේ.

5.18.3 මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු (FSVAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 අ වගන්තිය හා 2022 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වීහි සංශෝධනයන්ට අනුකූලව බැංකුවේ මුළු වට්ටිනාකම එකතුව 18%ක එකතු කළ අගය මත බද්දකට යටත් කරන ලදී.

5.18.4 එකතු කළ අගය මත බදු (VAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා එහි පසුකාලීන සංශෝධනයන්ට අනුකූලව එකතු කළ අගය මත බද්ද ගණනය කෙරේ. 2019 ජනවාරි 1 සිට 2022 මැයි 31 දක්වා එකතු කළ අගය මත බදු 8% ක අනුපාතයකට සහ 2022 ජූනි 1 සිට 2022 අගෝස්තු 31 දක්වා 12% අනුපාතයකට සහ 2022 සැප්තැම්බර් 1 සිට ඉදිරියට 15% අනුපාතයකට ගෙවිය යුතුය.

5.18.5 ලාභාංශ මත රඳවා ගැනීමේ බදු (WHT)

දේශීය පරිපාලිත සමාගම්වල බදුකළහැකි ලාභයෙන් බෙදාහැරී ලාභාංශ මූලාශ්‍රයේ දී 14%ක අඩුකිරීමක් සිදු කරන අතර එය බැංකුවේ අවසාන බදු වගකීම වේ. 2019 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි ලාභාංශ මත රඳවා ගැනීමේ බදු අවලංගු කර ඇත.

5.18.6 බෝග රක්ෂණ බදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව එක් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් බැංකුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත බදුවලට පසු ලාභයෙන් 1% ක් ගෙවීම අවශ්‍ය වේ.

5.18.7 අධිභාර බද්ද

2002 අංක 14 දරන අධිභාර බදු පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2022 අප්‍රේල් 8 දිනැති දැන්වීමක් බදුගෙවන්නන් වෙත නිකුත් කර ඇත. අධිභාර බද්ද 25%ක අනුපාතයට එකෝචිත බද්දක් වන අතර එය 2020/2021 ත්කසේරු විසර සඳහා රුපියල් බිලියන 2 ඉක්මවන බදුකළහැකි ලාභයක් සහිත පුද්ගල, හවුල්කාරත්ව, හෝ සමාගම් මත පනවනු ලබයි. සමාගම් සම්බන්ධයෙන් අධිභාර බදු පනවන ආකාරය පහතින් පැහැදිලි කර ඇත:

- සමාගමේ බදුකළහැකි ලාභය තහිවම රුපියල් බිලියන 2 ඉක්මවන සමාගමක්, සහ
- සියලුම පරිපාලිත සමාගම්වල සමුච්චිත බදුකළහැකි ලාභය සහ එම සමූහයේ පරිපාලක සමාගම බිලියන 2 ඉක්මවන සමූහයක සැම සමාගමක්

පරිපාලක සමාගම අධිභාර බදු වගකීම ගණනය කිරීමේදී එහි පරිපාලිත සමාගම්වලින් ලැබෙන ලාභාංශවලින් ලැබීම් සහ ලාභ ඉවත් කළ යුතු බව එම දැන්වීමෙන් වැඩිදුරටත් පැහැදිලි කරයි. එමෙන්ම, සමුච්චිත බදුකළ හැකි ආදායම ගණනය කිරීමේදී, යම් පරිපාලිත සමාගමක හෝ පරිපාලක සමාගමකට අලාභ හෝ සහන නොලද අලාභ හේතුවෙන් බදුකළහැකි ආදායම් ප්‍රමාණය ශූන්‍යනම්, එවැනි අලාභ හෝ ශූන්‍ය ප්‍රමාණය නොසලකා හැරිය යුතු බව පැහැදිලි කරයි.

5.18.8 සමාජ ආරක්ෂණ දායක බදු

2022 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනත යටතේ, වාර්ෂික බදුකළහැකි පිරිවැටුම රුපියල් මිලියන 120 ඉක්මවන පුද්ගලයින් මත 2.5%ක සමාජ ආරක්ෂණ බද්දක් පනවා ඇත. ඒ අනුව, බැංකුව 2022 ඔක්තෝබර් 1 දින සිට මෙම බද්දට යටත් වේ.

5.19 ආදායම් සහ වියදම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලාඒන සහ ආදායම විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි තාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ. එක් එක් වර්ගයේ ආදායම් සඳහා වන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායක සටහන් 6 සිට 10 දක්වා ඉදිරිපත් කෙරේ.

5.19.1 රජයේ සුරුකුම්පත් හා ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් වෙතින් ආදායම

ස්ථීර ආවර්තක ලාභ අනුපාතයක් පිළිබිඹු කිරීම උදෙසා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ආධික්‍යය අදාළ කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාණ්ඩාගාර බැඳුම්කර මත කූපන් පොලිය උපචිත පදනමක් මත හඳුනාගනී. ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් මත පොලී ආදායම ගිවිසුමෙහි කාලපරිච්ඡේදය මුළුල්ලේ සඵල පොලී අනුපාතිකය මත ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.19.2 කුලී ආදායම

මෙහෙයුම් කල්බදු මත ඇතිවන කුලී ආදායම ඉදිරියට යන කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත ගණනය කරන අතර, එය ආදායම් ප්‍රකාශයෙහි "වෙනත් මෙහෙයුම් ආදායම" යටතේ වාර්තා කෙරේ.

5.20 බණ්ඩ වාර්තාකරණය

බැංකුවේ බණ්ඩ වාර්තාකරණ පහත සඳහන් මෙහෙයුම් කාණ්ඩ වනම් පුද්ගල බැංකුකරණය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාරය සහ ප්‍රාථමික වෙළෙඳ ඒකකය, කල්බදු, රක්ෂණ, මූල්‍ය සහ සංචාර මත පදනම් වේ. ඉහත කරුණු සම්බන්ධ තොරතුරු සටහන 45හි අනාවරණය කෙරේ.

5.21 තැන්පතු ආරක්ෂණ යෝජනා ක්‍රමය

2010 සැප්තැම්බර් 27 වැනි දින නිකුත් කරන ලද 2010 අංක 5 දරන බැංකුකරණ පනත් නියමය "තැන්පතු බැරකම් රක්ෂණය" සහ පසුකාලීනව මෙයට සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව, 2010 ඔක්තෝබර් මස 1 දින සිට බල පැවැත්වෙන පරිදි, මුදල් නීති පනතේ 32අ සිට 32ඉ වගන්ති යටතේ නිකුත් කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා සහය යෝජනා ක්‍රම රෙගුලාසිවලට අනුකූලව, මුදල් මණ්ඩලය මගින් මෙහෙයවනු ලබන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක සියළු බලපත්‍රලාභී බැංකු සිය තැන්පතු බැරකම් රක්ෂණය කිරීම අවශ්‍ය වේ.

රක්ෂණය කළ යුතු තැන්පතුවලට පහත සඳහන් දෑ හැර ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු බැරකම් ඇතුළත් වේ.

- සාමාජික ආයතන වෙත තැන්පතු බැරකම්
- ශ්‍රී ලංකා රජය වෙත තැන්පතු බැරකම්
- බලපත්‍රලාභී බැංකුවල ආයතන පාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකුකරණ පනත් නියෝගයෙහි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකාරිත්වය සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ප්‍රදානය කරන ලද තැන්පතු බැරකම්
- කවර හෝ ලබාදෙන ලද පහසුකම වෙනුවෙන් අතිරේක ඇප ලෙස රඳවාගත් තැන්පතු බැරකම්
- බැංකුකරණ පනත අනුව අත්හැර දමන ලද දේපළ යන අර්ථය යටතට ගැනෙන තැන්පතු බැරකම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කරනු ලැබ ඇති මූල්‍ය සමාගම් පනත අරමුදල් අනුව අක්‍රීය ගිණුම්

ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු 14% හෝ එයට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගන්නේ නම්, බැංකුව සුදුසුකම්ලත් තැන්පතු බැරකම් මත 0.10%ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වන අතර, අනෙකුත් සියළු වාණිජ බැංකු සඳහා (14%ට අඩු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් සහිත) කාර්තුව අවසානයට පවතින සුදුසුකම්ලත් තැන්පතුවල මුළු අගය මත ගණනය කෙරෙන හා කාර්තුව අවසාන වීමේ සිට දින 15ක කාලපරිච්ඡේදයක් තුළ ගෙවිය යුතු 0.125%ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වේ.

5.22 පසුකාලීන සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමේ දිනය අතර, සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම්ය.

වාර්තාකරණ දිනට පසුව සිදුවන සියළුම ප්‍රමාණාත්මක හා වැදගත් සිදුවීම් සළකා බලා අදාළ වන පරිදි ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 44 හි අනාවරණය කෙරේ.

5.23 රක්ෂණ ක්ෂේත්‍රයට විශේෂිත ප්‍රතිපත්ති

5.23.1 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් බැරකම්

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් සඳහා, වාර්තාකරණ දිනට වාර්තා වී ඇති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ හිමිකම්පෑම් සිදුකර ඇති නමුත් වාර්තාකරණ දිනට වාර්තා වී නොමැති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙකටම ඇස්තමේන්තු සකස් කළ යුතුව ඇත. අවසාන හිමිකම් පිරිවැය නිශ්චිත තහවුරු කළ හැකිවීමට පෙර සැළකිය යුතු කාලපරිච්ඡේදයක් ගතවීමට ඉඩ ඇති අතර, ඇතැම් වර්ගවල ඔප්පු වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි බැරකම් වලින් වැඩි කොටස සිදුවූ නමුත් වාර්තා නොවූ හිමිකම්වලින් සැදුම් ලබයි. චේන් ලැඩර් සහ බෝන්හෙවුටර් – ෆර්ගසන් ක්‍රම සහ සංඛ්‍යාත/තීව්‍රතා ක්‍රම වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපන ශිල්පීය ක්‍රම රාශියක් භාවිත කරමින් නොගෙවූ හිමිකම්පෑම්වල අවසාන පිරිවැය ඇස්තමේන්තු කරනු ලබයි.

මෙම ශිල්පීය ක්‍රමවලට පාදක වන ප්‍රධාන උපකල්පන වනුයේ, සමාගමක අතීත හිමිකම්පෑම් විකාශන අත්දැකීම්, අනාගත හිමිකම්පෑම් විකාශනය ප්‍රක්ෂේපණය කර භාවිත කළ හැකි අතර, එබැවින් අවසාන හිමිකම් පිරිවැය ප්‍රක්ෂේපනයට භාවිත කළ හැකි බවයි. එබැවින්, මෙම ක්‍රම පෙර වර්ෂවල නිරීක්ෂණය කරන ලද විකාශනය හා අපේක්ෂිත අලාභ අනුපාතික මත පදනම්ව ගෙවූ හා සිදුවූ අලාභ, එක් හිමිකම්පෑමකට සාමාන්‍ය පිරිවැය හා හිමිකම්පෑම් සංඛ්‍යාව බහිර්නිර්වේෂණය කරයි. ඓතිහාසික හිමිකම්පෑම් විකාශනය ප්‍රධාන වශයෙන්ම අහඹු වර්ෂ මගින් විශ්ලේෂණය කෙරෙන නමුත්, භූගෝලීය ප්‍රදේශය මෙන්ම වැදගත් ව්‍යාපාර මාර්ග සහ හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබිය හැකිය. අලාභ ගැලපුම් ඇස්තමේන්තුවල මුහුණත් අගයට වෙන් කිරීමෙන් හෝ ඒවායේ අනාගත තත්ත්වය පිළිබිඹු කිරීම පිණිස වෙනම ප්‍රක්ෂේපණය කිරීමෙන් විශාල හිමිකම්පෑම් සාමාන්‍යයෙන් වෙනම ආමන්ත්‍රණය කරනු ලබයි. බොහෝ අවස්ථාවලදී, අනාගත හිමිකම්පෑම් උද්ධමන අනුපාතික හෝ අලාභ අනුපාතික සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ උපකල්පන සිදු නොකෙරේ. ඒ වෙනුවට භාවිත කෙරෙන උපකල්පන වන්නේ ප්‍රක්ෂේපන පදනම් වන ඓතිහාසික හිමිකම් විකාශන දත්ත තුළ ගම්‍යවන ඒවාය.

සම්බන්ධ වී ඇති සියළු අවිනිශ්චිතතා සැළකිල්ලට ගනිමින් ඇති විය හැකි පුළුල් පරාසයක ප්‍රතිඵලය ඉදිරිපත් කෙරෙන හිමිකම්පෑමේ ඇස්තමේන්තුගත අවසාන පිරිවැය තීරණය කිරීම සඳහා අතීත ප්‍රවණතා අනාගතයේදී අදාළ නොවිය හැකි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අතිරේක ගුණාත්මක විනිශ්චය භාවිත කරනු ලැබේ. (උදාහරණයක් ලෙස එක්වරක් පමණක් සිදුවන සිදුවීම්, හිමිකම්පෑම් සම්බන්ධයෙන් ජනතා ආකල්පවල වෙනස්වීම් වැනි වෙළෙඳපොල සාධකවල වෙනස්වීම්, ආර්ථික තත්ත්වයන්, උද්ධමන මට්ටම්, අධිකරණ තීන්දු හා නීති වැනි බාහිර හෝ වෙළෙඳපොල සාධකවල වෙනස්වීම් මෙන්ම කළඹ මිශ්‍රණය ඔප්පු ලක්ෂණ හා හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි).

නොඉපැයූ ආධික්‍යය වෙනුවෙන් වෙන්කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේදී සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදාගනු ලැබේ. ගිවිසුමක් මගින් සැපයෙන රක්ෂණ සේවා රටාවට, කාල බෙදා වෙන්කිරීම හැර වෙනත් පදනමකින් නොඉපැයූ ආධික්‍යය ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීමේදී ද විනිශ්චය අවශ්‍ය කෙරේ.

5.23.2 ආදායම් හඳුනාගැනීම

දළ ලිඛිත රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලබයි.

ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලැබේ. පූර්ව ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ආරම්භ වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ පැනනගින කවර හෝ ගැලපුම් රක්ෂණ වාරිකයට අයත් වේ.

නොඉපැයූ ප්‍රතිරක්ෂණ රක්ෂණ චාරිකය යනු වර්ෂයක චාර්තාකරණ දිනට පසුව අවදානම් කාලපරිච්ඡේද හා සබැඳි ලිඛිත රක්ෂණ චාරික කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ ආධික්‍යය එයට පාදක වන සෘජු රක්ෂණ ඔප්පු වල කාලසීමාව පුරා විලම්බනය කරනු ලැබේ.

5.24 නිකුත්කළ නමුත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති

මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමේ දිනයට නිකුත් කළ නමුත් එතෙක් බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිති පහත අනාවරණය කෙරේ.

- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – SLFRS 17 – රක්ෂණ ගිවිසුම්**
  SLFRS 17 යනු රක්ෂණ ගිවිසුම් සඳහා හඳුනාගැනීම සහ මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය ආවරණය කරන නව විස්තරාත්මක ගිණුම්කරණ ප්‍රමිතියකි.

- **LKAS 12 – ආදායම් බදු වෙත සංශෝධන**
  මෙම සංශෝධනයෙන් වගකීමක් නිරවුල්කරන ගෙවීම් බදු අරමුණ සඳහා අඩුකළ හැකි අවස්ථාවක, එවැනි අඩුකිරීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් වගකීමේ හෝ අදාළ වත්කමේ සංරචකයක (සහ පොළී වියදම) බදු අරමුණ සඳහා ආරෝපනය වේද යන්න පිළිබඳ විනිශ්චයට හේතු වන ආකාරය (අදාළ බදු නීතිය සැලකිල්ලට ගනිමින්) පැහැදිලි කරයි. මෙම විනිශ්චය යම් තාවකාලික වෙනස්වීම් වත්කමේ සහ වගකීමේ මූලික හඳුනාගැනීම මත පවතින්නේද යන්න තීරණය කිරීමේදී වැදගත් වේ.

- **LKAS 8 – ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ වලට සංශෝධන**
  මෙම සංශෝධනයෙන් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ දෝෂ නිවැරදි කිරීම අතර වෙනස පැහැදිලි කරයි. එමෙන්ම, ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීමට මැනුම් ශිල්ප සහ දෙයවුම් ආයතන විසින් භාවිතා කරන ආකාරය ද ඉන් පැහැදිලි කරයි. සංශෝධිත ප්‍රමිතියෙන් යෙදවුමක වෙනසක් හෝ මැනුම් ශිල්පයක වෙනසක් පිළිබඳ ගිණුම්කරණ ඇස්තමේන්තුවක් මත බලපෑම් පෙර කාලසීමාවල දෝෂ නිවැරදි කිරීමෙන් ඒවා ඇති නොවේනම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් වන බව පැහැදිලි කරයි.

- **LKAS 1: ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම් වර්ගීකරණයට සංශෝධන**
  මෙම සංශෝධනයෙන් ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම් වර්ගීකරණය සඳහා අවශ්‍යතාව විස්තර කරයි. මෙම සංශෝධනයෙන් බේරුම්කිරීම කල් දැමීමේ අයිතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද, වාර්තාකරණ කාල සීමාව අවසානයේ කල් දැමීමේ අයිතියක් පැවතිය යුතු බවත්, යම් ආයතනයක් එහි කල්දැමීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ සම්භාවිතාවයෙන් එම වර්ගීකරණය බලපාන්නේ නැති බවත්, පරිවර්තනය කළ හැකි වගකීමක් තුළ ඇතුළත් ව්‍යුත්පන්නයක් කොටස් මෙවලමක් වන්නේ නම් පමණක් වන කොන්දේසි වගකීම එහි වර්ගීකරණයට සහ හෙළිදරව් කිරීම්වලට බලපාන්නේ නැති බවත් පැහැදිලි කරයි.

6. දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුව/සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභය (ප්‍රතිලාභ) ප්‍රවාහ වීමේ හැකියාවක් පවතීද සහ ආදායම විශ්වසනීය ලෙස මිනුම්ගත කළ හැකිද යන්න පදනම් කර ගනිමින් ආදායම හඳුනා ගනී. එක් එක් වර්ගයේ ආදායම සඳහා විශේෂ හඳුනාගැනීමේ නිර්ණායක අදාළ ආදායම් සටහන්වල සම්පූර්ණයෙන් දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
පොළී ආදායම	7.1	321,935,983	197,330,011	351,386,736	222,362,450
ගාස්තු සහ කොමිස් ආදායම	8.1	16,397,745	8,268,168	17,213,747	9,645,136
වෙළෙඳ කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/(අලාභ	9	17,026,226	(1,345,029)	17,019,836	(1,207,608)
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	10	1,868,655	2,996,670	5,583,879	5,995,063
		357,228,609	207,249,820	391,204,198	236,795,041

7. ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය හානිකරණය වූ වත්කම් හැර මූල්‍යමය වත්කම්/බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට සවිල පොළී අනුපාතිකය යොදා ගනිමින් බැංකුව/සමූහය මගින් පොළී ආදායම/වියදම ගණනය කරනු ලබයි.

සවිල පොළී අනුපාතික ක්‍රමය

SLFRS 9 යටතේල ක්‍රමක්ෂය පිරිවැයට අඟයකළ සියලුම මූල්‍ය උපකරණ, ලාභ හෝ අලාභ තුළින් සාධාරණය අඟයට අඟයකළ මූල්‍ය උපකරණ (FVPL) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අඟයට අඟය කළ පොළී දරණ මූල්‍ය වත්කම් (FVOCI) සඳහා සවිල පොළී අනුපාතය (EIR) භාවිතා කරමින් පොළී ආදායම වාර්තා කරනු ලබයි. බැංකුවලට ගෙවියයුතු දෑ, අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු දෑ සහ අනෙකුත් ණය වැනි වාර්තාකළ වගකීම් සඳහා සවිල පොළී අනුපාතය (EIR) භාවිතා කරමින් පොළී වියදම වාර්තා කරනු ලබයි.

සවිල පොළී අනුපාතිකය යනු මූල්‍යමය වත්කමෙහි හෝ මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ හෝ වියට වඩා කෙටි කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍යමය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අඟයට තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලබන අනුපාතිකයයි. මෙම ආගණනය මූල්‍ය උපකරණයෙහි සියළු ගිවිසුම්ගත නියමයන් සැළකිල්ලට ගන්නා අතර, මූල්‍ය උපකරණය වෙත සෘජුවම පැවරිය හැකි සහ සවිල පොළී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන යම් ගාස්තු හෝ වර්ධනීය පිරිවැය ඇතුළත් කරගන්නා නමුත් අනාගත ණය අලාභ ඇතුළත් කර නොගනී.

හානිකරණ අලාභයන් හේතුවෙන් මූල්‍යමය වත්කමක හෝ සමාන මූල්‍යමය වත්කම් සමූහයක වාර්තාගත අඟය අඩු කරනු ලැබූ පසු, හානිකරණ අලාභය මිනුම්කරණ කාර්යය වෙනුවෙන් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස භාවිත කරන ලද පොළී අනාපාතිකයම තවදුරටත් භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරේ.

7.1 පොළී ආදායම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	9,830	240,498	15,263	285,264
බැංකුවල පවතින ශේෂයන්	926,746	2,419,823	1,486,976	2,525,712
ණය සහ අත්තිකාරම් – බැංකු	892,160	1,206,812	926,734	1,274,194
මූල්‍යමය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අඟය අනුව	921,043	768,284	921,043	768,284
ණය සහ අත්තිකාරම් වෙනත් ගනුදෙනුකරුවන් සඳහා	232,797,261	153,693,234	258,849,618	177,714,884
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	84,305,541	37,343,071	86,999,376	38,075,269
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම මනිනු ලබන ණය උපකරණ	1,246,709	704,633	1,351,033	765,187
කාර්ය මණ්ඩල ණය මත දිනා එකක වෙනස	836,693	953,656	836,693	953,656
මුළු පොළී ආදායම	321,935,983	197,330,011	351,386,736	222,362,450

7.2 පොළී වියදම

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
බැංකුවලට ගෙවිය යුතු	6,633,232	8,114,157	8,624,421	8,982,646
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	199,571,363	97,603,454	210,041,439	105,318,788
වෙනත් ණය ගැනීම්	33,861,939	3,465,215	33,842,362	3,451,678
නිකුත් කරන ලද ණය සුරැකුම්	5,503,630	5,103,325	7,060,585	6,966,957
කල්බදු වගකීම් මත පොළිය	607,754	583,020	782,854	767,602
මුළු පොළී වියදම	246,177,918	114,869,171	260,351,661	125,487,671
ශුද්ධ පොළී ආදායම	75,758,065	82,460,840	91,035,075	96,874,779

8. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුව/සමූහය ස්වකීය ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන පුළුල් පරාසයට පැතිරුනු විවිධාකාර සේවාවන් සැපයීම මගින් ගාස්තු හා කොමිස් මුදල් ආදායම් උපයයි. සේවය ඉටු කරනු ලැබූ විට ගාස්තු හා කොමිස් මුදල් හඳුනාගනී. කිසියම් කාලපරිච්ඡේදයක් මුළුල්ලේ සේවා සැපයීම වෙනුවෙන් උපයන ලද ගාස්තු අදාළ කාලපරිච්ඡේදයට උපචිත කෙරේ.

8.1 ගාස්තු හා කොමිස් ආදායම

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ණය	655,326	1,271,909	655,326	1,271,909
කාඩ්පත්	2,349,323	1,600,975	2,349,323	1,600,975
වෙළෙඳ හා ප්‍රේෂණ	8,320,217	1,361,782	8,320,217	1,361,782
ආයෝජන බැංකුකරණය	43,273	93,339	43,273	93,339
තැන්පතු	4,034,560	2,883,922	4,034,560	2,883,922
ඇපකර	719,146	716,185	719,146	716,185
වෙනත්	275,900	340,056	1,091,902	1,717,024
මුළු ගණන	16,397,745	8,268,168	17,213,747	9,645,136

8.2 ගාස්තු හා කොමිස් වියදම

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
කාඩ්පත්	806,575	333,087	806,575	333,087
වෙළෙඳ හා ප්‍රේෂණ	500	654	500	654
ආයෝජන බැංකුකරණය	19,934	43,084	19,934	43,084
ඇපකර	1,150	1,643	1,150	1,643
වෙනත්	516	219,318	516	219,318
මුළු ගණන	828,675	597,786	828,675	597,786
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	15,569,070	7,670,382	16,385,072	9,047,350

9. වෙළෙඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය), වෙළෙඳ කටයුතු වලින් පැන නගින විදේශ විනිමය ලාභ හෝ අලාභ, "මූල්‍යමය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව" වශයෙන් වර්ගීකරණය කරන ලද හිමිකම් සහ ස්ථාවර ආදායම් සුරැකුම් වල ආයෝජන තුළින් උපලබ්ධි කර ගත් ලාභ හෝ අලාභ සහ මූල්‍ය වත්කම් සහ බැරකම් වල සාධාරණ අගය වෙනස්වීම් හේතුවෙන් පැන නගින උපලබ්ධි නොවූ ලාභ සහ අලාභවලින් සමන්විත වේ.

ඉහත දක්වන ලද උපකරණවල සාධාරණ අගය වෙනස්වීම හේතුවෙන් පැන නගින ලාභ හෝ අලාභ ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනෙන අතර, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එක් එක් වාර්තාකරණ දිනයේදී සාධාරණ අගය අනුව ගණනය කෙරේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වෙළඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභ)					
වෙළෙඳාමෙන් ලාභය/(අලාභය)	9.1	2,944,849	(830,479)	2,938,459	(693,058)
ශුද්ධ සාධාරණ අගය අනුව ලාභ/(අලාභ)	9.2	14,081,377	(514,550)	14,081,377	(514,550)
මුළු ගණන		17,026,226	(1,345,029)	17,019,836	(1,207,608)

9.1 වෙළෙඳාමෙන් ලාභය/(අලාභය)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
විදේශ විනිමය	2,740,436	(965,361)	2,740,436	(965,361)
රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර)	184,223	143,459	184,223	143,459
ස්කන්ධ	20,190	(8,577)	13,800	128,844
මුළු ගණන	2,944,849	(830,479)	2,938,459	(693,058)

9.2 ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්වල ශුද්ධ සාධාරණ අගය අනුව ලාභ (අලාභය)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ව්‍යුත්පන්න	14,313,449	(440,500)	14,313,449	(440,500)
රජයේ සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	1,652	(4,074)	1,652	(4,074)
භාණ්ඩාගාර බැඳුම්කර	(233,724)	(69,976)	(233,724)	(69,976)
මුළු ගණන	14,081,377	(514,550)	14,081,377	(514,550)

10. වෙනත් මෙහෙයුම් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය/අලාභය

දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය/අලාභය දේපල, පිරියත සහ උපකරණ පාලනය අහිත් පාර්ශ්වය වෙත මාරුකරන ලද අවස්ථාවේදී හඳුනා ගනී.

ආයෝජන වෙතින් ලාභාංශ

ලාභාංශ ආදායම අදාළ ගෙවීම ලබාගැනීමේ බැංකුවේ/සමූහයේ අයිතිය තහවුරු කෙරෙන අවස්ථාවේදී හඳුනාගනී.

කපා හරින ලද බොල් ණය පියවා ගැනීම

බොල් ණය වශයෙන් කපාහරින ලද මුදල් ප්‍රමාණයන් අයකිරීම අදාළ මුදල ලද පසු හඳුනාගනී.

ශුද්ධ ඉපැයුම් වාරිකය

ශුද්ධ ඉපැයුම් වාරිකය යනු, දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිරක්ෂණය සඳහා පවරන ලද වාරිකය සහ සංචිත නොඉපැයූ වාරික අඩු කිරීමෙන් ලැබෙන අගය වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 5.23 හි විස්තර කෙරේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
දේපළ, පිරියත සහ උපකරණ සහ භාවිතයට අයිතිය ඇති වත්කම් විකිණීම මත ලාභය	174,560	62,744	237,350	126,830
ආයෝජන වෙතින් ලාභාංශ				
ලැයිස්තුගත කළ	71,328	24,737	77,760	30,986
ලැයිස්තුගත නොකළ	129,600	143,079	129,600	143,079
පරිපාලිත ආයතන	707,698	1,634,943	-	-
කපා හරින ලද බොල් ණය අයකිරීම	97,430	28,461	97,430	28,461
ශුද්ධ ඉපැයුම් වාරිකය	-	-	4,242,248	4,639,833
වෙනත්	688,039	1,102,706	799,491	1,025,874
මුළු ගණන	1,868,655	2,996,670	5,583,879	5,995,063

11. හානිකරණ අයකිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තරාත්මකව දක්වා ඇති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 - "මූල්‍යමය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ මිනුම්කරණය සඳහා පියවර තුනක ප්‍රවේශය යොදා ගනිමින් බැංකුව/සමූහය මූල්‍යමය වත්කම්වල හානිකරණ අලාභ හඳුනාගනී.

තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 36 'වත්කම් හානිකරණය' අනුව මූල්‍යමය නොවන වත්කමක ධාරක වටිනාකම අදාළ වත්කම භාවිතයෙන් හෝ විකිණීමෙන් ඇස්තමේන්තුගත අයකරගත හැකි වටිනාකම ඉක්මවා ගිය අවස්ථාවේදී බැංකුව/සමූහය මගින් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි. මෙයට සම්බන්ධ විස්තර මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන 5.13 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

	බැංකුව (සටහන 11.1)		සමූහය (සටහන 11.2)	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	28,366,700	13,282,540	29,374,441	12,863,972
වෙනත් මූල්‍ය වත්කම්	5,031,360	1,169,644	5,031,360	1,169,644
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	(51,609)	20,636	(51,609)	20,636
වෙනත්	-	-	(1,355)	431,206
මුළු හානිකරණ අයකිරීම්	33,346,451	14,472,820	34,352,837	14,485,458

11.1 බැංකුව

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2022			
	සටහන	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	re''000	re''000	re''000	re''000
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(235,379)	-	-	(235,379)
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	(1,815,409)	9,215,436	20,966,673	28,366,700
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	-	5,249,114	-	5,249,114
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	518	-	-	518
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	(22,024)	106,725	(136,310)	(51,609)
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අයකිරීම්		(2,071,560)	14,587,648	20,830,363	33,346,451
මුළු හානිකරණ අයකිරීම්					33,346,451

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2021			
	සටහන	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	(703)	5,102	-	4,399
බැංකුවල පවතින ශේෂයන්	19.2	(31,033)	-	-	(31,033)
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	133,705	-	-	133,705
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	1,637,097	6,457,732	5,187,711	13,282,540
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	1,061,847	-	-	1,061,847
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	726	-	-	726
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	750	206,330	(186,444)	20,636
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අයකිරීම්		2,802,389	6,669,164	5,001,267	14,472,820
වෙනත්					-
මුළු හානිකරණ අයකිරීම්					14,472,820

11.2 සමූහය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2022			
	සටහන	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	734	16,373	-	17,107
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(235,379)	-	-	(235,379)
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	(1,669,045)	9,107,554	21,935,932	29,374,441
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	-	5,249,114	-	5,249,114
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	518	-	-	518
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	(22,024)	106,725	(136,310)	(51,609)
මූලෘමය වත්කම් මත මුළු හානිකරණ අයකිරීම්		(1,925,196)	14,479,766	21,799,622	34,354,192
වෙනත්					
කපාහැරීම් ඇතුළුව ඇප බැහැර කිරීම මත අලාභ					(32,966)
කීර්තිනාමය මත හානිකරණ අයකිරීම්	29.2				31,611
මුළු හානිකරණ අයකිරීම්					34,352,837

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2021			
	සටහන	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	(703)	5,102	-	4,399
බැංකුවල පවතින ශේෂයන්	19.2	(31,033)	-	-	(31,033)
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	133,705	-	-	133,705
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	2,006,360	6,212,795	4,644,817	12,863,972
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	1,061,847	-	-	1,061,847
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	726	-	-	726
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	750	206,330	(186,444)	20,636
මූලෘමය වත්කම් මත මුළු හානිකරණ අයකිරීම්		3,171,652	6,424,227	4,458,373	14,054,252
වෙනත්					
කපාහැරීම් ඇතුළුව ඇප බැහැර කිරීම මත අලාභ					304,997
කීර්තිනාමය මත හානිකරණ අයකිරීම්	29.2				126,209
මුළු හානිකරණ අයකිරීම්					14,485,458

12. සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක මණ්ඩල වියදම් ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, නිශ්චිත දායකත්ව/ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වයන් සහ සෙසු කාර්ය මණ්ඩලය ආශ්‍රිත වියදම්වලින් සමන්විත වේ. කෙටි කාලීන සේවක බැඳීම් වට්ටම් රහිත පදනමක් මත මිනුම්ගත කෙරෙන අතර අදාළ සේවාව සපයන ලද අවස්ථාවේදී අදාළ වියදම් දරනු ලැබේ. සේවකයා විසින් සපයනලද පසුගිය සේවාවක ප්‍රතිඵලයක් ලෙස බැංකුව/සමූහය සතුව කිසියම් මුදලක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් පවතී නම් සහ එකී බැඳීම විශ්වසනීය අයුරින් මිනුම්ගත කළ හැකි නම් අදාළ ගෙවීමට අපේක්ෂිත මුදල සඳහා කෙටි කාලීන මුදල් දීමනා යටතේ බැරකමක් ලෙස හඳුනා ගනී.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වැටුප්, ප්‍රසාද දීමනා සහ ආශ්‍රිත වියදම්		20,364,710	18,603,077	25,860,327	23,449,166
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වෙත දායකත්වය - විශ්‍රාම අරමුදල්	12.1	2,697,765	783,921	2,697,765	783,921
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වෙත දායකත්වය - පාරිතෝෂිකය	12.2	44,383	171,742	146,586	297,601
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය		836,693	953,656	836,693	953,656
වෙනත්		2,659,197	2,259,539	2,659,197	2,259,539
මුළු ගණන		26,602,748	22,771,935	32,200,568	27,743,883

12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වෙත දායකත්වය - විශ්‍රාම අරමුදල්

බැංකුව මගින් 1996 ජනවාරි 1 දිනට පෙර සේවයට බැඳුනු සහ 1996 ජනවාරි 1 දිනට පසු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා, වෙන් වෙන්ව පරිපාලනය කෙරෙන අරමුදල් සඳහා දායකත්වය සැපයීම අවශ්‍ය වන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් දෙකක් පවත්වා ගෙන යනු ලබයි. බැංකුව මගින් මෙම විශ්‍රාම අරමුදල් වෙතින් පැන නගින ආයුගණක ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගැනෙන අතර, මෙම අරමුදල් ආශ්‍රිත වියදම් ආදායම් ප්‍රකාශයෙහි සේවක මණ්ඩල වියදම් යටතේ වාර්තා කෙරේ. මෙම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ විස්තර"සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" (සටහන 35.1 සහ 35.2) හි දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් ශුද්ධ වියදම					
නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම - 1996 ට පෙර විශ්‍රාම භාර අරමුදල	35.1.3	2,257,664	1,219,509	2,257,664	1,219,509
නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම - 1996 ට පසු විශ්‍රාම අරමුදල	35.2.3	440,101	(435,588)	440,101	(435,588)
		2,697,765	783,921	2,697,765	783,921

12.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වෙත දායකත්වය - පාරිතෝෂික - (සටහන 35.3)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් ශුද්ධ වියදම				
පශ්චාත් සේවා පිරිවැය	(126,496)	79,085	(126,496)	79,085
ප්‍රවර්තන සේවා පිරිවැය	72,839	34,426	123,941	97,356
පොලී පිරිවැය	98,039	58,231	149,141	121,160
ශුද්ධ වියදම	44,383	171,742	146,586	297,601

13. වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙනත් වියදම් ඒවාට අදාළ කාලපරිච්ඡේදය තුළ එම වියදම් දරනු ලබන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත. ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීමට වැය කෙරෙන සියළු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයෙන් අය කරනු ලැබේ.

ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය ක්‍රමවේදයන් සහ අනුපාතයන් පිළිබඳ සටහන 28 (දේපළ, පිරියත හා උපකරණ භාවිතයට අයිතිය ඇති වත්කම්) හි නියම කොට දක්වා ඇති පරිදි වේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන		7,127	7,436	22,031	15,355
විගණකවරුන්ගේ පාරිශ්‍රමික		7,850	12,940	23,224	26,261
විගණකවරුන් වෙත විගණන නොවන ගාස්තු		-	-	2,566	2,216
වෘත්තික සහ නෛතික වියදම්		179,198	133,435	219,667	163,716
ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය	13.1	4,705,872	5,054,904	5,366,761	5,711,558
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්		10,400,862	7,620,394	12,060,569	9,270,988
ප්‍රතිලාභ හිමිකම් හා ප්‍රාරක්ෂණ වියදම්		-	-	3,480,043	2,951,534
තැන්පතු රක්ෂණ වාරිකය		2,253,144	1,992,415	2,402,371	2,139,069
වෙනත්		3,184,734	2,468,054	3,210,551	2,490,474
මුළු ගණන		20,738,787	17,289,578	26,787,783	22,771,171

13.1 ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
දේපල, පිරියත සහ උපකරණවල ක්ෂයකිරීම	28	2,035,637	2,308,320	2,321,035	2,605,467
භාවිතයට අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය	28	2,017,947	2,106,844	2,378,562	2,450,170
ආයෝජන දේපල ක්ෂයකිරීම		-	1,606	-	1,606
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	29	652,288	638,134	667,164	654,315
මුළු ගණන		4,705,872	5,054,904	5,366,761	5,711,558

14. ආදායම් බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වර්තන බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 - "ආදායම් බදු" වලට අනුව, බදු වියදම යනු ප්‍රවර්තන සහ විලම්බිත බදු සම්බන්ධයෙන් අදාළ කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී ඇතුළත් කෙරෙන සමස්ත මුදල් ප්‍රමාණයයි. ආදායම් බදු වියදම වෙනත් විස්තීර්ණ ආදායම් හි සෘජුව හඳුනාගැනෙන අයිතමයන්ට සම්බන්ධ නොවන්නේ නම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ. ඉහත දක්වන ලද ආකාරයේ අවස්ථාවන්හිදී එය වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගැනේ.

ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එහි 2021 අංක 10 දරන සංශෝධිත පනතේ විධිවිධානවලට අනුකූල වන බදුකරණ අරමුණ සඳහා ගළපන ලද වර්ෂයේ ලාභයේ පදනම මත බදුකරණ වෙන්කිරීම සිදු කෙරේ. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ විස්තරාත්මක අනාවරණය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 5.18 හි දක්වා ඇත.

විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තාකරන දිනයට තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කෙරේ. විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු සම්බන්ධයෙන් විස්තරාත්මක අනාවරණය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 5.18.2 හි දක්වා ඇත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ප්‍රවර්තන වර්ෂයේ බදු වියදම්					
ආදායම් බදු වියදම	14.1	8,450,869	6,855,681	11,027,952	10,178,826
පෙර වර්ෂයේ (අඩි)/ඉහළ වෙන්කිරීම		(105,881)	174,406	(105,881)	174,406
විලම්බිත බදු අයකිරීම/(බැර)	14.2	(2,813,793)	(708,270)	(3,372,002)	(1,539,263)
ආදායම් බදු අනුපාත වෙනස මත විලම්බිත බදු අයකිරීම/(බැර)		(1,384,856)	344,640	(1,384,856)	344,640
මුළු බදු වියදම		4,146,339	6,666,457	6,165,213	9,158,609
සඵල බදු අනුපාතිකය (%)		19.4%	21.9%	23.1%	24.6%

14.1 බදු වියදම් සැසඳීම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වසර සඳහා බදු පෙර ලාභය	21,338,397	30,386,600	26,690,652	37,246,257
කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු (අදාළ වන බදු අනුපාතිකයට ගිණුම්කරණ ලාභය)	5,761,367	7,292,784	6,405,756	8,939,102
එකතු කළා: බදු කාර්යයන් සඳහා අඩු කළ නොහැකි වියදම්වල බදු බලපෑම	13,874,938	7,665,037	15,287,710	10,292,851
(අඩු කළා): බදු කාර්යයන් සඳහා අඩු කළ හැකි වියදම්වල බදු බලපෑම	(11,185,437)	(8,102,140)	(10,665,515)	(9,053,127)
කාලපරිච්ඡේදය සඳහා අදායම් බදු වියදම	8,450,868	6,855,681	11,027,952	10,178,826

14.2 ආදායම් ප්‍රකාශයෙහි විලම්බිත බදු අය කිරීම්/(බැරකම) පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
විලම්බිත බදු වත්කම්	513,878	(1,580,036)	611,847	(2,638,261)
විලම්බිත බදු වගකීම්	(4,712,527)	1,216,406	(5,368,705)	1,443,638
ලාභයට/(අලාභයට) විලම්බිත බදු (බැරකම්)/අය කිරීම්	(4,198,649)	(363,630)	(4,756,858)	(1,194,623)

14.3 වෙනත් විස්තීර්ණ ආදායම තුළ විලම්බිත බදු අයකිරීම/(බැරකම) පහත පරිදි වේ:

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා	2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	(991,318)	3,110,193	(953,496)	3,106,359
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය	1,052,155	881,484	1,313,946	917,484
වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට උපකරණවලින් ලාභය (අලාභය)	-	-	(137,822)	(30,075)
ආරම්භක ශේෂය මත ආදායම බදු අනුපාතයේ වෙනස මත විලම්භිත බදු බලපෑම	2,056,688	(245,293)	2,056,688	(245,293)
අනෙකුත් විස්තරාත්මක ආදායමට විලම්බිත බදු අයකිරීම/(බැරකම)	2,117,525	3,746,384	2,279,316	3,748,475
වර්ෂය සඳහා ශුද්ධ විලම්බිත බදු	(2,081,124)	3,382,754	(2,477,542)	2,553,852

14.4 ආදායම් බදු මත අදාළ අනුපාත

	2022 %	2021 %
බැංකුවේ දේශීය මෙහෙයුම්	30	24
අක් වෙරළ බැංකුකරණ ඒකකයෙහි දේශීය බැංකුකරණ මෙහෙයුම්	30	24
අක් වෙරළ බැංකුකරණ ඒකකයෙහි අක් වෙරළ බැංකුකරණ මෙහෙයුම්	30	24
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී	30	24
පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	30	24
පීපල්ස් මයික්‍රෝ ෆයිනෑන්ස් ලිමිටඩ්	30	24
සීමාසහිත පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්	30	24

14.5 අධිභාර බද්ද

2022 අංක 14 දරන අධිභාර බදු පනත පරිදි, 2020/2201 තක්සේරු වසරට අදාළව රුපියල් බිලියන 5.4ක අධිභාර බද්දක් සඳහා බැංකුව වගකීමට බැඳී සිටී. එකී පනතට අනුකූලව, එකී පනත 2020 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන මූල්‍ය වසර තුළ වියදමක් ලෙස සලකනු ලැබේ. පනත මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අභිබවා යන බැවින්, මෙම අධිභාර බදු වියදම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ පරිදි අධිභාරය සඳහා ගිණුම්කරණය මත විකල්ප සැලකීමේ ප්‍රකාශය යටතේ අවසර දී ඇති පරිදි ගිණුම්ගත කොට ඇත. ඒ අනුව බැංකුව, 2022 ජනවාරි 1 දිනට ආරම්භක රඳවා ගැනීමේ ඉපයීම්වලට ගැලපීමක් ලෙස අධිභාර බද්ද සඳහා මුළු වගකීම හඳුනා ගෙන ඇත.

	බැංකුව	සමූහය
අධිභාර බද්ද	5,439,713	7,932,806

15 කොටසකට ඉපයීම

15.5 කොටසක මූලික ඉපයීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 33 - "කොටසකට ඉපැයීම්" අනුව, කොටසකට මූලික ඉපැයීම් ගණනය කිරීම සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන පහත සඳහන් ලාභය සහ වසර තුළ හිඟව පවත්නා සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය මත පදනම් වී ඇත:

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2022	2021	2022	2021
සාමාන්‍ය කොටස් හිමියන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය (රු.'000)	17,192,058	23,720,143	19,571,989	26,350,975
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් වල බරතබන ලද සාමාන්‍යය (රු.'000)	1,000	1,000	1,000	1,000
කොටසකට මූලික ඉපැයීම් (රු.)	17,192	23,720	19,572	26,351

15.6 කොටසක තනුක ඉපයීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 33 - "කොටසකට ඉපැයීම්" අනුව, කොටසකට තනුක ඉපැයීම් ගණනය කිරීම සියළු තනුක විභවය සහිත සාමාන්‍ය කොටස්වල බලපෑම සඳහා ගැළපුම් කිරීමෙන් පසුව සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන සහ වසර තුළ හිඟව පවත්නා සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය මත පදනම් වී ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2022	2021	2022	2021
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ හැකි හැකි ශුද්ධ ලාභය (රු.'000)	17,192,058	23,720,143	19,571,989	26,350,975
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් වල බර තබන ලද සාමාන්‍යය (රු.'000)	1,000	1,000	1,000	1,000
විභජනය සඳහා වෙන් කර ඇති ප්‍රාග්ධනයේ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (රු. '000)	243,040	243,040	243,040	243,040
විභජනය සඳහා වෙන් කර ඇති නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාව (රු. '000)	244,040	244,040	244,040	244,040
කොටසකට තනුක ඉපැයීම් (රු.)	70	97	80	108

16. මූල්‍ය උපකරණ මිනුම්කරණය

පහත දැක්වෙන වගුව මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන මාතෘකා යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 - "මූල්‍ය උපකරණ" වල නිර්වචනය කොට ඇති පරිදි කාණ්ඩ වශයෙන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයන් විශ්ලේෂණය කොට ඇත:

16.1 බැංකුව – 2022 දෙසැම්බර් 31

	2022			
	FVTPL[1]	FVOCI[2]	AC[3]	Total
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	66,842,171	66,842,171
ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවතින ශේෂය	–	–	67,602,313	67,602,313
බැංකුවල ඇති තැන්පතු	–	–	–	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	14,882,584	–	–	14,882,584
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	5,556,754	–	–	5,556,754
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවට ණය හා අත්තිකාරම්	–	–	7,689,150	7,689,150
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,783,106,693	1,783,106,693
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ			913,099,927	913,099,927
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	1,661,656	–	1,661,656
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	10,378,370	–	10,378,370
මුළු මූල්‍ය වත්කම්	20,439,338	12,040,026	2,838,340,254	2,870,819,618

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	111,452,491	111,452,491
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,888,478	–	–	1,888,478
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	2,371,518,898	2,371,518,898
වෙනත් ණය ගැනීම්	–	–	191,527,573	191,527,573
යටත් කරන ලද කාල ණය	–	–	36,603,467	36,603,467
මුළු මූල්‍ය වගකීම්	1,888,478	–	2,711,102,429	2,712,990,907

[1] ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය *[2] වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය* *[3] ක්‍රමක්ෂය පිරිවැය*

මුදල් ප්‍රකාශවලට සටහන්

බැංකුව – 2021 දෙසැම්බර් 31

	2021			
	FVTPL[1]	FVOCI[2]	AC[3]	Total
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	57,538,351	57,538,351
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	–	–	56,717,820	56,717,820
බැංකුවල ඇති තැන්පතු	–	–	–	–
ව්‍යුපන්න මූල්‍ය උපකරණ	441,877	–	–	441,877
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	1,558,850	–	–	1,558,850
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවට ණය හා අත්තිකාරම්	–	–	10,131,952	10,131,952
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,835,697,108	1,835,697,108
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ			587,320,182	587,320,182
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				–
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ		1,621,375		1,621,375
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ		9,399,272		9,399,272
මුළු මූල්‍ය වත්කම්	2,000,727	11,020,647	2,547,405,413	2,560,426,787

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	107,745,916	107,745,916
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,761,220	–	–	1,761,220
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	2,071,532,612	2,071,532,612
වෙනත් ණය ගැනීම්	–	–	241,419,125	241,419,125
යටත් කරන ලද කාල ණය	–	–	48,861,680	48,861,680
මුළු මූල්‍ය වගකීම්	1,761,220	–	2,469,559,333	2,471,320,553

[1] ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය *[2] වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය* *[3] ක්‍රමක්ෂය පිරිවැය*

16.2 සමූහය - 2020 දෙසැම්බර් 31

	2022			
	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	-	-	68,077,027	68,077,027
ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවතින ශේෂය	-	-	67,602,313	67,602,313
බැංකුවල ඇති තැන්පතු	-	-	3,028,550	3,028,550
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	14,882,584	-		14,882,584
මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	5,915,926			5,915,926
මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවට ණය හා අත්තිකාරම්	-	-	7,689,150	7,689,150
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	-	-	1,915,771,684	1,915,771,684
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ			928,885,518	928,885,518
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	-	1,844,574	-	1,844,574
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	-	11,428,832	-	11,428,832
මුළු මූල්‍ය වත්කම්	20,798,510	13,273,406	2,991,054,242	3,025,126,158

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	-	-	122,696,978	122,696,978
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,888,478	-	-	1,888,478
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	-	-	2,450,079,037	2,450,079,037
වෙනත් ණය ගැනීම්	-	-	191,527,573	191,527,573
යටත් කරන ලද කාල ණය	-	-	52,781,563	52,781,563
මුළු මූල්‍ය වගකීම්	1,888,478	-	2,817,085,151	2,818,973,629

සමූහය – 2021 දෙසැම්බර් 31

	2021			
	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	58,836,831	58,836,831
ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවතින ශේෂය	–	–	56,717,820	56,717,820
බැංකුවල ඇති තැන්පතු	–	–	3,325,726	3,325,726
ව්‍යුපන්න මූල්‍ය උපකරණ	441,877	–		441,877
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	2,553,546			2,553,546
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				–
බැංකුවට ණය හා අත්තිකාරම්	–	–	13,398,055	13,398,055
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,990,689,061	1,990,689,061
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ			600,079,625	600,079,625
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	1,889,144	–	1,889,144
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	10,596,723	–	10,596,723
මුළු මූල්‍ය වත්කම්	2,995,423	12,485,867	2,723,047,118	2,738,528,408

	FVTPL[1]		AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	122,397,825	122,397,825
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,761,220	–	–	1,761,220
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	2,168,674,742	2,168,674,742
වෙනත් ණය ගැනීම්	–	–	241,419,125	241,419,125
යටත් කරන ලද කාල ණය	–	–	65,560,465	65,560,465
මුළු මූල්‍ය වගකීම්	1,761,220	–	2,598,052,157	2,599,813,377

[1] *ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය* [2] *වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය* [3] *ක්‍රමක්ෂය පිරිවැය*

17. මුදල් හා මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, බැංකුවල ස්ථාපන, ඒක්ෂණ සහ කෙටිකාලීන දැන්වීම් මුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර ණය ලබාදීමේ පහසුකම මුදල් සහ මුදල් සමාන දෑ වෙත ඇතුළත් වේ. මුදල් සහ මුදල් සමාන දෑ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරිපත් කෙරේ.

17.1 මුදල්

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 වන විට	සටහන	2022 රු.'000	2021 රු.'000	2022 රු.'000	2021 රු.'000
අතැති මුදල්		55,289,725	54,347,698	56,352,806	55,406,177
		55,289,725	54,347,698	56,352,806	55,406,177

17.2 මුදල් සමාන දෑ
